296 වන කාණ්ඩය - 16 වන කලාපය
தொகுதி 296 - இல. 16
**Volume 296 - No. 16**

2022 නොවැම්බර් 10 වන බ්‍රහස්පතින්දා
2022 நவம்பர் 10, வியாழக்கிழமை
**Thursday, 10th November, 2022**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
2022 නොවැම්බර් මස 14වන දින විශේෂ ආරක්ෂක විධිවිධාන
පාර්ලිමේන්තුවේ අයවැය කාර්යාලය පිහිටුවීම සඳහා වන මූලික පනත් කෙටුම්පත පිළිබඳ සාකච්ඡා කිරීමේ විශේෂ රැස්වීම

**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
ආබාධ සහිත පුද්ගලයන් සුබසාධන සහ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා දායක කර ගැනීම

**ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම**

**සුළු හිමිකම් අධිකරණ කාර්ය පටිපාටිය පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදි

**අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදි

**පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදි

**සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදි

**උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදි

**විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදි

**අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදි

**ළමයින් සහ තරුණ තැනැත්තන් (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදි

**අන්තරායකර සත්ත්ව (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදි

**බන්ධනාගාර ආඥාපනත:**
රීති

**ධීවර හා ජලජ සම්පත් පනත:**
නියෝග

**අත්‍යවශ්‍ය මහජන සේවා පනත:**
යෝජනා සම්මතය

**කල් තැබීමේ යෝජනාව:**
පාසල් දරුවන් මත් උවදුරෙන් ආරක්ෂා කර ගැනීම

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**
சேர்பெறுமதி வரி (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றத் தீர்ப்பு
2022 நவம்பர் 14ஆம் திகதிய விசேட பாதுகாப்பு ஏற்பாடுகள்
பாராளுமன்ற வரவு செலவுத்திட்ட அலுவலகத்தைத் தாபிப்பதற்கான அடிப்படைச் சட்ட வரைவு பற்றிய விசேட கூட்டம்

**அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா**:
மாற்றுத்திறனாளிகளை நலன்புரி மற்றும் அபிவிருத்திச் செயற்பாடுகளில் இணைத்துக்கொள்ளல்

**மாண்புமிகு சிவநேசதுரை சந்திரகாந்தனது சொந்த விளக்கம்**

**சிறுகோரிக்கை நீதிமன்றங்களின் நடவடிக்கைமுறைச் சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

**நீதித்துறை (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**மாகாணங்களின் மேல் நீதிமன்றம் (சிறப்பு ஏற்பாடுகள்) (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

**குடியியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**கண்டிய திருமண, மணநீக்கம் (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

**நஞ்சுகள், அபின் மற்றும் அபாயகரமான அவுடதங்கள் (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

**சிறுவர்கள் மற்றும் இளம் ஆட்கள் (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**அபாயகரமான விலங்குகள் (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

**சிறைச்சாலைகள் கட்டளைச் சட்டம்:**
விதிகள்

**கடற்றொழில், நீர்வாழ் உயிரினங்கள் சட்டம்:**
ஒழுங்குவிதிகள்

**அத்தியாவசிய பொதுச் சேவைகள் சட்டம்:**
தீர்மானம்

**ஒத்திவைப்புப் பிரேரணை:**
போதைப்பொருள் அச்சுறுத்தலிலிருந்து பாடசாலை மாணவர்களைப் பாதுகாத்தல்

# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:
- Value Added Tax (Amendment) Bill: Determination of the Supreme Court
- Special Security Arrangements on 14th November, 2022
- Special Meeting on Draft Bill for Establishment of Parliamentary Budget Office

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
- Engagement of Differently-abled People in Welfare and Development Activities

PERSONAL EXPLANATION BY HON. SIVANESATHURAI SANTHIRAKANTHAN

SMALL CLAIMS COURTS' PROCEDURE BILL:
- Read a Second, and the Third time, and passed

JUDICATURE (AMENDMENT) BILL:
- Read a Second, and the Third time, and passed as amended

HIGH COURT OF THE PROVINCES (SPECIAL PROVISIONS) (AMENDMENT) BILL:
- Read a Second, and the Third time, and passed

CIVIL PROCEDURE CODE (AMENDMENT) BILL:
- Read a Second, and the Third time, and passed as amended

KANDYAN MARRIAGE AND DIVORCE (AMENDMENT) BILL:
- Read a Second, and the Third time, and passed

POISONS, OPIUM AND DANGEROUS DRUGS (AMENDMENT) BILL:
- Read a Second, and the Third time, and passed as amended

CODE OF CRIMINAL PROCEDURE (AMENDMENT) BILL:
- Read a Second, and the Third time, and passed

CHILDREN AND YOUNG PERSONS (AMENDMENT) BILL:
- Read a Second, and the Third time, and passed as amended

DANGEROUS ANIMALS (AMENDMENT) BILL:
- Read a Second, and the Third time, and passed

PRISONS ORDINANCE:
- Rules

FISHERIES AND AQUATIC RESOURCES ACT:
- Regulations

ESSENTIAL PUBLIC SERVICES ACT:
- Resolution

ADJOURNMENT MOTION:
- Safeguarding School Children from Drug Menace

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2022 නොවැම්බර් 10 වන බ්‍රහස්පතින්දා***
*2022 நவம்பர் 10, வியாழக்கிழமை*
*Thursday, 10th November, 2022*

---

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER
[THE HON. MAHINDA YAPA ABEYWARDANA]
in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
### சேர்பெறுமதி வரி (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றத் தீர்ப்பு
### VALUE ADDED TAX (AMENDMENT) BILL: DETERMINATION OF THE SUPREME COURT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

I wish to announce to Parliament that I have received the Determination of the Supreme Court in respect of the Bill entitled "Value Added Tax (Amendment)", which was challenged in the Supreme Court in terms of Article 121(1) of the Constitution.

On an overall consideration of the provisions of the Bill, the Supreme Court is of the opinion that subject to the following amendments being moved at the Committee Stage of Parliament as proposed by the learned Deputy Solicitor General, the Bill, as a whole, is not inconsistent with the provisions of the Constitution:

(i) Clause 3
The Insertion of the following proviso in Section 10(1) - "*Provided further, for the purposes of paragraph (vii), the requirement for the registration shall raise from the date on which this Amendment Act comes into operation.*"

(ii) Clause 4(1)
The reference to "*September 30, 2022*" to be deleted and substituted with "*November 30, 2022*".

(iii) Clause 4(2)
The reference to "*October 1, 2022*" to be deleted and substituted with "*December 1, 2022*".

I order that the Determination of the Supreme Court be printed in the Official Report of today's Proceedings of the House.



*ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය :*
*உயர் நீதிமன்றத் தீர்ப்பு:*
*Determination of the Supreme Court:*

**IN THE SUPREME COURT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**

**"VALUE ADDED TAX (AMENDMENT) BILL"**

**SC (SD) No. 62/2022** **Petitioners:**
(1) Heiyanthuduwage Don Indika Ajith Wijesinghe,
178/3, Mabima, Heiyanthuduwa.

(2) Brahmanage Premalal,
Chairman,
Condominium Developers Association of Sri Lanka,
C/O, Ceylon Chamber of Commerce,
50, Nawam Mawatha, Colombo 2.

(3) Sellaperumage Pinsiri Fernando,
Secretary,
Condominium Developers Association of Sri Lanka,
C/O, Ceylon Chamber of Commerce,
50, Nawam Mawatha, Colombo 2.

**Counsel:** Dr. K. Kanag-Isvaran, PC with Lakshmanan Jeyakumar

**SC (SD) No. 63/2022** **Petitioner:** M. Victor,
149/44, Graceland City,
Diwulapitiya Road,
Demanhandiya, Negombo.

**Counsel:** Dharshana Weraduwage with Dhanushi Kalupahana and Ushani Atapattu

**Respondent:** Attorney General

**Counsel:** Nirmalan Wigneswaran, Deputy Solicitor General with Shiloma David, State Counsel

| **BEFORE:** | | |
|---|---|---|
| | Jayantha Jayasuriya, PC | Chief Justice |
| | S. Thurairaja, PC | Judge of the Supreme Court |
| | Arjuna Obeyesekere | Judge of the Supreme Court |

The Court assembled for hearing at 10.00 a.m. on 26th October 2022.

A Bill titled, "Value Added Tax (Amendment) Bill" [*the Bill*] was published as a Supplement to Part II of the Gazette of 23rd September 2022, issued on 27th September 2022. It was presented in Parliament by the Hon. Prime Minister and Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government, and was placed on the Order paper of Parliament on 18th October 2022.

**Articles 120, 121 and 123 of the Constitution**

Article 120 of the Constitution provides that, "*The Supreme Court shall have sole and exclusive jurisdiction to determine any question as to whether any Bill or any provision thereof is inconsistent with the Constitution.*"

Article 121(1) goes on to state that:

> "*The jurisdiction of the Supreme Court to ordinarily determine any such question as aforesaid may be invoked by the President by a written reference addressed to the Chief Justice, or by any citizen by a petition in writing addressed to the Supreme Court. Such reference shall be made, or such petition shall be filed, within one week of the Bill being placed on the Order Paper of the Parliament and a copy thereof shall at the same time be delivered to the Speaker …*"

In terms of Article 123(1), "*The determination of the Supreme Court shall be accompanied by the reasons therefor and shall state whether the Bill or any provision thereof is inconsistent with the Constitution and if so, which provision or provisions of the Constitution.*"

Where a primary determination is made as provided in Article 123(1) that the bill or any provision thereof is inconsistent with the Constitution, the consequential determinations that the Court is required to make are specified in Article 123(2).

Four Petitioners have accordingly invoked the jurisdiction of this Court in terms of Article 121(1) by filing the above numbered petitions in the Registry of the Supreme Court on 21st and 25th October 2022. Upon receipt of the said petitions, the Registrar of this Court issued notice on the Hon. Attorney General as required by Article 134(1) of the Constitution.

**The Bill**

The Bill comprises of five clauses including Clause 1 (short title) and Clause 5 (Sinhala text to prevail in case of inconsistency). According to the Statement of Legal Effect, the purpose of the amendments proposed in Clauses 2, 3 and 4 are as follows:

(a) Clause 2 – Increase the rate of the Value Added Tax [*VAT*] specified in Section 2 of the Value Added Tax Act, No. 14 of 2002, as amended [*the VAT Act*] on the value of goods or services supplied, or goods imported, in the following manner:

   (i) from 8% to 12% with effect from 1st June 2022 to 31st August 2022; and

   (ii) from 12% to 15% with effect from 1st September 2022.

(b) Clause 3 – Decrease the threshold for registration specified in Section 10 of the VAT Act from Rs. 300 million to Rs. 80 million per annum with effect from 1st October 2022.

(c) Clause 4 – Remove the exemption from VAT specified in Part II of the First Schedule of the VAT Act on the supply of condominium residential accommodation with effect from 1st October 2022.

While none of the Petitioners have any grievance over the provisions contained in Clauses 2 and 3 of the Bill, they claim that Clause 4 is retrospective in application and in any event, is violative of the Rule of Law, the Directive Principles of State Policy and Articles 3, 4, 12 and 14(1)(h) of the Constitution, and hence needs to be approved by the special majority of Parliament and by the People at a Referendum.

The learned Deputy Solicitor General submitted that:

(a) Clause 2 only seeks to confirm the VAT rate stipulated by way of Orders made under Section 2A of the VAT Act, and hence, although the said rates have already been implemented, the issue of retrospectivity does not arise in respect of Clause 2;

(b) An amendment will be moved at the Committee Stage of Parliament to the second proviso to Section 10(1) by specifying that the fifteen day period provided therein for a person to be registered for the purposes of Section 10 shall commence only from the date of enactment of the Bill;

(c) The Bill was formulated on the basis that it would be enacted by Parliament by 1st October 2022 and as such Clause 4(2) specified 1st October 2022 as the effective date from which condominium residential accommodation will be liable for VAT. However, due to the delay in presenting the Bill, he submitted that an amendment will be moved at the Committee Stage of Parliament to amend "September 30, 2022" referred to in Sub Clause (1) of Clause 4 to read as "November 30, 2022" and "October 1, 2022" referred to in Sub Clause 2 of Clause 4 to read as " December 1, 2022".

In these circumstances, the issue of retrospectivity arising from Clause 4 which had been raised in the two petitions was not pursued by the Petitioners, and for that reason, this Court shall refrain from making any determination on this issue.

**Absence of a Minister of Finance**

Mr. Dharshana Weraduwage, the learned Counsel for the Petitioner in SC (SD) Application No. 63/2022, submitted at the outset that even though the Cabinet Memorandum relating to the Bill has been presented to the Cabinet of Ministers by the *Minister of Finance, Economic Stabilization and National Policies*, a Member of Parliament is yet to be appointed to the said Cabinet Ministerial portfolio of Finance, Economic Stabilization and National Policies, and for that reason:

(a) there is no valid decision by the Cabinet of Ministers;

(b) there is non-compliance with the provisions of Article 152 of the Constitution, Standing Order No. 133 and Paragraph 5(vi) of the "Guidelines on Submission of Cabinet Memoranda/Notes."

He therefore submitted that this Court cannot proceed to determine the constitutionality of the Bill in terms of Articles 121 and 123 of the Constitution since due process leading up to the presentation of the Bill in Parliament has not been followed.

Article 78(2) provides that the passing of a Bill by Parliament shall be in accordance with the provisions of the Constitution and the Standing Orders of Parliament. The Guidelines referred to by Mr. Weraduwage are only an informal set of instructions in the preparation of Cabinet Memoranda, and is outside the purview of Article 78(2). In any event, the submission of Mr. Weraduwage that paragraph 5(vi), which specifies that a Cabinet Memorandum shall be listed only once the observations of the Ministry of Finance are obtained, has no application as the relevant Memoranda have been submitted by the Minister of Finance.

The learned Deputy Solicitor General, whilst submitting that a Minister of Finance does exist, submitted that in any event, the appointment of a Minister of Finance is within the executive power of the President, and therefore forms no part of the legislative process and is outside the jurisdiction conferred on this Court by Article 121.

Articles 44(1) and (2), as it stood prior to the 21st Amendment to the Constitution, and re-produced below, are relevant in considering whether a Minister of Finance did exist at the time the Cabinet of Ministers considered the Bill.

Article 44(1)

*" The President shall, from time to time, in consultation with the Prime Minister, where he considers such consultation to be necessary –*

*(a) determine the number of Ministers of the Cabinet of Ministers and the Ministries and the assignment of subjects and functions to such Ministers; and*

*(b) appoint from among the Members of Parliament, Ministers to be in charge of the Ministries so determined."*

Article 44(2)

*" The **President may assign to himself any subject or function** and **shall remain in charge of any subject or function not assigned to any Minister** under the provisions of paragraph (1) of this Article or the provisions of paragraph (1) of Article 45 and may for that purpose determine the number of Ministries to be in his charge, and accordingly, any reference in the Constitution or any written law to the Minister to whom such subject or function is assigned, shall be read and construed as a reference to the President"* [emphasis added].

The cumulative effect of Article 44(1) and (2) is that (a) while the President may assign any subject or function to himself, (b) the President shall remain in charge of any subjects or functions not assigned to any Minister. Thus, Article 44(2) makes it clear that the President can hold a ministerial portfolio in one of the two ways specified therein.

By a notification published in Gazette Extraordinary No. 2289/43 dated 22nd July 2022, the President, acting in terms of Article 44(1)(a) of the Constitution, had determined the number of Ministers of the Cabinet of Ministers and the Ministries and the assignment of subjects and functions, and Departments, Public Corporations and Statutory Institutions to the said Ministries. The said notification stipulated further that:

> *"All such subjects and functions and Departments, Public Corporations and Statutory Institutions that are not specifically assigned to any Minister will continue to remain in my charge as the President."*

The Schedule annexed to the said notification includes the Ministry of Finance, Economic Stabilisation and National Policies, which has been vested, *inter alia*, with the duty of "*Formulation, implementation, monitoring and evaluation of policies, programmes and projects, in relation to the subjects of Finance, Economic Stabilization*

*and Taxation*." It is observed that the VAT Act is one of the many laws that are to be implemented by the Minister in charge of the said Ministry.

By a further notification published in Gazette Extraordinary No. 2290/17 dated 26th July 2022, the President, acting in terms of Article 44(1)(b) of the Constitution, had appointed twenty three Ministers and assigned to such Ministers the Ministries mentioned against their names. The portfolio of Finance, Economic Stabilization and National Policies has not been assigned to any Minister. When the aforementioned notifications are considered together, it is clear that the President has retained to himself the portfolio of Finance, Economic Stabilization and National Policies, as permitted by Article 44(2) and the President therefore is the Minister of Finance.

In these circumstances, we are not in agreement with the submission of the learned Counsel for the Petitioner that a Minister of Finance did not exist at the relevant time.

**Compliance with Article 152 of the Constitution**

Article 152 of the Constitution reads as follows:

*"No Bill or motion, authorising the disposal of, or the imposition of charges upon, the Consolidated Fund or other funds of the Republic, or the imposition of any tax or the repeal, augmentation or reduction of any tax for the time being in force shall be introduced in Parliament except by a Minister, and unless such Bill or motion has been approved either by the Cabinet of Ministers or in such manner as the Cabinet of Ministers may authorise."*

Standing Order No. 133 provides as follows:

*"Parliament shall not proceed upon the consideration of any motion, Bill or amendment thereto authorizing disposal or imposition of charges upon the Consolidated Fund or other funds of the Republic or the imposition of any tax or the repeal, augmentation or reduction of any tax for the time being in force unless introduced by a Minister of the Cabinet of Ministers who shall, before making such motion, introducing such Bill or moving such amendment, signify to Parliament the approval of the Cabinet of Ministers to such motion, Bill or amendment.* ***An indication on the Order Paper of Parliament that "Cabinet approval is signified" shall be deemed sufficient in compliance to this requirement****"* [emphasis added].

In the **Value Added Tax (Amendment) Bill** [Decisions of the Supreme Court on Parliamentary Bills (2016-2017), Vol. XIII, 57 at pages 59-60] this Court, having considered the above two provisions, held as follows:

*"The combined effect of Article 152 read with Standing Order 133 makes it abundantly clear that prior to the presentation of a Bill in Parliament, it is mandatory that:*

*(i) The approval of the Cabinet of Ministers on such Bill has to be obtained;*

*(ii) When introducing, the Bill has to signify to Parliament the approval of the Cabinet of Ministers; and*

*(iii) The Bill has to be introduced to Parliament by a Minister."*

The learned Deputy Solicitor General submitted that:

(a) On 30th May 2022, the Cabinet of Ministers had approved the Cabinet Memorandum dated 28th May 2022 submitted by the then Minister of Finance, Economic Stabilisation and National Policies, seeking *inter alia* to increase the VAT rate from 8% to 12%; decrease the VAT threshold from Rs. 300 million to Rs. 120 million per annum; and remove the exemption on condominium residential accommodation;

(b) On 30th August 2022, the Cabinet of Ministers had approved the Cabinet Memorandum of the same date submitted by the Minister of Finance, Economic Stabilisation and National Policies, seeking *inter alia* to implement the revision of the VAT rate specified in the Interim Budget, 2022;

(c) On 12th September 2022, the Cabinet of Ministers had approved the Cabinet Memorandum dated 5th September 2022 submitted by the Minister of Finance, Economic Stabilisation and National Policies, seeking *inter alia* to further lower the VAT threshold from Rs. 120 million to Rs. 80 million per annum;

(d) On 22nd September 2022, the Cabinet of Ministers had approved the Cabinet Memorandum of the same date submitted by the Minister of Finance, Economic Stabilisation and National Policies, and the draft Bill to amend the VAT Act that was annexed to the said Memorandum.

Thus, it is clear that the Bill itself had been presented to the Cabinet of Ministers by the Minister of Finance, Economic Stabilisation and National Policies, and that the Cabinet of Ministers have approved the amendments that are now sought to be effected by the Bill to the VAT Act, and the Bill itself.

Furthermore, (a) the Order Paper of Parliament for 18th October 2022, which has been produced with both petitions, confirms that at the time the Bill was introduced to Parliament, the fact that such Bill had been approved by the Cabinet of Ministers had been signified to Parliament; (b) the Bill presented in Parliament contains an endorsement that it has been presented by a Minister on 18th October 2022.

In the above circumstances, we are satisfied that the Bill complies with the provisions of Article 152 of the Constitution.

**Clause 4 of the Bill**

We shall now consider the submissions of the learned Counsel for the Petitioners in relation to Clause 4, which proposes to remove the exemption from VAT in the supply of any condominium residential accommodation.

The 2nd and 3rd Petitioners in SC (SD) Application No. 62/2022 are the Chairman and Secretary, respectively, of the Condominium Developers Association of Sri Lanka. The 1st Petitioner in the said application and the Petitioner in SC (SD) Application No. 63/2022 are persons who had entered into agreements to purchase condominium residential accommodation.

At the time the VAT Act was introduced in 2002, the supply, lease or rent of residential accommodation was exempt from VAT in terms of item (xxiii) of the First Schedule to the original VAT Act. The only exclusion was the supply of residential accommodation by an enterprise that had entered into an agreement with the Board of Investment and where the total cost of the project relating to such agreement was not less than USD 10 million and the project related exclusively to the said supply, lease or rental. Thus, a mixed development project was exempt from VAT. The provisions of the Value Added Tax (Amendment) Act, No. 11 of 2015 extended VAT liability to mixed development projects, by excluding projects that related exclusively or partially to residential accommodation from the exception to the VAT exemption *(Item (xi) paragraph (b), Part II, Schedule I)*.

The Value Added Tax (Amendment) Act, No. 20 of 2016 granted an exemption from VAT only on the supply of residential accommodation after 1st November 2016. Lease and rent of residential accommodation were therefore made subject to VAT. *(Item (xi) paragraph (b), Part II, Schedule I)*

The Value Added Tax (Amendment) Act, No. 25 of 2018 limited the application of the above position to the commencement date of the 2018 Act (16th August 2018). It then proceeded to provide that from 1st April 2019 the following would apply:

(a) Lease or rent continued to be subject to VAT;

(b) The supply of residential accommodation not relating to condominium housing was exempt;

(c) The supply of condominium housing in any projects where the cost of any single housing unit in that project was not more than Rs. 15 million was exempt.

Therefore, the supply of condominium property where any single unit exceeded Rs. 15 million was liable to VAT. The said threshold was increased to Rs. 25 million by the Value Added Tax (Amendment) Act, No. 19 of 2019 and was applicable until 1st December 2019.

The 2018 Act appears to have inadvertently not made any provision for the period commencing from 16th August 2018 to 1st April 2019. However, the 2019 Amendment extended the application of the provisions introduced in 2016, until just prior to 1st

April 2019. The 2019 Amendment also exempted the following categories of the supply of residential accommodation:

(a) The sale of a condominium housing unit where a notarially executed agreement to sell had been executed prior to the date of commencement of the 2019 Act (31st October 2019);

(b) The sale of a condominium housing unit where a certificate of conformity had been issued prior to the date of commencement of the 2019 Act.

In terms of the Value Added Tax (Amendment) Act, No. 9 of 2021, from 1st December 2019, the supply of all residential accommodation, other than lease or rent, has been exempt from the payment of VAT. Thus, all supplies of condominium residential accommodation regardless of the value of any unit in the project were exempt from VAT.

It is therefore clear that while the supply of residential accommodation has consistently been exempt from VAT, the legislature has from time to time thought it fit to exempt from VAT, all or some categories of condominium residential accommodation.

Clause 4 of the Bill (read together with the amendment that is proposed to be moved at the Committee Stage of Parliament to Clause 4 with regard to the date) seeks to remove the aforementioned exemption from VAT referred to in Part II of the First Schedule to the Act, relating to the supply of condominium residential accommodation with effect from 1st December 2022. The result is that from 1st December 2022 the supply of condominium residential accommodation would no longer be exempt from VAT. The supply of a condominium residential accommodation after 1st December 2022 would therefore be liable for VAT.

The complaint of the Petitioners representing the Condominium Developers Association is that the imposition of VAT would result in an increase in the cost of condominium residential accommodation, thus affecting sales and an eventual slowdown of the construction industry which employs a large majority of its workforce from poor and marginalised segments of society. The complaint of those Petitioners who had entered into agreements for the purchase of condominium residential accommodation is that they entered into such agreements based on their financial capacity in order to achieve their lifelong goal of owning a house, and that the effect of Clause 4 would be to increase the cost of such accommodation, which additional cost would be beyond their means. In essence, the complaint of all Petitioners is that the removal of the said exemption is unfair and would affect them financially.

**Date of Supply**

Responding to the submission of Mr. Weraduwage that Clause 4 seeks to impose VAT on the total purchase consideration that had been agreed with the developer even though part of the agreed purchase consideration has already been made, the learned Deputy Solicitor General submitted that in terms of Section 4(5) of the VAT Act, the time of supply in an agreement which provides for periodical payments (other than a hire purchase agreement) would be when the payment is due or when the payment is received, whichever is earlier. He submitted further that this position is made clear by the use of the words, "*if such supply has taken place on or after December 1, 2022,*" in Clause 4(2) of the Bill and that accordingly, VAT shall be charged only on payments made after 1st December 2022. Therefore, while any sums of money paid to a developer in terms of a Sale and Purchase Agreement for the purchase of a condominium unit prior to 1st December 2022 will not be liable for VAT, it is only payments that fall due after 1st December 2022 that will be liable for VAT.

**Article 14(1)(h)**

Dr. K. Kanag-Isvaran, President's Counsel, appearing for the Petitioners in SC (SD) Application No. 62/2022 presented two arguments before us.

The first was that while the Universal Declaration of Human Rights recognises that, "*everyone has the right to own property alone as well as in association with others*", in terms of Article 14(1)(h) of the Constitution, every citizen is entitled to choose his residence within Sri Lanka. It was therefore sought to be argued that the imposition of VAT affects the fundamental right guaranteed by Article 14(1)(h), and hence, Clause 4 requires to be passed by the special majority of Parliament. We are of the view that while the imposition of VAT on the supply of condominium residential accommodation is an issue that relates to the affordability on the part of a citizen to purchase such accommodation, it certainly does not take away the right of a citizen to own property, nor does it fetter or restrict in any manner the right of a citizen to choose his residence within Sri Lanka.

**Article 27 – Directive Principles of State Policy**

The second argument of Dr. Kanag-Isvaran, PC was based on (a) Chapter VI of the Constitution, titled 'Directive Principles of State Policy and Fundamental Duties' comprising of Articles 27 – 29, and (b) more particularly Articles 27(1) and 27(2)(c), which are re-produced below:

Article 27(1)

"*The Directive Principles of State Policy herein contained shall guide Parliament, the President and the Cabinet of Ministers* ***in the enactment of laws*** *and* ***the governance of Sri Lanka for the establishment of a just and free society***" [emphasis added].

Article 27(2)(c)

"*The State is pledged to establish in Sri Lanka a Democratic Socialist Society, the objectives of which include –*

(c) *the realisation* ***by all citizens*** *of an adequate standard of living for themselves and their families, including adequate food, clothing and* ***housing****, the continuous improvement of living conditions and the full enjoyment of leisure and social and cultural opportunities;*" [emphasis added]

In order to place in perspective the said submission, it is perhaps important to state that in terms of Article 29, "*The provisions of this Chapter do not confer or impose legal rights or obligations and are not enforceable in any court or tribunal. No question of inconsistency with such provisions shall be raised in any court or tribunal.*"

While correctly conceding that the Directive Principles of State Policy are not enforceable, Dr. Kanag-Isvaran, PC nonetheless submitted that this Court has held that the Directive Principles of State Policy are the *conscience of the Constitution* and provide important guidance and direction to the various organs of the State in the enactment of laws. He submitted further that the Rule of Law requires the legislature to be guided by the said Directive Principles of State Policy in the enactment of laws, and the manner in which a financial burden has been imposed on the Petitioners by this Bill is contrary to the Rule of Law and is therefore a violation of Articles 3 and 4 of the Constitution.

Dr. Kanag-Isvaran, PC cited the judgment in **Seneviratne and Another v University Grants Commission and Another** [(1978-79-80) 1 Sri LR 182] where Wanasundera, J referring to the role played by the Directive Principles of State Policy stated as follows at pages 214-215:

> "*In Kesavananda Bharati v. State of Kerala [AIR 1973 SC 1461] all the Judges constituting the Bench had in one voice given the Directive Principles a place of honour in the Constitution. The Directive Principles, they said, "constitute the conscience of the Constitution." In State of Kerala v. Thomas, [AIR 1976 SC 490] Fazal Ali, J., observed –*
>
> > "*In view of the principles adumbrated by this Court, it is clear that the Directive Principles form the fundamental feature and the social conscience of the Constitution and the Constitution enjoins upon the State to implement these Directive Principles. The directives thus provide the policy, the guidelines and the end of socio-economic freedom and Arts. 14 and 16 are the means to implement the policy to achieve the ends sought to be promoted by the Directive Principles.*""

Justice Wanasundera went onto state as follows:

> "*It is a settled principle of construction that when construing a legal document the whole of the document must be considered. Accordingly, all relevant provisions of the Constitution must be given effect to when a constitutional provision is under consideration and, when relevant; this must necessarily include the Directive Principles. It has been said that the Directive Principles are in the nature of an instrument of instructions which both the Legislature and executive must respect and follow. The expressive language in the above citations is*

*intended to emphasise the fact that these provisions are part and parcel of the Constitution and that the courts must take due recognition of them and make proper allowance for their operation and function."*

In **Re Thirteenth Amendment to the Constitution Bill** [Decisions of the Supreme Court on Parliamentary Bills (1987) Vol. III 21] two important but contrasting observations relating to the effect of the Directive Principles were made.

The first was by Sharvananda, CJ who delivered the opinion of the majority, who stated [at page 35] that, *"True the Principles of State Policy are not enforceable in a court of law but that shortcoming does not detract from their value as projecting the aims and aspirations of a democratic government."* Wanasundera, J delivering the minority judgment stated [at page 57] that, *"While the Indian Courts have leaned on these principles to resolve matters of doubt, I do not think that they should have any controlling effect on any provision of the Constitution. These Directive Principles are really ethical or moral principles to guide the State. If any kind of legal importance is to be given to them, this would make the constitution unworkable."*

More progressive views as to the role of the Directive Principles of State Policy have been taken by this Court in later years.

In **Haputhanthirige and Others v Attorney General** [(2007) 1 Sri LR 101], Sarath Silva, CJ held that:

> *"The limitation in Article 29 which states that the provisions of Chapter VI are not justiciable would not in my view be a bar against the use of these provisions to interpret other provisions of the Constitution. ... Hence the restriction added at the end in Article 29 should not detract from the noble aspirations and objectives contained in the Directive Principles of State Policy, lest they become as illusive as a mirage in the desert."*

The above position was reiterated in **Watte Gedara Wijebanda v Conservator General of Forests and Others** [(2009) 1 Sri LR 337 at 356] when this Court stated that, *"although the Directive Principles of State Policy are not specifically enforceable against the State,* ***they provide important guidance and direction*** *to the various organs of State in the enactment of laws and in carrying out the functions of good governance."* [emphasis added]

In **Kirahandi Yeshin Nanduja De Silva and Another v. Sumith Parakramawansha and Others** [SC (FR) Application No. 50/2015; SC minutes of 2nd August 2017], Priyantha Jayawardena, PC, J observed as follows:

> *"The effect and the applicability of Directive Principles have been considered by Justice S. Sharvananda in his book titled Fundamental Rights in Sri Lanka (A Commentary) at page 55 where it states:*
>
> > *"Although [Directive] principles are expressly made unenforceable, that does not affect their importance and relevance. They are as important as the fundamental rights of an individual. They are relevant considerations in the enactment of laws.* ***They represent the aspirations of the people in Sri Lanka.*** *There is no disharmony between directive principles and the fundamental rights as they complement each other in aiming at the same goal of bringing about a social revolution and the establishment of a welfare state. These principles are constitutionally binding on the State, even though they are not enforceable but are only to be taken into account in determining the validity of a law. Hence,* ***to determine the ambit and dimension of fundamental rights and what kind of restrictions that can be legitimately imposed on them by law, the directive principles set out in Article 27 are relevant.****"* [emphasis added]

It is clear that what has been laid down as the Directive Principles of State Policy are noble and laudable objectives that shall guide the legislature and the executive not only in the enactment of laws but also in the governance of the Country in order to establish a just and free society. The Principles, although directory, are indeed the conscience of the Constitution and would be instructive when they are used to interpret other provisions of our Constitution, or to determine the ambit and dimension of fundamental rights and what kinds of restrictions can legitimately be imposed on them by law.

As pointed out by the learned Deputy Solicitor General, the use of the words, '*all citizens*' in Article 27(2)(c) makes it clear that it is a pledge that the State has made to each and every citizen of this Country that its objective is to ensure an adequate standard of living for all citizens and their families. This pledge is not directed at an individual, a few of its citizens or to a class of persons but to **all citizens**. To claim that in the enactment of laws, the State must give preference to one group of persons – in this instance those who purchase condominium residential accommodation – over and above the rights of the rest of the citizens, without any basis to grant such preferential treatment, is not only unconstitutional but untenable.

Although it was submitted by Dr. Kanag-Isvaran, PC that the genesis of the Bill is irrelevant, the wording of Article 27(2)(c) brings into focus the submission made by the learned Deputy Solicitor General that the amendments to the VAT Act are being brought in to generate the much needed revenue to overcome the present economic circumstances faced by Sri Lanka, direct economic activity to the general welfare of society and thereby improve the living conditions of all citizens. This position of the learned Deputy Solicitor General needs no elaboration at this juncture, suffice to state that as at 2021, (a) the revenue to GDP ratio is 8.7%; (b) the budget deficit is 12.2% of the GDP; and (c) the debt to GDP ratio is at 104.6%.

The learned Deputy Solicitor General submitted that the fundamental truth is that the primary source of revenue for the State is the money which people earn themselves. He submitted further that in order to provide all citizens with an adequate standard of living and continuously improve the living conditions of its People, as well as achieve the other Principles set out in Article 27(2) and meet its expenditure, the State requires money, which can be generated *inter alia* by borrowing the money of its people or by resorting to foreign borrowing, by imposing taxes, charges, duties, levies, royalties etc., or by charging the people more for the services provided by the State. The learned Deputy Solicitor General therefore submitted that the Bill, while giving effect to the Government's overall taxation policy, is entirely consonant with the objective of the State to provide an adequate standard of living for its people and establish a just society, even though the proposed amendments in Clause 4 impose additional financial burdens on a selected few.

**Control of Parliament over Public Finance**

We shall now consider if the imposition of a tax is contrary to the Rule of Law and is therefore a violation of Articles 3 and 4 of the Constitution.

In terms of Article 148 of the Constitution, *"Parliament shall have full control over public finance. No tax, rate or any other levy shall be imposed by any local authority or any other public authority, except by or under the authority of a law passed by Parliament or of any existing law."*

That the expansion of the tax regime, including the policies and methodologies that underpin such legislation is within the full control of Parliament has been emphasised by this Court over the years in several determinations.

In the **Inland Revenue (Amendment) Bill** [SC (SD) Nos. 1-3/2021; at pages 6-7], it was held that:

> *"It is an established principle that,* ***in fiscal Legislation, the Legislature has the greatest freedom of classification in imposing liability and granting concessions****, and such classifications in imposing liability or granting concessions have not been held inconsistent with Article 12(1) of the Constitution."* [emphasis added]

A similar view was expressed in the **Inland Revenue (Amendment) Bill** [Decisions of the Supreme Court on Parliamentary Bills (2004-2006), Vol. VIII, 29 at page 31], where this Court stated as follows:

> *"It is clear from the observations made consistently by the Constitutional Court and this Court that* ***in revenue matters in making classifications for the purpose of granting concessions or imposing liability there is a wide discretion****. These measures are taken not only to raise resources necessary for the State but also to direct economic activity projected to the general welfare of society.* ***Such measures would be considered as inconsistent with Article 12 of the Constitution only if they are manifestly unreasonable or discriminatory*** *..."* [emphasis added].

In the **Valued Added Tax (Amendment) Bill** [Decisions of the Supreme Court on Parliamentary Bills (2016-2017), Vol. XIII, 76 at pages 78-79], this Court, addressing an amendment that sought to remove an exemption which was previously afforded to "*healthcare services provided by medical institutions or professionally qualified persons*," stated as follows:

> "*As we observed, in taxation matters, it is well established that the legislature has the greatest freedom in classification. The State has a wide discretion in selecting the persons, or objects it will tax and a Statute is not open to attack on the ground that it taxes some persons or objects and not others.* ***The law undoubtedly is that the sovereign power of taxation is absolute, that it could be exercised up to any limit, that the determination of that limit is for the legislature and not for the Courts.*** *Legislative measures which Parliament intends to introduce in the exercise of its legislative power to pass tax statutes, could be considered as being in violation of Article 12 of the Constitution only where such measures are manifestly unreasonable or manifestly discriminatory. Other than in such strictly limited circumstances, it is no part of the function of a court to inquire into the exercise of legislative power of taxation with regard to the amount or persons or property on which a tax is imposed*" [emphasis added].

In the **Special Goods and Services Tax Bill** [SC (SD) Application Nos. 1-9/2022; at pages 9-10] it was held that:

> "*It is important that this Court places on record its view that (a) formulation of policy is very much the prerogative of the Executive and the Legislature, (b) it appears that the declared purposes for which the Bill is sought to be enacted (explained to this Court by the learned DSG) is very much in national and public interests, (c) it is within the exclusive domain of the legislative power of Parliament to convert policies into legislation, and (d) it is not the intention of this Court nor does it possess the jurisdiction to approve, critique or quash policies adopted by the Executive and the Legislature or comment regarding their appropriateness in comparison with what the Court believes to be in national and public interests.*
>
> *Following on with the comment made by the Supreme Court in the Nation Building Tax (Amendment) Bill [SC (SD) 34/2016], it is necessary for this Court to observe that this Court is devoid of jurisdiction to comment on the prudence or otherwise of a particular policy formulated by the Executive and sought to be converted into legislation by the enactment of a law by Parliament.*"

The caution that should be exercised when considering fiscal legislation was discussed in the **Surcharge Tax Bill** [SC (SD) Application Nos. 19-21/2022, 23-29/2022], where this Court cited the following passage from the opinion of the Supreme Court of the United States of America in **San Antonio Independent School District v Rodriguez** [(1973) 411 US 1 at page 41]:

> "*No scheme of taxation, whether the tax is imposed on property, income, or purchases of goods and services, has yet been devised which is free of all discriminatory impact. In such a complex arena in which no perfect alternatives exist, the Court does well not to impose too rigorous standard of scrutiny lest all local fiscal schemes become subjects of criticism under the Equal Protection Clause.*"

The position therefore is clear. This Court has consistently taken the view that the latitude given to the legislature to impose taxes is wide and that any decision to tax or exclude from tax any person/s would not give rise to an issue of constitutionality, except where the Bill transgresses the fundamental principles of equality without a rational nexus to the objective of the law or where such amendments are manifestly unreasonable or manifestly discriminatory.

Dr. Kanag-Isvaran, PC strenuously urged this Court, being the watchful guardian of the Constitution, and of the fundamental rights of the People to adopt a more pragmatic approach when examining the Bill and to consider Clause 4 in the context of the hardships that would be faced by the Petitioners if the exemption is removed as proposed by Clause 4. He went one step further by proposing that this Court impose the threshold over which condominium residential accommodation would be liable for VAT, similar to what was done by the legislature in 2018 and 2019 through the Amendment Acts.

In support of his submission, Dr. Kanag-Isvaran, PC referred us to the judgment of this Court in **Seneviratne and another v University Grants Commission** [supra; at page 215] where Wanasundera, J cited with approval the following passage relied on by counsel for the respondent from the main judgment in **Pathumma v. State of Kerala** [AIR 1987 SC 771] which four Judges concurred with:

> "*Courts interpret the constitutional provisions against the social setting of the country so as to show a complete consciousness and deep awareness of the growing requirements of the society, the increasing needs of the nation, the burning problems of the day and the complex issues facing the people which the legislature in its wisdom, through beneficial legislation, seeks to solve. The judicial approach should be dynamic rather than static, pragmatic and not pedantic, and elastic rather than rigid. It must take into consideration the changing trends of economic thought, the temper of the times and the living aspirations and feelings of the people.*""

The judgment in **Pathuamma**, however, continued to state in the very next sentence that:

> "*This Court while acting as a sentinel on the qui vive to protect fundamental rights guaranteed to the citizens of the country must try to strike a just balance between the fundamental rights and the larger and broader interests of society, so that when such a right clashes with the larger interest of the country, it must yield to the latter.*"

While the Petitioners concede that the Country is facing an economic crisis of proportions hitherto not seen, the policy of the State in introducing the Bill, as well as several other revenue-raising legislation with a view to stabilising the economy, have been carefully set out in the aforementioned Cabinet Memoranda dated 28th May 2022, 30th August 2022 and 5th September 2022. While those who built individual residential accommodation and were therefore outside the exemption were liable for the payment of VAT on the goods purchased as well as on services provided, the conferring of an exemption from VAT on the supply of condominium residential accommodation resulted in preferential treatment being meted out to the latter. Whether the conferment of such an exemption was in accordance with sound economic policy is not a matter that falls within the jurisdiction of this Court in terms of Article 121. What is clear however is that the conferring of an exemption was within the power of the legislature and its control over fiscal matters. Similarly, the proposed removal of the aforementioned exemption is also within the power of the legislature as contemplated by Article 148.

In the above circumstances, we are of the opinion that the removal of the aforementioned exemption in terms of Clause 4 is a measure that is being taken to raise resources necessary for the State and to direct economic activity projected to the general welfare of society and in the greater interests of the citizens of this Country. It neither transgresses the fundamental principles of equality nor is it manifestly unreasonable or manifestly discriminatory. Hence, we are of the opinion that the Bill is not inconsistent with the provisions of Articles 3, 4 and 12 of the Constitution.

Before we conclude, we must state that the wide latitude given to the legislature to impose taxes on the recommendation of the executive brings with it a whole host of responsibilities and duties, both for the legislature and for the executive. The legislature, entrusted with the responsibility of being in full control over public finance must demand that the executive rationalise to its satisfaction the necessity for a particular tax and the manner in which the monies raised by such tax would be expended. The executive on the other hand must, *inter alia,* act with great responsibility, manage all resources frugally and without wastage, and ensure that the monies generated by taxation are used to direct economic activity in such a manner that would benefit all citizens of this country. In this context, a greater responsibility lies on executive and administrative institutions to act in accordance with their mandate in the performance of their duties. This Court shall continue to exercise its Constitutional role as the *sentinel on the qui vive* over executive and administrative action.

**Summary of the Determination**

We are of the opinion that subject to the following amendments being moved at the Committee Stage of Parliament as proposed by the learned Deputy Solicitor General, the Bill as a whole is not inconsistent with the provisions of the Constitution:

Clause 3

The insertion of the following proviso after the second proviso in Section 10(1) – *"provided further, for the purposes of paragraph (vii), the requirement for the registration shall arise from the date on which this (Amendment) Act comes into operation."*

Clause 4(1)

The reference to *"September 30, 2022"* to be deleted and substituted with *"November 30, 2022"*.

Clause 4(2)

The reference to *"October 1, 2022"* to be deleted and substituted with *"December 1, 2022"*.

We place on record our appreciation of the assistance given by the learned Deputy Solicitor General who represented the Hon. Attorney-General, the learned President's Counsel and the learned Counsel who appeared for the Petitioners.

**JAYANTHA JAYASURIYA, PC**
**CHIEF JUSTICE**

**S. THURAIRAJA, PC, J**
**JUDGE OF THE SUPREME COURT**

**ARJUNA OBEYESEKERE, J**
**JUDGE OF THE SUPREME COURT**

## II

## 2022 නොවැම්බර් මස 14වන දින විශේෂ ආරක්ෂක විධිවිධාන

2022 நவம்பர் 14ஆம் திகதிய விசேட பாதுகாப்பு ஏற்பாடுகள்

SPECIAL SECURITY ARRANGEMENTS ON 14TH NOVEMBER, 2022

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2022 නොවැම්බර් මස 14 වැනි සඳුදා ගරු මුදල් අමාත්‍යතුමා විසින් 2023 වර්ෂය සඳහා අය වැය කථාව ඉදිරිපත් කිරීමට අදාළව පහත සඳහන් විශේෂ ආරක්ෂක විධිවිධාන කලින් වසරවලදී සිදු කළ ආකාරයටම ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා බව සියලු ගරු මන්ත්‍රීවරුන් වෙත මෙයින් දන්වනු කැමැත්තෙමි.

- 2022 නොවැම්බර් මස 11 වැනි සිකුරාදා ආරක්ෂක වැඩ පිළිවෙළ පහත සඳහන් ආකාරයට සිදු කරනු ලබන බව දන්වනු කැමැත්තෙමි.

  මන්ත්‍රීවරුන්ගේ විවේක කාමර, ඇඳුම් අල්මාරි ද ඇතුළුව සමස්ත පාර්ලිමේන්තු ගොඩනැගිල්ලම මෙදින ආරක්ෂක පරීක්ෂාවට ලක් කරනු ලැබේ.

- 2022 නොවැම්බර් මස 14 වැනි සඳුදා ආරක්ෂක වැඩ පිළිවෙළ පහත සඳහන් ආකාරයට සිදු කරනු ලබන බව ද දන්වනු කැමැත්තෙමි.

(අ) මහජන ගැලරිය රාජ්‍යතාන්ත්‍රික අමුත්තන් සඳහා පමණක් සීමා කරනු ලැබේ.

(ආ) පාර්ලිමේන්තු රථගාල මෙදින වසා තබන බැවින්, මන්ත්‍රීවරුන් පැමිණෙන වාහන අදාළ රථගාල් වෙත යොමු කරනු ලැබේ.

(ඇ) මෙදින පාර්ලිමේන්තුවට පැමිණීමේ දී, හැකිතාක් දුරට රියැදුරෙකු කැටුව පැමිණෙන ලෙස ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

(ඈ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින්ම තම රථය පදවාගෙන එන්නේ නම්, එම මන්ත්‍රීවරුන්ගේ වාහන නියමිත රථගාල වෙත ධාවනය කර ගාල් කරවීම පිණිස මන්ත්‍රී පිවිසුමෙහි පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට අයත් රියැදුරන් එම සේවාවේ යොදවනු ලැබේ.

(ඉ) මෙදින රථ වාහන පොලීසිය සහ සමීප පොලිස් ස්ථාන මඟින් විශේෂ රථ වාහන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.

ඉහත සඳහන් විශේෂ ආරක්ෂක විධිවිධාන සම්බන්ධව සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය අපේක්ෂා කරන බව ද කාරුණිකව දන්වනු කැමැත්තෙමි.

## III

## පාර්ලිමේන්තුවේ අයවැය කාර්යාලය පිහිටුවීම සඳහා වන මූලික පනත් කෙටුම්පත පිළිබඳ සාකච්ඡා කිරීමේ විශේෂ රැස්වීම

பாராளுமன்ற வரவு செலவுத்திட்ட அலுவலகத்தைத் தாபிப்பதற்கான அடிப்படைச் சட்ட வரைவு பற்றிய விசேட கூட்டம்

SPECIAL MEETING ON DRAFT BILL FOR ESTABLISHMENT OF PARLIAMENTARY BUDGET OFFICE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

"පාර්ලිමේන්තුවේ අයවැය කාර්යාලය පිහිටුවීම සඳහා වන මූලික පනත් කෙටුම්පත" පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන දේශපාලන පක්ෂ නායකයන් සහ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයන් සහභාගි වන විශේෂ රැස්වීමක් ගරු අග්‍රාමාත්‍යතුමාගේ සහභාගිත්වයෙන් 2022 නොවැම්බර් 10 වැනි බ්‍රහස්පතින්දා, එනම් අද දින අපර භාග 2.00ට කාරක සභා කාමර අංක 02 හි දී මාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට නියමිත බැවින්, මෙම රැස්වීම සඳහා දැනුම්දීම් ලැබ ඇති සියලුම ගරු මන්ත්‍රීවරයන් ඊට සහභාගි වන ලෙස මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

PAPERS PRESENTED

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2020 සහ 2021 වර්ෂ සඳහා ශීර්ෂ අංක 04 - උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ කාර්ය සාධන වාර්තා.- [අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවට ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2020 වර්ෂය සඳහා ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2020 වර්ෂය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා ප්‍රවාහන හා මහාමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2021 වර්ෂය සඳහා නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.- [ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

2021 වර්ෂය සඳහා මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.- [ගරු විදුර වික්‍රමනායක මහතා]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
## அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු මහින්ද අමරවීර මහතා (කෘෂිකර්ම අමාත්‍ය සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - கமத்தொழில் அமைச்சரும் வனசீவராசிகள் மற்றும் வனவளங்கள் பாதுகாப்பு அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera- Minister of Agriculture and Minister of Wildlife and Forest Resources Conservation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

(i) 2020/2021 වර්ෂ සඳහා සී/ස ලංකා පොස්පේට් සමාගමේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2020 වර්ෂය සඳහා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ වාර්ෂික වාර්තාව.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC - Minister of Justice, Prison Affairs and Constitutional Reforms)

Hon. Speaker, I present the Report of the Ministerial Consultative Committee on Justice, Prisons Affairs and Constitutional Reforms on the Code of Criminal Procedure Act, No. 15 of 1979 (Amendment) Bill, which was referred to the Committee.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## II

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

Hon. Speaker, I present the Report of the Ministerial Consultative Committee on Justice, Prisons Affairs and Constitutional Reforms on -

- Poisons, Opium and Dangerous Drugs (Amendment) Bill; and
- Kandyan Marriage and Divorce (Amendment) Bill,

which were referred to the Committee.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු කථානායකතුමනි, වැලිවේරිය, ඇඹරළුව උතුර, අංක 122/2 දරන ස්ථානයෙහි පදිංචි එම්.ඒ. විජේනායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனு பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petition ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -1515/2022- (2), ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, මොකක්ද කාරණය?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්න නිසා මම මේ කාරණය කියන්න ඕනෑ. ගරු කථානායකතුමනි, ඔබතුමාත් වැඩිහිටියෙක්. ඒ වාගේම මේ ගරු සභාවේ ඉන්න අපි බොහෝ දෙනෙක් වැඩිහිටියෝ. නමුත්, අසරණ දුප්පත් වැඩිහිටියන්ට ගෙවන වැඩිහිටි දීමනාව මාස තුනකින් සමෘද්ධි බැංකුවලින් ගෙවලා නැහැ. ඒ අය තැපැල් කන්තෝරුවෙන් තමයි ඒ දීමනාව වෙනදාට ගන්නේ. පසුව ආණ්ඩුවෙන් කිව්වා, ඒ දීමනාව ගෙවීම සඳහා සමෘද්ධි බැංකුවල ගිණුමක් ආරම්භ කරන්න කියලා. නමුත්, මාස තුනකින් එම වැඩිහිටි දීමනාව ගෙවලා නැහැ. අසරණ වැඩිහිටියන්ට සොච්චම් මුදලක් තමයි මේ දීමනාවෙන් හම්බ වෙන්නේ. රටේ දැන් පවතින ආර්ථික අර්බුදය තුළ ඒ අයට ඒකත් ලොකු දෙයක්. හැබැයි, ඒකවත් හම්බ වෙන්නේ නැති තත්ත්වයක් තමයි දැන් තිබෙන්නේ. ඒ නිසා අපි සභානායකතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා, වැඩිහිටි දීමනාව නිසියාකාරයෙන් ලබා දීම සඳහා කඩිනමින් පියවර ගන්න, ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන්න කියලා.

## ඉපලෝගම පොලිස් ස්ථානය: ස්ථිර ගොඩනැගිල්ලක් සහ නිල වාහනයක් ලබාදීම
## இபலோகம பொலிஸ் நிலையம் : நிரந்தரக் கட்டிடம் மற்றும் உத்தியோகபூர்வ வாகனம்
## IPALOGAMA POLICE STATION: PROVISION OF PERMANENT BUILDING AND AN OFFICIAL VEHICLE

1525/2022

**2. ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) ඉපලෝගම පොලිස් ස්ථානය පවත්වාගෙන යාම සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් නොමැතිවීම හේතුවෙන් මේ වන විට එම පොලිස් ස්ථානය පවත්වාගෙන යාම සඳහා "රණජයපුර" නිවාස සංකීර්ණයට අයත් නිවාස භාවිත කරනු ලබන බවත්;

(ii) මෙම පොලිස් ස්ථානයට අදාළ බලප්‍රදේශය සඳහා ග්‍රාම නිලධාරි වසම් 33ක් අයත් වන බවත්;

(iii) එම පොලිස් ස්ථානයට ලබා දී ඇති නිල රථය භාවිත කිරීමට නුසුදුසු තත්ත්වයක පවතින බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) එම පොලිස් ස්ථානය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට පියවර ගෙන තිබේද;

(ii) පොලිස් ස්ථානයේ භාවිතය සඳහා නව නිල රථයක් ලබා දීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இபலோகம பொலிஸ் நிலையத்தைப் பேணிச்செல்வதற்காக நிரந்தரமான கட்டிடமொன்று இல்லாமையால், இன்றளவில் அப்பொலிஸ் நிலையத்தைப் பேணிச்செல்வதற்கென "ரணஜயபுர" வீடமைப்புத் தொகுதிக்குச் சொந்தமான வீடுகள் பயன்படுத்தப்படுகின்றன என்பதையும்;

(ii) மேற்படி பொலிஸ் நிலையத்திற்கான ஆளுகைப் பிரதேசமானது, 33 கிராம உத்தியோகத்தர் பிரிவுகளை உள்வாங்குகின்றது என்பதையும்;

(iii) மேற்படி பொலிஸ் நிலையத்துக்கு வழங்கப்பட்டுள்ள உத்தியோகபூர்வ வாகனம் பயன்படுத்த முடியாத நிலையில் உள்ளது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி பொலிஸ் நிலையத்துக்கென நிரந்தரக் கட்டிடமொன்றை நிர்மாணிப்பதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுள்ளனவா என்பதையும்;

(ii) பொலிஸ் நிலையத்தின் பாவனைக்காகப் புதியதோர் உத்தியோகபூர்வ வாகனத்தை வழங்குவதற்கான நடவடிக்கையை மேற்கொள்வாரா என்பதையும்;

(iii) ஆமெனில், குறிப்பிட்ட திகதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

( இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security:

(a) Is he aware that -

(i) houses belonging to the "Ranajayapura" housing scheme are used to run the Ipalogama Police Station in the Anuradhapura District as there is no permanent building to house that police station;

(ii) 33 Grama Niladhari Divisions fall under the purview of the above-mentioned police station; and

(iii) the official vehicle that has been provided to that police station is not in a running condition?

(b) Will he inform this House -

(i) whether steps have been taken to construct a permanent building for that police station;

(ii) whether steps would be taken to provide a new official vehicle for the use of that police station; and

(iii) if so, the date on which it would be done?

(c) If not, why?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මහජන ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) ඔව්.

(ආ) (i) පොලිස් ස්ථානය මේ වන විට පවත්වාගෙන යනු ලබන රණජයපුර ත්‍රිවිධ හමුදා නිවාස සංකීර්ණ භූමියේ (පර්චස් 10 බැගින් වූ එක සමාන බිම් කොටස් 02ක්) පිහිටා ඇති ගොඩනැඟිලි 02ක් ශ්‍රී ලංකා පොලීසිය වෙත පවරාගෙන ඇත.

එම බිම් ප්‍රමාණය හා ගොඩනැඟිලි පොලිස් ස්ථානය පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් නොවන බැවින් ඉපලෝගම ග්‍රාම නිලධාරි වසමේ රූඩ් 03, පර්චස් 2.8ක ඉඩමක් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින අතර, අදාළ නිර්දේශ මේ වන විට ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමු කර ඇත.

නමුත්, අංක 03/2021 රාජ්‍ය වියදම් පාලනය අය වැය චක්‍රලේඛය අනුව රජයේ ආයතන සඳහා ගොඩනැඟිලි ඉදිකිරීම වසර දෙකකින් කල් දැමීමට උපදෙස් ලබා දී ඇති බැවින් හා යෝජිත ඉඩම විධිමත්ව ශ්‍රී ලංකා පොලීසිය වෙත පැවරී නොමැති බැවින්, නව ගොඩනැඟිල්ලක් ඉදිකිරීම සඳහා කටයුතු ආරම්භ කර නොමැත.

(ii) පොලිස් ස්ථානය සතු ජීප් රථ දෙක අලුත්වැඩියා කටයුතු සඳහා යොමු කර ඇති අතර, මේ වන විටත් පොලිස් ස්ථානය වෙත තාවකාලිකව අංක 32-5667 "ඉසුසු ටෲපර්" වර්ගයේ ජීප් රථයක් නිකුත් කර ඇත.

(iii) 2022.09.02වන දින ජීප් රථය ලබා දී ඇත.

(ඇ) පැන නොනඟී.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, අපේ නාවික හමුදාව 1950.12.09වන දා තමයි ආරම්භ කර තිබෙන්නේ. යුද හමුදාව 1949.10.10වන දා ආරම්භ කර තිබෙනවා. ගුවන් හමුදාව 1951.03.02වන දා ආරම්භ කර තිබෙනවා. සිවිල් ආරක්ෂක බලකාය 1986.01.01වන දා ආරම්භ කර තිබෙනවා. ශ්‍රී ලංකා පොලීසිය ආරම්භ කර තිබෙන්නේ 1866.09.03වන දා. ගරු කථානායකතුමනි, ලංකාවේ තිබෙන ආරක්ෂක අංශවලින් පරණම දෙපාර්තමේන්තුව තමයි, පොලිස් දෙපාර්තමේන්තුව. දැනට එහි 84,000ක නිලධාරින් ප්‍රමාණයක් සේවයේ යෙදී සිටිනවා.

හැබැයි, ඒ අයට බරපතළ අසාධාරණයක් වෙනවා, ගරු ඇමතිතුමනි. මම ඉහතින් කියපු සියලු ආරක්ෂක අංශවලට ආහාර දීමනාවක් දෙනවා. නමුත්, පොලීසියේ අයට බරපතළ අසාධාරණයක් වෙනවා. රටේ ආරක්ෂාව, නීතියේ ආධිපත්‍යය ඇති කරන්න ඕනෑ කියලා තමන්ගේ රාජකාරිය ඉටු කරන්න රෑ දවල් මහන්සි වෙන පොලීසියේ අයට 1948 නිදහස ලබා ගත් කාලයේ ඉඳන් බරපතළ අසාධාරණයක් වෙලා තිබෙනවා. මේ ගැන විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ, ගරු ඇමතිතුමනි. කිහිප වතාවක් මම මේ ගැන පාර්ලිමේන්තුවේ කථා කළා. නමුත් තවම සාධාරණයක් වෙලා නැහැ. *[බාධා කිරීමක්]* නැහැ, ගරු ඇමතිතුමනි. තවම සාධාරණයක් වෙලා නැහැ. ඒකත් ප්‍රශ්නයක් තමයි. තවමත් ඔවුන්ට ඒ අසාධාරණය වෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා පාසල්වල මත් ද්‍රව්‍ය පාවිච්චි කිරීම සම්බන්ධයෙන් මේ දවස්වල අපි කථා කරන බව. එදා කුඩු ගැහුවේ කවුද? බෙබද්දොයි, රස්තියාදුකාරයොයි. අද කුඩු ගහන්නේ කවුද? එදා අපි කිව්වා, කුඩු ගැහුවේ නාගරික පාසල්වල කියලා. අද උතුරේ වෙන්න පුළුවන්, නැඟෙනහිර වෙන්න පුළුවන්, සමස්ත රටම කුඩු ගහනවා. ඒ වාගේම, මත් ද්‍රව්‍ය භාවිත කරනවා; අයිස් කියන මත් ද්‍රව්‍යය භාවිත කරනවා. දැන් මේක ඉතා බරපතළ ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා, ගරු ඇමතිතුමනි. කලින් තරුණයෝ තමයි කුඩු ගැහුවේ. දැන් කෙල්ලොත් කුඩු ගහනවා.

ඊළඟට, තවත් ප්‍රශ්නයක් තිබෙනවා. ගරු කථානායකතුමනි, දැන් රට අරක්කුවල මිල වැඩි වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ නිසා ගම්වල කසිප්පු, කටුකම්බි නිෂ්පාදන වැඩි වෙලා තිබෙනවා. මේ හේතුව නිසා කාන්තාවකට නාන තොටුපොළ තුළ නාන්න බැහැ, බස්වල යන්න බැහැ. ඒ නිසා බරපතළ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා, ගරු ඇමතිතුමනි. මේකට වහාම විසඳුමක් දෙන්න ඕනෑ. පොලීසියේ අයගෙන් අපි කථා කරලා අහනකොට කියනවා, "අපිට පොලීසියේ නිලධාරින් අඩුයි, තෙල් නැහැ, වාහන නැහැ" කියලා.

පොලීසියේ නිලධාරින් අඩු ඇයි කියලා අහනකොට කියනවා, ඒ අය special duty එකකට දාලා තිබෙනවා කියලා. කාටද මේ special duty එකක් දාලා තිබෙන්නේ? අපේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉන්නවා නේ, ඥානා අක්කා. ඇය වෙනුවෙනුත් special duty කියලා පොලීසියේ අය දමලා තිබෙනවා. මේ විධියට special duty කියලා දාලා, මේ රටේ නීතියේ ආධිපත්‍යය නැති කරන්නේ නැතිව වහාම ඒ වෙනුවෙන් වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ.

ගරු ඇමතිතුමා නීති හදලා තිබෙනවා. හැබැයි, තවම නීතිය හරියට ක්‍රියාත්මක වෙලා නැහැ. මේ මත් ද්‍රව්‍ය උවදුර නිසා අනාගතය භාර ගන්න ඉන්න දරුවන්ට හොඳ දෙයක් වෙන්නේ

නැහැ. ඒ නිසා අනිවාර්යයෙන්ම ඒ වෙනුවෙන් කටයුතු කරන්න කියලා ඔබතුමාගෙන් මම ඉල්ලා සිටිනවා, ගරු ඇමතිතුමනි.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඒ වෙනුවෙන් කටයුතු කරන්නම්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සියලුදෙනා එකට එක්කහු වෙලා කටයුතු කරමු.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඔබතුමා කටයුතු කරන්න කියා කිව්ව නිසා අප ඒ වෙනුවෙන් කටයුතු කරනවා, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]* ඔබතුමා මගෙන් ඉල්ලීමක් නේ කළේ, ගරු මන්ත්‍රීතුමා. ප්‍රශ්නයක් නොවෙයි ඔබතුමා ඇහුවේ. ඉතින් මම කිව්වා, ඒ වෙනුවෙන් කටයුතු කරනවා කියලා.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ප්‍රශ්නයක් තමයි මම ඇහුවේ.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඔබතුමා ප්‍රශ්නයක් නොවෙයි ඇහුවේ. ඔබතුමා මගෙන් ඉල්ලීමක් කළේ. *[බාධා කිරීමක්]* ඉතින් ඔබතුමා ප්‍රශ්නය අහන්න කෝ.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ගරු ඇමතිතුමනි, ඒ වෙනුවෙන් ඔබතුමන්ලා ගන්න පියවර මොනවාද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කියපු කාරණය එතුමා කරනවා. එච්චරයි.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
පොලිස් දෙපාර්තමේන්තුව මඟින් ඒ සඳහා පියවර ගැනීමට කටයුතු කරනවා. අධ්‍යාපන අමාත්‍යාංශය වශයෙන් අප ඒ සඳහා පියවර ගනිමින් සිටිනවා. අද හවස සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව තිබෙන්නේ මේ මත් ද්‍රව්‍ය උවදුර සම්බන්ධයෙන්. ඒ අවස්ථාවේදී මම සියලු කරුණු ටික ඉදිරිපත් කරන්නම්.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ගරු කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය අපේ මයන්ත දිසානායක මන්ත්‍රීතුමා අහනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා අතුරු ප්‍රශ්න දෙකක් ඇහුවා, ගරු මන්ත්‍රීතුමා. පොලිස් නිලධාරින්ගේ ආහාර දීමනාව පිළිබඳ ප්‍රශ්නය සහ මත් ද්‍රව්‍ය පිළිබඳ ප්‍රශ්නය එක ප්‍රශ්නයක් නොවෙයි, ප්‍රශ්න දෙකක්.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ඒ එක ප්‍රශ්නයක්, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමා, දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
ගරු සභානායකතුමනි, මේ ප්‍රශ්නය අහනකොට විෂය භාර ඇමතිතුමා මේ ගරු සභාවේ හිටියා නම් හොඳයි කියා මට හිතෙනවා. *[බාධා කිරීමක්]* හොඳයි, මම ප්‍රශ්නය අහන්නම්.

ගරු ඇමතිතුමනි, තරිඳු උඩුවරගෙදර කියන මාධ්‍යවේදියා නොවැම්බර් මාසයේ 08වැනි දා CID එකට කැඳවා තිබුණා. ඒ වාගේම තරිඳු ජයවර්ධන මාධ්‍යවේදියාත් නොවැම්බර් මාසයේ 14වැනි දා CID එකට කැඳවා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ නම් දෙක මම විශේෂයෙන්ම කියන්න ඕනෑ. ඒ අය කැඳවා තිබෙන්නේ, Facebook එකේ ගිය post එකක් share කරපු හින්දා. ගරු ඇමතිතුමනි, මේ වාගේ තත්ත්වයකට ඉංග්‍රීසි භාෂාවෙන් කියන්නේ, "very slippery slope" කියලා. තරුණ ජනමාධ්‍යවේදීන් මේ විධියට ඉලක්ක කරගෙන තිබෙන්නේ ඉහළින්ම එන orders නිසාය කියනවා. ඒ කවුද කියලා මම නම සඳහන් කරන්නම්. දේශබන්ධු තෙන්නකෝන් මහත්මයාගේ නම සඳහන් වෙලා තිබෙනවා. ඉහළින්ම එන නියෝග කියලා ඒ ගොල්ලන්ව නිතරම අත් අඩංගුවට ගන්නවා. මේ රටේ තිබෙන ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ආරක්ෂා කරනවා වෙනුවට ජනමාධ්‍යවේදීන්ට මේ විධියට සැලකීම ඉතා භයානකයි කියන එක විශේෂයෙන් මේ උත්තරීතර සභාවට මා දැනුම් දෙන්න ඕනෑ.

මම අහන ප්‍රශ්නය මෙයයි, ගරු ඇමතිතුමනි. ආණ්ඩුව මේ විධියට කටයුතු කළොත්, අනාගතයේදී මේ රටේ අනිවාර්යයෙන්ම තව අරගළයක් ඇති වෙනවා. මතක තියා ගන්න, ලෝකයේ විශාල අරගළ ඇති වුණේ, විශේෂයෙන්ම තරුණයන් පාරට බැහැලා අරගළ කරපු නිසා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් මෙන්න මේ ඉල්ලීම කරනවා. ඇත්තටම කනගාටුයි, මේ විෂයභාර ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ නැති එක ගැන. මේ විධියට ජනමාධ්‍යයට හිරිහැර, කරදර කරන එක වහාම නතර කරන්න කියලා තමයි මම මේ අවස්ථාවේ ඉල්ලා සිටින්නේ.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඒ ප්‍රශ්නය විෂයභාර ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්නම්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3 -1673/2022 - (1), ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ජාතික පාසල්: ගම්පහ දිස්ත්‍රික්කය
## தேசியப் பாடசாலைகள்: கம்பஹா மாவட்டம்
## NATIONAL SCHOOLS: GAMPAHA DISTRICT

1896/2022

**4. ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ ඇති ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;
(ii) ඒවායේ නම් කවරේද;
(iii) "සෞභාග්‍යයේ දැක්ම" වැඩසටහන යටතේ ජාතික පාසල් බවට පත් කරන ලද පාසල් සංඛ්‍යාව කොපමණද;
(iv) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත (අ) (iv)හි සඳහන් පාසල් තෝරා ගැනීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;
(ii) ජාතික පාසල් බවට පත් කරනු ලබන පාසල්වලට ලබා දෙනු ලබන පහසුකම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கம்பஹா மாவட்டத்திலுள்ள தேசியப் பாட சாலைகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;
(ii) அவற்றின் பெயர்கள் யாவையென்பதையும்;
(iii) "சுபிட்சத்தின் நோக்கு" வேலைத்திட்டத்தின்கீழ் தேசியப் பாடசாலைகளாக மாற்றப்பட்ட பாட சாலைகளின் எண்ணிக்கை எத்தனை என்ப தையும்;
(iv) அவற்றின் பெயர்கள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி (அ) (iv)இல் குறிப்பிடப்பட்டுள்ள பாடசாலைகளைத் தெரிவுசெய்கையில் பின் பற்றப்பட்ட வழிமுறை யாதென்பதையும்;
(ii) தேசியப் பாடசாலைகளாக மாற்றப்படும் பாட சாலைகளுக்கு வழங்கப்படும் வசதிகள் யாவை யென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House-
(i) the number of National Schools in the Gampaha District;
(ii) the names of those schools;
(iii) the number of schools that were converted into National Schools under "Vistas for Prosperity and Splendour" programme; and
(iv) the names of those schools?

(b) Will he also inform this House -
(i) the methodology followed in selecting the schools mentioned in (a) (iv) above; and
(ii) the facilities provided to the schools that were converted into National Schools?

(c) If not, why?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 20කි.
(ii) ඇමුණුම 01හි සඳහන් කර ඇති ආකාරයට පහත පරිදි වේ.

ගම්පහ දිස්ත්‍රික්කයේ ජාතික පාසල්:

1. නිව්ස්ටඩ් බාලිකා විද්‍යාලය, මීගමුව
2. හරිස්චන්ද්‍ර විද්‍යාලය, මීගමුව
3. බණ්ඩාරනායක විද්‍යාලය, ගම්පහ
4. රත්නාවලී බාලිකා විද්‍යාලය, ගම්පහ
5. ශ්‍රී ධර්මාලෝක විද්‍යාලය, කැලණිය
6. සියනෑ ජාතික පාසල, දොම්පේ
7. ශ්‍රී පඤ්ඤානන්ද ජාතික පාසල, රද්දොළුව
8. නාලන්දා පිරිමි මධ්‍ය විද්‍යාලය, මිනුවන්ගොඩ
9. ගුරුකුල විද්‍යාලය, කැලණිය
10. ක්‍රිස්තුරාජ මධ්‍ය මහා විද්‍යාලය, තුඩැල්ල, ජා-ඇල
11. බණ්ඩාරනායක මධ්‍ය මහා විද්‍යාලය, වෙයන්ගොඩ
12. සෙනරත් පරණවිතාන ජාතික පාසල, උඩුගම්පොළ
13. ශාන්ත අන්තෝනි ජාතික පාසල, වත්තල
14. ඩී.එස්. සේනානායක මධ්‍ය මහා විද්‍යාලය, මීරිගම
15. ගලහිටියාව මධ්‍ය මහා විද්‍යාලය, ගණේමුල්ල.
16. විහාර මහාදේවි බාලිකා විද්‍යාලය, කිරිබත්ගොඩ

17. ශ්‍රී සංඝබෝධි මධ්‍ය මහා විද්‍යාලය, නිට්ටඹුව
18. හේනේගම මධ්‍ය මහා විද්‍යාලය, හේනේගම
19. ගම්/දේවි බාලිකා විද්‍යාලය, දොම්පේ
20. අල් මුබාරක් විද්‍යාලය, මල්වාන

(iii) 01කි.

(iv) ගම්/ දේවි බාලිකා විද්‍යාලය, දොම්පේ.

ගරු කථානායකතුමනි, මම මීට කලින් අවස්ථාවේදීත් කිව්වා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනාවලියට මත්තෙන් තමයි මේ අදහස ඉදිරිපත් කර තිබුණේ කියලා. ඔබතුමන්ලා සියලුදෙනා මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න කැඳවන්න මේ වනකොට කටයුතු කර තිබෙනවා. ඊළඟ සති දෙකේ කමිටු අවස්ථාවේදී, පළාතෙන් පළාත යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්ති රාමුව සහ පරිපාලනමය වශයෙන් කරන්නා වූ වෙනස්කම් සූදානම් කර තිබෙන ආකාරය පැහැදිලි කිරීමට මම බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා සහභාගි වන ලෙස මම ආරාධනා කරනවා.

සිදු කිරීමට යන එම වෙනස්කම් අනුව, දැනට තිබෙන කලාප 100, 120ක් වෙනවා. කොට්ඨාස කාර්යාල වෙනුවට School Boards 550ක් එනවා. පර්ෂද 1,200ක් එනවා. හැම පර්ෂදයකම 8 සිට 10 දක්වා කුඩා පාසල් ප්‍රමාණයක් තිබෙන්න පුළුවන්. එයින් ප්‍රමුඛ පාසල් එකක්, දෙකක් හෝ කොළඹ වාගේ තැන්වල තුනක් වෙන්න පුළුවන්. අපි ඒවා නම් කරන්නේ ප්‍රමුඛ පාසල් හැටියට. එතකොට ජාතික, ජාතික නොවන කියලා භේදයක් මතු කරන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, මේ ජාතික පාසල් බවට පරිවර්තනය කිරීමේ වැඩසටහනත් එක්ක ගුරු මාරුවීම්, ගුරු ස්ථානගත කිරීම් යන සියලු කටයුතුවල විශාල අර්බුදයක් මතු වෙලා තිබෙනවා. ඒ නිසා දැනට යෝජනා කර තිබෙන්නේ ජාතික මට්ටමේ එක පාසලක්වත් නැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට එක පාසලක් බැගින් ලබා දීමටයි. එවැනි කොට්ඨාස 124ක් තිබෙනවා. දැනට 24කට දීලා තිබෙනවා. ඉතිරි 100 ලබන අවුරුද්දේ ඒ නිර්ණායක අනුව තෝරාගෙන, ප්‍රමුඛ පාසල් බවට පත් කරනවා. ගම්පහ දිස්ත්‍රික්කයේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම අඩුම තරමින් ජාතික මට්ටමේ පාසලක් තිබෙනවා. ඒ නිසා ප්‍රමුඛතාව ලැබෙන්නේ එසේ නොමැති දුෂ්කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලටයි.

(ආ) (i) පාසල් තෝරා ගැනීම පාසල් සිතියම්කරණ - school mapping - තාක්ෂණික ක්‍රමවේදය හරහා ක්‍රියාත්මක කරන ලදී. එම පාසල්, නිර්ණායක 10ක් ඔස්සේ තෝරාගෙන ඇත.

ඊට අදාළ නිර්ණායක ඇමුණුම 02හි දැක්වෙන අතර, එම තෝරා ගැනීම්වලට අදාළව නිකුත් කර ඇති චක්‍රලේඛය ඇමුණුම 03හි දක්වා ඇත.

ඇමුණුම් 02 සහ 03 **සභාගත*** කරමි.

පාසල් සිතියම්කරණය තව සතියකින් අවසන් වෙනවා. මේ වනවිට පළාත් හයක එම කටයුතු අවසන් කර තිබෙනවා. මම හිතන විධියට අද අපේ නිලධාරින් කටයුතු කරන්නේ නැඟෙනහිර පළාතේ. ඒ වැඩකටයුතු ටික අවසන් වුණු ගමන් mappings සියල්ලම ගැන ඔබතුමන්ලා සමඟ සාකච්ඡා කරනවා. ඒ කියන්නේ, කලාප කාර්යාල සංඛ්‍යාව වැඩි වෙන්නේ කොහොමද, ඊට අනුරූපව School Boards වැඩි වෙන්නේ කොහොමද, ඊට අනුරූපව පර්ෂද ඇති වෙන්නේ කොහොමද, එයින් ප්‍රමුඛ පාසල් හැටියට නම් කර ගන්නේ මොනවාද යන කරුණු සාකච්ඡා කරනවා. අනිවාර්යයෙන්ම තිබෙන ජාතික පාසල ප්‍රමුඛ පාසලක් වෙනවා. හැබැයි, පළාත් පාසලක් වුණත්, ජාතික මට්ටමේ තිබෙන පාසල් ප්‍රමුඛ පාසල් බවට නම් කරලා ඒ පාසල් සමූහය, හයෙන් ඉහළ ද්විභාෂා, උසස් පෙළ විෂය ධාරා හතරම තිබෙන පාසල් බවට ඊළඟ අවුරුද්දේදී පරිවර්තනය කරන්න අපේක්ෂා කරනවා. ඒ නිසා, ඊට අදාළ නිර්ණායක පිළිබඳ දැන් ගැටලුවක් මතු වන්නේ නැහැ.

(ii) මෙම පාසල්වල අවශ්‍යතා පදනම් කරගත් පාසල් පාදක සැලසුම් මත පාසල්වලට ලබා දෙනු ලබන පහසුකම් තීරණය කරනු ලැබේ.

පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව අනුව තම පාසලේ තිබිය යුතු භෞතික හා මානව සම්පත් ප්‍රමාණය නිර්ණායක අනුව පාසල් විසින් ගණනය කර තම අවශ්‍යතා සපුරා ගැනීමට පාසල් මට්ටමේ සැලසුම් මඟින් ඉල්ලුම් කරයි.

එම අවශ්‍යතා වාර්ෂිකව අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා වෙන් කරනු ලබන ප්‍රතිපාදන මත ප්‍රමුඛතාකරණය කර ලබා දෙනු ලැබේ. පළාත් සභා වැය ශීර්ෂ යටතේ පළාත් සභා වෙත වෙන් කරන මුදල්වලින් පළාත් පාසල් සඳහා ප්‍රතිපාදනය කරනු ලැබේ.

(ඇ) පැන නොනඟී.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඇමතිවරයා වෙනස් වෙන වෙන සැරේට අධ්‍යාපන ප්‍රතිපත්තිත් වෙනස් වෙලා අධ්‍යාපනයට වෙන් කරන විශාල මුදල් ප්‍රමාණයක් වතුරේ යනවා. පාසල් දරුවන් රක්ෂණය කරන -ළමා රක්ෂණ- වැඩසටහනක් යහ පාලන ආණ්ඩුව කාලයේ ඇති කළා. නමුත්, අද ඒ වැඩසටහන ක්‍රියාත්මක වන්නේ නැහැ.

පසුගිය කාලයේ එක ඇමතිවරයෙක් පටන් ගත්තා, "ළඟම පාසල හොඳම පාසල" කියලා වැඩසටහනක්. ඒ අනුව, ගමේ තිබෙන පාසලට සල්ලි දීලා ළඟම පාසල හොඳම පාසල කරන්න ගියා. සාමාන්‍යයෙන් ජාත්‍යන්තරය පිළිගන්නේ පන්ති කාමරයක ඉන්න ඕනෑ ළමයි ප්‍රමාණය 30දෙනක් කියලා. නමුත්, අධිකරණය දුන් නියෝගයක් අනුව එම ප්‍රමාණය ළමයි 35දෙනකු දක්වා වැඩි කර තිබුණා. ඊට පස්සේ ඒකට appeal එකක් දාලා ළමයින් සංඛ්‍යාව 40දෙනකු කළා. ළමයි 35දෙනකු maintain කරගෙන ආපු එක එකපාරට 40දෙනකු කිරීම තුළ, "ළඟම පාසල-හොඳම පාසල" කියන concept එක බිඳිලා අද ගමේ පාසල් ටික වැහෙන තත්ත්වයකට පත් වෙලා තියෙනවා. මොකද, ළමයි ටික වෙනත් පාසල්වලට ඇදිලා ගිහිල්ලා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

ගරු කථානායකතුමනි, ඊට පස්සේ තවත් අධ්‍යාපන ඇමතිවරයෙක් ඇවිල්ලා "දහතුන් වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන" කියලා එකක් ඉදිරිපත් කළා. ඒකෙදි විෂයයන් 20ක් විතර හඳුන්වා දුන්නා. අද සමහර පාසල්වලට ඒ විෂයන් උගන්වන ගුරුවරුත් නැහැ. ඒ විෂයන් උගන්වන්න ඉන්නා ගුරුවරුන්ටත් මේ පාසල් වැහිලා ගිහිල්ලා නිසා උගන්වන්න විධියක් නැහැ. විශේෂයෙන්ම මේ දහතුන්වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන හරහා තාක්ෂණ විෂයයන් හඳුන්වා දුන්නා. මේකෙදි මැහුම්, ගෙතුම්, කෑම-බීම පිසීම වැනි දේවලුත් උගන්වනවා. හැබැයි, ඒ ඉන්න ගුරුවරුනුත් ඒ විෂයයන්වලට ආකර්ෂණයක් දක්වන්නේ නැහැ. මේ යටතේ automobile studies, electrical and electronic studies, welding, plumbing වාගේ දේවල් තිබුණත්, ඒවා ඉගැන්වීම සඳහා ගුරුවරු නැති හින්දා ඒ විෂයයන්වලට ඉල්ලුමක් නැති වෙලා ඒ පාසල් වැහෙන තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. ඒ වැඩසටහන වෙනුවෙන් ඒ අදාළ පාසල්වලට භාණ්ඩ ලබා දුන්නා. ඒ අතරේ, packing කඩපු නැති භාණ්ඩ තවමත් ගම්පහ දිස්ත්‍රික්කයේ පාසල්වල අනන්ත අප්‍රමාණව තිබෙනවා.

ඊට පස්සේ මේ රජය ඇවිල්ලා ජාතික පාසල් වැඩසටහන ගෙනාවා. ඒ කියන්නේ, පාසල් පද්ධතියේ දැනට ක්‍රියාත්මක වන පාසල් අතරින් තෝරාගත් පාසල් ජාතික පාසල් ලෙස වැඩිදියුණු කිරීම තුළින් ජාතික පාසල් සංඛ්‍යාව 1,000ක් දක්වා ඉහළ නංවන වැඩ පිළිවෙළක් ගෙන ආවා. ගරු ඇමතිතුමනි, ඊට අදාළ චක්‍රලේඛය අනුව එසේ තෝරා ගත් පාසලක් ජාතික පාසලක් ලෙස විවෘත කිරීමේ උත්සවයටත් රුපියල් ලක්ෂයක් දුන්නා. එනම්, සමරු ඵලකය ගහලා ජාතික පාසලක් කියලා විවෘත කරන්න රුපියල් ලක්ෂයක් දුන්නා. පාසල් පද්ධතියේ "ජාතික පාසලක්" කියලා නම ගහන්නත් රුපියල් ලක්ෂ 2ත්, 4ත් අතර මුදලක් එක පාසලකට වියදම් කළා. නමුත්, අද වන විට ඒ කටයුත්ත නතර වෙලා තිබෙනවා. මේ විධියට විවිධ ඇමතිවරුන් විවිධ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරගෙන යද්දී අධ්‍යාපනය වෙනුවෙන් වියදම් කරන්න තිබෙන සොච්චම් මුදලත් අහක යනවා. එක එක කාලෙට එන ඇමතිවරුන් එක එක ප්‍රතිපත්ති හදලා ක්‍රියාත්මක කිරීම නිසා, පැවැති ආණ්ඩුවේ ව්‍යාපෘති ඊළඟට එන ආණ්ඩුවේ ඇමතිවරුන් ක්‍රියාත්මක නොකිරීම නිසා මුදල් කොච්චර නම් අහක යනවාද? එසේ නොවීම සඳහා නිසි වැඩ පිළිවෙළක් නැද්ද? මේ වාගේ ප්‍රතිපත්ති තීන්දු ගන්න කොට යම් සාධනීය ක්‍රමවේදයකට, තිරසාර ක්‍රමවේදයකට ප්‍රතිපත්ති තීන්දු ගන්නා වැඩ පිළිවෙළක් අධ්‍යාපන අමාත්‍යාංශය භාර ඔබතුමා වෙතින්වත් නිර්මාණය වන්නේ නැද්ද කියා මම අහනවා, ගරු ඇමතිතුමනි.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කරනු ලබන්නේ ජාතික අධ්‍යාපන කොමිසම විසින්. ජාතික අධ්‍යාපන කොමිසම විසින් මීළඟ අවුරුදු 10 සඳහා -2023 සිට 2033 දක්වා- දස අවුරුදු ජාතික ප්‍රතිපත්ති සැලැස්මක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ ප්‍රතිපත්ති සැලැස්මට අනුරූපව තමයි අපි යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සියල්ල සමපාත කරලා තිබෙන්නේ, align කරලා තිබෙන්නේ. ඔබතුමා කියපු ජාතික පාසල් 1,000 පිළිබඳ කාරණය ගත්තොත්, පාසලකට "ජාතික" කියලා නම දැම්මෙන් වැඩක් වෙන්නේ නැහැ. ඒ පාසල ජාතික මට්ටමට ගෙනෙන්න ඕනෑ.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ඉතින්, ඒ දවස්වල බෝඩ් ගැහුවා නේ.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඒක බෝඩ් ගහපු අයගෙන් අහගන්න. මම ඒකට සම්බන්ධ වුණේ නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ඔබතුමා ඒකට සම්බන්ධ නැහැ තමයි. නමුත්- *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
පොඩ්ඩක් ඉන්න, මම කියන කල්. හැබැයි, ඒ අදහස අපතේ යන්නේ නැහැ. හේතුව මේකයි. School clusters 1,200ක් ඇති වනකොට, ඒ 1,200ට අදාළව ප්‍රමුඛ පාසලක් වන්නේ දැනට තිබෙන ජාතික පාසලක් හෝ යෝජිත ජාතික පාසලක්. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් ඉන්න.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ කාරණය ගැන අවධානය යොමු කරන නිසා මම ඔබතුමාගෙන් එක ප්‍රශ්නයක් අහනවා. පාසල් 1,000ක් ජාතික පාසල් මට්ටමට ගෙන ආවාම ඒ පාසල්වල සේවය කරන සියලුදෙනා පළාත් නවයක පළාත් රාජ්‍ය සේවාවෙන් රාජ්‍ය සේවයට එන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට හිතාගන්න පුළුවන්ද නේද, පරිපාලනමය වශයෙන් ඒක කොයි තරම් දුෂ්කර වැඩක්ද කියලා?

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මම ඒක පිළිගන්නවා. නමුත්, රුපියල් ලක්ෂ ගණනක් වියදම් කරලායි ඒ බෝඩ් ගැහුවේ. ඒවාට වියදම් වුණු මුදල් කාගෙන්ද අය කර ගන්නේ?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
බෝඩ් එක ගැහුවා කියලා ප්‍රශ්නයක් නැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
එතකොට ඒ බෝඩ්වලට වියදම් කළ මුදල්?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඒ මුදල් පසුගිය කාලයේ වැය කරලා අවසන් කර තිබෙනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
එතකොට, ඒ බෝඩ් එක අහක දමනවාද?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
නැහැ. බෝඩ් එක අහක යන්නේ නැහැ නේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ඇයි, "ජාතික පාසල" කියලා නේ බෝඩ් එකේ ගහලා තිබෙන්නේ.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
"ජාතික" වෙනුවට "ප්‍රමුඛ" කියලා වෙනස් කරන්න විතරයි තිබෙන්නේ. එච්චරයි!

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මම ඔබතුමා කියන කාරණය පිළිගන්නවා. ඔබතුමා හරි. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ- *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මම හරි දේ තමයි කරන්නේ. *[බාධා කිරීමක්]* අහගෙන ඉන්න, ගරු මන්ත්‍රීතුමා.

මම ඔබතුමාට කාරණය පැහැදිලිව කියන්නම්. "ජාතික පාසල" කියන බෝඩ් එක ගැසීමෙන් පාසලක් "ජාතික" වන්නේ නැහැ. මම ඒකට ඔබතුමාට හොඳ උදාහරණයක් කියන්නම්. එක්තරා වකවානුවක බදුල්ල දිස්ත්‍රික්කයේ පාසල් 28ක් ජාතික පාසල් බවට පරිවර්තනය කළා. මම ඒවායේ නම් කියන්නද? ඒවායෙන් එකක්, හල්දුම්මුල්ලේ පිහිටි වල්හපුතැන්න විද්‍යාලය. අද ඒ පාසලේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව කීයද? තවත් එකක්, දියතලාවේ ජනජය විද්‍යාලය. තවත් එකක්, දියලුම මහා විද්‍යාලය. ඔය විදියට කියාගෙන යන්න පුළුවන්, පාසල් 28ක නම්. අද ඒ හැම පාසලකම ශිෂ්‍ය සංඛ්‍යාව 400ට වඩා අඩුයි. බෝඩ් එකක් ගැසීමෙන් ඒ පාසල් "ජාතික" වුණේ නැහැ. ඒකට හොඳම උදාහරණය මා කියන්නම්. ඔබතුමාට පාර්ලිමේන්තුවට එන අතරමඟ දකින්න පුළුවන්, රේවත විද්‍යාලය. ගම්සභා හන්දියෙන් මෙපිටට එනකොට උසාවිය පහු කළාම තිබෙනවා, රේවත විද්‍යාලය. ඒ පාසලේ බෝඩ් එක "රේවත රාජකීය විද්‍යාලය" කියා වෙනස් කළා. දැන් ඔබතුමා කිව්වා නේ "ජාතික" කියන වචනය ගැන. එදා ඔබතුමන්ලාගේ ආණ්ඩුවේම හිටපු අධ්‍යාපන ඇමතිවරයෙක් "රේවත රාජකීය විද්‍යාලය" කියලා එම විද්‍යාලයට නම දැම්මා. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් අහගන්න, ඉතින්.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ඔබතුමන්ලාගේ හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා නේ,-

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
නැහැ, නැහැ. ඒ කථාව නොවෙයි, මේක පොඩ්ඩක් අහගන්න, ගරු මන්ත්‍රීතුමා. මම මේ කාටවත් දොස් කියනවා නොවෙයි. ඉතිහාසයේ වෙච්ච දේ කියන්නේ. පොඩ්ඩක් අහගන්න. එදා ඒ පාසලේ ළමයි 600ක් හිටියා. අද ඉන්නේ කීයද? ළමයි 97යි. එහෙම නම්, බෝඩ් එක මාරු කිරීමෙන් පාසලක් "ජාතික" හෝ "රාජකීය" වන්නේ නැහැ කියන එක පැහැදිලියි නේ.

ඒ නිසා ඔබතුමන්ලා සියලු දෙනාගේ සහයෝගයෙන් ඊළඟ සති දෙක තුළ මම පළාත් මට්ටමින් මන්ත්‍රීවරුන් කැඳවා, හදා තිබෙන ප්‍රතිපත්ති රාමුවට එකඟතාව අරගෙන පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ගේනවා. *[බාධා කිරීමක්]* ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමා ඒ ගැන හොඳට දන්නවා. අප ඔක්කෝම එකතු වෙලා ඒක සම්මත කළාම, කාලයකට වෙනස් නොවන ප්‍රතිපත්තියකට අනුව කටයුතු කරන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ, විවිධ සංකල්ප ඉදිරිපත් වෙන්න පුළුවන්. හැබැයි, ඒවාත් අපතේ නොයවා කරගෙන යන වැඩ පිළිවෙළකට තමයි අප අවතීර්ණ වන්නේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ඔබතුමා අද අධ්‍යාපන ඇමති වෙලා ඔහොම කිව්වාට, පසුගිය කාලයේ ඒ විධියට බෝඩ් ගැහුවේ ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ නියෝගය අනුව මේ රජය යටතේම එවකට අධ්‍යාපන අමාත්‍යාංශය භාරව හිටපු ඇමතිවරයාම තමයි. එසේ කරලා තවම එච්චර කාලයක් ගත වෙලා නැහැ. රටේ ජනතාවගේ සල්ලිවලින් එවැනි වැඩ කරලා අධ්‍යාපනයට වෙන් කරපු මුදල් සහ දෙමව්පියන්ගේ බලාපොරොත්තු තමයි සුන් කර දැම්මේ.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මේකයි. ගරු ඇමතිතුමනි, ළමයින්ට පාසලෙන් ආහාර වේලක් ලබා දෙනවා නේ. ඔබතුමා හොඳ වැඩක් කළා. එසේ ලබා දෙන කෑම වේලක වටිනාකම රුපියල් 30 ඉඳලා රුපියල් 60 දක්වා වැඩි කළා. ඒ වාගේම ජපානයෙන් හම්බ වෙන සහල්, චීනයෙන් හම්බ වෙන සහල් ආධාර වශයෙනුත් දෙනවා. හැබැයි, ඒ supplierගෙන් අය කරනවා කියලාත් කිව්වා. මම කියන්නේ එහෙම කරන්න එපා කියලා. මොකද, අද වනවිට බිත්තරයත් රුපියල් 50ක් වෙද්දී, මේ කෑම වේලක් රුපියල් 60කට දෙන්න බැහැ කියන එක ඕනෑම කෙනෙකුට තේරෙනවා. ඒ නිසා එහෙම සල්ලි කපන්න එපා, ගරු ඇමතිතුමනි.

ගරු ජනාධිපතිතුමා ඊයේ පෙරේදා දවසක ප්‍රකාශ කළා, තවත් ළමුන් දසලක්ෂයක් සඳහා ආහාර වේලක් ලබා දීමට කටයුතු කරනවා කියලා. ඒ සඳහා යම් වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස මා ඉල්ලා සිටිනවා. අපි දන්නවා, දුෂ්කර පාසල්වල ළමයින් හැමෝටම දිවා ආහාර වේලක් ලැබෙන බව. නමුත් දුෂ්කර නැති සමහර පාසල් තිබෙනවා. ගම්පහ පවා එවැනි පාසල් තිබෙනවා. ඒ පාසලක ළමයින් 1,000ක් ඉන්නවා නම්, ඒ අය අතරින් 200ක වාගේ පිරිසක් ආහාර වේලක් ගන්න බැරිව ඉන්නවා. ඒ පාසල්වල සියලු ළමයින්ට එසේ ආහාර වේලක් ලබා දීමේ අවශ්‍යතාවක් නැහැ. ඒ නිසා අලුතින් ළමුන් දසලක්ෂයකට ආහාර වේලක් ලබා දීමේදී ඒ සඳහා ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් සැදිය යුතුයි. ග්‍රාම නිලධාරි හරහා අඩු ආදායම් මට්ටමක් ලබන පවුල් සොයා බලා ඒ පවුල්වල සිටින පාසල් යන දූ දරුවන්ට ආහාර වේලක් ලබා දෙන වැඩ පිළිවෙළක් තිබෙනවාද? එහෙම නැත්නම්, වෛද්‍ය පරීක්ෂණ හරහා දරුවන්ගේ BMI අගය අඩුවීම කියන කාරණය සැලකිල්ලට ගෙන, විනිවිදභාවයෙන් යුතු වැඩ පිළිවෙළක් යටතේ දැනට යම් වැඩසටහනක් මේ වෙනුවෙන් සකස් කර තිබෙනවාද? එහෙමත් නැත්නම්, පරණ ක්‍රමවේදයටම ද මේ වැඩ පිළිවෙළත් කරගෙන යන්නේ?

ගරු ඇමතිතුමනි, මට නැවත ප්‍රශ්නයක් අහන්න අවස්ථාවක් නැති නිසා මා තවත් කාරණයක් ගැන කියන්න ඕනෑ.

මහපොළ ශිෂ්‍යත්වලාභීන් ගැනත් ඔබතුමන්ලා හිතන්න. මේ මහපොළ ශිෂ්‍යත්වය ලබා දෙන්නේ මහපොළ භාරකාර අරමුදලට ලැබෙන බැංකු පොලියෙන්. මමත් මහපොළ ශිෂ්‍යත්වලාභියෙක්. මම අධ්‍යාපනය හැදෑරුවේ විශේෂ කුසලතා ශිෂ්‍යත්වයෙන්. බැංකු පොලිය අද දෙගුණයකින්, තුන්ගුණයකින් වැඩිවෙලා තිබෙනවා. මහපොළ භාරකාර අරමුදලට ලැබෙන පොලියෙන් තමයි මහපොළ ශිෂ්‍යත්වය දෙන්නේ. ඉතින්, බැංකු පොලිය වැඩි කර තිබෙන මේ වෙලාවේ මහපොළ ශිෂ්‍යත්වලාභියෙකුට මාසයකට ලබාදෙන රුපියල් 5,000ක දීමනාව, දෙගුණයක් -රුපියල් 10,000ක්- කිරීමේ හැකියාවක් නැද්ද, ගරු ඇමතිතුමනි? බැංකු පොලිය වැඩි කර තිබෙන කාලසීමාව තුළ විතරක් හෝ ඒ අයට

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

වැඩි මුදලක් ලබා දෙන්න පුළුවන් නම් හොඳයි. ඒ කාරණය ගැනත් හිතලා, විශ්වවිද්‍යාල දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් යම් වැඩ පිළිවෙළක් නිර්මාණය කරලා තිබෙනවාද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අසන අවස්ථාවේදී ප්‍රශ්න දෙකක්ම ඇහුවා. එතකොට ඔබතුමා අතුරු ප්‍රශ්න 3ක් අසා තිබෙනවා. ඒකට කමක් නැහැ, මම ඔබතුමාගේ ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙන්නම්.

දැනට අධ්‍යාපන අමාත්‍යාංශයට වෙන් කර තිබෙන වැය ශීර්ෂය යටතේ ළමයින් ලක්ෂ 11කට තමයි පෝෂණය -ආහාර වේලක්- ලබා දෙන්නේ. එක් දරුවකු වෙනුවෙන් ආහාර වේලක් ලබාදීමට දිනකට රුපියල් 30ක මුදලක් මුලින් වෙන් කළා. නමුත්, ඒ මුදල මදි නිසා පසුව එය රුපියල් 60 දක්වා වැඩි කළා. හැබැයි, සාමාන්‍යයෙන් මේ මුදල රුපියල් 100ක් වත් විය යුතුයි. මේ වන විට චීනයෙන් ලැබුණු සහල් මෙට්‍රික් ටොන් 5,000 ඒ වෙනුවෙන් බෙදා අවසන් කර තිබෙනවා. තවත් සහල් මෙට්‍රික් ටොන් 5,000ක් ලැබීමට නියමිතව තිබෙනවා. ඒකත් අපි මේ වැඩසටහන සඳහා ලබා දෙනවා. ඊළඟට, ලෝක ආහාර වැඩසටහන - World Food Programme - යටතේ සහල් මෙට්‍රික් ටොන් 1,500ක් අපිට ලැබුණා. ඒකත් දැන් බෙදා හරිමින් තිබෙනවා. විශේෂයෙන්ම hostels තිබෙන පාසල්වලට ඒ ටික ලබා දෙන්න අපි කටයුතු කරනවා. ඒ අතරතුර මම කොළඹ නගරයේ නියමු ව්‍යාපෘතියක් ආරම්භ කළා. කොළඹ නගරයේ පාසල් 144ක දරුවන් 184,000ක් ඉන්නවා. ඒ අතරින් පාසල් 21ක් ජාතික පාසල්. පාසල් 20ක් රජයේ ආධාර ලබනවා. මේ සියල්ල පිළිබඳව සමීක්ෂණය කර බැලුවාම, සමහර පාසල් ඒ පාසල තුළම දිවා ආහාරයක් නොමැති දරුවන්ගේ ප්‍රශ්නය විසඳාගෙන තිබෙනවා. ඊට අමතරව ප්‍රමුඛ පාසල් විසින්, එහෙම නැත්නම් ජාතික මට්ටමේ පාසල් විසින් කුඩා පාසල් බලා කියා ගන්නවා. කිසිදු ආකාරයක පිළිසරණක් නැති පාසල් 18ක් අපට හම්බ වුණා. ඒ පාසල් 18 තුළ සිටින සියලුම දරුවන්ට -දරුවෝ 4,175කට- නොවැම්බර් මස පළමුවැනිදා ඉඳලා අපි දිවා ආහාර වේල ලබා දෙනවා. ඒ සඳහා මම වැඩසටහනක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. මේක නියමු ව්‍යාපෘතියක් විතරයි. *[බාධා කිරීමක්]* කොළඹ නගරයේ. *[බාධා කිරීමක්]* ඔව්. පොඩ්ඩක් ඉන්න, ගරු මන්ත්‍රීතුමා. මේ වැඩසටහන ජනවාරි මස පළමුවැනිදා ඉඳලා දිවයින පුරා ක්‍රියාත්මක කරන්න මම කටයුතු කරගෙන යනවා. දැනට දරුවන් ලක්ෂ 11කට තමයි මේ ආහාර වේල ලබා දෙන්නේ. ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරපු කැබිනට් පත්‍රිකාවක් මඟින් ඒ ප්‍රමාණය ලක්ෂ 21 දක්වා වැඩි කිරීමට යෝජනා කර තිබෙනවා. ඒ සඳහා දැනට අරමුදල් සම්පාදනය කර ගනිමින් සිටිනවා. ඒ සඳහා අවශ්‍ය චක්‍රලේඛ අපි මේ වර්ෂය තුළ නිකුත් කරනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නයට පිළිතුර මෙයයි. මහපොළ ශිෂ්‍යත්වය ලැබෙන්නේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් 110,000ක විතර පිරිසකටයි. දැනට ඒ අය වෙනුවෙන් මාසිකව රුපියල් 5,500ක් ගෙවනවා. සංවර්ධන ලොතරැයි මණ්ඩලය හරහා ලැබෙන මුදල් වැනි ආධාරවලින් තමයි අපි ඒ ශිෂ්‍යාධාර ගෙවන්නේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු ඇමතිතුමනි, මහපොළ භාරකාර අරමුදලට ලැබෙන බැංකු පොලියෙන් තමයි මේ මුදල් ගෙවන්නේ. දැන් බැංකුවල පොලී ප්‍රතිශතය වැඩි කරලා නේ තිබෙන්නේ.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
පොඩ්ඩක් ඉන්න, ගරු මන්ත්‍රීතුමා. බැංකු පොලී ප්‍රතිශතය වැඩි වුණේ දැනට මාස 3කට විතර කලින් නේ. පොලිය මාස 3කට කලින් වැඩි වුණා කියලා ඒක උපචිත - accrue - වෙලා, ගිණුම්වලට ඒ ටික ආවා කියලා නේ ඔබතුමන්ලා කියන්නේ. එක පැත්තකින්, දැන් පොලී අනුපාත වැඩියි කියලා කියනවා. මමත් ඒක පිළිගන්නවා. අද බැංකු පොලී අනුපාතය වැඩියි. පොලී අනුපාතය අද සියයට 32 දක්වා ඉහළ ගිහිල්ලා තිබෙනවා. මේක අනිවාර්යයෙන්ම සියයට 20න් පල්ලෙහාට එන්න ඕනෑ. ඊළඟ මාස 3, 4 ඇතුළත විශේෂයෙන්ම රජයේ බැංකුවල මුදල් සැපයුම හා ද්‍රවශීලතාව කියන කරුණුත් එක්ක බැංකු පොලී අනුපාතය ක්‍රමානුකූලව පහළට එනකොට ඔය පොලී අනුපාතය නැවත පහළට යනවා. ගරු මන්ත්‍රීතුමනි, දැන් පොලී අනුපාත වැඩිවෙලා මාස 3ක් විතර වුණා කියලා, පොලිය උපචිත වෙලා ගිණුමටවත් වැටිලා නැහැ. *[බාධා කිරීමක්]* ඔබතුමා මම කියන දේ පොඩ්ඩක් අහගන්න කෝ. මමත් අවුරුදු 9ක් විතර රාජකාරි කළේ බැංකුවක නේ, ගරු මන්ත්‍රීතුමා. මම බැංකු විභාගයත් කරලා තමයි එළියට ආවේ. උපචිත පොලිය - accrued interest - කියන්නේ මොකක්ද කියලා ඔබතුමා දන්නවාද? උපචිත පොලිය කියන්නේ, යම් deposit එකකට හෝ යම් දෙයකට ලැබෙන්නා වූ පොලියයි. ඒ උපචිත පොලිය අවුරුද්දකට පස්සේ තමයි ගිණුමට නැවත වැටෙන්නේ. නමුත්, පොලී අනුපාත වැඩිවෙලා තවම මාස 3යි. ඉතින් ඒක ගිණුමට වැටෙන්න වෙලාවක් නැහැ. මම පිළිගන්නවා, ඒ ශිෂ්‍යත්වලාභීන්ට ලැබෙන මුදල ප්‍රමාණවත් නැහැ කියලා. හැබැයි, මාසයකට, දෙකකට කලින් පොලී අනුපාත ඉහළ ගිය පමණින්, ඒ පොලිය අනුව ගණන් හදන්න බැහැ. දැනට අපි වෙනත් විකල්ප සොයනවා, කොහොමද මේ මුදල වැඩි කරන්නේ කියලා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු කථානායකතුමනි, මට පැහැදිලි කර ගැනීමක් කරගන්න තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද?

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු ඇමතිතුමනි, දැන් කොහොම හරි පොලිය වැඩිපුර ලැබෙනවා නේ.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
නැහැ නේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ලබන අවුරුද්දේ හරි වැඩිපුර පොලිය ලැබෙනවා නේ.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඒක අවිනිශ්චිතයි.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
එතකොට ඒ වැඩිවන පොලී මුදල නොදී ඉන්නවා ද?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
පොලිය සියයට 27, සියයට 32 විතර දක්වා විවිධ slabs අනුව වැඩි වුණේ පසුගිය මාස 3ක පමණ කාලයක ඉඳලායි.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
එතකොට ඒ මාස තුනක පොලිය,-

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඒ මාස තුනේ පොලිය account එකට එන්නේ අවුරුද්දකට පස්සේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
අවුරුද්දකට පස්සේ හරි ලැබෙනවා නේ. එතකොට ඒ සල්ලිවලින් දෙන්න පුළුවන් නේ.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඊළඟ මාස 9 දක්වාම මේ පොලී ප්‍රතිශතය තියේවි කියන එකට තිබෙන guarantee එක මොකක්ද? එහෙම අවිනිශ්චිත කාරණාවක් ගැන උපකල්පනය කරලා ගණන් හදන්න බැහැ. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා, රීති ප්‍රශ්නයක්ද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ගරු අධිකරණ ඇමතිතුමාත්, ගරු අධ්‍යාපන ඇමතිතුමාත් මේ මොහොතේ ගරු සභාවේ සිටින නිසා මට එතුමන්ලාගෙන් පොඩි පැහැදිලි කර ගැනීමක් කරගන්න තිබෙනවා.

ඒ, මෙන්න මේ කාරණය ගැන. නීති විද්‍යාලයේ ශිෂ්‍යයන්ගේ විභාග ගැන ගරු සභාවේ කිහිප වතාවක්ම ප්‍රශ්න කළා. ලබන මාසයේ දෙවැනි දා තමයි විභාගය පැවැත්වෙන්නේ. ඒ අයට සිංහල මාධ්‍යයෙන් හෝ දෙමළ මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටින්න තිබෙන අවස්ථාව ඉතා අවාසනාවන්ත විධියට නැති කරලා තිබෙනවා. ගරු අධිකරණ ඇමතිතුමාව අපි පෞද්ගලිකව මුණ ගැහිලා මේ ගැන කථා කළාම එතුමා අපට කියා සිටියා එය නිවැරදි කරන්න පියවර ගන්නවා කියලා. ගරු ඇමතිතුමාගෙන් මම අහන්න කැමැතියි, ඔබතුමා ඒ සම්බන්ධයෙන් ගත යුතු පියවර ගත්තා ද, එහි වර්තමාන තත්ත්වය මොකක් ද කියලා.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමන්ලා මීට කලිනුත් කිහිප වතාවක්ම මේ කාරණය පිළිබඳව ප්‍රශ්න කළා. මම අවස්ථා කිහිපයකදී ඒ සම්බන්ධයෙන් නීති අධ්‍යයන කවුන්සලයට ලිව්වා. ඊයේ දිනයේත් මා ලිපියක් ලිව්වා, මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම 2026 ජනවාරි 01වැනි දා වනතෙක් තව වසර තුනකට කල් දමන්න කියලා. කෙසේ වෙතත්, 2020 දී පළ කළ ගැසට් පත්‍රය තවමත් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නැහැ. එම නිසා නීති අධ්‍යයන කවුන්සලයට මම දැනුම් දුන්නා, මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමේ අවශ්‍යතාව තිබෙන බව. පාර්ලිමේන්තුවේ සහ සමාජයේ මේ පිළිබඳව අදහස් දක්වපු අතිබහුතරයකගේ අදහස්වලට අනුකූලව තමන්ගේ මවු බසින් විභාගයට ලියන්න තිබෙන අයිතිය අඩුම වශයෙන් තව වසර තුනකටවත් සුරක්ෂිත කරන්න ඕනෑ කියලා මම ඊයේ දිනයේ දී දැනුම් දුන්නා. ඊට ප්‍රතිචාර ලැබුණු වහාම මම ඔබතුමන්ලාට ඒ පිළිබඳව දැනුම් දෙන්නම්.

## විදුලි වැට ඉදිකිරීම: කුරුණෑගල දිස්ත්‍රික්කය
### மின்சார வேலிகளை அமைத்தல்: குருநாகல் மாவட்டம்
### CONSTRUCTION OF ELECTRIC FENCE : KURUNEGALA DISTRICT

2001/2022

**5. ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ අභයභූමිවල සහ වනාන්තරවල සැරිසරන වනඅලින් සංඛ්‍යාව කොපමණද;

(ii) ජනතාව සහ ඔවුන්ගේ දේපළ එම වනඅලින්ගෙන් ආරක්ෂා කර ගැනීම පිණිස විදුලි වැට ඉදිකිරීමට සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම එක් එක් විදුලි වැට ඉදිකිරීමට අපේක්ෂා කරනු ලබන ගම, එම ගම අයත්වන ග්‍රාම නිලධාරි වසම සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) එම එක් එක් විදුලි වැට ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු කර ඇති මුදල, ඉදිකිරීම් ආරම්භ කරනු ලබන දිනය සහ අවසන් කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வனசீவராசிகள் மற்றும் வனவளங்கள் பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குருநாகல் மாவட்டத்திலுள்ள சரணாலயங்கள் மற்றும் காடுகளில் நடமாடித் திரிகின்ற காட்டு யானைகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி காட்டு யானைகளிடமிருந்து மக்களை யும் அவர்களது சொத்துக்களையும் பாதுகாப் பதற்காக யானை வேலிகளை அமைப்பதற்குத் திட்டமிடப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், குறித்த ஒவ்வொரு யானை வேலியையும் அமைப்பதற்கு எதிர்பார்க்கும் கிராமம், கிராம அலுவலர் பிரிவு மற்றும் பிரதேச செயலகப் பிரிவு என்பன வெவ்வேறாக யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

(ஆ) குறித்த ஒவ்வொரு யானை வேலியையும் அமைப் பதற்காக மதிப்பீடு செய்யப்பட்டுள்ள தொகை, நிர்மாணப் பணிகள் ஆரம்பிக்கப்படும் திகதி மற்றும் நிறைவுசெய்யப்படுவதற்கு எதிர்பார்க்கப்படும் திகதி என்பன வெவ்வேறாக யாவையென்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Wildlife and Forest Resources Conservation:

(a) Will he inform this House -

(i) the number of wild elephants inhabiting the sanctuaries and forests of Kurunegala District;

(ii) whether plans have been made to construct electric fences to protect the people and their property from wild elephants; and

(iii) if so, the village, Grama Niladhari Division and Divisional Secretary's Division where each electric fence is expected to be constructed, separately?

(b) Will he also inform this House of the estimated amount for construction, date of commencement of construction and expected date of completion for each of the said electric fences, separately?

(c) If not, why?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) වනඅලි සංඛ්‍යාව 400ත්, 450ත් අතර වේ.

(ii) එම වනඅලීන්ගෙන් ජනතාව හා ඔවුන්ගේ දේපළ ආරක්ෂා කර ගැනීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගල්ගමුව, නිකවැරටිය, අඹන්පල, මහව හා ගිරිබාව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 05 ආවරණය වන පරිදි ප්‍රධාන විදුලි වැට කි. මී. 255ක් පමණ දුරට ඉදිකර ඇත.

මෙම සෑම විදුලි වැටක්ම බහුකාර්ය සංවර්ධන සහායකයන් හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් නඩත්තු කරනු ලබන අතර, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් සෘජුවම අධීක්ෂණය කරනු ලබයි. එමෙන්ම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගල්ගමුව, ඇහැටුවැව හා නිකවැරටිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල උග්‍ර වනඅලි ගැටුම පවතින ගම්මාන වටා ග්‍රාමීය විදුලි වැටවල් 18ක් ඉදිකර නඩත්තු කටයුතු සඳහා ග්‍රාමීය ගොවි සංවිධාන හා සිවිල් සංවිධාන වෙත භාර දී ඇත.

(iii) ඔව්. පහත වගුවේ දැක්වේ.

| අනු අංකය | විදුලි වැටේ නම | ආවරණය වන ගම් | ග්‍රාම නිලධාරි වසම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | විදුලි වැටේ දිග | මේ වන විට තත්ත්වය |
|---|---|---|---|---|---|---|
| 01 | කෝන් වැව | කෝන් වැව | කෝන් වැව | ගල්ගමුව | 06 කි.මී. | 100% |
| 02 | වඩුගම | වඩුගම | වඩුගම | ගල්ගමුව | 06 කි.මී. | 90% |
| 03 | දේවගිරිපුර - කට්ටකඩුව - ඉහළගම | දේවගිරිපුර - කට්ටකඩුව - ඉහළගම | කට්ටකඩුව | ගල්ගමුව | 06 කි.මී. | 100% |
| 04 | ගනේදිවුල්වැව | ගනේදිවුල්වැව | ගනේදිවුල්වැව | ගල්ගමුව | 01.1/2 කි.මී. | 100% |
| 05 | විහාර මාවත (ගනේදිවුල්වැව 11) | ගනේදිවුල්වැව | ගනේදිවුල්වැව | ගල්ගමුව | 01.1/2 කි.මී. | 100% |
| 06 | මඩදොඹේ - දඹරන්පොළ | මඩදොඹේගම | මඩදොඹේගම | ගල්ගමුව | 01.1/2 කි.මී. | 90% |
| 07 | කදුරුවැව | කදුරුවැව | කදුරුවැව | ඇහැටුවැව | 08 කි.මී. | 100% |
| 08 | රත්නදිවුල්වැව | රත්නදිවුල්වැව | රත්නදිවුල්වැව | ඇහැටුවැව | 09 කි.මී. | 90% |
| 09 | ඉපලෝගම 01 | ඉපලෝගම | 167 ඉපලෝගම | මහව | 07.1/2 කි.මී. | 80% |
| 10 | පහළ නෙත්තිපළ | පහළ නෙත්තිපළ | 136 යද්දගම | මහව | 04.1/2 කි.මී. | 75% |
| 11 | නාවන | නාවන | නාවන වසම | කොටවෙහෙර | 07 කි.මී. | 90% |
| 12 | දුම්මලගහ කොටුව | දුම්මලගහ කොටුව | නාවන වසම | කොටවෙහෙර | 04 කි.මී. | 90% |
| 13 | මොන්නැකුලම | දලුපතගම | මොන්නැකුලම | කොටවෙහෙර | 11 කි.මී. | 75% |

**2022 වර්ෂයේ ESCAMP ව්‍යාපෘතිය මඟින් ඉදිකරමින් පවතින විදුලිවැටවල විස්තර**

| අනු අංකය | විදුලි වැටේ නම | ආවරණය වන ගම් | ග්‍රාම නිලධාරි වසම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | විදුලි වැටේ දිග | මේ වන විට තත්ත්වය |
|---|---|---|---|---|---|---|
| 01 | කෝන්වැව | කෝන්වැව | කෝන්වැව | ගල්ගමුව | 06 කි.මී. | 100% |
| 02 | වඩුගම | වඩුගම | වඩුගම | ගල්ගමුව | 06 කි.මී. | 90% |
| 03 | දේවගිරිපුර - කට්ටකඩුව - ඉහළගම | දේවගිරිපුර - කට්ටකඩුව - ඉහළගම | කට්ටකඩුව | ගල්ගමුව | 06 කි.මී. | 100% |

(ආ) ඔව්.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉදි කිරීමට සැලසුම් කර ඇති කි.මී. 32 සඳහා අවශ්‍ය විදුලි වැට උපකරණ මිලදී ගෙන ඇති අතර, 2022 වර්ෂයේ ඉදි කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කර තිබියදී ඇති වූ ආර්ථික ගැටලු හේතුවෙන් මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති ජාතික අයවැය චක්‍රලේඛ 3/2022 හා 2022.04.26 අනුව විදුලි වැට ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නවතා ඇති අතර, මෙම විදුලි වැට 2023 වර්ෂයේ නැවත ඉදිකිරීමට සැලසුම් කර ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

පිළිතුරු ලබා දුන්නාට ස්තුතියි, ගරු ඇමතිතුමනි. මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ වනකොට අලි-මිනිස් ගැටුම ඉතාම උග්‍රවෙලා තිබෙනවා. ඒ තත්ත්වය වසරින් වසර වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා, මේ වෙනුවෙන් විශේෂ වැඩ පිළිවෙළක් යොදන්න වෙනවා, ගරු ඇමතිතුමනි. පසුගිය "The Sunday Times" පුවත් පතේ "Dearth of wildlife officers and other factors cited for wild elephant attacks" යන ශීර්ෂය යටතේ ලිපියක් තිබෙනවා. එහි සඳහන් කර තිබෙන්නේ විශේෂයෙන්ම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ගත් තොරතුරු. 2020 වර්ෂයේ අලින් පහර දීම නිසා මිනිසුන් 112දෙනෙක් මැරිලා තිබෙනවා; අලින් 328ක් මැරිලා තිබෙනවා. 2021 වර්ෂයේ අලින් පහර දීම නිසා මිනිසුන් 142දෙනෙක් මැරිලා තිබෙනවා; අලින් 375ක් මැරිලා තිබෙනවා. මේ වසරේ අගෝස්තු මාසය වනකොට අලින් පහර දීම නිසා මිනිසුන් 104දෙනෙක් මැරිලා තිබෙනවා; අලින් 320ක් මැරිලා තිබෙනවා. මා ළඟ තිබෙන මෙම ලේඛනයේ වසර ගණනාවක තොරතුරු තිබෙනවා. අලින් පහර දීමෙන් මිය ගිය මිනිසුන්ගේ සහ මිය ගිය අලින්ගේ සංඛ්‍යාලේඛන ඇතුළත් මේ ලේඛනය මා **සභාගත*** කරනවා.

මේක එන්න-එන්නම උග්‍ර වන ප්‍රශ්නයක්. මොකද, අලින් ජීවත් වුණු කැලෑ ප්‍රදේශ දැන් එළිවෙලා තිබෙනවා. ඒක නිරන්තරයෙන් දිගින්-දිගටම සිදුවෙලා තිබෙනවා. ඒ අනුව අලින් ගම්වැදිලා තිබෙනවා. ගම් පුළුල් වෙලා මිනිසුනුත් ගම් ඇතුළට ගිහින් තිබෙනවා. අලි ඉන්න තවත් රටවල් ලෝකයේ තිබෙනවා. එවැනි රටවල් මේ සම්බන්ධයෙන් ගෙන තිබෙන ක්‍රියාමාර්ග පිළිබඳවත් සලකා බලා, මේ ප්‍රශ්නය විසඳීම සඳහා ඔබතුමාට යම් සැලැස්මක් තිබෙනවාද? මේක අවුරුද්දක්, අවුරුදු දෙකක් තිස්සේ එන ප්‍රශ්නයක් නොවෙයි, දීර්ඝ කාලීනව එන ප්‍රශ්නයක්.

ගරු ඇමතිතුමනි, ඔබතුමාට ඉස්සර වෙලා හිටපු වනජීවී අමාත්‍යවරුනුත් මේ ප්‍රශ්නයට විසඳුම් හෙව්වා. ඒ නිසා මේ සඳහා ස්ථිරසාර විසඳුමක්, එහෙම නැත්නම් ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්න ඔබතුමාට සැලැස්මක් තිබෙනවාද?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය පිළිබඳව අපි දැනටමත් සාකච්ඡා ගණනාවක් පවත්වා තිබෙනවා. ඒ වාගේම අවශ්‍ය විශේෂඥ දැනුමත් ලබාගෙන තිබෙනවා. 2011 වසරේදී මේ සම්බන්ධයෙන් සමීක්ෂණයක් කර තිබෙනවා. ඒ අනුව, ඒ වන විට වනඅලි 5,879ක් ඉඳලා තිබෙනවා. 2011 වසරේ තමයි ඒ ගණන් බැලීම සිදු කරලා තිබෙන්නේ. ඊට පසුව නම් සමීක්ෂණයක් කරලා නැහැ. නමුත් අපට වාර්තා කරලා තිබෙනවා, දැන් ඒ ප්‍රමාණයේ විශාල වශයෙන් වැඩිවීමක් තිබෙන බව. එතකොට දැන් වනඅලි වැඩි වෙනවා, අලින්ට ඉන්න තිබෙන භූමිය අඩු වෙනවා. රටේ සංවර්ධන කටයුතුවලදී, විශේෂයෙන්ම මහවැලි ව්‍යාපාරයේ ඉඳලා මොරගහකන්ද ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘති සහ අධිවේගී මාර්ග, ක්‍රීඩා පිටි, ගොඩනැඟිලි ආදී රජයේ ඉදිකිරීම් බොහොමයක් කරලා තිබෙන්නේ අලි ගැවසුණු ප්‍රදේශවල. එතකොට අලින්ට ඉන්න තිබෙන භූමිය අඩු වෙනවා. නමුත්, අලින් ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි වෙනවා නේ. එතකොට අලින් ගම්වලට එන්න පටන් ගන්නවා. ඒ වාගේම අලිමංකඩ - elephant corridors - 16ක මේ වන විට මිනිසුන් පදිංචි කරවලා තිබෙනවා. එවැනි සමහර තැන්වල මිනිසුන් පදිංචි කර තිබෙන්නේ රජයේ මැදිහත් වීමෙන්. ඒ නිසා මෙම ප්‍රශ්නය විසඳන්න වෙනත් රටවල අත්දැකීම් පවා අපිට මේ වෙලාවේ උපයෝගි කර ගන්න වෙනවා. නමුත්, වෙනත් කිසිම රටක නැති ප්‍රශ්නයක් තමයි අපේ රටේ තිබෙන්නේ. ඒ කියන්නේ, ඉඩකඩම් අඩු වෙනවා, අලින් වැඩි වෙනවා. අපි මේ ප්‍රශ්නය පිළිබඳව දැනටමත් සාකච්ඡා කරගෙන යනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු ආකාරයට සාමාන්‍යයෙන් අලින් 300ක්, 350ක් විතර වාර්ෂිකව මැරෙනවා. ඒ වාගේම මිනිස් ජීවිතත් 100ක්, 140ක් විතර අහිමි වෙනවා. දේපළත් විශාල ප්‍රමාණයක් විනාශ වෙනවා. මේ සම්බන්ධයෙන් සොයා බලන්න ජනාධිපතිතුමාත් කමිටුවක් පත් කර තිබෙනවා. අමාත්‍යාංශයත් මේ සම්බන්ධයෙන් වෙනම දීර්ඝ සාකච්ඡා වටයක් පවත්වාගෙන යනවා. ලබන අඟහරුවාදා අපේ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව රැස්වෙනවා. එදිනට අපි මේ සම්බන්ධයෙන් දැනට ගෙන යන ක්‍රියාමාර්ග පිළිබඳව විශේෂ සාකච්ඡාවක් පවත්වන්න බලාපොරොත්තු වෙනවා. දේශීය දැනුම වාගේම විදේශීය දැනුමත්, අත්දැකීම් සියල්ලත් එකතු කරගෙන තමයි අපි යම් ක්‍රියාවලියක් ආරම්භ කරන්නේ. මම නිලධාරින්ට උපදෙස් ලබා දීලා තිබෙනවා, ලබන දෙසැම්බර් මාසය අවසන් වෙන්න ඉස්සෙල්ලා මේ සඳහා යෝජනාවලියක් ඉදිරිපත් කරන්න කියලා. ඒ යෝජනාවලිය අපි රටට ඉදිරිපත් කරනවා. එම යෝජනාවලිය අවුරුදු එකහමාරකින්-දෙකකින් පමණ මේ ප්‍රශ්නය සැලකිය යුතු මට්ටමකින් විසඳා ගන්න පුළුවන් විධියේ යෝජනාවලියක් වෙයි කියා අපි විශ්වාස කරනවා. ලබන අවුරුද්දේ අපි බලාපොරොත්තු වෙනවා, අලිමංකඩවල ගෙවල් හදාගෙන පදිංචි වෙලා ඉන්න ජනතාව එවැනි ස්ථාන තුනකින්වත් ඉවත් කරන්න.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු මහින්ද අමරවීර මහතා]

ඒ කියන්නේ, බලෙන් ඉවත් කිරීමක් නොවෙයි. ඒ අයට සුදුසු ඉඩම් ලබා දීලා, යම් වන්දියක් දීලා ඒ ඉඩ ප්‍රමාණයෙහි අලිමංකඩ 16ක් විවෘත කර ගත්තොත්, මේ ප්‍රශ්නය සැලකිය යුතු මට්ටමකින් පාලනය කර ගන්න අපට පුළුවන් වෙයි

ඊළඟට, වනඅලි ගම්වැදීම වැළැක්වීමට බාධක දෙකක් පනවන්නත් අපි කටයුතු කරනවා. විදුලි වැටවල් කොච්චර ගැහුවත් වැඩක් නැහැ, ඒවා කඩා ගෙන අලින් එනවා. ඊට පසුව එල්ලෙන වැටවල් ගැහුවා. දැන් ඒවාත් කඩා ගෙන අලින් එනවා. විදුලි වැට හෝ එල්ලෙන වැට වෙන්න පුළුවන්, එහෙම නැත්නම් ගස් වර්ග සහ අගල් වෙන්න පුළුවන්, කෙසේ හෝ අලින්ට එන්න බැරි වෙන විධියට බාධක දෙකක් පනවන්න ඉදිරියේදී අපි කටයුතු කරනවා.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු ඇමතිතුමාගෙන් මම ඇහුවේ මේ ප්‍රශ්නය සඳහා ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්න සැලැස්මක් තිබෙනවාද කියලායි. ඔබතුමා ඒකට උත්තරයක් දුන්නේ නැහැ. නමුත්, වැඩසටහනක් ගැන කිව්වා.

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මේ තත්ත්වය එන්න එන්නම බැරෑරුම් වෙනවා. මේ වසරේ අගෝස්තු මාසය වෙනකොට මිනිසුන්ගේ සහ අලින්ගේ මරණ ගණන වැඩි වෙලා තිබෙනවා. කැබිතිගොල්ලෑවේ සිද්ධිය දිහා බැලුවාම අපට පේනවා මේ ප්‍රශ්නය ඉවසන්න බැරිම තැනකට ජනතාව පත් වෙලා ඉන්න බව. මම ඒ සිද්ධිය අනුමත කරනවා නොවෙයි. මේ සිද්ධියෙන් මා නියෝජනය කරන වාරියපොල ප්‍රදේශයේ පොලිස් සාජන්ට්වරයෙක් ඝාතනය වුණා. කැබිතිගොල්ලෑවේ සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරලා ඇති. එහිදී ගම්වාසීන් විසින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට දිගින් දිගටම දුරකථන ඇමතුම් ලබා දීලා තිබෙනවා. එතකොට වනජීවී නිලධාරීන්ට එන්න පහසුකම් තිබුණාද? ගරු ඇමතිතුමනි, මේ සිද්ධියට අදාළ ප්‍රශ්න කිහිපයක්ම තිබෙනවා. අපි වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවටම චෝදනා කරනවා නොවෙයි. නමුත් අපි සොයා බැලිය යුතුයි, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් තිබුණාද කියලා. වනජීවී අධ්‍යක්ෂ ජනරාල්වරයා මාධ්‍යයට කියා තිබුණා "අපට ඉන්නේ නිලධාරින් 1,000ක විතර ප්‍රමාණයක්. ඒ නිලධාරින් සංඛ්‍යාවෙන් මේ කටයුතු කළමනාකරණය කර ගන්න අපහසුයි" කියලා.

වයඹ පළාතේත් මේ තත්ත්වය මේ විධියටම තිබෙනවා. මම අහපු ප්‍රශ්නයේ පළමුවෙනි කොටසෙනුත් අසා තිබෙන්නේ ඒ සම්බන්ධයෙන්. ගල්ගමුව, යාපහුව, නිකවැරටිය, වාරියපොල නගරවලටත් මේ ප්‍රශ්නය බලපා තිබෙනවා. ඒ නිසා එම ප්‍රදේශවල තිබෙන වනජීවී කාර්යාලවලට අවශ්‍ය පහසුකම් සහ වාහන තිබෙනවාද කියලාත් මම දැන ගන්න කැමැතියි. එහෙම නැත්නම්, ඔබතුමාගේ ඔය සැලසුම ක්‍රියාත්මක කරනතුරු තාවකාලිකව හෝ මේ කාර්යාලවලට අවශ්‍ය පහසුකම් ටික ලබා දෙන්න පුළුවන්ද, ගරු ඇමතිතුමනි?

කැබිතිගොල්ලෑව සිද්ධියේදී පොලිසියේ සාජන්ට්වරයෙක් මිය ගියා. එය ඉතාම අවාසනාවන්ත සිද්ධියක්. ඒ සිද්ධියේදී වනජීවී නිලධාරින් ආවේ නැහැ. ඒ නිසා පොලිසිය එතැනට ගියා. එතැනදී පොලිස් සාජන්ට්වරයෙක් ඝාතනයට ලක් වෙනවා. ඒ අවාසනාවන්ත සිද්ධිය අපි කොහොමවත් අනුමත කරන්නේ නැහැ. නමුත්, මේ ප්‍රශ්නයේදී ජනතාවගේ ඉවසීමේ සීමාව ඉක්මවා ගිහිල්ලා තිබෙනවා. මේක සංවේදීව හිතන්න ඕනෑ කාරණාවක්. ඒ නිසා මේ සම්බන්ධයෙන් ඔබතුමා කඩිනමින් ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ මොකක්ද?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

කැබිතිගොල්ලෑව සිද්ධිය සම්බන්ධයෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් මට වාර්තා කරපු විධියට, - ජනතාවගේ දැනුම්දීම මත- එතැන මිනිසුන්ට හිරිහැර කරන අලියෙක් ඉඳලා තිබෙනවා. සමහර අය ඒ පිළිබඳව දුරකථන මාර්ගයෙන් මටත් දැනුම් දුන්නා. ඒ අනුව, එම අලියා එතැනින් අල්ලා ගෙන ගොස් වෙනත් ප්‍රදේශයකට අත්හැර තිබෙනවා. හැබැයි, වෙනත් අලියෙක් තමයි මේ ගම්වැසියාට පහර දීලා ඝාතනය කර තිබෙන්නේ. ඒ විධියට තමයි අපට තොරතුරු වාර්තා කරලා තිබෙන්නේ. කෙසේ වෙතත්, ඒක ඉතාම කනගාටුදායක තත්ත්වයක්. ඒ වාගේම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් ඔබතුමා කිව්ව කාරණා ඇත්ත. සේවක හිඟය අපට විශාල වශයෙන් තිබෙනවා.

අලුතෙන් සේවකයන් බඳවා ගැනීමේ හැකියාවකුත් දැනට නැහැ. නමුත්, අපට තව බොහෝ සේවක පිරිසක් අවශ්‍ය වෙනවා. ඒ වාගේම වාහන සහ ඉන්ධනවල ප්‍රශ්නයකුත් තිබෙනවා. මොකද, අපට හම්බවෙන ඉන්ධන ප්‍රමාණය සීමාසහිතයි. ඒ නිසා ඒ ගැටලු ටිකත් කළමනාකරණය කර ගන්න ඕනෑ. අපට මූල්‍යමය ගැටලුවක් තිබෙනවා. ඒක රහසක් නොවෙයි. මූල්‍යමය ගැටලුවත් මේ සෑම අංශයකටම බලපා තිබෙනවා. මෙතැන යම් ප්‍රශ්නයක් තිබෙනවා, අපි ඒක පිළිගන්නවා. ඒ නිසා තමයි මම කිව්වේ මේ ප්‍රශ්නයට ජාතික මට්ටමේ විසඳුමක් අපි නුදුරේදීම ඉදිරිපත් කරනවා කියලා.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු කථානායකතුමනි, මට ගරු අමාත්‍යතුමාගෙන් තවත් කාරණයක් අහන්න තිබෙනවා. දැන් අපේ රට උග්‍ර ආහාර ප්‍රශ්නයකට මුහුණ දෙනවා. මේක අපේ ප්‍රදේශවලට පමණක් නොවෙයි, ලංකාවේ හැම ප්‍රදේශයකටම තිබෙන ප්‍රශ්නයක්. මේ වෙනකොට වඳුරන්ගෙන් සහ දඬු ලේනුන්ගෙන් විශාල වගා හානියක් සිදු වෙනවා. ඒ සතුන් අපේ ප්‍රදේශවල වගාවලින් සියයට 20ක්, 25ක් පමණ විනාශ කරනවා. ගරු ඇමතිතුමනි, මේ ප්‍රශ්නයට කඩිනම් විසඳුමක් අවශ්‍යයි. ඒ සඳහා ඔබතුමන්ලා යම් වැඩ පිළිවෙළක් ලැහැස්ති කරලා තිබෙනවාද?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ඒ සම්බන්ධයෙන් සොයා බලන්න කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේත්, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්වරියගේත් ප්‍රධානත්වයෙන් නිලධාරින් ඇතුළත්ව කමිටුවක් පත් කළා. ඒ අය මට පසුගිය බ්‍රහස්පතින්දා වාර්තාවක් ලබා දුන්නා. අපි දැන් ඒ වාර්තාව සමාලෝචනය කරනවා. අපි ඒක ඔබතුමන්ලාටත් ලබා දෙන්නම්. ගරු කථානායකතුමනි, මේ සතුන්ගෙන් විශාල විනාශයක් සිදු වෙන බව ඇත්ත. මට මතක හැටියට, ඒ වාර්තාවට අනුව වාර්ෂිකව පොල් ගෙඩි මිලියන 121කට පමණ මේ සතුන් හානි කරනවා. ඒ වාගේම වී මෙට්‍රික් ටොන් 8,000කට වැඩි ප්‍රමාණයකට හානි කරනවා. ඒ කමිටුව මේ ගැන වාර්තාවක් ලබා දීලා තිබෙනවා. මේ කමිටුව ලබා දුන් නිර්දේශ මත අපි යම් ක්‍රියාවලියකට යොමු වෙනවා. පාර්ලිමේන්තුවේ සිටින 225දෙනා සහ ජනමාධ්‍ය ආයතන අපට සහයෝගය ලබා දුන්නොත්, මේ සතුන්ගෙන් සිදු වෙන හානිය අවම කර ගැනීම සඳහා අපට කටයුතු කරන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු, වඳුරා, රිළවා, මොනරා, දඬු ලේනා, ඉත්තෑවා, වල් ඌරා කියන සතුන් අපි දැනටමත් තහනම් ලැයිස්තුවෙන් ඉවත් කර තිබෙනවා. ඒ කියන්නේ, ඒ

සතුන් දැන් ආරක්ෂිත සතුන්ගේ ලැයිස්තුවේ නැහැ. ඔබතුමන්ලාටත් තේරෙනවා ඇති, අපි මේ තත්ත්වය පාලනය කර ගන්න ඕනෑ බව. ඒකට ක්‍රමවේද කිහිපයක් තිබෙනවා. ඔබතුමන්ලාගේ සහයෝගය ලැබුණොත් ඒ වැඩ පිළිවෙළ නුදුරේදීම ක්‍රියාත්මක කරන්න අපට පුළුවන් වෙයි; ඒක අපි අනිවාර්යයෙන්ම කරනවා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු ඇමතිතුමනි, කැබිතිගොල්ලෑවේ වුණා වාගේම සිද්ධියක් 2021.02.12 දින රාත්‍රියේ නුවර ගම්පළාතේ මධ්‍යම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මානින්ගමුව කියන ගමේත් සිදු වුණා. නමුත්, එතැන කැබිතිගොල්ලෑවේ සිද්ධිය තරම්ම බරපතළ දෙයක් වුණේ නැහැ. එතැනදී වෙලා තිබෙන්නේ මේකයි. රාත්‍රී 10.00ට විතර පාරේ ගිය දෙන්නෙක් අලියකුගේ ඇඟේ වැදිලා ඒ එක්කෙනෙකුට අලියා ගහපු නිසා ඒ කෙනා මියගියා. ඊට පස්සේ අලියා ඒ මැරුණු කෙනාගේ සිරුරට පයින් ගහමින් එය හොඳෙන් හැතැප්ම එකහමාරක් විතර කැලය ඇතුළට අරගෙන ගියා. ඊ තිස්සේ කෝල් කළාට වනජීවී නිලධාරින් ඇවිත් තිබෙන්නේ පසුදින උදේ 10.00ට විතර. උදේ ඒ ස්ථානයට ප්‍රාදේශීය ලේකම්තුමාත් ඇවිල්ලා ඉන්නකොට තමයි වනජීවී නිලධාරින් ආවේ.

හැබැයි කැබිතිගොල්ලෑවේ වුණා වාගේම -ඒ සිද්ධියේදී තරම් ක්‍රියාත්මක නොවුණාට- ජනතාව කුපිත වෙලා ඒ කට්ටියට බැණ වැදුණා. ඒ body එක හම්බ වුණේ කැලයේ වනජීවී කලාපය තුළ තිබිලා නේ. හැබැයි අලියා පහර දෙන්න පටන් ගන්නේ මහ පාරේ ඉඳලා. වනජීවී කලාපය ඇතුළේ තිබිලා ඒ මනුස්සයාගේ body එක හම්බ වෙච්ච හින්දා, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් එනකොට ඒ කට්ටියට විරුද්ධව ගමේ ජනතාව හඬ නඟපු හින්දා ඒ බැණ වැදුණ එකට තරහට, ඒ වෛරය පිරිමහන්න ඒ මැරුණු මනුස්සයා වෙනුවෙන් දෙන වන්දිය ලබා දෙන්නේ නැහැ. එතැනදි මහා අසාධාරණයක් කරලා තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්වරුන් වනජීවීන් වාගේ හැසිරෙන්නේ නැතුව මනුස්සයෝ විධියට හැසිරිලා ඩබ්ලිව්. විපුලසේන කියන ඒ මනුස්සයාගේ වන්දි මුදල ලබා දෙන්න කටයුතු කරන්න ඕනෑ. ඒ සඳහා යම් ක්‍රියාමාර්ගයක් ගන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේම ප්‍රශ්නයක් මොණරාගල දිස්ත්‍රික්කයේත් තිබුණා. ඔබතුමන්ලාගේ පක්ෂයේ මන්ත්‍රීවරයකු එය අපේ අවධානයට යොමු කළාම අපි ඒ පිළිබඳව විශේෂ මැදිහත්වීමක් කරලා ඒ වන්දිය ලබා දෙන්න කටයුතු කළා. ඒ වාගේම, මේ කාරණය සම්බන්ධවත් නැවත පරීක්ෂණයක් කරලා, වන්දිය ලබා දීමේ හැකියාවක් තිබෙනවා නම්, ඒ සඳහා අවශ්‍ය පියවර අපි ගන්නවා. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අතිරේකව, පොලීසිය හෝ රජයේ නිලධාරින් ලවා අපි මේ පිළිබඳව වෙනම පරීක්ෂණයක් කරන්නම්. *[බාධා කිරීමක්]* හොඳයි, ඒ පිළිබඳව වෙනම පරීක්ෂණයක් මම කරවන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 6 -2039/2022- (2), ගරු ලලිත් එල්ලාවල මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## පහත හේවාහැට ප්‍රා.ලේ. කොට්ඨාසය: පානීය ජල ගැටලුව
## பஹத்த ஹேவாஹெட்ட பிரதேச செயலகப் பிரிவு: குடிநீர்ப் பிரச்சினை
## PAHATHA HEWAHETA DS DIVISION: DRINKING WATER PROBLEM

2040/2022

**7. ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, පහත හේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පදිංචි පවුල් අතරින් පානීය නල ජල පහසුකම් සහිත පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවතින පානීය ජල ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கண்டி மாவட்டத்தின், பஹத்த ஹேவாஹெட்ட பிரதேச செயலகப் பிரிவில் வசிக்கும் குடும்பங்களில் குழாய்மூலமான குடிநீர் வசதிகளைக்கொண்டுள்ள குடும்பங்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) மேற்படி பிரதேச செயலகப் பிரிவில் நிலவும் குடிநீர்ப் பிரச்சினையைத் தீர்ப்பதற்கு மேற்கொள்ளப்படவுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Water Supply:

(a) Will he inform this House -

(i) the number of families residing within the Pahatha Hewaheta Divisional Secretary's Division in the Kandy District, who have pipe-borne drinking water facilities; and

(ii) the measures that are to be taken to solve the drinking water problem prevailing within the Divisional Secretary's Division concerned?

(b) If not, why?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ජලසම්පාදන ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) පානීය නල ජල පහසුකම් සහිත පවුල් සංඛ්‍යාව 11,377කි. (මූලාශ්‍රය - සම්පත් පැතිකඩ)

(ii) පානීය ජල ගැටලුව විසඳීම සඳහා ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව සහ ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග ගනු ලබයි.

• ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව විසින් ගනු ලබන ක්‍රියාමාර්ග

පහත හේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දැනට හඳුනාගත් නව ව්‍යාපෘති යෝජනා 5ක් පවතින අතර එය ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

| අනු අංකය | ග්‍රාම නිලධාරි වසම | ප්‍රතිලාභී පවුල් ගණන |
|---|---|---|
| 01 | උඩුවින්න (නැඟෙනහිර) | 52 |
| 02 | පුලියද්ද | 150 |
| 03 | ඔළුවාවත්ත (නැඟෙනහිර) | 25 |
| 04 | බටගල්ල | 140 |
| 05 | නුගලියද්ද පහළ | 150 |
| එකතුව | | **517** |

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග

පහත හේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දැනට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් ආවරණය නොවන ග්‍රාම නිලධාරි වසම් 16ක් ආවරණය වන පරිදි හා පවත්නා ආවරණ කලාප වැඩි දියුණු කිරීම සඳහා නව ජල සම්පාදන ව්‍යාපෘති 03ක් ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

යෝජිත ජල සැපයුම් ව්‍යාපෘති

| අනු අංකය | ව්‍යාපෘතිය | ආවරණය වන ග්‍රාම නිලධාරි වසම් ගණන | ප්‍රතිලාභී පවුල් ගණන |
|---|---|---|---|
| 01 | මහනුවර - නැඟෙනහිර ජලසම්පාදන ව්‍යාපෘතිය | මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාලේ, පාතහේවාහැට, මැදදුම්බර, පන්විල, පාතදුම්බර හා ගඟවට කෝරළේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 06හි ග්‍රාම නිලධාරි වසම් 142ක පානීය ජල අවශ්‍යතා සපුරාලීම හා වැඩිදියුණු කිරීමට නියමිතය. | 7,289 |
| 02 | මාරස්සන ජල යෝජනා ක්‍රමය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | දැනට මාරස්සන ජල යෝජනා ක්‍රමය මඟින් ආවරණය වන ග්‍රාම නිලධාරි වසම් 33හි ආවරණ කලාපය වැඩි කිරීම හා නව ග්‍රාම නිලධාරි වසම් 07ක් ආවරණය කිරීම මඟින් මුළු ග්‍රාම නිලධාරි වසම් 40ක් තුළ පවතින පානීය ජල අවශ්‍යතා සපුරාලීමට නියමිතය. | 4,600 |
| 03 | අංකෙළිපිටිය ජලසම්පාදන ව්‍යාපෘතිය | පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් 09ක් ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමට යෝජිතය. | 2,353 |
| එකතුව | | | **14,242** |

(ආ) අදාළ නොවේ.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

ගරු කථානායකතුමනි, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය අතුරු ප්‍රශ්නයක් අහනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රධාන ජල යෝජනා ක්‍රම දෙකක් ක්‍රියාත්මක වෙලා තිබෙනවා, විසල් මාතලේ ජල සම්පාදන යෝජනා ක්‍රමය සහ විසල් දඹුල්ල පානීය ජල ව්‍යාපෘතිය කියලා. කලින් ප්‍රාදේශීය සභා සතුව තිබුණු ජල යෝජනා ක්‍රමත් මේවාට එකතු කර ගෙන තිබෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත්, රත්තොට ප්‍රාදේශීය සභාව සතුව තිබුණු ජල යෝජනා ක්‍රම දෙකක් තමයි, බඹරකිරිඇල්ල ජල යෝජනා ක්‍රමය සහ රත්තොට ජල යෝජනා ක්‍රමය. මේ ජල යෝජනා ක්‍රම දෙක කලින් පාලනය වුණේ ප්‍රාදේශීය සභාව යටතේයි. විසල් මාතලේ ජල සම්පාදන යෝජනා ක්‍රමයට මේ ජල යෝජනා ක්‍රම දෙක එකතු කර ගත් නිසා එම ජල යෝජනා ක්‍රම දෙකේ වැඩ කළ සේවකයන් දැන් ඒ ජල යෝජනා ක්‍රමයේ සේවය කරනවා. ගරු ඇමතිතුමනි, ප්‍රාදේශීය සභාව යටතේ තමයි මේ අය කලින් සේවය කළේ. ඒ ගොල්ලන් බඳවා ගත්තේ ඒ ජල යෝජනා ක්‍රම යටතේ සේවය කිරීම සඳහායි. නමුත්, විසල් මාතලේ ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ඔවුන් ගත්තාට පස්සේ මා කලින් කිව්ව අයගේ රැකියාව සම්බන්ධයෙන් ගැටලුවක් ඇති වෙලා තිබෙනවා. මේ අය ප්‍රාදේශීය සභාවේ ස්ථිර සේවකයන් විධියට වැඩ කළා. දැන් ඒ අයට එම ප්‍රාදේශීය සභාව තුළ ඒ තනතුර නැහැ. ඒ නිසා ඒ අයගේ රැකියාව දැන් අනතුරේ තිබෙන්නේ. ඒ පිළිබඳව අමාත්‍යාංශය ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද කියලා මා ඔබතුමාගෙන් දැනගන්න කැමතියි.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ඔබතුමියගේ ප්‍රශ්නය මම විෂයභාර ඇමතිතුමාට යොමු කරන්නම්. එතුමා ඔබතුමියට පිළිතුරු ලබා දෙයි.

**ගරු උදයන කිරිඳිගොඩ මහතා**
(மாண்புமிகு உதயன கிரிந்திகொட)
(The Hon. Udayana Kirindigoda)

ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා අතුරු ප්‍රශ්නයක් ඇහුවාට පිළිතුරු දෙන්න ඇමතිතුමා නැහැ නේ, ගරු මන්ත්‍රීතුමා.

ප්‍රශ්න අංක 8 -2059/2022- (2), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## අ/මෛත්‍රීපාල සේනානායක මධ්‍ය මහා විද්‍යාලය: වර්තමාන තත්ත්වය

### அ/மைத்திரிபால சேனாநாயக்க மத்திய மகா வித்தியாலயம்: தற்போதைய நிலைமை

### A/MAITHRIPALA SENANAYAKA CENTRAL COLLEGE: CURRENT STATUS

2171/2022

9. **ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) මැදවච්චිය, අ/මෛත්‍රීපාල සේනානායක මධ්‍ය මහා විද්‍යාලය මේ වනවිට විශාල පරිහානියකට ලක් වෙමින් පවතින බව එතුමා දන්නේද?

(ආ) එසේ නම්, එම පරිහානිය වැළැක්වීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) மதவாச்சி, அ/மைத்திரிபால சேனாநாயக்க மத்திய மகா வித்தியாலயம் இன்றளவில் பாரிய பின்னடைவுக்கு உள்ளாகி வருவதை அவர் அறிவாரா?

(ஆ) ஆமெனில், மேற்படி பின்னடைவைத் தடுப்பதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that A/Maithripala Senanayaka Central College in Medawachchiya is faced with a massive deterioration at present?

(b) If so, will he inform this House of the steps to be taken to prevent that deterioration?

(c) If not, why?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) අ/මෛත්‍රීපාල සේනානායක මධ්‍ය මහා විද්‍යාලය පරිහානියට ලක්වීමක් වර්තමානයේ දක්නට නොමැත.

කලාප මට්ටමේ නර්තනය, මානව ශාස්ත්‍ර තරගවලදී ජයග්‍රහණ රාශියක් 2022 වර්ෂයේදී ලබා ගෙන ඇත. එමෙන්ම 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය වනවිට අපොස (උසස් පෙළ) විභාග ප්‍රතිඵලවලදී ද සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබේ. විස්තර ඇමුණුම 01හි දක්වා ඇත.

2021.06.17 දින සිට මෙම පාසලට නව විදුහල්පතිවරයෙක් පත්ව ඇති අතර, ඔහු මීන් පෙර අ/අනුරාධපුර මධ්‍ය විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති ලෙස කටයුතු කරන ලද 1 ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ විදුහල්පතිවරයෙකි. අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ජාතික පාසල්වලට විදුහල්පතිවරු තෝරා පත් කර ගැනීම සඳහා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත ඔහු අ/මෛත්‍රීපාල සේනානායක මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පති ලෙස පත් කර ඇත. විස්තර ඇමුණුම 02හි දක්වා ඇත.

එබැවින්, වර්තමානය වනවිට අ/මෛත්‍රීපාල සේනානායක මධ්‍ය මහා විද්‍යාලයේ අධ්‍යයන කටයුතු හා අනෙකුත් බාහිර ක්‍රියාකාරකම් වඩා විධිමත් පරිදි සිදු වෙමින් පවතී.

(ආ) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

ඇමුණුම් 01 සහ 02 **සභාගත*** කරමි.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු ඇමතිතුමනි, මේ ප්‍රශ්නය යොමු කරපු කාලයේ ඒ පාසලේ හිටපු විදුහල්පතිතුමා නිසා තමයි මම මේ ප්‍රශ්නය අහලා තිබෙන්නේ. ඒ විදුහල්පතිතුමාගේ කාලයේ මූල්‍ය අක්‍රමිකතා පවා සිදු වෙලා තිබෙනවා. ඒ පිළිබඳව හොයලා බලන්න. දැන් නම් මේ විදුහලේ එහෙම ප්‍රශ්නයක් නැහැ.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඔබතුමාගේ ප්‍රශ්නය යොමු කරන කොට ඒ විදුහල්පතිතුමා තමයි මේ පාසලේ ඉඳලා තිබෙන්නේ.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ඒ වෙලාවේ හිටපු විදුහල්පතිතුමා සම්බන්ධ ප්‍රශ්නයක් තමයි මේ යොමු කරලා තිබෙන්නේ. හැබැයි, ප්‍රශ්නය පෙළ ගැහිලා දැන් ඒක අහන අවස්ථාවට එනකොට ඒ ප්‍රශ්නය විසඳිලා. ඒ ගැන මම ස්තුතිවන්ත වෙනවා. හැබැයි, ගරු ඇමතිතුමනි, ඒ හිටපු විදුහල්පතිතුමාගේ මූල්‍ය අක්‍රමිකතා ගණනාවක් තිබෙනවා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
වර්තමාන විදුහල්පතිතුමා යටතේ ඒ පාසලේ උසස් පෙළ ප්‍රතිඵල සියයට 66 ඉක්මවා තිබෙනවා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
වර්තමාන විදුහල්පතිතුමා ඉතා සාර්ථකව වැඩකටයුතු කරගෙන යනවා. ඒ පිළිබඳව ගැටලුවක් නැහැ. කලින් හිටපු විදුහල්පතිතුමා ගැනයි ප්‍රශ්නය තිබුණේ.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ප්‍රශ්න අහන්න බයයි. මොකද, අපි ප්‍රශ්න අහන කොට ඔබතුමා පෙරළා අපෙන් ප්‍රශ්න අහනවා. ඔබතුමා නම් ප්‍රශ්නයට සූදානම් වෙලා නේ එන්නේ. මම ප්‍රශ්නය අහන කොට ඔබතුමා පෙරළා මගෙන් ප්‍රශ්න ඇහුවොත් මට ඒකට උත්තර දෙන්න අපහසු වෙන්න පුළුවන්. අනෙක් ඇමතිවරු කරන්නේ නැති අලුත් ක්‍රමයක් මේක.

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අද වෙනකොට අපේ පාසල්වල විදුහල්පතිවරු 4,000කගේ විතර හිඟතාවක් තිබෙනවා. ඒ විදුහල්පතිවරු බඳවා ගැනීම සම්බන්ධයෙන් අපේ ගුරු සංගම් විසින් වාරණ නියෝගයක් අරගෙන දැන් එය තාවකාලික අත්හිටුවා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඉදිරියේදී විදුහල්පතිවරුන් බඳවා ගන්නේ ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවට අනුව තරග විභාගයකින් ද? එහෙම නැත්නම් පසුගිය කාලයේ වාගේ, මේ රටේ අධ්‍යාපනය විනාශ කරන්න තමන්ගේ දේශපාලන හිතවතුන්ගෙන් ඒ අය බඳවා ගන්නවා ද කියන එක තමයි අපට දැන ගන්න ඕනෑකම තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා ඔය ප්‍රශ්නයට පෙරේදාත් උත්තර දුන්නා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ පළමුවැනි අතුරු ප්‍රශ්නයට පිළිතුර මෙයයි. දැනට විදුහල්පතිවරුන් 4,000ක හිඟයක් තිබෙනවා. ඒකට හේතුව, පසුගිය කාලයේ විදුහල්පතිවරුන් බඳවා ගැනීමේ තරග විභාගය නොපැවැත්වීමයි. දැන් අපි ඒ සඳහා කටයුතු කරගෙන යනවා. දැනට විදුහල්පතිවරුන් පත් කරන්න එපා කියලා ශ්‍රේෂ්ඨාධිකරණය වාරණ නියෝගයක් දීලා තිබෙනවා. ඒකට හේතුව මොකක් ද? විදුහල්පතිවරුන් බඳවා ගැනීමේ තරග

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

විභාගය තියලා උසස්වීම් දෙන්න හදන කොට ලකුණු හොඳට අරගෙන තිබුණා. හැබැයි, සම්මුඛ පරීක්ෂණයේදී ඒ අයට ලකුණු අඩු වුණා. එසේ වුණාය කියන 1,700ක පිරිසක් ඉන්නවා. ඒ 1,700ක පිරිසට අතිරේකව 169දෙනෙකු ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා අතුරු තහනම් නියෝගයක් අරගෙන තිබෙනවා. අවුරුදු 5ක, 10ක, 15ක කාලයක් තිස්සේ වැඩ බලන විදුහල්පතිවරු 2,682ක් ඉන්නවා. මම ඒ සියලු පාර්ශ්ව එක තැනකට ගෙන්වලා සාකච්ඡා කළා. එහිදී අප සමථයකට එකඟ වුණා. ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණයට මෝසමක් ඉදිරිපත් කරලා ඒ සමථය සටහන් කරන්න එකඟ වුණා. ඒ සමථය සටහන් කළාට පස්සේ අපට පුළුවන් විදුහල්පති පත්වීම් ටික දෙන්න.

ඒ අනුව දැනට විදුහල්පති ශ්‍රේණිය නොදරන 4,000කට වැඩි පිරිසකට එකවර පත්වීම් දෙන්න පුළුවන්. ඒ සඳහා අවශ්‍ය කටයුතු දැනට නීතිපති දෙපාර්තමේන්තුව විසින් කරගෙන යනවා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු රෝහිණී කුමාරි විජේරත්න මැතිනියට අහන්න අවස්ථාව දෙනවා. ඊට කලින් මට පොඩි කාරණයක් දැනගන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, NVQ මට්ටමේ වෘත්තීය පුහුණු වැඩසටහන් අපේ විදුහල්වල ක්‍රියාත්මක කළා නේ. නමුත්, දැන් ඒ කටයුතු සිදු වෙන්නේ නැහැ. දැන් ඒ ගුරුවරු වෙනත් දිස්ත්‍රික්කවල සේවය කරනවා. ඒ අයට තමන්ගේ දිස්ත්‍රික්කයට එන්න විධියකුත් නැහැ. එක්කෝ, ඒ ගුරුවරුන්ට පරණ විධියට උගන්වන්න වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන්න ඕනෑ. දැන් ඒ ගුරුවරු විදුහල් තුළ නිකම් ඉන්නවා. ඒ නිසා ඒ අය වෙනම දෙයකට යොමු කර ගන්න වැඩ පිළිවෙළක් තිබෙනවාද කියා මම දැනගන්න කැමැතියි.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පළමුවැනි අතුරු ප්‍රශ්නයේ දෙවැනි කොටසින් ඇහුවේ, "13 plus" කියන අධ්‍යාපනය සම්බන්ධයෙන්. ඔබතුමා ඇහුවේ ඒකට අදාළ වුණු ගුරුවරු ගැන නේ.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ඒ පුහුණු වැඩසටහන් සඳහා ශිෂ්‍යයෝ ගන්නේ නැහැ නේ. බඳවා ගැනීම් දැන් කරන්නේ නැහැ. එතකොට ඒ ගුරුවරු ටික නිකම් ඉන්නේ.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

නැහැ, ගරු මන්ත්‍රීතුමා. අපි ලබන අවුරුද්දේ ක්‍රියාත්මක වැඩසටහනත් එක්ක දිවයින පුරා පාසල් 526ක් නම් කළා, "13 plus" education සඳහා. ඒ කියන්නේ, අපොස සාමාන්‍ය පෙළ විභාගයෙන් හොඳ ප්‍රතිඵල නැති නමුත්, 'පාසලේදී වෘත්තීය පුහුණුව ලබා ගත හැකි' කියලා පාසල් 526ක් නම් කළා. කොළඹ කලාපයේ විතරක් එවැනි පාසල් 19ක් තිබෙනවා. ඒ පාසල් 19න් අද ක්‍රියාත්මක වෙන්නේ සිංහල මාධ්‍ය පාසල් 11යි, දෙමළ මාධ්‍ය පාසල් 8යි, උදාහරණයක් හැටියට. ඒ පාසල් 11නුත් පාසල් 6ක් විතරයි ක්‍රියාත්මක වෙන්නේ. හැබැයි, මේ අමාත්‍යාංශය යටතට වෘත්තීය පුහුණු අංශයත් එකතු වුණු නිසා ඒ අයත් එක්ක සාකච්ඡා කරලා, ලබන වසර තුළදී අපි ක්‍රමානුකූලව වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා. තව සති දෙකකින් තුනකින් පමණ GCE O/L results එනවා. ඒ ප්‍රතිඵල ආවාට පස්සේ "13 plus" වැඩසටහන නැවත සක්‍රිය කරවා, NAITA එකේ සහයෝගයත් ලබාගෙන විධිමත් විධියට පාසල්වල වෘත්තීය පුහුණුව ලබා දෙන්න අපි කටයුතු කරනවා. එතකොට අර ගුරුවරුන්ට ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. ඒ ගොල්ලන්ට ඒවායේ සේවය කරන්න පුළුවන්.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු ඇමතිතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය මම අහනවා. කැබිනට් පත්‍රිකා දෙකක් සම්බන්ධයෙන් මට ඔබතුමාගෙන් පැහැදිලි කර ගැනීමක් තමයි කරගන්න තිබෙන්නේ. පළමුවැනි කාරණය මේකයි. 2/97 චක්‍රලේඛය යටතේ, බී.සී. පෙරේරා වැටුප් කො◌ාමිසමෙන් ගුරුවරුන්ගේ වැටුප් විෂමතාවක් ඇති වුණු බව ඔබතුමා දන්නවා. ඒ ගැන දිගින් දිගටම අපි පාර්ලිමේන්තුවේ කථා කළා. ඔය වැටුප් විෂමතාව නිවැරදි කෙරුණේ 2021 ජනවාරි ඉඳලා නේ. ඒ වනකල් විශ්‍රාම ගිය අයත් ඒ අසාධාරණයට ලක් වුණා. එහෙම නම් ඒ අයත් මේකට හිමිකම් කිව යුතුයි කියන එක ඔබතුමා දන්නවා. මොකද, ඒ ගොල්ලන්ටත් ඒකෙන් අසාධාරණයක් වුණු නිසා. ඒ ගොල්ලන්ගේ විශ්‍රාම වැටුප රුපියල් 25,000ටත් අඩුයි, ගරු ඇමතිතුමනි. අද තිබෙන ජීවන වියදමත් එක්ක ඒ අයට ජීවත් වෙන්න තියා බෙහෙත් ටික ගන්නවත් ඒ මුදල මදි.

ඒ කැබිනට් පත්‍රිකාව ගැන ඔබතුමාගෙන් ඇහුවාම ඔබතුමාගේ උත්තරය වුණේ, "රටේ සල්ලි නැහැ. සල්ලි ලැබුණාම ඒ කටයුතු කරනවා" කියන එක. රටේ සල්ලි තිබෙන කාලය එන විට ඒ ගොල්ලන් ජීවත් වෙයිද කියලා ගැටලුවක් තිබෙනවා. එම නිසා ඔබතුමා ඒ සම්බන්ධයෙන් මෙවර අය වැයට හෝ යෝජනාවක් ඉදිරිපත් කර සහනයක් ලබා දෙන්න බලාපොරොත්තු වෙනවාද කියලා මම දැන ගන්න කැමැතියි.

අනික් කාරණය මේකයි. ඊයේ ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් ඇහුවා, 6/2016 චක්‍රලේඛය අනුව, 2017.01.01 සිට 2019.12.31 දක්වා කාලය තුළ විශ්‍රාම ගිය අයට 2020 ජනවාරි 01වැනි දින සිට ලැබිය යුතු විශ්‍රාම වැටුප සඳහන් කර තිබුණත්, ඒක ලැබෙන්නේ නැති වීම සම්බන්ධයෙන්. ඒ පැත්තෙනුත් ඒ මිනිසුන් ලොකු අසාධාරණයකට ලක් වෙනවා, ජීවත් වීම පිළිබඳ අරගලයේදී. ඒ නිසා ඒ සම්බන්ධයෙනුත් අවධානය යොමු කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

ඊළඟට, අනෙක් කැබිනට් පත්‍රිකාව තමයි, උපාධිධාරින් 60,000ක් බඳවා ගැනීම සම්බන්ධයෙන් නිකුත් කළ කැබිනට් පත්‍රිකාව. උපාධිධාරින් 60,000ක් බඳවා ගැනීමේදී වයස අවුරුදු 35ට වැඩි අය සම්බන්ධයෙන් මොකද කරන්නේ කියන එක සහ කළමනාකරණ සේවයේ ඉන්න අයට ඒ සඳහා ඉල්ලුම් කරන්න පුළුවන්ද කියන කාරණය තිබෙනවා. ඒ වාගේම, උපාධිධාරින් සහ පශ්චාත් උපාධිධාරින් අද වෙනත් දෙපාර්තමේන්තුවල කම්කරුවන් විධියට ඉන්නවා. ඔබතුමන්ලා ඔය කියන, අලුතින් එන කැබිනට් පත්‍රිකාව අනුව ඒ අයටත් මේ සඳහා ඉල්ලුම් කිරීමේ හැකියාව තිබෙනවාද කියා පැහැදිලි කරන්න.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නයෙන් ගරු මන්ත්‍රීතුමිය අසන ලද කාරණයට 2/97 චක්‍රලේඛය සහ 6/2006 චක්‍රලේඛය පිළිබඳව ගණනය කිරීමක් කර අපි අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරනවා. ඒ අනුව ඉදිරි කාලයකදී ඒ අයට

හිඟ වැටුප් හෝ ලැබිය යුතු - අඩුම ගණනේ දැන් සිට හෝ ලැබිය යුතු- ප්‍රමාණය ලබා දෙන්න අපි යෝජනා කරනවා.

එතුමිය ඊළඟ කාරණයෙන් පැහැදිලි කිරීමක් ඉල්ලුවා, ගරු කථානායකතුමනි. ඒක ඉතාම වැදගත් කාරණයක්. 2018, 2019, 2020, 2021 වසරවල pass out වෙච්ච උපාධිධාරීන් 53,000ක් සංවර්ධන නිලධාරීන් හැටියට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් බඳවා ගත්තා. ඒ සඳහා බාහිර උපාධිධාරීනුත් ඉල්ලීම් කළා. ඒ 53,000න් 22,000ක් දැනට පාසල්වලට යොමු කර තිබෙනවා, ගුරු අභ්‍යාසලාභීන් හැටියට. ඉතිරි පිරිස ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ වෙනත් රජයේ කාර්යාලවල වැඩ කරනවා. ඒ අයට රුපියල් 41,000ක පමණ වැටුපක් ලැබෙනවා. මේ අය ගුරු සේවයට ගන්නකොට වැටුප රුපියල් 6,700කින් වැඩි වෙනවා. ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය කිව්වා වාගේ මෙතැන කාණ්ඩ කිහිපයක් ඉන්නවා.

මම ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාව අනුව ඔබතුමියලා සහ අනෙකුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඉදිරිපත් කළ කරුණු සලකා බලලා මම යෝජනා කළා, දැනට ගුරු අභ්‍යාසලාභීන් හැටියට සිටින පිරිසට සහ වයස අවුරුදු 35ට අඩු උපාධිධාරීන් සඳහා තරග විභාගය පැවැත්වීමට. ගුරු සේවා ව්‍යවස්ථාවේ තිබෙන්නේ වයස අවුරුදු 35ට අඩු වෙන්න ඕනෑ කියලායි. උපාධිධාරීන් තරග විභාගයකින් ගන්නේ. අපි තරග විභාගය පවත්වනවා. හැබැයි, වයස අවුරුදු 35ට අඩු පිරිසට. උපාධිධාරී අභ්‍යාසලාභීන් හැටියට 300ක පමණ පිරිසක් තමයි දැනට ඉන්නේ. අනෙක් කැබිනට් පත්‍රිකාව කෙටුම්පත් කර අවසානයි. අපි ලබන සතියේ ඒක ඉදිරිපත් කරනවා. ඒ අනුව, මේ කාණ්ඩ සියල්ලටම විභාගයට පෙනී සිටීමේ අවස්ථාව ලැබෙනවා.

පළමු කාරණය හැටියට, සංවර්ධන නිලධාරීන් ලෙස බඳවා ගත් 53,000ටම -පාසල්වල සේවය කරන උපාධිධාරී අභ්‍යාසලාභීන් ඇතුළු කාර්යාලවල වෙනත් තනතුරුවල සේවය කරන සියලු උපාධිධාරීන්ට- විභාගයට පෙනී සිටින්න අවස්ථාව දෙනවා. අර අභ්‍යාසලාභී ගුරුවරුන්ට හැර අනික් සියලු දෙනා වයස අවුරුදු 35ට අඩු වෙන්න ඕනෑ. අභ්‍යාසලාභී ගුරුවරුන් ලෙස බඳවා ගන්නකොට ඒ අයගේ වයස අවුරුදු 35යි. හැබැයි, දැන් ඒ අයගේ වයස අවුරුදු 38, 39 වෙලා. ඒක තමයි අපේ යෝජනාව. එතකොට, ගුරු සේවා ව්‍යවස්ථාව අනුව වයස අවුරුදු 35ට අඩු සියලු දෙනාට විභාගයට පෙනී සිටින්න පුළුවන්.

ඊළඟට, දැනට ඌන සේවා උපාධිධාරීන් කියලා පිරිසක් ඉන්නවා. ඒ අය උසස් පෙළ කරලා රැකියාවට ගිහිල්ලා වයස අවුරුදු 35ට අඩුයි. හැබැයි, උපාධියක් අරගෙන තිබෙනවා. ඒ ගොල්ලන්ටත් අවස්ථාව දෙනවා, විභාගයට පෙනී සිටින්න. ඊට අමතරව, උපාධිධාරියෙක් ග්‍රාම නිලධාරියෙක් හැටියට හෝ ලිපිකරුවෙක් හැටියට ඉන්නවා නම්, -ඔබතුමිය කිව්වා වාගේ පශ්චාත් උපාධි තියෙන අයත් ඉන්න පුළුවන්- ඒ සියලු දෙනාටත් ගුරු සේවා ව්‍යවස්ථාව අනුව මේ විභාගයට පෙනී සිටින්න අවකාශ දෙනවා. අපි දීප ව්‍යාප්තව මේ විභාගය පවත්වනවා. ඒ විභාගයේ ලකුණු මත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනවා. අපි ලකුණු සියල්ල පළාත්වලට දෙනවා; පළාත් කලාප මට්ටමට ගිහිල්ලා ඉතාම කඩිනමින් ඒ පත්වීම් ටික දෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළ අපි කරනවා, ඒ අය NIE එකේ Postgraduate Diploma in Education අවුරුදු තුනක් තුළදී සම්පූර්ණ කරගත යුතුයි කියන කොන්දේසියට යටත්ව. ඒ කරුණු ටික තමයි දැනට කියන්න තිබෙන්නේ. ඔබතුමිය මේ කාරණය අහපු එක හොඳයි. මොකද, හැමෝම මේ කාරණය මගෙන් අහනවා. ඉතින් මේකට ප්‍රසිද්ධියේ උත්තර දුන්නාම හොඳයි. මොකද, විභාග අපේක්ෂකයෝ ඉන්න පුළුවන්. අපි මේ කැබිනට් පත්‍රිකාව සම්මත වෙච්ච ගමන් ඊළඟ සති දෙක තුළ -දෙසැම්බර් මාසයේ මැද වෙනකොට- දීප ව්‍යාප්තව පොදු විභාගය පවත්වනවා. අපි ඉතාම කඩිනමින් ප්‍රතිඵල දීලා ඒවා පළාත්වලට ලබා දෙනවා, තිබෙන ගුරු පුරප්පාඩු ටික සපුරා ගන්න. ඒ කටයුත්ත අවසන් වුණාම සුපුරුදු පරිදි පළාත් සභාවලට අවස්ථාව තිබෙනවා, ඉන් අනතුරුව ඇති වන ගුරු පුරප්පාඩු සඳහා පළාත් සභා මට්ටමින් උපාධිධාරීන් වෙනුවෙන් විභාග පවත්වා ගුරුවරු බඳවා ගන්න.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාගෙන් තව පැහැදිලි කිරීමක් කරගෙන එතුමාට දැනුම් දීමකුත් කරන්න තිබෙනවා.

ගරු ඇමතිතුමනි, 2/97 චක්‍රලේඛය සම්බන්ධව ඔබතුමා ඒ කිව්ව විධියට අපට දිනයක් කියා ගන්න පුළුවන්කම තිබෙනවාද කියන ගැටලුව තිබෙනවා. විශේෂයෙන් ඒ ගොල්ලන් හිඟ වැටුප් ඉල්ලන්නේ නැහැ නේ. හිඟ වැටුප් ඕනෑ නැහැ. වර්තමාන වැටුපට ගළපා විශ්‍රාම වැටුප සකස් කර ගැනීම තමයි අවශ්‍ය පළමු කාරණය. ඊළඟට, ඌන සේවා උපාධිධාරීන් පිළිබඳව අපි කථා කරපු කාරණයේදී ඒ ගොල්ලන්ට අසාධාරණයක් වුණා නේ. ඒ ගොල්ලන්ට උසස්වීම්වලට හෝ උපාධිධාරීන් ලෙස බඳවා ගැනීම් සඳහා ඉල්ලන්න බැරි විධියට තමයි ගැසට් පත්‍රිකාව ආවේ. ඒ නිසා ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

දැනට රජයේ සේවයේ යෙදී සිටින උපාධිධාරීන්ට ඉල්ලන්න පුළුවන්.

## ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ: පාඨමාලා
## தேசிய கல்வியியல் கல்லூரிகள்: பாடநெறிகள்
## NATIONAL COLLEGES OF EDUCATION: COURSES CONDUCTED

2519/2022

**10.** **ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ ස්ථාපිත කර ඇති ජාතික අධ්‍යාපන පීඨ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම අධ්‍යාපන පීඨවල එක් එක් භාෂා මාධ්‍ය අනුව පවත්වනු ලබන පාඨමාලා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පාඨමාලාවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) විද්‍යාපීඨ ගුරු පුහුණුව සඳහා සිසුන් හිඟයක් පවතින බව දන්නේද;

(ii) එසේ නම්, එම ගැටලුව විසඳීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා]

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இதுவரையில் இலங்கையில் நிறுவப்பட்டுள்ள தேசிய கல்வியியல் கல்லூரிகளின் எண்ணிக்கை யாவை;

(ii) அவற்றின் பெயர்கள் என்ன;

(iii) தேசிய கல்வியியல் கல்லூரிகளில் ஒவ்வொரு மொழி மூலத்திற்கும் ஏற்ப நடத்தப்படும் பாட நெறிகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

(iv) மேற்படி பாடநெறிகளின் பெயர்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) கல்வியியல் கல்லூரி ஆசிரியர் பயிற்சிக்காக மாணவர்களின் பற்றாக்குறை காணப்படுவதை அறிவாரா;

(ii) ஆமெனில், மேற்படி பிரச்சினையைத் தீர்ப்பதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) the number of National Colleges of Education established in Sri Lanka at present;

(ii) the names of the aforesaid Colleges;

(iii) the number of courses conducted by the National Colleges of Education, in relation to each medium of instruction, separately; and

(iv) the names of those courses?

(b) Will he also inform this House -

(i) whether he is aware that there is a dearth of students for teacher training at the Colleges of Education; and

(ii) if so, the steps that would be taken to solve that problem?

(c) If not, why?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මේ වන විට ස්ථාපිත කර ඇති විද්‍යාපීඨ සංඛ්‍යාව 19කි.

(ii) විද්‍යාපීඨයන්හි නම් පහත සඳහන් කර ඇත.

| | |
|---|---|
| 1 | ඌව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය |
| 2 | නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය |
| 3 | සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය - දඹදෙණිය<br>සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය - නිට්ටඹුව |
| 4 | සියනෑ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය |
| 5 | හාපිටිගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය |
| 6 | මහවැලි ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය |
| 7 | වව්නියා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය |
| 8 | ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය |
| 9 | අඩ්ඩාලච්චේන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය |
| 10 | මඩකලපුව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය |
| 11 | පුලතිසිපුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය |
| 12 | වයඹ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය |
| 13 | රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය |
| 14 | රුහුණු ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය |
| 15 | යාපනය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය |
| 16 | දර්ගා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය |
| 17 | පේරාදෙණිය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය |
| 18 | පස්දුන්රට ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය |
| 19 | මහරගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය |

(iii)

| භාෂා මාධ්‍යය | පාඨමාලා සංඛ්‍යාව |
|---|---|
| 1. සිංහල මාධ්‍යය | 22 |
| 2. දෙමළ මාධ්‍යය | 23 |
| 3. ඉංග්‍රීසි මාධ්‍යය | 05 |

(iv) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා මාධ්‍ය අනුව පවත්වනු ලබන පාඨමාලා වෙන් වෙන් වශයෙන් පහත සඳහන් කර ඇත.

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයන්හි එක් එක් භාෂා මාධ්‍ය අනුව පවත්වනු ලබන පාඨමාලා

**සිංහල මාධ්‍යය**

| අනු අංකය | පාඨමාලාව |
|---|---|
| 1 | ප්‍රාථමික අධ්‍යාපනය |
| 2 | විද්‍යාව |
| 3 | ගණිතය |
| 4 | සමාජීය විද්‍යාව |
| 5 | බුද්ධ ධර්මය |
| 6 | කතෝලික ධර්මය / ක්‍රිස්තියානි ධර්මය |
| 7 | පළමු බස (සිංහල) |
| 8 | චිත්‍ර |
| 9 | නැටුම් (පෙරදිග) |
| 10 | සංගීතය (පෙරදිග) |
| 11 | නාට්‍ය හා රංගකලාව |
| 12 | ශාරීරික අධ්‍යාපනය |
| 13 | ගෘහ ආර්ථික විද්‍යාව |
| 14 | කෘෂි හා ආහාර තාක්ෂණය |
| 15 | තාක්ෂණ අධ්‍යයනය - ශිල්ප කලා |
| 16 | නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය |
| 17 | නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය |
| 18 | නිර්මාණකරණය හා විදුලිය හා ඉලෙක්ට්‍රොනික් තාක්ෂණවේදය |

| අනු අංකය | පාඨමාලාව |
|---|---|
| 19 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය |
| 20 | දෙවන බස (සිංහල) |
| 21 | විශේෂ අධ්‍යාපනය |
| 22 | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය |

**දෙමළ මාධ්‍යය**

| අනු අංකය | පාඨමාලාව |
|---|---|
| 1 | ප්‍රාථමික අධ්‍යාපනය |
| 2 | විද්‍යාව |
| 3 | ගණිතය |
| 4 | සමාජීය විද්‍යාව |
| 5 | හින්දු ධර්මය |
| 6 | ඉස්ලාම් ධර්මය |
| 7 | කතෝලික ධර්මය / ක්‍රිස්තියානි ධර්මය |
| 8 | පළමු බස (දෙමළ) |
| 9 | චිත්‍ර |
| 10 | නැටුම් (භාරත) |
| 11 | සංගීතය (කර්නාටක) |
| 12 | නාට්‍ය හා රංගකලාව |
| 13 | ශාරීරික අධ්‍යාපනය |
| 14 | ගෘහ ආර්ථික විද්‍යාව |
| 15 | කෘෂි හා ආහාර තාක්ෂණය |
| 16 | තාක්ෂණ අධ්‍යයනය - ශිල්ප කලා |
| 17 | නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය |
| 18 | නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය |
| 19 | නිර්මාණකරණය හා විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණවේදය |
| 20 | තොරතුරු හා සන්නිවේදය තාක්ෂණය |
| 21 | දෙවන බස (දෙමළ) |
| 22 | විශේෂ අධ්‍යාපනය |
| 23 | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය |

**ඉංග්‍රීසි මාධ්‍යය**

| අනු අංකය | පාඨමාලාව |
|---|---|
| 1 | විද්‍යාව |
| 2 | ගණිතය |
| 3 | ඉංග්‍රීසි |
| 4 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය |
| 5 | බටහිර සංගීතය |

(ආ) (i) පුරප්පාඩු සංඛ්‍යාවට අනුව බඳවා ගැනීම් සිදු කරන බැවින් සිසුන් හිඟයක් නොපවතී.

(ii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගෙන් අහන්න ප්‍රශ්න රාශියක් තිබෙනවා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

අහන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්න 2ක් අහන්න.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු අමාත්‍යතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

පසුගිය කාලයේදී රාජ්‍ය සේවකයන් විශ්‍රාම යන වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කරලා ඔවුන්ට සේවා දිගුවක් ලබා දුන්නා. නමුත්, නැවත ඒ අයගේ විශ්‍රාමික වයස් සීමාව අවුරුදු 60 කළා. ආරංචියක් තිබෙනවා, අධ්‍යාපන පරිපාලන සේවයේ තෝරා ගන්නා ලද කණ්ඩායමකට පමණක් ගැසට් එකක් නිකුත් කරලා සේවා දිගුවක් ලබා දෙන්න යනවා කියලා. ඒ එක්කම, මෙන්න මේ කාරණය කෙරෙහිත් මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමතියි. පහ, හය ශ්‍රේණිවල ඉගෙන ගන්නා කුඩා දරුවන් කණ්ඩායමක් ඔවුන්ගේ දක්ෂතා පෙන්වමින්, "ආශාවරී" නමින් ලංකාව පුරා ප්‍රසංග පවත්වමින් යනවා. දවසක් මමත් ඒ ළමයින්ගේ ප්‍රසංගයක් බැලුවා. සාමාන්‍යයෙන් ප්‍රසංගයකදී අපි සිංදුවක්, දෙකක් අහලා එළියට යනවා. නමුත්, ඒ ප්‍රසංගය අවසන් වෙනතෙක් අපි බැලුවා.

ගම්පහ දිස්ත්‍රික්කයේ සහකාර පොලිස් අධිකාරිවරයා - අතුකෝරළ කියන මහත්මයා- මේ ළමයින්ගේ සංගීත ප්‍රසංග සඳහා අවසර නොදෙන පදනමක තරයේම ඉන්නවා. ඒ පොලිස් අධිකාරිවරයාට තිබෙන ප්‍රශ්නය මොකක්ද කියලා අපට තේරෙන්නේ නැහැ. නව නිපැයුම්කරුවන්, කලාකරුවන්, විද්වතුන්, ලේඛකයින් වාගේ දක්ෂතා තිබෙන අය රටට බිහි වෙන්න කුඩා කාලයේ මෙවැනි ක්‍රියාවන්ගෙන් අඩිතාලම දැමෙනවා.

ඇත්තටම, "ආශාවරී" ප්‍රසංගය පවත්වන ඒ ළමා කණ්ඩායමට සහ ඒ ගුරුවරුන්ට ඔබතුමන්ලාගේ විශේෂ අනුග්‍රහයක් ලැබෙන්න ඕනෑ; ඒ අය කෙරෙහි විශේෂ අවධානයක් යොමු වෙන්න ඕනෑ. එවන් අවස්ථාවක අතුකෝරළ වාගේ පොලිස් නිලධාරින් ඒ විධියට බාධක - barriers - දැමීම වැළැක්වීම වෙනුවෙන් ඔබතුමාගේ මැදිහත්වීම මා විශේෂයෙන් බලාපොරොත්තු වෙනවා, ගරු ඇමතිතුමනි. ඔබතුමා මේ කාරණා දෙකටම උත්තර දුන්නොත් හොඳයි.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, වයස අවුරුදු 65 ලෙස පැවැති රාජ්‍ය සේවකයන් විශ්‍රාම යෑමේ වයස් සීමාව අතුරු අය වැය ඉදිරිපත් කළ අවස්ථාවේ අවුරුදු 60 දක්වා පහත හෙළුවා. ඒ විධියට ඒ වයස පහළට දැම්මත්, ඒ වන කොටත් වයස අවුරුදු 60 ඉක්මවා සිටි රාජ්‍ය සේවකයන්ට 2022 දෙසැම්බර් 31වන දා දක්වා සේවය කිරීමට අවසර දුන්නා. නමුත්, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඊට වඩා වෙනස්

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

ව්‍යුහයක් තිබෙන්නේ. හැබැයි, ඒ අයගෙනුත් බොහෝ දෙනා වයස අවුරුදු 60න් විශ්‍රාම යන්න ඕනෑ. අධ්‍යාපන පරිපාලන සේවයේ පළාත් අධ්‍යක්ෂකවරු 9 දෙනාගෙන් 7 දෙනෙක් විශ්‍රාම යනවා. ඒ සමඟම අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ විශ්‍රාම ලබන පිරිස -මට මතක හැටියට- ඔක්කොම 31 දෙනෙක් ඉන්නවා. විශේෂ ශ්‍රේණියට ආවේ නැති ඊළඟ පිරිස ඉන්නවා. ඒ ගොල්ලන් විශේෂ ශ්‍රේණියට එන්න ඕනෑ. හැබැයි, එතකොට ප්‍රශ්නය මතු වන්නේ විශේෂ ශ්‍රේණියේ සිටිය යුතු පිරිස් සම්බන්ධයෙන්. මොකද, ඔවුන්ට පසුගිය කාලයේ ප්‍රමාදයක් ඇති වෙලා තිබුණා. දැන් අපි ඒ අයට අවස්ථාව දෙනවා, විශේෂ ශ්‍රේණියට එන්න. එතෙක් යම් ප්‍රශ්නයක් මතු වෙනවා. උදාහරණයක් වශයෙන් අපි විභාග දෙපාර්තමේන්තුව ගනිමු. ඒ දෙපාර්තමේන්තුව පැවැත්වූ විභාගයක ප්‍රතිඵල නිකුත් කරන්න තිබෙනවා කියා හෝ තවත් විභාගයකට සූදානම් වෙමින් සිටිනවා කියා හෝ හිතමු. එසේ විභාගයක් සම්බන්ධයෙන් කටයුතු කරන අතරමැද කෙනෙකු විශ්‍රාම ගියොත්, අපට ප්‍රශ්නයක් මතු වෙන්න පුළුවන්, කවුද ඒ සම්බන්ධයෙන් වග කියන්නේ කියලා. එවැනි සුවිශේෂ වූ අවස්ථාවකදී අපෙන් ඉල්ලීමක් කළොත් -මෙතෙක් එහෙම ඉල්ලීමක් සිදු කර නැහැ- ඒ ඉල්ලීම අමාත්‍ය මණ්ඩලයට යොමු කරන්න අපට පුළුවන්. එවිට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාව ලැබුණොත්, මාස කිහිපයකට -ඒ කටයුත්ත අවසාන වනකල්- කොන්ත්‍රාත් පදනම මත ඒ අයට අවස්ථාව දෙන්න පුළුවන්. නමුත්, අනෙක් සියලු දෙනා වයස අවුරුදු 60 දී විශ්‍රාම යන්න ඕනෑ.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
එතකොට, විශ්‍රාම වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කරන කථාව මොකක්ද?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
නැහැ, අවුරුදු 65 දක්වා දීර්ඝ කරන්නේ නැහැ.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
පසුගිය කාලයේ අවුරුදු 65 දක්වා සේවය දීර්ඝ කළාට පසුව රාජ්‍ය සේවකයන් විශාල වශයෙන් ණය පවා ලබා ගත්තා. ඒ අය අද මුළුමනින් අසරණ වෙලා ඉන්නවා, මේ තත්ත්වය නිසා. මේ සම්බන්ධයෙන් ඔබතුමාට කරන්න දෙයක් නැති බවත් මා දන්නවා, ගරු ඇමතිතුමනි.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
සාමාන්‍යයෙන් එහෙම අපේක්ෂා ඇති වෙනවා. නමුත් මේ ප්‍රතිපත්තිමය තීන්දු අනුව අපට කරන්න දෙයක් නැහැ. අප බලන්නේ අපේ ආයතනවල පරිපාලනය බිඳ නොවැටෙන ආකාරයට කටයුතු පවත්වාගෙන යන්න සහ කළමනාකරණය කර ගන්නයි.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා "ආශාවරී" කියන සංගීත කණ්ඩායම ගැන. මමත් දැක්කා ඒ පිරිස. ලෝක ළමා දිනය දවසේ විහාරමහා දේවී උද්‍යානයේදී ඒ ගොල්ලන් තමයි සංගීතය සැපයුවේ. ඒ, මැදිරිගිරිය ප්‍රදේශයේ පිරිසක්. දවසක් මේ කාරණය සම්බන්ධයෙන් අහපු ප්‍රශ්නයට පිළිතුරක් දුන්නා අපේ විෂය භාර රාජ්‍ය අමාත්‍යතුමිය විසින්. ඒ නිසා මම එතුමියටත් කථා කරලා මේ ගැන කියන්නම්. අපට නම් කිසිම ප්‍රශ්නයක් නැහැ. මොකද, ඒ අය ළමා මට්ටමින් ම තමයි ඒ සංගීත ප්‍රසංගය පවත්වන්නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
එහෙම නම්, ඒ බව පොලිසිය භාර ඇමතිතුමාට කියන්න.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
පොලිසිය භාර ඇමතිතුමා දැනට රෝහලේ ඉන්නේ. එතුමා ආවාම මම ඒ ගැන කියන්නම්. *[බාධා කිරීමක්]* අපට නම් ප්‍රශ්නයක් නැහැ. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය භාර රාජ්‍ය ඇමතිතුමිය ඒ සම්බන්ධයෙන් පිළිතුරක් දුන්නා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, වැදගත් කාරණයක් කියන්න මට පොඩි වෙලාවක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉක්මනට කියන්න, ගරු මන්ත්‍රීතුමා. කාලය ගත වෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි. මම මේ ප්‍රශ්නය අහන්නේ අධ්‍යාපන ඇමතිතුමාගෙන් නොවෙයි, ගරු අධිකරණ ඇමතිතුමාගෙන්. ඒ, නීති අධ්‍යාපනයට අදාළවයි. ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා කිව්වා, වර්ෂ 2020 පළ කළ ඒ ගැසට් පත්‍රය තවම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා නැති බව. ඒ ගැසට් පත්‍රය පාර්ලිමේන්තුවේ අනුමැතියට තවම ඉදිරිපත් කරලා නැත්නම්, නීති විද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් තමන් කැමැති භාෂාවකින් විභාගයට මුහුණ දෙන්නේ කොහොමද? සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනෙන් තමන්ට කැමැති භාෂාවක් තෝරාගන්න අවස්ථාව තිබියදී, විෂයන් තුනක් සම්බන්ධයෙන් පමණක් ඉංග්‍රීසි භාෂාවෙන් පිළිතුරු ලිවිය යුතුයි කියා සඳහන් කර තිබෙනවා. ඒ නිසා ගැසට් පත්‍රය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන කල් එක්කෝ විභාගය කල් දමන්න ඕනෑ, එහෙම නැත්නම් නීති විද්‍යාලයට කියන්න ඕනෑ, යම් කාලයකට මේ ආකාරයට කටයුතු කරන්න කියලා. ගරු අධිකරණ අමාත්‍යතුමනි, ඔබතුමාටයි ඒ ගැසට් එක සම්බන්ධව තීන්දුව ගන්න පුළුවන්. ඔබතුමා ලියුම් ලියලියා ඉන්න ගියොත් ප්‍රමාද වැඩියි. මොකද, ලබන මස 02 වැනි දා විභාගය පවත්වන්න නියමිතයි. එතකොට ඔබතුමා ආයෙත් මේ පාර්ලිමේන්තුවේදී කියාවි, "මොනවා කරන්නද? 02 වැනි දා විභාගය පවත්වන්න සිදු වෙලා" කියලා. මේක ලියුම් ලියන වෙලාවක් නොවෙයි. ඒ නිසා මේ සම්බන්ධයෙන් කඩිනම් මැදිහත්වීමක් කරන්න, ගරු ඇමතිතුමනි. අප කියන්නේ ඒ විභාගය නොපවත්වන්න කියන එක නොවෙයි, ගරු ඇමතිතුමනි. සාධාරණ කාලයක් දීලා විභාගය පවත්වන්න. එච්චරයි!

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ගරු කථානායකතුමනි, නීති අධ්‍යාපන සභා පනත අනුව, it is only with the concurrence of the Council that we can publish the Gazette. අදාළ ගැසට් නිවේදනය නිවපු ගරු අධිකරණ

ඇමතිතුමා තමයි පළ කර තිබෙන්නේ. ඒක තවම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා නැහැ. ඒ නිසා එය ක්‍රියාත්මක කිරීමට තිබෙන නීතිමය බාධාවත් සඳහන් කරලා තමයි නීති අධ්‍යයන කවුන්සලයට මම මේ කාරණය දැනුම් දීලා තිබෙන්නේ. එතැනින් ප්‍රතිචාරයක් ලැබෙන්න දින කිහිපයක් යයි. ඊට පසුව අපි තීරණයක් ගනිමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 1, ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මන්ත්‍රීතුමා.

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ඒ එක්කම මම පොඩි කාරණාවක් කියන්න ඕනෑ, ගරු කථානායකතුමනි. මම හැම රැස්වීම් දවසකම උදේම පාර්ලිමේන්තුවට එන කෙනෙක්. අද එන්න විනාඩි පහක් පරක්කු වුණා. අද මගේ නමින් මේ ප්‍රශ්නය තිබෙන බවක්වත් මම දන්නේ නැහැ. වෙනදාට ප්‍රශ්න ඇතුළත් න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය කලින් එවනවා. අනෙකුත් ලේඛනත් අපට එවනවා. මේ table එක මත ඊයේ තබා තිබෙන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකයෙහි අද ප්‍රශ්න තිබෙන බවක් සඳහන් වෙලා නැහැ. එහි තිබෙන්නේ 11 වැනි දා සිට ඉදිරියට ඒවා. ඒ නිසා මගේ මේ ප්‍රශ්නය අසා අතුරු ප්‍රශ්න අහන්නත් මට අවස්ථාව දෙන්න කියා මම බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටයේදී අතුරු ප්‍රශ්න අහන්න අවස්ථාවක් නැහැ.

## වී ගොවිතැනේ නිරත ගොවීන්: පොහොර ලබා දීම
## நெற்செய்கையில் ஈடுபடும் விவசாயிகள்: உரம் வழங்குதல்
## FARMERS ENGAGED IN PADDY FARMING: PROVISION OF FERTILIZER

1515/2022

**1. ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ වී ගොවිතැන සිදු කරනු ලබන කුඹුරු අක්කර ප්‍රමාණය සහ වී ගොවිතැන සිදු කරනු ලබන ගොවි පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

(ii) වර්ෂ 2015 සිට 2019 දක්වා වී ගොවිතැනින් ඉවත් වූ පවුල් සංඛ්‍යාව;

(iii) එම කාලය තුළ වී ගොවීන් සඳහා පොහොර සහනාධාරය ලබා දීමට වැය කරන ලද මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 2020 වර්ෂයේ ශ්‍රී ලංකාවේ මුළු පොහොර අවශ්‍යතාව එක් එක් භෝගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2020 වර්ෂයේ රසායනික පොහොර ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල හා ආනයනය කරන ලද පොහොර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது இலங்கையில் நெற் பயிர்ச்செய்கை மேற்கொள்ளப்படும் வயற்காணிகளின் பரப் பளவு எத்தனை ஏக்கர்கள் என்பதையும், நெற் பயிர்ச்செய்கையில் ஈடுபடும் விவசாயக் குடும்பங் களின் எண்ணிக்கை தனித்தனியாக எத்தனை என்பதையும்;

(ii) 2015ஆம் ஆண்டு முதல் 2019ஆம் ஆண்டு வரையில் நெற் பயிர்ச்செய்கையிலிருந்து விலகி யுள்ள குடும்பங்களின் எண்ணிக்கை யாதென் பதையும்;

(iii) இக்காலப்பகுதியில் நெல் விவசாயிகளுக்கு உர மானியம் வழங்குவதற்காகச் செலவிடப்பட்டுள்ள நிதித்தொகை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2020ஆம் ஆண்டில் இலங்கையின் மொத்த உரத் திற்கான தேவைப்பாடு ஒவ்வொரு பயிருக்கும் ஏற்ப வெவ்வேறாக யாதென்பதையும்;

(ii) 2020ஆம் ஆண்டில் இரசாயன உரத்தை இறக்குமதி செய்வதற்காகச் செலவிடப்பட்டுள்ள நிதித்தொகை மற்றும் இறக்குமதி செய்யப்பட் டுள்ள உரத்தின் அளவு வெவ்வேறாக யாதென் பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he inform this House -

(i) the acreage of paddy fields in which paddy farming is conducted and the number of families engaged in paddy farming in Sri Lanka at present, separately;

(ii) the number of families who departed from paddy farming from the year 2015 to the year 2019; and

(iii) the amount that was spent for granting fertilizer subsidy to paddy farmers during that period?

(b) Will he also inform this House, separately-

(i) quantities of fertilizer that were needed in the year 2020 in respect of each crop; and

(ii) amount of money that was spent on importing chemical fertilizers and the quantity of fertilizer that was imported in the year 2020?

(c) If not, why?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) ශ්‍රී ලංකාවේ වී ගොවිතැන් සිදු කරනු ලබන කුඹුරු අක්කර ප්‍රමාණය:

- 2021/22 මහ කන්නයේදී වගා කර ඇති කුඹුරු ප්‍රමාණය දළ වශයෙන් අක්කර අක්කර 1,917,000කි.
- 2022 යල කන්නයේදී වගා කර ඇති කුඹුරු ප්‍රමාණය දළ වශයෙන් අක්කර 1,179,000කි.

(මූලාශ්‍රය:සංඛ්‍යාලේඛනඅංශය,කෘෂිකර්ම අමාත්‍යාංශය **- ඇමුණුම 1**)**

වී ගොවිතැන් සිදු කරනු ලබන ගොවි පවුල් සංඛ්‍යාව:

- මේ වනවිට ලංකාවේ වී ගොවිතැන් සිදු කරනු ලබන ගොවි පවුල් සංඛ්‍යාව දළ වශයෙන් 1,152,500කි.

(මූලාශ්‍රය: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව - ඇමුණුම 2-a සහ 2-b)

(ii) වී ගොවිතැනෙන් පවුල් ඉවත් වීමක් සිදු වී නොමැත.

(මූලාශ්‍රය: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව - ඇමුණුම 2-a**, 2-b** සහ 2-c**)

(iii)

| | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| සහනාධාර මුදල් ප්‍රදානය (රු. මි.) | - | 13,088.56 | 9,324.38 | 2,941.01 | - |
| වී පොහොර සඳහා සහනාධාර (රු. මි.) | 39,787.65 | - | - | 6,399.37 | 9,764.33 |
| වී පොහොර සඳහා වූ දිගු කාලීන ණය ගෙවීම (රු. මි.) | - | - | 16,463.03 | 14,995.46 | 13,458.72 |
| **වී පොහොර සඳහා මුළු සහනාධාර වියදම (රු. මි.)** | **39,787.65** | **13,088.56** | **25,787.41** | **24,335.84** | **23,223.05** |

(මූලාශ්‍රය - ජාතික පොහොර ලේකම් කාර්යාලය)

*** පුස්තකාලයේ තබා ඇත.*
*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

(ආ) (i)

- 2020 වර්ෂයේදී (2019/20 මහ සහ 2020 යල) වී වගාව සඳහා මුළු පොහොර අවශ්‍යතාව මෙට්‍රික් ටොන් 382,000ක් විය.
- අනෙකුත් භෝග සඳහා මුළු පොහොර අවශ්‍යතාව දළ වශයෙන් මෙට්‍රික් ටොන් 728,700ක් විය.
- ඒ අනුව 2020 වර්ෂය සඳහා මුළු පොහොර අවශ්‍යතාව දළ වශයෙන් මෙට්‍රික් ටොන් 1,110,700ක් විය.

(මූලාශ්‍රය: ජාතික පොහොර ලේකම් කාර්යාලය - ඇමුණුම 3**)

(ii)

- 2020 වර්ෂයේ රසායනික පොහොර ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුළු මුදල ආසන්න වශයෙන් රුපියල් මිලියන 33,974කි. (ඇමුණුම 4**)
- 2020 වර්ෂයේ ආනයනය කරන ලද මුළු පොහොර ප්‍රමාණය දළ වශයෙන් මෙට්‍රික් ටොන් 891,000කි. (ඇමුණුම 5**)

(මූලාශ්‍රය - ජාතික පොහොර ලේකම් කාර්යාලය)

(ඇ) අදාළ නොවේ.

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)
ගරු කථානායකතුමනි, අපට කලින් දැනුවත් කළ විධියට කටයුතු කරන්නේ නැති එක- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න ඇතුළත් න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය ඔබතුමන්ලාට එවනවා.

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)
නැහැ, දැන් එවන්නේ නැහැ. පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමනි, දැන් එය එවන්නේ නැහැ. මම Table Office එකෙනුත් ඇහුවා. ඒ නිලධාරින් කිව්වා, තිබෙන මොනවාදෝ ප්‍රශ්නත් එක්ක, එවන්නේ නැහැ කියලා. ඒ නිසා මන්ත්‍රීවරු දැනුවත් නැහැ. එවැනි ප්‍රශ්නයක් වෙලා ඊයේත් චෝදනා කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් ඒ අදාළ ලේඛන පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියට ඇතුළත් කරනවා. සෑම මන්ත්‍රීවරයකුටම ඒවා බලාගන්න පුළුවන්. එය පරීක්ෂා කර බලන්න, ගරු මන්ත්‍රීතුමා. ඒ පිළිබඳ ගැටලුවක් තිබෙනවා නම් නිවැරදි කරන්නම්.

*** පුස්තකාලයේ තබා ඇත.*
*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

## රෝහණ විජේවීර මහතා අත් අඩංගුවට ගැනීම සහ මරණය: විස්තර

## திரு. ரோஹண விஜேவீரவினது கைதும் மரணமும்: விபரம்

## ARREST AND DEATH OF MR. ROHANA WIJEWEERA: DETAILS

2039/2022

**6. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු ලලිත් එල්ලාවල මහතා වෙනුවට)**
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு லலித் எல்லாவல சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Lalith Ellawala)
මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ජනතා විමුක්ති පෙරමුණේ හිටපු නායක රෝහණ විජේවීර මහතාව 1989.11.12 වන දින එවකට පැවැති රජය විසින් අත් අඩංගුවට ගෙන ඒ බව මාධ්‍ය මඟින් ප්‍රකාශයට පත් කරන ලද බවත්;

(ii) 1989.11.13 වන දින ඔහු මිය ගොස් ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) රෝහණ විජේවීර මහතාගේ මරණය ස්වාභාවික මරණයක්ද;

(ii) නො එසේ නම්, ඝාතනයක්ද;

(iii) එම මරණය ඝාතනයක් නම්, ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අධිකරණයක් මඟින් ලබා දෙන ලද නඩු තීන්දුවක් තිබේද;

(iv) මෙම මරණය සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයකු හෝ නායකයකු හෝ විසින් නීති මඟින් කටයුතු කිරීමට පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மக்கள் விடுதலை முன்னணியின் முன்னாள் தலைவர் திரு. ரோஹண விஜேவீர அவர்களை 1989.11.12ஆம் திகதி அப்போது ஆட்சியிலிருந்த அரசாங்கம் கைதுசெய்து, அது தொடர்பாக ஊடகங்களின்மூலம் வெளிப்படுத்தியது என்பதையும்;

(ii) 1989.11.13ஆம் திகதி அவர் உயிரிழந்துள்ளார் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) திரு. ரோஹண விஜேவீர அவர்களின் மரணம் இயற்கை மரணமா என்பதையும்;

(ii) இன்றேல், அது ஒரு படுகொலையா என்பதையும்;

(iii) படுகொலை எனின், அது தொடர்பில் இலங்கை நீதிமன்றமொன்றினால் வழங்கப்பட்டுள்ள வழக்குத் தீர்ப்பொன்று உள்ளதா என்பதையும்;

(iv) மேற்படி மரணம் தொடர்பில் மக்கள் விடுதலை முன்னணியின் உறுப்பினர் ஒருவர் அல்லது தலைவர் ஒருவர் சட்டரீதியான நடவடிக்கைகளை மேற்கொள்வதற்கு நடவடிக்கை எடுத்துள்ளாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security:

(a) Is he aware that -

(i) on 12.11.1989 the then Government arrested Mr. Rohana Wijeweera, ex-leader of the Janatha Vimukthi Peramuna, and published that fact in the media; and

(ii) Mr.Rohana Wijeweera died on 13.11.1989?

(b) Will he inform this House -

(i) whether Mr. Rohana Wijeweera's death is a natural one;

(ii) or else, whether it is an assassination;

(iii) if the death is an assassination, whether there is a verdict given by a court of law in Sri Lanka; and

(iv) whether a member or a leader of the Janatha Vimukthi Peramuna has taken steps to institute legal action regarding the death?

(c) If not, why?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මහජන ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) ජනතා විමුක්ති පෙරමුණේ හිටපු නායක රෝහණ විජේවීර මහතා අත් අඩංගුවට ගැනීම හා මරණය සම්බන්ධයෙන් 1989 නොවැම්බර් මස 14, 18 හා 21 යන දිනවල නිකුත් වූ දිනමිණ පුවත් පත්වල වාර්තා පළ වී ඇත.

(ii) එම පුවත් පත් වාර්තාවල පිටපත් ඇමුණුම** යටතේ ඉදිරිපත් කර ඇත.

(ආ) (i) නොදනී.

මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හෝ ශ්‍රී ලංකා පොලිසියේ වෙනත් ස්ථානයක් මඟින් විමර්ශනයක් සිදු කර නොමැත.

(ii) නොදනී.

(iii) නොදනී.

(iv) නොදනී.

(ඇ) ජනතා විමුක්ති පෙරමුණේ හිටපු නායක රෝහණ විජේවීර මහතා අත් අඩංගුවට ගැනීම හෝ 1989.11.13 දින මිය යෑම සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් ලේඛනගත වී නොමැත.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

## වගවත්ත ටයර් කර්මාන්තශාලාව සඳහා යටිතල පහසුකම් : වැය කළ මුදල
වகவத்தை 'டயர்' தொழிற்சாலைக்கான உட்கட்டமைப்பு வசதிகள் : செலவிடப்பட்ட தொகை
INFRASTRUCTURE FACILITIES FOR WAGAWATTA TYRE FACTORY: MONEY SPENT

2059/2022

**8. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා වෙනුවට)**
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு நலின் பண்டார ஜயமஹ சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Nalin Bandara Jayamaha)
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) හොරණ, වගවත්ත ටයර් කර්මාන්තශාලාව ඉදිකිරීමේ ව්‍යාපෘතියට යටිතල පහසුකම් ලබා දීම සඳහා භාවිත කරන ලද අරමුදල් කවරේද;

(ii) එම කර්මාන්තශාලාව සඳහා ලබා දී ඇති විදුලි සම්බන්ධතාව මෙගාවොට් කොපමණද;

(iii) ඉහත ව්‍යාපෘතිය සඳහා ජල සැපයුම ලබා දෙන ලද ආකාරය කවරේද;

(iv) එම ව්‍යාපෘතියේ පිවිසුම් මාර්ගය ඉදි කිරීම සඳහා රජය විසින් වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

முதலீட்டு மேம்பாடு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஹொரண, வகவத்தை 'டயர்' தொழிற்சாலை நிர்மாணக் கருத்திட்டத்திற்கு உட்கட்டமைப்பு வசதிகளை வழங்குவதற்காகப் பயன்படுத்தப் பட்ட நிதியங்கள் யாவையென்பதையும்;

(ii) மேற்படி தொழிற்சாலைக்கு வழங்கப்பட்டுள்ள மின் இணைப்பானது எத்தனை மெகாவாட் என்பதையும்;

(iii) மேற்படி கருத்திட்டத்திற்கு நீர் விநியோகம் வழங்கப்பட்டுள்ள விதம் யாதென்பதையும்;

(iv) மேற்படி கருத்திட்டத்திற்கான நுழைவுப் பாதையை நிர்மாணிப்பதற்கு அரசாங்கத்தால் செலவிடப்பட்ட பணத்தொகை எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Investment Promotion:

(a) Will he inform this House -

(i) the amount of funds that were utilized for providing infrastructure facilities for the project to construct the Wagawatta Tyre Factory in Horana;

(ii) the megawatt capacity of the electricity supply that has been provided to the said factory;

(iii) the manner in which the water supply is provided to the aforesaid project; and

(iv) the amount of money that was spent by the Government on the construction of the access road to the said project?

(b) If not, why?

**ගරු දිලුම් අමුණුගම මහතා (ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு திலும் அமுனுகம - முதலீட்டு மேம்பாடு இராஜாங்க அமைச்சர்)
(The Hon. Dilum Amunugama - State Minister of Investment Promotion)
ගරු කථානායකතුමනි, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) වගවත්ත කර්මාන්ත කලාපය සඳහා අභ්‍යන්තර යටිතල පහසුකම් ලබා දීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අරමුදල් ආසන්න වශයෙන් රුපියල් මිලියන 302ක් පමණ භාවිත කර ඇත.

මෙම මුදල සෘජුවම ටයර් කර්මාන්තශාලාව ඉදි කිරීමේ ව්‍යාපෘතියට පමණක් නොව සම්පූර්ණ වගවත්ත කලාපයේ යටිතල පහසුකම් සඳහා වැය කරන ලදී.

(ii) ලංකා විදුලිබල මණ්ඩලය විසින් ටයර් කර්මාන්තශාලාව සඳහා මෙගාවොට් 18ක විදුලි සම්බන්ධතාවක් ලබා දී ඇත.

(iii) වගවත්ත කර්මාන්ත කලාපය සඳහා හොරණ අපනයන සැකසුම් කලාපයේ සිට ජලනළ මාර්ගයකින් ජලය ලබා දී ඇත.

(iv) ව්‍යාපෘතියේ පිවිසුම් මාර්ගය ඉදි කිරීම සඳහා රජය විසින් මුදල් වැය කර නොමැත.

වගවත්ත වෙළඳ කලාපයේ පිවිසුම් මාර්ගය ඉදි කිරීම සඳහා රුපියල් 494,374,993.60ක් වැය කරන ලදී.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

## ආබාධ සහිත පුද්ගලයන් සුබසාධන සහ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා දායක කර ගැනීම
மாற்றுத்திறனாளிகளை நலன்புரி மற்றும் அபிவிருத்திச் செயற்பாடுகளில் இணைத்துக்கொள்ளல்
ENGAGEMENT OF DIFFERENTLY-ABLED PEOPLE IN WELFARE AND DEVELOPMENT ACTIVITIES

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

මෙරට සමස්ත ජනගහනයෙන් මිලියන 1.7ක් -ලක්ෂ 17ක් - පමණ, එනම් සමස්ත ජනගහනයෙන් සියයට 7ත්, 9ත් අතර පිරිසක් ආබාධ සහිත පුද්ගලයන් වනවා. සිය අවශ්‍යතා හා වුවමනා සපුරාගැනීමේදී, එනම් වෛද්‍ය පහසුකම්, අධ්‍යාපනය සහ රැකියා කටයුතුවලට යොමු වීමේදී මෙරට පොදු පහසුකම්වල පවතින අඩු පාඩු නිසා ඔවුන්ට දුෂ්කරතා රැසකට මුහුණ දීමට සිදුව තිබෙනවා. මෙම ආබාධ සහිත ජනතාවගේ අවශ්‍යතා මෙන්ම කුසලතා හඳුනාගනිමින් රටේ සාමාන්‍ය පුරවැසියන් ඉලක්ක කොට සිදු කරන සෑම සුබසාධන සහ සංවර්ධන ක්‍රියා දාමයකටම ආබාධ සහිත තැනැත්තන් දායක කරගැනීම සඳහා කටයුතු කළ යුතුයි. ඒ සඳහා ආබාධ සහිත ප්‍රජාව මුහුණ දෙන භෞතික මෙන්ම ප්‍රතිපත්තිමය බාධා ද ඉවත් කිරීම සිදු කළ යුතුයි. එසේම, ආණ්ඩුව ආබාධිත ප්‍රජාවට සිය අභියෝග ජය ගැනීමට අවශ්‍ය සහයෝගය ලබා දීම සඳහා මූලිකත්වය දී කටයුතු කළ යුතුයි.

ගරු කථානායකතුමනි, මා විශේෂයෙන්ම මතක් කරන්න කැමැතියි, පසුගිය ජනාධිපතිවරණයේදී අප මේ රටේ ලක්ෂ 17ක් පමණ වූ ආබාධ සහිත ජනතාව සමඟ සමාජ ගිවිසුමකට ප්‍රවේශ වුණු බව. ඒ ප්‍රතිපත්ති මාලාව තමයි දැන් මා ළඟ මේ තිබෙන්නේ. මා එම ප්‍රතිපත්ති මාලාව **සභාගත*** කරනවා, ගරු කථානායකතුමනි.

එදා ඒ ජනාධිපතිවරණය ජයග්‍රහණය කරපු තැනැත්තා අද ජනාධිපති තනතුරේත් නැහැ. නමුත්, එතුමා නියෝජනය කරමින් නිර්මාණය වුණු ආණ්ඩුව අපොහොසත් වෙලා තිබෙනවා, ආබාධිත ප්‍රජාව වෙනුවෙන් ඉටු කළ යුතු කාර්ය භාරය ඉෂ්ට කරන්න.

ආබාධිත ජනතාව ගැන කථා කරන කොට මා කියන්න ඕනෑ, පුද්ගලයන් 1,000කට ආබාධ සහිත අය 87දෙනෙකු සිටින බව. 2011 වර්ෂයේ සංගණනය අනුව දළ වශයෙන් අප මේ සංඛ්‍යා කියන්නේ. ආබාධ සහිත තැනැත්තන්ගෙන් සියයට 57ක් කාන්තාවන්; සියයට 43ක් පිරිමි අය. අපේ රටේ සමස්ත ජනගහනයෙන් ආබාධ සහිත කාන්තාවන් සියයට 5ක් ඉන්නවා. ආබාධ සහිත ඡන්ද දායකයන් ඉන්නවා, ලක්ෂ 12ක් පමණ. ඒ නිසා ආබාධ සහිත ජනතාව නොසලකා හැරීම සිදු කරන්නේ නැතිව, ඒ අය මුහුණ දෙන ගැටලුවලට, ප්‍රශ්නවලට සාධනීය විසඳුම් ලබා දීම රජයේ වගකීමක් සහ යුතුකමක් වනවා. ඒ අනුව, මෙය ජාතික වැදගත්කමකින් යුතු ගැටලුවක් වශයෙන් සලකා පහත සඳහන් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු හා පැහැදිලි කිරීම් රජයෙන් බලාපොරොත්තු වෙනවා.

1. ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම, 2020 වර්ෂයේදී යාවත්කාලීන කර ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇති බව එවකට විෂයභාර අමාත්‍යතුමිය විසින් පාර්ලිමේන්තුවේදී 2020.02.06 දින ප්‍රකාශ කරනු ලැබුවා.

   එදා ඒ ප්‍රශ්නය ඇහුවේත් මමයි. එවකට සිටි ඇමතිතුමිය කිව්වා, එය යාවත්කාලීන කරනවා කියලා. නමුත්, මේ වනතෙක් එය ක්‍රියාත්මක වෙලා නැහැ. එම සැලැස්ම මෙතෙක් ක්‍රියාත්මක නොවූයේ ඇයි? එම සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන්නේ කවදා වනවිට ද? එම සැලැස්ම ක්‍රියාත්ම කිරීම පටන් අරගෙන අවසන් කරන දින පිළිබඳව මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නේ ද?

2. ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සඳහා වූ ජාතික කොමිෂන් සභාවක් ආබාධ සහිත පුද්ගල සංවිධාන ඒකාබද්ධ පෙරමුණ පුන පුනාම ඉල්ලුම් කර තිබෙනවා. ඒ අනුව, මේ රටේ විශේෂයෙන්ම ආබාධ සහිත ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරක්ෂා වන ආකාරයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරමින් ප්‍රතිපාදන සකස් කිරීමත්, ඒ වාගේම ජාතික කොමිෂන් සභාවක් ලබා දීමත් ක්‍රියාත්මක කරන්නේ කවදා ද? ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 33 වැනි වගන්තියේ සඳහන් නිර්ණායකයන්ට අනුකූලව සංශෝධනය කරනු ලැබූ නව පනත් කෙටුම්පත මේ දක්වා පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොවීමට හේතු කවරේ ද? හැම දාම කියනවා, එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අනුකූලව අලුත් නීති ගෙනෙනවා කියලා. තිබෙන නීතිය සංශෝධනය කරනවා කියලා. නමුත්, එය කථාවට පමණක් සීමා වී තිබෙනවා. මෙය කඩිනමින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට රජය අපේක්ෂා කරන්නේ ද? එසේ නම්, ඒ කවදා වනවිට ද?

3. ශ්‍රවණාබාධිත පුද්ගලයින්ට සිය අවශ්‍යතා ඉටු කර ගැනීමේදී සංඥා භාෂාව අත්‍යවශ්‍ය වේ. මේ වනවිට කෙටුම්පත් කර ඇති සංඥා භාෂා පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොවූයේ මන් ද? එම පනත් කෙටුම්පතත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකරන්නේ ඇයි? මේ රටේ ලක්ෂ 17ක් වූ ආබාධිත ජනතාවට මේ පවතින ක්‍රමය යටතේ ක්‍රියාත්මක වන කුඩම්මාගේ සැලකිල්ලද මේ තවදුරටත් ක්‍රියාත්මක කරන්නේ? එම සංඥා භාෂා පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ කවදාද? එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන නිශ්චිත දින වකවානු කවරේද?

4. මෙරට රාජ්‍ය ආයතනයන්හි සංඥා භාෂා පරිවර්තකයින් කොපමණ සංඛ්‍යාවක් සේවයේ යෙදී සිටී ද? එම පිරිස ප්‍රමාණවත් යැයි රජය සිතන්නේ ද? නොඑසේ නම්, ඉදිරියේදී රාජ්‍ය සේවයට සංඥා භාෂා පරිවර්තකයින් බඳවා ගැනීමට රජය කටයුතු කරන්නේ ද?

5. විශේෂ අවශ්‍යතා සහිත දරුවන් පාසල් අධ්‍යාපනය සඳහා යොමු කරවීමේ රජයේ සැලසුම කුමක් ද? එම දරුවන්ට අධ්‍යාපනය ලබා දීම සඳහා විශේෂ පුහුණුව ලත් ගුරුවරුන් ප්‍රමාණවත් පරිදි සිටීද? පාසල් අධ්‍යාපනයෙන් පසු එම දරුවන් වෘත්තීය අධ්‍යාපනය සඳහා යොමු කරවීමට රජය සතු වැඩ පිළිවෙළ කුමක්ද?

6. ප්‍රවේශ පහසුකම් නොමැති වීම ආබාධිත ප්‍රජාවට රාජ්‍ය ආයතනවල සේවාවන් ලබා ගැනීම සඳහා බාධාවක් වී ඇති බව රජය දන්නේ ද? එසේ නම්, ඒ සඳහා රජය ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද? ඉදිරියට ගොඩනැඟිලි ඉදිකිරීම් සඳහා සැලසුම් අනුමත කිරීමේදී ආබාධිත ප්‍රජාවගේ ප්‍රවේශ පහසුකම් අනිවාර්ය අංගයක් විය යුතු බවට විධිවිධාන ගෙන ඒමට රජය කටයුතු කරන්නේද?

ගරු කථානායකතුමනි, මේ වනවිටත් පාර්ලිමේන්තුව 2006 අංක 1467/15 දරන ගැසට් පත්‍රයේ සඳහන් නියෝග මඟින් පොදු ස්ථාන සහ පොදු ගොඩනැඟිලිවල ප්‍රවේශ පහසුකම් සකස් කළ යුතු බවට නියෝග කර තිබෙනවා. නමුත්, ඒ නියෝග ක්‍රියාත්මක වෙන්නේ නැහැ. එම ගැසට් පත්‍රය මේ අවස්ථාවේ දී මා **සභාගත*** කරනවා.

එමෙන්ම සියලු රාජ්‍ය ආයතන ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ පහසුකම් සකස් කළ යුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණය මඟින්ද තීන්දුවක් ලබා දී තිබෙනවා. SCFR No. 221/2009 දරන එම ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවත් මම **සභාගත*** කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

*** පුස්තකාලයේ තබා ඇත.*
*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

පසුව නැවතත්, 2018 වර්ෂයේදී රාජ්‍ය ආයතන ලැයිස්තුවක් නම් කරලා, ආබාධ සහිත තැනැත්තන්ට එම රාජ්‍ය ආයතනවල ප්‍රවේශ පහසුකම් සකස් කළ යුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් SC FR Application No. 273/2018 නඩුවෙන් තීන්දුවක් ලබා දී තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ සියලුම ලේඛන මා **සභාගත*** කරනවා.

ආබාධිත ප්‍රජාව වෙනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණය දුන් තීන්දු ක්‍රියාත්මක කරන්නේත් නැහැ; රජය නිකුත් කරන ගැසට් පත්‍ර ක්‍රියාත්මක වන්නේත් නැහැ. මේක හරි විහිළුවක්. මෙහෙම වෙන්නේ ඇයි, මේවා ක්‍රියාත්මක නොකරන්නේ ඇයි කියා මා රජයෙන් අහන්න කැමැතියි.

7. ආබාධ සහිත පුද්ගලයින්ට රජය මඟින් ලබාදෙන රුපියල් 5,000 දීමනාව සමෘද්ධි බැංකු හරහා පමණක් ලබා දීමට කටයුතු ආරම්භ වී ඇති බවත්, මේ හේතුවෙන් පසුගිය මාස දෙක තුළ එම දීමනාව ආබාධිත පුද්ගලයින්ට නොලැබී ඇති බවත් වාර්තා වේ. මෙහි සත්‍යතාව කුමක්ද? මෙම දීමනාව සමෘද්ධි බැංකුව හරහා පමණක් ලබා දීමට කටයුතු කිරීම තුළින් ආබාධිත ප්‍රජාව බොහෝ අපහසුතාවන්ට මුහුණ දෙන බව රජය දන්නේද? ඒ සඳහා රජය ගෙන ඇති පියවර කවරේද?

ස්තුතියි.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්න මාලාවේ ඇතුළත් 5වන ප්‍රශ්නය අධ්‍යාපනයට සම්බන්ධ වන නිසා මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා. සෙසු ප්‍රශ්න සඳහා විෂයභාර අමාත්‍යතුමා විසින් ඉදිරි දිනයකදී පිළිතුරු ලබා දෙයි.

ගරු කථානායකතුමනි, 5වන කාරණයෙන් අහන්නේ විශේෂ අවශ්‍යතා සහිත දරුවන් පිළිබඳවයි. එයට පිළිතුරු මෙසේයි.

ජාතික අධ්‍යාපන කොමිසම විසින් සකස් කර ඇති විශේෂ අධ්‍යාපන ප්‍රතිපත්ති මාලාව අනුව විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් වෙනුවෙන් පාසල් අධ්‍යාපන වැඩසටහනක් හඳුන්වා දී ඇත. එම වැඩසටහන අනුව සෑම වසරකම ජනවාරි 31 දිනට වයස අවුරුදු 3 සම්පූර්ණ කරන විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමුන්ගේ - children with special education needs - තොරතුරු ලියා පදිංචි කරනු ලැබේ.

ජාතික ප්‍රතිපත්තියට අනුව විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමුන්ට දැනට ආරම්භ කර ක්‍රියාත්මක වන විශේෂ අධ්‍යාපන වැඩ පිළිවෙළ මෙසේය.

1. සෑම වසරකම ජනවාරි 31 දින වන විට වයස අවුරුදු 3 සම්පූර්ණ කළ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමුන් හඳුනා ගැනීම.

2. හඳුනා ගත් ළමයින්ගේ දෙමව්පියන්ට සෞඛ්‍ය හා අධ්‍යාපන අමාත්‍යාංශ එක්ව දෙමාපියන් දැනුවත් කිරීමේ අවස්ථා තුනක් ලබා දීම.

3. වයස අවුරුදු 4 දී විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් 2023 වර්ෂයේ සිට පාසල්වලට ඇතුළත් කිරීම.

4. එලෙස වයස අවුරුදු 4 දී, උග්‍ර ආබාධිත සිසුන්ට ඉගැන්වීමට ගුරු පුහුණුව ලබා දී ඇති පරිදි ගුරුවරුන් ඉගැන්වීම ආරම්භ කිරීම. ඒ සඳහා අන්තර්කරණ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ සකසා ඇත.

5. විශේෂ අධ්‍යාපන ක්‍රමෝපාය පන්ති කාමරය හෙවත් විශේෂ අධ්‍යාපන ඒකකය තුළ සංවර්ධනය වූ සිසුන් ප්‍රාථමික හෝ සාමාන්‍ය පන්තියකට ඒකීයකරණය කරනු ලැබේ. 1969 සිටම මෙම integration වැඩ පිළිවෙළ පැවති අතර, එය දැන් මනාව සංවිධානය කෙරෙමින් පවතී.

6. සාමාන්‍ය පන්ති කාමරයේ ඉගෙනුම ලබන සිසුන් 5දෙනෙකුට විශේෂ අධ්‍යාපන ගුරු භවතෙකුගේ සහාය ඇතිව ප්‍රාථමික අධ්‍යාපනය ලබා දීමට සැලසුම් කර ඇත.

7. අධ්‍යාපන තක්සේරුකරණ වාර්තාවට අනුව විශේෂ අධ්‍යාපනය නොලබන, එහෙත් සුළු ආබාධිත සිසුන් පළමුවන ශ්‍රේණියට ඇතුළත් කිරීමේදී කුමන ගණයකින් හෝ සියයට 3 ආබාධිතභාවය පදනම් කරගෙන සාමාන්‍ය ක්‍රමයට 2024 වර්ෂයේ සිට පාසලට ඇතුළත් කිරීමට විධිවිධාන යොදා ඇත.

8. විභාග සහන යටතේ විභාගයට පෙනී සිටින අඩු ආදායම් සහිත විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සිසුන්ට 6 ශ්‍රේණියේ දී ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමේදී අමතර ශිෂ්‍යත්ව 250ක් ලබා දීම 2018 වර්ෂයේ සිට ආරම්භ කර ඇත.

9. විභාග සහන යටතේ 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්වයට පෙනී සිටින සිසුන්ට පාසල් ලබා දීමේදී අමතර සහන සලසා ඇත.

10. උසස් පෙළට ළමුන් ඇතුළත් කිරීමේදී විභාග සහන යටතේ විභාගයට පෙනී සිටින විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්ට සහන සලසා ඇත.

11. 2014 වන විට විශේෂ අධ්‍යාපන ගුරු පුහුණුව ලැබූ ගුරුවරුන් 588දෙනෙකු වෙනත් විෂයයන් ඉගැන්වීම නිසා මෙම සිසුන් 3,500කට පමණ අධ්‍යාපනය අහිමි වී තිබුණි. 2014 දී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ හා අධ්‍යාපන කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ උපදෙස් පරිදි, විශේෂ අධ්‍යාපන ගුරුවරුන් වෙනත් විෂයයන් ඉගැන්වීම නවතා ඇත. ඒ අනුව දැනට ඒ අවශ්‍ය ගුරුවරුන්ගේ ඌනතාව 200 දක්වා අඩු කර ඇත. විද්‍යා පීඨවල පුහුණුව ලැබූ 8,000ක පිරිසකට පත්වීම් දෙන්න සූදානම් කර තිබෙනවා, ඒ ප්‍රතිඵල නිකුත් වූ වහාම.

ඒ 8,000 අතර 200දෙනෙකු පමණ ඉන්නවා, විශේෂ අධ්‍යාපනය ලබා දීම සඳහා පුහුණු කළ. ඒ අයගෙන් මේ අඩුව පිරිමසා ගන්න පුළුවන්කම තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු අමාත්‍යතුමනි, මම තවත් අමතර කාරණාවක් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. උපාධිධාරීන් සංවර්ධන නිලධාරීන් හැටියට බඳවා ගැනීමේදී මෙතෙක් කල් විදේශ විශ්වවිද්‍යාල හෝ එම විදේශ විශ්වවිද්‍යාලවලට අනුබද්ධිත දේශීය ආයතන මඟින් උපාධිය ලබා ගත් අයටත් එම පත්වීම් ලබා දුන්නා. හැබැයි, බාහිර උපාධිධාරීන් හැටියට සලකා, ඒ අය උපාධිධාරී පත්වීම් ලබා දීමට නුසුදුසුයි කියන වර්ගීකරණය යටතේ එම පත්වීම් ලබා නොදීපු 4,461ක පිරිසක් මෙවර ඉන්නවා. මෙච්චර කල් බාහිර උපාධිධාරීන්ටත් එම පත්වීම් ලබා දුන්නා. අපි මේ සම්බන්ධයෙන්

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

වැඩිදුරටත් කරුණු හොයා බලනකොට දැන ගන්න ලැබුණා, ප්‍රතික්ෂේප වුණු ඒ සෑම රැකියා අපේක්ෂකයකුම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධිය සම්පූර්ණ කර ඇති බව. ඒ අනුව 4,461ක පිරිසක් විශාල අසාධාරණයකට, ඉමහත් පීඩනයකට, අසහනයකට ලක් වෙලා තිබෙනවා. ඒ අය වෙනුවෙන් ඔබතුමා ලබා දෙන විසඳුම මොකක්ද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, සංවර්ධන නිලධාරින් බඳවා ගත්තේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන්. ඒ බඳවා ගත්ත කොටසෙන් පිරිසක් තමයි පාසල්වලට අනුයුක්ත කළේ. දැනටත් ඒ අයගේ පාලන කටයුතු සිදු වන්නේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හරහා. ඒ අය පාසල්වලට අනුයුක්ත කර තිබෙනවා පමණයි. මට මතකයි, ඒ අවස්ථාවේදීත් ඔය ප්‍රශ්නය මතු වුණා. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් උපාධියක් නම්, එය වලංගුයි. ඒ නිසා මේ ප්‍රශ්නය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන්ම විසඳිය යුතුයි. හැබැයි ඒ අයට අවසර දෙනවා නම්, ඒ අය බඳවා ගත්තා නම්, ඒ අයටත් පොදුවේ අවුරුදු 35ට අඩු ප්‍රතිපත්තිය මත, ගුරු සේවා ව්‍යවස්ථාව අනුව -මා කලින් කියපු මුල් කාණ්ඩ තුනටම ඇතුළත් වෙලා- විභාගයට පෙනී සිටින්න පුළුවන්, ගුරු වෘත්තියට එනවා නම්. හැබැයි මූලික තීන්දුව ගන්න ඕනෑ, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන්. මම ඒ පිළිබඳව ඒ අමාත්‍යාංශයේ අවධානය යොමු කරවන්නම්.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා මතු කළේ ඉතා වැදගත් කාරණයක් බව අපි පිළිගන්නවා. සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය මේ විෂය සම්බන්ධව දීර්ඝ කාලයක් තිස්සේ කටයුතු කර තිබෙනවා. මේ සඳහා අවශ්‍ය නීති රාමුව සකස් කරන්න අධිකරණ, බන්ධනාගාර කටයුතු අමාත්‍යාංශය විධියට අපි අවස්ථා ගණනාවකදී මැදිහත් වෙලා තිබෙනවා. ඒ අනුව අදාළ අමාත්‍යාංශයත් සමඟ නීති කෙටුම්පතකුත් අපි සම්පාදනය කළා. ඊට අමතරව, විශේෂ අවශ්‍යතා ඇති තැනැත්තන්ගේ සංගම් ගණනාවක් තිබෙනවා, ඒ උදවියත් එකතු වෙලා යම් නීති රාමුවක් සකස් කරලා තිබෙනවා. මේ පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කරලා අපි කමිටුවක් පත් කළා. ඒ කමිටුවේ සභාපතිවරයා විධියට පත් කළේ ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා. එතුමා යටතේ ඒ කමිටුව ක්‍රියාත්මක වෙනවා. එතුමා අපට දැනුම් දීලා තිබෙනවා, ඒ කමිටුව සාර්ථකව ක්‍රියාත්මක වෙන බව. ඒ කමිටුවේ වාර්තාව ලද වහාම අදාළ අණපනත් සම්මත කර ගැනීම සඳහා අපි පියවර ගන්නවා.

ගරු කථානායකතුමනි, සංඥා භාෂාව සම්බන්ධව කියනවා නම්, රාජ්‍ය මාධ්‍යයක් වන ජාතික රූපවාහිනිය ඒ සම්බන්ධයෙන් යම් ආකාරයක මැදිහත්වීමක් සිදු කර තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාත් දකිනවා, අපේ මේ පාර්ලිමේන්තුවේ රැස්වීම් කටයුතු විකාශයේදීත් අපි කථා කරන දේවල් නිලධාරිනියක් සහ නිලධාරි මහත්මයෙක් විසින් සංඥා භාෂාවෙන් පරිවර්තනය කරන ආකාරය. නමුත් ඒ ප්‍රජාව මතක් කර සිටිනවා, මේ අවශ්‍යතාව පිළිබඳව පෞද්ගලික මාධ්‍යයෙන් ප්‍රමුඛතාවක් ලබා නොදීම පිළිබඳව. ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ සාධාරණ ඉල්ලීමක් තිබෙනවා. අපි ඒ කාරණයත් එම කමිටුවේදී සාකච්ඡා කරලා, හැකි ඉක්මනට ඒ සම්බන්ධයෙනුත් අණපනත් ඉදිරිපත් කරන්න කටයුතු කරනවා, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු අනුප පස්කුවල් මහතා (සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுப பஸ்குவல் - சமூக வலுவூட்டுகை இராஜாங்க அமைச்சர்)
(The Hon. Anupa Pasqual - State Minister of Social Empowerment)

ගරු කථානායකතුමනි, සමාජ සේවා දෙපාර්තමේන්තුවත්, ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලයත් තිබෙන්නේ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ. ගරු විපක්ෂ නායකතුමා විසින් ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ලද ප්‍රශ්නයේ සමහර කොටස්වලට පිළිතුරු දීම සඳහා තොරතුරු ගොනු කිරීමට අවශ්‍ය බැවින්, එම ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීම සඳහා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා වෙනුවෙන් මම සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා, මොකක්ද point of Order එක?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, 38වන ස්ථාවර නියෝගය සහ 52වන ස්ථාවර නියෝගය කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

අග්‍රාමාත්‍යවරයාගෙන් අසනු ලබන ප්‍රශ්නවලට මාස ගණනාවකින් අපට අවස්ථාව ලැබුණේ නැහැ. ගරු කථානායකතුමනි, ඔබතුමා ඒ ගැන අවධානය යොමු කරලා, 38වන ස්ථාවර නියෝගය යටතේ අග්‍රාමාත්‍යවරයාගෙන් අසනු ලබන ප්‍රශ්නවලට දැන් අවස්ථාව නොලැබෙන්නේ ඇයි, එම ස්ථාවර නියෝගය අත්හිටුවලාද තිබෙන්නේ කියන කාරණය සොයා බලන්න.

ඊළඟට, 52වන ස්ථාවර නියෝගය කෙරෙහිත් මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, ගරු කථානායකතුමනි. මම පාර්ලිමේන්තුවට ඇවිල්ලා දැනට අවුරුදු 12ක් වෙනවා. ඒ කාලයේ සිට විවිධ මන්ත්‍රීවරු විසින් පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් ඉදිරිපත් කළා. කලින් කලට ආණ්ඩු විසිරෙනවා. එතකොට එම පනත් කෙටුම්පත් නැවතත් ඉදිරිපත් කරනවා. ගරු කථානායකතුමනි, කරුණු විමසුවොත් ඔබතුමාටත් දැන ගන්න පුළුවන් වෙයි, සමහර පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් ඔය විධියට අවුරුදු 12ක්, 15ක් තිස්සේ ඉදිරිපත් කර තිබෙන බව. අනෙක් කාරණය තමයි, ඒ පනත් කෙටුම්පත අවුරුදු 10ක් තුළදී සම්මත වුණේ නැත්නම්, නැවතත් මුල ඉඳලාම වියදම් කරගෙන එම කටයුත්ත කරන්න සිදුවීම. ගරු කථානායකතුමනි, ගම්වල තිබෙන පෙරහැරක් සම්බන්ධව හෝ පොදු සුබසාධන ආයතනයක් ගැන තමයි පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතකින් ඉදිරිපත් වෙන්නේ. නැවතත් ඒ පිළිබඳව පුවත් පතක පළ කරනවාය කියන්නේ, ඒ මිනිසුන්ට දරන්න බැරි මුදලක් ඒ සඳහා වියදම් කරන්න වෙනවා කියන එකයි. ඒ නිසා මේ සම්බන්ධයෙනුත් කඩිනම් ක්‍රියාමාර්ගයක් ගන්න ක්‍රමවේදයක් හදන්න කියලා මම ඉල්ලා සිටිනවා. අග්‍රාමාත්‍යවරයාගෙන් අසනු ලබන ප්‍රශ්න සහ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් කියන කාරණා දෙකම කෙරෙහි ගරු සභානායකතුමාගේත් අවධානය මා යොමු කරවනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒ සම්බන්ධයෙන් අදාළ උපදෙස් නිකුත් කරන්නම්.

පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම, රාජ්‍ය අමාත්‍ය ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මැතිතුමා.

## ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම
## மாண்புமிகு சிவநேசதுரை சந்திரகாந்தனது சொந்த விளக்கம்
## PERSONAL EXPLANATION BY HON. SIVANESATHURAI SANTHIRAKANTHAN

**ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා (ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சிவநேசதுரை சந்திரகாந்தன் - கிராமிய வீதிகள் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Sivanesathurai Santhirakanthan - State Minister of Rural Road Development)
கௌரவ சபாநாயகர் அவர்களே, எனது சிறப்புரிமை சம்பந்தமாகப் பேசுவதற்கு வாய்ப்பளித்தமைக்கு நன்றி.

கடந்த 06.10.2022 அன்று பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு எம்.ஏ. சுமந்திரன் அவர்கள் என்னுடைய சிறப்புரிமையை மீறும் வகையிலே இந்தச் சபையிலே பல கருத்துக்களைக் கூறியிருந்தார். முக்கியமாக அவர் சார்ந்த கட்சியினுடைய ஒரு பாராளுமன்ற உறுப்பினருடைய சிறப்புரிமை மீறப்பட்டதாக, ஊடகத்தை மையப்படுத்திய ஒரு குற்றச்சாட்டிலே என்னையும் இழுத்து, அவரைப் பாதுகாப்புப் பிரிவினர் பின்தொடர்வதாகவும் நான் விடுதலைப் புலிகள் அமைப்பில் இருந்ததாகவும் பலவிதமான குற்றச்சாட்டுக்களைக் கூறிச் சேறடிப்பை மேற்கொண்டு எனது நற்பெயருக்குக் களங்கத்தை ஏற்படுத்தியிருந்தார். அதிலும் முக்கிய தேசியப் பிரச்சினையாக, கடந்த காலங்களிலே எதிர்க்கட்சியிலிருந்த தற்போதைய சனாதிபதி அவர்களையும் என்னையும் கொளுவிவிடுகின்ற பாணியில் கருத்துக்களைச் சொல்லியிருந்தார். 600 பொலிஸார் கொல்லப்பட்டதற்கும் எனக்கும் சம்பந்தம் இருப்பது போன்றதான ஒரு குற்றச்சாட்டையும் முன்வைத்திருந்தார்.

கௌரவ சபாநாயகர் அவர்களே, இதற்கு நான் இந்தச் சபையிலே ஒரு தெளிவான பதிலை அளிக்கவேண்டும். நான் விடுதலைப் புலிகள் அமைப்பில் இருந்தேனென்பது ஊர் அறிந்த, உலகம் அறிந்த உண்மைதான். 1990 - 1991ஆம் ஆண்டு காலப்பகுதியிலே நான் பாடசாலையில் கல்வி கற்றுக்கொண்டிருந்தேன். அப்போது என்னுடைய வயது 16 ஆகும். அந்த அடிப்படையில், அப்பட்டமான குற்றச்சாட்டுக்களைப் பாராளுமன்றத்தில் முன்வைப்பதும் அந்தக் காலப்பகுதியில் பள்ளிவாசலில் இடம்பெற்ற கொலைகளுடன் என்னைச் சம்பந்தப்படுத்திப் பேசுவது போன்ற விடயங்களும் தவிர்க்கப்படவேண்டும். முக்கியமாகப் பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு எம்.ஏ. சுமந்திரன் அவர்கள் இந்தப் பாராளுமன்றத்தில் என்னுடைய நற்பெயருக்குக் களங்கத்தை ஏற்படுத்தி இருக்கிறார். அக்காலத்தில் நான் சந்தேக நபராகக் கைதுசெய்யப்பட்ட விடயத்தைக் குறிப்பிட்ட அவர், தான் நீதிமன்றத்தை மதிக்கவேண்டிய ஒரு பிரபலமான சட்டத்தரணியாக இருந்தும்கூட, நான் நீதிமன்றத்தினால் விடுதலை செய்யப்பட்ட விடயத்தைக் குறிப்பிடவில்லை. அவர்களுடைய அரசியல் இலாபத்திற்காக அல்லது கிழக்கு மாகாணத்திலே எங்களுடைய அரசியலை இல்லாமல் செய்வதற்காகச் சொல்லப்படும் காழ்ப்புணர்ச்சியினாலான பேச்சுக்களை இந்தச் சபை ஏற்றுக்கொள்ளக்கூடாது.

கௌரவ சபாநாயகர் அவர்களிடம் நான் விநயமாக முன்வைக்கும் விண்ணப்பம் என்னவென்றால், 'சிறப்புரிமை' என்ற கருப்பொருளின் அடிப்படையில், நான் சபையில் இல்லாதிருந்த வேளையில், அவர் தான் சார்ந்த ஒருவருக்காகத் தனக்குச் சம்பந்தமில்லாத விடயங்களைக் கூறி என்மீது வைத்த குற்றச்சாட்டுக்களை 'ஹன்சாட்' பதிவிலிருந்து அகற்றவேண்டுமென்பதும் இனிவரும் காலங்களிலே தங்களுக்குச் சம்பந்தமில்லாத விடயங்களைச் 'சிறப்புரிமை என்ற அடிப்படையில் சபையிலே பேசுவதற்கு அனுமதி வழங்கக்கூடாது என்பதுமாகும்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
යෝජනා පිළිබඳ දැනුම් දීම, ගරු සභානායකතුමා.

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 14 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> " "විසර්ජන" පනත් කෙටුම්පත (2023) සලකා බැලීම සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(1) හි සඳහන් "විසි හය" යන වචන වෙනුවට "විස්ස" යන වචන ආදේශ කිරීමෙන් ක්‍රියාත්මක විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## III

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "2022 නොවැම්බර් 15 අඟහරුවාදා, 16 බදාදා, 17 බ්‍රහස්පතින්දා, 18 සිකුරාදා, 19 සෙනසුරාදා, 21 සඳුදා සහ 22 අඟහරුවාදා "විසර්ජන" පනත් කෙටුම්පත (2023) සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2022 නොවැම්බර් 14 සඳුදා පාර්ලිමේන්තුව රැස්වන දිනයක් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, "විසර්ජන" පනත් කෙටුම්පත (2023) සලකා බැලීම සඳහා 2022 නොවැම්බර් 15 අඟහරුවාදා සිට 21 සඳුදා දක්වා වෙන් කළ දිනයන්හි රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ.භා. 6.00 දක්වා විය යුතු ය. අ. භා. 5.30 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) සහ (6) ඡේද ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.00 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## III

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, "විසර්ජන" පනත් කෙටුම්පත (2023) සලකා බැලීම සඳහා වෙන්කළ 2022 නොවැම්බර් 22 අඟහරුවාදා රැස්වීම පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 5.00 දක්වා විය යුතු ය. අ. භා. 5.00 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන වැඩ කටයුතු. න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 14 දක්වා ඉදිරිපත් කිරීම.

## සුළු හිමිකම් අධිකරණ කාර්ය පටිපාටිය පනත් කෙටුම්පත
## சிறுகோரிக்கை நீதிமன்றங்களின் நடவடிக்கைமுறைச் சட்டமூலம்
## SMALL CLAIMS COURTS' PROCEDURE BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[පූ.භා. 11.13]

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා වෙනුවෙන්, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

එසේම අද දින න්‍යාය පත්‍රයේ සඳහන් විෂය අංක 2 සිට 14 දක්වා වූ යෝජනා ද මා ඉදිරිපත් කරනවා. ගරු කථානායකතුමනි, අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ වන යෝජනා සම්මතය පිළිබඳව විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ යම් එකඟතාවක් ද තිබෙනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ ඇමතිතුමා.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු අජිත් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு அஜித் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. AJITH RAJAPAKSE] *took the Chair.*

[පූ.භා. 11.14]

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC - Minister of Justice, Prison Affairs and Constitutional Reforms)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ අමාත්‍යාංශයට අදාළව අද දිනයේදී අපි පනත් කෙටුම්පත් නවයක් සහ රීති කීපයකුත්, තවත් අමාත්‍යාංශ දෙකකට අදාළව නියෝග සහ යෝජනා සම්මතයකුත් සම්මත කර ගැනීම සඳහා ගරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. මේ රටේ යල් පැන ගිය සමහර නීති වෙනස් කරලා, පද්ධතියේ වෙනසක් - system change එකක් - කරන්න ඕනෑය කියලා ජනතාව ලොකු බලාපොරොත්තුවකින් ඉන්න මොහොතක තමයි, අපි අද දිනයේදී මේ පනත් කෙටුම්පත්, රීති සහ නියෝග සම්මත කර ගැනීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන්නේ. හිටපු අධිකරණ අමාත්‍ය ගරු අලි සබ්රි මැතිතුමා කමිටු රාශියක් පත් කරලා, බොහෝ අණපනත් පිළිබඳව කරුණු ගැඹුරින් අධ්‍යයනය කරලා, විනිසුරුතුමන්ලා සහ ජ්‍යෙෂ්ඨ නීතිඥවරුන්ගේත් සහයෝගය ලබා ගෙන මේ නීති පද්ධතියේ ලොකු වෙනසක්, පෙරළියක් සිදු කරමින් තමයි මේ නීති රීති පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කටයුතු කර තිබෙන්නේ.

මේ පනත් කෙටුම්පත් අතර, විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පතත් අපි ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. අපි ප්‍රධාන වශයෙන් බලාපොරොත්තු වුණු කාරණා කිහිපයක් මේ පනත් කෙටුම්පතට ඇතුළත් කර තිබෙනවා. විශේෂයෙන්ම මේ පනත සම්මත කරපු කාලයේ නොතිබුණු අලුත් විෂ මත් ද්‍රව්‍ය අද සමාජයට හඳුන්වා දී තිබෙනවා. අද සමාජය මත් ද්‍රව්‍ය විසින් ගිල ගත්ත තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අයිස් කියන මත් ද්‍රව්‍යය මේ පනතේ උපලේඛනයේ සඳහන් නොවී තිබුණ දෙයක්. අයිස් කියන්නේ, ඉතාම භයානක මත් ද්‍රව්‍යයක්. අපි ඒ පිළිබඳව විශේෂඥ වෛද්‍යවරුන්ගේ මතය විමසා බැලුවා. අනෙකුත් මත් ද්‍රව්‍යවලට වඩා, ඒ පාවිච්චි කරන උදවියගේ මොළයේ සෛල විනාශ කරන, මිනිස්සු විකෘති තත්ත්වයට පත් කරන ඉතාම භයානක මත් ද්‍රව්‍යයක්, මේක. ඔවුන්ගේ මතය තමයි, මේ මත් ද්‍රව්‍යයට ඇබ්බැහි වූවෙකුගේ ජීවත් වීමේ කාල සීමාව අවුරුදු දෙකකට සීමා වෙනවා කියන එක. අවුරුදු දෙකකින් එහාට ඔවුන්ට ජීවත් වීමේ හැකියාව නැති වෙනවා, මේවා පාවිච්චි කළොත්. ඒ තරමම භයානක විෂ මත් ද්‍රව්‍යයක් තමයි අයිස් කියන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නීතිය ක්‍රියාත්මක කරන්න අපි කොතරම් උත්සාහය දැරුවත් යම් යම් අවස්ථාවලදී නීතියේ අඩු පාඩුකම් නිසා, නිලධාරින්ගේ දූෂිත ක්‍රියා නිසා අත්අඩංගුවට ගනු ලබන විෂ මත් ද්‍රව්‍ය නැවතත් සමාජයට මුදා හරින අවස්ථා අපි දැකලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක සිද්ධ වෙන්නේ මේවා අධිකරණය භාරයේ හෝ පොලිසිය භාරයේ රඳවා තබා ගැනීමේදීයි. මෙවැනි විෂ මත් ද්‍රව්‍ය අහු වුණාට පස්සේ නඩුව පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් සාම්පල් තබාගෙන, ඒවා පිළිබඳ ඡායාරූප හා සාක්ෂි ඉතිරි කරගෙන, අදාළ පාර්ශ්වද සහභාගි කරගෙන, විනිසුරුවරුන්ගේ නිර්දේශය සහ අධීක්ෂණය යටතේ ඒ විෂ මත් ද්‍රව්‍ය විනාශ කරන්න අපි ප්‍රතිපාදන හඳුන්වා දෙනවා. ඒ ආකාරයට අපි මේ විෂ මත් ද්‍රව්‍ය නැවත නැවතත් සමාජයට යාම වළක්වන්න කටයුතු කරනවා.

වයස අවුරුදු 18ට අඩු අයට දඬුවම් දී සිර ගෙවල්වලට යැවීම වෙනුවට පුනරුත්ථාපනයට හෝ පරිවාසයට යැවීම සඳහා ප්‍රතිපාදන මේ නීති රීති යටතේ සකස් වෙනවා. වර්තමාන නීති අනුව, මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ තැනැත්තන් අධිකරණ නියෝගයකින් තොරව පුනරුත්ථාපනයට යැවීම පිළිබඳ ගැටලු තිබෙනවා. ඒවා නිරාකරණය කරගෙන, ස්වේච්ඡාවෙන් වුණත් පුනරුත්ථාපනයට හෝ පරිවාසයට යොමු වෙලා ඒ ඇබ්බැහි වූවන් මේ රටේ නිවැරදි පුරවැසියන් බවට පත් වෙන්න ඉඩ දෙන්න ලොකු උත්සාහයක් දරනවා. ඒ වාගේම හෙරොයින්, කොකේන්, මෝෆින් වාගේ විෂ මත් ද්‍රව්‍ය ව්‍යාපාර කළ අය, ඒවා ළඟ තබා ගත් අය සම්බන්ධව පවතින නීතිය තමයි, ඒ ප්‍රමාණය ග්‍රෑම් 2කට වැඩියි නම් මරණීය දණ්ඩනය හෝ ජීවිතාන්තය දක්වා සිර දඬුවම් ලබා දීමට අධිකරණයට බලය දී තිබීම. අද සිර ගෙවල්වල පවතින තත්ත්වයත් සැලකිල්ලට භාජන කරලා ග්‍රෑම් 2 කියන සීමාව ග්‍රෑම් 5 දක්වා වැඩි කරන්න මේ නීතියේ සංශෝධනයක් ගෙනැල්ලා තිබෙනවා. අපි උපදේශක කාරක සභාවලදී මේ සම්බන්ධ ගැටලු කිහිපයක් නැවත සාකච්ඡා කළා. ඒ අනුව, අපි ඇප ලබා දීම සම්බන්ධ කාරණයේදී එකඟතාවකට ආවා, Committee Stage එකේදී යම් කිසි සංශෝධනයක් කරමු කියලා. ඒ අනුව, මත් ද්‍රව්‍ය ග්‍රෑම් 10 දක්වා ළඟ තබා ගත් කෙනෙකුට ඇප දීමේ බලය මහාධිකරණයට ලබා දෙන්න වාගේම ග්‍රෑම් 10ට වඩා වැඩි ප්‍රමාණයකට චෝදනා ලබන චූදිතයන්ට ඇප දීම අභියාචනාධිකරණයට පවරන්න එකඟතාවකට ආවා. මෙහිදී රස පරීක්ෂක වාර්තාව අනුව පිරිසිදු, - pure - ග්‍රෑම් 10 කියන සීමාව තමයි සලකන්නේ. සමහර වෙලාවට සාමාන්‍ය වෙළෙඳ පොළේ තිබෙන මත් ද්‍රව්‍යවලින් ශුද්ධ ග්‍රෑම් 10ක් හදා ගන්න අඩුම තරමින් ග්‍රෑම් 60ක්, 70ක්, 80ක් වාගේ ප්‍රමාණයක් තිබෙන්න ඕනෑ. ඒ පිළිබඳව ක්ෂණිකව රස පරීක්ෂක වාර්තා ලබා දීමේ වැඩ පිළිවෙළකුත් අපි ක්‍රියාත්මක කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද කාලයේ අපි හඳුනා නොගත්, විෂ මත් ද්‍රව්‍ය විධියට භාවිත කරන ඖෂධ තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් මේවා සම්බන්ධව දැඩි සීමා පනවා තිබුණත් සමහර ෆාමසිවල නොසැලකිලිමත්කම නිසාත්, මුදල් උපයන්න තිබෙන කෑදරකම නිසාත් මේවා විකුණන තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

අද මත් ද්‍රව්‍ය ජාලය එදාට වඩා පුළුල් වෙලා තිබෙනවා. eZ cash ක්‍රමය හරහා මත් ද්‍රව්‍ය මිලට ගන්න අද හුඟක් අය පුරුදු වෙලා තිබෙනවා. වෛද්‍යවරු කියන විධියට, අද අපේ රටේ තරුණ පරම්පරාවෙන් ලක්ෂ හතරහමාරක් විතර විෂ මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා ඉන්නවා. අපට තොරතුරු ලැබිලා තිබෙනවා eZ cash හරහා මුදල් ගෙවලා, -ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාගේ ප්‍රදේශයේ ජනතාව මට තොරතුරු රාශියක් ලබා දුන්නා- ප්‍රදේශයේ කිලෝමීටර් කණුවේ අංකය දැම්මාම; උදාහරණයක් විධියට 'දකුණු අධිවේගී මාර්ගය කියලා 120 කණුව' කියලා දැම්මාම 120 කිලෝමීටර් කණුව තිබෙන තැනදී රෑට ඒ කුඩු පාර්සලය පහළට අතහැරලා යනවා කියලා. එතකොට අර පුද්ගලයා ඒ වෙලාවට ඇවිල්ලා ඒ පාර්සලය ගන්නවා. ඒ වාගේ ඉතාම සංවිධානාත්මක ජාලයක් හරහායි මේ දේවල් ක්‍රියාත්මක වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ එක්කම මම මේ කාරණයත් සඳහන් කරන්න ඕනෑ. අද "අරුණ" පුවත් පතේ මුල් පිටුවේ යම් ප්‍රවෘත්තියක් පළ කර තිබුණා, මරණීය දණ්ඩනය සහ ජීවිතාන්තය දක්වා සිර දඬුවම් ලබා දීම පිළිබඳ කාරණයේදී, හෙරොයින් ඇතුළු ඒ මත් ද්‍රව්‍ය ග්‍රෑම් 2ක කියන සීමාව ග්‍රෑම් 10 දක්වා වැඩි කර තිබෙනවා කියලා. මාධ්‍යවේදියකු ඊයේ මට කථා කරලා ඒ පිළිබඳව ඇහුවා. හැබැයි, ඔහු මගෙන් ඇහුවේ ඇප දීම

සම්බන්ධව යම් කිසි වෙනසක් අපි කරනවාද කියන කාරණය. එතැනදී මම සඳහන් කළා, මත් ද්‍රව්‍ය ග්‍රෑම් 10 දක්වා ළඟ තබා ගැනීම සම්බන්ධයෙන් මහාධිකරණයට ඇප දෙන්න බලයක් තිබෙනවා, හැබැයි ග්‍රෑම් 10ට වැඩි නම් අභියාචනාධිකරණයටයි ඒ බලය තිබෙන්නේ කියලා. මම හිතන්නේ ඔහු ඒ කාරණය වරදවා වටහාගෙන වෙන්න ඇති. ග්‍රෑම් 10 දක්වා කියන සීමාව තමයි මරණීය දණ්ඩනය සහ ජීවිතාන්තය දක්වා සිර දඬුවම් ලබාදීම වෙනුවෙන් අපි සංශෝධනය කරන්න යන්නේ කියා සඳහන් වන එක නිවැරදි වෙන්න ඕනෑ කාරණයක්.

කුමන රජයක් තිබුණත්, නීතිය ක්‍රියාත්මක කරන ආයතන මත් ද්‍රව්‍ය නිවාරණය කිරීම සඳහා විශාල උත්සාහයක් දරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මත් ද්‍රව්‍ය කල්ලි සම්බන්ධයෙන් කටයුතු කරන එක ලෙහෙසි පහසු දෙයක් නොවෙයි. සමහර ඒවා අවි ආයුධ අරගෙන ඉන්න පාතාල කල්ලිවලට සම්බන්ධ සංවිධානාත්මක ආයතන විධියට පවත්වාගෙන යන ඒවා. ඒවා නීතියේ රැහැනට ගෙනෙන්න පොලිස් නිලධාරින් විශාල පරිශ්‍රමයක් දරනවා. අද උදේ අපේ ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා මේ පිළිබඳව ගරු සභාවේදී ප්‍රශ්න කළා. පොලිස් දෙපාර්තමේන්තුව මේ වාගේ නඩුවකට අදාළ කාරණා ඔප්පු කරන්න විශාල ප්‍රයත්නයක් දරනවා. සමහර වෙලාවට ඒ උදවිය තමන්ගේ ජීවිතය පරදුවට තබමිනුයි මේ ව්‍යාපාරවල යෙදෙන ජාවාරම්කරුවන් සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කරන්නේ. ඒ වාගේම, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින්, නීතිඥවරු විශාල උත්සාහයක් දරනවා මේ ප්‍රශ්න සම්බන්ධයෙන් කටයුතු කරන්න. හැබැයි, සමහර වෙලාවට ඒවා බොහොම අවතක්සේරුවට ලක්වන අවස්ථා අපි දකිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර වෙලාවට අධිකරණවලදී පවා පොලීසියේ, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් ඉතා අපහසු තත්ත්වයට පත් වෙනවා. අධිකරණය ස්වාධීනයි. අධිකරණය ස්වාධීනව කටයුතු කරන්න ඕනෑ. ඒ ගැන ගැටලුවක් නැහැ. නමුත්, අපට සමහර කාරණාවලදී පෙන්වා තිබෙනවා, එක එක අධිකරණ අනුව කටයුතු කරන ආකාරය වෙනස් බව. සමහර විනිසුරුවරුන් කුඩු සම්බන්ධව දක්වන්නේ අමුතු ආකල්ප. උතුරට ගිය වෙලාවේ උතුරේ පොලිස් නිලධාරින්ට තිබුණු ලොකු ගැටලුවක් තමයි, ඒ ප්‍රදේශයේ එක මහෙස්ත්‍රාත් අධිකරණයකට කුඩු අල්ලලා ගෙනියන්න ඒ පොලිස් නිලධාරින්ට තිබුණු බය. මොකද, ඒ මහෙස්ත්‍රාත්වරයා ඒ පොලිස් නිලධාරින් ඉතා අපහසුතාවට පත් වන විධියට විවේචනය කරලා, දොස් කියලා අවසානයේදී ඔවුන්ව අපරාධකාරයෝ බවට පත් කරන්න යනවා. ඒ නිසා මේ අධිකරණ ක්‍රියා කලාපය පිළිබඳවත් අපි අධිකරණ සේවා කොමිෂන් සභාවට දැනුම් දී තිබෙනවා. සමහර වෙලාවට මහාධිකරණයට ගියාම, රජයේ නීතිඥවරුන්ටත්, අතිරේක සොලිසිටර් ජනරාල්වරුන්ටත් මේ වාගේ ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. සමහරු තේරුම් ගන්නේ නැහැ, පොලීසිය සහ නීතිපති දෙපාර්තමේන්තුව ඉෂ්ට කරන්නේ ජාතික කර්තව්‍යයක් බව. ගාස්තුවක් ලබා ගැනීම සඳහා සේවා දායකයකු වෙනුවෙන් පෙනී සිටීමක් නොවෙයි ඒ උදවිය කරන්නේ. රාජ්‍යය වෙනුවෙන්, මේ රටේ තරුණ පරම්පරාව ආරක්ෂා කරගන්න මහත් කැප කිරීමක් තමයි ඒ අය කරන්නේ. ඒ නිසා අපට සිද්ධ වෙනවා, මේ පිළිබඳව අලුතෙන් හිතන්න. මොකද, මේ ප්‍රශ්නය නිරාකරණය කරන එක, වසංගතයක් වැනි මේ කාරණය නිම කරන එක පොලීසියටවත්, අධිකරණයටවත් තනියෙන් කරන්න බැහැ. මේකට සමාජයේ දායකත්වයක් ලැබෙන්න ඕනෑ.

හුඟක් පළාත්වලට ගියාම බොහෝදෙනා කියන කරුණුවලින් අපිට තේරුම් ගන්න දේවල් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. සමහර ප්‍රදේශවල අය මේ කුඩු ව්‍යාපාරිකයෝ කවුද කියලා දන්නවා. කුඩු බෙදා හරින්නේ කවුද කියලාත් දන්නවා. හැබැයි, ඒ අය ගැන පොලීසියට තොරතුරක් දෙන්න ඔවුන් බයයි. මොකද, පොලීසියෙන් මේ තොරතුරු එළියට ගියොත්, ඒ ගොල්ලන්ගේ ජීවිත අවදානමට ලක් වෙන නිසා. ඒ බය නිසා මේ රටේ සමහර පුරවැසියෝ තොරතුරු ලබා නොදෙන තත්ත්වයක් තිබෙනවා.

ඒ වාගේම, රටේ ප්‍රසිද්ධ පාසල්වල දරුවන් අයිස් වැනි මත් ද්‍රව්‍ය අරගෙන අහු වෙලා තිබෙනවා. සමහර විදුහල්පතිවරු, ගුරුවරු මේ තොරතුරු යට ගහනවා.

ඒ තොරතුරු එළියට යන්න දෙන්නේ නැහැ. අපටත් කියා තිබෙනවා, "ඒ තොරතුරු එළියට ගියාම පාසලට මහා කැලලක් ඇති වනවා. ඒ නිසා මේවා මාධ්‍යයට යන්න දෙන්න හොඳ නැහැ" කියලා. එම නිසා ඒ තොරතුරු හෙළිදරව් කරන්නේ නැතිව ඒ ගොල්ලන් වසන් කරන අවස්ථා තිබෙනවා. ඒ තොරතුරු වසන් කර ගෙන මේ කාර්යය කරන්නත් බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අද අපේ රට ඉතාම භයානක, අනතුරුදායක තත්ත්වයකයි තිබෙන්නේ. මම කථා කරන්නේ මේ රටේ ආර්ථිකය කඩා ගෙන වැටුණු එක ගැන නොවෙයි. ඒ ගැන හැමෝම දන්නවා. අද වනකොට අප නොයෙකුත් හේතූන් මත පිල්වලට, කල්ලි, කණ්ඩායම්වලට බෙදිලා, රණ්ඩු සරුවල් කරමින් ඉන්න අතරතුර මේ රට මත් ද්‍රව්‍යවල ඉතා භයානක ගොදුරක් බවට පත් වෙලා තිබෙනවා. මේ තත්ත්වය පිටුපස ක්‍රියාත්මක වෙන්නේ කවුද කියා සොයා බලා කටයුතු කරන්න ඕනෑ.

අප දන්නවා, හයිටි රාජ්‍යයට සිදු වෙලා තිබෙන්නේ කුමක්ද කියලා. ඒ ගැන මේ පාර්ලිමේන්තුවේදීත් මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් කථා කළා. ඒ ජනතාවට මත් ද්‍රව්‍ය -විස්කි, බියර්, වයින් වාගේ දේවල්- නොමිලේ දීලා, ඒ රටේ තරුණ පරපුර සම්පූර්ණයෙන්ම ඒවාට පොලඹවලා, මුළු රාජ්‍යයම මතින් මත් කරවලා, නොයෙකුත් විදේශ රාජ්‍යයන් හයිටි රාජ්‍යයේ ආධිපත්‍යය පතුරුවා ගෙන එහි සම්පත් සූරා කන තත්ත්වයට අද වනකොට පත් වෙලා තිබෙනවා. ඒ රටේ පුරවැසියන්ගේ ආයු කාලය අද වනකොට අවුරුදු 30ට, අවුරුදු 32ට අඩු වෙලා තිබෙනවා. මම හිතන්නේ ඒකම තමයි දැන් ශ්‍රී ලංකාවේත් ක්‍රියාත්මක වෙන්නේ. ඒ රටේ නොමිලේ බියර්, විස්කි බෙදුවා වාගේ අපේ රටේත් විෂ මත් ද්‍රව්‍ය යම් ආකාරයකට ව්‍යාප්ත කරමින් පවතින බව අපට පෙනෙනවා. අපේ වාගේ රටක ලක්ෂ හතරකට, හතරහමාරකට වැඩි තරුණ පරම්පරාවක් මතට ඇබ්බැහි වෙලා තිබෙනවා කියන එක ඉතාම බරපතළ කාරණයක්. විශේෂයෙන් පාසල්වල පිරිමි දරුවන් පමණක් නොවෙයි ගැහැනු දරුවන් පවා මේ අයිස් වැනි මත් ද්‍රව්‍යවලට හුරු වෙච්ච බවට සාධක අප ඕනෑ තරම් දැක තිබෙනවා. ඒ නිසා අප යෝජනා කර තිබෙනවා, මේ මත් ද්‍රව්‍ය උවදුර මැඩලන්න කාර්යසාධක බලකායක් පත් කරන්න කියලා. අප මීට සති කීපයකට පෙර උතුරට ගිය වෙලාවේ උතුරේ ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් එවැනි ප්‍රාදේශීය කාර්යසාධක බලකායක් එම ප්‍රදේශයේ පිහිටෙව්වා. ඒ කණ්ඩායම විසින් මේ වන කොට උතුරු පළාතේ ඒ සම්බන්ධයෙන් නිරීක්ෂණය කරමින් සහ අවශ්‍ය පියවර ගනිමින් සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ළමයින් සහ තරුණ තැනැත්තන් (සංශෝධන) පනත් කෙටුම්පතත් අද සම්මත කර ගැනීම සඳහා මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. මෙහි මුල් පනත ඉතා පැරණියි. මේ සංශෝධන පනත් කෙටුම්පත වර්තමානයට ගැළපෙන ලෙස ඉදිරිපත් කර තිබෙනවා. මෙහි එක්සත් ජාතීන්ගේ ළමා ප්‍රඥප්ති, සම්මුතීන්වලට අනුකූල ආකාරයට "ළමයා" යන්න අර්ථ නිරූපණය කර තිබෙනවා. "ළමයා" යන්න අර්ථ නිරූපණය කිරීමේදී කලින් තිබූ වයස අවුරුදු

[ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා ]

14 -16 කියන සීමාව වෙනස් කර තිබෙනවා. ඒ වාගේම, "තරුණයා" යන්න අර්ථ නිරූපණය කිරීමේදී කලින් තිබූ අවුරුදු 16 - 18 කියන සීමාව වෙනස් කර "ළමයා" යන්න අර්ථ නිරූපණයට වයස අවුරුදු 18 ඇතුළත් කර තිබෙනවා. ඒ අනුව, මෙය "ළමා ආඥාපනත" වශයෙන් වෙනස් කරන්න වාගේම, දණ්ඩ නීති සංග්‍රහයේ 53වන වගන්තිය යටතේ රඳවා තබා ගැනීම් පිළිබඳ නියෝගය නිකුත් කරන්න, විශේෂයෙන් වරදක් සිදු කරන අවස්ථාවේදී ඒ තැනැත්තා වයස අවුරුදු 18ට අඩු නම් මරණීය දණ්ඩනය හෝ ජීවිතාන්තය දක්වා සිර දණ්ඩන ලබා දීම ඉවත් කරලා, ඒ වෙනුවට ඔවුන් පුනරුත්ථාපනය කිරීමේ වැඩ පිළිවෙළවල් සඳහා යොමු කරන්න අවශ්‍ය ප්‍රතිපාදන මෙමඟින් ඉදිරිපත් කර තිබෙනවා.

දරුවන්ට ශාරීරික දඬුවම් ලබා දීම පිළිබඳ ප්‍රශ්නය ඊයේත් මේ ගරු සභාවේ දැඩි ලෙස සාකච්ඡාවට භාජන වෙච්ච කරුණක්. අද මේ පනත් කෙටුම්පත සම්මත වුණාට පස්සේ දරුවන්ට ශාරීරික දඬුවම් ලබා දීම වළක්වන්න පුළුවන්කම ලැබෙනවා.

ඊළඟට, උඩරට විවාහ හා දික්කසාද පනත සංශෝධනය කිරීමෙන් අප බලාපොරොත්තු වනවා, ඒ පනතේ II වන කොටස අහෝසි කරන්න. එහි II වන කොටසේ තිබෙන ප්‍රතිපාදන අනුව වයස අවුරුදු 18ට අඩු බාල වයස්කරුවන්ට වුණත් විවාහ වීම සඳහා අවශ්‍ය විධිවිධාන සහ ක්‍රමවේද සකස් වෙලා තිබෙනවා. නමුත්, ජාත්‍යන්තර වශයෙන් අද පිළිගෙන තිබෙනවා, විවාහයක් සඳහා භෞතික වශයෙන් දරුවකු සූදානම් වෙන්න නම් වයස අවුරුදු 18 ඉක්මවිය යුතුයි කියලා. ඒ පිළිබඳව තිබෙන අනෙකුත් අණ පනත් අප සංශෝධනය කර තිබෙනවා. සාමාන්‍ය විවාහ ආඥාපනත සංශෝධනය කර තිබෙනවා. ඒ පිළිබඳව අධිකරණ තීන්දු නිකුත් කර තිබෙනවා. ඒ අනුව එම නිවැරැදි කිරීම් උඩරට විවාහ හා දික්කසාද ආඥාපනත සම්බන්ධයෙනුත් අදාළ කරගැනීම සඳහා තමයි මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ.

සුළු හිමිකම් අධිකරණ කාර්ය පටිපාටිය පනත් කෙටුම්පත අලුතින්ම හඳුන්වා දෙන එකක්. අපේ සිවිල් නඩු විධාන සංග්‍රහයේ තිබුණා, සුළු හිමිකම් පිළිබඳ එක පරිච්ඡේදයක්. අපි ඒ පරිච්ඡේදය ඉවත් කළා, ඒක අද කාලයට නොගැළපෙන නිසා. අත් දැකීම් ඇති ජ්‍යෙෂ්ඨ විනිසුරුතුමන්ලා, නීතිඥතුමන්ලා එකතු වෙලායි මෙය කෙටුම්පත් කළේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙයින් බලාපොරොත්තු වන්නේ, මුදල් සම්බන්ධ අඩු වටිනාකමක් ඇති නඩු වෙනම අධිකරණයකට යොමු කරලා, කාර්ය පටිපාටිය ලිහිල් කරලා, මාස 12ක් වාගේ කාලයක් ඇතුළත ඒවාට නඩු තීන්දුවක් ලබා දීලා මේ ප්‍රශ්න ඉක්මනට අවසන් කරන්නයි. දළ වශයෙන් ගත්තොත්, ලක්ෂ 15ක් වැනි මුදලක්. නිශ්චිත මුදල අපි තීරණය කරන්න ඕනෑ. අපි මේ හා සමගාමීව තවත් සංශෝධන ගණනාවක් සිදු කරමින් පවතිනවා. විශේෂයෙන්ම සමථ මණ්ඩල - Mediation Boards - පනත අද සාර්ථකව ක්‍රියාත්මක වෙනවා. 2015 සංඛ්‍යාලේඛන අනුව බැලුවාම පෙනෙනවා, සමථ මණ්ඩලයට වර්ෂයකට පැමිණිලි ලක්ෂයක් පමණ එන බව. ඒවායෙන් සියයට 47ක් පමණ සමථය වෙලා තිබුණා. අධිකරණය වෙනුවට විකල්ප ලෙස යොදාගන්නා ක්‍රම - alternative dispute resolution system එක - ගැන අපි අත්හදා බැලුවා. ඒ අනුව අපි එහි මූල්‍ය සීමාව ලක්ෂ පහ දක්වා එකල වැඩි කළා. අපට තිබෙන සංඛ්‍යාලේඛන අනුව මේ වන කොට එයට ඉදිරිපත් වන පැමිණිලිවලින් සියයට 70ක් පමණ නිරාකරණය කරගන්නට පුළුවන්කම ලැබෙනවා. ඒක ඉතා ඉහළ මට්ටමක්.

අපි උතුර සහ නැඟෙනහිර විශේෂ සමථ මණ්ඩල ක්‍රියාත්මක කළා, යුද්ධය පැවැති කාලයට අදාළව ඒ ජනතාවගේ ඉඩම් පිළිබඳ ප්‍රශ්න ඉතා කෙටියෙන් නිරාකරණය කර ගැනීම සඳහා. අපි එහි සාර්ථකත්වය දැක තිබෙනවා. ඒ නිසා ලංකාවේ අනෙක් ප්‍රදේශවලටත් අපි එය ව්‍යාප්ත කරගෙන යනවා. මෑතකදී යුරෝපා සංගමය යුරෝ මිලියන 16ක ප්‍රදානයක් ලබා දෙන්න කටයුතු කර තිබෙනවා, මේ වැඩ පිළිවෙළ පුළුල් කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලක්ෂ 10ක, 15ක වාගේ හිමිකමක්, වටිනාකමක් සම්බන්ධ නඩුවක් ආවත්, මිලියන 100ක, 200ක වටිනාකමක් සම්බන්ධ නඩුවක් ආවත් ඒ හැම එකක්ම එකම නඩු රෝලක අහලා විභාග කරන්න ගත්තාම එක හා සමාන කාලයක් ගත වෙනවා. ඒ නිසා විශාල වටිනාකමක් තිබෙන නඩුවක් හබ කරන උදවිය ගත කරන කාල සීමාව කුඩා මුදලක් ලබා ගන්න එන කණ්ඩායමටත් ගත කරන්න සිදු වෙනවා. ඒ නිසා ඒ උදවියට සහනයක් ලබා දීමටත්, වැඩි වටිනාකමක් තිබෙන නඩු සම්බන්ධයෙන් අධිකරණයට කාලය ප්‍රමාණවත් ලෙස අරගෙන ඒවා විසඳා ගැනීමටත් මේ සංශෝධනය උපකාරී වෙනවා. මෙය එක්තරා සංශෝධනයක් පමණයි. අපි මීන් ඉදිරියටත් තවත් යම් යම් සංශෝධන සිදු කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නීතියේ ප්‍රමාදය කියන එක අද මුළු රටේම ජනතාව ප්‍රශ්නයක් විධියට ඉදිරිපත් කරන කාරණයක්. මේ පිළිබඳව සොයා බලා, පරීක්ෂණ කර අපේ අධිකරණ පද්ධතියේ පවතින හුඟක් දුර්වලතා අපි හඳුනාගෙන තිබෙනවා. ගරු රවුෆ් හකීම් හිටපු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා අපේ අධිකරණවල තිබෙන ප්‍රශ්න ගැන. විනිසුරුතුමන්ලාට නඩු විමසීම සඳහා තිබෙන කාලය සීමා වෙලා තිබෙනවා. නඩු විමසීම සඳහා තමන්ට තිබෙන කාලයෙන් සියයට 30ක්, සමහර අධිකරණවල සියයට 40ක් පරිපාලනමය කාර්යයන් සඳහා එතුමන්ලා වැය කර තිබෙනවා. මේ අපතේ යන්නේ වටිනා judicial time එක. මේ හේතුවෙන්, අධිකරණයේ නඩු විමසීම සඳහා තිබෙන කාලයේ අඩුවීමක් වෙලා තිබෙනවා. ලෝකයේ වෙනත් රටවල එය මඟ හරවාගැනීම සඳහා court case administration systems හදලා තිබෙනවා. අපිත් දැන් ඒ සඳහා කටයුතු කරගෙන යනවා. ඒ වාගේම court system එක digitalize කරන්න - පරිගණකගත කරන්න - අපේ හිටපු ගරු ඇමතිතුමා කටයුතු ආරම්භ කර තිබෙනවා. නමුත්, මේ වෙලාවේ ආර්ථික වශයෙන් තිබෙන ප්‍රශ්න නිසා ඒ කටයුත්ත ඉදිරියට ගෙන යෑම අපට අපහසු වෙලා තිබෙනවා. ඉදිරියේදී අපි බලාපොරොත්තු වෙනවා, ඒ සම්බන්ධයෙනුත් යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න.

සුළු හිමිකම් අධිකරණයක් පිහිටුවන කොට ඊට ආනුෂංගිකව ඊට ගැළපෙන ලෙස අධිකරණ සංවිධාන පනත සංශෝධනය කරන්න අපට සිදු වනවා; සිවිල් නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කරන්න සිදු වෙනවා; ඒ වාගේම අධිකරණ බලය පිළිබඳව පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කරන්නත් සිද්ධ වෙනවා.

ඒ එක්කම අපි ඉදිරිපත් කර තිබෙනවා, අන්තරායකර සත්ත්ව ආඥාපනතට සංශෝධනයක්. මෙය, අන්තරායකර සතුන් සන්තකයේ තබාගැනීම නිසා සමාජයේ නොයෙකුත් උදවියට වන හිරිහැර, අවහිරතා පිළිබඳව සලකා බලා ගෙනෙන ලද සංශෝධනයක්. එවැනි සතෙකු ළඟ තබාගන්නා තැනැත්තෙකුට ඒ සඳහා අවසර ලැබෙන්නේ රුපියල් 1,000ක බැඳුම්කරයක් මතයි. හැබැයි, ඒ රුපියල් 1,000 කියන මුදල අද කාලයට ගැළපෙන්නේ නැහැ. ඒ නිසා අපි මෙයින් යෝජනා කර තිබෙනවා, රුපියල් 250,000 දක්වා ඒ බැඳුම්කරයේ වටිනාකම වැඩි කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බන්ධනාගාර ආඥාපනත යටතේ අද ඉදිරිපත් කර තිබෙන රීති ගැනත් මා කිව යුතුයි. එම රෙගුලාසි 1930 ගණන්වල සිට තිබෙන ඒවා. අපි ඒ රීති සංශෝධනය කරලා ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව අප සිදු කරපු වෙනස්කම් අතර තිබෙනවා, මව්වරුන් සමඟ බන්ධනාගාරගත වන දරුවන් සහ ඔවුන්ගේ ආහාර රටාව පිළිබඳව විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. අවුරුදු පහ දක්වා වන දරුවන් මවත් සමඟ බන්ධනාගාරගත වීම පිළිබඳ ප්‍රායෝගික ගැටලු තිබෙනවා. අපි උත්සාහයක් දැරුවා, එවැනි දරුවන් සහ මවුවරුන් එක ස්ථානයකට ගෙනැල්ලා ඒ දරුවන්ට ඒ මව්වරුන්ගේ රැකවරණය ලබා දෙන්න; ඔවුන් පුනරුත්ථාපනය කරන්න. නමුත් මෙහිදී ප්‍රායෝගික ගැටලුවක් මතු වෙලා තිබෙනවා. ඒ මව්වරුන් එක් එක් ප්‍රදේශවලින් යම් යම් චෝදනා මත අත් අඩංගුවට ගත් උදවිය. ඒ උදවිය කැමැති, තමන් ඉන්න ප්‍රදේශයේ බන්ධනාගාරයක කාලය ගත කරන්නයි. ඒ නිසා ඒ අය එක තැනකට ගෙනෙන ක්‍රියාදාමය කරගන්න අපට තවමත් බැරි වෙලා තිබෙනවා. හැබැයි, ඉදිරියේදී අපි ඒ වෙනුවෙන් උත්සාහ දරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බරපතළ ලෙස රෝගාතුර වූ - terminally ill - සිරකරුවන් විශාල සංඛ්‍යාවක් අද ඉන්නවා. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ගරු ඇමතිතුමනි, බන්ධනාගාර රීති සංශෝධනය කිරීම සම්බන්ධයෙන් පත්තරයේ පළ වෙලා තිබුණු කාරණා අතර අපි දැක්කා, සල්ලි ගෙවලා වෙනම කුටියක් ගන්න රැඳවියෙකුට පුළුවන් කියලා. ඒ ක්‍රමය පිළිබඳව අද විශාල ආන්දෝලනයක් තිබෙනවා. එහෙම කරන්න අදහසක් තිබෙනවාද?

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
මම ඒ කාරණය ගැන තමයි දැන් කථා කරන්න සූදානම් වුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1930 ගණන්වල බන්ධනාගාර රීති අනුව -දැන් තිබෙන නීතිය අනුව- සිවිල් සිරකරුවන්ට සහ අපරාධ සිරකරුවන්ට ගාස්තුවක් ගෙවලා cell එකක් වෙන් කර ගන්න පුළුවන්. ඒ උදවියට අවශ්‍ය ගෘහ භාණ්ඩ ඒ ගොල්ලන්ට සල්ලි ගෙවලා ලබා ගන්න පුළුවන්. ඒක තමයි තිබෙන නීතිය. හැබැයි, මෙතැනදී ඒ මාධ්‍යයට කථා කරපු කිසි කෙනෙක් තේරුම් අරගෙන නැහැ, සිවිල් සිරකරුවන් කියලා වෙනම කොට්ඨාසයකුත්, අපරාධ සිරකරුවන් කියලා වෙනම කොට්ඨාසයකුත් ඉන්න බව. සිවිල් සිරකරුවන් සිරගත කර තිබෙන්නේ දණ්ඩ නීති සංග්‍රහය හෝ අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ හෝ නොවෙයි. ඒ උදවිය සිරගත කර තිබෙන්නේ සිවිල් නඩු විධාන සංග්‍රහය යටතේ. නඩු තීන්දුවෙන් නියම කළ මුදල ගෙවා ගන්න විනිශ්චිත ණයකරුට බැරි නම්, විනිශ්චිත ණය හිමියාට අයිතියක් තිබෙනවා, බන්ධනාගාරය දරන වියදම බන්ධනාගාරයට ගෙවලා ඒ තැනැත්තා හිරේ යවන්න. ඔහුව මාසයක් හෝ මාස තුනක් හිරේ යවන්න ප්‍රතිපාදන තිබෙනවා. එතකොට ඒ තැනැත්තා හිරේට යන්නේ අපරාධකරුවෙකු විධියට නොවෙයි. මුදල් ගෙවාගන්න බැරි වුණු නිසා. ඒ තැනැත්තාට අයිතියක් තිබෙනවා, තමන්ගේ සල්ලිවලින් මේ ආකාරයට වෙන් කිරීමක් කරගන්න. ඒක තමයි මේ රටේ තිබුණු නීතිය. ඒ නීතිමය අයිතිය තිබෙනවා, අපරාධකාරයන්ටත්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේකෙන් කරලා තිබෙන්නේ, අපරාධ නීතිය යටතේ අපරාධ සිරකරුවන්ට තිබුණු අයිතිය අහිමි කිරීමක්. දැන් වෙලා තිබෙන්නේ මේකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දැන් තිබෙන නීතිය අනුව යම් අපරාධ සිරකරුවෙකු, "මට සල්ලි තිබෙනවා, මම සල්ලි දෙන්නම්. මට cell එකක් දෙන්න" කිව්වොත්, දෙන්න වෙනවා. ඒක වළක්වන්නයි අප මේ සංශෝධනය ගෙන ආවේ. සිවිල් සිරකරුවන් කියන්නේ අපරාධකාරයන් නොවෙයි. සිවිල් සිරකරුවන් සිරගත කිරීමේ ක්‍රමවේදය පිළිබඳව සිවිල් නඩු විධාන සංග්‍රහයේ තවම තිබෙනවා. ඒ ගැන ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා දන්නවා. හැබැයි, අපේ හිර ගෙවල්වල එහෙම එක සිරකරුවෙකුවත් දැන් නැහැ. අපරාධ සම්බන්ධව වැරැදිකරුවන් වෙලා ආ සිරකරුවන්ට තිබුණු අයිතියක් තමයි අප මේකෙන් අහිමි කරන්නේ.

මොකද, අපට ඒක කරන්න බැහැ. සල්ලි තිබෙන සිරකරුවන් සල්ලි දීලා කියයි, "අපට කුටි දෙන්න" කියලා. එහෙම වුණොත් අපට දෙන්න වෙනවා. ඒක තමයි දැන් තිබෙන නීතිය. ගරු ඩිලාන් පෙරේරා මැතිතුමනි, හිටපු අධිකරණ ඇමතිවරයෙකු හැටියට ඔබතුමා මේ ගැන දන්නවා. මේවා ඉල්ලුවොත් අපට දෙන්න වෙනවා. ඉතින්, අපට එහෙම දෙන්න බැහැ නේ. එහෙම දෙන එක සාධාරණත් නැහැ. මොකද, සල්ලිකාර සිරකරුවන්ට එක විධියකටත්, සල්ලි නැති සිරකරුවන්ට තව විධියකටත් සලකන්න අපි එකඟ නැහැ. ඒ නිසා අපි මේ නීතිය නිසි පරිදි සැකසුවා. හැබැයි, සිවිල් සිරකරුවන් කියන කාණ්ඩය අපට ඒක ඇතුළට දමන්න බැහැ. සිවිල් සිරකරුවන් කියන්නේ යම් කිසි පාර්ශ්වයක් විසින් මුදල් ගෙවලා හිරේට යවන අය. මේ රටේ දිගින් දිගටම ඕක සිදු වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද වෙනකොට අපේ හිර ගෙවල්වල එහෙම එක්කෙනෙක්වත් නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිවයි මම මේ ප්‍රශ්නය අහන්නේ. එතකොට රිමාන්ඩ් සිරකරුවන් සම්බන්ධයෙන් නොවෙයිද, මේ වෙනස් කිරීම කරන්නේ?

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
නැහැ, සිරකරුවන් සම්බන්ධව. වැරැදිකරුවන් වෙච්ච අය සම්බන්ධව.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
Not about remand prisoners, is it?

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
Yes.

ඇත්ත වශයෙන්ම නීතියේ තිබුණු ලොකු අඩු පාඩුවක්, අසමානතාවක් නිවැරදි කිරීම තමයි අපි මේ කළේ. හුඟක් අය මාධ්‍යයෙන් මේ පිළිබඳ විවේචන ඉදිරිපත් කරනවා මම දැක්කා. මේ පිළිබඳව හොඳ අධ්‍යයනයක් කරන්න ඕනෑ නේ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු ඇමතිතුමනි, එම නිවේදනය තුළ, රැඳවියන් බැලීම සඳහා, ඒ කියන්නේ රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටින අයව බැලීම සඳහා තිබෙන දින වකවානු වෙනස් කරලා, සතියකට එක දවසක් වශයෙන් සීමා කරලා තිබෙනවා නේද ?

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ඔව්.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
එතකොට උදවියන් බලන්න තිබෙන අවස්ථාව නැති වෙනවා නේ.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කලින් තිබුණු විධියට සතියකට දින පහක් සිරකරුවන් බලන්න යන්න පුළුවන්. අද අපේ සිරගෙවල්වල ඉඩ කඩ තිබෙන්නේ 13,000කටයි. හැබැයි, මේ වනවිට සිරකරුවන් 25,000ක් මේ සිර ගෙවල්වල පිරිලා ඉන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ සංශෝධන මඟින් යෝජනා කරලා තිබෙන්නේ කෙනෙකු සතියට දින පහක් එනවා වෙනුවට එක දිනයක තුන්දෙනෙකුට පැමිණීමට අවස්ථාව ලබා දෙන්නයි. මොකද, එක එක දවසට එක එක අය එනවා. පරිපාලනයේ දී මේක විශාල ගැටලුවක් වෙනවා. ඒ නිසා සතියකට දවසක් තුන්දෙනෙකුට එන්න අවස්ථාව දීලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම මුදල් තිබෙන, සමාජයේ ඉහළ මට්ටමේ සිටින කෙනෙකුව බලන්න තමයි මෙහෙම දිනපතා -නිරන්තරයෙන්- කට්ටිය එන්නේ. සාමාන්‍ය පවුලක හිරකාරයෙක් බලන්න මාසයකට දවසක් කෙනෙක් එන්නේත් කලාතුරකින්. සමහර අයව බලන්න එන්න කෙනෙකුත් නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
අපි අමාත්‍යාංශය විධියට තනියෙන් ගත්ත තීන්දුවක් නොවෙයි, මේක. මේ පිළිබඳ විශේෂඥ කමිටු පත් කරලා, වෛද්‍යවරුන්ගේ මත අරගෙන, සෞඛ්‍ය අමාත්‍යාංශය සම්බන්ධ කරගෙන, ඒ සියලුදෙනාගේ අදහස්වලට අනුකූලව තමයි මේක සකස් කළේ. මොකද, ඒකෙන් හානියක් වෙන්නේ නැහැ. මේ ක්‍රමයෙන් එක දිනයක තුන්දෙනෙකුට යන්න අවස්ථාව ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට අමතරව අපි මේ රීතිවලින් බලාපොරොත්තු වෙන තව දෙයක් තිබෙනවා. හුඟක් වැඩි වයසට ගිය උදවිය සිරගෙවල්වල ඉන්නවා. මම පෞද්ගලිකව ගිහින් බැලුවා. ඒ උදවිය අතර නැඟිට ගන්න බැරි අය ඉන්නවා. පිළිකා වැනි රෝග හැදුණු අය ඉන්නවා. සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් විශේෂඥ කමිටුවක් පත් කරලා, මේ අයව ඒ කමිටුව වෙත යොමු කරලා, ඒ කමිටුව නිර්දේශ කරනවා නම් පමණක් ඒ උදවියට සමාව දීලා පිටමං කිරීමේ ක්‍රමවේදයක් අපි මෙයින් හඳුන්වා දීලා තිබෙනවා. මේ වනවිට අපි ඒ සඳහා අවශ්‍ය යන්ත්‍රණයත් සකස් කරමින් පවතිනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.45]

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම නීතිය ක්‍රියාත්මක වෙන්නේ රටේ තිබෙන ආර්ථික තත්ත්වය මතයි. ගරු අමාත්‍යතුමනි, ඇත්තම කියනවා නම් අද රට බංකොලොත්. රට බංකොලොත් වුණාම මිනිස්සුත් බංකොලොත්. එතකොට හිරගෙවල් පිරෙනවා. ඉතින්, මේක තමයි අද රටේ තිබෙන තත්ත්වය. මම ඔබතුමාට කියනවා, සිරගෙවල්වල ඉන්න අයට පොදු සමාවක් - general amnesty එකක් - දෙන්න කියලා. විශේෂයෙන්ම මහේස්ත්‍රාත් උසාවිවල පොඩි නඩුවලට, සුළු වැරැදිවලට අදාළ සැකකරුවන්ට පොදු සමාවක් දීලා නිදහස් කරන්න කියලා මහෙස්ත්‍රාත්වරුන්ට උපදෙස් දෙන්න. අද රටේ තිබෙන තත්ත්වය අනුව මේ දුප්පත්කම නිසා අපරාධ රැල්ල වැඩි වෙලා තිබෙනවා. මේ රට බංකොලොත් කරපු ආණ්ඩුවකට අපේ රටේ ආර්ථිකය ගොඩ ගන්න පුළුවන්ද කියලා මම අහනවා.

මොකද, 2019 දී අපි රට භාර දෙනකොට ඇමෙරිකානු ඩොලර් මිලියන 7,800ක සංචිතයක් එක්කයි භාර දුන්නේ. දැන් ඒක බිංදුවට බැහැලා. රස්සාවල් නැති වෙලා. අද ඩොලරුත් නැහැ, රුපියලුත් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතින් මේ වාගේ තත්ත්වයක් යටතේ අපරාධ වැඩි වෙනවා, සිරගෙවල් පිරෙනවා. ඒ නිසා රජය මේ රටේ ආර්ථික තත්ත්වය ගැන කල්පනා කරලා, කොහොමද මේ රට ගොඩ ගන්නේ කියන එක ගැන තීරණයක් ගන්න ඕනෑ. *[බාධා කිරීමක්]* දුප්පත්කම නිසා සිර ගෙවල් පිරෙනවා. ඒකයි මම කියන්නේ. *[බාධා කිරීමක්]* ඔබතුමාට තේරුම් ගන්න බැරි ද? බලන්න, අද පාර්ලිමේන්තුවේ කී දෙනාද ඉන්නේ?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
විපක්ෂයේ කවුරුත් නැහැ.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
අපි විපක්ෂය නේ. අද පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ 25දෙනෙක්වත් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මේ පාර්ලිමේන්තුව දැන් expire වෙච්ච Parliament එකක්; කල් ඉකුත් වූ භාණ්ඩයක්. බලන්න, කිසිම ජවයක් නැහැ. බලන්න, ඇමතිවරු කී දෙනාද ඉන්නේ? ඇමතිවරු එකයි, දෙකයි, තුන්දෙනායි ඉන්නේ. කිසිම ජවයක් නැහැ. මේ පාර්ලිමේන්තුව මැරිලා. *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන මැතිවරණය අභියස දැන් අපි ඉන්නේ. අපි පළාත් පාලන මැතිවරණය අභියස සිටිද්දී, ගරු අධිකරණ ඇමතිතුමා මැතිවරණ නීතිය ගැන විශේෂ කාරක සභාවක් පත් කරන්න යෝජනා කරලා තිබෙනවා. මට නම් මෙහි පරමාර්ථය තේරෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දිනේෂ් ගුණවර්ධන මැතිතුමාට අද පණිවුඩයක් යවලා කිව්වා, මම එතුමාගේ මැතිවරණ ප්‍රතිසංස්කරණ කමිටුව ගැන කථා කරනවා, ඒ නිසා

පාර්ලිමේන්තුවේ ඉන්න කියලා. නමුත් එතුමා ආවේ නැහැ. මොකද, මැතිවරණ නීති රීති ප්‍රතිසංස්කරණය කරන්න 2012දී මහින්ද රාජපක්ෂ මැතිතුමා ඉස්සෙල්ලාම දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ සභාපතිත්වයෙන් කමිටුවක් පත් කෙරුවා. ඉන්පසු යහ පාලන ආණ්ඩුව ආවාම අපිත් කිව්වා, එතුමාට ඒ කටයුත්ත කරගෙන යන්න කියලා. ඊට පස්සේ ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ආවාට පසුවත්, එතුමාට ඒ කටයුත්ත කරගෙන යන්න කියලා කිව්වා. අවුරුදු 10ක් තිබුණා; he had ten years to bring reforms to the Local Authorities Elections laws and other election laws. ඒ අවුරුදු 10 ඇතුළත කළේ නැහැ නේ. 2012දී ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු 2,000ක් හිටපු එක 4,000 දක්වා වැඩි කළේ ගරු අගමැතිතුමා. *[බාධා කිරීමක්]* ආ, එතුමා ගරු සභාවේ ඉන්නවාද?

***[මෙම අවස්ථාවේදී ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සභා ගර්භයට පැමිණියේය.]***

*[இச்சந்தர்ப்பத்தில் மாண்புமிகு சனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் சபாமண்டபத்துட் பிரவேசித்தார்.]*

*[At this stage, the Hon. President Ranil Wickremesinghe entered the Chamber.]*

ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු සංඛ්‍යාව 4,000ක් කළා. යහ පාලන ආණ්ඩුවෙන් එම ප්‍රමාණය 8,000ක් කළා. දිනේෂ් ගුණවර්ධන මැතිතුමා නේ, එම කමිටුවේ සභාපති. එම සංඛ්‍යාව 8,000ක් කරලා දැන් කියනවා, ගණන වැඩියි කියලා. විපක්ෂය හැටියට අපි ආණ්ඩුවට සහයෝගය දෙන්න සූදානම්. අපි සහයෝගය දුන් නිසා තමයි විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වුණේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විපක්ෂය ඡන්දය දුන්නේ නැත්නම් එදා ඒක සම්මත වෙනවාද? සම්මත වෙන්නේ නැහැ. ඡන්ද 174ක් ලැබුණා. ඉන් ඡන්ද 90ක් අපේ. අපි සහයෝගය දුන්නේ මොකද? අපටත් ඕනෑ, රට බේරා ගන්න. 1948 ඉඳලා මේ රටේ ආණ්ඩු ගණනාවක් තිබුණා. නමුත් ඒ එක ආණ්ඩුවක්වත් රට බංකොලොත් කෙරුවේ නැහැ. හැම ආණ්ඩුවක්ම ඊළඟ ආණ්ඩුවට සල්ලි ඉතිරි කරලා ගියා. නමුත් ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට රට බංකොලොත් කියලා මේ ගොල්ලන් කිව්වා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය අවුරුදු 100 ගත්තොත්, රටවල් 7යි බංකොලොත් කියලා කට ඇරලා ලෝකයට ප්‍රකාශ කර තිබෙන්නේ. ලජ්ජා නැද්ද? සාමාන්‍යයෙන් කෙනෙක් බංකොලොත් වුණාම කට වහගෙන ඉන්නවා. මේ ගොල්ලන් ඇවිල්ලා කිව්වා, අපි බංකොලොත් කියලා.

අපි විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඡන්දය දුන්නා. මොකද, අපට ස්වාධීන කොමිෂන් සභා අවශ්‍යයි. මම ආඩම්බර වෙනවා, මම හැමදාම ස්වාධීන කොමිෂන් සභා වෙනුවෙන්, අධිකරණයේ නිදහස වෙනුවෙන්, ඒ වාගේම උසස් ආයතනවල ස්වාධීනත්වය වෙනුවෙන් ඡන්දය දුන්නා. මම දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඡන්දය දුන්නා. හැබැයි, අපි දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධ වුණා. අපි එදා නැඟිටලා යන්න ගියා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අපි ඡන්දය දුන්නා. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අපි විරුද්ධ වුණා. ඉතින් අපට ආඩම්බර වෙන්න පුළුවන්. ආණ්ඩුව පැත්තේ සමහර අය ඉන්නවා, ව්‍යවස්ථා සංශෝධන හතරටම ඡන්දය දීපු. ඒ අය දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයටත් ඡන්දය දුන්නා; ස්වාධීන කොමිෂන් සභා ඇති කරන්නත් ඡන්දය දුන්නා; දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධයෙන් කොමිෂන් සභා නැති කරන්නත් ඡන්දය දුන්නා; නැවත දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඒවා ඇති කරන්නත් ඡන්දය දුන්නා; ආයෙත් නැති කරන්නත් ඡන්දය දුන්නා.

අධිකරණයේ කටයුතු කළ ස්වාධීන නීතිඥවරයකු හැටියට මම හැමදාම ඒ ගැන කථා කළා. එම නිසා මා නම් ඒ ගැන ආඩම්බර වෙනවා. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කරනකොට මම අලි සබ්රි මැතිතුමාට කිව්වා, නීතිඥවරයකු හැටියට ඔබතුමා විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගේන එක ගැන මම කනගාටු වෙනවා කියලා. මම එතුමාගෙන් ඇහුවා, ඇයි, මේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගේන්නේ කියලාත්. එතුමා ඒ කාලයේ හිටියේ මහා උජාරුවෙන්. අපි කියන දේවල් ඇහුවේ නැහැ. මම සංශෝධන 40ක් ඉදිරිපත් කළා, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ සංශෝධන එකක්වත් පිළිගත්තේ නැහැ. මොකද, ඔබතුමා ඒ කාලයේ බලයෙන් මත් වෙලා හිටියේ, "අපට තුනෙන් දෙකක බලයක් ලැබුණා, හැටනව ලක්ෂයකගේ ඡන්දය ලැබුණා" කියලා. හැබැයි, පසුගිය දිනවල එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයට ගිහිල්ලා ඔබතුමා අහගත්තා නේ; අහ ගත්තා නේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මානව හිමිකම් සම්බන්ධ accountability ප්‍රශ්නය අපට හැමදාම තිබුණා. නමුත්, මේ වතාවේ ප්‍රශ්නය වුණේ ආර්ථික අපරාධ. ගරු අධිකරණ ඇමතිතුමනි, මොනවාද මේ ආර්ථික අපරාධ? ආණ්ඩුව ආර්ථික අපරාධ කරලා තිබෙනවා කියලා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලය පිළිගෙන තිබෙනවා. ඔබතුමා දන්නවාද, සැප්තැම්බර් මාසයේ රටවල් 175ක් සහභාගි වන එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා මණ්ඩලයට - General Assembly එකට - මේ ප්‍රශ්නය යොමු වන බව? ලජ්ජා නැද්ද? අද එක්තරා පුවත් පතක පළ කර තිබෙනවා, ඒ ගොල්ලන් ලංකාවට විරුද්ධව පරීක්ෂණ කරන්න ඇමෙරිකානු ඩොලර් මිලියන 6ක් - US Dollar 6 million - ඉල්ලා තිබෙන බව. මේවා තමයි ඔබතුමන්ලා මේ අවුරුදු තුනේ කළේ. දැන්වත් මේක දාලා යන්න. අපි ජනාධිපතිතුමාට දොස් කියන්නේ නැහැ. මොකද, එතුමා නොවෙයි මේකට වග කියන්න ඕනෑ. එතුමාත් එතකොට අපිත් එක්ක නේ, හිටියේ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍ය සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ - சனாதிபதியும் பாதுகாப்பு அமைச்சரும் நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - President, Minister of Defence and Minister of Finance, Economic Stabilization and National Policies)
කටු අත්තක් භාර ගත්තේ.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඒක මම පිළිගන්නවා. එතුමා හැමදාම ඒ කථාව කිව්වා. මට මතකයි 2000 වසරේදීත් කිව්වා, "කටු අත්තක් භාර ගත්තේ" කියලා. අපි කියන්නේ මේ ආණ්ඩුවට මේ රට පාලනය කරන්න වරමක් නැහැ කියලායි. කරන්න ඕනෑ ඔක්කෝම කරලා ඉවරයි නේ? වෙන මොනවාද විනාශ කරන්න තිබෙන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අපි ඡන්දය දුන්නා. ඕනෑ නම් අපට ඡන්දය නොදී ඉන්න තිබුණා, මෙතැනදීත් අපි දේශපාලනය කරනවා නම්. නමුත්, අපි ඡන්දය දුන්නා. දැන් ස්වාධීන කොමිෂන් සභා ඇති කරලා තිබෙනවා. අපට පේනවා, මානව හිමිකම් කොමිසමට, ඒ වාගේම මැතිවරණ කොමිසමට බලපෑම් කරන බව. අපි දන්නවා, ඒ බලපෑම් කරන හැටි. අපිත් ආණ්ඩුවල හිටියා නේ. මම මැතිවරණ කොමිසමේ සභාපතිට කියන්න කැමැතියි, මැතිවරණය පවත්වන්න කියලා. එතුමාට බලපෑම් කරන්න

[ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

කාටවත් අයිතියක් නැහැ. මට බෞද්ධ කියමනක් මතක් වුණා. මම ඒ කියමන මැතිවරණ කොමසාරිස්තුමාට මතක් කර දෙන්න කැමැතියි. "උපන් දා සිට කරපු පව් නැත වරක් වැන්දොත් කැලණියේ" කියලා කියනවා නේ. කිසි කෙනෙකුට භය නොවී මේ මැතිවරණය පැවැත්වුවොත්, එතුමා ඉතිහාසයට එක්කාසු වෙනවා. ඒ නිසා මම එතුමාට කියනවා, මැතිවරණය පවත්වන්න කියලා. එතුමාට නීතිපතිතුමාගෙන් උපදෙස් ගන්න ඕනෑ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද රටේ ජනතාව මැතිවරණයක් ඉල්ලනවා. ජනතාව මැතිවරණ පිපාසයෙන් ඉන්නේ. ඒ නිසා මැතිවරණය පවත්වන්න. සමගි ජන බලවේගය හැටියට අපි මැතිවරණයකට සූදානම්. මොකද, අපි ජනතාවට අවස්ථාවක් දෙන්න ඕනෑ. හිටපු ජනාධිපති පැනලා ගියා; හිටපු අගමැති පැනලා ගියා; කැබිනට් එක අස් වුණා. මේක, මොන ආණ්ඩුවක්ද? ආණ්ඩුව should be ashamed to be in power. ජනතාවට අවස්ථාවක් දෙන්න.

මේ වෙලාවේ ගරු ජනාධිපතිතුමා සභාවේ ඉන්න එක ගැන මම සතුටු වෙනවා. ලබන සතියේ අය වැය ඉදිරිපත් කරනවා. නමුත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක තිබෙන එකඟතා තවම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා නැහැ. අපි කොහොමද, අය වැය විවාදයේදී කථා කරන්නේ? What are the taxes? What are the special levies? අපි මේ මොනවාවත් දන්නේ නැහැ. අද වන විට මේ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ එකඟතා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ නැතිව, අය වැය ගැන සාකච්ඡා කරන්න අපට පුළුවන්ද? මම කියන දේ ගැන ඔබතුමන්ලාගේත් හදවතට තට්ටු කරලා අහලා බලන්න. ගරු ජනාධිපතිතුමා මන්ත්‍රීවරයකු විධියට මේ පැත්තේ ඉන්නකොට හැමදාම වාගේ කිව්වා, IMF එකත් එක්ක තිබෙන ගිවිසුම ඉදිරිපත් කරන්න කියලා.

එතුමා සර්ව පාක්ෂික සමුළුවට ගිය වෙලාවේ බැසිල් රාජපක්ෂ මහත්මයාත් එක්ක රණ්ඩු වුණා, මේ Agreement එක දෙන්න කියලා. ඉතින් අපි ජනාධිපතිතුමාට කියනවා, අපට ඒ ගිවිසුම දෙන්න කියලා. අපිත් ඔබතුමන්ලාට සහයෝගය දෙන්න කැමැතියි. ඒක නේ අපි විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පක්ෂව ඡන්දය දුන්නේ. අපි දන්නවා, රටේ ප්‍රශ්නයක් තිබෙන බව. කළුවරේ අතපතගාමින් ගියොත් මොකක්ද වෙන්නේ? අපටත් විශාල සැකයක් ඇතිවෙලා තිබෙනවා, මොකක්ද මේ කරන්න යන්නේ කියලා.

මම අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිතයන් ලංකාවට ආවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ අය පුවත් පත් සාකච්ඡාවක් - press conference එකක් - පැවැත්වුවා. ඔවුන් මොකක්ද කිව්වේ? ජන මතය විමසන්න කිව්වා. You need a mandate. මොකද, "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන්නේ දේශීය සම්පත් ආරක්ෂා කරනවා කියලායි. ඒක නේ එහි හරය. දැන් කර ගෙන යන්නේ දේශීය සම්පත් එකින් එක privatize කරන එක, විකුණන එක. මේක පරස්පර විරෝධියි. මේවා කරන්න ජන වරමක් නැහැ. ජන වරමක් ගන්න. ජන වරම තුළින් අපි වැඩ කරමු. අපිත් ඒ සඳහා අවශ්‍ය සහයෝගය දෙන්න සූදානම්.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා.

[පූ.භා. 11.57]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍ය සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ - சனாதிபதியும் பாதுகாப்பு அமைச்சரும் நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - President, Minister of Defence and Minister of Finance, Economic Stabilization and National Policies)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අදට නියමිත කටයුතු අතර අධිකරණ අමාත්‍යාංශයට අදාළ වන වැදගත් පනත් කෙටුම්පත් නවයක් සහ බන්ධනාගාර ආඥාපනත යටතේ රීති ඉදිරිපත් කර තිබෙනවා. ඒ ගැන මේ සභාවේ දීර්ඝ වශයෙන් කථා කර තිබෙන නිසා මම ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ. කාලය අනුව අපේ නීති නවීකරණය කරන්න ඕනෑ. ඒ වැඩ කටයුතු එතුමාට භාර දීලා තිබෙනවා. ඒකෙන් කොටසක් තමයි අද ඉදිරිපත් කරලා තිබෙන්නේ. මම බලාපොරොත්තු වෙනවා, එතුමා මේ අවුරුද්දේත්, ලබන අවුරුද්දේත් ඒ සියල්ලම මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරයි කියලා. ඕනෑ නම් වැඩිපුර දවස් කිහිපයක් පාර්ලිමේන්තුව රැස්වෙලා හෝ මේ නීති සම්මත කර ගනිමු. නීති නවීකරණය කරන එක වැදගත් කාරණයක්.

මම සඳුදාත්, අඟහරුවාදාත් අපේ පරිසර ඇමතිතුමා සමඟ ඊජිප්තුවේ කයිරෝ නුවර පැවැති COP27 සමුළුවට සහභාගි වුණා. දේශගුණික විපර්යාස පිළිබඳ ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක රුවන් විජයවර්ධන මැතිතුමාත්, අපට ආධාර කරන මාලදිවයිනේ හිටපු ජනාධිපති මොහමඩ් නෂීඩ් මහත්මයාත් මා සමඟ එයට සහභාගි වුණා. මේක වැදගත් සමුළුවක්. 2015දී මේ සමුළුවට සහභාගි වුණු හිටපු ජනාධිපතිවරයකු වූ ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට අපි විශේෂයෙන්ම ප්‍රශංසා කරන්න ඕනෑ. මොකද, ඒ අවස්ථාවේදී -2015දී- එතුමා ඒ ගිවිසුමට එකඟ වුණා. අපේ රටේ තාප විදුලි බලාගාර ඉදිකිරීම සීමා කරන්න එහිදී එතුමා තීරණය කළා. ඒ අනුව අපි එවැනි බලාගාර එකක්වත් අලුතින් හදලා නැහැ. ගිය අවුරුද්දේ ග්ලාස්ගෝ නුවර පැවැති COP26 සමුළුව කොවිඩ් වසංගතය නිසා පවත්වන්න ප්‍රමාද වුණා. නමුත්, එදා බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ හිටපු අගමැති බොරිස් ජොන්සන් මැතිතුමාගේ නායකත්වය යටතේ හොඳ යෝජනාවක් ඉදිරිපත් කළා, 2050 වසර වෙනකොට දේශගුණික විපර්යාස නවත්වන්න සෙන්ටිග්‍රේඩ් අංශක 1.5 දක්වා ගෝලීය උණුසුම ඉහළ යෑම සීමා කරන්න කෙසේ හෝ කටයුතු කරනවා කියලා. මෙවර සමුළුවට අපි සහභාගි වුණේ ඒ සම්බන්ධව අප විසින් අරගෙන තිබෙන පියවර පිළිබඳව දැනුවත් කරන්නයි. ඒ සම්බන්ධව ඉංග්‍රීසි භාෂාවෙන් කථා කරන්න මම බලාපොරොත්තු වෙනවා. මොකද, ඒක ලංකාවට පමණක් නොවෙයි, අනෙක් රටවලටත් වැදගත්.

Hon. Deputy Speaker, there has been no progress made since COP 26 till we went for COP 27. In fact, the target of limiting global warming to 1.5°C by 2050 was being raised again even by some of the developed countries and many countries in the G20. The G20 countries have not reduced their emissions at all. They have not, in any way, contributed the US Dollar 100 billion that they promised. We require US Dollar 350 billion a year, but we have not even fulfilled that pledge. So, in that sense, we went for COP 27 having a setback in the agreements and the achievements made at COP 26.

When we looked at COP 27 arrangements, we found that none of the developed countries or the G20 countries

were there to have a serious conversation with others. Some of the leaders who came, came only for the opening day and though they were supposed to have made statements, those statements were made not at the main conference, but on the sidelines of various events that took place. Then, they all left. Actually, on the second day, the only senior leader we had from the European side was the German Chancellor Olaf Scholz, who was there taking part in the Global Shield initiative that they had initiated. We must thank him for that. Of the G20 leaders, the main position was taken by the President of South Africa, Cyril Ramaphosa. In that background, I myself from Sri Lanka and some of the other leaders had to condemn and criticize the stand that had been taken by the G20 countries, the G7 countries and the developed economies.

We cannot go on like this. There are serious issues that the world faces. If you listen to the speech made by the Secretary General of the UN, you would realize that in the next 20 or 30 years, the situation will become more serious. We listened to the Prime Minister of Pakistan. We studied the situation, where the melting of the Himalayas has affected Pakistan. Not only them, but Nepal also said that it is going to affect them too. Then, it is going to affect India, where the Ganges runs through and in fact, it is also going to affect Bangladesh because both the Ganges and the Brahmaputra run through Bangladesh. It is going to affect Myanmar because the Irrawaddy and Salween rivers run through Myanmar. Then, it is also going to affect the Maldives; it will go under water. It is going to affect us with part of our western coast going under water. Even places like Kanyakumari at the tip of South India will go under water. That is the threat that all of us are facing, but there is no response on that by the major countries.

So, we were discussing among ourselves that the only way out is to go for COP28 and lock horns with the G20 countries on these issues. The target is to limit global warming to 1.5°C by 2050. We have to lock horns with them and take them on, which means we have to be ready to discuss it with like-minded countries. I am sure both the Minister of Foreign Affairs and the Minister of Environment can do that. Most countries are waiting to do that. So, Sri Lanka has to join them. We must, as far as possible, support it and if necessary, on some occasions, take the leadership on this issue.

The second matter is, food security. We have gone through a problematic period. I must thank the countries which helped us. We would not have a major issue with regard to food security next year, hopefully. But in Africa, the situation is pretty bad: 20 to 30 million people will be affected and there will be a large number of deaths in the Horn of Africa. There is no aid or assistance and it was also not discussed. In addition to that, some of them cannot grow food; others cannot get fertilizer to grow food because they do not have money. So, we have to help them. The other matter is, most of them are affected especially by debt. So, in my view, we should give assistance to those countries which have serious problems of food scarcity.

On the same terms, the IMF gave help to Ukraine. Ukraine is fighting a war with Russia. But, these people are fighting the war of survival. So, we should ask the West to give them the same support that was given to Ukraine. These are major issues which should be part of our foreign policy and our environment policy in the coming years.

I was very happy when the Chief Opposition Whip referred to Geneva. I think The right to live of this generation, the younger people who will be 40, 50 by 2050, and the unborn, of whom we are talking, is the very basic right. So, if you ignore the rights of the youth, the younger generation, and the unborn, that would be the worst genocide which could happen. So, we hope, in time to come, while they are addressing issues concerning Sri Lanka, they will also be in a position to address this whole issue, which I would call "genocide into genocide into genocide". So, we should raise that up.

මට කලින් අපේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කථා කළා. එතුමාටත් මම පිළිතුරු දෙන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, අපි අපේ ප්‍රශ්න විසඳන්න බලාපොරොත්තු වෙනවා. ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමා ඒ ගැන කියාවි. දැන් අපට වුවමනා කරන නීති 3ක් තිබෙනවා. විශේෂයෙන්ම Truth and Reconciliation Commission, Counter Terrorism Act ඒ වාගේම, corruption පිළිබඳ අලුත් නීති සකස් කරගෙන මේ ඇමතිවරු දෙදෙනා ජනවාරි, පෙබරවාරි මාස වන විට ඒවා ඉදිරිපත් කරනවා. ඒ එක්කම ද්‍රවිඩ ජනතාවගේ ප්‍රශ්න ගැන, උතුරේ අපේ ජනතාවගේ ප්‍රශ්න ගැන අපි සාකච්ඡා කරගෙන යනවා. මම දන්නා විධියට අත් අඩංගුවේ හිටපු, සිරගතව හිටපු කිහිප දෙනෙක් නිදහස් කර තිබෙනවා. නිදහස් කරන්න තවත් අය ඉන්නවා; ලේඛකයෙක් ඉන්නවා. මේ වන විට ඒ ලේඛකයාට නඩු දාලා තිබෙනවා. ඒ නඩු අවසන් වුණාට පස්සේ එයා වැරදිකරු කියලා තීරණය කළොත්, -නිවැරදි නම් ප්‍රශ්නයක් නැහැ- ඒ සහාය ලබා දෙන්නත් බලාපොරොත්තු වෙනවා. ඔහු සම්බන්ධ වෙලා තිබෙන්නේ පිත්තල හන්දියේ වූ සිදුවීමටයි. අපේ විදේශ කටයුතු ඇමතිතුමා, හිටපු ජනාධිපතිතුමා එක්කත් ඒ ගැන කථා කරලා තිබෙනවා. අපට ඕනෑ මේ ප්‍රශ්නය විසඳන්නයි.

ඊළඟට, අතුරුදන්වූවන් ගැනත් අපි කථා කරමු. ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි, මම හිතන විධියට ඒ සම්බන්ධයෙන් අපේ කාලයේ තිබුණේ නඩු 60ක් විතර නේද?

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
Files 65ක් විතර.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)
2019 දී අපි බලයෙන් යනකොට files 65ක් විතරයි තිබුණේ. දැන් කීයක් තිබෙනවා ද, ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමා?

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
දැන් 2,000ක් complete කරලා තිබෙනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)
2,000ක් අවසන් කරලා තිබෙනවා. මම ගරු ඇමතිතුමාට කිව්වා, ඕනෑ නම් තවත් පත් කරගෙන ඉක්මනින් මේක අවසන් කරන්න කියලා. Files ගත්තාට පස්සේ අපි කථා කරමු. We all can talk on that.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ඒ සංඛ්‍යාව ඒ තරම් නිවැරදි නැහැ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)

Okay. I will tell you, both of you have a discussion and come to me with the agreed figures. We are willing to put more panels to start inquiring. That is the only way we can address their issues. Next week, we will have a discussion with the Members of Parliament from the North on the procedure, and, Hon. Member, I will also invite you.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
Although he is not from the North.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)
He says that he represents the people of recent Sri Lankan origin living in Vavuniya. There is a fair number in that area settled by Mr. Sellasamy and now, he is taking leadership on behalf of them. So, we have to discuss that problem and get it out of the way.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
I am a Sri Lankan.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)
Yes, you are a Sri Lankan. Otherwise? You had more Sinhala votes, votes of three-wheeler drivers and all those, than some of the Sinhala Members here.

I hope my good Friend, the Hon. G.G. Ponnambalam from the All Ceylon Tamil Congress, will also join us to settle this problem. Even if you go halfway, it would be a big thing.

We are also having a development plan for the North. I am getting an assessment done on the renewable energy potential in the North and the possibility of producing green hydrogen. If you produce green hydrogen on a competitive basis, the whole economy of the North would come up. So, we have to look into that because the bulk of our renewable energy will be produced in areas from Puttalam all the way down to Trincomalee. There are other areas of development we are going to focus on. We started development from Trincomalee down to the East with tourism. So, there is a fair number of developments we want to do. Apart from that, we want to settle that issue. All of us are Sri Lankans. Therefore, let us all get together and make it a point to settle that.

අපි බලන්න ඕනෑ, විශේෂයෙන්ම අපේ 75වැනි නිදහස් සංවත්සරය වෙනකොට මේ ප්‍රශ්න විසඳන්න. කවුරුවත් මේ රටට ඇඟිලි ගහන්න ඕනෑ නැහැ. අපිට පුළුවන් අපේ ප්‍රශ්න ටික විසඳාගෙන ඉදිරියට යන්න. ඒක කරන්න තමයි අපි විශේෂයෙන්ම බලාපොරොත්තු වෙන්නේ.

ඊළඟට, අපේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කියපු දෙයක් සම්බන්ධයෙන් මම කාරණයක් කියනවා. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගත්තේ ආණ්ඩුවයි, විපක්ෂයයි දෙකම එකතු වෙලා. අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කළෙත් එහෙමයි. විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කළෙත් එහෙමයි.

ඉස්සර වෙලාම ආණ්ඩුක්‍රම සභාව පත් කරන්න. මම හිතන විධියට මෙතැන පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. ඒක ප්‍රශ්නයකුත් නොවෙයි. අගමැතිතුමා සහ විපක්ෂ නායකතුමා එකතු වෙලා තමයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට සිවිල් සමාජයෙන් පත් කරන 3දෙනා නම් කරන්නේ. ඒක සහතික කරන්නේ කථානායකතුමා. කොහොමද පාර්ලිමේන්තුව ඒක ප්‍රතික්ෂේප කරන්නේ? එහෙම ප්‍රතික්ෂේප කරනවා නම් අගමැතිතුමාට ආණ්ඩු පක්ෂයේ සහයෝගය නැහැ; විපක්ෂ නායකතුමාට විපක්ෂයේ සහයෝගය නැහැ; කථානායකතුමාට දෙපැත්තේම සහයෝගය නැහැ. එහෙම නම් මේ තුන්දෙනාටම ඉල්ලා අස් වෙන්න වෙනවා. ඒක කරන්නේ නැහැ නේ; කරන්න බැරි දෙයක් නේ. ඒ නායකයෝ දෙදෙනා එකඟ වෙලා, කථානායකතුමා සහතික කළාම නිල වශයෙන් ඒ පත්වීම් සිදු කරනවා. It is just a procedural event.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ගරු ජනාධිපතිතුමනි, ඒක දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේත් තිබුණා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)
ඒක දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේත් තිබුණා. ඒකයි කළේ. අපි එකඟ වුණු හැටියට ඇමතිතුමා ඒක සංශෝධනය කළා. So, it is just a matter of proposing the names to agree on. Therefore, let us have the names. I told the Hon. Prime Minister also about that. Let us talk it over with the Hon. Speaker and get three names proposed. මෙතැන ප්‍රධාන ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ විපක්ෂයේ සජබයට අයිති නොවන මන්ත්‍රීවරයා කවුද කියන එකයි. අපි ද්‍රවිඩ පක්ෂවලින් නම් කරනවා නම්, දෙවනුව විශාලම කණ්ඩායම තිබෙන්නේ එතැන. අපි ගිය සැරේත් ද්‍රවිඩ නම් කිරීමකුයි, කාන්තා නම් කිරීමකුයි දෙකම දැම්මා. එහෙම නම් කාන්තා නම් කිරීම ගැන බලන්න පුළුවන්. මුස්ලිම් එක්කෙනෙක් ගැන බලන්නත් පුළුවන්. මුස්ලිම් එක්කෙනෙක් නැත්නම් ඒ අනුව කාන්තා නම් කිරීමක් කරන්න. මම කියන්නේ මේක ඉක්මනට

කරන්න කියලා. එතකොට අලුත් කොමිෂන් සභා සියල්ලම අපට පත් කරන්න පුළුවන්. අපි ඒක කරන්න ලෑස්තියි. ඒ නිසා මේ වැඩ කටයුත්ත ඉක්මනට කරලා දෙන්න කියලා මම ඔබ සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා.

මම ඒ සම්මේලනයට යද්දී මට අවස්ථාව ලැබුණා, විශේෂයෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කළමනාකාර අධ්‍යක්ෂතුමිය හමු වෙන්න. මම එතුමිය එක්ක සාකච්ඡා කළා. එතුමිය කිව්වා, අපිට සහයෝගය දෙනවා කියලා. ඉතින් කිසිම බයක් ඇති කරගන්න එපා. අපිට දැන් තිබෙන්නේ ඉන්දියාව සහ චීනය එක්ක සාකච්ඡා කර ඒ කටයුතු අවසන් කරන්නයි. චීනය අපට කිව්වේ පක්ෂ සම්මේලනයෙන් පසුව සාකච්ඡා ආරම්භ කරන්න කියලායි. දැන් ඒ කටයුතු ආරම්භ කර තිබෙනවා. ඒ ගැන බලා අපි වැඩ කටයුතු ක්‍රියාත්මක කරනවා. අපි රටවල් දෙකෙන්ම ඉල්ලන්නේ, දෙසැම්බර් මාසය වෙනකොට මේ කටයුතු අවසන් කරන්න බලමු කියලා. ලෝක බැංකුවේ සභාපතිතුමාත් හම්බ වුණා. මම මේ ගැන දීර්ඝව කථා කරන්න යන්නේ නැහැ.

විශේෂයෙන් විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කිව්වා මේ ගැන කරුණු කියන්න කියලා. මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා කිව්වා, "මේ කරුණු දන්නේ නැත්නම්, අපි විවාදයට එන්නේ නැහැ." කියලා. එහෙම නම් අපට විරුද්ධ වෙන්නේ නැත්නම් දෙපැත්තේම සහයෝගය ඇතුව අපිට ලෙහෙසියෙන්ම මේක සම්මත කරන්න පුළුවන්.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය ඇතුව මම ගරු ජනාධිපතිතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න කැමැතියි.

ගරු ජනාධිපතිතුමනි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක අත්සන් කළ ගිවිසුම මෙවර අය වැයට කලින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවාද?. මොකද, ඒක වැදගත්.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)

ඉස්සර අපි සාකච්ඡා අවසන් කර යන්න තිබුණේ IMF එකට පමණයි. ඒත් මේ අවස්ථාවේදී මෙය අරගෙන අනෙක් රටවල් එක්කත් කථා කරන්න ඕනෑ. විශේෂයෙන් දැනට ජපානය එක්ක කථා කරනවා. චීනය සහ ඉන්දියාව කියන රටවල් දෙක Paris Club එකේ සාමාජිකයන් නොවෙයි. එතැනදීත් සංශෝධන වෙන්න පුළුවන්. ඒවා ඔක්කෝම කළායින් පසුව මම කියන්නම්.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

It would be too late.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)

It would not be too late. We are working accordingly. Easily, the Hon. (Dr.) Harsha de Silva can go and ask them for that. He went and asked for that before he made his statement here.

So, we will keep you informed if there is any development. We have told you that they have given us targets; those will not change. It is a four-year programme. We have to go to the original rate of 14.5 per cent or 15 per cent. We are looking into that. The Budget tries to accelerate it so that we can have a higher growth rate and certainly, more development and investments. So, we will look at the targets the IMF has given and see how we can increase revenue. That is what I want from this Budget. Certainly, on the Agreement, we will keep you informed.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

If the IMF Agreement is tabled before the Budget, it would be very helpful. Then, we will know where we are heading.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)

The IMF says, "Do not release it till we finish this round of negotiations". - *[Interruption.]* Do not worry. I will not put anyone into trouble.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

By that time, you can sign and seal the Agreement.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)

The Agreement has been signed and finished. We must get the others to sign.

If there is a change, I will come back and tell you. But so far, we do not know what China and India has to say. I do not think -

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

The only thing is, when you were on this side, you were always asking for the Agreements to be tabled.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)

I stand by that. But, there are three other parties we have to discuss with and also the private creditors. There was no intermediate stage. But, I can keep you all briefed. There are targets; those targets would not change. So, you can look at those and tell us your ideas.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු විමල් වීරවංශ මැතිතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු ජනාධිපතිතුමනි, මට කරුණු පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. රට-රටවල් අතර කළ ණය ගනුදෙනු විතරක් නොවෙයි, අපේ ණය පංගුවට අයත් වන්නේ. අපි ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරවලින් ගත් ණය තොගයකුත් තිබෙනවා. ඒක අපේ මුළු ණය පංගුවෙන් විශාල ප්‍රතිශතයක්. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී ජාත්‍යන්තර ආයතනවලින් ගත් ණයවලටත්, රට-රටවලින් ගත් ණයවලටත් අමතරව ඒ ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරවලින් ගත් ණයත් ප්‍රතිව්‍යුහගත කරනවාද, ඒක සාර්ථක කරන්න පුළුවන් මට්ටමක තිබෙනවාද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)
අපේ ණය කොටස තුළ පෞද්ගලිකව දුන් ණය - ISBs - වාගේම, ජාත්‍යන්තර සංවිධානවලින් ලබා ගත් ණයත්, විශේෂයෙන් ඒ ඒ රටවල් එක්ක ඇති කරගත් ද්විපාර්ශ්වික ගිවිසුම් හරහා ලබා ගත් ණයත් තිබෙනවා. ප්‍රධානම කාරණය තමයි ද්විපාර්ශ්වික ගිවිසුම් හරහා ලබා ගත් ණය. Paris Club එකේ සාමාජික රටවලුත්, ඒ වාගේම ඉන්දියාව සහ චීනයත් තමයි මේ සඳහා එකඟ වෙන්නේ. ඒ එකඟත්වය පෞද්ගලික ණය ලබා දුන් අය පිළිගන්නවා. දැනට එක නඩුවක් තිබුණා. දැන් ඒකත් සමථයකට පත් කරන තත්ත්වයක තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන් ද්විපාර්ශ්වික ණය ගැන සාකච්ඡා කර එකඟත්වයකට ආවාම, පෞද්ගලික ණය ලබා දුන් අය එක්ක විශාල ප්‍රශ්නයක් තියේවි කියලා අපි හිතන්නේ නැහැ. දැනට ඒ සාකච්ඡා ආරම්භ කර තිබෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු ජනාධිපතිතුමනි, මම ඊට අතිරේකව තවත් කාරණයක් දැන ගන්න කැමැතියි. දැන් ඔබතුමා කිව්වා, ණය ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළව චීනය සහ ඉන්දියාව එක්ක වෙනම සාකච්ඡා කරනවා කියලා. අවාසනාවකට හෝ ඔය කියන කිසියම් රටක් ඒ ණය ප්‍රතිව්‍යුහගතකරණයට අදාළ යෝජනාවට එකඟ නොවී වෙනත් විකල්ප යෝජනාවක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කළොත්, එතකොට මේ සමස්ත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය බිඳ වැටෙනවාද? එම ක්‍රියාවලිය එසේ බිඳ වැටුණොත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හරහා අපි බලාපොරොත්තු වෙන කිසියම් හෝ ප්‍රතිලාභයක් තිබෙනවා නම් ඒක ලබා ගැනීමේ ක්‍රියාවලිය ඇනහිටිනවාද? එසේ වේවා කියා මම ප්‍රාර්ථනා කරනවා නොවෙයි. නමුත්, එහෙම තත්ත්වයක් ඇති වුණොත් මොකද වෙන්නේ, කියන එකත් මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)
එක රටක් විරුද්ධ වුණොත් මොකක්ද සිදු වෙන්නේ කියන කාරණය ගැන අපි සාකච්ඡා කරලායි තිබෙන්නේ. ඒ, එකඟ නොවුණොත්. ඒත් දැනට ඇත්ත වශයෙන්ම තිබෙන්නේ විකල්ප දෙකයි. ඒ තමයි, ණය කපා හැරීම හෝ ණය ගෙවන කාලය අවුරුදු දහයකට හෝ විස්සකට දීර්ඝ කිරීම. ඒ විකල්ප දෙක ගැන තමයි කථා කළේ. ඒ විකල්ප දෙකෙන් එකකට එන්න කටයුතු කරගන්න අපට පුළුවන්.

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මටත් පැහැදිලි කර ගැනීමක් කරගන්න තිබෙනවා. පොඩි වෙලාවක් දෙන්න.

ගරු ජනාධිපතිතුමනි, අය වැය ඉදිරිපත් කරනකොට අපේ අය සහ වැය පිළිබඳ කෙටි අදහසක් අපට තිබෙන්න ඕනෑ. IMF එක සමඟ අපේ තිබෙන එකඟතා මොනවා ද කියලා අපි දන්නේ නැතිව අය වැයක් ඉදිරිපත් කරන්න යාමේදී, යම් හෙයකින් ඒ අයගෙන් අපි බලාපොරොත්තු වුණු සහයෝගය උපරිම ආකාරයෙන් නොලැබුණොත් මොකක්ද වෙන්නේ? අපි එලෙස වේවා කියා ප්‍රාර්ථනා කරන්නේ නැහැ. ඒ සහයෝගය උපරිම ආකාරයෙන් ලැබෙයි කියලායි අපි බලාපොරොත්තු වෙන්නේ. නමුත්, එහි යම් වෙනසක් වුණොත්, ඒ විවිධ scenariosවලට ගැළපෙන විධියට අය වැය සැකසීමට සූදානම් වෙලාද ඉන්නේ?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)
අපි දැන් අය වැය සකස් කරන්නේ ඒ රාමුව තුළයි. මේ සම්බන්ධ සාකච්ඡාවලදී ඒ රාමුවෙන් පිට යාමට සිදු වන ප්‍රශ්නයක් ඇති වුණොත් අපි දැනුම් දෙන්නම්. වෙනස් කරන්න පුළුවන්, රාමුව ඇතුළේ. මෙතැන තිබෙන ප්‍රධාන දේ, ජනතාව මත වැඩිපුර බර දානවා ද, නැත්නම් අපි අය කරන සෘජු බදු වැඩි කරනවා ද කියන කාරණයයි. ඒ කියන්නේ, වක්‍ර බදු පනවනවා ද, සෘජු බදු අය කරනවා ද කියන කාරණය. අනෙක, ආණ්ඩුවේ වියදම් පාලනය කිරීම. ඒ කාරණා තුන තමයි අපට තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි, ගරු ජනාධිපතිතුමනි.

මීළඟට, ගරු ඩග්ලස් දේවානන්දා අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[පි.ව. 12.19]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා (ධීවර අමාත්‍යතුමා)**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா - கடற்றொழில் அமைச்சர்)
(The Hon. Douglas Devananda - Minister of Fisheries)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எனக்கு முன்னர் இங்கு உரையாற்றிய மாண்புமிகு சனாதிபதி அவர்கள் நாட்டு மக்கள் எதிர்கொள்கின்ற பிரச்சினைகளைத் தீர்ப்பதற்கான யோசனைகளை முன்மொழிந்திருந்தார். விசேஷமாக, இந்த நாட்டில் வாழும் தமிழ் மக்கள், தமிழ் பேசும் மக்கள் எதிர்கொள்கின்ற பிரச்சினைகளுக்கான தீர்வுத் திட்டங்களை முன்மொழிந்திருந்தார். அவர் அப்பிரச்சினைகளைத் தீர்ப்பார் என்ற நம்பிக்கை எனக்கிருக்கிறது என்பதை நான் இங்கே வெளிப்படுத்துகிறேன்.

இன்றைய தினம் இச்சபையில் 1996ஆம் ஆண்டின் 2ஆம் இலக்க கடற்றொழில் மற்றும் நீர்வாழ் உயிரினங்கள் சட்டத்தின்கீழான மூன்று ஒழுங்குவிதிகள் சமர்ப்பிக்கப் பட்டிருக்கிறது. அவை தொடர்பில் இந்த கௌரவ சபையில் எனது கருத்துக்களையும் பதிவுசெய்வதற்கு வாய்ப்பு வழங்கியமைக்கு முதலில் உங்களுக்கு எனது நன்றியைத் தெரிவித்துக்கொள்கிறேன்.

கடந்த காலங்களில் வெறுமனே பாதகங்களை மட்டும் உலகளவில் கொண்டுவந்திருந்த, இன்னும் முடிவுறாது தொடர்கின்ற அனர்த்தங்கள் எமது நாட்டையும் விட்டுவைக்காத நிலையில், இந்த நாடு அசந்து போய்விடுமென நம்பி, அதற்கான தயாரிப்புகளில் ஈடுபட்டு, "வெந்த புண்ணில் வேல் பாய்ச்சுவதுபோல" செயற்படுகின்ற சுயலாப அரசியல்வாதிகள் மற்றும் அரசியல் பின்னணிகொண்ட சுயநலவாதிகள் மேற்கொண்டிருந்த மிகைவாத செயற்பாடுகள் காரணமாக எமது மக்கள் "இந்த நாட்டுக்கு இனிமேல் எதிர்காலமே கிடையாது" என்ற வகையில் கொண்டிருந்த நம்பிக்கையை உடைத்தெறிந்து, "விழ விழ எங்களாலும் புதுத்தெம்புடன் எழுந்திருக்க முடியும்" என்ற நம்பிக்கையை இந்த அரசு எமது மக்களுக்கு ஏற்படுத்தியிருக்கிறது. அதற்காக எமது சனாதிபதி மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ அவர்களுக்கும் பிரதமர் கௌரவ தினேஷ் குணவர்தன அவர்களுக்கும் எமது மக்கள் சார்பாக எனது நன்றியைத் தெரிவித்துக்கொள்கிறேன்.

நாங்கள் அரசியலுக்காக எல்லாவற்றையும் எதிர்த்துக் கொண்டிருப்பவர்கள் அல்லர். அதேநேரம், வெறும் அரசியலுக்காக இந்த அரசாங்கத்தில் அங்கம் வகிக்கவுமில்லை. ஓர் இக்கட்டான நிலையில் இந்த நாட்டையும் காப்பாற்றி, எமது மக்களையும் காப்பாற்ற வேண்டும் என்ற நோக்கில், அதற்கு முகங்கொடுக்க முடிந்த செயற்பாட்டுத் தைரியத்துடன்தான் நாங்கள் இந்த அரசாங்கத்தில் பங்கெடுத்தோம் என்பதை நான் இந்தச் சந்தர்ப்பத்தில் வலியுறுத்திக் கூற விரும்புகிறேன். எமது மக்கள் தங்களது வாக்குகளை எமக்கு வழங்கி, தங்களது பிரச்சினைகளைத் தீர்க்குமாறு வழங்கிய ஆணையானது, எங்களை நிர்ப்பந்தித்திருக்கிறது. ஆகையால், எங்களால் எமது மக்களுக்குக் கிடைக்கின்ற அரிய சந்தர்ப்பங்களைக் கைநழுவவிட முடியாது. அதன் காரணமாகவே அரசாங்கங்களுடன் இணைகின்றபோது, நாங்கள் விதிக்கின்ற நிபந்தனைகள் பொது நிபந்தனைகளாக இருக்கின்றன. எமது மக்களின் பிரச்சினைகளைத் தீர்க்க வேண்டும் என்பதற்காகவே நாங்கள் அவ்வாறு செய்கிறோம். அதற்காக, அரசாங்கங்கள் எமது மக்களின் பிரச்சினைகளை எல்லாம் உடனடியாகத் தீர்த்துவிடும் என்ற எதிர்பார்ப்பை மட்டும் முன்வைத்து நாங்கள் செயற்படுகின்றவர்கள் அல்லர்.

எமது நடைமுறைச் சாத்தியமான அணுகுமுறைகள், தேசிய நல்லிணக்கச் செயற்பாடுகள் காரணமாக எமது மக்களின் பிரச்சினைகளை முடிந்தளவு தீர்த்துக்கொள்வதற்கு நாங்கள் அரசாங்கத்திற்கு தடையற்ற பாதைகளைத் திறந்து விடுகிறோம். அரசாங்கம் அதில் பயணிப்பதில் தாமதங்களையோ, சிரமங்களையோ எதிர்கொள்வதில்லை என்பது எமது மக்களுக்குச் சாதகமான நிலைப்பாடாகும். இதற்கு மாறான நிலைப்பாட்டைக் கொள்கையாக வகுத்துக் கொண்டவர்கள் எமது சக தமிழ் அரசியல்வாதிகளாகச் செயற்பட்டு வருகின்றனர். அவர்கள் எமது மக்களின் பிரச்சினைகளைத் தீர்க்காமல், அவற்றைத் தங்களது அரசியல் தேவைகளுக்காக மட்டும் அவ்வப்போது கையிலெடுத்து, பின்னர் தொடர்ந்தும் எமது மக்களின் பிரச்சினைகளைத் தீராப் பிரச்சினைகளாக்கி, அப்பிரச்சினைகளை எமது மக்களின் வீடுகளிலேயே குடியமர்த்தி வைத்து வருவதை வழக்கமாகக் கொண்டவர்கள். அதன்மூலம் எமது மக்களது வாக்குகளைச் சூறையாடி வருவதை "முதலீடு இல்லாத பண்டமாற்று அரசியல்" என கொள்கை வகுத்துக்கொண்டவர்கள். இதனை இப்போது எமது மக்கள், "வீட்டைக் காட்டி மோசம் செய்கின்ற செயல்" எனப் பகிரங்கமாகவே கூறி வருகின்றனர். இத்தகைய கொள்கையின் வரைவிலக்கணமாகவே இவர்கள் இன்னமும் புலி வாலைப் பிடித்துக்கொண்டிருக்கின்றனர். எமது மக்களின் மனங்களில் வருகின்ற மாற்றங்களின் முன்பாக, புலிவாலை விடவும் முடியாமல், தொடர்ந்து பிடித்திருக்கவும் முடியாமல் திணறுகின்ற இவர்கள், புலிவாலுக்குப் பதிலாகப் பூனை வாலைப் பிடித்திருக்கலாமோ என்று நினைக்கவும் கூடும்.

எமது நாட்டின் தற்போதைய நிலைமையில், எமது மக்களின் வாழ்வாதாரம் மற்றும் அன்றாடத் தேவைகளைத் தீர்க்கக்கூடிய வகையில், நாங்கள் உற்பத்தித்துறைகள் சார்ந்த முன்னெடுப்புக்களைப் பேணிப் பாதுகாத்து வளர்த்து வருகின்ற நிலையில், இவர்கள் எமது மக்களது பிரச்சினைகளைத் தீர்க்காமல், தீர்க்கவிடாமல் பேணிப் பாதுகாத்து வருகின்றனர். அத்துடன் நிற்காமல், எமது மக்களின் பிரச்சினைகளைத் தீர்க்கின்ற எமது வழிமுறைகளை இடைமறித்து, அவற்றையும் சீர்குலைத்து, எமது மக்களை நடுத்தெருவில் விடுகின்ற இவர்களது நோக்கங்களைப் பூர்த்திசெய்துகொள்வதற்கும் செயற்பட்டு வருகின்றனர். இவற்றுக்கெல்லாம் நாங்கள் அஞ்சியிருந்தால், இன்று எமது மக்கள் அனுபவிக்கின்ற எவ்விதமான வாய்ப்புக்களும் எமது மக்களுக்கு இதுவரையில் கிடைத்திருக்காது என்பதையும் எமது மக்கள் அறிவார்கள். நாங்கள் மக்களது பிரச்சினைகளைத் தீர்ப்பதற்கென்றே அரசியலில் காலடியெடுத்து வைத்தவர்கள். அதனையே நான் எனக்குக் கிடைத்திருக்கின்ற அமைச்சின்மூலமும் செய்து வருகிறேன்.

எமது நாட்டில் வளங்கள் இல்லாமல் இல்லை. சரியான முகாமைத்துவக் கட்டமைப்புகள், செயற்பாடுகள் இல்லாமை காரணமாக, எமது வளங்கள் அழிக்கப்பட்டு வருகின்றன. பல வளங்களினூடாக உரிய பயன்பாடுகள் பெறப்படாமல் இருக்கின்றன. கடந்த 05ஆம் திகதி நான் முல்லைத்தீவில் அமைந்துள்ள கொக்கிளாய் கடற்றொழில் கிராமத்திற்குச் சென்றிருந்தேன். அங்கே கனிய மணல் அகழ்வு காரணமாக கடற்கரையானது, குறிப்பிடத்தக்களவு தூரம் கடலால் உள்வாங்கப்பட்டு, அந்தக் கிராமமே கூடிய விரைவில் கடலுக்குள் சென்றுவிடக்கூடிய அபாயம் ஏற்பட்டிருக்கிறது. மறுபக்கத்தில், மேற்படி மணல் அகழ்வு காரணமாக அக்கடற்றொழிலாளர்களால் மேற்கொள்ளப்பட்டுவந்த கரைவலைத் தொழிலை மேற்கொள்ளமுடியாமல், அவர்கள் தடைசெய்யப்பட்ட கடற்றொழில் முறைமைகளில் ஈடுபட நேரிட்டுள்ளதாகவும் அறியக்கிடைத்தது. இவ்விடயம் தொடர்பில் நான் விரைவில் அமைச்சரவைப் பத்திரமொன்றைச் சமர்ப்பிக்க உள்ளேன் என்பதை இங்கே தெரிவிக்க விரும்புகிறேன்.

இங்கு மாத்திரமல்ல, பல்வேறு செயற்பாடுகள் காரணமாக கடலரிப்பானது, தென், மேல், வடமேல், கிழக்கு மாகாணங்களின் பல இடங்களில் ஏற்பட்டு வருவதை என்னால் நேரடியாகவே அவதானிக்கக்கூடியதாக இருக்கிறது. இதன் மறுபக்கத்தில், சட்டவிரோத மற்றும் தடைசெய்யப்பட்ட கடற்றொழில் முறைமைகளும் மேற்கொள்ளப்படுவதாக அறியக்கிடைக்கிறது. இத்தகைய விடயங்கள் தொடர்பில் உரிய நடவடிக்கைகளை நாம் முன்னெடுத்து வருகிறோம். அந்த வகையில், எமது நாட்டின் கடற்றொழிலை முகாமைத்துவம் செய்வதற்கென நாம் பல்வேறு திட்டங்களை வகுத்துச் செயற்படுத்தி வருகிறோம். அதன் ஒரு கட்டமாகவே இன்று நான் இங்கு மூன்று ஒழுங்குவிதிகளை முன்வைத்திருக்கிறேன்.

அதில் ஒன்று, 2022.04.25ஆம் திகதிய 2277/04ஆம் இலக்க அதிவிசேட வர்த்தமானியில் பிரசுரிக்கப்பட்ட, 2022ஆம் ஆண்டின் நீல நிற நீந்தும் நண்டுகள் கடற்றொழில் முகாமை ஒழுங்குவிதியாகும். எமது நாட்டுக்கு அந்நியச் செலாவணியை ஈட்டித்தருவதில் பெரும் பங்கை வகிக்கின்ற கடல் வளங்களில்

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා ]

நீல நிற, நீந்தத்தக்க நண்டு வகையினமும் ஒன்றாகும். அந்தக் கடல் வளத்தை அழியவிடாமல் பாதுகாத்து, அதன் உற்பத்தியில் உச்ச பயனை அடையவேண்டும் என்பதற்காக நாம் இந்த முகாமைத்துவ ஏற்பாட்டை அத்துறை சார்ந்த கடற்றொழிலாளர்களுடனும் கலந்துரையாடி மேற்கொண்டுள்ளோம். அதனடிப்படையில், மேற்படி நண்டு உற்பத்தித் துறையில் ஈடுபடுவதற்கென அனுமதிப் பத்திரம் வழங்கல் முறை, ஏனைய நீர் வாழ் உயிரினங்களுக்குப் பாதிப்பு ஏற்படாத வகையில், அதனைப் பிடிப்பதற்குப் பயன்படுத்தவேண்டிய வலையின் விபரம், வலையின் கண் அளவு விபரம், தொழிலில் ஈடுபடக்கூடிய படகுகளின் விபரம், பிடிக்கப்படக்கூடிய நண்டுகளின் எடை, பிடிக்கக்கூடிய கால எல்லை, மேற்படி கடல் வளம் தொடர்பில் ஆய்வுகள் மேற்கொள்ளப்படுகின்ற காலகட்டங்கள் என அனைத்து ஒழுங்குவிதிகளும் இதில் உள்ளடக்கப்பட்டுள்ளன.

அடுத்தது, 2021ஆம் ஆண்டின் கடற்றொழில் (கட்டணங்களை விதித்தல்) ஒழுங்குவிதியாகும். இது 2021.11.24ஆம் திகதிய 2255/22ஆம் இலக்க அதிவிசேட வர்த்தமானப் பத்திரிகையில் பிரசுரிக்கப்பட்டதாகும்.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
கௌரவ அமைச்சர் அவர்களே, உங்களுக்கு இனிய பிறந்தநாள் வாழ்த்துக்கள்! நீங்கள் நீடூழி வாழ வேண்டும் என்று வாழ்த்துகிறேன். வட மாகாணம் உட்பட ஒட்டுமொத்த இலங்கைக்கும் உங்களுடைய சேவை அத்தியாவசியமாக இருக்கிறது.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
நன்றி!

1996ஆம் ஆண்டின் 2ஆம் இலக்க கடற்றொழில் மற்றும் நீரியல் வளங்கள் கட்டளைச் சட்டத்தின்மூலமாக விதிக்கப்பட்டிருந்த ஒழுங்குவிதிகளின்கீழ் பணிக்கப்பட்டிருந்த கடற்றொழில் அனுமதிப் பத்திரங்களுக்கான கட்டணம், 2011.03.23ஆம் திகதி வெளியிடப்பட்ட 1698/13ஆம் இலக்க அதிவிசேட வர்த்தமானிமூலம் கடற்றொழிலாளர்களுக்கு நிவாரணம் வழங்கும் வகையில் அகற்றப்பட்டது. 2011ஆம் ஆண்டின் பின்னர், ஆழ்கடல் தொடர்பில் விடுக்கப்பட்ட ஒழுங்குவிதிகளுக்கு அமைவாக மாத்திரமே மேற்படி அனுமதிப் பத்திரங்களுக்கான கட்டணங்கள் அறவிடப்பட்டு வந்தன. தற்போதைய நிலையில், எமது நாட்டில் கடற்றொழிலில் ஈடுபடுகின்ற படகுகளின் எண்ணிக்கையானது படிப்படியாக அதிகரித்துள்ளது. அந்த அதிகரிப்புக்குச் சமாந்தரமாக கடல் வளங்களின் அதிகரிப்பு காணப்படுவதில்லை. ஆகையால், கடல் வளங்களின் அதிகரிப்பு தொடர்பில் எமது அமைச்சு கூடிய அவதானமெடுத்து, அதற்காக விஞ்ஞானப்பூர்வ ஆய்வுகளை மேற்கொண்டு, நடவடிக்கைகளை எடுத்து வருகின்றது.

குறிப்பாக, கடல் வளங்களுக்குப் பாதிப்பை ஏற்படுத்துகின்ற கடற்றொழில் முறைமைகளைத் தடைசெய்தல், அதனைச் சட்ட ரீதியான நடவடிக்கைகள்மூலம் உறுதிசெய்தல், அனுமதிப் பத்திரங்களை வரையறைசெய்தல், செயற்கைப் பவளப் பாறைகளை உருவாக்குதல் போன்ற பல்வேறு நடவடிக்கைகளை மேற்கொண்டு வருகிறது. தடைசெய்யப் பட்ட முறைமைகளினூடாக கடற்றொழிலில் ஈடுபடுவதைத் தடுப்பதற்கான பொறிமுறைகளை அந்தந்தப் பகுதிகளில் இயங்குகின்ற கடற்றொழிலாளர் சங்கங்கள், கடற்படையினர், கடலோரப் பாதுகாப்புத் துறையினர், எமது கடற்றொழில் மற்றும் நீரியல் வளங்கள் திணைக்கள அதிகாரிகளுடன் இணைந்து நாம் மேற்கொண்டு வருகிறோம். அதேநேரம், "பழையன கழிதலும், புதியன புகுதலும்" என்ற நிலைப்பாட்டில், விஞ்ஞானபூர்வமான புதிய தொழில்நுட்பங்களினூடாக மாற்று வழிமுறைகளை நாம் இனங்கண்டு, அவற்றையும் அறிமுகப்படுத்தி வருகிறோம். அதுதவிர, மீனினம் மற்றும் நீர்வாழ் உயிரின வளர்ப்பு முறைகளிலும் அதிக ஈடுபாடு கொண்டுள்ளோம்.

இதனிடையே கடற்றொழிலுக்கான அனுமதிப் பத்திரங்களை வழங்குதல், கடற்றொழில் முகாமைத்தும், கண்காணிப்பு போன்ற பல்வேறு செயற்பாடுகளுக்குப் பாரியளவில் செலவிட நேரிட்டுள்ளது. ஆகையால், சிறு கடற்றொழிலாளர்கள் தவிர்ந்த, ஏனைய பாரிய பரிமாண கடற்றொழில் சார்ந்தும், அது சார்ந்த ஏனைய பாரியளவு தொழிற்றுறைகள் சார்ந்தும் உள்ளவர்களுடன் கலந்துரையாடி, அவர்களுக்குப் பாதிப்பு ஏற்படாத வகையில், மேற்படி கட்டணங்களைக் குறிப்பிட்டளவு அதிகரிப்பதற்கான நடவடிக்கைகளை நாம் மேற்கொண்டுள்ளோம். குறிப்பாக, கடற்றொழில் அனுமதிப் பத்திரங்களுக்கான கட்டணங்கள், கடலுணவு ஏற்றுமதி அனுமதிப் பத்திரங்களுக்கான கட்டணங்கள், ஏற்றுமதிக்கான அடிப்படை வசதிகளை மேற்கொள்வதற்கான கட்டணங்கள், அவற்றுக்கான நிறுவனங்களைப் பதிவுசெய்வதற்கான கட்டணங்கள், படகு கட்டும் தளங்களைப் பதிவுசெய்வதற்கான கட்டணங்கள், பாரிய படகுகளுக்கான புதிய எண்களைப் பெற்றுக்கொள்வதற்கான கட்டணங்கள் என்பன இதில் உள்ளடக்கப்பட்டுள்ளன. இத்தகைய கட்டண அறவீடுகள் மூலம் ஈட்டப்படுகின்ற நிதியைக்கொண்டு, கடற்றொழில் மற்றும் நீரியல் வளங்கள் திணைக்களத்தின்மூலமாக எமது கடற்றொழிலாளர்களின் நன்மை கருதிய செயற்பாடுகளுக்கும் அனர்த்த நிலைமைகளின்போதான நிவாரண மற்றும் இழப்பீடுகளுக்குமான கொடுப்பனவுகளுக்குமென ஒரு பொறிமுறையை நாம் உருவாக்கவுள்ளோம் என்பதையும் இங்கு தெரிவித்துக்கொள்ள விரும்புகிறேன்.

அடுத்தது, 07.02.2022ஆம் திகதி பிரசுரிக்கப்பட்ட 2266/06ஆம் இலக்க, 1984ஆம் ஆண்டு திருத்தப்பட்ட கரைவலை ஒழுங்குவிதி ஆகும். இது அம்பாந்தோட்டை மாவட்டத்தின் தங்காலை கடற்றொழில் திட்ட அதிகாரிப் பிரிவின்கீழுள்ள களமெட்டிய கடற்றொழில் பரிசோதகர் பிரிவில் அமைந்துள்ள களமெட்டிய கடற்றொழில் துறைமுகத்தின் கிவுல களமெட்டிய கரைவலை பாடுவை அகற்றுவதற்காகக் கொண்டுவரப்பட்டதாகும். இந்தப் பகுதியின் கடற்றொழில் அபிவிருத்தி கருதி, 2013ஆம் ஆண்டு

வரவு செலவுத்திட்டத்தின்மூலம் நிதி ஒதுக்கப்பட்டு, 2014ஆம் ஆண்டு அது தொடர்பான பணிகள் ஆரம்பிக்கப்பட்டு, 2022.06.09ஆம் திகதி இக்கடற்றொழில் துறைமுகம் திறந்து வைக்கப்பட்டது. இதன் காரணமாக கரைவலை தொழில்வாய்ப்பை இழந்த 28 கரைவலை உரிமையாளர்களுக்கும் அத்தொழிலில் ஈடுபட்டிருந்த தொழிலாளர்களுக்கும் பகிரும் வகையில், தலா 50 இலட்சம் ரூபாய் வீதம் இழப்பீட்டை நாம் வழங்கியிருக்கிறோம். மேற்படி கடற்றொழில் துறைமுகத்திற்கு இடையூறு ஏற்படாத வண்ணமே இந்த ஒழுங்குவிதி கொண்டுவரப்பட்டுள்ளன.

கடற்றொழில் துறையில் பாரிய பாதிப்பை உண்டுபண்ணிய எரிபொருள் பிரச்சினையைத் தீர்க்கும் வகையில், தற்பொழுது குறிப்பிட்டளவு எரிபொருள் கிடைப்பதற்கான ஏற்பாடுகளை நாம் மேற்கொண்டுள்ளோம். மேலும், பரவலான எரிபொருள் விநியோகம் தொடர்பில் நாம் தொடர்ந்தும் அவதானம் செலுத்தி வருகிறோம். அதேவேளை, எரிபொருள் விலை ஒரு பிரச்சினையாக இருக்கிறது என்பதையும் மறுக்க இயலாது. எனினும், கடந்த காலங்களைவிட தற்போது அதிகளவான படகுகள் கடற்றொழிலில் ஈடுபடுகின்றன. அத்துடன், மீன்கள் அதிகளவில் அறுவடையாகின்ற காலமும் வந்துள்ளது. இவற்றின் காரணமாக மீனினங்களின் விலைகள் வீழ்ச்சியடைந்து, நுகர்வோருக்கு அதிக சுமையற்ற நிலை உருவாகியிருக்கிறது. அதேநேரம், கடற்றொழில் உற்பத்தியாளர்கள் தொடர்பிலும் நாம் அவதானம் செலுத்தவேண்டும். ஆகையால், எரிபொருள் விலையேற்றத்தை ஈடுசெய்யக்கூடிய வகையிலான மாற்று வழிமுறைகள் தொடர்பிலும் நாம் ஆராய்ந்து வருகின்றோம்.

எமது கடல் வள மற்றும் எமது கடற்றொழிலாளர்களின் கடற்றொழில் சார்ந்த சொத்துக்களுக்குப் பாரிய அழிவுகளை ஏற்படுத்தி வருகின்ற இந்திய இழுவைப் படகுகளின் ஆக்கிரமிப்புகள் தொடர்கின்றன. இதற்கு எதிராக நாம் சட்ட நடவடிக்கைகளை எடுத்து வருகிறோம். இந்திய பாரிய இழுவைப் படகுகளுக்கு எமது கடற்றொழிலாளர்களின் சிறிய படகுகளால் முகங்கொடுக்க இயலாது. அதன் காரணமாக எமது கடற்றொழிலாளர்கள் கடற்றொழிலை மேற்கொள்ள இயலாத சூழ்நிலையும் காணப்படுகிறது. எனவே, சட்ட ரீதியில் கைதுசெய்யப்பட்டு, நீதிமன்றம்மூலம் அரசுடைமையாக்கப் படுகின்ற இந்திய இழுவைப் படகுகளின் தொழில் முறைமைகளை மாற்றி, தேர்ந்தெடுக்கப்படுகின்ற எமது கடற்றொழிலாளர்களுக்கு அவற்றை வழங்குவதன்மூலம் அவர்களால் இந்திய இழுவைப் படகுகளை எதிர்கொண்டு, தொழிலில் ஈடுபட இயலுமென நான் நம்புகிறேன்.

மேலும், கரைவலைத் தொழிலில் ஆளணிப் பற்றாக்குறை காணப்படுவதால், அதனை இழுப்பதற்கு 'டிரக்டர்' இயந்திரங்கள் பயன்படுத்தப்பட்டு வருவதாகவும் அறியக்கிடைக்கிறது. அதன் காரணமாக கடல் வளமும் கடற்கரையும் பாதிக்கப்படுகின்றன. ஆகையால், இம்முறை தொடர்பில் ஆராய்ந்து வருகிறோம். இத்தொழிலில் ஈடுபடுகின்ற மக்களது வாழ்வாதாரங்கள் குறித்தும் நாம் கவனம்செலுத்த வேண்டும். வளங்களுக்குப் பாதிப்பு ஏற்படாத வகையில், கரையில் வெகுதொலைவில் நிறுத்தி வைக்கப்படுகின்ற winchமூலம் இதனை மேற்கொள்ளக்கூடிய சாத்தியங்கள் குறித்தும் நாம் சிந்தித்து வருகிறோம் என்பதையும் இங்கு தெரிவித்துக் கொள்கிறேன்.

மேற்படி ஒழுங்குவிதிகள் சார்ந்த மற்றும் ஏனைய கடற்றொழில் சார்ந்த பிரச்சினைகள் தொடர்பில் இங்கு பல்வேறு கருத்துக்கள் முன்வைக்கப்படலாம். அவ்வாறு முன்வைக்கப்பட்டால், அவற்றுக்கான பதில்களை வரவு செலவுத்திட்ட விவாதங்களின்போது தெளிவாக முன்வைப் பதற்கு எதிர்பார்த்துள்ளேன் என்பதையும் தெரிவித்து, கடற்றொழில் அபிவிருத்தி தொடர்பிலான அனைவரது கருத்துக்களையும் ஆலோசனைகளையும் செவிமடுத்தவனாக, ஆரோக்கியமான கருத்துக்களையும் ஆலோசனைகளையும் செயற்படுத்த முனைபவனாக, எமது இந்தச் செயற்பாடுகளில் அதிக அக்கறைகொண்டு பங்களிப்பாற்றி வருகின்ற கௌரவ கடற்றொழில் இராஜாங்க அமைச்சர் பியல் நிஷாந்த த சில்வா அவர்களுக்கும் எமது அமைச்சின் செயலாளர் திருமதி இந்து ரத்நாயக்க உட்பட மேலதிகச் செயலாளர்கள், ஏனைய அதிகாரிகளுக்கும் கடற்றொழில் மற்றும் நீரியல் வளங்கள் திணைக்களப் பணிப்பாளர் நாயகம் திரு. சுசந்த கஹவத்த உள்ளிட்ட அதிகாரிகளுக்கும் ஏனைய திணைக்களத் தலைவர்கள் உள்ளிட்ட அதிகாரிகளுக்கும் எனது நன்றியைத் தெரிவித்து, விடைபெறுகிறேன். வணக்கம்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රවුෆ් හකීම් මැතිතුමා.

[12.39 p.m.]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Hon. Deputy Speaker, the Hon. Minister of Justice, Prison Affairs and Constitutional Reforms has proposed many Amendments to the existing legislation to introduce important reforms in a variety of areas and he explained the details of what he proposes to do.

Before I move on to some of the substantive matters, I would like to digress initially to point out about a controversial issue that has arisen in the Sri Lanka Law College with regard to the conduct of its examinations. That subject comes under the Hon. Minister and we have also briefly discussed in the House a few days ago about the new rule that had been promulgated by the Council of Legal Education, asking the Tamil and the Sinhala medium students, who follow lectures conducted at the Sri Lanka Law College in English, to sit for examinations and answer question papers too in English. This has created a serious problem for students who are from the vernacular language streams.

Sir, both Minister (Dr.) Wijeyadasa Rajapakshe, President's Counsel, as well as Former Minister M. U. M. Ali Sabry, President's Counsel, are vernacular-educated, prominent lawyers who have been given silk. I have also been a former Minister of Justice. Out of my own experience, I can tell you that even when I entered the Sri Lanka Law College, I opted to sit for some papers in the Tamil language, my mother tongue, though I followed lectures in English because I was more confident in my mother tongue to sit for examinations. So, that opportunity should not be denied to the students who wish to sit for papers in their mother tongue. On the pretext of this elitist approach to impose English literacy on the legal fraternity from their Law College days is a very futile exercise because we must understand that people will have to, over a period of time, develop their ability in English.

[ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා]

That is what all of us did. Therefore, I would once again plead with the Minister to reconsider that decision and would also urge the Council of Legal Education - I hope what we speak today will be conveyed to His Lordship the Chief Justice as well, as the Chairman of the Council of Legal Education - to consider that matter and give some kind of relief to the students who wish to sit for examination papers in their mother tongue since comprehending questions and answering papers in the mother tongue is easier for some of those students who come from rural areas. All of us are clear examples for that. My Colleague, the Hon. Dilan Perera - he is the son of an illustrious lawyer - too opted to sit for -

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
Even the present Principal of the Law College.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
There you are! So, several such examples are there. Therefore, once again, I plead that this matter be considered. Sir, I do not want to spend anymore time on that.

Then, I would like to refer to a news article that appeared in "The Morning" newspaper of Wednesday, 09th of November under the caption "SC rejects Muslim women's bid to apply as Quazis", which states, I quote:

> "The Supreme Court (SC) yesterday (8) refused to grant leave to proceed for two separate Fundamental Rights (FR) petitions filed by a number of Muslim women challenging the Gazette dated 7 October, 2022, which called for applications only from Muslim males to be considered for appointment as Quazis and as Members of the Board of Quazis."

What is most striking is this.

> ".. the petitioners had wanted the said Gazette Notification amended to lift the ban imposed on females to apply. The court did not provide any reason for the refusal."

Sir, that issue is a very contentious issue because the Supreme Court, on several occasions after having heard counselling support to grant leave, had refused leave without assigning any reason. For instance, when it came to the petitions on the Twentieth Amendment, a variety of counsels appeared for several days and after having heard all counsels, finally, the Supreme Court refused leave without assigning reasons. This is a very funny situation. I would like to urge that on such important matters, at least a brief reasoning be given by the Court to justify why leave is being refused, particularly when it comes to the original jurisdiction conferred on the Supreme Court. When I say original jurisdiction, that means, the jurisdiction on Fundamental Rights as well as on Constitutional matters, issues concerning the constitutionality of Bills before this House. Those are matters of original jurisdiction conferred on the Supreme Court. There, the litigants, the applicants or the petitioners do not have a right to appeal beyond that because the Supreme Court is the apex court.

Therefore, assigning reasons for the refusal to grant leave is something that should be normally done, not on all peremptory matters, but particularly on important matters, though it is within the powers of the Supreme Court to refuse leave. Having heard counsels for days on, they do not assign reasons.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Therefore, that is a very unsatisfactory situation and I would like to urge that that matter be reconsidered.

Also, when it comes to Muslim personal laws, we have asked the Hon. Minister of Justice to give us the so-called Shabry Haleemdeen Report, which is still not made public, so that we, Members of Parliament, can examine it and ensure that all those reforms necessary for Muslim personal laws are brought forthwith without much delay. Then, we can have a closure to the controversy that exists regarding certain reforms for Muslim personal laws in this country.

Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ජයන්ත වීරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.47]

**ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி ஜயந்த வீரசிங்க)
(The Hon. Jayantha Weerasinghe, PC)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කලින් කියලා තිබුණේ විනාඩි 14ක කාලයක් තිබෙනවා කියලා. දැන් ඒක විනාඩි 10කට සීමා වෙලා තිබෙනවා. කමක් නැහැ, මම පුළුවන් විධියට කථා කරන්නම්. නීතියට සම්බන්ධ මේ වාගේ විෂයයක් ගැන කථා කරනකොට ජනාධිපති නීතිඥවරයෙක් වන මන්ත්‍රීවරයෙකුට ටිකක් දීර්ඝ වෙලාවක් ලබා දීම ඉතාම සුදුසුයි කියා මම හිතනවා. මට විනාඩි 14ක් තිබෙනවා කියලා මුලින් කිව්වා. නමුත්, දැන් ඒක විනාඩි 10කට අඩු කරලා තිබෙනවා. කමක් නැහැ, මට ලබා දුන් කාලයට අනුව මම පුළුවන් විධියට කථා කරන්නම්.

අද අපි කථා කරන පනත් කෙටුම්පත් අතරින්, මත් ද්‍රව්‍යවලට අදාළව තිබෙන විෂවර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත දෙස අපි විශේෂ උනන්දුවකින් බලන්න ඕනෑ. රට, සමාජය, දූ දරුවන් විනාශ වෙන ආකාරයට අද සමාජය තුළ මේ මත් ද්‍රව්‍ය පුළුල් ලෙස පැතිරී තිබෙනවා. මේ සම්බන්ධයෙන් තිබෙන කනගාටුදායක තත්ත්වය තමයි, මේවා නිකම්ම පැතිරී නොයෑම. මේ මත් ද්‍රව්‍ය වැඩි ප්‍රමාණයක් පැතිරෙන්නේ පාසල් දරුවන් අතරේයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ කාරණය කිව්වේ පොලිස් නිලධාරියෙක්. මම දන්නේ නැහැ, ඒක කොච්චර දුරට ඇත්තක්ද

කියලා. එතුමා පොලීසියේ ඉහළ නිලධාරියෙක්. එතුමන්ලා මේ පිළිබඳව අධ්‍යයනය කර තිබෙනවා. එතුමා මට කිව්වා, අයිස් කියන මත් ද්‍රව්‍යය අවුරුදු 3ක්, 4ක් එක දිගට ගත්තොත් ඒ පුද්ගලයා මිය යනවා කියලා. පාසල් යන දරුවෙක් අයිස් මත් ද්‍රව්‍යය භාවිත කරන්න පටන් ගත්තොත්, ඒ දරුවාගේ ජීවිතයට මොකක්ද වෙන්නේ?

අලුත් පනත් කෙටුම්පත ගැන කථා කරන්න ඉස්සෙල්ලා, වර්තමාන අධිකරණ ඇමතිතුමාටත්, ඊට ඉස්සෙල්ලා හිටපු අලි සබ්රි ඇමතිතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා, මත් ද්‍රව්‍ය විනාශ කර දමන්න -නවතා දමන්න- හැකි වන විධියේ -උපකාර වන විධියේ- පනත් කෙටුම්පතක් ගෙනාවාට. මේ සම්බන්ධයෙන් තිබෙන පැරණි පනත මම අද රැගෙන ආවා. ඒත් එක්කම අලුත් පනත් කෙටුම්පතත් ගෙනාවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පැරණි පනත ගෙනැල්ලා තිබුණේ 1984දීයි. ඒ කියන්නේ, දැනට අවුරුදු 38 කට පමණ පෙර. එම නිසා කාලීන වශයෙන් බරපතළ අවශ්‍යතාවක් තිබුණා, අලුත් පනත් කෙටුම්පතක් ගෙනැල්ලා පැරණි පනතේ තිබෙන නීතිමය තත්ත්වය මදි කියලා හිතෙන තැන්වලට තදින් නීති සම්පාදනය කරන්න. මම හිතනවා, නව පනත් කෙටුම්පතෙන් ඒ කටයුත්ත ගොඩක් දුරට සිද්ධ වෙලා තිබෙනවා කියලා. හැබැයි, මෙහි යම්කිසි ස්ථාන තිබෙනවා, අපි එකඟ නොවෙච්ච. ඒ කියන්නේ, මේක ගැන සාකච්ඡා කරනකොට -මමත් හිටියා, ඔය කමිටුවල- අපි එකඟ නොවෙච්ච කරුණු කිහිපයකුත් මේ පනත් කෙටුම්පතට ඇතුළත් කර තිබෙනවා. ඒකට කමක් නැහැ. මෙහි ඉතාම හොඳ දේවල් ටික මම පෙන්වන්නම්.

මේ පනත් කෙටුම්පත ගැන සාකච්ඡා කරනකොට, බොහෝ දුරට කථා වුණේ වර්තමානයේ රටට පිළිලයක් වෙලා තිබෙන, ශාපයක් වෙලා තිබෙන අයිස් කියන මත් ද්‍රව්‍යය පැරණි පනතට ඇතුළු වෙලා තිබුණේ නැහැ කියන කාරණයයි. අලුත් පනත් කෙටුම්පතට අද ඒක බොහෝම ලස්සනට ඇතුළු කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පැරණි පනතේ තහනම් මත් ද්‍රව්‍ය වර්ග 62ක් පිළිබඳව සඳහන් වෙනවා. නමුත්, මේ අලුත් පනත් කෙටුම්පතේ තහනම් මත් ද්‍රව්‍ය වර්ග 161ක් ඇතුළත් කර තිබෙනවා. එම නිසා මේ මත් ද්‍රව්‍ය අපේ රටට එවන රටවලට මේ පනතෙන් නම් ලේසියෙන් බේරෙන්න පුළුවන් වෙයි කියලා මම හිතන්නේ නැහැ. ඒකේ මත් ද්‍රව්‍ය වර්ග 161ක් තහනම් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉස්සෙල්ලාම මා එක කාරණයක් කියන්න ඕනෑ. මේ අලුත් පනත් කෙටුම්පතේ සඳහන් කර තිබෙන්නේ, අසවල් ඖෂධය කියලායි. මෙහි "drugs" කියන වචනය 'ඖෂධ' වශයෙන් සඳහන් කර තිබෙනවා. මෙහි සඳහන් කරන්න ඕනෑ, ඖෂධය කියලා නොවෙයි, අසවල් මත් ද්‍රව්‍ය කියලායි. මොකක්ද, මේකේ තිබෙන ඖෂධය? මේවා ඖෂධ නොවෙයි. එම නිසා මා ඉතාම කරුණාවෙන් ඉල්ලා සිටිනවා, මේ පනත් කෙටුම්පතේ සඳහන් කර තිබෙන ඒ වචන ටික මත් ද්‍රව්‍ය කියලා වෙනස් කරන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මත් ද්‍රව්‍ය සම්බන්ධයෙන් අවස්ථා දෙකකදී හෝ අවස්ථා තුනකදී තමයි මේ කටයුතු කෙරෙන්නේ. එක අවස්ථාවක් තමයි, මේ රටට ගෙනෙනකොට; import කරනකොට. ඊළඟට, නිෂ්පාදනය කරන අවස්ථාව. අනික් එක, බෙදා හරින අවස්ථාව සහ ඒවාට ආධාර සහ අනුබල දෙන අවස්ථාව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කියන්න සතුටුයි, කෙනෙකුට ලේසියෙන් බේරෙන්න බැරි වෙන්න, මේ අලුත් පනත් කෙටුම්පතේ නිෂ්පාදනය කිරීම කියන වචනවලට වඩා පුළුල් අර්ථයක් දීලා තිබෙනවා. ඒ තමයි, මේ පනත් කෙටුම්පතේ දෙවන පිටුවේ 11 සිට 13 දක්වා පේළිවල නිෂ්පාදනය කිරීම යන්න, "...එක් ඖෂධයක් තවත් ඖෂධයක් ලැබෙන පරිදි පිරිසිදු කිරීම හෝ පරිවර්තනය කිරීම..." වශයෙන් සඳහන් කර තිබෙනවා. මා හිතන්නේ නැහැ, මුල් පනතේ මේ කාරණය තිබුණාය කියලා. මේ වචන වෙනස් කරන්න ඕනෑ. මේවා ඖෂධ නොවෙයි. මෙය, "එක් මත් ද්‍රව්‍යයක් තවත් මත් ද්‍රව්‍යයක් බවට පරිවර්තනය කිරීම" වශයෙන් සඳහන් කරන්න ඕනෑ. කරුණාකරලා මේ වැරැද්ද Committee Stage එකේදී නිවැරදි කරන්න. අපි බොහෝ අවස්ථාවල දැකලා තිබෙනවා, එක මත් ද්‍රව්‍ය වර්ගයකින් තවත් මත් ද්‍රව්‍යයක් හදන්න පුළුවන් කියලා. අන්න ඒ කාරණය තමයි මේ අවස්ථාවේදී මේ පනත් කෙටුම්පතින් මුලිනුපුටා දමා තිබෙන්නේ.

ඊළඟට, සාමාන්‍යයෙන් ජාවාරම් කිරීම සම්බන්ධයෙන් මුල් පනතින් දී තිබෙන දඬුවම ම මේකෙත් දීලා තිබෙනවා. ඒක ඉස්සර ඉඳලාම එහෙමයි. හැබැයි, මේ අලුත් පනත් කෙටුම්පතේ "ජාවාරම් කිරීම" යන්නට වඩා පුළුල් අර්ථයක් තිබෙනවා. ඒ තමයි, "යම් දෙයක් සිදුකිරීම සඳහා ඉදිරිපත් වීම" යන්නත් ඇතුළත් කර තිබීම. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කල්පනා කරලා බලනකොට මේ ජාවාරම් කිරීම ඉතාම භයානක විධියට කෙරීගෙන යන බව පෙනෙනවා. ඒ ජාවාරම් කිරීම කළත්, නැතත්, ඒ සඳහා ඉදිරිපත් වුණත් දඬුවම් විඳින තත්ත්වයක් මේ පනත් කෙටුම්පතට ඇතුළත් කරලා තිබෙනවා. ඒක හොඳ ලක්ෂණයක්. ඒක අගය කළ යුතුයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி ஜயந்த வீரசிங்க)
(The Hon. Jayantha Weerasinghe, PC)
අයියෝ! එච්චරද? කමක් නැහැ.

රැස් වුණු කමිටුවලදී අපි නිතර නිතර කියපු දෙයක් තමයි, මේ මත් ද්‍රව්‍ය පිළිබඳ නඩු අවසන් වුණාම හෝ ඊට පෙර මේ මත් ද්‍රව්‍ය පිට කරලා විකුණනවාය කියන කාරණය. ඒක ඇත්තක්. ඒවාට සමහර පොලිස් නිලධාරිනුත් අහුවෙලා තිබෙනවා; රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරිනුත් අහුවෙලා තිබෙනවා. එසේ කරන්න බැරි වෙන්න මේ පනත් කෙටුම්පතේ ඉතාම කාලෝචිත නීති වගන්ති ඇතුළත් කරලා තිබෙනවා. නඩුව පටන් ගැනීමට පෙර, අවශ්‍ය කරන විධියට ඒවායේ samples අරගෙන, පින්තූර අරගෙන, ඒවා අධිකරණවලට යවලා, ඊට පස්සේ මේ මත් ද්‍රව්‍ය විනාශ කරලා දමන්න ඕනෑ. ඒක බොහොම හොඳයි. එතකොට ඒවා නැවත සමාජයට යන්නේ නැහැ.

ඊළඟට, කමිටු රැස්වීම්වලදී අපි කියපු තවත් දෙයක් තමයි, මේ වැරැදිකරුවන් පුනරුත්ථාපනයට යොමු කළාම වහාම පුනරුත්ථාපනයෙන් ඉවත් වෙලා ඇවිල්ලා නැවතත් ඒ බිස්නස් එක කරනවාය කියන කාරණය. දැන් ඒකත් කරන්න බැරි වෙන්න අලුත් නීති හදලා තිබෙනවා.

ඊළඟට මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පතේ 7වන පිටුවේ පේළි 15ත් 25ත් අතර කොටසට. කෙනෙක් පුනරුත්ථාපනයට දැම්මාට පසුව පැනලා ආවොත් ඔහුට වෙන දේ මෙහි තිබෙනවා. පනතේ 87වන වගන්තියේ කියනවා අවුරුදු දහ අටට පහළ දරුවෙකුට මරණ දඬුවම දෙන්නෙත් නැහැ, ජීවිතාන්තය දක්වා සිර දඬුවම් දෙන්නෙත් නැහැ කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන් වෙනවා, කථාවේ ඉතිරි ටික සභාගත කළා නම් හොඳයි.

**ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி ஜயந்த வீரசிங்க)
(The Hon. Jayantha Weerasinghe, PC)
මට තව මොහොතක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම කෙටියෙන් කියලා අවසන් කරනවා.

විශේෂයෙන් කියලා තිබෙනවා, ඔය විධියට පුනරුත්ථාපනයට දැම්මාට පසු පැනලා ආවොත් ඒ පුද්ගලයාට අවුරුදු 10ක සිර දඬුවමක් ලැබෙන බව. හැබැයි, ඒ සිර දඬුවම ගෙවෙන්නේ කොහොමද? අවුරුදු 5ක් අනිවාර්ය පුනරුත්ථාපනය, අනෙක් අවුරුදු 5 අනිවාර්ය පරිවාස කිරීමක් විධියට. ඒක බොහොම හොඳයි. ඒ තැනැත්තාට පැනලා එන්න බැහැ. පැනලා ආවොත් සිර දඬුවමක් ලැබෙනවා. හැබැයි, සිර දඬුවම ලැබෙන්නේ පොල්ලෙලි තලන්න නොවෙයි, අනිවාර්ය පරිවාසය අවුරුදු 5යි, අනිවාර්ය පුනරුත්ථාපනය අවුරුදු 5යි වශයෙන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත පිළිබඳව මට තව කරුණු බොහොමයක් කියන්න පුළුවන්. නමුත් කාලය අවසන් නිසා මගේ කථාව නිමා කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.58]

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි දැක්කා අධිකරණ ක්‍රියාදාමයට සම්බන්ධ අණපනත් ගැන දීර්ඝ වශයෙන් කථා කරනවා. මගේ පෞද්ගලික මතය මේකයි. මේ රටේ ප්‍රමාණවත් තරම් අණපනත් තිබෙනවා, අධිකරණ තිබෙනවා. නමුත්, යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමය සාධාරණව, රටට අවශ්‍ය විධියට සිද්ධ වෙනවාද, ජනතාවට සාධාරණය සිද්ධ වෙනවාද කියන එක මට ප්‍රශ්නයක්. මේකට උදාහරණයක් මගේ අත්දැකීම් මත දෙන්න ඕනෑ. මම මේ රටේ මාස 30ක සිර දඬුවමක් විඳපු පුද්ගලයෙක්. මම යුද හමුදාපති ධුරයෙන් ඉවත් වෙලා ජනාධිපති ධුරයට තරග කළා. ඊට පස්සේ කැලෑ උසාවියක් පත් කරලා මට විරුද්ධව චෝදනාවක් ගෙනාවා. මම ඒකට කැලෑ උසාවිය කියන්නේ ඇයි? යුද්ධාධිකරණයක් පත් කළා. යුද හමුදා පනතේ තිබෙනවා අනිවාර්යයෙන්ම විනිශ්චයකාරවරු චූදිතයාට වඩා ජ්‍යෙෂ්ඨ වෙන්න ඕනෑ කියලා. මට වඩා නිල දෙකක් පහළ විනිශ්චයකාරවරු දාලා මගේ නඩුව ඇහුවා. ඒක කැලෑ උසාවියක්. මේ කැලෑ උසාවියේදී කිව්වේ, මම ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙලා ඉන්නකොට, මගේ බෑනා එවකට දාපු ටෙන්ඩර් පත්‍රිකාවක් සම්බන්ධව ක්‍රියා කළ ටෙන්ඩර් මණ්ඩලයේ මම වාඩි වෙලා හිටපු එක වැරදියි කියලා. අපි තර්කයක් ගෙනාවා, ඒක දැනගෙන හිටියේ නැහැ කියලා. මොකද, මගේ බෑනාට ඒ අදාළ කොම්පැනියේ තනතුරක්වත් තිබුණේ නැහැ. එතකොට ඒ ගොල්ලන් කිව්වා, "බෑනා තිරය පිටුපස - behind the scene - ඉඳන් තමයි කොම්පැනිය මෙහෙයවලා තිබෙන්නේ" කියලා. මම හමුදාපති හැටියට ඒවා දැනගෙන හිටියේ නැහැ කිව්වාම, ඔප්පු කරන්න හැදුවේ කොහොමද? බෑනාගේ සහ මගේ දියණියගේ විවාහ මංගල උත්සවය හමුදාපති නිල නිවසේ ගත්ත නිසාත්, මම ඇමෙරිකාවේ ගිහිල්ලා දවස් 4ක් මගේ දියණියගේ ගෙදර හිටපු නිසාත්, මම ජනාධිපතිවරණයට ඉල්ලනකොට බෑනා සහ දියණිය ඇමෙරිකාවේ ඉඳලා ඇවිල්ලා ජනාධිපතිවරණයේදී මට වැඩ කළ නිසාත් මට බෑනාගේ සියලු පෞද්ගලික ව්‍යාපාර ගැන අවබෝධයක් තිබෙන්න ඕනෑ කිව්වා. එහෙම කියලා තමයි මම ඒවා දැනගෙන හිටියා කියලා පෙන්වූවේ. එතකොට මේ නීති ලංකාවේ ක්‍රියාත්මක වෙනවාද? මේ චෝදනා පත්‍ර නිර්මාණය කළෙත්, චෝදනා පත්‍රවලට අත්සන් කළෙත්, නඩු තීන්දු අත්සන් කළෙත්, දඬුවම අත්සන් කළෙත් එවකට රටේ සිටි නායකයා. එතුමා තමයි මේ සියල්ලම තීන්දු කළේ, මට විරුද්ධව ජනාධිපතිවරයේදී ඡන්දය ඉල්ලපු පුද්ගලයා. ඔහු තමයි මේ සේරම කළේ. ඒ තර්ක ගෙනාව නඩු ගොනුවේ, 2010 සැප්තැම්බර් 16 දින කාර්ය සටහන්වල පිටු අංක 10, 11 සහ 12හි තිබෙනවා. මේ නඩුව මෙහෙයවපු නීතිඥයා පිළිගත්තා කියලා යුද හමුදාපති ටෙන්ඩර් මණ්ඩලයේ ඉඳගෙන රජයට හානියක් වෙන ආකාරයට ක්‍රියා කරලා නැහැ කියලා.

කිසිම වංචාවක් කරන්න යුද හමුදාපතිට චේතනාවක් තිබිලාත් නැහැ, යුද හමුදාපති ටෙන්ඩර් මණ්ඩලයේ සිටීම නිසා ටෙන්ඩර් ක්‍රියා පටිපාටියට කිසිම අසාධාරණයක් වෙලාත් නැහැ කියලා පිළිගත්තා. නමුත්, ටෙන්ඩර් මණ්ඩලයේ සිටීම වැරදියි කියලා තමයි මට මාස තිහක සිර දඬුවමක් දුන්නේ. එහෙම දඬුවම් කරනවා නම්, මේ රටේ වැඩකටයුතු සිද්ධ වන ආකාරයට ලංකාවේ පරිපාලන ක්ෂේත්‍රයේ ඉන්න සියලුදෙනා සහ මැති ඇමතිවරු සියලුදෙනා ඉන්න ඕනෑ හිර ගෙවල්වල බව මේ රටේ ජනතාව දැන ගන්න ඕනෑ. ටෙන්ඩර් මණ්ඩලයේ හිටියා කියලා තමයි මට දඬුවම් කළේ. කැලෑ උසාවියෙන් මට දඬුවම් කරලා, මම හිරෙන් එළියට එනකොට මගේ ප්‍රජා අයිතිය අහිමි කරන්න ඕනෑ නිසා ශ්‍රේෂ්ඨාධිකරණට ගිහිල්ලා නැවතත් තීන්දුවක් ගත්තා, යුද අධිකරණය කියන්නේ මේ රටේම අධිකරණයක් කියලා. නමුත් යුද අධිකරණය කියන්නේ, හමුදාවේ පරිපාලනය මෙහෙය වන්න පත් කරන එකක්. ඒක රටේ තිබෙන ජාතික අධිකරණයක් නෙවෙයි. නමුත්, මගේ ප්‍රජා අයිතිය අහෝසි කරන්න ඕනෑ නිසා එහෙම තීන්දුවක් ගත්තා.

ඒ නඩුව මෙහෙය වූයේ, නීතිපති දෙපාර්තමේන්තුවේ එවකට හිටපු බුවනෙක අලුවිහාරේ කියන නීතිඥයා. ඒ නීතිඥයා තමයි විධියට ඒ නඩුව මෙහෙය වූයේ. ඒ නඩුව ඉවරවෙලා මා හිරේ ගියාම ඔහු කෙළින්ම පත් කළා ශ්‍රේෂ්ඨාධිකරණයට. මම හිතන විධියට ඔහු දැනටත් ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉන්නවා, ජ්‍යෙෂ්ඨ විනිසුරුවරයකු හැටියට. මෙම යාන්ත්‍රණයේ ඒ වාගේ අය ඉන්නවා නම්; ඒ වාගේ පුද්ගලයන් අතේ නම් මේ දේවල් තිබෙන්නේ; යුක්තිය පසිඳලීමේ ක්‍රමය හරහා මේ වාගේ දේවල් සිද්ධ වෙනවා නම්; මොන අණ පනත් ගෙනාවත් කවදාවත් මේ රටේ ජනතාවට සාධාරණයක් ඉෂ්ට වෙන්නේ නැහැ.

අපේ ගරු අධිකරණ ඇමතිතුමා ස්වාධීන කොමිෂන් සභා ගැනත් කතා කළා. ගරු මන්ත්‍රීවරුනි, මම තරයේ විශ්වාස කරනවා, මෙම ආයතනවල කටයුතු පිරිසිදු කළේ නැත්නම් ස්වාධීන කොමිෂන් සභා තිබුණාට සත පහකවත් වැඩක් නැහැ, මේ රටේ ජනතාවට එමගින් සේවයක් වෙන්නේත් නැහැ කියලා. ඉස්සෙල්ලාම මෙම ආයතනවල කටයුතු පිරිසිදු වෙන්න ඕනෑ. ඒ වාගේම, මෙම ආයතනවල ඉන්න චරිත, පිරිසිදු චරිත වෙන්න ඕනෑ. මුලින්ම ඒගොල්ලෝ නීතියට ගරු කරන මිනිස්සු වෙන්න

ඕනෑ. එහෙම නැති වුණොත්, ස්වාධීන කොමිෂන් සභාවලින් මේ රටේ ජනතාවට කවදාවත් සෙතක් වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2010 ජුලි 28වැනි දා නඩු වාර්තාවේ, පිටු අංක 5 හා 6හි තිබෙනවා, ටෙන්ඩර් මණ්ඩලයේ සිටීමෙන් යුද හමුදාපතිගෙන් වංචාවක් සිදුවෙලා නැහැ කියලා. මේ කරුණ ඕනෑ කෙනෙකුට refer කරන්න පුළුවන්. ඒකයි මම ඒ කාරණාව ගැන කතා කළේ. මේ වනකොටත් රටේ මේ ආකාරයේ කරුණු කාරණා සිද්ධ වනවා.

මම පසුගිය දවස්වල ගියා වසන්ත මුදලිගේ කියන තරුණයා බලන්න. ඔහු රැඳවුම් නියෝග මත තබා තිබෙනවා. ඔහු අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු. මම තංගල්ලට ගියාම කිව්වා, තංගල්ලේ නැහැ, කොළඹ ත්‍රස්ත විමර්ශන අංශයේ ඉන්නවා කියලා. ඒ දෙවැනි තට්ටුවේ රඳවා තිබෙන්නේ කිව්වා. මේ රටේ කවුරුත් දැනගෙන හිටියේ නැහැ, ඔහු තංගල්ලෙන් කොළඹට ගෙනාවා කියලාත්. මම ගියා ත්‍රස්ත විමර්ශන අංශයට. ගිහිල්ලා මම කතා කළා. එතැන හිටියා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස පොලිස් අධිකාරිවරයෙක්. ඔහු පොලිස් අධිකාරි, ගුණසේකර කියලා පුද්ගලයෙක්. ඔහු ආවා මගේ ළඟට. ටයි එකත් එයාට බර වැඩියි වාගේ. බෙල්ල කඩාගෙන වැටිලා. මම කියපු කිසි දෙයක් එයාට ඇහුණේත් නැහැ. කනටම ළංවෙලා කතා කරන්නත් වුණා. ඒ පුද්ගලයාගෙන් මම ඇහුවා, අපට වසන්ත මුදලිගේ බලන්න පුළුවන් ද කියලා. ඔහු කිව්වා, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට ගෙනාපු නව සංශෝධන අනුව මන්ත්‍රීවරයෙකුට එහෙම බලන්න දෙන්න බැහැ කියලා.

මේ ගරු සභාවේ ඉන්න ගරු මන්ත්‍රීවරු කවුරුත් පිළිගනීවි කියා මා හිතනවා, අත්අඩංගුවේ ඉන්න කෙනෙකු බැලීමට යෑමට මන්ත්‍රීවරුන්ට වරප්‍රසාද තිබෙන්න ඕනෑ බව. බන්ධනාගාර විෂයය කලින් භාරව හිටපු ඇමතිතුමා දැන් ගරු සභාවේ ඉන්නවා. හිටපු ගරු ඇමතිතුමනි, සිරකරුවන් බැලීමට යෑමට වරප්‍රසාද තිබෙනවා නම්, මරණීය දණ්ඩනය නියම වෙච්ච අය පවා බැලීමට යෑමට වරප්‍රසාද තිබෙනවා නම්, අත්අඩංගුවට ගත්ත කෙනෙකු රැඳවුම් නියෝග මත හිටියා වුණත් බලන්න යෑමේ වරප්‍රසාදය දෙන්න ඕනෑ. නමුත්, ඒ පොලිස් අධිකාරිවරයා කිව්වා, පනතට සංශෝධන ගෙනෙන්න කලින් පුළුවන්කම තිබුණා, දැන් බැහැ කියලා. මම සොයා බැලුවාම, වර්තමානයේ එවැනි සංශෝධනයක් කරලා නැහැ. ඒ පනත එලෙස සංශෝධනය වෙලා නැහැ.

ඊළඟට, මම ඒ පොලිස් අධිකාරිවරයාගෙන් ඇහුවා, වසන්ත මුදලිගේ ත්‍රස්තවාදියෙක්ද, මේ රටේ ත්‍රස්තවාදයක් තිබෙනවාද කියලා. ත්‍රස්තවාදයක් තිබෙනවාද කියලා ඇහුවාම ඒ පොලිස් අධිකාරිවරයා කියනවා, "මේ තරුණයා තියාගෙන ඉන්නේ ත්‍රස්තවාදයක් තිබෙනවාද කියලා සොයලා බලන්න" කියලා. එතකොට ත්‍රස්තවාදයක් තිබෙනවාද කියලා සොයලා බලන්න තරුණයෙක් අත්අඩංගුවට ගෙනැල්ලා රැඳවුම් නියෝග මත දවස් 90ක් බන්ධනාගාරයේ රඳවා තබාගෙන ඉන්නවා. ඒ තරුණයා අසනීප වෙලා. ස්වාමීන් වහන්සේ නමකුත් බන්ධනාගාරයේ රඳවා තබාගෙන ඉන්නවා. උන් වහන්සේත් තදබල ලෙස අසනීප වෙලා ඉන්නවා. අනික, එවැනි තත්ත්වයක් තිබෙනවා නම්, බුද්ධි අංශ මොනවාටද තිබෙන්නේ? පසුගිය කාලයේ මට ලියුමක් ගෙනැල්ලා දුන්නා, පසුගිය දෙවැනි දා තිබුණු උද්ඝෝෂණය මම සංවිධානය කරනවාය කියලා බුද්ධි අංශ වාර්තා කර තිබෙනවාය කියලා. මේ වාගේ බහුබූත තමයි වර්තමාන බුද්ධි අංශ කරන්නේ. හොඳ වෙලාවට මේ යෝධයෝ යුද්ධය තිබෙන කාලයේ හිටියේ නැහැ. මේගොල්ලන් යුද්ධය තිබෙන කාලයේ හිටියා නම්, ප්‍රභාකරන් ඇවිල්ලා අපිව අල්ලාගෙන එහෙට ගෙනගිහිල්ලා මේ වෙනකොට රැඳවුම් නියෝග මත රඳවාගෙන!

අද මේ වාගේ තත්ත්වයක් යටතේ තරුණයන්ට හානි කරනවා. වසන්ත මුදලිගේ කියන තරුණයා වාගේම අත්අඩංගුවට අරගෙන තිබෙන භික්ෂූන් වහන්සේ බරපතළ ලෙස අසනීප වෙලා ඉන්නවා. මම අද මේ ගැන කිව්ව බව තමුන්නාන්සේලා මතක තියාගන්න. වැරදිලාවත් ඔවුන්ගේ ජීවිතවලට හානියක් වුණොත්, මේ රටේ ජනතාව අනිවාර්යයෙන් ත්‍රස්ත විමර්ශන අංශයයි, පොලීසියයි පොළොවට සමතලා කරාවි. ඒ විතරක් නොවෙයි. මේ පාර්ලිමේන්තුවේ ඉන්න මැති ඇමතිවරුන්ටත් දැන්ම තියා රක්ෂණාවරණයක් ලබාගෙන ඉන්න වෙනවා. මොකද, අපටත් යන එන මං නැති වේවි. අපට මතකයි, පසුගිය වර මැති ඇමතිවරුන්ගේ නිවාසවලට ගිනි තැබීම් කරලා තමුන්නාන්සේලාට හැංගිලා ජීවත් වෙන්න වෙච්ච හැටි. අපි ඒවා මතක තියාගෙන ඒවායෙන් පාඩම් ඉගෙන ගන්න ඕනෑ.

මේ රජය මානව හිමිකම් කඩ කරනවා, මූලික අයිතිවාසිකම් කඩ කරනවා. මම මේ රටේ ජනතාවගෙන් ඉල්ලා සිටිනවා, මේවා නවත්වන තෙක් මේ රජයට කවදාවත් ආධාර කරන්න එපා කියලා. මේ රජයට සහයෝගය දෙන්න බැහැ. මේ රජය අපෙන් ඉල්ලනවා, සහයෝගය දෙන්න කියලා. මේවා නවත්වලා මූලික අයිතිවාසිකම්වලට සහ මානව හිමිකම්වලට ගරු කරන දවසට අපි තමුන්නාන්සේලාට සහයෝගය දෙනවා. ලංකාවේ පුරවැසියන් පිට රට ජීවත් වෙනවා. ඒ ප්‍රජාවගෙනුත් මා ඉල්ලා සිටිනවා, මේ රජයට කිසි ලෙසකින් උදවු කරන්න එපා. මේ කරුණු-කාරණා පෙළ ගැහෙනතෙක් ඩොලරයක්වත් මේ රටට එවන්න එපා කියලා.

ඊළඟට, පොලීසියට ගෙනිහිල්ලා වයස අවුරුදු 10 ළමයින්ගේ කකුල් පුච්චනවා අපි දැක්කා. ඒ වාගේ තිරිසන් වැඩ සිද්ධ වෙනවා නම්, ලෝකයේ මිනිස්සු හිතයි, මේ රටේ ඉන්නේ වනචාරි මිනිස්සු කියලා. ඒ නිසා මේවාට විරුද්ධව තදබල ලෙස නීතිය ක්‍රියාත්මක වෙන්න ඕනෑ.

අවසාන වශයෙන් මේ කාරණයත් මම කියන්න ඕනෑ. "අරගළ කරන්න එපා. මේ රටේ ආර්ථිකය කඩාගෙන වැටෙනවා" කියලා කොළඹ ව්‍යාපාරික ප්‍රජාව කියා තිබෙනවා මම දැක්කා. ඒ ව්‍යාපාරික ප්‍රජාවගේ Chamber එකෙන් මම ඉල්ලා සිටිනවා, දේශපාලනඥයෝ හොරකම් කරන ඒවා නවත්වන්නත්, ඒවා විවේචනය කරන්නත්, ඒවාට විරුද්ධව නැඟී සිටින්නත් ක්‍රියාත්මක වෙන්න කියලා. එහෙම ක්‍රියාත්මක වෙනවා නම්, ඒ අය මෙහෙම ඉල්ලීමක් කරපු එක සාධාරණයි.

ඒ වාගේම, මම අනෙක් පැත්තට පනින්න යනවා, ඇමතිකම් ගන්න යනවා කියන කථාවක් Facebook එකේ පළ වෙනවා මම දැක්කා. මට අගමැති ධුරය භාර ගන්න කිව්වාමත් මම යම් යම් දේවල් අනුමත කරන්නේ නැති හින්දා ප්‍රතිපත්ති මත ඉඳලා ඒක ප්‍රතික්ෂේප කළා. මම එවැනි නිවට, බියගුලු වැඩ කරන්නේ නැහැ. එහෙම කරන කට්ටියක් ඉන්න පුළුවන්. සමහරු එහෙම සාකච්ඡා පවත්වාවි. මම කවදාවත් ඒ තත්ත්වයට වැටෙන්නේ නැහැ කියලා මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.1.10]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ අමාත්‍යාංශයට අදාළ පනත් කෙටුම්පත් 09ක් අද පාර්ලිමේන්තුවේ දෙවනවර කියවීමේ විවාදය සඳහා ඉදිරිපත් කර තිබෙනවා. මම මුලින්ම ගරු අධිකරණ අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා, ඉතා කාලෝචිත පනත් කෙටුම්පත් කිහිපයක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම පිළිබඳව. ඒ වාගේම, මම මේක අවස්ථාවක් කර ගන්නවා, හිටපු අධිකරණ අමාත්‍යතුමාට ස්තුති කරන්න. මේ රටේ අධිකරණ ක්ෂේත්‍රයේ විප්ලවීය වෙනසක් ඇති කරන්න එතුමාට හැකියාව ලැබුණා. එතුමා අධිකරණ අමාත්‍ය ධුරය දරපු කාලයේ අවුරුදු දෙකක් ඇතුළත කැබිනට් පත්‍රිකා 80ක් ඉදිරිපත් කරමින් අවුරුදු 40කට, 50කට වඩා පැරණි මේ අණපනත් යාවත්කාලීන කරන්න සුවිශේෂී මෙහෙවරක් කළ බව මම කැබිනට් මණ්ඩලයේ හිටපු නිසා මට මතකයි. මෙතෙක් හිටපු අධිකරණ අමාත්‍යවරු අතරින් කෙටි කාලයක් තුළ මෙපමණ කැබිනට් පත්‍රිකා ප්‍රමාණයක් ඉදිරිපත් කරපු, මෙපමණ අණපනත් ප්‍රමාණයක් -ඒ කියන්නේ අත්‍යවශ්‍යම අණපනත්- සංශෝධනය කරන්න කටයුතු කරපු අමාත්‍යවරයා හැටියට  අපි එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

මට මතක හැටියට ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටියේ විනිසුරුවරු 11 දෙනායි. එතුමා ඒ සංඛ්‍යාව 17 දක්වා වැඩි කළා. අභියාචනාධිකරණයේ හිටියේ විනිසුරුවරුන් 12 දෙනායි. එතුමා ඒ සංඛ්‍යාව 20 දක්වා වැඩි කළා. ඉතිහාසයේ පළමුවන වතාවට එතුමා මහෙස්ත්‍රාත් අධිකරණවලට විනිසුරුවරුන් 47 දෙනෙක් බඳවාගත්තා. ඒ නිසා එතුමා අධිකරණ ක්ෂේත්‍රයේ දැවැන්ත වෙනසක් කරන්න කටයුතු කළා. ඒ වාගේම, වත්මන් අධිකරණ ඇමතිතුමා ඒ කටයුතු තවත් ඵලදායී ලෙස ඉදිරියට කරගෙන යනවා.  අපේ අධිකරණ ක්ෂේත්‍රය වෙනුවෙන් මේ ගන්නා වූ ක්‍රියාමාර්ග පිළිබඳව  අපේ විශේෂ ස්තුතිය එතුමන්ලාට පුද කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඕනෑම රටක නීතිය කියන්නේ ඒ රටේ දියුණුවට හා පැවැත්මට සුවිශේෂී වශයෙන් බලපාන කාරණයක්. නමුත්, පසුගිය කාලයේ අපි දැක්කා, අධිකරණ ක්ෂේත්‍රයේ යල් පැන ගිය අණ පනත් කිසිවක් සංශෝධනය කරන්න කටයුතු කරලා තිබුණේ නැති බව. මේ කාරණය කෙරෙහි කාගේවත් අවධානය යොමු වුණේ නැහැ. මොකද, මේකෙන් දේශපාලන වාසියක් ලැබෙන්නේ නැහැ නේ. ගොඩක් වෙලාවට අපි පුරුදු වෙලා ඉන්නේ දේශපාලන වාසියක් එන දෙයක් කරන්න. හැබැයි, අධිකරණ ක්ෂේත්‍රය වෙනුවෙන් අවශ්‍ය සුවිශේෂී වැඩ කොටස ඉටු කිරීමේ කටයුත්ත හිටපු අධිකරණ අමාත්‍යතුමා ආරම්භ කළා වාගේම, වත්මන් අධිකරණ අමාත්‍යතුමා ඒ කටයුතු ඉදිරියට ගෙන යන බව මා විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අධිකරණ අමාත්‍යතුමා මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන මේ අණ පනත් අතුරින් මා විශේෂ අවධානයක් යොමු කරනවා, විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මත් ද්‍රව්‍ය භාවිතය තමයි රටක් හැටියට අප අද මුහුණ දී තිබෙන බරපතළම ප්‍රශ්නය. අද මේ රටේ තරුණයන්, වැඩිහිටියන්, මහල්ලන්, දරුවන් ආදී වශයෙන් වයස් භේදයක් නැතිව සියලුදෙනා -හැම කෙනෙක්ම- දැඩි ලෙස, ශීඝ්‍රයෙන් මත් කුඩුවලට ඇබ්බැහි වෙමින් යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලයේ මත්කුඩුවලට ඇබ්බැහි වූවන් පිළිබඳ සංඛ්‍යා දත්ත ඇතුළත් ලේඛනයක් මා ළඟ තිබෙනවා. ඒ ලේඛනයට අනුව 2018 අවුරුද්දේ හෙරොයින් කිලෝග්‍රෑම් 739ක්, 2019 අවුරුද්දේ කිලෝග්‍රෑම් 1741ක්, 2020 අවුරුද්දේ කිලෝග්‍රෑම් 1629ක්, 2021 අවුරුද්දේ කිලෝග්‍රෑම් 1630ක්, 2022.11.10වන දා වනවිට කිලෝග්‍රෑම් 1415ක් ආදී වශයෙන් කිලෝග්‍රෑම් 7155ක් මේ අවුරුදු පහේදී අත්අඩංගුවට අරගෙන තිබෙනවා. කැනබිස් ගත්තොත්, 2018 අවුරුද්දේ කිලෝග්‍රෑම් 4778ක්, 2019 අවුරුද්දේ කිලෝග්‍රෑම් 7071ක්, 2020 අවුරුද්දේ කිලෝග්‍රෑම් 16198ක් ආදී වශයෙන් කිලෝග්‍රෑම් 53930ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. කොකේන් කියන වර්ගයත් විශාල ප්‍රමාණයක් මේ විධියටම අත්අඩංගුවට අරගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූවන් පිළිබඳ  සමීක්ෂණයක් එක් එක් දිස්ත්‍රික් මට්ටමින් අවසාන වශයෙන් කරලා තිබෙන්නේ 2019දී. ඒ අනුව, අම්පාර දිස්ත්‍රික්කයේ 2,402යි; අනුරාධපුරයේ 3,235යි; බදුල්ලේ 9,207යි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොලීසිය ඉදිරිපත් කරන වාර්තාවලට අනුව මේ වනකොට අපේ රටේ පුද්ගලයන් ලක්ෂ 5කට වඩා මත් කුඩු, අයිස් සහ කොකේන් කියන වර්ගවලට ඇබ්බැහි වෙලා සිටිනවා. අපි කථා කළ යුත්තේ මේ කාරණය පිළිබඳයි. මේ රටේ සිද්ධ විය යුත්තේ ඒකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නමුත්, අපි කවුරුවත් මේ කාරණයට අවධානය යොමු කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ජීවත් වන ප්‍රදේශයේ පසුගිය කාලයේ මත් කුඩු භාවිත කරපු පාසල් යන දරුවන් විශාල පිරිසක් පොලීසියේ මැදිහත් වීමෙන් අත්අඩංගුවට ගන්න සිද්ධ වුණා. ඒ දරුවන් පාසලේ ඉගෙනගන්නා පන්ති එක්ක බැලුවාම පොලීසියට ඒ දරුවන් ඉදිරිපත් කරගන්න විධියක් නැහැ. අද වන කොට පාසල් දරුවන් ඉතා ශීඝ්‍ර ලෙස මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙමින් ඉන්නවා. ඒ වාගේම කර්මාන්තශාලාවල සේවය කරන පුද්ගලයන්, විවිධ තරාතිරම්වල පුද්ගලයන් අද මත් ද්‍රව්‍ය භාවිතයට පුරුදු වෙලා ඉන්නවා. ඒ නිසා අපි ගරු ඇමතිතුමාට කිව්වා, නීති රීති තද කරන්න කියලා. මුලින්ම ග්‍රෑම් 2ක් සඳහා තමයි මහාධිකරණයෙන් ඇප දෙන්න නියමිතව තිබුණේ. ඊට පස්සේ ඒ ප්‍රමාණය ග්‍රෑම් 5ක් වුණා. දැන් ඒ ප්‍රමාණය ග්‍රෑම් 10ක් වෙලා තිබෙනවා. මත් කුඩු භාවිත කරලා පොලීසියෙන් අත්අඩංගුවට ගන්නා අය  මහෙස්ත්‍රාත්වරු රිමාන්ඩ් බන්ධනාගාරගත කරන්නේ නැහැ. ඒ කාරණය සම්බන්ධයෙන් ඇමතිතුමා කියපු කථාවේ තව පැත්තක් තිබෙනවා. මොකද, මත් කුඩු භාවිත කරන අය අත්අඩංගුවට ගන්න කටයුතු කළොත් ඔවුන් රඳවා ගන්න බන්ධනාගාරවල ඉඩ නැහැ; මාස ගණන් තියාගෙන ඉන්න වනවා. හැබැයි ගරු ඇමතිතුමනි, අපි කියන්නේ ඒ සඳහා දැවැන්ත පුනරුත්ථාපන වැඩසටහනක් හදන්න කියලායි. මත් කුඩු භාවිත කරලා අත්අඩංගුවට ගන්නා පුද්ගලයන්ට -අද තිබෙන නීතිය අනුව- උසාවියට ඉදිරිපත් කළ ගමන්  ඇප දෙනවා.

ඒ නිසා මත් කුඩු භාවිත කරන අයට බියක් ඇති වන්නේ නැහැ. මොකද, කුඩු ගහලා හසු වුණොත් උසාවියෙන් ඇප දෙනවා කියලා ඒ අය දන්නවා. එම නිසා මේ තත්ත්වය වෙනස් කළ යුතුයි. හැබැයි, මා දන්නේ නැහැ, ඒ වෙනස කරන්නේ කොහොමද කියලා. ගරු අධිකරණ ඇමතිතුමනි, මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, අධිකරණ සේවා කොමිෂන් සභාව හරහා හෝ අග්‍ර විනිශ්චයකාරතුමා දැනුවත් කරලා, මහෙස්ත්‍රාත්වරුන් දැනුවත් කරලා, කුඩු භාවිත කරන දරුවන් පුනරුත්ථාපනය කිරීම සඳහා වන වැඩසටහනක් අධිකරණ අමාත්‍යාංශය හරහා  ක්‍රියාත්මක කරන්න කියලා.

ගරු අමාත්‍යතුමනි, ඒ පුනරුත්ථාපන මධ්‍යස්ථානවලත් අඩු පාඩු තිබෙනවා. ඒ දරුවන් පුනරුත්ථාපනය කරන්න අවශ්‍ය පළපුරුදු පිරිසක් ඒ මධ්‍යස්ථානවල නැහැ. ගරු අමාත්‍යතුමනි, අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදීත් මා ඔබතුමාට

යෝජනා කළා, ඒ දරුවන් පුනරුත්ථාපනය කිරීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් හදන්න කියලා. ඔිනෑ නම් ඔබතුමා ඒ සඳහා කාර්ය සාධක බලකායක් හදන්න. මේ පාර්ලිමේන්තුවේ අපි කැමැතියි, ඒකට ස්වේච්ඡාවෙන් උදවු කරන්න. ඒ සඳහා වන කාර්ය සාධක බලකායක් හදලා ඒ තරුණ තරුණියන් පුනරුත්ථාපනය කරන ජාතික වැඩසටහනක් හදන්න. ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, ඒ සඳහා අමාත්‍යාංශයේ සල්ලි නැහැ කියලා; ප්‍රතිපාදන අමාරුයි කියලා. මේ රටේ කෝටිපතියෝ, ප්‍රකෝටිපතියෝ ඉන්නවා, විවිධ දැන්වීම්වලට බිලියන ගණනින් සල්ලි දෙන. ක්‍රිකට් ක්‍රීඩාව ගත්තොත්, ක්‍රිකට්වලට මිලියන 500ක විතර sponsorship එකක් දෙනවා. සමහර ක්‍රීඩාවලට සමහර සමාගම් මිලියන ගණනින් අනුග්‍රහය දක්වනවා. ඒ නිසා ඒ සමාගම්වලට කථා කළොත්, මේ සඳහාත් ප්‍රතිපාදන ලබාගන්න අපට අනිවාර්යයෙන් පුළුවන්.

ගරු අමාත්‍යතුමනි, මා හිතන විධියට, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ගැන කථා කරන එකවත්, IMF එකේ ගිවිසුම ගැන කථා කරන එකවත්, පළාත් පාලන මැතිවරණය ගැන කථා කරන එකවත්, පවතින ආණ්ඩුවට අයින් වෙන්න කියන එකවත් නොවෙයි අපි අද කරන්න ඕනෑ. අප ඔක්කෝම එක්කහු වෙලා අද කරන්න ඕනෑ, අපේ රටේ තරුණ පරම්පරාව සහ අනාගත පරපුර මේ මත් උවදුරෙන් බේරා ගැනීමටයි. නමුත්, අද කවුරුවත් මේ ගැන කථා කරන්නේ නැහැ, මේකෙන් දේශපාලන වාසියක් නැති වෙයි කියලා. අද මේ රටේ ලක්ෂ පහක් පමණ මත් උවදුරට ඇබ්බැහි වෙලා ඉන්නවා නම්, තව ටික දවසක් යනකොට ඒ ප්‍රමාණය ලක්ෂ 10ක් වෙයි; ඊළඟට ලක්ෂ 15ක් වෙයි; ඊළඟට ලක්ෂ 20ක් වෙයි. ඊට පස්සේ මේ රටේ හැම කෙනෙකුම මත් උවදුරට ඇබ්බැහි වන තත්ත්වයක් උදා වෙයි. ඒ නිසා මේ සම්බන්ධයෙන් දැඩි නීති රීති ගෙනැල්ලා, මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීමට කටයුතු කරන්න ඕනෑ. පසුගිය සතියේ අතිවිශාල මත් කුඩු ප්‍රමාණයක් මේ රටට හොරෙන් ගෙනැවිත් තිබෙන බව අපි දැක්කා. නාවික හමුදාව විසින් ඒවා අත්අඩංගුවට අරගෙන තිබෙන බවත් අපි දැක්කා. රේගුව තුළට විශාල වශයෙන් කුඩු එනවා. හැබැයි, ඒ පිළිබඳ සොයා බැලීමේ වැඩසටහනක් නැහැ. දවසකට අපේ රේගුවේ containers 2,500ක් විතර තිබෙනවා. ඒවායෙන් සියයට පහක්වත් check කරන්නේ නැහැ. ඒ නිසා ඒ containers ඇතුළේ කුඩු එනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ රටට කුඩු එවන විධි සොයා බලා, ඒවා වළක්වන්න අවශ්‍ය නීති සකස් කරලා, කුඩු විකුණන පුද්ගලයන්ට එරෙහිව දැඩි නීති ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ වාගේම, මත් කුඩු භාවිත කරන දරුවන් පුනරුත්ථාපනය කිරීමට කටයුතු කරන්නත් ඕනෑ. පුළුවන් නම් මේ කාරණය විෂයයක් හැටියට හෝ ගෙනැල්ලා පාසල් දරුවන් දැනුවත් කරලා, දෙමවුපියන් දැනුවත් කරලා මත් උවදුරෙන් දරුවන් බේරාගන්න, ඒ සඳහා වන ජාතික වැඩසටහනක් හදන්න කියලා තමයි අපි ගරු අමාත්‍යතුමාට කියන්නේ.

දැන් තිබෙන්නේ ඉතාම භයානක තත්ත්වයක්. ගරු අමාත්‍යතුමනි, මා ඔබතුමාට කියපු සංඛ්‍යා ලේඛනවලට අනුව, හෙරොයින්, කොකේන්, හෂීස් ඇතුළුව මත් ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 25,000ක් විතර මේ අවුරුදු ගණන තුළ පොලීසිය අත්අඩංගුවට ගෙන තිබෙනවා. අත්අඩංගුවට ගැනීමට නොහැකි වුණු විශාල ප්‍රමාණයකුත් තිබෙනවා. ඒ කියන්නේ, අවුරුද්දකට මත් ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 10,000ක් විතර අත්අඩංගුවට ගන්නවා. තවත් කිලෝග්‍රෑම් 20,000ක්, 30,000ක් විතර එළියේ තිබෙනවා. ඒ වාගේම, අවුරුද්දකට ලක්ෂ පහක් විතර පිරිසක් ඒවා භාවිත කරන බව කියනවා. මේක ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ තත්ත්වය වෙනස් කිරීම සඳහා මේ පාර්ලිමේන්තුවේ අපි සියලුදෙනා එකට එක්කහු වෙන්න ඕනෑ. ගරු අධිකරණ අමාත්‍යතුමනි, කාර්ය සාධක බලකායක් හදලා, ජාතික වැඩසටහනක් හදලා, මේ රටේ අනාගතය භාරගන්න ඉන්න අහිංසක දරුවන්ගේ අනාගතය බේරා ගැනීම සඳහා, ඒ දරුවන් මත් උවදුරෙන් බේරාගැනීම සඳහා වන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියා ඔබතුමාට යෝජනා කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.20]

**ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා**
(மாண்புமிகு இம்தியாஸ் பாகிர் மாகார்)
(The Hon. Imthiaz Bakeer Markar)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අධිකරණ අමාත්‍යාංශය ගැන කථා කරන කොට, මා පළමුවෙන්ම කියනවා, ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා නීති විද්‍යාලයීය ශිෂ්‍ය ශිෂ්‍යාවන් සම්බන්ධයෙන් කරපු ඉල්ලීමට මාත් එකඟ වෙන බව. මමත් ඒ කාරණය අනුමත කරනවා. ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලීමක් කරනවා, නීති විද්‍යාලයේ විභාගවලදී සෑම විෂයකටම ඉංග්‍රීසියෙන් පිළිතුරු ලියන්න බල කරන තත්ත්වයක් එකවර ඇති කරන්න එපා, අගවිනිසුරුතුමා එක්ක කථා කරලා, ඒ වෙනුවෙන් ක්‍රමානුකූලව පියවර ගන්න පුළුවන් විධියක් ගැන කල්පනා කර බලන්න කියලා. ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා කියපු විධියට සිංහල මාධ්‍යයෙන්, ද්‍රවිඩ මාධ්‍යයෙන් ඉගෙන ගත්ත දරුවෝ ගම්බද ප්‍රදේශවලින් නීති විද්‍යාලයට එනවා. මා ඉගෙන ගත්තේත් සිංහල මාධ්‍යයෙන්. සිංහල මාධ්‍යයෙන් හෝ දෙමළ මාධ්‍යයෙන් ඉගෙන ගෙන නීති විද්‍යාලයට ගිහින් එකවර ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙන ගන්න විට අපහසු තත්ත්වයක් ඇති වෙනවා. අපි සමහර විෂයයන් ඉංග්‍රීසි භාෂාවෙන් කළා. ඔක්කෝම විෂයන් ඉංග්‍රීසියෙන් කරන එක සමහර දරුවන්ට අසීරු වෙනවා. ඒ හින්දා අග්‍ර විනිශ්චයකාරතුමා ඇතුළු පිරිස එක්ක සාකච්ඡා කරලා ඒ දරුවන් අපහසු තත්ත්වයට පත් නොකරන විධියේ තීන්දුවකට ඒම ගැන සලකා බලන්න මැදිහත් වෙන්න කියා මා ගරු අධිකරණ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්න කැමැතියි.

අද අපේ රටේ සියලු කටයුතු බොහෝදුරට දේශපාලනීකරණය වී තිබෙන බව අපි දකිනවා. පසුගිය දා ජනාධිපති මාධ්‍ය අංශයෙන් ප්‍රකාශයක් නිකුත් කරලා තිබුණා, යාල සිද්ධිය සම්බන්ධයෙන් අපක්ෂපාතී පරීක්ෂණයක් කරන්න ජනාධිපතිතුමා ඉල්ලීමක් කළා කියලා. අපක්ෂපාතී පරීක්ෂණයක් කිරීම විශේෂ උදවුවක් වෙන්න බැහැ. මේක හැමෝගේම අයිතියක්. ඒ නිසා අපක්ෂපාතී පරීක්ෂණ සිදුවිය යුතුයි. ජනාධිපතිවරයා මැදිහත් වෙලා අපක්ෂපාතී පරීක්ෂණ ඉල්ලන තත්ත්වයට අපේ රට වැටිලා තිබෙනවා කියන්නේ ඉතාම කනගාටුදායක තත්ත්වයක්. මේ ක්‍රමය - system - වෙනස්වීමයි අද ජනතාව ඉල්ලන්නේ. මේක තමයි අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ.

අද බන්ධනාගාර ආඥා පනත යටතේ ඉදිරිපත් කරන රීති අනුමත කිරීම සඳහා ඉදිරිපත් වෙලා තිබෙනවා. එහි තිබෙන යහපත් පැති අපි අගය කරනවා. නමුත් මේවා ක්‍රියාත්මක කරද්දී සලකා බැලිය යුතු රීති තිබෙනවා. 2015දී එක්සත් ජාතීන්ගේ

[ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා]

සංවිධානය අනුමත කළ නෙල්සන් මැන්ඩෙලා රීති තිබෙනවා. 1948 මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ සිරකරුවන් පිළිබඳ විශේෂ සඳහනක් තිබුණේ නැහැ. එහිදී කිව්වා, හැමෝටම සමානව සැලකීම, වධ හිංසා නොකිරීම, මිනිස්කමේ අභිමානයට ගරු කිරීම, වනිතාවන්ට ගරු කිරීම යන කරුණු. මේවා ගැනත් පොඩ්ඩක් සැලකිලිමත් වෙන්න. මේ ඉදිරිපත් කරන බන්ධනාගාර රීතිවල රැකියා සඳහා සිරකරුවන් යෙදවීම ගැන සඳහන් වෙනවා. මෙන්න මේ වාගේ කටයුතුවලදී සිරකරුවන් තේරීමේදී ඒ අය මොන මොන රැකියාවලටද යොදන්නේ කියලා පුද්ගල අභිමතයට අනුව තීන්දු ගන්න ඉඩ තියන්න එපා. මෙන්න මෙහෙමයි මේ කටයුතු විය යුත්තේ කියලා පැහැදිලි ක්‍රමයක් මේ සඳහා හදන්න.

මිනී මැරුම් නඩුවලදී දඬුවම් ලබපු උදවියට සමාව දීම වැනි දේවල්වලදී පවා ඇඟිලි ගැසීම් ගැන, වැරදි තීන්දු ගැනීම් ගැන අද රටේ චෝදනා තිබෙනවා. ඒ වාගේ තත්ත්වයකට පත් වෙන්නේ නැතිව තීන්දු ගැනීම ගැන නිශ්චිත ක්‍රමයක් හඳුන්වා දීම වැදගත් කියන එක ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න මම කැමැතියි.

අද ජනාධිපතිතුමා කථා කරනකොට සඳහන් කළා, දූෂිත ගනුදෙනු ආදිය පිළිබඳව සොයා බැලීමට අවශ්‍ය නීති ගෙන ඒමට ලබන ජනවාරි, පෙබරවාරි වෙනකොට කටයුතු කරනවා කියලා. අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවට වංචා පිළිබඳව සොයා බැලීමට තිබෙන නීති ප්‍රමාණවත් නොවීම නිසා අලුතින් නීති හඳුන්වා දීමේ සූදානමක් 2018, 2019 කාලයේ තිබුණා. අද 2023ටත් කිට්ටු වෙලා තිබෙනවා. නමුත් මෙතෙක් ඒවා ක්‍රියාත්මක වුණේ නැහැ. මම පෞද්ගලිකව කෙනෙකු ඉලක්ක කරලා නොවෙයි මේ කියන්නේ. අද අපේ රටේ ප්‍රතිරූපය නරක් වෙලා තිබෙනවා. ආර්ථික ඝාතන සම්බන්ධයෙන් ජාත්‍යන්තර මානව හිමිකම් කොමිසමේ පවා ඇඟිල්ල අපේ රටට දිගු වෙනවා. මේවා පිළිබඳ සාධාරණ පරීක්ෂණ කරන්න. මේ අහිමි වූ මුදල් කන්දරාව අපේ ජනතාවට නැවත ලබා දෙන්න. ඒ සඳහා තිබෙන නීති ප්‍රතිපාදන මදි නම් ප්‍රමාණවත් නීති ගෙන ඒමේ කටයුත්තට ප්‍රමුඛතාව ලබා දී කටයුතු කළ යුතුව තිබෙනවා. මේවා හිස් වචන බවට පත් වෙන්න ඉඩ දෙන්නේ නැතිව ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න ඕනෑ.

අද බලන්න, ත්‍රස්ත ලේබලය අලවලා විශ්වවිද්‍යාල ක්‍රියාකාරිකයන් සිර ගෙදරට ගන්නවා. ඒ ගොල්ලන්ගේ ඇස් දෙක වහලා රැ ජාමයේ එක එක තැන්වලට ඇදගෙන යනවා; මරණ භය දෙනවා. මේවා විය යුතු නැහැ. මේවා මේ රටේ ප්‍රතිරූපයට හානිකරයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කරලා තිබෙන මිනිස් අයිතිවාසිකම්වලට විරුද්ධව අද අපි ත්‍රස්ත විරෝධී පනත අවභාවිත කරන හැටි බලන්න.

ඊයේ, පෙරේදා සිට පොලිස් ආඥා පනත පවා අවභාවිත කරන හැටි අපි දකිනවා. මේ තත්ත්වයට රට ගෙන යන්න එපා. අපේ රට ලෝකය ඉදිරියේ තව තවත් හුදෙකලා වෙන තත්ත්වයට ගෙන යන්න එපා. නීතිඥ සංගමයේ සභාපතිතුමා හැටියට හිටපු කෙනෙක් අද අධිකරණ ඇමති ධුරයේ ඉන්නේ. ඒ නිසා යම් යම් බැඳීම් තිබෙන්න පුළුවන්; යම් යම් සීමා තිබෙන්න පුළුවන්. නමුත් ඒ බැඳීම්වල ඉන්නේ නැතිව ස්වාධීනව කටයුතු කරලා අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිරූපය, ගෞරවනීය ප්‍රතිරූපය ආරක්ෂා කර ගන්නටත්, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කරලා තිබෙන මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා වෙන වාතාවරණයක් ඇති කරන්නටත් කටයුතු කරන්න.

නමුත් එහෙම ගමනක් යන්න ආණ්ඩුව සූදානම් නැති බවයි අපට පෙනෙන්නේ. අධිආරක්ෂක කලාප පිහිටුවීමේ ගැසට් නිවේදනය ගෙනාවා. පුනරුත්ථාපන කාර්යාංශයක් ගෙනාවා. ඒ පුනරුත්ථාපන කාර්යාංශයට තෝරා ගන්නා උදවිය පිළිබඳව තීන්දුව ගන්නේ අධිකරණ විභාගවලින් නොවෙයි; නිශ්චිත ක්‍රමයකින් නොවෙයි.

මෙයා ත්‍රස්තවාදියෙක් කියලා ආරක්ෂක ඇමතිවරයා තීන්දු කළොත්, ඒ පුද්ගලයා පුනරුත්ථාපන කඳවුරට ගෙනයන්න පුළුවන්. මේ නිසා ඒකාධිපති වියරුවකින් කටයුතු කරන විධියට ගමනක් යන බවක් අපට පෙනෙන්නට තිබෙනවා. ඒක භයානකයි. මේ තත්ත්වය හොඳ නැහැ. මේ යන ගමන ජනතාව තේරුම් අරගෙන තිබෙනවා. ඒ නිසා දෙබිඩි රංගනයක යෙදෙන්න එපා. ප්‍රජාතන්ත්‍රවාදී මුහුණුවර පෙන්වමින් ඒකාධිපති වියරුවකින් කටයුතු කරන්න එපා. මර්දනය තමයි ප්‍රශ්නවලට උත්තරය කියලා හිතන්න එපා කියන අනතුරු ඇඟවීම වගකිව යුතු උදවියට ලබා දෙමින්, මගේ කථාව මෙතැනින් අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**

(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)

(The Hon. Deputy Speaker)

ගරු අලි සබ්රි මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 16ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.26]

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)**

(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி - வெளிநாட்டு அலுவல்கள் அமைச்சர்)

(The Hon. M.U.M. Ali Sabry, PC - Minister of Foreign Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත් කීපයක් සම්බන්ධයෙන් විවාද කරන මේ අවස්ථාවේ දී මටත් කථා කරන්නට අවස්ථාව ලබා දීම ගැන මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මේ පනත් කෙටුම්පත්වලට අදාළ සියලු කැබිනට් පත්‍රිකා මා අධිකරණ අමාත්‍ය ධුරය දරන කාලයේ ඉදිරිපත් කරපු ඒවා. ඒ පනත් කෙටුම්පත් අද මේ විධියට එළියට පැමිණීම ගැන මට තිබෙන්නේ නිහතමානී ආඩම්බරයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2019දී මම අධිකරණ ඇමති ධුරය භාර ගන්න කොට නොවිසඳුණු නඩු තිබුණා, 766,000ක්. අද ඒ ප්‍රමාණය ඊටත් වඩා වැඩි ඇති. ඒ නඩු අහන්න ලංකාවේ විනිශ්චයකාරවරුන් හිටියේ 330දෙනෙයි. දිස්ත්‍රික් උසාවිවල විතරක් නඩු 242,000ක් විසඳන්න තිබෙනවා. දිසා විනිසුරුවරුන් 70ක් පමණයි ඉන්නේ. ඒ සම්බන්ධයෙන් අපි සම්පූර්ණයෙන් අධ්‍යයනය කරලා ඒකට විසඳුමක් ලබා ගැනීම සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතුව වෙනම ව්‍යාපෘති කාර්යාලයක් පිහිටෙව්වා. එම ව්‍යාපෘති කාර්යාලය තුළින් අපි කරුණු පහක් අධ්‍යයනය කළා. පළමුවැනි එක තමයි, සම්පූර්ණ යටිතල පහසුකම් සලසලා විනිශ්චයකාරවරුන් ප්‍රමාණය හා උසාවි ප්‍රමාණය වැඩි කිරීම. ඒ අනුව, සුප්‍රීම් උසාවියේ සිටි විනිශ්චයකාරවරුන් 11දෙනෙකුගේ ප්‍රමාණය අවුරුදු 41කට පසුව 17 දෙනෙකු දක්වා වැඩි කරන්නට අපට පුළුවන්කම ලැබුණා. Court of Appeal එකේ විනිශ්චයකාරවරුන් 12දෙනෙක් හිටපු එක 20දෙනෙක් දක්වා වැඩි කරන්නට අපට පුළුවන් වුණා. හිටපු ජනාධිපතිතුමාට හා කැබිනට් මණ්ඩලයට කථා කරලා High Court එකට අලුතින් විනිශ්චයකාරවරුන් 20දෙනෙක් පමණ පත් කළා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! කවුරු හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු ඩයනා ගමගේ මහත්මිය (සංචාරක රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு(திருமதி)டயனா கமகே - சுற்றுலாத்துறை இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Diana Gamage - State Minister of Tourism)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතු ය"යි මම යෝජනා කරනවා.

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேக்கர)
(The Hon. Premalal Jayasekara)

***විසින් ස්ථිර කරන ලදී***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. WEERASUMANA WEERASINGHE *took the Chair.*

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, අපි ඒ කාලය තුළ කරන ලද විවිධ කරුණු රාශියක් හේතු කොටගෙන තමයි මෙවැනි පනත් කෙටුම්පත් කීපයක් ඉදිරිපත් කරන්නට අපට අවශ්‍ය වුණේ කියලා. ගරු අධිකරණ ඇමතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ, එතුමා ඒ සියලු පනත් සංශෝධනය කිරීමේ කාර්යය ඉදිරියට අරගෙන ගිහිල්ලා සම්මත කර ගැනීම සඳහා අද ඉදිරිපත් කර තිබීම ගැන. මෙවැනි පනත් කෙටුම්පත් කීපයක් ඉදිරිපත් කරන්නට අපට අවශ්‍ය වුණේ කරුණු කීපයක් පාදක කරගෙනයි. උදාහරණයක් හැටියට, සුළු හිමිකම් අධිකරණ කාර්ය පටිපාටිය පිළිබඳව ප්‍රකාශ කරන්නට ඕනෑ. සුළු හිමිකම් අධිකරණ කාර්ය පටිපාටිය අපට අවශ්‍ය වුණේ මේ නිසායි. දළ වශයෙන් ලංකාවේ දිස්ත්‍රික් උසාවිවල නඩු 250,000ක් පමණ තිබෙනවා. ඒවා අහන්න අපට තිබෙන්නේ උසාවි 70ක් විතරයි. ඒ නිසා නඩු කොච්චර ඇහුවත් අහලා ඉවර කර ගන්නට බැහැ. මේවායින් අතිවිශාල ප්‍රමාණයක් -සියයට 80ක් විතර- තිබෙන්නේ ඉතා පොඩි නඩු. Credit cards සම්බන්ධ නඩු 30,000ක්, 50,000ක් පමණ තිබෙනවා. ඒ නඩු අතිවිශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ නඩුවක් අහන්න ගතවන කාලයත්, රුපියල් බිලියනයක ගනුදෙනු සම්බන්ධයෙන් වූ නඩුවක් අහන්න ගතවන කාලයත් එක හා සමානයි. ඒ නිසා තමයි සමහර නඩු අවුරුදු 20ක්, 25ක් තිස්සේ අහන්නේ නැති තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ ජනතාවගෙන් මිලියනයකට විනිශ්චයකාරවරුන් කී දෙනෙක් ඉන්න ඕනෑද කියලා ලෝකයේ දර්ශකයක් තිබෙනවා. අපේ Public Service එකේ විශාල ප්‍රමාණයක් හිටියාට, අවශ්‍ය තැන්වලට ප්‍රමාණවත් පුද්ගලයන් සංඛ්‍යාවක් නැහැ. ලංකාවේ සිටින්නේ මිලියනයකට විනිශ්චයකාරවරුන් 15දෙනයි. සමහර දියුණු රටවල මිලියනයකට විනිශ්චයකාරවරුන් 200දෙනෙක් ඉන්නවා. තායිලන්තය වාගේ මධ්‍යම පන්තියේ රටවල මිලියනයකට විනිශ්චයකාරවරුන් 68දෙනෙක් ඉන්නවා. ඉන්දියාව එච්චර ලොකු රටක් වෙලාත්, මිලියනයකට විනිශ්චයකාරවරුන් 22ක් ඉන්නවා. ලංකාවේ ජනගහනයෙන් මිලියනයකට විනිශ්චයකාරවරුන් 15දෙනෙක් ඉන්නවා. අපි දැන් ඒ ප්‍රමාණය 60කින්, 70කින් වැඩි කළා. මේ ප්‍රමාණය වැඩි කරන්න ඕනෑ. නමුත් ආර්ථික අවපාතය හේතුකොටගෙන ඒ බලාපොරොත්තු වූ දේවල් කර ගන්න අපට බැරි වුණා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු ඇමතිතුමනි, -

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)

ඔබතුමා මගේ කාලයෙන් ගන්න එපා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

යහපාලන ආණ්ඩුව කාලයේ එදිනෙදා නඩු අහන අධිකරණ තුනක් නිර්මාණය කළා. ඒවා දැන් අකර්මන්‍ය වෙලා. විශාල වංචා - දූෂණ නඩු සඳහා තේ, ඒවා ඇති කළේ. ඔබතුමාගේ කාලයේත් ඒක අකර්මන්‍ය වෙලා තිබුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමා කථා කරන්න. ගරු මන්ත්‍රීතුමා, ඊළඟ කථාව ඔබතුමාගේ.

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)

ඒ තෝරා ගත් නඩු කිහිපයක් සඳහා විතරයි. ඒකෙන් මේ ප්‍රශ්නයට විසඳුම් ලැබෙන්නේ නැහැ. හැබැයි, විරුද්ධ පාක්ෂිකයාට විරුද්ධව නඩු දාන්න ඒවා හොඳයි. එහෙම නොවෙයි වෙන්න ඕනෑ, ගරු මන්ත්‍රීතුමනි. මේක පොදුවේ හැමෝටම තිබෙන ප්‍රශ්නයක්. තෝරා ගත් නඩු විතරක් අරගෙන, තෝරා ගත් අයට විතරක් නඩු දාලා මේ ප්‍රශ්න විසඳන්න බැහැ. මේක විශාල ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නයට අපි උත්තරයක් දෙනවා නම්, හැමෝටම විසඳුම් ලැබෙන ආකාරයේ උත්තරයක් තමයි දෙන්නට ඕනෑ.

සුළු හිමිකම් අධිකරණයකින් අපි බලාපොරොත්තු වන්නේ මෙයයි.

Court procedures සම්බන්ධ ජාත්‍යන්තර පිළිගත් standards තිබෙනවා. ඒවා ලොකුවට හිතන්න අවශ්‍ය දේවල් නොවෙයි. උදාහරණයක් හැටියට credit card සම්බන්ධ නඩුවක් ගත්තොත්, ඒ සම්බන්ධයෙන් නඩු අහන්න දෙයක් නැහැ. Credit card එක දීලා තිබෙනවා නම්, credit card එකේ statement එක ඇවිල්ලා තිබෙනවා නම්, ඒ ගෙවලා තිබෙන මුදල අඩු කරන්න පුළුවන් නම්, ඒකට හරස් ප්‍රශ්න අහමින් කාලය නාස්ති කරන්න

[ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා]

අවශ්‍යතාවක් නැහැ. 1979 අංක 44 දරන ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනතේ 66 වගන්තිය යටතේ තිබෙන නඩුවක් වාගේ affidavits දාලා කරන්න පුළුවන් විධියට තමයි ඒක හදලා තිබෙන්නේ. මේ ක්‍රියා පටිපාටිය හරියට තේරුම් අරගෙන කටයුතු කළොත් හරි පහසුයි. අධිකරණ ඇමතිතුමා කිව්වා වාගේ, තව දෙයක් තිබෙනවා. නඩුකාරවරු ඒක දකින විධිය හා ප්‍රායෝගිකව භූමියේ ක්‍රියාත්මක කරන ආකාරය අනුව තමයි අවසාන වශයෙන් මෙය ක්‍රියාත්මක වෙන්නේ.

මේ ක්‍රියා පටිපාටිය තවත් එක ක්‍රමයක් බවට පත් කර ගන්නේ නැතිව, ජාත්‍යන්තර වශයෙනුත්, අනික් තැන්වල තියෙන ආකාරයටත් හරියට පාවිච්චි කරලා ප්‍රයෝජනයට ගත්තොත්, සියයට 80ක් වන නඩු, මාස හයකින් විතර සාක්ෂි අහන්නේ නැතිව, ලේඛන මත පදනම් වෙලා ඉවර කරන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එස්ටෝනියාව, චීනය වාගේ රටවල අද AI - Artificial Intelligence - එකෙන් තමයි මේ වාගේ නඩු විසඳන්නේ. ප්‍රශ්නයක් වුණොත් විතරයි, judge කෙනෙකුට යොමු වන්නේ. මොකද, මේවායේ බලන්න දෙයක් නැහැ. Credit card එකක් තියෙනවා නම්, එහෙම නැත්නම් යම් දෙයක් බඩු අරගෙන තියෙනවා නම් එහෙමයි කටයුතු කරන්නේ. මේ සුළු හිමිකම් අධිකරණ කාර්ය පටිපාටිය පනත් කෙටුම්පතින් අපි බලාපොරොත්තු වන්නේ එවැනි කුඩා නඩු ඉතා ඉක්මනට අවසන් කරගෙන, වැදගත් නඩුවලට වැඩි කාලයක් ලබා දෙන්නයි. විශේෂයෙන් ඉඩම් නඩු වාගේ ඒවාට.

ඉඩම් නඩුවක් පැවරුවොත්, එය ඉවර කර ගන්න විධියක් නැහැ. සමහර බෙදුම් නඩු තියෙනවා, අවුරුදු 30ක්- 40ක්. නීතිඥවරයකු හැටියට මම දන්නවා, සමහර බූදල් නඩු තියෙනවා, අවුරුදු 50- 80යි අතර. ඉතින්, මේවා විසඳා ගන්න ඕනෑ. සමහර ඉඩම් නඩුවලට මුලින්ම පෙනී සිටි අයත් මැරිලා, දෙවන පරම්පරාවත් මැරිලා, තුන්වෙනි පරම්පරාව තමයි දැන් නඩු කියන්නේ. මේවාට විසඳුම් ලබා ගැනීම සඳහා තමයි මේ ක්‍රමය අපි ඉදිරිපත් කළේ. මේක තේරුම් අරගෙන හරියට යොදවා ගත්තොත්, පොඩි නඩු ඉක්මනට විසඳන්න පුළුවන් වුණොත්, අපට පුළුවන් ඒ කාලය වැදගත් නඩුවලට යොදවන්න.

ඒ නිසා සැලැස්මක් ඇතිව වෙනම කමිටුවක් දාලා තමයි අපි මේ කටයුතු කළේ. මේ කමිටුවේ නායකත්වය දැරුවේ අභියාචනාධිකරණයේ අපේ විශිෂ්ට විනිශ්චයකාරවරයෙකු ලෙස පිළිගන්නා ආචාර්ය රුවන් ප්‍රනාන්දු මැතිතුමා. එතුමා විශාල කණ්ඩායමක් එක්ක එකතු වෙලා වැඩ කොටස් රාශියක් කළා. අවුරුදු එකහමාරක් තිස්සේ කරපු ඒ පරීක්ෂණවල ප්‍රතිඵලයක් හැටියට තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් වෙලා තිබෙන්නේ. ඒ නිසා මේක හරියට තේරුම් අරගෙන, zero කරන්නේ නැතිව නිසි ලෙස ක්‍රියාවේ යොදවයි කියා අපි බලාපොරොත්තු වෙනවා.

ඊළඟට ඉතාම වැදගත් දේ තමයි, අපි අර මුලින් කියපු විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත. කාලයක් තිස්සේ අපි දැනගෙන හිටියා, නොයෙක් අවස්ථාවල විවිධ විෂ වර්ග එනවාය කියන කාරණය. දැන් අයිස් ගැන කියනවා. අයිස් අරගෙන උසාවියට ගියාට, ඒක මත් ද්‍රව්‍යයක් කියලා හඳුනාගෙන නැහැ. එතකොට මොකක්ද වෙන්නේ? ඔවුන් එළියට දානවා. ඒ හින්දා අපි ඒ තත්ත්වය තේරුම් ගන්න ඕනෑ. ඒ වාගේ අවස්ථා කිහිපයක් තිබුණා. අයිස් සම්බන්ධයෙන් වූ ප්‍රතිපාදන වෙනස් කිරීම ඇතුළුව තවත් අලුත් ද්‍රව්‍ය ඇතුළුව වර්ග 161ක් අපි මේ විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ධ (සංශෝධන) පනත් කෙටුම්පතට ඇතුළත් කරලා තියෙනවා. ඒ නිසා පසුගිය කාලයේ අයිස් ආවා වාගේ තවත් අලුත් දෙයක් ආවොත් ඉදිරියේදී නැවත පනත සංශෝධනය කරන්නට ඕනෑ නැහැ. එහෙම දෙයක් වුණොත් ගරු අධිකරණ ඇමතිතුමාට පුළුවන්, ගැසට් එකකින් ඒ ද්‍රව්‍ය මේ ලැයිස්තුවට එකතු කරන්න.

ඒ හැරුණාම ඔප්පු කිරීමේ භාරය සම්බන්ධයෙනුත් ලොකු ප්‍රශ්නයක් තියෙනවා. හැමෝම දන්නවා, මේ ද්‍රව්‍ය අරගෙන ගිහිල්ලා පරීක්ෂා කරලා වාර්තා එවන්න ඕනෑය කියන එක. නමුත්, මුළු ලංකාවේම මේ සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරින් හිටියේ 13දෙනායි. ඒ, අවුරුද්දකට එන 16,000ක් වූ මත් ද්‍රව්‍ය පරීක්ෂා කරලා වාර්තා එවීම සඳහා. මම හිතන හැටියට දැන් නම් 30දෙනෙක් විතර ඉන්නවා. උදාහරණයක් කිව්වොත්, ඒගොල්ලන් Batticaloa ගිහිල්ලා සාක්ෂි දීලා එනකොට ඒ යන දවස නිවාඩුයි; යන දවසේ සාක්ෂි දෙන්න විධියකුත් නැහැ. එතකොට ඊළඟ දවසේත් නිවාඩුයි. එතකොට ඒ section එකම දින කිහිපයක් සම්පූර්ණයෙන් වහන්න ඕනෑ. ඒ නිලධාරින්ගේ සාක්ෂිවලට වටිනාකමක් දෙන්න, ඔවුන් මුලින්ම ගිහිල්ලා ඒ පිළිබඳව විශේෂයෙන්ම තහවුරු කිරීමක් අවශ්‍ය නැහැ කියලා කියනවා නම්, ඒ තහවුරු කිරීම නොමැතිව සාක්ෂි පිළිගැනීම කරන්න මේ පනත් කෙටුම්පතින් ප්‍රතිපාදන ලබා දීලා තිබෙනවා. ඒකෙන් බලාපොරොත්තු වෙන්නේ නඩු ඉක්මනින් ඇසීම සහ අනවශ්‍ය විධියට ප්‍රමාදවීම වැළැක්වීමයි.

ඊළඟට ගරු අධිකරණ ඇමතිතුමා කරයි කියලා අපි බලාපොරොත්තු වුණේ මෙයයි. මේ නිලධාරින්ගේ සාක්ෂි පරිගණක තාක්ෂණය ඔස්සේ ලබා දීම සඳහා අවස්ථාව ලබා දීම. එතකොට ඒ නිලධාරියාට office එකේ ඉඳලාම සාක්ෂි දෙන්න පුළුවන්. අවශ්‍යම වුණොත් පමණක් ඔහු ගෙන්වා ගන්නවා. එහෙම කළොත් කාලය අඩු කර ගන්න පුළුවන්.

තුන්වෙනි එක තමයි, වැදගත්ම දේ. මේ රටේ සිටින මිනිසුන්ගෙන් ලක්ෂ 5ක් විතර අද වෙනකොට හෙරොයින් ඇතුළු නොයෙකුත් මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා තියෙනවා. ඒ ඇබ්බැහි වෙච්ච සමහර අය පොඩි ළමයි. සමහර අවස්ථාවලදී ඔවුන් ළඟ තිබුණේ ග්‍රෑම් දෙකක වාගේ මත් ද්‍රව්‍ය ප්‍රමාණයක් වෙන්න පුළුවන්.

හුඟක් රටවල තෝරා ගෙන ඉන්නවා, මේකට බලපාන කණ්ඩායම් තුනක් තියෙනවා කියා. එක කණ්ඩායමක් තමයි, මහා පරිමාණයේ මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවෝ. ඔවුන් 100ක් විතර ඇති. දෙවන කණ්ඩායම තමයි, මේවා බෙදා හරින ජාලයේ ඉන්නා අය. ඒ අය 500ක් විතර ඇති. තුන්වන කාණ්ඩය, මේවා බොන අය. ඒ අය ලක්ෂ 5ක් විතර ඇති. නමුත්, අපි පන්නන්නේ ලක්ෂ 5ක් වන බොන අය පස්සේ. ඉතින්, ඇති වැඩක් තියෙනවාද? මේ ප්‍රශ්නය මේවාට ඇබ්බැහිවීම පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. මේ ප්‍රශ්නය මත් ද්‍රව්‍ය පිළිබඳ ප්‍රශ්නයකුත් නොවෙයි. පිටරටවල් නම් මේ ප්‍රශ්නය තේරුම් අරගෙන තියෙන්නේ සෞඛ්‍ය ප්‍රශ්නයක් හැටියටයි. ළඟ තිබුණේ ග්‍රෑම් දෙකකට වඩා අඩු මත් ද්‍රව්‍ය ප්‍රමාණයක් නම්, පෘතුගීසියේ decriminalize කරනවා. එතකොට ඒක criminal offence එකක් නොවෙයි. ඒගොල්ලන් යවන්නේ ඉස්පිරිතාලෙට. එහෙම නැත්නම් පුනරුත්ථාපන කඳවුරකට. නමුත්, අපි කරන්නේ මොකක්ද? ඒගොල්ලන් අල්ලා ගන්නවා; ඇතුළට දානවා; මාස 3ක්, මාස 6ක්, සමහර වෙලාවට මාස 9ක් ඇතුළේ තියා ගන්නවා; ඊට පස්සේ එළියට එනවා. නැවතත් මාසයක් එළියේ ඉන්නවා; නැවත ඇතුළට යනවා.

හැබැයි, නඩු 3,000ක්, 4,000ක් High Court එකේ තිබෙනවා. ඒ නඩු අතර මත් ද්‍රව්‍ය ජාවාරම්කාරයන්ගේ නඩුත් තිබෙනවා. ඒ ජාවාරම්කාරයන් හරි කැමැතියි, ඒගොල්ලන්ගේ නඩුත් මේ අතර තියෙන එකට. මොකද, අර නඩු 3,000-4,000 අතරේ තිබෙන

ඒගොල්ලන්ගේ නඩු එතකොට අහන්නේ නැහැ. පොඩි මිනිසුන්ගේ නඩු ටික අහමින් ඉන්නවා. මත් ද්‍රව්‍ය ග්‍රෑම් 2කට වඩා අඩුවෙන් ළඟ තබාගෙන හිටපු ලක්ෂ 5ක මිනිසුන්ට මරණ දඬුවම දීලා මරා දමන්න අපට පුළුවන්ද? ඒක මොන විහිළුවක්ද?

ඒ නිසා මේ නීති වෙනස් වෙන්න ඕනෑ. මේ නීති ගැන මහා ලොකුවට කථා කරනවා. ග්‍රෑම් දෙකකට වඩා වැඩියෙන් ළඟ තබා ගන්නා හැම දෙනාටම මරණ දඬුවම දුන්නාම මොකක්ද වෙන්නේ? ඒ මරණ දඬුවම ක්‍රියාත්මක වෙන්නේත් නැහැ. මේ අයට ඉන්න කොහේද බන්ධනාගාර හදන්නේ? කී දෙනෙක් තියා ගන්නද? මේවා ගැන බොරුවට කථා කරන්නේ නැතිව ප්‍රායෝගිකව මේ දිහා බලන්න ඕනෑ. ඒ නිසා තමයි ග්‍රෑම් 5ක් දක්වා ඒ ප්‍රමාණය වෙනස් කරලා තිබෙන්නේ. මරණ දඬුවම දෙන්න ළඟ තබා ගන්න ඕනෑ ප්‍රමාණය ඉන්දියාවේ ග්‍රෑම් 10යි; මලයාසියාවේ ග්‍රෑම් 25යි.

ඒ නිසා ප්‍රායෝගිකව මේ තුන්ගොල්ලන් හඳුනා ගන්න ඕනෑ. පුනරුත්ථාපනය කරන්න ඕනෑ අය පුනරුත්ථාපනය කරන්න ඕනෑ. ජාලයට සම්බන්ධ අයගේ ජාලය කඩන්න ඕනෑ. ඉහළින්ම ඉන්න මත් ද්‍රව්‍ය ජාවාරම්කාරයන් පිටුපස හඹා ගිහිල්ලා ඔවුන් විනාශ කරන්න ඕනෑ. ඒ වාගේම ඔවුන්ගේ නඩු ඉක්මනට අහන්නත් ඕනෑ. ඔවුන්ට මරණ දණ්ඩනය දෙන්න ඕනෑ. මරණ දණ්ඩනය ක්‍රියාත්මක කරනවාද, නැද්ද කියන එක ගැන අපි හැමෝම එකතු වෙලා වෙනම කථා කරන්න ඕනෑ. මේ යන විධියට මේ හැමදෙනාගේම නඩු ටික උසාවියට යොමු කරනවා. නමුත් විභාග වෙන්නේ නැහැ. මම ඊයේ මේ පිළිබඳව කථා කරනකොට ගරු ඇමතිතුමා කිව්වා, වෙනම උසාවි ඇති කරන්න එතුමා දැන් සාකච්ඡා කරගෙන යන බව. වෙනම ඇති කරන උසාවිවල මත් ද්‍රව්‍ය ග්‍රෑම් 2ක් ළඟ තබා ගන්නා පුද්ගලයන්ගේ නඩු අහලා වැඩක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ග්‍රෑම් 100ට වඩා ළඟ තබා ගන්නා ජාවාරම්කාරයන්ගේ නඩු 100ක් විතර තෝරාගෙනයි ඒවායේ අහන්න ඕනෑ. ඔවුන් මුළු රටම විනාශ කරනවා. ඒ විතරක් නොවෙයි, ඔවුන්ට මහා සම්බන්ධකම් තිබෙනවා. මේ සමහර අය දේශපාලනඥයන්ටත් සම්බන්ධයි. මේ සම්බන්ධයෙන් කටයුතු කරන අවංක නිලධාරින් අතිවිශාල ප්‍රමාණයක් ඉන්නවා. නමුත්, සමහර නිලධාරින් පවා මේ අයත් එක්ක සම්බන්ධයි. Judgesලාගෙන් judgesලාටත් මත් ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඇප දෙන ප්‍රතිපත්තියේ වෙනසක් තිබෙනවා. මේ සියල්ල සොයා බලා තමයි අපි මේ පිළිබඳව කටයුතු කරන්න ඕනෑ. ඒ තෝරා ගත්ත සියදෙනාට හරියට නඩු පවරලා ඔවුන් පාලනය කරන්න පුළුවන් නම්, එතැනින් තමයි මේ ජාලය කඩන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා මහජන ආරක්ෂක - Public Security - ඇමතිතුමාත්, අධිකරණ, බන්ධනාගාර කටයුතු ඇමතිතුමාත් එකතු වෙලා වෙනම විශේෂ බලකායක් හදලා, පිට රටින් මත් ද්‍රව්‍ය එන එක වළක්වා ගන්නේ කොහොමද කියලා බලන්න ඕනෑ.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
We are initiating it.

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
Very good. ගරු ඇමතිතුමා කියනවා, ඒක පටන් ගත්තා කියලා. මේ සම්බන්ධයෙන් අපි මුලින් සාකච්ඡා කිහිපයක් පැවැත්වූවා, හිටපු ජනාධිපතිතුමා ඉදිරියේ. ඒ සඳහා වෙනම විශේෂ බලකායක් හදන්න ඕනෑ. බලකායක් හදලා, මහා පරිමාණ ජාවාරම්කාරයන් තෝරා ගෙන ඔවුන් විනාශ කරන අතරතුර, ලංකාවට මත් ද්‍රව්‍ය එන මාර්ග අවහිර කරන්න ඕනෑ. ඒ අතරතුරදීම බෙදා හරින ජාලයත් විනාශ කර දමන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ හැරුණු විට පාසල්වල ඉහළ ශ්‍රේණිවල ඉගෙන ගන්නා තරුණ දරුවන්ට මෙහි ආදීනව නැවත නැවත කියා දීලා ඔවුන් මේවායින් මුදා ගැනීමත් ඉතාම වැදගත්. නැත්නම් අපේ රටේ සිටින විශාල පිරිසක් මේ විධියට මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙන්න ගත්තොත්, අපේ රට විනාශ වෙලා යාවි. මට දැන ගන්න ලැබුණා, අවුරුදු දහඅටක දරුවෙක් party එකකට ගිහිල්ලා වැරදීමකින් මත් ද්‍රව්‍ය අරගෙන තිබුණු අවස්ථාවක, ග්‍රෑම් 5ක් ළඟ තබා ගත්තා කියලා ඇතුළට දමපු බව. ඊට අදාළ report එක එනකොට මාස හයක් ගතවෙලා. Report එක ආවේ, මිලිග්‍රෑම් එකක -ග්‍රෑම් එකෙනුත් දහයෙන් එකක්- ප්‍රමාණයක් කියලා. හැබැයි, report එක එන්න මාස 6ක් ගත වුණා. ඒ ළමයා එතෙක් හිටියේ බන්ධනාගාරය ඇතුළේ. එතකොට ඒ ළමයා විනාශ වෙලා අවසන්. ප්‍රේමලාල් ජයසේකර රාජ්‍ය ඇමතිතුමා මේ වෙලාවේ මේ ගරු සභාවේ ඉන්නවා. එතුමාත් මේ ගැන දන්නවා. බන්ධනාගාරයක් ඇතුළට ගියාට පසුව, ඒ දරුවෝ එතැන නිකම් තියාගෙන ඉන්නකොට සම්බන්ධ වෙන්නේ underworld එකට, සම්බන්ධ වෙන්නේ මත් ද්‍රව්‍ය ජාලයට, සම්බන්ධ වෙන්නේ විනාශයට. ඒ නිසා අපි කරන්න ඕනෑ, පොඩි ළමයි සහ මත් ද්‍රව්‍ය ග්‍රෑම් 2කට වඩා අඩුවෙන් ළඟ තබා ගන්නා අය පුනරුත්ථාපනය කිරීම. ඒ අයට වෛද්‍ය උපදෙස් ලබා දීම. දැන් ඒ සඳහා කටයුතු කරන්න යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. නායකත්වය ලබා දීලා ඒ වැඩ කටයුතු කිරීම සම්බන්ධයෙන් ගරු අධිකරණ, බන්ධනාගාර කටයුතු ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා. පොදුවේ කියපු ආකාරයට මෙහි විශාල වෙනසක් තිබෙනවා.

මම තව එක කරුණක් කියන්න ඕනෑ. ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහත්මයාත් කිව්වා, ගරු රවුෆ් හකීම් මහත්මයාත් කිව්වා, ඉංග්‍රීසි භාෂාව එක පාරටම Sri Lanka Law College එකට හඳුන්වා දුන්නා කියලා. ඒක වැරදියි. 2020දී ඉංග්‍රීසි භාෂාව හඳුන්වා දෙනකොට අවුරුදු 3ක කාලයක් ලබා දුන්නා. 2020දී නොවෙයි, 2021දී නොවෙයි, 2022දී තමයි මෙය ක්‍රියාත්මක කරන්නේ කියලා. ඒ අනුව, 2022 වර්ෂයේ සිට පළමුවැනි අවුරුද්දේ ඔබට papers 3ක් ඉංග්‍රීසි භාෂාවෙන් කරන්න වෙන බව ඔවුන්ට කිව්වා.

2024, දෙවැනි අවුරුද්දේ papers 5ක් කරන්න වෙනවා. අවසාන වසරේ papers සියල්ල ඉංග්‍රීසි භාෂාවෙන් කරන්න වෙනවා. මේකට උත්සාහ කරන්න කියලා Council of Legal Education එක අපට කිව්වේ ඇයි? අමාරුවෙන් හෝ ඉංග්‍රීසි ඉගෙන ගෙන එළියට ආවාට පස්සේ ඒ තරගයට මුහුණ දෙන්න පුළුවන් නීතිඥවරයෙක් අපි බිහි කරනවා ද, නැත්නම් දෙවැනි පන්තියේ නීතිඥවරයෙක් බිහි කරනවා ද? ඉන්දියාවේ තිබෙන හින්දි භාෂාවෙන් උගන්වන law faculty එකක් කියන්න? එවැනි එක faculty එකක්වත් නැහැ. මේ වරද අපි නිවැරදි කර ගන්න ඕනෑ. හැබැයි, ඒකේ ව්‍යතිරේකයක් තිබෙනවා. අපි දන්නවා, Open University එකේ ඉගෙන ගන්නා දරුවන්ට එක පාරටම ඇවිල්ලා Englishවලින් උත්තර ලියන්න බැහැ කියලා. University of Jaffna එකේත් English introduce කරලා ඉවරයි. පේරාදෙණියේත් Englishවලින් තමයි උගන්වන්නේ. හැබැයි, කොළඹ උගන්වන්න දෙන්නේ නැහැ. ප්‍රශ්නය තිබෙන්නේ ළමයින්ට නොවෙයි, සමහර lecturersලාටයි. මොකද, ඒ ගොල්ලන්ට උගන්වන්න පුළුවන් වෙයි ද කියලා. ඒ නිසා අපි මේ ක්‍රමය ක්‍රියාත්මක වෙන තැනටයි යන්න ඕනෑ. ඒ ගොල්ලන්ට අමාරු නම් සභාවට බලය දීලා තිබෙනවා, ඒ ගොල්ලන්ට තව අවුරුදු දෙකක් වැඩි කරන්න. ඒ නිසා මම හිතනවා මේක වැරදි විධියට අර්ථ දක්වන්න හොඳ නැහැ කියලා. ඉතාම සද්භාවයෙන් තමයි මේ කටයුත්ත කරන්නේ.

[ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා]

මේ රටේ සාමාන්‍ය මිනිසුන්ගේ දරුවෝ තමයි university එකට එන්නේ. එහෙම university එකට එන දරුවෝ මොට කරලා එළියට දමන එක නොවෙයි, මුවහත් කරලා එළියට දාන්න ඕනෑ. මුවහත් කරනකොට වැදගත් ම දේ තමයි, ඔවුන්ට නවීන තාක්ෂණය ලබා දෙන එක; ඉංග්‍රීසි භාෂාව ලබා දෙන එක. එහෙම නැත්නම් වෙන්නේ මොකක්ද? ලංකාවේ ඉන්න දක්ෂතම දරුවෝ ටික university එකට ගෙන්වනවා; අවුරුදු තුනක් university එක ඇතුළේ තියාගෙන කට පාඩම් කරවලා එළියට දානවා; ඔවුන්ට කවදාවත් රස්සාවක් හොයා ගන්න බැහැ. ඊට පස්සේ ඔවුන් හදාගන්නවා, "රැකියා විරහිත උපාධිධාරීන්ගේ සංගමය" කියලා එකක්. ඊට පස්සේ රජයේ රස්සා ඉල්ලනවා. එතකොට තිබෙන රස්සාවලට වැඩි රස්සා ප්‍රමාණයකට රජයේ රස්සාවලට දානවා. එතැනට ගිහිල්ලාත් වෙනසක් කරන්නේ නැහැ, එතැනත් වෘත්තීය සමිති හදා ගන්නවා. ඉතින් රට විනාශ වෙනවා. ඒක විෂම චක්‍රයක්. ඒ නිසා මේ පිළිබඳ තේරුම් අරගෙන රටට ගැළපෙන, අදට ගැළපෙන, ජාත්‍යන්තරයට ගැළපෙන අධ්‍යාපන ක්‍රමයක් සඳහා දායක වෙන්න කියලා ඉල්ලමින් මම නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් මාන්නප්පෙරුම මහතා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.43]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසරයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා සද්භාවයෙන් කොපමණ අණපනත්, කෙටුම්පත් ගෙනාවත් මේ අණපනත්වලින් රටේ නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒක තමයි රටේ ජනතාව පිළිගන්නා දේ. නීතිය හැමට එක සේ බලපාන්නේ නැති තත්ත්වයක් රාජ්‍ය තුළ සිද්ධ වෙනවා. ඒ නිසා මම හිතනවා, අලුත් අපි අණපනත් ගෙනෙන්න ඉස්සර වෙලා මේ රටේ නීතිය ක්‍රියාත්මක කරන යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා, අපක්ෂපාතී යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම සඳහා අපි වෙහෙසෙන්න ඕනෑ කියලා. අර කියනවා වාගේ, අපි මොන නීති හැදුවත් නීති ක්‍රියාත්මක කරන අය තමයි නීති කඩන්නේ.

ගරු ඇමතිතුමනි, Hiru CIA Newsවලින් පෙන්නුවා, ත්‍රිකුණාමලයේ සාගි නගර්වල වැලි කැණීමේ ජාවාරමක් සිද්ධ වෙනවා කියලා. මේ ජාවාරම කරන්නේ කවුද? ඒ නීතිය ක්‍රියාත්මක කරන්න ඉන්න අධ්‍යක්ෂ ජනරාල්වරයා. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් සජ්ජන ද සිල්වා මහත්තයා තමයි මේ ජාවාරමට වැරදි විදියට බලපත්‍ර දීලා තිබෙන්නේ. මේ ජාවාරමට වැලි බලපත්‍රය ගත්තේ කවුද? භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ වර්තමාන සභාපතිවරයා. එතකොට මේ සභාපතිවරයායි, අධ්‍යක්ෂ ජනරාල්වරයායි වැලි ජාවාරම කරනවා නම්, ඒ ගැන තිබෙන අණපනත් ගැන කථා කරලා වැඩක් තිබෙනවාද? අපි මේ අණපනත් හදලා දෙන්නේ කාටද ක්‍රියාත්මක කරන්න කියලා? භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ වර්තමාන සභාපතිවරයා මංජුල සෙනරත් මහත්මයා. එතුමාට අයිති Uptown Ventures සමාගම තමයි වැලි කැණීම් කරන්නේ. ඒ සභාපතිවරයා වැරදි විදියට නීතිරීති උල්ලංඝනය කරලා, අණපනත් කඩලා තිබෙනවා. ඒ බලපත්‍රය දීලා තිබෙන්නේ අධ්‍යක්ෂ ජනරාල්වරයා. එහෙම නම් මේක, "වැටත් නියරත් ගොයම් කා නම් කාට පවසම් ඒ අමාරුව" කිව්වා වාගේ දෙයක්. ඒ දෙන්නාම ආරක්ෂා කරන්නේ ඇමතිවරයා. වග කීමෙන් කියනවා, ඒ දෙන්නාම ආරක්ෂා කරන්නේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය භාරව ඉන්න ඇමතිවරයා කියලා. එතුමා සභාපතිවරයාත් ආරක්ෂා කරනවා, අධ්‍යක්ෂ ජනරාල්වරයාත් ආරක්ෂා කරනවා. එහෙම නම් මේ ගරු සභාවට ඇවිල්ලා නීති හදලා, අත උස්සලා ඇමති වශයෙන් ඉඳගෙන හොරු ටික ආරක්ෂා කරනවා නම්, මේ රටේ නීති හදන එකේ තේරුමක් තිබෙනවාද? අපි ව්‍යවස්ථාදායක සභාවට ඇවිල්ලා කාලය නාස්ති කරන එකේ තේරුමක් තිබෙනවාද කියන එක මම විශේෂයෙන් අහනවා.

පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයා තමයි වෛද්‍ය අනිල් ජාසිංහ මැතිතුමා. එතුමා පරීක්ෂාවක් කරලා කිව්වා, "මේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පත්වීමට නීතිමය අයිතියක් නැහැ. වහාම එතුමා හිටපු තැනට යවන්න ඕනෑ" කියලා. ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයා අවුරුද්දකට ඉස්සෙල්ලා ඇමතිවරයාට ඒ නිර්දේශය ලබා දීලා තිබිය දී අද වනතුරු ඒක ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

පනත අනුව එහි විමර්ශන නිලධාරියා වෙන්නේ ඇමතිවරයා. එතකොට අමාත්‍යාංශ ලේකම්වරයා කියන දේ ඇමතිවරයා ගණන් ගන්නේ නැහැ. අන්තිමට මොකක්ද වෙලා තිබෙන්නේ? ඇමතිවරයා නීති විරෝධී පත්වීම් කරපු අධ්‍යක්ෂ ජනරාල්වරයා වැලි ජාවාරමේ ඉත්තෙක් බවට පත් කර ගෙන ඔහුගෙන් වැඩ ගන්නවා. ඒ නිසා මම අහනවා මේකේ තේරුමක් තිබෙනවාද කියලා. විශේෂයෙන්ම කියනවා නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වර්තමාන සභාපතිවරයාට වැලි කැණීම් බලපත්‍රය දෙනකොට 1992 අංක 33 දරන පතල් සහ ඛනිජ ද්‍රව්‍ය පනත සහ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත උල්ලංඝනය කළා. අමාත්‍යාංශයේ ලේකම්වරයා මේ ගැන පරීක්ෂණයක් කරලා, භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල් සජ්ජන ද සිල්වා මහත්මයාට charge sheet එකක් දීලා තිබෙනවා. ඇමතිවරයා ඒක ගණන් අරගෙන නැහැ. ඒක හමස් පෙට්ටියට දමාගෙන තියාගෙන ඉන්නවා. ඉතින් මේ රටේ නීතියක් හැදුවාට වැඩක් තිබෙනවාද? ගරු අධිකරණ ඇමතිතුමනි, ඔබතුමා අණපනත් ගෙනාවාට වැඩක් තිබෙනවාද? මේවා ක්‍රියාත්මක කළ යුතු රාජ්‍ය නිලධාරින්, ඇමතිවරු මේවා ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඉතින්, මෙතැනට ඇවිල්ලා අත උස්සලා මේ නීති සම්මත කළාට වැඩක් තිබෙනවාද? මේ පැත්තෙන් ඇවිල්ලා අත උස්සලා,-

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேக்கர)
(The Hon. Premalal Jayasekara)
Sir, I rise to a point of Order.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
කරුණාකර, මගේ කථාවෙන් පසු ඔබතුමා කථා කරන්න. මගේ වෙලාව දෙන්න බැහැ.

ඇමතිවරයා නම් ඒ නීති කඩන්නේ, එතුමා මේ ගරු සභාවට ඇවිල්ලා අත උස්සලා මේ පනත් කෙටුම්පත් සම්මත කළාට වැඩක් තිබෙනවාද? වැලි ජාවාරම් කරන කෙනෙකු භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ සභාපති වශයෙන් පත් කරන්න ඇමතිවරයාට සදාචාරාත්මක අයිතියක් තිබෙනවාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ප්‍රේමලාල් ජයසේකර රාජ්‍ය ඇමතිතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேக்கர)
(The Hon. Premalal Jayasekara)
ගරු මන්ත්‍රීතුමනි, ඊයේ ඔබතුමන්ලාගේ ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා ගහ විනාශ කරන්න ඉඩ දුන්නේ නැත්නම් ජනතාව එක්ක පාරට බහිනවා කිව්වා. ඒවාත් පරිසර හානි නේ. ඔබතුමා ඒවා ගැන කථා කරන්නේ නැද්ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක point of Order එකක් නොවෙයි, ගරු රාජ්‍ය ඇමතිතුමනි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව කරගෙන යන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ආණ්ඩු පක්ෂයේ -පොහොට්ටුවේ- ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් මම අහනවා, ඔබතුමාගේ පක්ෂයේ ඉන්න කෙනෙක් වැරැද්දක් කළාම, විපක්ෂය පැත්තට ඇඟිල්ල දිගු කරලා ඒක හරියි කියන එකද ඔබතුමා කියන්නේ? විළි ලජ්ජා නැති මන්ත්‍රීකමක් නේ තිබෙන්නේ. ඒ ගොල්ලන් වැරැදි කරනවා නම් අපිත් වැරැදි කරන්න ඕනෑ. ඒකද තත්ත්වය? ඒක නිසා මම කියනවා, මේ වැඩේ තේරුමක් නැහැ කියලා. මේ රටේ නීති හැදුවාට, නීති සම්මත කළාට තේරුමක් නැහැ.

අනික් කාරණය තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමතිවරයා කොහොමද වැලි කැණීම් කරන වැලි ජාවාරම්කාරයෙක් ඒ ආයතනයේ සභාපති කරන්නේ? ඇමතිවරයා කොහොමද, ව්‍යාපාරයක් වශයෙන් වැලි ජාවාරම් කරන පුද්ගලයෙක් අරගෙන ඇවිල්ලා ඒ සභාපති පුටුවේ ඉන්දවන්නේ? එවැනි පුද්ගලයෙකු ඒ බලපත්‍ර දෙන ආයතනයේ සභාපති කරන්න එතුමාට සදාචාරාත්මක අයිතියක් තිබෙනවාද? ඉතින් රටක් හැදෙයිද? ඒ නිසා "වැටත් නියරත් ගොයම් කා නම් කාට පවසම් ඒ අමාරුව" කියලා තමයි අහන්න වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. ගරු අධිකරණ ඇමතිතුමනි, එදා ඔබතුමා අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරද්දී, මාත් එහි සාමාජිකයකුව සිටියදී මේ රටේ විශාල වශයෙන් මූල්‍ය වංචා සිදුවන නිසා සද්භාවයෙන් යුතුව එදිනෙදා නඩු අහන අධිකරණයක් ගෙනාවා. අද ඒ අධිකරණයට මොකක්ද වෙලා තිබෙන්නේ? ඒ විතරක් නොවෙයි ගරු ඇමතිතුමනි. මහා පරිමාණයේ මූල්‍ය වංචා සම්බන්ධ යහ පාලන ආණ්ඩුවෙන් පනවපු නඩු 41ක් technical faults කියලා ඉවත ගියා. අධිකරණයෙන් ඒ නඩු විභාග කරලා නොව, technical faults කියලා තමයි ඒ නඩුවට අදාළ චූදිතයන් නිදහස් කළේ. එහෙම නම්, ඒ නඩු නැවත පවරන්නේ නැද්ද? ඇයි, නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඒ නඩු නැවත පවරන්නේ නැතිව කල් මරන්නේ කියලා මම ප්‍රශ්න කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.49]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

අද මේ ගරු සභාවේදී ඉතාම කාලෝචිත මාතෘකා කිහිපයක් සාකච්ඡා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා අපි දැනගෙන සිටියේ සාමාන්‍යයෙන් මේ රටේ පහළ මට්ටමේ, එහෙම නැත්නම් යම් රැකියාවක් කරන්නේ නැතිව රස්තියාදු ගසමින් කටයුතු කරන පිරිස් තමයි මත් ද්‍රව්‍ය භාවිත කරන්නේ කියලා. හැබැයි, අද වෙනකොට පාසල් දරුවන්, තරුණ ප්‍රජාව වැනි මේ රටේ අනාගතය භාර ගන්නට සිටින පිරිස් තමයි මේ මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා සිටින්නේ.

මේ රටේ නීති සම්පාදනය කරන ප්‍රධාන ආයතනය හැටියට අපට මේ සඳහා නීති සම්පාදනය කරන්න වගකීමක් තිබෙනවා. හැබැයි, අපේ ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා කිව්වා වාගේ, අපි මේ පාර්ලිමේන්තුව තුළ මොන තරම් නීති සම්පාදනය කළත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නීති මහ පොළවේ ක්‍රියාත්මක කළ යුතුයි. පැහැදිලිවම අපි දන්නවා මේ හදන නීතිවලින් රිංගා යන්න යම් යම් අයට පුළුවන්කම ලැබිලා තිබෙන බව. ඒකට හැමෝම නොවෙයි, දූෂිත රාජ්‍ය නිලධාරින්, පොලීසියේ දූෂිත නිලධාරින්, ඒ වාගේම නීති පද්ධතියේ කටයුතු කරන සමහර නිලධාරින් වගකියන්න ඕනෑ.

අපි උදාහරණයක් ගනිමු. වරදක් කළ කෙනෙකු හසු වුණාම, යම් කාලයකට අත්අඩංගුවට පත් වෙලා ඉඳලා, ඊට පසුව ඇප ලැබුණු පසු නැවතත් ඒ ජාවාරමේම නියැළෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙනකොට මහ දවාලේ ප්‍රසිද්ධියේ මිනිසුන්ට වෙඩි තියලා මරන යුගයක් මේ ආරම්භ වෙලා තිබෙන්නේ. පාතාලය විසින් කිසිම ඉවක්-බවක් නැතුව, බයක් නැතුව ප්‍රසිද්ධියේ මේ රටේ මිනිස්සු ඝාතනය කරනවා. ඒ අය එහෙම කරන කොට, සමහර වෙලාවට පාරේ යන අහිංසක මිනිසුන්ටත් වෙඩි වැදිලා ජීවිත අහිමි වුණු අවස්ථා අපි දැකලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම තත්ත්වයක් තුළ අපි බලන්න ඕනෑ, මේ සමස්ත මත් ද්‍රව්‍ය ජාවාරම නතර කරන්නේ කොහොමද, ඒකට තිත තබන්නේ කොහොමද කියලා.

අපි දන්නවා, අපේ රට අද මත් ද්‍රව්‍ය මධ්‍යස්ථානයක් -drug hub - බවට පත් වී තිබෙන බව. මේ මත් ද්‍රව්‍ය නැව්වලින් එනවා, බෝට්ටුවලින් එනවා, ධීවර බෝට්ටුවලින් එනවා. මේ විධියට මේ රට තුළට මත් ද්‍රව්‍ය ඉතා අධික ප්‍රමාණයක් එනවා. මේ ළඟදීත් කෝටි 600කට අධික වටිනාකමකින් යුත් හෙරොයින් මත් ද්‍රව්‍ය තොගයක් හසු වුණා. මම හිතන විධියට රට තුළ එච්චර ප්‍රමාණයක් භාවිත කරන්නත් බැහැ. ඒ නිසා අපි බලන්න ඕනෑ, මේ මත් ද්‍රව්‍ය යන්නේ කොහේටද, මේ මත් ද්‍රව්‍ය එන්නේ කොහෙන්ද කියලා. අපි ඒ මුල් හඳුනාගෙන අවසන් කළොත්, හරියට ඒ රෝගය හඳුනාගෙන ඒ රෝගයට ප්‍රතිකාර කරනවා වාගේ මත් ද්‍රව්‍ය ගෙනෙන මූලස්ථාන හඳුනාගෙන, ඒක වැළැක්වුවොත් අපේ රටේ මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වන තරුණ-තරුණියන්ගේ ජීවිත යම් ආකාරයකින් ආරක්ෂා කරගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මත් ද්‍රව්‍ය බෙදා හැරීමේ යන්ත්‍රණයක් තිබෙනවා. ඒ බෙදා හැරීමේ යන්ත්‍රණය නතර කරගන්නත් අපට පුළුවන්කම ලැබුණොත් ඒ තුළිනුත් මත්

[ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙන අපේ රටේ තරුණ-තරුණියන්ගේ ජීවිත ආරක්ෂා කරගන්න පුළුවන් වෙයි කියලා මා විශ්වාස කරනවා. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වුණු කෙනා අල්ලාගෙන, ඊට පසුව ඒවා බෙදා හැරීමේ යන්ත්‍රණය සොයා ගෙන, ඊට පසුව එහි මූලාරම්භය දක්වා යන්න පුළුවන් කියලා අපි කල්පනා කරනවා නම්, ඒක කොයි තරම් ප්‍රායෝගිකද කියන එක පිළිබඳව මට සාධාරණ ප්‍රශ්නයක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි කියන්නේ මේ රටේ මත් ද්‍රව්‍ය සම්බන්ධ කාරණාවලට දෙන්න පුළුවන් උපරිම දඬුවම දීලා තිත තැබිය යුතුයි කියන එකයි. පිලිපීනය, සිංගප්පූරුව වැනි රටවල් ලබා දෙන දැඩි දඬුවම් අපේ රටට මත් ද්‍රව්‍ය ගෙන්වන ජාවාරම්කරුවන්ටත් ලබා දිය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා නියෝජනය කරන ආසනය ගැන කථා කරනවා නම්, ඒක ධීවර ජනතාව බහුතරයක් සිටින ආසනයක්. අද වෙනකොට අපේ ධීවර ජනතාව දැඩි අර්බුදයකට පත් වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකට හේතුව මේකයි. ධීවර ජනතාවට විශේෂයෙන්ම කුඩා බෝට්ටු හිමියන්ට අවශ්‍ය වෙන්නේ ලාම්පු තෙල්. අද වනවිට ලාම්පු තෙල්වල දැවැන්ත හිඟයක් තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මේ රටේ ලාම්පු තෙල් මිල වැඩි කළා. ලාම්පු තෙල් මිල රුපියල් 253කින් වැඩි කළාම, ඒ මුදලට ලාම්පු තෙල් අරගෙන ධීවර ජනතාවට ධීවර කර්මාන්තයේ නියැළෙන්න පුළුවන්කමක් නැහැ. ඊට අමතරව ඒගොල්ලන් 2T oilවලට ගෙවන්නත් ඕනෑ. ඒවායේ මිල වැඩි වෙලා තිබෙනවා, ධීවර ආම්පන්නවල මිල වැඩි වෙලා තිබෙනවා, ධීවර බෝට්ටුවල මිල වැඩි වෙලා තිබෙනවා. මේ කරුණුත් එක්ක බැලුවාම, ධීවරයෙකුට මුහුදු යන්න දවසකට රුපියල් 50,000ක විතර මුදලක් වැය වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔවුන් හැම දාම මුහුදු ගියා කියලා ඒ අයට හැම දාම මාළු හම්බ වෙන්නේත් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මට තව මිනිත්තුවක් ලබා දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ නිසා මේ ධීවර ජනතාවට යම් කිසි සහනයක් ලබා දෙන්න කියන ඉල්ලීම අපි මේ ආණ්ඩුවෙන් කරනවා. අපි දැක්කා, චීන රජය විසින් ධීවර ජනතාවට සහ කෘෂිකර්මාන්තයේ නියැළෙන ජනතාවට ඩීසල් ලීටර් මිලියන 10ක් ලබා දෙන්න කටයුතු කරනවා කියා තිබුණා. අපි ස්තුතිවන්ත වෙනවා, චීන රජයට. හැබැයි, එහිදී බොහොම විනිවිදභාවයෙන් යුතුව අපේ ධීවර ජනතාවටත්, කෘෂිකාර්මික කටයුතුවල නියැළෙන ජනතාවටත් ඒ ඉන්ධන ලබා දෙන්න කියා මම රජයෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩයනා ගමගේ රාජ්‍ය ඇමතිතුමිය. ඔබතුමියට විනාඩි 11ක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා. 1.55]

**ගරු ඩයනා ගමගේ මහත්මිය (සංචාරක රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) டயனா கமகே - சுற்றுலாத்துறை இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Diana Gamage - State Minister of Tourism)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

ඇත්තවශයෙන්ම, අද අපි සාකච්ඡා කරන දිනට නියමිත කටයුතු අතර, විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පතත් දෙවනිවර කියැවීමට ඉදිරිපත් කර තිබෙනවා. අපි දන්නවා, පාසල් ළමුන් පවා අද මේවාට ඇබ්බැහි වෙලා තිබෙන තත්ත්වයක් රට තුළ තිබෙන බව.

අපි සියලුදෙනාම ඒ ගැන කථා කරලා තිබෙනවා. මේ ගැන අපි හැම දාමත් කථා කරනවා. අහිංසක දරුවෝ විෂ මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම නිසා අපේ රටේ අම්මලා, තාත්තලා විශාල පීඩාවක් විඳිනවා. මම අපේ ගරු අලි සබ්රි ඇමතිතුමාගේ කථාවට සියයට සියයක්ම එකඟයි. එතුමා ඒ කියපු සෑම වචනයක්ම ඇත්තටම අපි හිතට ගත යුතුයි. මොකද, එතුමා කියපු ඒ සෑම වචනයකම තේරුමක් තිබෙනවා. මේ රට තුළ මත් ද්‍රව්‍ය business කරන මිනිස්සු ඉන්නවා. හැබැයි, අපි කරන්නේ මත් ද්‍රව්‍ය addictsලා, ඒ කියන්නේ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙච්ච මිනිස්සු පස්සේ දුවන එකයි. එතුමා කිව්වා වාගේම, අපි හොයන්නේ නැහැ මෙතැනට මේ ළමයින් වැටුණේ කොහොමද, මිනිස්සු මේවාට ඇබ්බැහිවෙලා තිබෙන්නේ කොහොමද කියලා. ඒ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ මේ මත් ද්‍රව්‍ය අපේ රට ඇතුළට එන නිසා. මේ මත් ද්‍රව්‍ය රටට එන ක්‍රමය අපි තවම නවත්වලා නැහැ. මේක දැන් අවුරුදු ගණනාවක් තිස්සේ වෙන දෙයක්. ඒ නිසා එතුමා කිව්වා වාගේ අපි ඇත්ත වශයෙන්ම මේ මත් ද්‍රව්‍ය ජාවාරම් කරන මිනිස්සුන්ට දැඩි දඬුවම් ගේන්න ඕනෑ. එවැනි අයට මරණ දඬුවම දීලා මදි. මම කියන්නේ, අඩුම ගාණේ මේ රට තුළ මත් ද්‍රව්‍යවලට සම්බන්ධ වැරදිකරුවන්ටවත් මරණ දඬුවම ක්‍රියාත්මක කළ යුතුයි කියලායි. මොකද, එහෙම නැත්නම් අපට රටක් විධියට මේ විධියට යන්න බැහැ.

දියුණු රටවල පාසල්වලට පොලීසියෙන් හරි, Narcotics Bureau එකෙන් හරි ගිහිල්ලා, ඒ පාසල් දරුවන්ට මත් ද්‍රව්‍ය සම්බන්ධයෙන් අවබෝධයක් දෙනවා. ඔවුන් ඒ පාසල් තුළට ගිහිල්ලා මේ මත් ද්‍රව්‍යවල තිබෙන භයානකකම ගැන කියලා දෙනවා. මම විශ්වාස කරනවා, අපිත් අපේ රටේ සෑම පාසලක් තුළම ඒ දේ කළ යුතුයි කියලා. අපිත් අපේ රටේ පාසල් තුළ මෙවැනි වැඩසටහන් ස්ථාපනය කළ යුතුයි. ඒ වාගේම, පාසල් තුළට මත් ද්‍රව්‍ය ඇතුළුවන එක නවත්වන්න නම්, අපි පාසල් දරුවන් තුළින්ම ඔත්තු බැලීමේ සේවාවක් ඇති කළ යුතුයි. ගොඩක් අය කියනවා, මත්කුඩු ග්‍රෑම් දෙකක් හෝ ඊට වැඩියෙන් සන්තකයේ තියාගෙන අත්අඩංගුවට ගත්ත අය රිමාන්ඩ් කරන්න ඕනෑ කියලා. එවැනි අය පසුගිය කාලයේ අපි රිමාන්ඩ් කළා. මේ විධියට මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවූ අය රිමාන්ඩ් එකේ දමලා අපට මේ ප්‍රශ්නයෙන් ගැළවෙන්න පුළුවන් ද? මේ සභාවේදී කියැවුණා වාගේ මේ රට තුළ drug addictsලා ලක්ෂ 5ක් විතර ඉන්නවා. අපි මේ ගොල්ලන් අත්අඩංගුවට අරගෙන බන්ධනාගාරගත කිරීම තුළින් මොකක්ද වෙන්නේ? අලි සබ්රි මැතිතුමා කිව්වා වාගේ ඊට පස්සේ එතැන හැදෙන්නේ පාතාලයක්. මේ drugsවලට ඇබ්බැහි වෙච්ච කෙනා බන්ධනාගාරගත වෙලා නැවත එළියට එන්නේ සම්පූර්ණයෙන්ම drug dealer කෙනෙක් වෙලා; පාතාලයත් එක්ක එකතු වෙලා. ඒ ගොල්ලන් තමයි ඊට පස්සේ සියලු drug deals කරන්නේ. මේ අය හිරගෙදරට ගියාට පස්සේ ඒක

ඇතුළේදී සොයා ගන්නවා, ඒවා කරන ක්‍රම සහ විධි. ඒ විතරක් නොවෙයි, මත් ද්‍රව්‍ය පාවිච්චි කරන හැම කෙනාම මේ විධියට රිමාන්ඩ් බාරයට පත් කරලා හිර ගෙදරට යවන්න ගත්තොත් මොකක්ද වෙන්නේ? එක සිරකරුවෙක් වෙනුවෙන් අපි දිනකට මේ රටේ ජනතාවගේ බදු මුදල්වලින් රුපියල් 800ක් වැය කරනවා. එතකොට ඔබතුමන්ලාට හිතා ගන්න පුළුවන්ද අපේ රටේ සිටින සිරකරුවන්ට කොච්චර මුදලක් අපි දිනකට වැය කරනවා ද කියලා.

ඒ නිසා අපි කළ යුත්තේ ඒ ගොල්ලන් සිරගත කිරීම නොවෙයි. අර කිව්වා වාගේ ග්‍රෑම් 2ක් සන්තකයේ තිබෙනවා කියන්නේ ඇබ්බැහි වූ කෙනෙකුගේ; drug addict කෙනෙකුගේ. එතකොට, ඒ drug addictව අපි අනිවාර්යයෙන්ම නීති මඟින් යහපත් පැත්තට ගන්න එකයි කරන්න ඕනෑ. මම විශ්වාස කරන්නේ "voluntary" කියලා නොවෙයි. Rehabilitation should be made compulsory by the justice system. It should be compulsory and not voluntary. ඒක හින්දා ඒක ඒ විධියට විය යුතුමයි. එම නිසා මම හිතනවා ඒක දැන් වෙනස් විය යුතුයි කියලා. දැන් "voluntary" කියන එක වෙනස් කරලා අධිකරණයෙන්ම මේ මත්කුඩුවලට ඇබ්බැහි වෙච්ච අය පුනරුත්ථාපනයට යැවිය යුතුමයි. මම විශ්වාස කරනවා, අපේ ගරු ඇමතිතුමා ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් සුදුසු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරයි කියලා.

ඒ වාගේම, මම කිව යුතු තවත් දෙයක් තිබෙනවා. විපක්ෂ නායකතුමනි, ඔබතුමා කරුණාකරලා උද්ඝෝෂණ කරන්න පාරට බහින වැඩේ නවත්වන්න. මොකද, දැන් මේ රට බංකොලොත්භාවයෙන් එළියට ගන්න අපට ඕනෑවෙලා තිබෙනවා. මේ වන විටත් අපේ රටට යම්කිසි ප්‍රමාණයක සංචාරකයන් පිරිසක් ඇවිත් ඉන්නවා; එමින් සිටිනවා. ඒ හින්දා ඔබතුමා විපක්ෂ නායකවරයා හැටියට කළ යුත්තේ මේ දේ නොවෙයි. ඔබතුමා කරන්න ඕනෑ පාරට බහින එක නොවෙයි. ඔබතුමා කරන්න ඕනෑ සංචාරකයන් අපේ රටට පැමිණීම කඩාකප්පල් කරන එක නොවෙයි. ඔබතුමා කරුණාකරලා මේ වැඩේ නවත්වන්න. මේ රටට, රටේ මිනිස්සුන්ට, මේ ජාතියට ඔබතුමාගේ කිසියම් ආදරයක් තිබෙනවා නම්, මේ වැඩේ නවත්වන්න. ඔබතුමා ඒක කරන්න එපා. ඔබතුමා එදා පාරට බැස්සාට පස්සේ අන්තිමේදී මිනිස්සු ඔබතුමාට හූ කිව්වා. අපි ඒක දැක්කා. ඊළඟ වතාවේ රටේ මිනිස්සු ඔබතුමාට හූ කියන එකක් නැහැ; මේ විධියට ගියොත් ඊළඟ වතාවේ මිනිස්සු ඔබතුමන්ලාට ගල් මුගුරුවලින් ගහයි. මොකද, මේ රටේ මිලියන 22ක ජනතාවක් දුක් විඳින්නේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ක්‍රියා නිසායි. ඒ හින්දා කරුණාකර ඔය ක්‍රියාව නවත්වන්න.

දැන් කියන්න යන්නේ මා පිළිබඳ ප්‍රශ්නයක්. මම පසුගිය කාලයේ මාධ්‍ය හරහා දැක්කා, කාන්තාවක වන මට සමගි ජන බලවේගයේ රැස්වීමකදී මොන තරම් නිගා කර තිබෙනවාද කියලා. විපක්ෂ නායකතුමනි, ඔබතුමා ළඟ සිටියදීයි එහෙම කළේ. මට ආරංචි හැටියට, ඔබතුමාමයි එහෙම කියන්න කියලා තිබෙන්නේ. ඒ, සමගි ජන බලවේගයේ කෙනෙක් ලු. මම දන්නේ නැහැ ඒ පක්ෂයට කොහොම ආවා ද කියලා, ඒ වාගේ කාලකණ්ණි මිනිස්සු. සමගි ජන බලවේගයේ කෙනෙකු යැයි කියාගනිමින් ඔබතුමා එහා පැත්තේ තියාගෙනයි එහෙම කතා කළේ. ඒ නිගා කළේ කාන්තාවකට. ඒ කියන්නේ, ඔබතුමාගේ මවට, ඔබතුමාගේ බිරිඳට, සහෝදරියට. ඒක මතක තියාගන්න. ඔබතුමා එතැන වාඩි වෙලා සිටියදී කාන්තාවකට නිගා කරන්න දෙනවා නම්, මොකක්ද ඔබතුමාගේ විපක්ෂ නායකකම? ඇත්තෙන්ම කියන්න ලජ්ජයි, මේ තිබෙන ලජ්ජා නැති වැඩ. මම ඒවාට බය නැහැ. මට ඕනෑම කෙනෙකුට ඕනෑම දෙයක් කියන්න පුළුවන්. මට ඒක ප්‍රශ්නයක් නොවෙයි. නමුත් stageවලට නැගලා කාන්තාවකට නිගා කළා, විපක්ෂ නායකයා වන ඔබතුමා ළඟ තබාගෙන; සමගි ජන බලවේගය පක්ෂයේ කෙනෙකු කියාගෙන. ලජ්ජයි! සුදු පිරුවට ඇඳ ගත්තු සමහර අය මගේ පුරවැසිභාවය ගැන කතා කරනවා. ඔය පැත්තේ ඉන්න අය TV එකට ඇවිල්ලා මගේ පුරවැසිභාවය ගැන කතා කරනවා. ඇයි ඒ? මම කාන්තාවක් හින්දාද? මේ සභාවේ ඉන්නවා නේ ද්විත්ව පුරවැසිභාවය තිබෙන තවත් අය. එහෙම නම්, ඒ ගොල්ලන් ගැන කථාවක් නැත්තේ ඇයි? එහෙම ප්‍රශ්නයක් තිබෙනවා නම්, එය නීත්‍යානුකූලව විසඳා ගන්න. මෙතැනට ඇවිල්ලායි, මාධ්‍යවලට ගිහිල්ලායි කතා කරන්න එපා මගේ පුරවැසිභාවය ගැන.

මගේ පුරවැසිභාවය ගැන කතා කරපු කිහිපදෙනාගෙන් මා අහන්න කැමැතියි, ඔබතුමන්ලා බෞද්ධයන්ද කියලා. ඔබතුමන්ලා බුද්ධාගමේද? බෞද්ධාගමේ නම්, මේ කාරණය ගැන කතා කරන්න ගියොත් අපට කතා කරන්න වෙන්නේ, බංග්ලාදේශයෙන් ආපු විජය කුමාරයා ගැන. විජය කුමාරයා කියන්නේ කවුද? එහෙම නම් අපි එතැනින් පටන් ගනිමු. බෞද්ධාගම අදහන ඔබතුමන්ලා සියලුදෙනා කථා කරන බුදු හාමුදුරුවෝ කියන්නේ කවුද? ඒ ඉන්දියාවේ උපන් සිදුහත් කුමරු. අද අපි අවුරුදු 2500ක ඉතිහාසයක් ගැන කතා කරනවා. අපි බුදු හාමුරුවන් කියලා අදහන්නේ කවුද? අපි විශ්වාස කරන්නේ බුදු හාමුදුරුවන්ගේ ධර්මය. බුදු හාමුදුරුවෝ කියන්නේ, ඉන්දියාවේ උපන් සිදුහත් කුමරු. කවුද දන්ත ධාතූන් වහන්සේ මේ රටට වැඩම කළේ? විදේශික කාන්තාවක්. මේ කවුද මේ රටට බුද්ධාගම ගෙනාවේ? විදේශික පිරිසක්.

ඒ හින්දා නිකම් බොරුවට මිනිසුන්ට මඩ ගහන්න එපා. ඒ විධියට කථා කරමින්, මඩ ගහලා එක දාගන්න එපා. ඒ වාගේ දේවල් කරන්න එපා. ඔබතුමන්ලා මේ රටේ හැම ආණ්ඩුවකම ඇමතිවරුන් වෙලා හිටියා; ආණ්ඩු කළා. නමුත්, මොකක්ද මේ රටට කරලා තිබෙන්නේ? තමුන්ගේ පළාතටවත් වැඩක් කරලා තිබෙනවා ද? මේ රට මේ තත්ත්වයට පත් වීම ගැන වග කියන්න ඕනෑ ආණ්ඩු කරපු ඔබතුමන්ලා. මේ රට මේ තත්ත්වයට පත් කිරීම සම්බන්ධයෙන් වග කිව යුතු මිනිස්සු අද විපක්ෂය පැත්තේ ඉඳගෙන මහ ලොකුවට කතා කරනවා; මඩ ගහනවා. එතුමන්ලා කතා කරන්නේ හරියට මැරිලා ඉපදිලා වාගේයි. එතුමන්ලා පසුගිය ආණ්ඩුවල ඇමතිකම් කරපු අය. ඒ වාගේම මේ ආණ්ඩුවේම ඇමතිකම් කරපු සමහර අය තමයි අද මෙහෙම කතා කරන්නේ. රට මේ තත්ත්වයට පත් කිරීම සම්බන්ධයෙන් ඒගොල්ලොත් වග කියන්න ඕනෑ. ඒ හින්දා ඒ විධියට කවුරුවත් කතා කරන්න ලැස්ති වෙන්න එපා. මේ රටට මේ විධියට ඉදිරියට යන්න බැහැ.

මම විපක්ෂ නායකතුමාට කියන්නේ මෙයයි. ගෝඨාභය සර් හිටපු කාලයේ වගකීම භාර ගන්න කිව්වාම ඔබතුමා කොන්දේසි දමපු එක ඇත්තටම හොඳයි. ඔබතුමා අද ආණ්ඩුව භාර ගත්ත නම් මේ රට සෝමාලියාවක් වෙලා තමයි ඉවර වෙන්නේ. එහෙම වුණා නම්, මේ රටේ අපි ඔක්කෝටම එල්ලිලා මැරෙන්නයි වෙන්නේ. එහෙම නොවෙච්ච එක, ඔබතුමා කොන්දේසි දම දමා, ලියුම් ලිය ලියා හිටපු එක මේ රටේ මිලියන 22ක ජනතාවගේ පිනක්. ඒක ලොකු දෙයක්. ඔබතුමන්ලාට මා කියන්න කැමැතියි, මේ රට ගොඩ ගන්න අපි එකට එකතු වෙමු කියලා. ඡන්දයක් පවත්වන්න පුළුවන් තත්ත්වයක අද මේ රට නැහැ.

[ගරු ඩයනා ගමගේ මහත්මිය ]

අද මැතිවරණ නොවෙයි අවශ්‍ය. ඡන්ද ගත්තා කියලා ඔබතුමන්ලාට මේ රටේ කරන්න පුළුවන් කෙහෙල් මලකුත් නැහැ. හෙට මේ රටේ ඡන්දයක් තිබ්බා කියලා කොහෙන්ද ඔබතුමන්ලාට ඩොලර් එන්නේ? කොහොමද, ඔබතුමන්ලා මේ රට කරගෙන යන්නේ? හෙට ඡන්දයක් තියලා ඔබතුමන්ලාට මේ රට දුන්නොත් මේ රට කරගෙන යන්න පුළුවන් කියලා ඔබතුමන්ලාට තිබෙන guarantee එක මොකක්ද? මේ රට භාරගන්න කියලා කියන කොට දිව්වා; හැංගුණා. ඊට පස්සේ love letters ලියනවා වාගේ එක දිගටම ලිව්වා. එහෙම නම්, ඔය එක් එක්කෙනා මට මඩ ගහන්න ලෑස්ති වෙන්න එපා. ඔය පැත්තේ හැමෝම කරන හොර වැඩ අපි දන්නවා. මට මඩ ගැහුවාට කමක් නැහැ. මට ඒවා වදින්නේ නැහැ. මට ඒවා ප්‍රශ්නයක් නොවෙයි. අපි ඒවා වෙනම විසඳා ගනිමු. නමුත් කරුණාකර මේ රට කරන්න ඉඩ දෙන්න. මට කියන්න තිබෙන්නේ එච්චරයි. මේ රට කරන්න එකතු වෙන්න. එහෙම නැතුව "අපිට බලය දෙන්න" කියලා ඡන්දය ඉල්ලාගෙන පාරට බහින්න එපා. ඔබ සියලුදෙනා කරලා තිබෙන්නේ ඊළඟ අවුරුදු පහේ බලයට එන්න ඡන්දය ගන්නේ කොහොමද කියලා හිතමින් කටයුතු කරපු එක. මේ රට කරන්න ආපු හැම කෙනාම කරලා තිබෙන්නේ ඒකයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය අමාත්‍යතුමියනි, ඔබතුමියට නියමිත කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු ඩයනා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) டயனா கமகே)
(The Hon. (Mrs.) Diana Gamage)
රට ගැන හිතලා නැහැ කවුරුවත්. ඒ හින්දා දැන්වත් මේ රට ගැන හිතන්න, මේ ජනතාව ගැන හිතන්න, මේ ජනතාව විඳින පීඩනය ගැන හිතන්න, රටේ ජනතාවට සහන සලසන්න හිතන්න. එක එක්කෙනාට මඩ ගහමින් ඇවිදින එක නොවෙයි මේ රටේ කළ යුත්තේ. මම මේක කියන්නේ අවසන් වතාවට. ඔබතුමන්ලා විපක්ෂයක් හැටියටත් එකතු වෙලා මේ රට ගොඩ දමන්න ක්‍රමයක් සොයන්න. එච්චරයි කරන්න තිබෙන්නේ, ඔබතුමන්ලාට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි, මට මේ අවස්ථාව ලබා දුන්නාට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. Imran Maharoof. You have five minutes.

[பி.ப. 2.06]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நன்றி! இன்று விவாதிக்கப்படுகின்ற சட்டமூலங்களின் திருத்தம் சம்பந்தமான விடயங்களிலே குறிப்பாகப் போதைப்பொருள் சம்பந்தமான விடயங்கள் அதிகம் பேசப்படுகின்றன. உண்மையிலே, இன்று இந்தப் போதைப் பொருட்களினுடைய பாவனை வீதம் மிகவும் அதிகரித்துச் செல்கின்ற ஒரு நிலைப்பாடு காணப்படுகின்றது. குறிப்பாக, இன்று இளைஞர்களைப் பாதிக்கின்ற அல்லது அவர்களுடைய எதிர்காலத்தைக் கேள்விக்குறியாக்குகின்ற ஒரு நிலைமையை இந்தப் போதைப் பொருட்களுடைய பாவனை ஏற்படுத்தியிருக்கின்றது. நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற திருகோணமலை மாவட்டத்தில்கூட இன்று இந்தப் போதைப் பொருட்களினுடைய பாவனை அதிகரித்துச் செல்கின்றது. குறிப்பாக, இன்று சிறார்களைக் குறிவைத்து இந்த வியாபாரத்தை முன்னெடுத்துச் செல்கின்ற ஒரு நிலைப்பாடு எங்களுடைய பிரதேசங்களிலே காணப்படுகின்றது. ஆகையால், இளைஞர்களுடைய, சிறார்களுடைய எதிர்கால வாழ்க்கையைக் கருத்திற்கொண்டு, அவர்களைப் பாதுகாப்பதற்காகக் கொண்டுவரப்படுகின்ற சட்டங்களை நாங்கள் ஆதரிக்கத் தயாராக இருக்கின்றோம். ஆனால், அவ்வாறான சட்டங்கள் அதிக தண்டனை வழங்கக்கூடிய சட்டங்களாக உருவாக்கப்பட வேண்டும் என்பதுதான் எங்களுடைய விருப்பமாகக் காணப்படுகின்றது. ஆகையால், இந்தப் போதைப் பொருட்களுக்கு அடிமையாக இருக்கின்ற சிறார்களுடைய எதிர்காலத்தைக் கருத்திற்கொண்டு, சிறந்த முன்னெடுப்புக்களை மேற்கொள்ளவேண்டும் என்று இந்த இடத்தில் நாங்கள் கேட்டுக்கொள்கின்றோம்.

இன்று இந்தப் பாராளுமன்றத்திலே பல விடயங்கள் பேசப்படுவதை நாங்கள் பார்க்கின்றோம். குறிப்பாக, இன்று அரசாங்கத்திலிருக்கின்ற அமைச்சர்கள், பாராளுமன்ற உறுப்பினர்கள்மீது சுமத்தப்பட்டிருக்கின்ற குற்றச்சாட்டுக்களையெல்லாம் இங்கிருக்கின்ற எல்லோர் மீதும் சுமத்தவேண்டும் என்ற அடிப்படையில் 225 பேரும் குற்றவாளிகள் என அவர்கள் சொல்கிறார்கள். எப்படி 225 பேரையும் குற்றவாளிகள் எனச் சொல்லமுடியும்? உதாரணமாக, போக்குவரத்தில் சம்பந்தப்பட்ட ஒரு வாகனத்துக்கு accident ஏற்பட்டால் அதைப் பாவிக்கின்றவர் அல்லது அதை ஓட்டுபவர்தான் அதற்கு வகைசொல்லவேண்டுமே ஒழிய, அந்த வாகனத்தில் பயணிப்பவர்கள் அல்ல. அதில் இருந்தவர்கள் எப்படி அதற்குப் பொறுப்புக்கூறுவார்கள்? என்று கேட்க விரும்புகின்றேன். அரசாங்கத்திலே இருந்துகொண்டு, சில பிழையான நடவடிக்கைகளை மேற்கொண்டு, பிழையான முடிவுகளை எடுத்து இன்று இந்த நாட்டை மிகவும் மோசகரமான ஒரு சூழ்நிலைக்குத் தள்ளியவர்கள், தங்களுடன் அனைத்துப் பாராளுமன்ற உறுப்பினர்களையும் - 225 பேரையும் - ஒன்றாகச் சேர்த்து அதற்குப்பொறுப்புக் கூறவேண்டியவர்களாகக் காட்டுகின்ற ஒரு நிலைப்பாடு காணப்படுகின்றது. நல்ல விடயங்களைச் செய்கின்றபொழுதெல்லாம் "நாங்கள்தான் இதற்குப் பிரதான காரணம்" என்று சொன்னார்கள்; "நாங்கள் மட்டும்தான் இதற்கு பொறுப்பாளர்கள்" என்று சொன்னார்கள். இன்று அவர்களது செயற்பாடுகளால் இந்த நாடு மோசமான ஒரு சூழலுக்குத் தள்ளப்பட்டதற்குப் பின்னர், இங்கிருக்கின்ற 225 பேரும் இதற்கு வகைகூறவேண்டுமென்று சொல்லுகின்றார்கள்.

இன்று இந்த அரசாங்கத்தில் உள்ளவர்கள் தேர்தலுக்கு முகங்கொடுக்கப் பயப்படுகின்றார்கள்; மக்கள் மத்தியிலே செல்வதற்கு அஞ்சுகின்றார்கள். அமைச்சுப் பதவிகளைப் பெற்ற எத்தனையோ அமைச்சர்கள் இன்னும் கொழும்பிலேதான் இருக்கிறார்கள். அவர்களால் தங்களுடைய ஊருக்கு அல்லது தொகுதிக்குச் செல்லமுடியாது; அங்கிருக்கின்ற மக்களைச் சந்திக்க முடியாது. ஆகையால், தேர்தலைப் பிற்போடுகின்ற ஒரு நிலைப்பாடு காணப்படுகின்றது. 'கொரோனா' முடிந்தும் இன்னும் இந்த அமைச்சர்கள் கொழும்பிலே quarantine செய்யப்பட்டிருக்கிறார்கள். ஊருக்குச் சென்று மக்கள்

மத்தியிலே வாக்குக் கேட்கின்ற ஒரு சூழல் இல்லாத காரணத்தினால் இவர்கள் தேர்தலைப் பிற்போட்டுக் கொண்டிருக்கிறார்கள். மாகாண சபைத் தேர்தலை எடுத்துக்கொண்டால், அந்தச் சட்டத்தில் சில திருத்தங்கள் கொண்டுவரவேண்டும். அந்தத் தேர்தல் முறைகளை மாற்றவேண்டுமென்று சொல்லுகின்றார்கள். உள்ளூராட்சி மன்றத் தேர்தல் என்றால், உறுப்பினர்களைக் குறைக்க வேண்டும். அதிலே மாற்றம் கொண்டுவரவேண்டுமென்று சொல்லுகிறார்கள். இவ்வாறு சொல்வதன்மூலம் இந்த அரசாங்கத்திலே இருக்கின்ற அமைச்சர்கள், பாராளுமன்ற உறுப்பினர்கள் மக்களைக் கண்டு அஞ்சுகின்ற ஒரு நிலையிலே இருந்துகொண்டிருக்கிறார்கள் என்பதை நாங்கள் விளங்கிக்கொள்ள வேண்டும்.

இந்தப் பாராளுமன்றத்தை எடுத்துக்கொண்டால்கூட, சரியான ஒரு நிலைப்பாட்டிலே இந்தப் பாராளுமன்றம் செல்லுகின்றதா? என்ற கேள்வி இன்று எங்களிடம் காணப்படுகின்றது. இங்கு அரசாங்கம் சார்பாக இருக்கின்றவர்கள் யார்? எதிர்க்கட்சியிலே இருக்கின்றவர்கள் யார்? பாராளுமன்ற அமர்விலே எத்தனை ஆளுங்கட்சிப் பாராளுமன்ற உறுப்பினர்கள் சமுகமாயிருக்கின்றார்கள்? கேட்கின்ற கேள்விக்கு யார் உரிய பதிலைக் கூறுவார்கள்? அவற்றுக்கு யார் பொறுப்புக்கூறுவார்கள்? என்ற பிரச்சினைகள் இன்று காணப்படுகின்றன. முன்னாள் ஜனாதிபதி அவர்கள் துரத்தியடிக்கப்பட்டிருக்கின்றார். முன்னாள் பிரதமர் அவர்களை விரட்டியிருக்கின்றார்கள். நிதி அமைச்சர் அவர்களை மாற்றியிருக்கிறார்கள்.

இவ்வாறான நிலையில் அரசாங்கம் ஒரு ஸ்திரத்தன்மையற்றதாக இருக்கின்ற காரணத்தினால் சரியான ஒரு முடிவை எடுத்துக்கொள்ள முடியாமல் கஷ்டப்படுகின்ற ஒரு நிலைப்பாடு காணப்படுகின்றது. ஆகையால் எப்படியாவது மக்களினுடைய ஆணையைப் பெறுவதற்காக மக்கள் மத்தியிலே செல்வதற்கான ஒரு வாய்ப்பை ஏற்படுத்தவேண்டும். மிகவிரைவிலே தேர்தலை நடத்துவதற்கான நடவடிக்கையை மேற்கொள்ளுங்கள் என்று நாங்கள் அரசாங்கத்திடம் கோருகின்றோம். ஏனென்றால் மீண்டும் மக்களுடைய ஓர் ஆணையைப் பெற்று, மக்களுடைய விருப்பத்தின்மூலம் தெரிவுசெய்யப்படுகின்ற அரசாங்கமாக இருந்தால்தான் ஏனைய விடயங்களிலே இந்த நாட்டை முன்னெடுத்துச் செல்லக்கூடிய ஒரு நிலையேற்படும். இன்று எத்தனையோ நாடுகளுடனான உறவுகள் துண்டிக்கப்பட்டிருக்கின்றன. அதனால், பல்வேறு வகையான உதவிகள் எமது நாட்டிற்குக் கிடைக்காமல் மக்கள் கஷ்டப்படுகின்ற நிலைமை ஏற்பட்டிருக்கின்றது. ஆகையால், ஸ்திரத்தன்மையுடைய ஓர் அரசாங்கத்தை உருவாக்கினால்தான் எங்களுடைய நாட்டை முன்னெடுத்துச் செல்லமுடியும் என்பதை நான் இங்கே கூறிக்கொள்ள விரும்புகின்றேன். ஆகவே, மிகவிரைவிலே ஒரு தேர்தலுக்கு முகங்கொடுக்கின்ற ஒரு சூழலை ஏற்படுத்தி, மக்களுடைய ஆணையைப் பெற்று, மீண்டும் இந்த நாட்டிலே ஸ்திரத்தன்மையான ஓர் அரசாங்கத்தை உருவாக்குவதற்கான ஆதரவை நீங்கள் வழங்க வேண்டுமென்று நான் கேட்டுக்கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Rishad Bathiudeen. You have five minutes.

[பி.ப. 2.12]

**ගරු රිෂාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நீதி அமைச்சர் அவர்களால் இன்று கொண்டுவரப்பட்டிருக்கின்ற திருத்தச் சட்டமூலங்கள் இன்றைய சூழ்நிலையில் நாட்டுக்குத் தேவையானவையாகும். ஆனால், அவற்றை நடைமுறைப்படுத்துகின்ற விடயங்களிலே அரசியலுக்கு அப்பால் செயற்படுகின்றபோதுதான் அதன் பலாபலன்களை மக்கள் அடைந்துகொள்வார்கள். அந்த வகையிலே இன்று கொண்டுவரப்பட்டுள்ள இந்தத் திருத்தச் சட்டமூலங்களை அங்கீகரித்துக்கொள்வதோடு மட்டுமல்லாமல், அவற்றை நடைமுறைப்படுத்துகின்ற விஷயத்திலும் அரசியலுக்கு அப்பால் செயற்படவேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் விஜயதாஸ ராஜபக்ஷ அவர்களிடத்திலே நான் முஸ்லிம் விவாக, விவாகரத்துச் சட்டம் தொடர்பாக ஒரு விஷயத்தைச் சொல்ல வேண்டும். இதற்கு முன்னர் நீதி அமைச்சராக இருந்த கௌரவ அலி சப்ரி அவர்கள் MMDA சம்பந்தமாக Committee ஒன்றை உருவாக்கியிருந்தார். அந்தக் Committee இற்கு ஏற்படுத்தப்பட்டிருந்த சில அழுத்தங்கள் காரணமாக, இஸ்லாமிய விழுமியங்களுக்கு அப்பால், வரையறைகளுக்கு அப்பால் சில முடிவுகள் எடுக்கப்பட்டு, அதன் அறிக்கை உங்களிடத்திலே வழங்கப்பட்டதாக நாங்கள் அறிகிறோம். ஆகவே, இது சம்பந்தமாக உங்களிடத்திலே வேண்டுவது, இங்கே இருக்கின்ற மக்களால் தெரிவுசெய்யப்பட்ட முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்கள் தமது கருத்துக்களை முன்வைப்பதற்கும் அதிலேயுள்ள தவறுகளைத் திருத்திக்கொண்டு அவசரமாக அதை நடைமுறைப்படுத்துவதற்கும் அதற்கான விட்டுக்கொடுப்புகளைச் செய்வதற்கும் ஏதுவாக அவர்களோடு ஒரு சந்திப்பை உங்களுடைய அமைச்சிலோ அல்லது பாராளுமன்றத்திலோ மிக விரைவாக ஏற்பாடு செய்யவேண்டுமென்பதாகும். அதைச் சரியான முறையிலே செய்யவேண்டுமேயொழிய யாருடைய அழுத்தங்களினாலும் செய்யக்கூடாது. ஏனென்றால், கடந்த காலங்களில் அவர்கள் சுதந்திரமாகச் செயற்படுவதற்கான வழிவகைகள் இருக்கவில்லை என்று நாங்கள் அறிகின்றோம். எனவே, அது சம்பந்தமாகக் குறிப்பாக முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்களோடு கலந்துரையாடுவதற்கான ஒரு கூட்டத்தை ஏற்பாடு செய்து தாருங்கள் என்று இந்த இடத்திலே நான் வேண்டுகோள் விடுக்கின்றேன்.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු මන්ත්‍රීතුමනි, මීට පෙර ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා එක්කත් මා ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කළා. පනත් කෙටුම්පත සකස් කරලා තිබෙන්නේ, විශේෂඥ කමිටුවෙන්. මේ සතිය ඇතුළත සියලුම මුස්ලිම් මන්ත්‍රීතුමන්ලා අතර එය circulate කරලා, පාර්ලිමේන්තුව ඇතුළේ දී ඒ පිළිබඳව සාකච්ඡාවක් ආරම්භ කරමු කියලා මා එතුමාට දැනුම් දුන්නා.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)

හොඳයි, බොහොම ස්තුතියි.

அது மாத்திரமல்ல, மிகமோசமான இந்த PTA தொடர்பாக நாடு முழுவதும் பல போராட்டங்களும் எதிர்ப்புக்களும் எழுந்துகொண்டிருக்கின்றன. இந்த PTAஇன் கீழ் கைதுசெய்யப்பட்டதன் காரணமாகப் பல வருடங்களாகப் பல்வேறு கஷ்டங்களுக்கு மத்தியில் தமிழ் இளைஞர்கள் சிறையிலே வாடுவதை நானும் சிறையிலே இருந்தபோது கண்ணால் கண்டேன். அதேபோல, கடந்த 3 வருடங்களாகப் பல முஸ்லிம் உலமாக்கள், கல்விமான்கள் இந்தச் சட்டத்தின் கீழுள்ள ஏற்பாடுகளைப் பயன்படுத்தி அநியாயமாகத் தொடர்ந்தும் சிறையிலே வைக்கப்பட்டிருக்கின்றார்கள். அவர்களுக்கான நியாயம் இன்னமும் கிடைக்கவில்லை. எனவே, இவ்வாறானவர்களுக்கு நியாயம் கிடைக்கக்கூடிய முறையிலே இந்த PTA திருத்தம் செய்யப்படவேண்டும் என்றும் அமைச்சர் அவர்களிடத்திலே நான் வேண்டுகோள் விடுக்கின்றேன்.

அதேபோல, தற்போது எல்லோராலும் பேசப்படுகின்ற இன்னுமொரு விஷயம்தான் சட்டக் கல்லூரியிலே ஆங்கில மொழியில்தான் பரீட்சை எழுதவேண்டும் என்பதாக அறிவிக்கப்பட்ட விடயம். இது தொடர்பாகப் பல மாணவர்கள், பல சிவில் அமைப்புக்கள் எங்களிடத்திலே வந்து அடிக்கடி பேசுகின்றார்கள். இது சம்பந்தமாகவும் தாங்கள் கவனத்திலெடுத்து, அவர்கள் அவ்வாறு பரீட்சை எழுதுவதற்கு ஒரு கால வரையறையை வழங்கக்கூடிய ஒரு சந்தர்ப்பத்தை ஏற்படுத்திக் கொடுப்பது தொடர்பாக CJ உடன் பேசி, உரிய நடவடிக்கை எடுக்கவேண்டும் என்று உங்களிடத்திலே வேண்டுகோள் விடுக்கின்றேன்.

அடுத்து, இந்த நாட்டிலே இன்று மிகமோசமான ஒரு பிரச்சினையாக இருப்பது போதைப்பொருள் பாவனை. இந்தப் போதைப்பொருள் பாவனையின் காரணமாக நாங்கள் பலரைப் பலிகொடுத்துவிட்டோம். இதனால் இளைஞர்கள் மாத்திரமன்றி, மாணவர்களும் பாதிக்கப்பட்டுள்ளார்கள். ஏனென்றால் இன்று பாடசாலைகளுக்குள்ளும் அது புகுந்துவிட்டது. பாடசாலைகள் மற்றும் tuition centres இற்குச் செல்கின்ற மாணவர்கள் மிகமோசமானதொரு நிலைக்குத் தள்ளப்படுகின்றார்கள். இன்று கொண்டுவரப்படுகின்ற சட்டமூலங்களினூடாகப் பிரயோசனம் இருந்தாலும், இதற்கான ஒரு விசேட வேலைத்திட்டத்தைக் கல்வியமைச்சோடு இணைந்து செயற்படுத்துமாறு நாங்கள் வேண்டுகோள் விடுக்கின்றோம்.

அதுமாத்திரமல்லாமல், இன்று நாட்டிலே இருக்கின்ற பல வகையான பிரச்சினைகளுக்குக் காரணம் சட்டங்களைச் சரியாக நடைமுறைப்படுத்தாமை ஆகும். அரசியலமைப்பின் 20ஆவது திருத்தச் சட்டம் நடைமுறைப்படுத்தப்பட்டதன் பிறகு நீதிமன்றத்திற்கு இருந்த சுயாதீனத் தன்மை இல்லாமற்போனது. ஆனாலும், 21ஆவது திருத்தத்தினூடாக எதிர்காலத்திலே நீதித்துறையில் மாத்திரமல்லாமல், ஏனைய அனைத்துத் துறைகளிலும் ஒரு சுயாதீனத் தன்மையைக் கண்டுகொள்ளலாம் என்ற ஒரு நம்பகத்தன்மை எமக்கு ஏற்பட்டிருக்கின்றது.

இறுதியாக, இன்றைய விவாதத் தலைப்போடு சம்பந்தப்பட்ட அமைச்சின் கீழான விஷயமாக இல்லாவிட்டாலும் இந்த வாரம் எனக்குப் பேசக்கூடிய வாய்ப்புக் கிடைக்காத காரணத்தினால் இன்னுமொரு விஷயத்தை இங்கே குறிப்பிட விரும்புகின்றேன். நேற்றைய தினம் நான் புத்தளத்திற்குச் சென்றபொழுது, தென்னை மட்டை போன்ற அதன் மூலப்பொருட்களினூடாக உற்பத்திகளைச் செய்பவர்கள், “தென்னை உற்பத்திப் பொருட்களைக் கொள்வனவு செய்யும் ஏற்றுமதியாளர்கள் monopolyஆக இருந்து எமக்குப் பல கஷ்டங்களை ஏற்படுத்துகின்றார்கள். அதாவது, 15 வருடங்களுக்கு முன்னர் எம்மிடத்திலே 18 ரூபாய்க்கு வாங்கிய அதே பொருட்களை இப்பொழுதும் 18 ரூபாய்க்குத்தான் வாங்குகின்றார்கள்” என்று என்னிடத்திலே முறைப்பாடு செய்தார்கள். உங்களுக்குத் தெரியும், 15 வருடங்களுக்கு முன்னர் ஒரு லீற்றர் டீசலின் விலை 45 ரூபாயாக இருந்தது; இன்று 415 ரூபாயாக இருக்கின்றது. அன்று மின்சாரக் கட்டணம் 15,000 ரூபாய் என bill வந்தால் இன்று 50,000 ரூபாய் என வருகின்றது. அந்தவகையிலே, மூலப்பொருளான ஒரு தொன் தென்னை மட்டையை அன்று அவர்கள் 750 ரூபாய்க்கு வாங்கினார்கள் என்றால் இன்று 10,000 ரூபாய்க்கு வாங்குகின்றார்கள். ஆனால் 15 வருடங்களுக்கு முன்னர் அவர்களிடத்திலே வாங்கிய 18 ரூபாய்க்குத்தான் கொள்வனவாளர்கள் இன்றும் அந்தத் தும்பினை வாங்குகின்றார்கள். இதற்குப் பின்னால் சில சதிகாரர்கள் இருக்கின்றார்கள். இதற்குப் போதிய ஏற்றுமதியாளர்கள் இல்லாத காரணத்தினால் எங்களுடைய கைத்தொழில் அமைச்சர் இது சம்பந்தமாக விசேஷ கவனம் செலுத்தி, உலக சந்தைக்கேற்ப இந்தப் பொருட்களுக்கு நியாயமானதொரு விலையைப் பெற்றுக்கொடுக்க நடவடிக்கை எடுக்கவேண்டும் என்றும், இது சம்பந்தமாகக் கலந்துரையாடுவதற்காக அமைச்சர் மற்றும் உற்பத்தியாளர்கள் இணைந்ததாக ஒரு கூட்டத்தையும் ஏற்பாடு செய்ய இருக்கின்றோம் என்ற விஷயத்தையும் கூறி, சந்தர்ப்பமளித்தமைக்கு நன்றி தெரிவித்து, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ප්‍රේමලාල් ජයසේකර රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு இம்ரான் மஹ்ரூப் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. WEERASUMANA WEERASINGHE *left the Chair, and* THE HON. IMRAN MAHAROOF *took the Chair.*

[අ.භා. 2.19]

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා (වරාය හා ගුවන් සේවා රාජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு பிரேமலால் ஜயசேக்கர - துறைமுகங்கள் மற்றும் விமான சேவைகள் இராஜாங்க அமைச்சர்)

(The Hon. Premalal Jayasekara- Minister of Ports and Aviation)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පතත් සමඟ ම තවත් පනත් කෙටුම්පත් කිහිපයක්, රීති, නියෝග හා යෝජනා සම්මතයක් සම්බන්ධයෙන් සාකච්ඡා වන මේ මොහොතේ ගරු විජයදාස රාජපක්ෂ අධිකරණ ඇමතිතුමාටත්, හිටපු අධිකරණ ඇමති අලි සබ්රි මැතිතුමාටත්, නීති අංශයේ සියලු නිලධාරින්ටත් මා විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. මොකද, මේ රටේ තරුණ තරුණියන් ඉතාම දැඩි ලෙස විෂ මත් ද්‍රව්‍යවලට ගොදුරුවෙලා, දරු පරපුර විනාශ වෙමින් පවතින මොහොතක මෙවැනි සංශෝධන කිහිපයක් ගෙන ඒම වැදගත් වන නිසා.

ගරු ඇමතිතුමනි, අධිකරණ අමාත්‍යාංශය සම්බන්ධයෙන් කථා කරන නිසාත්, මෙය අධිකරණයටත් යම් අපහාසයක් සිදුවන අවස්ථාවක් වශයෙන් මා දැකපු නිසාත් තමයි මේ ප්‍රකාශය කරන්නේ. විත්තිකරුවකු නිදොස් කොට නිදහස් කරමින් අධිකරණය දුන් නඩු තීන්දුවක් පිළිබඳව ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් පසුගිය දවස් ගණනක් තිස්සේ මාධ්‍ය හරහාත්, ප්‍රසිද්ධියේ ප්‍රධාන පෙළේ රැස්වීම්වලත් චෝදනා කරමින් කථා කළා. අධිකරණය දුන් තීන්දුවක් සම්බන්ධයෙන් තමයි අධිකරණය අභිභවා ගිහින් විවිධ චෝදනා එල්ල කරමින් ඒ විධියට කථා කළේ. ඒ නිසා අධිකරණයට අපහාස කිරීම පිළිබඳවත් යම් ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය නීති නැවත ගෙන එන ලෙසත් මේ අවස්ථාවේ දී මා යෝජනා කර සිටිනවා.

අද ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත් කිහිපයක්, රීති, නියෝග හා යෝජනා සම්මතයක් යන සියල්ල තුළම ඉතාම වැදගත් කාර්යයන් රැසක් ඉටු කරන්නට තිබෙන බව විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. මට යම්කිසි කාලයක් බන්ධනාගාරයේ ඉන්න සිද්ධ වුණා. බන්ධනාගාරය තුළ සිරකරුවන් ජීවත් වන ආකාරය ඒ කාල සීමාව තුළදී මා දැක්කා. ඒ වාගේම බන්ධනාගාරය තුළ කාන්තා සිරකරුවන් සමඟ කුඩා දරුවන් සිටිනවා. ඒ අයට බන්ධනාගාරය තුළ නිසි ආහාරයක්, නිසි අධ්‍යාපනයක් ලැබෙන්නේ නැහැ. ඒ වාගේම යම් හෙයකින් ඒ අය තව ටික කාලයක් බන්ධනාගාරය තුළ ජීවත් වුණොත්, සිරකරුවන් අතර හුවමාරු වන වචනම පාවිච්චි කරන්න තමයි ඒ දරුවෝ පුරුදු වෙන්නේ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් යම් ක්‍රියාමාර්ග ගැනීමට අද සිදු කරන මේ නීති සංශෝධන තුළින් හැකියාව ලැබෙනවා. ඒ පිළිබඳව ගරු ඇමතිතුමාට මාගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා.

ඊළඟට, තවත් කාරණයක් මම කියන්න ඕනෑ. අයිස් මත් ද්‍රව්‍යය අද රට පුරාම -අස්සක් මුල්ලක් නැර- ව්‍යාප්ත වෙලා තිබෙනවා. අපි දන්නවා, හෙරොයින් මත් ද්‍රව්‍යය සාමාන්‍යයෙන් ව්‍යාප්ත වෙලා තිබුණේ ප්‍රධාන නගරවල කියලා. නමුත් අද පාසල් දරුවන්, ඒ වාගේම තරුණ-තරුණියන් විශාල ප්‍රමාණයක් අයිස් මත් ද්‍රව්‍යයට නැඹුරු වෙලා තිබෙනවා. ඒක ඉතාම බැරෑරුම් කාරණයක්. මත් ද්‍රව්‍ය පාවිච්චි කරන අයගේ ශරීර සම්පූර්ණයෙන් විකෘති වෙනවා. අපි දැකලා තිබෙනවා, මාසයට-දෙකට බන්ධනාගාර තුළ ඉන්න තුන්හතරදෙනා මිය යනවා. බන්ධනාගාර තුළ ඉන්න අය කථා කරන ශෛලිය, හැසිරෙන ආකාරය සම්පූර්ණයෙන් වෙනස්. විකෘති මනසකින් තමයි ඒ අය හැසිරෙන්නේ. මෙවැනි මත් ද්‍රව්‍ය ගම තුළට ව්‍යාප්ත වෙනවා කියන්නේ, ඒ තුළින් රටේ ලොකු විනාශයක් සිද්ධ වීමයි. ඒ නිසා මෙවැනි අණපනත් ගෙනැල්ලා ඒ තත්ත්වය වළක්වා ගෙන අපේ අනාගත පරපුර රැක ගන්න පුළුවන් වෙයි කියා මා හිතනවා.

අපේ ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමාගේ, ගරු අලි සබ්රි ඇමතිතුමාගේ කථාවලදී පැහැදිලි වුණා, ප්‍රධාන ජාලය විනාශ නොකර ග්‍රෑම් දෙක-තුනක් ළඟ තියා ගන්නා පුද්ගලයන් හිරේ දැමීමෙන් සිදු වන දේ. අද බන්ධනාගාර තුළ අතිවිශාල පිරිසක් ඉන්නවා; විශාල තදබදයක් තිබෙනවා. සාමාන්‍යයෙන් 13,000කට විතර ඉන්න පුළුවන් බන්ධනාගාරයක අද වනකොට 25,000ක් විතර ඉන්නවා. ඇත්තෙන්ම ඒ අය පුනරුත්ථාපනය කරලා, ඒ අයට යම් වෘත්තීය පුහුණුවක් ලබා දීම තුළින් ඒ අය හොඳ මට්ටමකින් සමාජයට යවන්න පුළුවන් කියා මා හිතනවා. තිස්ස අත්තනායක මැතිතුමා පවා පසුගිය කාලයේ අප සමඟ බන්ධනාගාරගත වෙලා හිටියා. ඇත්තටම එතැන අපි දැක්කේ වෙනම විශ්වවිද්‍යාලයක් විධියට. බන්ධනාගාර තුළ සිටින කණ්ඩායම් විවිධ වැරැදිවලට යොමු වෙනවා. යම් කෙනකුට දඬුවම් ලබා දෙනකල් ටික කාලයක් ඉන්නේ රිමාන්ඩ් බන්ධනාගාරයේ. එතකොට ඒ සියලුදෙනා ඉන්නේ එකට. එහෙම වුණාම සුළු වරදකට බන්ධනාගාරයකට එන කෙනාත් අන්තිමේදී මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා, එතැනින් එහාටත් ගිහිල්ලා මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හැටියට, විවිධ අපරාධකරුවන් හැටියට තමයි සමාජයට යන්නේ. ඒ අය වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන වෙන් කර තැබීමට කටයුතු කර තිබෙනවා, මේ විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත හරහා.

අවුරුදු 18ට වඩා අඩු දරුවන් මිනී මැරුම් චෝදනාවකට ලක් වුණොත්, ඒ අයට දඬුවමක් ලබා දෙනවාද, නැද්ද කියලා මෙතෙක් නිශ්චිතව සඳහන්ව තිබුණේ නැහැ. අද ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පතට අනුව අවුරුදු 18ට අඩු දරුවන්, එහෙම නැත්නම් තරුණයන් අනිවාර්යයෙන්ම මරණීය දණ්ඩනයෙන් නිදහස් කිරීමේ අවස්ථාව ලැබී තිබෙනවා. හැබැයි, ඔවුන් පරිවාසයේ තියනවා. ඒක ගැටලුවක් නැහැ. මේ රටේ පවතින නීති සංශෝධනය කිරීම අද අනිවාර්යයෙන්ම සිදු විය යුතුයි. මොකද, සුද්දාගේ කාලයේ පටන් පවතින බොහෝ නීති තමයි අදටත් රට පුරාම ක්‍රියාත්මක වෙන්නේ. ඒ නිසා නීති සංශෝධනය අනිවාර්යයෙන්ම සිදු විය යුතු කාරණයක් බව මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

ගරු අමාත්‍යතුමනි, මම තවත් යෝජනාවක් ඉදිරිපත් කරන්න ඕනෑ. පොලීසිය, සුරාබදු දෙපාර්තමේන්තුව සහ ත්‍රිවිධ හමුදාව ඇතුළු ආරක්ෂක අංශවල සියලුදෙනාම ඒකාබද්ධව යම් වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ, මත් ද්‍රව්‍ය ජාවාරම මැඩලීම සඳහා. එහෙම නැතිව එක කණ්ඩායමකට විතරක් ඒක කරන්න පුළුවන්කමක් නැහැ. අද මේ සම්බන්ධයෙන් පොලීසියට විශාල කාර්ය භාරයක් ඉෂ්ට කරන්න සිදු වෙලා තිබෙනවා. ඒ නිසා මේ කණ්ඩායම් තුනම එකතු වෙලා ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන්න ඕනෑ. මේ වන විටත් ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවාය කියලා ගරු ඇමතිතුමා කිව්වා. මේ කණ්ඩායම් තුනම එකට එකතු වෙලා කටයුතු කරනවා නම්, ගම් මට්ටමෙන් මීට වඩා පුළුල් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා, ජනතාව දැනුවත් කරලා, මත් ද්‍රව්‍ය ජාවාරම නැවැත්වීම සඳහා, එහෙම නැත්නම් අඩු කිරීම සඳහා යම් ක්‍රියාමාර්ගයක් ගන්න පුළුවන් වෙයි කියා මා හිතනවා.

[ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා]

මේ අවස්ථාවේ සිරකරුවන් ගැනත් මම කියන්න ඕනෑ. දීර්ඝ කාලීනව බන්ධනාගාරගතව සිටින සිරකරුවන් ඉන්නවා. සමහර අය අවුරුදු 20ක්-25ක් වාගේ කාලයක් තිස්සේ බන්ධනාගාරවල දුක් විඳිනවා. රටක් හැටියට, රජයක් හැටියට අපි ඒ සිරකරුවන් පුනරුත්ථාපනය කිරීමට හෝ බන්ධනාගාරගත කිරීමේදී ඒ අයට අවශ්‍ය පහසුකම් ලබා දීමට කටයුතු කළ යුතුයි. නමුත්, අද වන විට බන්ධනාගාර තුළ සිටින සිරකරුවන්ගේ ඇඟ උඩින් මීයන් පවා දුවනවා. ඔවුන්ට අවශ්‍ය වැසිකිළි පහසුකම් පවා නිසි ලෙස නැහැ.

සමහර නිලධාරින් ඉතා අමානුෂික ලෙස සිරකරුවන්ට සලකනවා. සමහර නිලධාරින් නම් හොඳයි. එම නිසා ඒ සම්බන්ධයෙනුත් ඉදිරියේදී යම් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරන්න. බන්ධනාගාරවල පවතින තදබදය අඩු කරනවා නම්, මේ ප්‍රශ්නය යම්තාක් දුරකට හෝ නිරාකරණය වෙයි කියා මම හිතනවා. ඒ වාගේම දීර්ඝ කාලීනව බන්ධනාගාරගතව සිටින සිරකරුවන්ට වර්ගීකරණයක් නොකර පොදුවේ සමාව ලබා දීමට කටයුතු කරන්න කියන කාරණයත් මම මේ අවස්ථාවේදී යෝජනා කරනවා. හැබැයි, පළමුවෙනි වතාවට යම් වරදක් කරලා ඒ වරදට අදාළව දඬුවම් ලැබූ අයෙකුට සමාව දීලා තිබියදී, නැවත වතාවක් දඬුවමකට මුහුණ දෙන්න සිද්ධ වුණොත්, ඒ අවස්ථාවේදී කිසිම සමාවක් ලබා නොදෙන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

විශේෂයෙන්ම අධිකරණ කටයුතු සම්බන්ධයෙන් පවතින නීති, අණ පනත් සංශෝධනය කිරීමට මෙවැනි පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීම පිළිබඳව ගරු ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, කඩිනමින් ක්‍රියාමාර්ග ගන්නවා නම්, මේ රටේ අනාගත පරපුර මත් ද්‍රව්‍යවලින් බේරා ගැනීමට අවස්ථාව සැලසෙයි කියාත් මා හිතනවා. එම නිසා ඉදිරි කාලය තුළදී එම ක්‍රියාමාර්ග කඩිනමින් අරගෙන, අපි ඉදිරිපත් කළ කරුණු ගැනත් විශේෂ අවධානයක් යොමු කර කටයුතු කරන්න කියා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

அடுத்து, கௌரவ செல்வம் அடைக்கலநாதன் அவர்கள்! உங்களுக்கு 7 நிமிடங்கள் உண்டு.

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்கு 9 நிமிடங்கள் ஒதுக்கப்பட்டிருந்தது. இன்று TNA சார்பில் நான்தான் முதலில் பேசுகிறேன். எனக்கே ஏழு நிமிடங்கள்தான் ஒதுக்கப்பட்டிருக்கின்றது என்றால், அதை ஏற்றுக்கொள்ள முடியாது. ஏழு நிமிடங்களுக்குள் நான் எதைப் பேசுவது?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கென ஒதுக்கப்பட்டிருந்த நேரம் குறைக்கப்பட்டுள்ளது.

[பி.ப. 2.28]

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய சட்டத்திருத்தங்கள் தொடர்பான விவாதத்திலே கலந்துகொண்டு, என்னுடைய கருத்துக்களையும் சொல்லலாமென்று நினைக்கிறேன். கௌரவ நீதி அமைச்சர் அவர்கள் என்னுடைய உரையைச் செவிமடுக்க வேண்டுமென நான் எதிர்பார்க்கிறேன். Hon. Minister, please listen to me. இனப் பிரச்சினையைத் தீர்ப்பது தொடர்பிலான உங்களுடைய கருத்துக்களை நான் பத்திரிகை வாயிலாக அறியக்கூடியதாக இருந்தது. அதுமாத்திரமல்ல, அப்பிரச்சினையைத் தீர்க்கப் போவதாக நீங்கள் பொதுவெளியிலும் சொல்லிக்கொண்டிருக்கிறீர்கள். உண்மையிலேயே உங்களுடைய அந்தக் கருத்து வரவேற்கத்தக்கது. இனப் பிரச்சினையை உடனடியாகத் தீர்ப்பதற்கான வழிமுறையை ஏற்படுத்துவதற்கான பேச்சுவார்த்தையை நீங்கள் விரைவில் எல்லா அரசியல் கட்சிகளையும் அழைத்து நடத்த வேண்டுமென்று கேட்டுக்கொள்கிறேன். இனப் பிரச்சினைக்கான தீர்வானது, தந்தை செல்வா உட்பட பலராலும் கூறப்பட்டு வருகின்ற, எங்களுடைய வடக்கு, கிழக்கில் இருக்கின்ற அனைத்துத் தமிழ்க் கட்சிகளும் ஏற்றுக்கொள்ளக்கூடிய சமஷ்டி முறையிலான தீர்வாக அமைய வேண்டும் என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகிறேன்.

அண்மையில் வடக்கு, கிழக்கு ஒருங்கிணைப்புக் குழுவினர் 100 நாட்கள் செயற்றிட்டம் ஒன்றை மேற்கொண்டிருந்தார்கள். இச்செயற்றிட்டத்தின் இறுதி நாளன்று "ஐக்கிய இலங்கைக்குள் ஒருங்கிணைந்த வடக்கு - கிழக்கு மாகாணத்துக்கு மீளப் பெறமுடியாத சமஷ்டி முறையிலான அதிகாரப் பகிர்வைத் தரவேண்டும்" என்ற தலைப்பில் அவர்கள் மக்கள் பிரகடனம் ஒன்றைச் செய்திருந்தார்கள். அதன் நகலை உங்களுக்குத் தந்துதவுவது நன்றாக இருக்கும் என்று நான் நினைக்கிறேன்.

கௌரவ அமைச்சர் அவர்களே, இந்தப் பேச்சுவார்த்தையை ஆரம்பிப்பதற்குரிய சூழலை நீங்கள் உருவாக்குவீர்கள் என்ற நம்பிக்கை எனக்கு இருக்கிறது. மாகாண சபைத் தேர்தலை நடத்தி, பதின்மூன்றாவது திருத்தச் சட்டத்திலுள்ள அதிகாரங்களை முழுமையாக நடைமுறைப்படுத்தி, மாகாண சபை முறைமையை வலுப்படுத்த வேண்டுமென்று நான் இச்சந்தர்ப்பத்திலே கேட்டுக்கொள்ள விரும்புகிறேன்.

இந்த அரசாங்கம் நல்லிணக்கத்தின் அடிப்படையில், பல வருட காலமாக சிறையிலே இருந்த எங்களுடைய அரசியல் கைதிகளில் 08 பேருக்கு பொதுமன்னிப்பு அளித்திருக்கிறது. அவர்களில் நான்கு பேர்தான் விடுதலை செய்யப்பட்டிருக்கிறார்கள். மற்றைய நான்கு பேரும் விடுதலை செய்யப்படவில்லை. அவர்களில் இரண்டு பேருக்கு புனர்வாழ்வு அளிக்கப்பட வேண்டுமென்று நீதிமன்றம் உத்தரவிட்டிருக்கிறது. நீங்கள் அதனை withdraw பண்ணுவதற்குரிய நடவடிக்கையை எடுத்தால், அவர்களும் விடுதலை செய்யப்படுவதற்கான வாய்ப்பிருக்கிறது. மற்றைய இரண்டு பேருக்கும் எதிராகத் தாக்கல் செய்யப்பட்டிருக்கின்ற caseஐ வாபஸ்பெறுவதாகச் சொல்லியிருக்கிறார்கள். நீங்கள் இந்த விடயத்திலும் கவனம் செலுத்தி, இருக்கின்ற தடங்கல்களை நிவர்த்திசெய்து, அவர்கள் 04 பேரையும் விடுதலை செய்வதற்குரிய நடவடிக்கையை உடனடியாக

மேற்கொள்ள வேண்டுமென்று நான் இச்சந்தர்ப்பத்திலே கேட்டுக்கொள்கிறேன். ஏனெனில், எட்டு பேரில் நான்கு பேரை விடுதலை செய்து 10 நாட்களுக்கும் மேலாகிறது. எதிர்வருகின்ற கிறிஸ்மஸ் பண்டிகைத் தினத்தின்போது நல்லிணக்கத்தை வெளிப்படுத்தும் வகையில், மிகுதியாகவுள்ள எங்களுடைய தமிழ் அரசியல் கைதிகளை விடுதலை செய்வதற்கான வாய்ப்புக்களை உருவாக்க வேண்டும். தமிழ் அரசியல் கைதிகள் இன்னும் கொஞ்சப் பேர்தான் இருக்கிறார்கள். நீங்கள் அவர்களையும் விடுதலை செய்தால், உண்மையிலே இந்த அரசாங்கத்தின்மீது எங்களுக்கு நம்பிக்கை ஏற்படுவதற்கான ஒரு நல்ல சமிக்ஞையாக நாங்கள் அதைப் பார்க்கக்கூடியதாக இருக்கும். அந்த வகையிலே, நீங்கள் இந்த விடயத்திலே நல்லதொரு முடிவை எடுத்திருக்கிறீர்கள். அதற்காக உங்களுக்கு என்னுடைய நன்றியைத் தெரிவித்துக்கொள்கிறேன். நீங்கள் அதனைத் தொடர்ந்து செய்யவேண்டும் என்றும் மிகுதியாக இருக்கின்ற தமிழ் அரசியல் கைதிகளை மிக விரைவில் விடுதலைசெய்ய வேண்டுமென்றும் நான் இச்சந்தர்ப்பத்திலே கேட்டுக்கொள்ள விரும்புகிறேன்.

இன்றைய விவாதத்திற்குச் சம்பந்தமில்லாத ஒரு விடயத்தை நான் இங்கு கூற விரும்புகிறேன். அதாவது, Department of Forest Conservation மற்றும் ஏனைய திணைக்களங்களின்கீழ் இருக்கும் விவசாய நிலங்களை விவசாயம் செய்வதற்காக விடுவிக்க வேண்டுமென அரசாங்கம் சொல்லியிருக்கிறது. இதே கருத்தை மாண்புமிகு சனாதிபதி அவர்களும் சொல்லியிருக்கிறார். இன்று வன்னி மாவட்டத்தில் குறிப்பாக வவுனியா, முல்லைத்தீவு, மன்னார் போன்ற பிரதேசங்களில் Department of Forest Conservationஇன் ஆளுகையின்கீழ் இருக்கின்ற விவசாயக் காணிகளை உழுவதற்கு விட்டிருக்கிறார்கள். எனினும், அந்தக் காணிகளில் உளுந்தைப் பயிரிட முற்படும்போது, அதை Department of Forest Conservation தடைசெய்து, வேறு மரங்களை நாட்டுவதற்கு முயற்சி செய்கிறது. கடந்த 23ஆம் திகதி கௌரவ அமைச்சர் அவர்கள் அங்கு ஒரு கூட்டத்தை நடத்தியிருந்தார். அதன்போது, Department of Forest Conservationஇன்கீழ் இருக்கின்ற விவசாய நிலங்களை விடுவித்து, அவற்றில் விவசாய நடவடிக்கைகளை மேற்கொள்வதனூடாக பொருளாதாரப் பிரச்சினையை ஓரளவுக்குத் தீர்க்கலாம் என்பதாக அவர் கூறியிருந்தார்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் இரண்டு நிமிடங்கள் உண்டு.

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)
எனக்கு ஏழு நிமிடங்கள்! அதற்குள் "இன்னும் இரண்டு நிமிடங்கள்தான் இருக்கின்றன" என்று ஞாபகப்படுத்துகிறீர்கள்.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இந்த விடயத்திலே கவனமெடுக்க வேண்டும். அதேபோன்று, மாண்புமிகு சனாதிபதி அவர்களுக்கும் இந்தக் கோரிக்கையை நான் முன்வைக்கிறேன். விவசாயிகள் விவசாயம் செய்வதற்கு ஆர்வமாக இருக்கிறார்கள். எனினும், மேற்குறிப்பிட்ட திணைக்களங்களால் தொடர்ந்து தடையேற்படுத்தப்பட்டுக் கொண்டிருக்கின்றன. அரசாங்கம் சொன்ன விடயத்தை நடைமுறைப்படுத்தினால், உற்பத்திகளை மேற்கொள்வதனூடாக இந்த நாட்டிலுள்ள பொருளாதாரப் பிரச்சினையை ஓரளவுக்கு நிவர்த்திசெய்ய முடியுமென நான் இங்கு குறிப்பிட விரும்புகிறேன்.

நான் இங்கு இன்னுமொரு விடயத்தையும் சொல்ல வேண்டும். குடிவரவு, குடியகல்வு விடயத்துக்குப் பொறுப்பாக இருந்த முன்னாள் அமைச்சர் அவர்கள் வட மாகாணத்தில் அதன் கிளை அலுவலகமொன்றைத் திறந்து வைத்து, அங்கு passport பெறுவதற்கான வழிமுறைகளைச் செய்திருந்தார். எனினும், அதிலொரு சிக்கல் இருக்கிறது. அதாவது, onlineஇலே விண்ணப்பித்து passportஐப் பெறுவதற்கு 3 - 4 மாத காலக்கெடு கொடுக்கப்படுகிறது. ஆனால், ஒரு சில தரகர்களின் உதவியோடு 25,000-35,000 ரூபாயைக் கொடுத்து, உடனடியாக passportஐப் பெற்றுக்கொள்ளக்கூடிய நிலைமை அங்கு காணப்படுகிறது. அதாவது, காசு உள்ளவர்கள் இலஞ்சம் கொடுத்து, passportஐ உடனடியாகப் பெறக்கூடிய வாய்ப்பு இருக்கிறது. அதேபோல், வெளிநாட்டில் இருக்கின்ற எங்களுடைய சிங்கள மக்கள் passportsஐப் பெறுவதற்காக அந்தந்த நாடுகளில் இருக்கின்ற தூதரகங்களினூடாக விண்ணப்பங்களை இங்கு அனுப்புகின்றபோது, அந்த documents நன்றாகப் பரிசீலிக்கப்படுகின்றன. ஆனால், இங்கு சில காரணங்களைக் காட்டி, அவ்வாறு அனுப்பப்படுகின்ற passports விநியோகிப்பதைக் காலதாமதப்படுத்துகிறார்கள். எனினும், 50,000 ரூபாய் - 100,000 ரூபாய் வரையில் இலஞ்சம் கொடுப்பவர்களுக்கு உடனடியாக passportஐ விடுவிக்கின்ற நிலைமை காணப்படுகிறது.

அங்கு பணிபுரிகின்ற எல்லா அதிகாரிகளும் இவ்வாறு செய்கிறார்கள் என்று நான் சொல்லவில்லை. நல்ல அதிகாரிகளும் இருக்கிறார்கள். ஒரு சில அதிகாரிகள் இவ்வாறு காலதாமதப்படுத்தி passportஐ விநியோகிப்பதால், அங்கு பாரிய பிரச்சினை உருவாகி இருக்கிறது என்பதை நான் இச்சந்தர்ப்பத்தில் சொல்லிக்கொள்ள விரும்புகிறேன். தற்போது குடிவரவு, குடியகல்வு விடயத்துக்குப் பொறுப்பாக புதிய அமைச்சர் ஒருவர் நியமிக்கப்பட்டிருக்கிறார். அவரிடமும் இதைச் சொல்லவேண்டும். ஏனெனில், இதனால் வெளிநாட்டிலிருக்கின்ற எங்களுடைய சிங்கள, தமிழ் மக்கள் பாதிக்கப்பட்டிருக்கிறார்கள். ஆகையால், கௌரவ அமைச்சர் அவர்கள் இதுதொடர்பில் கூடிய கவனம் செலுத்தி, உரிய நடவடிக்கை எடுக்கவேண்டும். இறுதியாக, எங்களுடைய தமிழ் மக்களுடைய இனப் பிரச்சினையைத் தீர்ப்பதற்கான நடவடிக்கைகளைக் காலம்தாழ்த்தாது மேற்கொள்ளவேண்டுமெனக் கேட்டு, நேரத்தை ஒதுக்கித் தந்த கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களுக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පොඩි පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. Hon Member, may I speak in Sinhala or in English?

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)
Hon. Minister, you may speak in English, please.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

The Hon. Member raised several pertinent questions. One is about the four detainees who had been pardoned by His Excellency the President. In fact, there was a technical issue, Hon. Presiding Member. Some persons were under appeal - they have been convicted and they have appealed to the Supreme Court and were waiting until their appeals were disposed of. It is not permitted under the Constitution to grant pardon when an appeal is pending. But with all that, we have granted pardon subject to the condition that they will withdraw the appeals.

The Hon. Charles Nirmalanathan brought to my notice about the other two detainees. Apparently when we granted pardon, we did not know that in addition to the jail sentence, there had been a direction by the Honourable Court that they should also go through a period of rehabilitation, extending up to one year. Now, for that, I was told, the Commissioner General of Prisons had sought the opinion of the Hon. Attorney General, and we will accelerate the process.

With regard to the land matter, in fact, I have already constituted a committee, Chaired by the Secretary of my Ministry, consisting of all the Secretaries of the relevant Ministries and District Secretaries of all five Districts in the Northern Province. They are going ahead with that. Then, through the mobile services that we started, we were able to cater to around 12,000 returnees from India, who had issues with regard to the National Identity Cards, passports and birth certificates. I think, at least 75 to 80 per cent of the problems have been sorted; but still there are some pending issues and we are dealing with them.

As the Hon. Member pointed out, in fact I met a person today, who wanted to go overseas for urgent medical treatment. That person has paid the money for one day service of the passport, but the date given was 27th of December. So, what the Hon. Member raised is true; it is a very valid point. In fact, in the morning also I spoke to the Minister in charge of the subject and I was told that there had been some shortage of passport books. Certainly, we will attend to that on an urgent basis.

Thank you very much.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ගුණතිලක රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.40]

**ගරු ගුණතිලක රාජපක්ෂ මහතා**
(மாண்புமிகு குணதிலக ராஜபக்ஷ)
(The Hon. Gunathilaka Rajapaksha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ ක්ෂේත්‍රයට අතිශය වැදගත් වූ පනත් කෙටුම්පත් නවයක් අද දෙවනවර කියවීමේ විවාදය සඳහා ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම, බන්ධනාගාර ආඥාපනත යටතේ ඉදිරිපත් කරන රීති ද අද විවාදය සඳහා ඉදිරිපත් කර තිබෙනවා. නව රජය යටතේ අධිකරණ ක්ෂේත්‍රයේ විශාල වෙනසක් කිරීමේ අරමුණින් ඉදිරිපත් කර තිබෙන මේ පනත් කෙටුම්පත් සහ රීති තුළින් මේ රටේ අධිකරණ තුළ ගොඩ ගැසී ඇති ප්‍රශ්න රාශියකට උත්තර ලැබෙන බව අපට විශ්වාසයි.

ඒ වාගේම, ධීවර හා ජලජ සම්පත් පනත යටතේ නියෝග සහ අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනා සම්මතයක් මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. ඒ සියල්ලත් අද සාකච්ඡාවට ගැනෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවේ හිටපු පොළොන්නරුව දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී, අපේ හිතවත් ගරු අමරකීර්ති අතුකෝරළ මැතිතුමා සාහසිකයන් අතින් ම්ලේච්ඡ ලෙස ඝාතනය වෙලා දැන් මාස හයක් වෙනවා. මේ පාර්ලිමේන්තුවේ සිටින අපි සියල්ලෝම එක හඬින් ඉල්ලා සිටියා, විශේෂ අධිකරණයක් පිහිටුවා එතුමාගේ ඝාතනය සම්බන්ධයෙන් වන නඩුව විභාග කරන්න කියලා. අපේ වර්තමාන අධිකරණ අමාත්‍යතුමාට නැවතත් මතක් කර සිටිනවා, මේ පාර්ලිමේන්තුවේ හිටපු අහිංසක මන්ත්‍රීවරයා හැටියට එතුමාට කරන ගෞරවයක් වශයෙන් එම විශේෂ අධිකරණය තුළින් එතුමාගේ ඝාතනය සම්බන්ධ නඩුව විභාග කරන්න කියලා.

අපි කොච්චර නීති රීති ගෙනාවත්, අතළොස්සක් නිලධාරීන් නිසා සමහර තැන්වලදී ඒවා හරිහැටි ක්‍රියාත්මක නොවන බව පේනවා. මීට අවුරුදු පහකට පමණ පෙර මම පළාත් සභාවේ ඉන්නකොට එක්තරා පොලිස් නිලධාරියෙකුගේ දියණියගේ විවාහ මංගල උත්සවයකට සහභාගි වුණා. ඒ ප්‍රදේශයේ නම් දරාපු හෙරොයින් ව්‍යාපාරිකයෙකුත් ඒ අවස්ථාවේ එතැනට ඇවිල්ලා හිටියා. ඒ ව්‍යාපාරිකයා විවාහ වූ යුවලට ත්‍යාගය, සන්තෝසම වශයෙන් දුන්නේ කාර් එකක යතුරක්. ඒක ඒ කාලයේ හැටියට ලක්ෂ 20ක්, 25ක් වටිනා වාහනයක්. අපි කොච්චර නීති පැනවුවත්, නීතියෙන් රිංගා ඒ ජාවාරම් කරන ව්‍යාපාරිකයන් මැඩලන්න කියා මම ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා. සියලු පහසුකම් දීලා ත්‍රිවිධ හමුදාව යොදවා හෝ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා සිටින තරුණ දරුවන් සහ අපේ රටවැසියන් එයින් මුදා ගැනීම සඳහා අපි කටයුතු නොකළොත් අපට අඳුරු අනාගතයකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඊයේ පෙරේදා ගියා නාවික හමුදාවේ ත්‍රිකුණාමලයේ පිහිටි Sober Island එකට. මීට අවුරුදු පන්සිය ගණනකට ඉහතදී පෘතුගීසීන් අපේ රට අල්ලා ගත්ත අවස්ථාවේ යුදමය වශයෙන්, ආර්ථික පැත්තෙන් ඉතා වැදගත් දූපතක් තමයි සෝබර් දූපත. එහි අක්කර 170ක භූමි ප්‍රමාණයක් තිබෙනවා. ඒ කාලයේ ලංකාවේ ලාදුරු රෝගීන් ඉඳලා තිබෙනවා. ඒ රෝගීන් අනෙක් අයගෙන් වෙන් කරන්නයි ඒ දූපතට ගෙන ගොස් තිබෙන්නේ. ඒ මිය අයගේ සොහොන් කොත් අදත් ඒ දූපතේ තිබෙනවා.

ගොඩනැඟිලිත් ගොඩක් තිබෙනවා. මුහුදෙන් වට වූ ඒ දූපත ඉහත සඳහන් කළ කාරණයට ප්‍රයෝජනයට ගන්න පුළුවන්. වැරදි කරන පුද්ගලයන් එතැනට ගෙනගිහින් දමන්නත් පුළුවන්. එතැනින් ලේසියෙන් එන්න බැහැ. වටේටම මුහුද. ඒ Island එක, ඒ සෝබර් දූපත අපේ රටට අයිති එකක්. මා කලින් කියපු, දඬුවම් ලබන පුද්ගලයන් ඒ දූපතට ගෙන ගොස් දමන්නත් පුළුවන් බව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා.

සිංගප්පූරුවේ හෙරොයින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්ට දඬුවම විදුලි පුටුවට යැවීමයි. ඒ දඬුවමේ දරුණු බව දැනගෙන ඒ රටේ මිනිස්සු ඒවාට ඇබ්බැහි වීම අඩු කරගෙන තිබෙනවා. අපි

බෞද්ධාගමික රටක් වුණත්, ඒ විධියට විදුලි පුටුව මඟින් මරණ දඬුවම දීම ක්‍රියාත්මක කළොත් අනාගත දරුවන් වෙනුවෙන්, අනාගත රට වැසියන් වෙනුවෙන් යහපතක් වෙයි. එතකොට මේ මත්ද්‍රව්‍ය ව්‍යාපාර බොහෝදුරට අඩු වෙයි කියලා මට ලොකු විශ්වාසයක් තිබෙනවා. ඒ නිසා අපට දැඩි දඬුවම් ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළක් අනුගමනය කරන්න වෙනවා. සිංගප්පූරුවේ වාගේමයි සෞදි අරාබියේ තත්ත්වයත්. ඒ අය මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිවලට, ස්ත්‍රී දූෂණවලට දඬුවම හැටියට ගල් ගහලා මරනවා. ඒක ඒ රටේ නීතිය. අපිත් ඒ වාගේ දඬුවම් ලබා දෙන්න පටන් ගත්තොත් මිනී මැරුම්, මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිකරුවන් අඩු වෙයි කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා මම වර්තමාන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධ නීති රීති දැඩි කරන්න කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් ඉතිරිව තිබෙනවා.

**ගරු ගුණතිලක රාජපක්ෂ මහතා**
(மாண்புமிகு குணதிலக ராஜபக்ஷ)
(The Hon. Gunathilaka Rajapaksha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 14ක කාලයක් තිබුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් ඒක අඩු වෙලා තිබෙනවා.

**ගරු ගුණතිලක රාජපක්ෂ මහතා**
(மாண்புமிகு குணதிலக ராஜபக்ஷ)
(The Hon. Gunathilaka Rajapaksha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උදේ වරුවේ විපක්ෂය පැත්තෙන් කියනවා ඇහුණා අපේ ආණ්ඩුව මැතිවරණවලට බයේ කල් මරනවා කියලා. හැබැයි, ඒ අයට අපි මතක් කරන්න ඕනෑ, යහපාලන ආණ්ඩුව කාලයේ අවුරුදු 03ක් යනතුරු පළාත් පාලන මැතිවරණය පැවැත්වූවේ නැහැ කියන එක. අන්තිමට පළාත් පාලන මැතිවරණය තිබුණේ, 2011දී. 2015දී තමයි ඊළඟ පළාත් පාලන මැතිවරණය පවත්වන්න තිබුණේ. නමුත්, අවුරුදු 3ක් වනතුරු - 2018 වනතුරු- ඒ ආණ්ඩුව පළාත් පාලන මැතිවරණය තිබ්බේ නැහැ. ඒ කාලයේත් ඔය සජබයේ අය හිටියා, ජේවීපී සහෝදරවරු හිටියා. 1982දීත් ජනමත විචාරණයක් ගෙනැල්ලා මැතිවරණය කල් දැම්මා අපට මතකයි. ඒ නිසා මේක අහම්බයක් නොවෙයි.

මාත් පළාත් සභාවේ හිටපු මන්ත්‍රීවරයකු හැටියට දන්නවා, 2018දී තමයි පළාත් සභා මැතිවරණය තියන්න නියමිතව තිබුණේ. එවකට තිබුණු යහ පාලන ආණ්ඩුව 2019 වසර අවසාන වනතුරු බලයේ හිටියා. ඉතින් පළාත් සභා මැතිවරණය තිබ්බාද? Charles Nirmalanathan) අය දැන් මැතිවරණ ඉල්ලනවා. ඒක විහිළුවක්. අපි මැතිවරණවලට භය පක්ෂයක් නොවෙයි. අපේ පක්ෂය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ. අපි මැතිවරණවලට භය නැහැ. නමුත්, අපි හිතන්න ඕනෑ කාරණාවක් තිබෙනවා. අපි අවුරුදු 5කට ජනතාවගෙන් බලය අරගෙනයි මේ සභාවට ආවේ. කොවිඩ් වසංගතයට හිර වෙලා, අරගළයට මාස ගානක් හිර වෙලා, අවුරුදු දෙකක් නිකම්ම ඒ කාලය නාස්ති වුණා. අපට ජනතාව ඡන්දය දුන්නේ අවුරුදු 5කට. ඒ නිසා මම කියනවා පුළුවන් නම් අපට අහිමි වුණු ඒ අවුරුදු දෙකත් එකතු කරලා දෙන්න කියලා. ජනතාව අපට වැඩ කරන්න වරම දුන්නත්, අපට වැඩ කරන්න ඉඩ ලැබුණේ නැහැ. අපි ඒ වැඩ කොටස කළ යුතුයි. ඡන්දවලට අපි භය නැහැ. ඊළඟ මැතිවරණය කොයි මොහොතේ ආවත් අපේ පක්ෂයත්, අපේ රජයත් භය නැතිව, නොපැකිළිව ඒවාට මුහුණ දෙන්න සූදානම් බව උදේ වරුවේ ඒ ගැන කථා කළ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මා මතක් කර සිටින්න ඕනෑ.

මේ රටේ අධිකරණ ක්ෂේත්‍රය තුළ පවතින ප්‍රශ්න විසඳීමට ගත්ත ක්‍රියාමාර්ග ගැන වර්තමානයේ අධිකරණ විෂයය භාර ගරු අමාත්‍යතුමාට ස්තුතිය පුද කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
How many minutes do I have, Sir?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
You have five minutes, Hon. Member.

[2.49 p.m.]

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
Hon. Presiding Member, there is an old saying that goes, “Do not throw the baby out with the bathwater.” The Hon. Minister of Justice is present here. I think, our system has failed. So, we are in a situation - I think we are in a unique situation, Hon. Minister - where we can actually think anew, think outside the box and bring in laws and regulations that can actually make that "system change" happen in this country. That is required. Hon. Minister, I know you are trying very hard. We have had several consultations with you in regard to the things that you want to do in your Ministry. So, let me first wish you well in those endeavours.

However, Sir, we are in a situation like - පැදුරෙන් බිමට වැටුණා වාගේ තත්ත්වයක්. We are bankrupt. We are actually economically bankrupt and also we are now politically and socially bankrupt. We have to fix this country. In this time of adversity we have a good opportunity. If both sides of the aisle can work together, we can actually fix this country now and have a system in place that we can be proud of and hand this country over to the next generation.

However, is this the system change that was promised not so long ago? Look at the continuing scandals and allegations that are taking place even in this bankrupt state. Look at the coconut oil scandal that took place; look at the sugar scandal that took place. We, actually, as Samagi Jana Balawegaya and Samagi Tharuna Balawegaya, went to the Commission to Investigate Allegations of Bribery or Corruption and made a complaint. It has been two years now, but we still have not got any result as to

[ගරු මයන්ත දිසානායක මහතා]

what is happening with that investigation. There is nothing that they have notified to any of us  as to what is going on with that investigation.

Hon. Presiding Member, we say that we are one country with one system of law. However, sadly, we are like two countries with many systems of law - one law for the rich and the powerful and some other law for the poor and downtrodden villager who lives in a remote place in Polonnaruwa, Ampara or any other area. If a villager picks up a coconut from a neighbour's compound, then the full extent of the law will be extended to him; he will have to face the full consequences of it. This is what we must change in this country. If you look at the Easter Sunday attack, Sir, we are still waiting for justice.  The families are waiting for justice; they are still crying at night wondering what happened. Hon. Minister, if we are to move forward in this country, we need to solve these issues. එහෙම කරන්නේ නැත්නම් අපට කවදාවත් ඉදිරියට යන්න බැහැ කියන එක කනගාටුවෙන් වුණත් මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. I can understand the pain and the sufferings that those families are undergoing and I can relate to that.

Sir, look at the laws that need to be put in place. For example,  we need laws in regard to contempt of court incidents and  we need an anti-corruption laws in this country.  In regard to Muslim divorce laws and  Kandyan divorce laws, we need to have new laws in place, so that this country will have a unified system. But we are still waiting for all that.

Look at the number of rape incidents happening. Hon. Minister, a recent survey statistics on rape incidents revealed that Sri Lanka has recorded the highest number of rape cases in Asia. It is a very sad state. Again, look at the sufferings of school children and sexual abuse of school children.   All in all, look at the plight of the school children today.

Also there was a story about animal cruelty doing rounds on Facebook, yesterday or the day before.  The Director of a certain hospital has ordered that all the dogs be beaten and chased out. There was a dog that was about to give birth and the pups that were born were stillborn. There are several cases like this. We are supposed to be a Buddhist country, but the number of cases regarding cruelty to animals are increasing. Therefore, we need to bring in laws to that effect. I do not know why it is not happening.

Hon. Presiding Member, I will wind up by saying this. We look at Singapore, Dubai and other countries in terms of their development.  They were able to develop because they had stringent laws; they had one law for everybody. When Singapore Airlines went on strike in 1980, Prime Minister, Lee Kuan Yew said, "The rule of law will prevail. If the pilots are going on with the strike and if they are not working, I will use the full extent of the law and sack them. I will take in a new set of pilots and continue with the Singapore Airlines. I will not let Singapore Airlines be grounded nor let the country fall."

So, I think it is time, we need to bring in laws that can actually be followed in this country, without using the police to hammer the *Aragalaya* or the boys that were in the *Aragalaya.*  We must use the police actually to enforce law and order in this country.

Hon.  Presiding Member, I know I have limited time, but I'll wind up by saying this.  It is actually with a heavy heart that I see this country struggling to move forward. I look forward to seeing a change and hope that we can change this system by bringing in the laws and regulations that are required.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.56]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha  Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ කාරණා හා සම්බන්ධ පනත් කෙටුම්පත් කිහිපයක් පිළිබඳව අද සාකච්ඡාවට ලක් වනවා. ඒ පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් අපට විශාල ගැටලු නැහැ. නමුත් ගරු ඇමතිතුමනි, අපි කොච්චර නීති රීති ගෙනාවත්, මේ ආර්ථික තත්ත්වයත් එක්ක නීතිය, සදාචාරය, සංස්කෘතිය නිවැරැදිව රැකෙන්නේ නැහැ.  බුදු හාමුදුරුවන් වහන්සේ අග්ගඤ්ඤ සූත්‍රයේ ඉතා පැහැදිලිව දේශනා කර තිබෙනවා, "දුප්පත්කම ඇති වන කල්හි හොර හතුරන් බිහි වේ. හොර හතුරන් ඇති වන කල්හි අවි ආයුධ බිහි වේ. අවි ආයුධ ඇති වන කල්හි අපරාධ, මිනී මැරුම්, මංකොල්ලකෑම් ඇති වේ" කියලා. ඒ නිසා නීතියෙන් විතරක් අපරාධ වළක්වා ගන්න පුළුවන් කියලා අපි හිතන්නේ නැහැ.

කුඩු ජාවාරම මේ තරම් ව්‍යාප්ත වෙන්න, අපරාධ වැඩි වෙන්න ප්‍රධාන හේතුව තමයි, සමාජ පදනම බිඳ වැටීම සහ ආර්ථික පදනම බිඳ වැටීම. මිනිස්සු කුඩු විකුණන්නේ සල්ලි හොයන්න වෙන කරන්න දෙයක් නැති නිසා. මට මතකයි, දරුවන් දෙදෙනෙකු ඉන්න අවුරුදු 26ක අම්මා කෙනෙක් ගල්කිස්ස උසාවි භූමියේදී යට ඇඳුමේ තියාගෙන කුඩු පැකට් දෙකක් විකුණලා පොලීසියට අහු වුණා. පොලීසිය ප්‍රශ්න කරද්දී ඒ අම්මා කිව්වේ, "මගේ දරුවෝ දෙන්නාට කිරි පැකට් එකක් ගන්න මම මේ කුඩු පැකට් විකුණනවා" කියලා. එල්ලුම් ගහ -මරණීය දණ්ඩනය- තිබෙනවා කියලා පෙනි පෙනීත් ඒ අම්මා කුඩු පැකට්  විකුණන තත්ත්වයට පත් වන්නේ ඇත්තටම මේ තිබෙන ආර්ථික ප්‍රශ්න නිසා. ඒ නිසා අද සමාජයේ මතුවෙලා තිබෙන දැවැන්ත ආර්ථික අර්බුදයත් එක්ක අපරාධ, කුඩු ජාවාරම්, පාතාලය, මිනී මැරුම්  වැඩි වෙනවා. ඒ නිසා නීතියෙන් පමණක් මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන් කියලා අපි හිතන්නේ නැහැ. ඒ සඳහා මේ ආර්ථික පදනම වෙනස් විය යුතුයි. එහෙම වුණොත් පමණයි, මේ අපරාධ සහ කුඩු ජාවාරම් පාලනය කරන්න පුළුවන් වන්නේ.

විෂ මත්ද්‍රව්‍ය ළඟ තබා ගැනීමට අදාළව පැවැති ග්‍රෑම් 2 සීමාව ග්‍රෑම් 5 දක්වා වැඩි කිරීම සම්බන්ධයෙන් කරුණු දක්වමින් ආණ්ඩුව පාර්ශ්වයෙන් කිව්වා, "හිර ගෙවල්වල තද බදය අඩු කරගන්න ඕනෑ. එක සිරකරුවකුට රුපියල් 800ක් වියදම්

වෙනවා" කියලා. මා හිතන හැටියට ඒක පාලනය කරන්න නම් - සිරගත වන ප්‍රමාණය අඩු කරගන්න- මේ වාගේ සංශෝධනයක් ගෙනෙන එක ප්‍රඥාගෝචර නැහැ. මොකද, රටේ දැන් තිබෙන තත්ත්වය අනුව ඒ ග්‍රෑම් 2 සීමාව ග්‍රෑම් 5 කළොත්, ග්‍රෑම් 5 ග්‍රෑම් 10 කළොත්, තව අවුරුදු දෙකතුනකින් වෙන දේ බලන්න. මත් ද්‍රව්‍ය භාවිත කරන අය අද ඉන්නේ ලක්ෂ 5ක් නම්, මේ නිසා ඒ ප්‍රමාණය ලක්ෂ 10ක්, 15ක් දක්වා වැඩි වනවා. මේ යෝජනාවේ අරමුණ සිරගත වන සංඛ්‍යාව අඩු කිරීම නම්, ඒක වැරැදියි. නමුත්, ඉන් එහාට ගිහින් මත් ද්‍රව්‍ය හා සම්බන්ධ මහා පරිමාණ ජාවාරම්, මහා පරිමාණ ව්‍යාපාර නතර කිරීමේ අර්ථයෙන් විෂ මත් ද්‍රව්‍ය ග්‍රෑම් 10කට වඩා ළඟ තබාගත් අයට දැඩි නීති රීති පනවමින්, ඇප ලබා ගැනීමේ ටිකක් අමාරු තත්ත්වයක් ඇති කළොත්, අභියාචනාධිකරණයට ගිහිල්ලා ඇප ලබාගන්නා තත්ත්වයක් ඇති කළොත්, මහා පරිමාණ මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවන්, මහා පරිමාණ ව්‍යාපාර මෙල්ල කිරීමක් අපේක්ෂා කරන්න පුළුවන්. නමුත් මේ කුඩුවල ගොදුරු බවට පත් වන අය, සාමාන්‍යයෙන් කුඩු ගහන අය පාලනය කරන්න නම්, මේ තිබෙන සමාජ, ආර්ථික තත්ත්වය වෙනස් කරන්න ඕනෑය කියන එක පැහැදිලිව කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධීවර ක්ෂේත්‍රයට අදාළව ඉදිරිපත් කරන ගැසට් නිවේදන තුනකුත් අද ඉදිරිපත් කර තිබෙන නිසා, එම ක්ෂේත්‍රය ගැනත් කථා කරන්න මා මෙය අවස්ථාවක් කරගන්නවා. මේ වන කොට ධීවර ක්ෂේත්‍රයට අදාළව බරපතළ, දැවෙන ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. විශේෂයෙන්ම වත්තල-මීගමුව කලාපය පුරාවට වැලි හැරීම පිළිබඳ අලුත් තත්ත්වයක් මතු වෙලා තිබෙනවා. මීට කලින් Port City එක හැදීමට වැලි හාරද්දී ඒ ප්‍රදේශයේ කිලෝමීටර 6ක සීමාවට එහා පැත්තේ මුහුදු යෑම ධීවරයන්ට සීමා කළා. මුලදී පොරොන්දු වුණේ කිලෝමීටර් 6ක සීමාව කියලායි. නමුත් භාවිතයේදී ඒ සීමා උල්ලංඝනය කළා. ඒ නිසා ධීවරයෝ විශාල අපහසුතාවකට පත් වුණා. ඒ වාගේම, වත්තල ඉඳලා කොච්චිකඩේ දක්වා වන මුහුදු තීරය බරපතළ වෙරළ ඛාදනයකට ලක් වෙලා තිබෙනවා. එහෙම තිබියදී Muthurajawela LNG Project එකට තවත් වැලි ඝන මීටර් මිලියන 1.5ක් අවශ්‍යයි කියලා සඳහන් කර තිබෙනවා. ඒ ව්‍යාපෘතිය සඳහාත් ඒ ප්‍රදේශයේ වැලි හාරන්න යනවා. ඒ වැලි හැරීම තුළ වෙරළ තවදුරටත් ඛාදනයට ලක්වීම සිදු වනවා.

ඒ වාගේම, කොළඹ වරාය බටහිර ජැටිය ව්‍යාපෘතිය ඊයේ ආරම්භ කළා. එය ආරම්භ කරනවාත් එක්කම මීගමුව ප්‍රදේශයට ධීවර අමාත්‍යාංශයේ නිලධාරින් ගිහිල්ලා ධීවර සමිති නියෝජිතයන් කැඳවා "ඔලන්රෝ" හෝටලයේ රැස්වීමක් පවත්වා තිබුණා. කොළඹ වරාය බටහිර ජැටියට වැලි ගන්න අවශ්‍යතාවක් තිබෙනවා, ඒ නිසා වැලි හාරන්න ඉඩ දෙන්න, එහිදී සිදු වන හානියට ඒ ප්‍රදේශයේ ධීවර කර්මාන්තය කරන අයට යම් වන්දියක් ලබා දෙනවා කියලා පවසා තිබෙනවා.

පරිසර හානිය වෙනුවෙන් වන්දියක් ගෙවලා, ඒ ප්‍රදේශයේ ධීවර ජනතාවගේ ජන ජීවිතය අවුල් කරන්නයි මේ හදන්නේ. ධීවරයන් කවුරුවත් ඒකට එකඟ වෙලා නැහැ. ධීවර සමිතිවලින් ඒකට බරපතළ විරෝධයක් එල්ල වෙලා තිබෙනවා. හැබැයි, අමාත්‍යාංශ නිලධාරින් කියලා තිබෙනවා, "පස් දෙනෙකුගෙන් යුක්ත කමිටුවක් අපි පත් කරනවා, මේ වැලි හැරීම අනිවාර්යයෙන්ම සිද්ධ කරනවා"යි කියලා. Port City එක ක්‍රියාත්මක කරද්දීත්, වැලි හැරීම් වෙනුවෙන් රුපියල් ලක්ෂ විස්සක වන්දියක් ධීවර සමිතිවලට දෙනවා කියලා පොරොන්දු වුණා. නමුත්, ඒ කටයුත්තත් හරියාකාරව සිද්ධ වුණේ නැහැ. අද වනකොට ඒ වෙරළ තීරය ආරක්ෂා කරන ප්‍රධාන ස්ථාන වන පිටිපන, පමුණුගම වාගේ ප්‍රදේශ බරපතළ වෙරළ ඛාදනයකට ලක් වෙලා තිබෙනවා. වෙරළ තීරය ආරක්ෂා කරන තඹගල ගල් පරය අද වනකොට ඛාදනයට හා පුපුරා යෑමට ලක් වෙලා තිබෙනවා. එහෙම තියෙද්දීත් පරිසර ඇගැයීමක් නැතිව හදිසියේ බටහිර ජැටියට ගන්න වැලි හාරන්න යෑම තුළින් ඒ ප්‍රදේශයේ ධීවර ජනතාව විශාල පීඩාවට ලක් වෙනවා.

මේක කරන්න ඕනෑ ක්‍රමයක් තිබෙනවා. බටහිර ජැටිය ව්‍යාපෘතියට වැලි ලබා ගැනීමේ අවශ්‍යතාවක් තිබෙනවා නම්, ඒ ධීවර ජනතාව දැනුවත් කරලා, පරිසරයට හානියක් නොවන විධියටත්, වෙරළ තීරය ඛාදනය නොවන විධියටත් කටයුතු කරන්න තිබුණා. වෙරළ තීරය ඛාදනයට ලක් වෙලා තිබෙන නිසා, ඒ ප්‍රදේශයේ ජනතාවගේ ගෙවල් බලා ගෙන සිටියදී ගහ ගෙන යනවා. ඒ නිසා මේ තත්ත්වය වහාම පාලනය කරන්න රජය මැදිහත් විය යුතුව තිබෙනවා. "මීගමුව සංවර්ධන සැලැස්ම" කියලා එකක් තිබෙනවා. 2030 අවුරුද්ද වනකොට ඒ ප්‍රදේශයේ ධීවර ගම්මාන සම්පූර්ණයෙන්ම අහෝසි වන සැලැස්මක් තමයි ඇත්තටම තිබෙන්නේ. විශේෂයෙන්ම වත්තල සහ මීගමුව කලාපය තුළ ජීවත් වන ධීවර ජනතාව මේ ප්‍රශ්නය නිසා දැඩි ලෙස පීඩාවට පත් වෙලා සිටිනවා. ඔවුන්ගේ ජීවත් වීමේ අයිතිවාසිකම ලබා දෙන්න; ඔවුන්ගේ ජන ජීවිතය ආරක්ෂා කර දෙන්න. බටහිර ජැටියට ගන්න වැලි හාරන්න කියමින් ධීවරයන්ට මුහුදු යන්න තිබෙන අවස්ථාව නැති කරන්න එපා. ආර්ථික අමාරුකම් යටතේ ජීවත් වන ධීවර ජනතාවට රස්සාව නැති කරන්න එපා. ඒ අයගේ ගෙවල් ටික මුහුදට ඛාදනය වෙන්න ඉඩ හරින්න එපා. ඔවුන් ආරක්ෂා කරන්න මැදිහත් වෙන්න කියලා ඉල්ලා සිටිමින් මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.03]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සමගි ජන බලවේගයේ ජාතික ලැයිස්තුවෙන් මන්ත්‍රී ධුරයට පත් වෙච්ච ඩයනා ගමගේ රාජ්‍ය ඇමතිතුමිය මේ ගරු සභාවට ඇවිල්ලා කථා කළා. එතුමිය මොනවා කියනවාද කියලා අපටත් තේරුණේ නැහැ. එතුමිය හැම කෙනාටම බැණගෙන, බැණගෙන ගියා. කාට බැන්නාද කියලා අපි දන්නේත් නැහැ. හිටපු ගමන් ඇමතිතුමාගේ පැත්තටත් අත දික් කළා; අපේ පැත්තටත් අත දික් කළා. නමුත් අපි දන්නේ නැහැ, එතුමිය කාට බැන්නාද කියලා. මම හිතන විධියට, අද එතුමියට උසාවියේ නඩුවක් තිබෙනවා. ලබන දෙසැම්බර් 15වැනි දා ඒ නඩුව යළි කැඳවන ලෙසත්, එතුමියගේ නඩුවට අදාළ සියලු ලිය කියවිලි ඉදිරිපත් කරන්න කියලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට උසාවියෙන් නියෝග කරලා තිබෙනවා. සමහර විට ඒ නඩුව නිසාද දන්නේ නැහැ, එතුමිය කලබල වෙලා මේ ගරු සභාවට ඇවිල්ලා අපි ඔක්කොටම බැණලා ගියේ. එතුමියට පිනට ජාතික ලැයිස්තුවේ මන්ත්‍රීකමක් ලබා දුන්නාට, එතුමිය හරි නම් විපක්ෂ නායකතුමාට මල් තියලා වඳින්න ඕනෑ කියලා මා එතුමියට කියන්න කැමැතියි. මොකද, අපි ඔක්කෝම මහන්සි වෙලා, ඡන්ද අරගෙන තමයි මේ ජාතික ලැයිස්තුවේ මන්ත්‍රීවරු ටික ලබා ගත්තේ. එතුමිය කොහේද ඉඳලා ඇවිල්ලා, අපේ ජාතික ලැයිස්තුවෙන් පිනට මන්ත්‍රී ධුරයකට පත් වුණා.

[ගරු මුජිබුර් රහුමාන් මහතා ]

2009 අවුරුද්දේ එතුමිය එක්සත් ජාතික පක්ෂයෙන් පළාත් සභාවට තරග කළා. මා හිතන විධියට එදා එතුමිය ඡන්ද දෙදාහක්වත් ගත්තේ නැහැ. එතුමියට පළාත් සභාවටවත් යන්න අවස්ථාවක් නැතිව සිටියදී තමයි අපේ විපක්ෂ නායකතුමාගේ හොඳකමට එතුමිය පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක් හැටියට පත් කළේ. නමුත්, එතුමිය අද මේ ගරු සභාවට ඇවිල්ලා එතුමාටම ගරහන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. එතුමිය භාරව සිටින රාජ්‍ය අමාත්‍යාංශයේ තිබෙන ප්‍රශ්න, ඇමතිතුමා එක්ක තිබෙන ප්‍රශ්න, එතුමියට ගැසට් නොකර තිබෙන ආයතන පිළිබඳ ප්‍රශ්න, ඒවා ඔක්කොම ආණ්ඩුව ඇතුළේ බේරා ගන්න කියන එකයි එතුමියට කියන්න තිබෙන්නේ. එතුමිය රෑට දකින හීන, ගෙදර වෙන දේවල් හිතේ තියා ගෙන ඇවිල්ලා මේ ගරු සභාවේ දී අපි එක්ක රණ්ඩු සරුවල් ඇති කර ගන්න එපා කියලා තමයි එතුමියට කියන්න තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අධිකරණ අමාත්‍යාංශය යටතට අයත් වන සංශෝධන පනත් කෙටුම්පත් කීපයක් දෙවනවර කියවීම සඳහා අද මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත තුළින් මත් ද්‍රව්‍ය විනාශ කිරීම, වැටලීම සම්බන්ධව තිබෙන නීති රීති තව-තවත් තදින් ක්‍රියාත්මක කරලා, ඒවා භාවිත කරන අයට නීතියෙන් ගැලවෙන්න අවස්ථාව නොලැබෙන ආකාරයේ නීති රීති ගෙන ඒම පිළිබඳව ගරු ඇමතිතුමාට අපි ස්තුතිවන්ත වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ජනාධිපතිතුමා අද උදේ වරුවේ මේ ගරු සභාවට ඇවිල්ලා කිව්වා, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට සංශෝධන ගෙනෙනවා කියලා. ජනාධිපතිතුමා අගමැති වෙලා හිටපු කාලයේත් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමට මේ පනත සංශෝධනය කරනවා කියලා පොරොන්දු වුණා. හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත් කිව්වා, මේ පනත සංශෝධනය කරනවා කියලා.

නමුත්, අපි අහන්නේ කවදාද මේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සංශෝධනය කරන්නේ? හැම දාම ඇවිල්ලා කියනවා, පනත සංශෝධනය කරනවා කියලා. නමුත්, දින වකවානුවක් නැහැ. සංශෝධනය කරන්නේ කවදා ද කියලා කියන්නේ නැහැ, සංශෝධනය කරනවා කියලා කියනවා. 2015 - 2019 ආණ්ඩු කාලයේ එතුමා අගමැති වෙලා සිටියදීත් ඒක කිව්වා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත් කිව්වා. හිටපු අධිකරණ ඇමතිතුමාත් කිව්වා. නමුත්, සංශෝධනය වෙන පාටක් නැහැ.

ඒ පනත සංශෝධනය නොකර, ආණ්ඩුවට විරුද්ධව සිටින විරුද්ධවාදීන් දඩයම් කරන්න මේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පාවිච්චි කරනවා කියලා අපට පෙනෙනවා. ඒ පනත භාවිත කරමින් වසන්ත මුදලිගේ කියන ශිෂ්‍ය නායකයාත්, ඒ වාගේම සිරිධම්ම ස්වාමීන් වහන්සේත් අද වෙන කොට රඳවාගෙන ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම පැහැදිලිවම කියලා තිබෙනවා, ඒ දෙදෙනා අත්අඩංගුවට අරගෙන තිබෙන එක ඉතාම අසාධාරණයි, අයුක්ති සහගතයි, ඒ දෙපළට සාමාන්‍ය නීතිය ක්‍රියාත්මක කරන්න පුළුවන් කියලා. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම පසුගිය සතියේ එළි දැක්වූ වාර්තාවකින් ඒක කියලා තිබෙනවා. එහෙම නම් මොකට ද මේ නීතිය? ලබන සුමානය වෙන කොට ඒ අය රඳවාගෙන සිටින දින 90 - මාස තුන - අවසානයි. අපි අධිකරණ ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, දින 90ක් රඳවා තබා ගන්න එක තවත් දික් කරනවා ද, එහෙම නැත්නම් මේ දින 90 අවසාන වෙන නිසා ඒ ශිෂ්‍ය ක්‍රියාකාරීන් දෙදෙනා නිදහස් කරනවාද කියලා. අපට ඒකට උත්තරයක් දෙන්න ඕනෑ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සංශෝධනය කරනවා කියලා, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ තමන්ට විරුද්ධව අදහස් පළ කරන අය රඳවා තබා ගැනීම හා අත්අඩංගුවට ගෙන ඒ අය මර්දනය කිරීම ගැන අපි තදබල ලෙස අපේ විරෝධය පානවා. ඒක ජාත්‍යන්තරයේත් අද වෙන කොට කථා බහට ලක් වෙලා තිබෙනවා. විශේෂයෙන් ම යුරෝපා සංගමය පසුගිය සතියේ පවත්වපු රැස්වීමේදී පවා මේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ගැන සාකච්ඡා කරලා තිබෙනවා. ඔවුන් ආණ්ඩුවට දන්වලා තිබෙනවා, වහාම මේ පනත සංශෝධනය කරන්න කියලා. එහෙම නොකර ආණ්ඩුව හිතුමතේ යන්න ගියොත් GSP Plus එකටත් අනතුරුදායක තත්ත්වයක් ඇති වෙන්න පුළුවන් කියන එකත් අපි මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් මම මේ කාරණය කියන්න ඕනෑ. 2021 නොවැම්බර් 02වැනි දා මම නීතිපති දෙපාර්තමේන්තුවට ලිපියක් දුන්නා. පසු ගිය කාලයේ නීතිපති දෙපාර්තමේන්තුව ආණ්ඩුවේ ප්‍රබලයන්ට දාපු නඩු විශාල ප්‍රමාණයක් ඉල්ලා අස් කරගත්තා. ඒ හිටපු ඇමතිවරුන් වෙන්න පුළුවන්, වර්තමාන ඇමතිවරුන් වෙන්න පුළුවන්, ආණ්ඩුවත් එක්ක ගනුදෙනු කරපු අය වෙන්න පුළුවන්, ජනාධිපතිතුමා ළඟින් හිටපු අය වෙන්න පුළුවන්, ඒ සියලුදෙනාට සම්බන්ධ නඩු ටික ඉල්ලා අස් කර ගත්තා. 2021 නොවැම්බර් මාසයේ 02වැනි දා අපි ලිපියක් භාර දුන්නා, තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ඒ විස්තර ටික අපට ලබා දෙන්න කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම යවපු ලිපියට 2022 පෙබරවාරි මාසයේ 01වැනි දා නීතිපති දෙපාර්තමේන්තුව මට ලිපියක් එවා තිබුණා. එතුමන්ලා ඒ ලිපියේ වැදගත් දෙයක් කියලා තිබෙනවා. එහි Right to Information Act එකේ අංකය දාලා, "Reply Letter" කියලා සඳහන් කර තිබෙනවා, "The information requested relate to many cases instituted before High Courts in many parts of the island. The process of collecting the necessary information would therefore require a reasonable length of time." කියලා. ඒ කියන්නේ සාධාරණ කාලයක් අවශ්‍යයි ලු. නීතිපති දෙපාර්තමේන්තුව මට මේ ලියුම එව්වේ, 2022 පෙබරවාරි මාසයේ 01වැනි දා. දැන් ඒකට මාස 08ක් ගත වෙලා, මාස 09කට ආසන්න කාලයක් වෙනවා. ගරු ඇමතිතුමනි, නීතිපති දෙපාර්තමේන්තුවට තවම බැරි වෙලා තිබෙනවා, ඉල්ලා අස් කර ගත්ත නඩුවල විස්තර ටික ලබා දෙන්න. ලජ්ජයි. රටේ නීතිය ක්‍රියාත්මක කරන, රටේ ජනතාව නීතියේ සාධාරණත්වය බලාපොරොත්තු වෙන නීතිපති දෙපාර්තමේන්තුව මෙන්න මේ විධියට නොසැලකිලිමත්ව වැඩ කරනවා නම් මොකක්ද මේ රටේ නීතිය ගරු ඇමතිතුමනි? නීතිපති දෙපාර්තමේන්තුවම නීතියට ගරු කරන්නේ නැහැ. ඇයි, ඒ තොරතුරු දෙන්න බැරි? ආණ්ඩුවේ නායකයන්ගේ විස්තර නිසාද? ආණ්ඩුවේ ඇමතිවරුන් සම්බන්ධ ඉල්ලා අස්කර ගත් නඩු නිසාද? එහෙම නැත්නම්, ඒවා දෙන්න එපා කියලා නීතිපති දෙපාර්තමේන්තුවට ආණ්ඩුවෙන් බලපෑම් එනවාද කියන ප්‍රශ්නය අපි අහන්න කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතිපති දෙපාර්තමේන්තුව අද ඉතා කනගාටුදායක තත්ත්වයකට පත් වෙලා තිබෙනවා.

මම මතක් කරන්න ඕනෑ තව විශේෂ දෙයක් තිබෙනවා. පාස්කු බෝම්බ ප්‍රහාරයට සම්බන්ධ සාරා ජෙස්මින් කියන කාන්තාව තමයි සහරාන්ලා එක්ක ඉඳලා බේරුණු එකම කාන්තාව. සහරාන්ගේ බිරිඳ ජනාධිපති කොමිසමට දීපු කටඋත්තරයේ පවා ඇය කියනවා, "සාරා ජෙස්මින් මැරුණේ නැහැ. බෝම්බ පිපිරුණාට පස්සේ ඇය එළියේ කථා කර කර හිටියා මට ඇහුණා" කියලා. සහරාන්ගේ බිරිඳගේ කටඋත්තරයේ එහෙම තිබෙනවා. අපි හැම දාම කිව්වා, මේ සාරා ජෙස්මින් අල්ලාගන්න කියලා.

සාරා ජෙස්මින් වෙනුවෙන් DNA පරීක්ෂණ දෙකක් කළා. මේ බෝම්බ ප්‍රහාරය සම්බන්ධයෙන් වූ පාර්ලිමේන්තු විශේෂ කාරක

සභාව යන අතරේ එක පරීක්ෂණයක් කළා. ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාව යන අතරේ නියෝගයක් දුන්නා, තවත් පරීක්ෂණයක් කරන්න කියලා. ඒ DNA පරීක්ෂණ දෙකේදීම සාරා ජෙස්මින්ගේ මළ සිරුර කල්මුනේ බෝම්බ පිපිරුණු තැන තිබුණේ නැහැයි කියන එක තහවුරු වුණා. ඒ කියන්නේ, සාරා ජෙස්මින් ඉන්නවා කියන එකයි. මාස කීපයකට කලින් පොලිසිය භාරව හිටපු ඇමතිවරයා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වා, "සාරා ජෙස්මින් මියැදිලා කියලා අපි සැක කරනවා. නැවත වතාවක් මේ DNA පරීක්ෂණය කරන්න ඕනෑ" කියලා. ඊට පස්සේ තුන්වෙනි වරටත් ඒ පරීක්ෂණය කළා. දැන් තුන්වෙනි වරටත් ඒ වාර්තාව නිකුත් වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතැන වළ දමපු මළ සිරුරු එක්ක සාරා ජෙස්මින්ගේ මවගේ DNA සැසඳෙන්නේ නැහැ. එහෙම නම් සාරා ජෙස්මින් ඉන්නවා. සාරා ජෙස්මින් ඉන්දියාවට යවන්න උදවු කරපු අබූබකර් කියන කලවංචිකුඩි පොලිසියේ OIC මහත්මයා තවම CID එකේ අත්අඩංගුවේ ඉන්නවා. නමුත්, මට තිබෙන ප්‍රශ්නය තමයි, ආණ්ඩුව සාරා ජෙස්මින් හොයනවාට වඩා, සාරා ජෙස්මින් මැරුණා කියලා තහවුරු කරන්න මහන්සි වන එක.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න. ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මම ඉක්මනින් කථාව අවසාන කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ ඇයි? සාරා ජෙස්මින් හොයා ගත්තොත් මේ සියලු තොරතුරු හොයා ගන්න පුළුවන් වන නිසා. මොකද, සහරාන්ගේ කණ්ඩායමේ දැනට ජීවතුන් අතර ඉන්නවා කියලා තහවුරු වෙලා තිබෙන එකම කෙනා තමයි, සාරා ජෙස්මින් නොහොත් පුලස්තිනී මහේන්ද්‍රන්. ඒ නිසා අපි ආණ්ඩුවට කියනවා, සාරා ජෙස්මින් මැරුණාය කියලා තහවුරු කරන්න මහන්සි වෙන්න එපා කියලා. ඇය ඉන්දියාවට යවන්න උදවු කරපු පොලිසියේ OIC මහත්මයාත් අද වනකොට ඉන්නේ අත්අඩංගුවේ. ඉන්දියානු ආණ්ඩුවේ ඉන්න ආරක්ෂක උපදේශකවරයා කීප වතාවක් ලංකාවට ආවා. ඒ වෙලාවේ අපි ආරක්ෂක රාජ්‍ය ඇමතිතුමාගෙන් ප්‍රශ්න කළා, ඉන්දියානු ආරක්ෂක උපදේශකවරයාත් එක්ක සාකච්ඡා කරලා සාරා ජෙස්මින් ඉන්දියාවේ ඉන්නවා නම්, ලංකාවට ගෙන්වා ගන්න වැඩ පිළිවෙළක් සකස් කළාද, ඒ ගැන ඉල්ලීමක් කළාද කියලා. නමුත්, එවැනි කිසිම ඉල්ලීමක් කරලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉක්මනින් මගේ කථාව අවසාන කරන්නම්.

අවසාන වශයෙන් මම ගරු කථානායකතුමාගෙන් ඉල්ලීමක් කරනවා. දැන් ද්විත්ව පුරවැසිභාවය ගැන පාර්ලිමේන්තුවේ විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ද්විත්ව පුරවැසියන් විතරක් නොවෙයි, මේ පාර්ලිමේන්තුවේ විදේශිකයෝත් ඉන්නවා කියලා කථාවක් තිබෙනවා. ඒ නිසා පාර්ලිමේන්තුවටත්, කථානායකතුමාටත් වග කීමක් තිබෙනවා, මේ සම්බන්ධයෙන් හොයන්න විශේෂ කාරක සභාවක් පත් කරලා, ඒ විශේෂ කාරක සභාවට බලය ලබා දෙන්න. එතකොට ඒ විශේෂ කාරක සභාව හරහා පාර්ලිමේන්තුව තුළ ඉන්න ද්විත්ව පුරවැසියෝ කවුද කියලා හඳුනා ගන්න පුළුවන්. බොහොම ස්තුතියි.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මුජිබුර් රහුමාන් මැතිතුමා නඟපු ප්‍රශ්නයට කෙටි උත්තරයක් දෙන්න ඕනෑ. එතුමාත් දන්නවා, මම පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ සාක්ෂිකරුවෙක් කියන එක. ඒ නිසා මම ඒ පිළිබඳව දීර්ඝ වශයෙන් කථා කරන්න යන්නේ නැහැ. එතුමාත් එහිදී සාක්ෂි දුන්නා.

පාස්කු ප්‍රහාරය වැනි ප්‍රහාරයක් සිද්ධ වෙන්න ඉඩකඩ තිබෙනවාය කියලා කියපු නිසාම මම අවුරුදු දෙකහමාරක් තිස්සේ මේ පාර්ලිමේන්තුව තුළ වින්දිතයකු විධියට තමයි හිටියේ. ජාතිවාදය අවුස්සන කෙනෙකු විධියට මම ලේබල්වෙලාත් හිටියා. මේ පිළිබඳව පරීක්ෂා කළ ජනාධිපති පරීක්ෂණ කොමිසමත් කියලා තිබෙනවා, එවකට නීතිය ක්‍රියාත්මක කරන ආයතන, පණිවුඩකරුට වෙඩි තිබ්බා මිසක්, ඒ පිළිබඳව සොයා බලා කටයුතු නොකරපු නිසායි ඒක වුණේ කියලා.

ඇත්ත වශයෙන්ම උදේ ගරු ජනාධිපතිතුමා කිව්වේ, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සංශෝධනය කරනවා කියලා නොවෙයි. ඒ පනත මීට අවුරුද්දකට කලින් සශෝධනය කරලා තිබෙනවා. ඒ පනත වෙනුවට අලුතින් පනතක් ගේන්න මම කමිටුවක් පත් කරලා තිබෙනවා. ඒ කමිටුව තුළින් අපි බලාපොරොත්තු වෙනවා, ඉදිරි මාස තුනක වාගේ කාල සීමාවක් ඇතුළත ඒ වෙනුවට අලුත් පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන්න කියලයි.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න, ගරු ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න.

දැන් මේ ගරු සභාවේදී අපේ මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කිව්වා, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සංශෝධනය වෙනවා කියලා. මට අහන්න තිබෙන්නේ මේකයි. ඒ පනත සංශෝධනය කරනවාට මම විරුද්ධ නැහැ. නමුත්, මේ ගරු සභාවේදීම සුමාන දෙකකට ඉස්සෙල්ලා මේ පාර්ලිමේන්තුවේ ඉන්න ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරු පිළිගත්තා, අමරකීර්ති මහත්මයා ඝාතනය කළේ ත්‍රස්තවාදීන් කියලා. ඒ වාගේම, මට ගැහුවේත් ත්‍රස්තවාදීන්. ගරු ඇමතිතුමනි, ඒ නිසා තමයි මම ඔබතුමාගෙන් අහන්නේ, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සංශෝධනය කරනවාද, නැත්නම් අහෝසි කරනවාද කියලා. මොකද, එහෙම වුණොත් අමරකීර්ති මහත්මයාට වාගේම අපටත් ලොකු අවාසියක්, අසාධාරණයක් සිද්ධ වෙනවා. ඇත්තටම ආණ්ඩු පක්ෂය, විපක්ෂය යන දෙගොල්ලන්ම කිව්වා, ත්‍රස්තවාදී නායකයෝ තමයි අමරකීර්ති මහත්මයා ඝාතනය කළේ කියලා.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සංශෝධනය කරන්න නොවෙයි අපි බලාපොරොත්තු

[ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

වෙන්නේ. ඒ වෙනුවට අලුතින් පනතක් ගේන්නයි අපි බලාපොරොත්තු වෙන්නේ. ජාතික ආරක්ෂාව කියන එක අපට අඩුකොට තක්සේරු කරන්න බැහැ. අපි 2015දී ඒ වෙනුවට පනතක් කෙටුම්පත් කළා, Counter Terrorism Bill කියලා. ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනාවා. මට මතක හැටියට, ඒක ඉදිරිපත් කළේ එවකට හිටපු තිලක් මාරපන ඇමතිතුමා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවුරුත් බලාපොරොත්තු නොවුණු ආකාරයට පාස්කු ප්‍රහාරය සිද්ධ වුණාට පස්සේ, ඒ පනත් කෙටුම්පත ගැන කිසිවෙකුට උනන්දුවක් තිබුණේ නැහැ. එදා ඉදිරිපත් වූ පනත් කෙටුම්පත අනුව ත්‍රස්තවාදය වැළැක්වීමට පියවර ගත යුතුයි කියන මතයේ හැමෝම හිටියා. මේ වන විට රටේ තත්ත්වය වෙනස් වෙලා තිබෙනවා. නමුත් ජාතික ආරක්ෂාව දෙවනුකොට නොතබා, මහජන ආරක්ෂාව, මහජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා වන විධියට තුලනාත්මක ලෙස අලුත් පනත් කෙටුම්පතක් සකස් කරන්න කමිටුවක් පත් කරලා මේ වන විටත් ඒ වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.17]

**ගරු නීතිඥ මධුර විතානගේ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி மதுர விதானகே)
(The Hon. Madhura Withanage, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ප්‍රස්තුත කාරණාවලින් එපිටට ගිහින් ත්‍රස්තවාදය ගැන සාකච්ඡාවක් මතු වෙලා තිබෙනවා. මේ වන විට ලෝකයේ new terrorism - නව ත්‍රස්තවාදය - සහ traditional terrorism කියලා කොටස් දෙකකට බෙදිලා තිබෙනවා. පසුගිය කාලයේ ත්‍රස්තවාදය - terrorism - ගැන ජාත්‍යන්තරය, විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්ති තුළ Resolutions pass කරලා තිබෙනවා. ඒ වාගේම, FBI ආයතනය ත්‍රස්තවාදියා කියන්නේ කවුද කියලා නිර්වචන ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා ත්‍රස්තවාදීන්ට සුදු හුණු ගාන්න එපා. ජාතික ලැයිස්තුවලින් ආපු සමහර මිනිස්සු පසුගිය කාලයේ ත්‍රස්තවාදීන් විධියට වැඩ කළා. ඒ අය අත්අඩංගුවට ගන්නවා අපි දැක්කා. ඒ නිසා ජාතික ආරක්ෂාව ගැන සැලකිලිමත් වෙන්න. ත්‍රස්තවාදයට සම්බන්ධ අයට සුදු හුණු ගාන්න ලෑස්ති වෙන්න එපා කියලා අපි මේ උත්තරීතර සභාවෙන් ඉල්ලනවා. ත්‍රස්තවාදියා කියන එක විවරණය කරලා තිබෙන විධිය Google ගිහින් බලන්න පුළුවන්. එතකොට ඒ ගැන හොඳටම දැනගන්න පුළුවන්. මේ පිළිබඳව අපට උපදෙස් දෙන, පනත්වලට සංශෝධන ගේන්න කියන ජාත්‍යන්තර ආයතනවල, ඒ රටවල ත්‍රස්තවාදය කියන එක හොඳට නිර්වචනය කරලා තිබෙනවා.

මම අලි සබ්රි ඇමතිතුමාටත්, ඒ වාගේම විජයදාස රාජපක්ෂ ඇමතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. නවවැනි පාර්ලිමේන්තුවේ ආරම්භයේ සිට ඉතාම කඩිනමින් පනත්වලට සංශෝධන රාශියක් එතුමන්ලා ගෙනැත් තිබෙනවා. ඒ නිසා පනත්වලට වැඩිම සංශෝධන ගෙනාපු පාර්ලිමේන්තුව විධියට අපේ පාර්ලිමේන්තුව සලකන්න පුළුවන්. මොකද, වසර ගණනාවක් අවධානයට ලක් නොවූ නීතිවලට අද වන විට විශේෂ සංශෝධන ගෙනැත් තිබෙනවා.

අදත් ඉතාම ප්‍රගතිශීලී නීති සංශෝධන කිහිපයක් ගෙනැල්ලා තිබෙනවා. මෙතැනදී විශේෂයෙන් සුළු හිමිකම් අධිකරණ ක්‍රමය ගැන මට කියන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, වාණිජ මහාධිකරණ වාගේ අධිකරණවල වාණිජ වැඩ කටයුතු ශක්තිමත් කරන්න, කාර්යක්ෂම කරන්න, විශේෂයෙන් ව්‍යාපාරවලට, ආර්ථිකයට වැදගත් වෙන ක්ෂණික ක්‍රියාමාර්ග ගන්න තමයි සුළු හිමිකම් අධිකරණ පිහිටෙව්වේ. ඔබතුමා මට දැනුම් දුන් විධියට අද වන විට එම අධිකරණවල නඩු 10,000ක් පමණ තිබෙනවා. Trial 1,000ක් විතර යනවා. එහෙම නම්, තව පරිපාලන වියදමක් දරලා රටේ ජනතාවගේ බදු මුදල් තවදුරටත් නාස්ති කරන සුළු හිමිකම් අධිකරණ ක්‍රමයෙන් ඔබ්බට ගිහිල්ලා කරන දෙයක්ද දැන් කරන්න යන්නේත්? මේ ගැන මම ඔබතුමාගෙන් ඇහුවාම ඔබතුමා හොඳ උත්තරයකුත් දුන්නා. Administration of Justice Law එක යටතේ, ඒ කියන්නේ 1973දී නම් මෙවැනි අවස්ථාවකදී යම් කිසි standard format එකක් පුරවලා තමයි ඒ නඩුව භාර දෙන්න ඕනෑ. නමුත් විවිධ වැල්වටාරම් ලියලා, පැමිණිලි දාලා, ලිපි ලේඛන විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කරලා, ඒවා ගැන තර්ක විතර්ක කරලා, මාස ගණන්, වසර ගණන් දින අරගෙන ඒ නඩු විසඳන්න කල් ගත කරනවා නම්, වටිනාකම රුපියල් මිලියන 1.5කට අඩු නඩු ඉක්මනින් අවසන් කිරීමට පරිපාලන කාර්යක්ෂමතාව ශක්තිමත් කරනවා කියලා ඔබතුමන්ලා හිතන දේ නම් මේ තුළින් වෙන්නේ නැහැ. අපි මූලිකවම මෙයින් බලාපොරොත්තු වෙන්නේ සිවිල් අධිකරණවල තිබෙන බර -පීඩනය- අඩු කරලා ඉතා දියුණු, කාර්යක්ෂම තත්ත්වයකට එම අධිකරණ ගෙන ඒමයි. ඒ වාගේම, මෙම කාරණයේදී අපට යථාර්ථවාදීව කටයුතු කරන්න පුළුවන් නම් අපි ඉතාම වැදගත් තැනකට එනවා.

අද අපි ව්‍යාපාර කිරීමේ පහසුකම් දර්ශකයේ - Ease of Doing Business Index - සියවන ස්ථානයේ ඉන්නේ. Global Competitiveness Index එකේ අසූහතරවන ස්ථානයේ ඉන්නේ. ඒ වාගේම Corruption Perceptions Index එකේ එකසියදෙවන ස්ථානයේ ඉන්නේ.

හැබැයි, අධිකරණ ක්‍රමය කාර්යක්ෂම කර ගන්න පුළුවන් වුණොත්, අපට ඉතාම වේගයෙන් ව්‍යාපාර පහසු කිරීමේ දර්ශකයේ ඉහළට එන්නත් පුළුවන්.

අද දවසත් ඉතා වැදගත්. අපේ රට ව්‍යාපාර පහසු කිරීමේ දර්ශකයේ ඉහළට ගේන්නට කමිටුවක් පත් කරන්න කියා මම පාර්ලිමේන්තුවෙන් ඉල්ලුවා. ඒ යෝජනාව පාර්ලිමේන්තුවෙන් අනුමත කරලා කථානායකතුමා ළඟට යවලා තිබෙනවා. ඒ හරහා අපි බලාපොරොත්තු වෙන්නේ මේ රටේ වැඩකටයුතු කාර්යක්ෂම කරන්නයි. නමුත් අපි තවදුරටත් අනවශ්‍ය පරිපාලන පීඩනයක් මේකෙන් ලබා ගන්න බලාපොරොත්තු වෙනවා නම්, ඒක ඉෂ්ට වෙන්නේ නැහැ. මම හිතන හැටියට, අපේ රට ආසියාවේ වැඩිම නීති තිබෙන රට බවට පත් වෙනවා වාගේම, ලෝකයේ වැඩිම නීති කඩන රටවල් අතරත් අංක එකට වාගේ ඉන්නවා. ඒකයි, Corruption Perceptions Index එකේ අපි 102වන තැනට ඇවිල්ලා ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීති හැදුවාට වැඩක් නැහැ. අද රාජ්‍ය පරිපාලනය අන්ත දූෂිත තැනකට වැටිලා. රාජ්‍ය පරිපාලන නිලධාරින් කෙළින් වැඩ කරනවා නම්, රටේ දූෂණ, වැරදි අක්‍රමිකතා අඩු වෙනවා වාගේම, ජනතාව රස්තියාදු වෙන්නේ නැහැ. මම මේ කියන්නේ සමස්ත නිලධාරින්ට නොවෙයි, අද මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉන්න නිලධාරින්ට නොවෙයි. දූෂිත නිලධාරින් අතළොස්සකගේ ක්‍රියා කලාපය නිසා මේ පාර්ලිමේන්තුව කොපමණ නීති හැදුවත් වැඩක් නැහැ. අද ග්‍රාම නිලධාරියාගේ ඉඳලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දක්වා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිට අමාත්‍යාංශ ලේකම්වරයා

දක්වා වූ සමස්ත පරිපාලනය -රාජ්‍ය සේවය- නීති රීති අනුව නිවැරදිව, කඩිනම්ව, කාර්යක්ෂමව වැඩ කරනවා නම් මේ රටේ තිබෙන ප්‍රශ්නවලින් සියයට 50ක්වත් ඇති වන්නේ නැහැ. නමුත් ඒ ආයතනවල ඒ කාරණා නිසා තමයි අපට සැරින් සැරේට සංශෝධන ගෙනැත් නීති හදන්න වෙන්නේ. එහෙම නීති හැදුවත් තවදුරටත් එකම දේ වෙනවා නම් ප්‍රතිඵලයක් ලැබෙන්නේ නැහැ.

අපේ බන්ධනාගාර පද්ධතියත් වහාම ප්‍රතිසංස්කරණය කරන්න ඕනෑ. සමහර මැති ඇමතිවරුන් බන්ධනාගාර පද්ධතිය සම්බන්ධයෙන් ඔවුන්ගේ අත්දැකීම් ඉදිරිපත් කළා. එය අද යම්කිසි පිරිසකගේ ව්‍යාපාරික ස්ථානයක් බවට පත් වෙලා තියෙනවා. හිරේ යන මිනිහා ව්‍යාපාරිකයෙක් වෙලා, දාමරිකයෙක් වෙලා, මිනීමරුවෙක් වෙලා, කප්පම්කාරයෙක් වෙලා එළියට එනවා. ඒ වාගේම ඇතැම් බන්ධනාගාර නිලධාරීන් තම වෘත්තිය ඉතා ඉහළ අනියම් ආදායම් මාර්ගයක් බවට පත් කරගෙන තියෙනවා. මෙන්න මේ ගැනත් අපි කඩිනම් ක්‍රියාමාර්ග ගන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ මධුර විතානගේ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி மதுர விதானகே)
(The Hon. Madhura Withanage, Attorney-at-Law)
හොඳයි.

විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග පනත් කෙටුම්පත මඟින්, නඩු භාණ්ඩ සාම්පල රැගෙන, සංරක්ෂණය කර, මුද්‍රා තබා, ඡායාරූපගත කර, බැහැර කිරීම දක්වා වැදගත් ක්‍රියාමාර්ගයක් ගෙන තිබෙනවා. ඒ වාගේම දූෂිත නිලධාරීන් නිසා මේ ක්‍රියාවලියත් යම්කිසි වැරදි මාර්ගයකට යන්න පුළුවන්. ඒ නිසා ගරු ඇමතිතුමනි, මේ අධිකරණ ක්‍රියාවලිය වැරදි මඟට යොමු කරන නිලධාරීන් සම්බන්ධයෙනුත් දැඩි ක්‍රියාමාර්ග ගැනීමට නීති රීති, අණපනත් ගේන්න වෙනවා. මොකද, අපට තිබෙන අත්දැකීම් අනුව, හෙරොයින් පාන් පිටි වෙනවා; පවුඩර් වෙනවා. එහෙම දේවල් පසුගිය කාලයේ අපට අහන්න දකින්න ලැබුණා. එහෙම වුණේ නිලධාරීන් අතින් මිසක් සාමාන්‍ය පුරවැසියන් අතින් නොවෙයි. එවැනි වැරදි කරන නිලධාරීන්ට විරුද්ධව දැඩි ක්‍රියාමාර්ග ගත යුතුයි. එහෙම නැතිව, අපි කොච්චර නීති ගෙනාවත් වැඩක් නැහැ. නීති රකින ක්‍රියාවලියට සම්බන්ධ වෙන නිලධාරීන් නීති කඩනවා නම්, ඔවුන්ට එරෙහිව දැඩි දඬුවම් දෙන නීති ගෙනාවේ නැත්නම් මෙවැනි කොපමණ සංශෝධන ගෙනාවත් ඉන් වැඩක් වෙන්නේ නැහැ.

විශේෂයෙන්ම මේ දවස්වල මිනිසුන්ගේ හදවතට ගොඩක් වේදනා දැනෙන අත්දැකීම තමයි කුඩා දරුවන් සම්බන්ධ වැරදිවලට අත්අඩංගුවට ගැනීම සහ ඒ අධිකරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් වූ කාරණා. මම මේ ගරු සභාවේ අවධානයට යොමු කරනවා, 2021 පෙබරවාරි මාසයේ ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු අංක SC/FR/97/2017 මඟින් දරුවන්ට එරෙහි ශාරීරික දඬුවම් සහමුලින්ම තහනම් කිරීමේ ඓතිහාසික නඩු තීන්දුව. ඇත්තටම වැරදි සම්බන්ධයෙන් දරුවන් අත්අඩංගුවට ගැනීම් සහ ඒ සම්බන්ධ ඉදිරි නීති ක්‍රියාමාර්ග ලෝකය පිළිගත් ඉහළ නිර්ණායක අනුව කළ යුතුයි. කොළඹ ප්‍රදේශය ගත්තොත්, අපට විශාල සම්පත් ප්‍රමාණයක් තිබෙනවා. ළමයි 50ක්, 60ක් ඉගෙන ගන්න, අක්කර 10ක, 15ක ඉඩම් තිබෙන, ගොඩනැඟිලි 7ක්, 8ක් තිබෙන විශාල පාසල් ප්‍රමාණයක් තිබෙන බව මම ගරු අමාත්‍යතුමාටත් කිව්වා. ඒවා වැරදි කරපු දරුවන් පුනරුත්ථාපනයට සහ ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් පාවිච්චි කරන්න පුළුවන්. ඔවුන්ගේ පසුවිපරම් සම්බන්ධයෙනුත් ඒ සම්පත් පාවිච්චියට ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ කියලා යෝජනා කරමින් මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු සෙල්වම් අඩෙයික්කලනාදන් මහතා**
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සෙල්වම් අඩෙයික්කලනාදන් මන්ත්‍රීතුමා.

**ගරු සෙල්වම් අඩෙයික්කලනාදන් මහතා**
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)
பொதுமன்னிப்பு அளிக்கப்பட்டும் விடுதலை செய்யப் படாமல் இருந்த நான்கு தமிழ் அரசியல் கைதிகளில் மூவர் இன்று விடுதலை செய்யப்பட்டிருக்கிறார்கள். அதற்காக மாண்புமிகு சனாதிபதி அவர்களுக்கும் சம்பந்தப்பட்ட அமைச்சர் அவர்களுக்கும் நன்றி சொல்லக் கடமைப்பட் டிருக்கிறேன். இவ்வாறு மற்றையவரையும் விடுதலை செய்தால், நன்றாக இருக்குமென்று நினைக்கிறேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.26]

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர)
(The Hon. Jayantha Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වැදගත් විවාදයේදී විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව අදහස් කීපයක් මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න මම කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දේශීයවත්, ගෝලීයවත් සමකාලීන සමාජ අර්බුදයේ ප්‍රධාන ගැටලුවක් බවට මේ මත් උවදුර පත්ව තිබෙනවා. අපේ රටේත් මත් උවදුර ඇරඹෙන්නේ, ප්‍රවේගකාරී ලෙස ව්‍යාප්තවීම ආරම්භ වෙන්නේ 1977 වර්ෂයෙන් පසු ඇරඹුණු විවෘත ආර්ථික ප්‍රතිපත්තියත් එක්කයි කිව්වොත් එය වඩාත් නිවැරදියි. ඉන් අනතුරුව තමයි ප්‍රවේගකාරී ලෙස මත් උවදුර ප්‍රවර්ධනය වෙන්න පටන් ගන්නේ. අද ගමත්, නගරයත් එක සේ යා කරමින්, ඒ වාගේම කාන්තාව ද, පිරිමියා ද, ළමයා ද, තරුණයා ද, වැඩිහිටියා ද කියන සියල්ලන් එක ලෙස මත් රකුසාගේ රුදුරු ග්‍රහණයට ලක් වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එවැනි තත්ත්වයක් පවතිද්දී, ඒ තුළින් අද මුළු

[ගරු ජයන්ත සමරවීර මහතා]

සමාජයම මහා ආන්තරාවකට ඇදගෙන යද්දි, අපේ පවුල් සංස්ථාව බිඳ වැටිලා, මුළුමනින්ම සමාජය අවතැන් වෙලා, බන්ධනාගාර පිරිලා, පාසල් දරුවන් පවා මේ උවදුරේ රූදුරු ගොදුරු බවට පත් වෙලා, බරපතළ සමාජ ඛේදවාචකයක් කෙමෙන් කෙමෙන් නිර්මාණය වෙමින් තිබෙන වෙලාවක තමයි අද මේ පනත් කෙටුම්පත ගැන මේ විවාදයේදී අපි කථා කරන්නේ.

මේ සම්බන්ධයෙන් ගරු විජයදාස රාජපක්ෂ අධිකරණ අමාත්‍යතුමා සාධනීය උත්සාහයක් අරගෙන තිබෙනවා. විශේෂයෙන්ම අන්තරායකර ඖෂධ පාලනය බලවත් ලෙස සංශෝධනය වෙන්නේ 1984 අංක 13 දරන විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත මගින්. අද අපේ පාසල් දරුවන්, තරුණයන්, වැඩිහිටියන් පමණක් නොව කාන්තාවන් පවා ගොදුරු කර ගන්නා භයානක මත් ද්‍රව්‍යයක් වන methamphetamine හෙවත් අයිස් මත් ද්‍රව්‍යය පාලනයත් අද මෙම පනත් කෙටුම්පතට ඇතුළත් කරලා තිබෙනවා. 1984 අංක 13 දරන විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනතට methamphetamine හෙවත් විවී නාමය අනුව අයිස් කියන මත් ද්‍රව්‍ය විශේෂය ඇතුළත් කරලා තිබුණේ නැහැ.

ඒ විතරක් නොවෙයි. මත් ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය - UNODC - විසින් ලොව හඳුනා ගත් විශේෂ මත් ද්‍රව්‍ය ලැයිස්තුවත්, ලංකාවේ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය හඳුනා ගෙන තිබෙන මත් ද්‍රව්‍ය විශේෂත් මේ පනත් සංශෝධනයට ඇතුළත් කර තිබීමත් විශේෂ සාධනීය ලක්ෂණයක්. මීට පෙර අයිස් මත් ද්‍රව්‍යය පාවිච්චිය සම්බන්ධයෙන් චෝදනාවක් ගොනු කරන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒකට ලංකාවේ නීතියක් තිබුණේ නැහැ. නමුත් ඒකත් අද මේ සංශෝධනයට ඇතුළත් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පතේ ඒ සාධනීය ලක්ෂණ තිබෙනවා වාගේම, මේ තුළින් අපේ රටේ මත් ද්‍රව්‍ය ප්‍රවර්ධනය සඳහාත් ඉඩ කඩ ලැබෙන අවස්ථාවකුත් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ මොකද? ඒ තමයි, මේ පනත් කෙටුම්පත මගින් මත් ද්‍රව්‍යවලට පනවන දණ්ඩන සීමාව අඩු කොට තිබීම. 1984 අංක 13 දරන පනත සංශෝධනය මගින් හෙරොයින් ග්‍රෑම් දෙකක් ළඟ තබා ගැනීම මරණීය දණ්ඩනය හෝ ජීවිතාන්තය දක්වා සිර දඬුවමක් ලැබීමේ වරදක් බවට පත් වෙනවා.

නමුත්, මේ පනත් කෙටුම්පත මගින් එම ප්‍රමාණය ග්‍රෑම් 5ක් දක්වා වැඩිකොට තිබෙනවා. දැන් ආරංචි ලැබෙන විධියට එය ග්‍රෑම් 10ක් දක්වා වැඩි කිරීමේ සංශෝධනයක් එන බව තමයි කියන්නේ. ග්‍රෑම් 2ක ප්‍රමාණය ග්‍රෑම් 5, ග්‍රෑම් 10 දක්වා වැඩි වුණොත්, ඒක මොන තරම් ප්‍රමාණයකින් වැඩි වෙනවාද? දැනට පාවිච්චි කරන හෙරොයින් - diacetylmorphine- මත් කුඩු පැකට් එකක හෙරොයින් තිබෙන්නේ මිලිග්‍රෑම් 3යි. මත්කුඩු පැකට් එකක සාමාන්‍ය බර මිලිග්‍රෑම් 30ක් වුණාට එහි වැඩිපුර තිබෙන්නේ පාන් පිටි, කිරි පිටි, පැරසිටමෝල් කුඩු වාගේ දේවල්. මේ ආදී තනුකකාරක එක්ක ඒ පැකට් එකක හෙරොයින් තිබෙන්නේ මිලිග්‍රෑම් 3යි. එතකොට දැනට සීමාව තිබෙන්නේ හෙරොයින් ග්‍රෑම් 2ක් ළඟ තබා ගැනීම, රැගෙන යෑම, ප්‍රවාහනය කිරීම මරණීය දණ්ඩනය හෝ ජීවිතාන්තය දක්වා සිර දඬුවම් ලැබිය හැකි වරදක් කියලා. මේ සංශෝධනයෙන් එම ප්‍රමාණය ග්‍රෑම් 5 දක්වා වැඩි කරලා තිබෙනවා. එහෙම ඒ ප්‍රමාණය වැඩි කළොත් මොකද වෙන්නේ? හෙරොයින් ග්‍රෑම් 2ක ප්‍රමාණයක් හඳුනා ගන්න නම්, අඩුම තරමින් ග්‍රෑම් 20ක්වත් අත්අඩංගුවට ගන්න වෙනවා. ග්‍රෑම් 20ක් අත්අඩංගුවට ගත්තොත් තමයි, හෙරොයින් ග්‍රෑම් 2ක් හඳුනා ගන්න පුළුවන් වෙන්නේ. හෙරොයින් ග්‍රෑම් 5ක් හඳුනා ගන්න නම්, ග්‍රෑම් 50ක්වත් අත්අඩංගුවට ගන්න වෙනවා. ග්‍රෑම් 50ක ප්‍රමාණයක් කියන්නේ, ඒ ප්‍රමාණයෙන් දැනට වීථියේ තිබෙන මත් කුඩු පැකට් 600ක් පමණ හදා ගන්න පුළුවන් ප්‍රමාණයක්. එතකොට ග්‍රෑම් 10ක් හඳුනා ගන්නවා කියන්නේ, ඊටත් වැඩි ප්‍රමාණයක් හදා ගන්න පුළුවන් ප්‍රමාණයක්. ඒ නිසා මත්ද්‍රව්‍යවලට වැට බඳින්න, methamphetamine හෙවත් අයිස්වලට වැට බඳින්න, ඒවායෙන් අපේ දරුවන්, අපේ සමාජය ආරක්ෂා කර ගන්න මේ පනත ගේනවා නම්, එයින් ඔබ, අප බලාපොරොත්තු වන වුවමනාව ඉෂ්ට වෙන්නේ නැහැ, ඒ වෙනුවට ඒවා ප්‍රවර්ධනය කිරීමේ නීතියක් බවට මෙය පත් වෙනවාය කියන එක අපි අධිකරණ අමාත්‍ය ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමාට කියන්න කැමැතියි. මත්ද්‍රව්‍ය බෙදා හරින්නන්ට, ජාවාරම්කාරයන්ට, මත්ද්‍රව්‍ය අළෙවි කරන නියෝජිතයන්ට රිසි සේ වැඩි වැඩියෙන් මත් කුඩු අළෙවි කිරීමට හැකියාව තිබෙන නීතියක් බවට මෙය පත් වෙනවා. ඒ පිළිබඳව ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරවන ගමන්, මේ සංශෝධනය ඉවත් කරගෙන හෙරොයින්, කොකේන්, methamphetamine හෙවත් අයිස් වාගේ මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වන සීමාව නැවත ග්‍රෑම් 2ක සීමාවට ගෙන එන ලෙස මා ඉතා ඕනෑකමින් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. එසේ නොවුණොත්, ඔබතුමාගේ මේ සද්භාවී උත්සාහය මේ රට වනසන නීතියක් බවට පත් වෙනවාය කියන එක අවධාරණය කරමින් මගේ අදහස් දැක්වීම මෙයින් නතර කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.34]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද මෙම ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත් අතරින් විශේෂයෙන් ළමයින් සහ තරුණ තැනැත්තන් (සංශෝධන) පනත් කෙටුම්පත තුළිනුත්, උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත තුළිනුත් ගෙනැවිත් තිබෙන ඇතැම් සංශෝධන සම්බන්ධයෙන් මා සතුටු වෙනවා. විශේෂයෙන් "ළමයා" යන්න අර්ථ නිරූපණය කිරීමේදී වයස අවුරුදු 16, අවුරුදු 18 බවට පත් කිරීම තුළින් අධිකරණයේදී, විශේෂයෙන් අපරාධ නීතිය අනුව කටයුතු කරන අවස්ථාවලදී දරුවාට යම් ආරක්ෂාවක් සහ යම් යම් ප්‍රතිලාභ ලැබෙනවා. කාලය හරස්වීම නිසා ඒ පිළිබඳව මම විස්තර කරන්න යන්නේ නැහැ. පොදුවේ ගත්තාම ඒ ගැන අපට සතුටු වන්න පුළුවන්.

මම මෙතැනදී විශේෂයෙන් මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා, ගරු ඇමතිතුමනි. ඒ තමයි, වයස අවුරුදු 16ත්, 18ත් අතර ගැහැණු දරුවා තවමත් අනාරක්ෂිතයි කියන එක. මොකද, ගැහැණු දරුවන්ට වයස අවුරුදු 16දී ලිංගික කටයුතු සඳහා යම්කිසි ස්වාධීනත්වයක් ලබා දීම සහ විවාහ වන වයස අවුරුදු 18 කිරීම තුළ යම්කිසි ගැටලුවක් තිබෙනවා. ඒක විසඳා ගන්නේ කොහොමද කියලා මම දන්නේ නැහැ, ගරු ඇමතිතුමනි. ඒ තුළ අපේ දරුවන් ලොකු ගැටලුවලට මුහුණ දීලා තිබෙනවා. විශේෂයෙන් ගැහැණු දරුවන්.

මේ වෙනකොට දවසකට ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණ 10ක් වාගේ වාර්තා වන තත්ත්වයක් අපේ රටේ තිබෙන බව අපි දන්නවා. ඒත් එක්කම, වයස අවුරුදු 18ක් වන දරුවන් සහ ඊට අඩු දරුවන් වරදකරුවන් වෙනකොට ඒ අය රඳවා තබා ගැනීම පිළිබඳ කාරණය ගැන මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මොකද, විවිධ වයස් කාණ්ඩවල දරුවන් එකට තැබීම තුළ, ඒ කියන්නේ, වයස අවුරුදු 12ක දරුවනුත්, අවුරුදු 17, 18 වයසේ පසුවන දරුවනුත් එක තැනක රඳවා තැබීම තුළ යම් යම් ගැටලු ඉස්මතු වෙන්න පුළුවන්. ඒ නිසා ඔබතුමන්ලා ඒ සම්බන්ධයෙනුත් නීති රීති ගෙනැවිත් එවැනි දරුවන් වයස් කාණ්ඩ අනුව රඳවා තබන්න පුළුවන් නම් හොඳයි කියලා මම හිතනවා.

ඊළඟට, මා කථා කරනවා උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත ගැන. අපි දන්නවා අපේ රටේ විවාහ නීති කිපයක් තිබෙන බව. එහිදී පුද්ගල නීති නැතිව පොදු නීතියකට එන්න අපට හැකියාවක් තිබෙනවා නම් හොඳයි. විශේෂයෙන්ම උඩරට විවාහ නීතිය තුළ දීග විවාහයේදී දියණියන්ට දේපළ බෙදීමේදී යම් කිසි ගැටලුවක් තිබෙනවා. ඒ වාගේම, තේසවලමෙයි නීතියේදී ඉඩම් සම්බන්ධ තීරණ ගැනීම තිබෙනවා. මුස්ලිම් විවාහ නීතියේ ඇතැම් කරුණු ගත්තාම, අනෙක් විවාහ නීතිවලට වඩා එහි වෙනස්කම් තිබෙනවා. මම ඔබතුමාට යෝජනා කරනවා, හැකියාවක් තිබෙනවා නම් මේ පුද්ගල නීති නැතිව, එක රටකට විවිධ නීති නැතිව, ඉඩම් සම්බන්ධව සහ විවාහ සම්බන්ධව පොදු නීතියක් ගෙනෙන්න පුළුවන් නම් හොඳයි කියලා.

විශේෂයෙන් මේ අවස්ථාවේදී මගේ අවධානය යොමු කරනවා, අධිකරණ තුළ නඩු විසඳීමේදී දරුවන් මුහුණ දෙන ගැටලු පිළිබඳව. 2020 වර්ෂය දක්වා අපේ රටේ ළමා අපයෝජන සිද්ධි 5,062ක් තිබෙනවා. එයින් සිද්ධි 1,292ක නඩු කටයුතු අවසන් කර තිබෙනවා. තව දහස් ගණනක් pending තිබෙනවා. ඊළඟට, දූෂණ සිද්ධි - rape cases - 4,200ක් තිබෙනවා. එයින් 1,094ක් විසඳා තිබෙනවා. තව කොටසක් විසඳීමට තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ තොරතුරු සභාගත කිරීමට බලාපොරොත්තු වෙනවා.

ගරු ඇමතිතුමනි, මෙතැනදී ගැටලුවක් තිබෙනවා. මේවාට විසඳුම් ලබා දෙනකොට, ඒ දරුවා වැඩිහිටියෙක් වෙලා, ඒ අයටත් දරුවන් ලැබී තිබෙන අවස්ථා තිබෙනවා. ඒ කියන්නේ, එසේ අපයෝජනයට හෝ දූෂණයට ලක් වුණු දරුවා ඒ වෙනකොට වැඩිහිටියෙක් වෙලා. එතකොට මේවාට විසඳුම් ලබා දෙන්න යනකොට ඔහුට හෝ ඇයට සමාජයට මුහුණ දෙන්න බැරි තත්ත්වයක් ඇති වෙනවා. 2010 සිට 2022 සැප්තැම්බර් දක්වා කාලය තුළ බාල අපරාධ 41,039ක් වාර්තා වෙලා තිබෙනවා. සුළු වැරදි තිබෙනවා, 27,041ක්. ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම් 311ක්, අවුරුදු 16ට අඩු ස්ත්‍රී දූෂණ 17,643ක්, අවුරුදු 16ට අඩු බාල වයස්කාරයන් බලහත්කාරයෙන් පාවිච්චි කිරීම් 1,545ක්, බරපතළ ලිංගික අපයෝජන 8,089ක් යනාදී වශයෙන් ඒවා වාර්තා වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ තොරතුරු **සභාගත*** කරනවා. ඒ අනුව ගත්තාම, අපට හිතන්න බැරි තරමට අපේ රටේ දරුවෝ අනාරක්ෂිතයි කියන එක මම මේ වෙලාවේ ඔබතුමාට කියනවා.

ඒ වාගේම, මේ වාගේ සිද්ධිවලදී වූදිතයන් නිදහස් වෙලා යනවා. මම දන්නේ නැහැ, මේ නීතිය ඇතුළේ කාන්තාවන් සහ දරුවන් සම්බන්ධයෙන් තීරණ ගන්න කොට, වරදකරුවන් නීතියේ ඇහිලි අස්සෙන් රිංගා යන්නේ කොහොමද කියලා. පසුගිය කාලයේ ජර්මන් තරුණියක් දූෂණය කර ඇයගේ පෙම්වතා මරා දැමූ වූදිතයා නිදහස් වුණා. ඒ වාගේම, කන්‍යාවන් 100 දෙනෙකු දූෂණය කළා කියලා බොහොම ප්‍රසිද්ධ වූ ඇතැම් අය - *[බාධා කිරීමක්]* ඔව්, සාරුවා සුනිල් කියන පුද්ගලයා ප්‍රාදේශීය සභාවක හිටපු සභාපති කෙනෙක්. ඔහුත් නිදහස් වුණා. මම දන්නේ නැහැ, එහෙම වුණේ කොහොමද කියලා.

ගරු ඇමතිතුමනි, ළමා අපචාර, අපයෝජන, ළමා දූෂණ, ස්ත්‍රී දූෂණ වැනි නඩුවලදී වූදිතයන්ට ගැලවී යන්න අවස්ථාව ලැබෙන්න එක හේතුවක් තමයි ඒ නඩුවලට ගත වන කාලය. ඒ නිසා මම ඔබතුමාට යෝජනා කරනවා, දරුවන්ට සහ ස්ත්‍රීන්ට සිදු වන දූෂණ හා අපචාර සම්බන්ධයෙන් වන නඩු විසඳීම සඳහා සතියකට විශේෂ දිනයක් ලබා දීම හෝ එහෙම නැත්නම් ළමා අධිකරණ පිහිටුවීම වැනි කුමන හෝ ක්‍රමයක් ආරම්භ කරන්න කියලා. එහෙම නැත්නම් අර වූදිතයන් නීතියේ ඇහිලි අස්සෙන් රිංගා යන එක වළක්වා ගන්න බැරි වෙනවා.

මම ඉදිරිපත් කරන ඊළඟ කාරණාව මේකයි. ගරු ඇමතිතුමනි, විදේශගත මව්වරුන්ගේ පවුල්වල දරුවන් අනාරක්ෂිතයි. මේ වෙනකොට ආණ්ඩුව නීතියක් ගෙනැවිත් තිබෙනවා, තීරණයක් අරගෙන තිබෙනවා, වයස අවුරුදු දෙකහමාරට අඩු දරුවන් ඉන්නා මව්වරුන්ට විදේශගත වෙන්න බැහැ, වයස අවුරුදු දෙකහමාරට වැඩි දරුවන් ඉන්නා මව්වරුන්ට විදේශගත වෙන්න පුළුවන් කියලා. මේ වෙලාවේ සභාවේ ගරු තලතා අතුකෝරල මැතිතුමියත් සිටිනවා. අපි පසුගිය කාලයේ එම වයස් සීමාව අවුරුදු පහ දක්වා ඉහළ දමා තිබුණේ. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට යෝජනා කරනවා, වයස අවුරුදු පහට අඩු දරුවන් සිටින කාන්තාවන්ට විදේශගත වෙන්න ඉඩ දෙන්න එපා කියන කාරණය නීතියක් හැටියට ගෙනෙන්න කියලා. මොකද, එවැනි තත්ත්ව තුළදීත් අපේ දරුවෝ අනාරක්ෂිත වෙනවා.

මම අවසාන කාරණාව හැටියට ඉදිරිපත් කරන්නේ මෙයයි. වින්දිතයෙක් වූ යම් දරුවෙක් මාධ්‍ය තුළින් නිරාවරණය වීමෙන් ඒ දරුවාට වෙන්නේ අගතියක්. දරුවෙක් වින්දිතයෙක් වුණාම, පොලීසිය එතැනට යනකොට, මාධ්‍යයත් ඒත් එක්කම යනවා. එතකොට මුළු රටම දැන ගන්නවා, මේ ළමයාට මෙහෙම දෙයක් වුණා කියලා. එවැනි අවස්ථාවලදී එම සිද්ධියට සම්බන්ධ කාරණා සමාජ මාධ්‍යවල පළ කරනවා. ප්‍රධාන නාළිකාවල ඒවා විකාශය වෙනවා; මුද්‍රිත මාධ්‍යයේ යනවා. එවැනි සිදුවීමකට ප්‍රසිද්ධියක් නොතිබෙන තාක්කල් ඒ දරුවා ආරක්ෂිතයි. නමුත්, එවැනි කාරණයක් මාධ්‍යයට මුදා හැරීමත් එක්ක ඒ දරුවාට අනාරක්ෂිත තත්ත්වයක් ඇති වෙනවා. ඒ සඳහා අපට ළඟම -ආසන්නම- සිද්ධිය පොළොන්නරුවේ සිද්ධියයි. මම පෙරේදාත් පාර්ලිමේන්තුවේදී ඒ ගැන කථා කළා. මගෙන් ඇතැම් අය අහනවා, දිසාපති කෙනෙකුට එහෙම ලියන්න බැහැ කියලා ආයතන සංග්‍රහයේ කොතැනද තිබෙන්නේ කියලා.

සමහරු අහනවා, එහෙම දෙයක් නීති පොතේ කොතැනද තිබෙන්නේ කියලා. ඉතින් මම කියනවා, මෙතැන තිබෙන්නේ නීති පොතේවත්, ආයතන සංග්‍රහයේවත් තිබෙන දෙයක් නොවෙයි, මෙතැන තිබෙන්නේ සදාචාරය සම්බන්ධ ප්‍රශ්නයක් කියලා. දරුවන් සම්බන්ධයෙන් තීන්දු තීරණ ගන්න කොට, 'දරුවා කාගේ ද' කියන තැන නොවෙයි, 'කාගේ වුණත් දරුවෙක්' කියන තැන ඉඳලා කටයුතු කරන්න ඕනෑ. විශේෂයෙන්ම රජයේ වග කිවයුතු නිලධාරීන් ඒ විධියට කටයුතු කරන්න ඕනෑ. ඒ දිසාපතිතුමා ඊට පස්සේ සියලු ආයතනවලට ලියුමක් යවනවා, "වැරදි තොරතුරක් මත තමයි මම ඒ ලියුම ගහලා තිබෙන්නේ. ඒ නිසා ඒක නිවැරදි කරගන්න" කියලා. අවුරුදු 13ක, 14ක

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

දියණියක් ගැබිනියක් වෙලා කිව්වාම හැමෝම හොයනවා, කවුද එයා කියලා. ගරු ඇමතිතුමනි, මෙවැනි තත්ත්වයක් ඇති වෙන්න ඉඩ දෙන්න එපා, ඒ වෙනුවෙන් නීති ගෙනෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම මම ඒ දිසාපතිතුමාගෙන් අහනවා, ඒ දේ වුණේ ඔබතුමාගේ දුවට නම්, ඔබතුමා කරන්නේ ඔය විධියට රට වටේ ලියුම් ගහන එක ද, එහෙම නැත්නම් ඒ අඩු වයස් ගැහැනු දරුවාට ඒ අපරාධය කරපු කෙනා සොයා බලා දඬුවම් කරන්න අදාළ ආයතනවලට ඒ කාරණය ගෙන යන එක ද කියලා. මා ඒක එතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියගේ කථාවට නියමිත කාලය දැන් අවසානයි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය පිළිබඳ ගැටලුවක් තිබෙන නිසා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරමින් කථාව අවසන් කරන්නම්. දරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන්, දරුවන්ගේ රැකවරණය සම්බන්ධයෙන්, දරුවන්ගේ පෝෂණය සම්බන්ධයෙන් අපි මීට වඩා දැඩි තීන්දු තීරණ ගන්න ඕනෑ. එහෙම නොවුණොත් මේ පවතින නිදහස තුළ, මේ තිබෙන මාධ්‍ය නිදහස තුළ අනාගතයේදී දරුවන් මීට වඩා ව්‍යසනවලට ලක්වීම වළක්වාගන්න බැරිව යනවා.

ස්තුතියි.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසර පතනවා ඒ ගරු මන්ත්‍රීතුමිය නැඟූ වැදගත්ම කාරණාවක් සම්බන්ධයෙන් යම්කිසි පැහැදිලි කිරීමක් කරන්න.

කාන්තා හා ළමා අපචාර සම්බන්ධ නඩුවල විශාල ප්‍රමාදයක් තිබෙන බව ඇත්ත වශයෙන්ම අපි පිළිගන්නවා. වර්තමානයේ අපි විතරක් නොවෙයි, මෙතෙක් හිටපු අධිකරණ ඇමතිවරු සියලුදෙනා ඒ ප්‍රමාදය අඩු කරගන්න විශාල වෙහෙසක් ගත්තා. යම් මට්ටමකට එය සාර්ථක වුණත් එහි තවත් අඩු පාඩු තිබෙනවා. මීට දින දෙකකට කලින් අපි අධිකරණ සේවා කොමිෂන් සභාවත් එක්ක සාකච්ඡා කරලා එකඟතාවකට ආවා, ලබන ජනවාරියේ ඉඳලා ළමා අපචාර සම්බන්ධ වෙනම මහාධිකරණයක් පවත්වාගෙන යන්නත්, විෂ මත් ද්‍රව්‍ය සම්බන්ධයෙන් වෙනම මහාධිකරණයක් පවත්වාගෙන යන්නත්. ඒ මඟින් මේ නඩු ප්‍රමාදය වළක්වා ගැනීමයි අරමුණ.

ගරු මන්ත්‍රීතුමිය කියපු කාරණය මම පිළිගන්නවා. අපේ මාධ්‍ය සංස්කෘතිය සහ සදාචාරයත් එක්ක බැඳුණු ප්‍රශ්නයක් තිබෙනවා. මහා බ්‍රිතාන්‍යය වාගේ රටවල කාන්තාවක් පිළිබඳව, දරුවකු පිළිබඳව, මේ වාගේ ලිංගික කාරණයක් පිළිබඳව, පවුල් ප්‍රශ්නයක් පිළිබඳව කරුණක් මතු වුණාම, එම අවස්ථාවේම මාධ්‍යයට යම් යම් තහනම් ආඥා නිකුත් කරන්න අධිකරණයට බලය තිබෙනවා, "මේ නඩුව පිළිබඳව වාර්තා කරන එක තහනම්" කියලා. යම්කිසි අවස්ථාවක ඒ තහනම ලිහිල් කළොත් විතරයි ඒක මාධ්‍යයේ පළ කරන්නට පුළුවන්. අනාගත දරුවන්ටත් බලපාන නිසා සමහර නඩුවලදී -විශේෂයෙන් අපචාර නඩුවලදී- නියෝග දෙනවා, අවුරුදු 20ක්, 30ක් යනකල් ඒවා පිළිබඳව මාධ්‍ය හරහා වාර්තා කරන්න තහනම් කියලා. ඒ නියෝග කඩ කළොත් අධිකරණයට අපහාස කිරීමක් ලෙස සලකා දඬුවම් දෙන ක්‍රම පවා තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමිය දකින්න ඇති, අපේ ශ්‍රී ලාංකිකයෙකු සම්බන්ධව ඕස්ට්‍රේලියාවේ පවතින නඩුවේත් සමහර සිද්ධි මාධ්‍යයට වාර්තා කරන්න විශේෂ අවසරයක් ගන්න සිදු වූ බව. අධිකරණ අවසරයකින් තොරව එහෙම වාර්තා කරන්න දෙන්නේ නැහැ. මොකද, කාන්තාවන්ගේ, දරුවන්ගේ වටිනා ජීවිත විවිධ රටවල මාධ්‍ය හරහා කරන ප්‍රචාර තුළින් විනාශ කරනවා. ඒකත් අපේ වාගේ රටවල විෂ මත් ද්‍රව්‍ය වසංගතය හා සමාන වසංගතයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ සම්බන්ධව අවධානය යොමු කිරීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙමින්, ඊට අදාළ නීති රීති ඉදිරියේදී සම්පාදනය කිරීමට මා බලාපොරොත්තු වන බවත් සඳහන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. G.G. Ponnambalam. You have 13 minutes.

Before he starts, will an Hon. Member propose the Hon. Madhura Withanage to the Chair?

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
Sir, I propose that the Hon. Madhura Withanage do now take the Chair.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මධුර විතානගේ මහතා මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு இம்ரான் மஹ்ரூப் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு மதுர விதானகே அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. IMRAN MAHAROOF *left the Chair and* THE HON. MADHURA WITHANAGE *took the Chair.*

[3.46 p.m.]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Hon. Presiding Member, I wish to restrict my comments to the Amendments that have been proposed to the Poisons, Opium and Dangerous Drugs Ordinance. Many who have spoken and written about that Bill have primarily concentrated on bail matters. I think the Hon. Minister, when he introduced this Bill in the morning, also stated that he would be moving some Amendments at the Committee Stage assigning cases involving over five grammes of drugs to the High Court and cases involving over ten grammes, to the Court of Appeal, if I am not mistaken.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

Cases involving up to ten grammes, to the High Court and above ten grammes, to the Court of Appeal.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

Okay.

Sir, I do not want to take my time to speak about the bail provisions, but I do want to say a few words with regard to certain other provisions which, I think, are important and I expect the Government to take them quite seriously. I make these comments, Sir, from a very particular perspective. Former Justice, the Hon. C.V. Wigneswaran, is here. We belong to two different parties; we do not get on politically, but when it comes to the issue of drugs in the North and the East and the way in which drugs are being spread in the society, I think we all, the TNA, the Hon. C.V. Wigneswaran, my party and I and even some Tamil Members who belong to the Government, maybe, not officially and openly, are in agreement that the military's involvement in this process just cannot be denied. Unfortunately, the reality is that the military has not come out of the counter-insurgency mode and they continue to act on the basis of a counter-insurgency strategy and as a result, they are the biggest peddlers of drugs in the North and the East, particularly in Jaffna, I can tell you as a Member for the Jaffna Electoral District. By extension, the police are also in it. So, I make these comments from that specific angle. When we look at the Amendments that have been introduced and when we know that the military and the police are involved in this whole exercise, then, we find that these Amendments, if I may say so, Sir, are actually quite dangerous. So, it is in that respect that I wish to make some comments.

The first matter I wish to bring to the notice of this House is with regard to the provision that currently prevails, which is, at present, the police can send drugs to the Government Analyst's Department for testing either directly or through court. Sending them through court is something we have no qualms about, but sending them directly by the police, I think, is something that, once again, raises a lot of concern. I precisely look at it from the very specific angle of the military's and the police's involvement in the whole drug problem which prevails in the North and the East and the Hon. Presiding Member will understand as a lawyer that the chain of custody is fundamental in this sort of cases. Also, we all know that primarily because of tampering with evidence, cases fail.

So, in those circumstances, where there is so much of corruption and black money involved, I think the procedure of the police sending those productions or evidence directly to the Government Analyst must, in some way, be stopped. Court oversight , I think, has become very important particularly in the North and the East; the sooner you bring it within court, the better it is for a fair proceeding. This, Hon. Minister, must particularly be taken into account. When you consider 2020, if I am not mistaken, several members of the Police Narcotics Bureau were found tampering with drug productions which had been taken into custody and sent directly to the Government Analyst, where they had taken some quantity of those and resold it. If I am not mistaken, there are cases against them. So, that is an important matter that I wish to flag.

Sir, in the case of Nagalingam Chettiyar Kandasamy vs. the Hon. Attorney General, the Court of Appeal held "In a case of this nature, the prosecution not only need to prove the case beyond reasonable doubt but also ensure, with cogent evidence, that the inward journey of the production has not been disturbed at the all-material point." Then, there is another case, Perera vs. the Hon. Attorney General, in which the Court stated this: "It is a recognized principle that in a case of this nature, the prosecution must prove that the productions had been forwarded to the Analyst from proper custody, without allowing room for any suspicion that there had been no opportunity for tampering or interfering with the production till they reach the Analyst. Therefore, it is correct to state that the most important journey is the inward journey because the final Analyst report will depend on that". So, that is the extent to which the Court gives importance to the chain of custody, to the non-tampering of such evidence. Therefore, having court oversight, I think, will be fundamental in the case of justice.

The other provision proposed is Section 77A(5), which requires the judge to authorize the PNB or any other person authorized by the judge to photograph the evidence and then he can ask the evidence to be destroyed. When you have this very high risk of tampering of drugs produced to court and of judicial officers being involved in these drugs cases, not having these evidence protected and safeguarded until the very end of the trial proceedings is another matter that you really need to reconsider, Hon. Minister. I wish to flag those two matters at the beginning.

Then, I wish to come to the main part of what I wish to state. That is with regard to compulsory rehabilitation. Proposed Section 86(1) states that persons will not be prosecuted for offences under Section 52, possession and consumption, Section 54, selling, supplying and procuring, or paragraphs (b), (c) or (d) of subsection (1) of section 54A, which deals with manufacturing and trafficking, in the following circumstances: (a) where the quantity of drug is less than one gramme; (b) where such person agrees to undergo treatment for de-addiction and rehabilitation and (c) where the Attorney-General has stayed prosecution.

Sir, on the face of it, this provision seems progressive. In effect, there is no choice because anyone would prefer or opt to go through the so-called rehabilitation than to go through prosecution. In fact, there is substantive evidence that compulsory rehabilitation drives persons to relapse and hence, it is counterproductive. I am saying it with responsibility. So, under those circumstances, the notion of compulsory rehabilitation, I think, has to be looked at much more deeply.

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

Then, there is another issue. These rehabilitation centres, at the moment, are found only in two places: Kandakadu and Senapura. The Hon. Minister knows that there are serious allegations of human rights violations in both these centres and they are managed by the military, not by experts. The UN Working Group on Arbitrary Detention has, in fact, commented on this very negatively. As a Member of Parliament who represents the North and the East and who deals with the military in a very hostile manner on a very regular basis, what I can say is the less you have the military involved in matters they should not be involved in, the better. This is entirely a civil matter and it has nothing to do with the military. So, to have them involved is really not good and from a North and East point of view, we find it quite problematic.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තිබෙන්නේ තව විනාඩි දෙකක කාලයක් පමණයි.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Sir, I have 13 minutes.

Then, Sir, proposed Section 86(2)*(a)* empowers the police officer in charge to refer a person to a Government Medical Officer - GMO - to determine the extent of drug dependency. The GMO cannot determine the extent of drug dependency. It is a psychiatrist, a psychologist or an expert counsellor who can, if at all, do it. All that the GMO can do is to carry out a test, if at all, to see whether the person is under the influence of drugs, but not dependency. So, there, you have someone who is going to certify that a person is "dependent", not on a scientific basis, but most probably on his own personal experience and his prejudices. So, that again, I think, is something which needs to be looked at.

Sir, the following Section, 86(2)*(b),* is quite frightening and it is most concerning because it bestows upon the police the power to refer a person to a designated treatment centre, if the GMO's report finds the person is drug dependent.

So, the person who is going to certify that a person is drug dependant actually does not have any expertise to do so and if he does it, if the GMO in fact says that a person is drug dependant, the police can directly send a person to a rehabilitation centre without any court involvement. So, in a place like the North and the East, where you have the military and the police directly involved in the spread of drugs, when the police have the power that has been given under this Amendment, you can just imagine, Sir, the disastrous consequences that the people will be put to.

I will conclude by just mentioning one more matter. That is, the way in which proposed Section 87 deals with children. With this Amendment, Sir - it might be seen somewhat progressive at the superficial level - you are criminalizing children; this Section criminalizes children. The involvement of a child, who is under 18 years, in acts that are criminalized under this law will likely be due to various socio-economic circumstances and there would be several mitigating circumstances that will have to be taken into account in punishing them. Yet, instead of addressing the root causes, enabling the children to rebuild their lives, this provision criminalizes children, who would have become involved in such acts due to poverty, discrimination and marginalization.

Therefore, Sir, I think the Government should have a deeper look at these specifically because - I am saying this with responsibility - of the military's and the police's involvement in the issues with regards to the spread of drugs in the North and the East. These Amendments that have been proposed might, in the overall context, be seen as something that is required for the country because of the drug menace that is increasing, but, actually, when the police and the military are, in fact, accused of being involved in it, when you look at it from that angle, I think they are very dangerous and require a deeper look into them.

Thank you, Sir.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.01]

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දෙවැනි වර කියවීම සඳහා ඉදිරිපත් කළ පනත් කෙටුම්පත් පිළිබඳව කතා කරන්න ඉස්සෙල්ලා, අධිකරණ ඇමතිතුමාට නැවත වරක් මා මතක් කරන්න කැමැතියි, ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලිවීමේ භාෂාව සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නය පිළිබඳව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතිඥවරු හැටියට ඔබතුමාත්, මාත් දන්නවා, අපි නීති විද්‍යාලයට ගිහිල්ලා ඉගෙන ගන්නේ නීතිය බව. නීතිය ඉගෙන ගත්තාට පස්සේ නීති විද්‍යාලය විසින් අපෙන් විභාග කළ යුතු වන්නේ නීතිය පිළිබඳ දැනුම. දැන් අලුතින් මතයක් ගොඩනැඟිලා තිබෙනවා, නීතිය පිළිබඳ දැනුමට වඩා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුමත් ඒ විධියටම විභාග කළ යුතුයි කියලා.

දැන් මේ කතා කරන මා ගැන අපේ ගරු අධිකරණ ඇමතිතුමාත් හොඳින්ම දන්නවා. මගේ පියා ඉංග්‍රීසි භාෂාවෙන් ඉගෙන ගත්ත, ඉංග්‍රීසි භාෂාව කතා කරන්න පුළුවන් සහ ලියන්න පුළුවන් කෙනෙක්. මගේ පියාට සිංහල භාෂාව කතා කරන්න විතරයි පුළුවන්, ලියන්න බැහැ. මගේ මව ඉංග්‍රීසි ගුරුවරියක්. එහෙම වෙලාත් -ඉංග්‍රීසි කතා කරන පවුලකින් ඇවිල්ලාත්- මම නීති විද්‍යාලයේ ප්‍රශ්න පත්‍ර දෙකක් හැරුණුකොට අනික් සියලු ප්‍රශ්න පත්‍රවලට උත්තර ලිව්වේ සිංහල භාෂාවෙන්. මට ඉංග්‍රීසි කතා කරන්න පුළුවන්කම තිබුණාට, මගේ මවු භාෂාවෙන් අදහස් ප්‍රකාශ කරන්න සහ යමකට උත්තර ලියන එක මට වඩා පහසුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් බොහොම අමාරුවෙන් නීති විද්‍යාලයේ ඉගෙන ගෙන ඔය තත්ත්වයට ආපු කෙනකු බව මම දන්නවා. අද නීති විද්‍යාලයේ ඉන්න විදුහල්පතිතුමාත් මම දන්නවා. එතුමාත් ඒ විධියේම කෙනෙක්. නීතිඥයෙක් වෙලා කළු කෝට් එක ඇඳ ගත්තාම මවු භාෂාවෙන් විභාගය ලියපු සමහර අයට, "නැහැ, අපි ඉංග්‍රීසි භාෂාවෙන්ම විභාගයට ලියන්න ඕනෑ" කියලා හැදෙන ඒ රෝගය මොකක්ද කියලා මම නම් දන්නේ නැහැ. නමුත්, එය ලොකු අපරාධයක්. ඒ ලෙඩේ හැදිලා තිබෙන්නේ "voice cut නීතිඥවරු" කියන අයට. උසාවිවල වැඩ කරන නීතිඥවරු දන්නවා, උසාවිවල වැඩ කරන භාෂාව සිංහල සහ දෙමළ බව. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙනුත් එය නියම කරලා තිබෙනවා. ප්‍රායෝගිකව වැඩ කිරීමේදී ඉංග්‍රීසි භාෂාවෙන් කතා කිරීම වෙනම දෙයක්. ඒ නිසා ඉංග්‍රීසි භාෂාවෙන් lectures දෙන්න; ඒ lectures අහගෙන ඉන්න දරුවෝ තමන්ට කැමැති භාෂාවකින් උත්තර ලියයි. ඉංග්‍රීසි භාෂාවෙන් ඉදිරිපත් කරන lectures යම් ප්‍රමාණයකට තේරුම් ගන්න ඒ දරුවන්ට පුළුවන්. නීතිඥවරයකු වෙලා නීතිඥ වෘත්තිය කරනකොට ඉංග්‍රීසි භාෂාව තවදුරටත් දියුණු කර ගන්න ඒ දරුවන්ට පුළුවන්. එම නිසා ඒ විභාගවලදී ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් උත්තර ලියන්න සිදුවුණොත් එය විශාල අපරාධයක්. ගරු ඇමතිතුමනි, එම නිසා මම ඔබතුමාගෙන් වැඳලා ඉල්ලනවා, මේ පව්කාර වැඩේට ඔබතුමා සහයෝගය දෙන්න එපා කියලා. ඔබතුමාට පූර්වගාමී අධිකරණ ඇමතිතුමා ජිනීවාවලට ගිහිල්ලා කිව්වා, හිටපු සමහර මුදල් ඇමතිවරු විසින් උද්ධච්ච තීන්දු ගැනීම තමයි අපේ රටේ තිබෙන ආර්ථික ප්‍රශ්නයට මුල කියලා. ඔබතුමාට පූර්වගාමී අධිකරණ ඇමතිතුමා මම ආදරය කරන කෙනෙක්. හැබැයි, එතුමා මේ ගත්තේ උද්ධච්ච තීන්දුවක්. එතුමා ගත්ත ඒ උද්ධච්ච තීන්දුව වෙනස් කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමනි, අද දෙවැනි වර කියැවීම සඳහා ඉදිරිපත් කළ පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් මට යම් යම් ප්‍රශ්න තිබෙනවා. බන්ධනාගාර ආඥාපනත යටතේ ඔබතුමා හඳුන්වා දෙන්න යන රීති සම්බන්ධයෙනුත් මට යම් යම් ප්‍රශ්න තිබෙනවා. එම රීතිවල රිමාන්ඩ් බන්ධනාගාරගත කර ඇති සිරකරුවන්ට දැන් තිබෙන අයිතිවාසිකම් පොඩ්ඩක් කප්පාදු කරනකොටම මම හිතුවා, රිමාන්ඩ් සිරකරුවන්ටත් ඕනෑ නම් සල්ලි ගෙවලා ඒ පහසුකම් ලබා ගන්න අවස්ථාව දෙනවා කියලා. ඔබතුමා කිව්වා ඒක අදාළ වෙන්නේ රිමාන්ඩ් සිරකරුවන්ට නොවෙයි, සිවිල් වරදකට වරදකරුවන් වෙච්ච අයට පමණයි කියලා. එතැන පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, සිවිල් වරදකට වරදකරුවන් වෙච්ච අයගෙනුත්, සල්ලි තිබෙන කෙනාට පුළුවන් සුඛෝපභෝගිව බන්ධනාගාරගත වී සිටින්න. මම වාගේ කෙනෙකු සිවිල් වරදකට වරදකරුවකු වෙලා බන්ධනාගාරගත වුණොත්, මට එහෙම ඉන්න වෙන්නේ නැහැ. එතැනදීත් පොඩ්ඩක් කුඩම්මාගේ සැලකිල්ලක් දක්වා තිබෙනවා. ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. මොකද, සිරකරුවන් දෙදෙනෙකුට දෙවිධියකට සැලකීම වැරැදියි.

ගරු ඇමතිතුමනි, ඊළඟ කාරණය මෙයයි. අපේ ශබ්දකෝෂයට ජිනීවාවලින් හඳුන්වා දීපු අලුත් වචන දෙකක් තිබෙනවා. ඒ තමයි, "ආර්ථික වරදකරුවන්." ආර්ථික වරදකරුවන් කියන අය සිවිල් වරදකරුවන් යටතට නම් අයත් වන්නේ, මේ සංශෝධනය ගෙන එන්නේ අනාගතයේ ආර්ථික වරදකරුවන් වන අයට බන්ධනාගාරවලදී සැප පහසුව ජීවත් වෙන්න අවශ්‍ය පරිසරය සකසා දෙන්නද කියන සැකය ඔබතුමා කෙරෙහි වැරැදි විධියට සමාජය ඇති කර ගන්න පුළුවන්.

මම කැමැති නැහැ, ඔබතුමා වැනි කෙනකු ගැන එවැනි වැරැදි මතයක් සමාජයෙන් එනවාට. අපි දන්නා විධියට බොහෝ ආර්ථික වරදකරුවන් ඉන්නේ ආණ්ඩු පක්ෂයේ. නමුත්, විරුද්ධ පක්ෂයේත් එවැනි අය ඉන්න පුළුවන්. මේ නිසා ඔබතුමා කෙරෙහි වැරැදි මතයක් ඇති කරන්න පුළුවන්, අනාගතයේ ආර්ථික වැරැදිකරුවන් වන අය සිවිල් වරදකරුවන් යටතට වැටෙනකොට බන්ධනාගාර තුළ ඔවුන්ට වඩා සැපවත් ජීවිත ගත කරන්න අවශ්‍ය පරිසරය ඔබතුමා සැකසුවාද කියලා. ඒ නිසා මේ නීති ගෙනෙනකොට ඒ කාරණය කෙරෙහිත් ඔබතුමාගේ අවධානය යොමු කරන්නය කියන කාරණයත් මම කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර නීති ගෙනැල්ලා වැඩක් වෙන්නේ නැහැයි කියලා ගරු ඇමතිතුමාගේ කථාවේදී නිලධාරින්ට ඇඟිල්ල දික් කළා. ඔව්, නිලධාරින්ට ඇඟිල්ල දික් කරන්න ඕනෑ. හැබැයි, සමහර නීති ක්‍රියාත්මක කරන්න බැරි වෙන්නේ සමහර දේශපාලනඥයන් නිසායි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ කාරණය කියා මගේ කතාව අවසන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඔබතුමාට විරුද්ධව කියනවා නොවෙයි. ගරු අධිකරණ ඇමතිතුමනි, බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ උපසභාපතිතුමාගෙන් මට මේ මොහොතේ SMS එකක් ලැබුණා. බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ පොහොට්ටුවේ සහ විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් ඔක්කෝම එකතුවෙලා බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට විරුද්ධව තිබෙන දූෂණ, වංචා චෝදනා සම්බන්ධයෙන් ජනාධිපතිතුමාට ලියුමක් යැව්වාම, ජනාධිපති ලේකම් කාර්යාලය ඒ ලිපි ගොනුව එවා තිබෙනවා, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ලේකම් සාගර කාරියවසම් මහත්මයාට ඒ සම්බන්ධයෙන් විමර්ශනය කරලා එවන්න කියලා. මේක හරියට, "හොරාගෙ අම්මාගෙන් පේන අහනවා වාගේ" වැඩක්. බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ සභාපති ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ කෙනෙක්. ඔහුගේ වංචා, දූෂණ පිළිබඳව උපසභාපතිතුමා සහ මන්ත්‍රීවරුන් සියලුදෙනාම එකතුවෙලා ජනාධිපතිතුමාට ලිපියක් යවනවා. ජනාධිපතිතුමාගේ කාර්යාලයෙන් ඒ ලිපිය එවනවා, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ලේකම් වන අපේ ආදරණීය මිත්‍රයා - මේ දවස්වල මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගේ ඉතා ළඟම මිත්‍රයා- සාගර කාරියවසම් මහත්මයාට, ඒ සම්බන්ධයෙන් විභාග කරලා එවන්න කියලා. මේ දවස්වල සාගර කාරියවසම් මහත්මයාට තිබෙන්නේ, ඒවා විභාග කරන්න නොවෙයි, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මැති ඇමතිවරුන්ගෙන් ගුටි කන්නේ නැතුව බේරිලා ඉන්නයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා කියපු විධියට මේ රටේ නීතිය ක්‍රියාත්මක කරන්න බැරිවෙලා තිබෙන්නේ, මේ රටේ නිලධාරින් නිසා පමණක් නොවෙයි. සමහර නිලධාරින් සහ දේශපාලනඥයනුත් ඒ ගොඩේ ඉන්නවාය කියන කාරණයත් මතක් කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
මගේ හිතමිත්‍ර ගරු ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමා සඳහන් කරපු එක් කාරණයක් සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් නොකළොත්

[ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා ]

සමාජයට වැරැදි මතයක් යන්න ඉඩ තිබෙනවා කියා මා හිතනවා. ඇත්ත වශයෙන්ම එතුමා සඳහන් කළ, "ආර්ථික අපරාධ" කියලා කියනකොටම ඒ වචනයෙන් තේරෙනවා, economic crimes කියලා. If someone is convicted of a crime, irrespective of the nature of the crime, he is a criminal prisoner. But as far as a civil prisoner is concerned, he is a person who has been sent in by his opponent paying all the expenses out of his pocket. නඩුවක විනිශ්චිත ණයකරුගෙන් මුදල් අය කර ගැනීමට නොහැකි නම්, ඒ සඳහා ඔහුට වත්කමක් නැත්නම්, විනිශ්චිත ණය හිමියා රජය දරන වියදම රජයට බැඳලා තමයි ඔහු හිරගෙට යවන්නේ. ඒ නිසා ඔහු අපරාධ සිරකරුවකුගේ අර්ථ නිරූපණයට ගැනෙන්නේ නැහැ. අපි පිළිගන්නවා, මෙය එක්දහස්අටසිය ගණන්වල පනවපු නීතියක් කියලා. ඒ කාලයේ ඉඳලා තවමත් ඒ නීතිය සිවිල් නඩු විධාන සංග්‍රහයේ තිබෙනවා. හැබැයි, දැන් නඩු කියන්නෝ කවදාවත් අතින් සල්ලි වියදම් කරලා තමන්ගේ විරුද්ධකාරයා හිරේට යවන්න කටයුතු කරන්නේත් නැහැ. මේ වනකොට ඒ විධියේ එක සිරකරුවකුවත් ඇත්තේත් නැහැ. නමුත්, "සිවිල් සිරකරු" කියන අර්ථ නිරූපණය සිවිල් නඩු විධාන සංග්‍රහයේ තිබෙන නිසා ඒකේ වෙනසක් නොකර මේ පනත් කෙටුම්පතේ වෙනසක් කරන්න බැරි නිසායි මෙහෙම කරලා තිබෙන්නේ. නමුත්, අපරාධ සම්බන්ධයෙන් වැරදිකරුවන් වූ, මුදල් තිබෙන අයට වෙනම සැලකිලි ලබා ගන්නත්, මුදල් නැති අයට එහෙම නොවෙන්නත් තිබෙන ක්‍රමය මේ මඟින් අපි අහෝසි කරලායි තිබෙන්නේ.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

If the economic crimes fall under the category of criminal offence, there is no problem. But as far as I know, economic crimes have not been described in our law.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

Yes.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

So, I thought, sometimes the economic crimes can be categorized under the civil sector as well. But, if you say, "no" and it is definitely criminal, then, of course, people will not misinterpret your Amendment.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

I can give a very clear assurance that if anybody is convicted under economic crimes, he will not come within the ambit of a civil prisoner.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඒක හොඳ මාතෘකාවක් නිසා ඒ සම්බන්ධයෙන් අපි වෙනම විවාදයක් පවත්වමු.

ගරු පියල් නිශාන්ත ද සිල්වා මැතිතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.11]

**ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා (ධීවර රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பியல் நிஷாந்த த சில்வா - கடற்றொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Piyal Nishantha De Silva - State Minister of Fisheries)

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදයේදී මාගේ කථාව ආරම්භ කිරීමට ප්‍රථම විශේෂයෙන්ම කියන්න ඕනෑ, විපක්ෂයේ වුණත් ගරු රෝහිණී විජේරත්න මන්ත්‍රීතුමිය පාර්ලිමේන්තුවේ කළ කථාව පිළිබඳව මම බොහොම ආඩම්බර වෙන බව. ඒ වාගේම අධිකරණ, බන්ධනාගාර කටයුතු ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා, එතුමියගේ කථාව පිළිබඳව වැඩි අවධානයක් යොමු කරලා, යම් යම් සංශෝධන කරන්න තිබෙනවා නම් ඒවා කරන්න සහයෝගය ලබා දෙන්න කියලා.

කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යවරයා හැටියට සිටි කෙටි කාලය තුළ, දරුවන්ට සිදු වන හිංසන, අපයෝජන, බාල වයස්කාර දැරියන් දූෂණයට ලක් වීම වැළැක්වීම සම්බන්ධයෙන් මම විශාල වැඩ කොටසක් ක්‍රියාත්මක කරගෙන ආවා. ගරු ඇමතිතුමනි, ළමා අධිකරණ පිහිටුවීම සම්බන්ධව මම යෝජනා කිපයක්ම අපේ හිටපු අධිකරණ ඇමතිවරු දෙදෙනාටම ලබා දුන්නා. ඒ ළමා අධිකරණ පිහිටුවන්න ඇමතුමා කටයුතු කිරීම පිළිබඳව මම සතුටු වෙනවා. ඒ වාගේම ඒ අවධිය තුළ මම වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ මධ්‍යස්ථාන ඇති කරගෙන ගියා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, සෑම පළාතකම වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ මධ්‍යස්ථාන ඇති කිරීමට කටයුතු කරන්න කියලා. ඒ වාගේම, දරුවන්ගේ වයස අවුරුදු පහට වැඩි නම් තමයි මව්වරුන්ට විදේශගත වෙන්න ඉඩ දිය යුත්තේ කියන අදහසත් ඉදිරිපත් කරමින්, දැන් කථා කරන මාතෘකාවට සම්බන්ධ වෙන්න මම කැමතියි.

අද අපේ ගරු ඩග්ලස් දේවානන්දා ඇමතිතුමා ධීවර හා ජලජ සම්පත් පනත යටතේ නියෝග තුනක් මේ සභාවට ඉදිරිපත් කළා. ඉන් එක් නියෝගයක් වන නිල් පිහිනුම් කකුළුවා සම්බන්ධව ගෙනාපු නියෝගය ගැන මා කථා කරන්න කැමතියි. මේ රටට ඉතාම හොඳ ආර්ථික ශක්තියක් ලබා දෙන්නටත්, ධීවර ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනයට ඉතාම හොඳ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නටත් මේ යෝජනාව ඉතාම වැදගත් වෙනවා. ඒ නිසා මම ගරු ඇමතිතුමාටත්, ඒ වාගේම අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමිය ප්‍රමුඛ නිලධාරීන්ටත් මාගේ ගෞරවය, ස්තුතිය පුද කරනවා. ඒ සඳහා අනුමැතිය ලබා දුන්, සහයෝගය ලබා දුන් මේ පාර්ලිමේන්තුවේ සියලුදෙනාටත් මා ස්තුතිවන්ත වෙනවා.

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, අපේ රට දූපතක්; සාගරයෙන් වට වෙලා තිබෙන්නේ. හැබැයි, මේ දූපතේ ඉන්න ජනතාව සාගරයෙන් උපරිම ප්‍රයෝජනය ගන්නවාද කියන කාරණය ගැන අපට සැකයක් තිබෙනවා. මේ වන විට ගරු ඇමතිතුමාත්, අපිත් ධීවර අමාත්‍යාංශය හැටියට විශේෂ, සාර්ථක වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන යනවා. කෙටි කාලීන සහ දීර්ඝ කාලීන වැඩ පිළිවෙළ හැටියට තමයි ඒවා ක්‍රියාත්මක කරගෙන යන්නේ. අපි සමස්ත ධීවර කර්මාන්තයටම අණපනත්, විවිධ රෙගුලාසි ගෙනෙනවා. නමුත් ඒ සියල්ලට කලින් අපි මේ මහ පොළොවේ පැළ කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක

කරන්න ඕනෑ. වර්තමානය තුළ අපි ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරගෙන යනවා. ඒ පිළිබඳව තමයි මම අද මේ පුංචි කාල වේලාව තුළ කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ.

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, නොවැම්බර් 21වැනි දාට ලෝක ධීවර දිනය යෙදී තිබෙනවා.

නොවැම්බර් 21, ලෝක ධීවර දිනයට සමගාමීව දින හතක් තිස්සේ ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ අපි ගරු මන්ත්‍රීවරුන්ගේ අතට පත් කරන්නට සැලැස්වූවා. ඒ තුළින් අපි බලාපොරොත්තු වෙන්නේ, ධීවර ජනතාව ආර්ථිකමය වශයෙන් ශක්තිමත් ජනතාවක් බවට පත් කිරීම විතරක්ම නොවෙයි, ඔවුන් තුළ හොඳ ආකල්පමය වෙනසක් ඇති කරන්නටත්, ඔවුන්ගේ සියලු අවශ්‍යතා පිළිබඳව සොයා බලා කටයුතු කරන්නටත්. ඒ වාගේම දරුවන් සහ කාන්තාවන් ඇතුළු සියලු ධීවර ජනතාවගේ ප්‍රශ්න -ගැටලු- සොයා බලා, දිස්ත්‍රික්කයෙන්-දිස්ත්‍රික්කයට ගිහිල්ලා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්-කාර්යාලයට ගිහිල්ලා කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

මේ ගැන අතීතයේ සිටම මේ පාර්ලිමේන්තුවේ කථා කරනවා; විවිධ මාධ්‍ය ආයතනවලට ගිහිල්ලා කථා කරනවා. නමුත්, බිම් මට්ටමේ වැඩ පිළිවෙළක් ඉතාම ඉබි ගමනින් ක්‍රියාත්මක වුණා. මේ ඉබි ගමන, බොහොම වේගවත් ගමනක් බවට පත් කරන්නට නම්, අපි සැබෑ ලෙසම, ප්‍රායෝගිකව ධීවර ජනතාවට සම්බන්ධ වෙන්න ඕනෑ; සමීප වෙන්න ඕනෑ. අන්න ඒ නිසාම තමයි අපි මෙවර ලෝක ධීවර දිනය වෙනුවෙන් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන්න තීරණය කළේ. ඒ වැඩසටහන් අතර ධීවරයන් වෙනුවෙන් නව රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙනවා. ධීවර ජනතාව අවදානම් රැකියාවක තමයි යෙදෙන්නේ. ඔවුන් අවදානම් රැකියාවක යෙදෙනවා නම්, රජයක් හැටියට අපට යුතුකමක් තිබෙනවා ඒ ජනතාව ආරක්ෂා කරන්න. ඒක නිසා අපි අමාත්‍යාංශයක් හැටියට අලුත් රක්ෂණ ක්‍රමයක් ඒ අයට හඳුන්වා දෙනවා. ඉතිහාසය පුරාම ධීවර ජනතාව වයස්ගත වන විට ඉතාම අසරණ තත්ත්වයට පත් වුණා. ඒ නිසා මෙවර ලෝක ධීවර දිනයේදී ධීවර විශ්‍රාම වැටුපක් ලබා දෙන්න අපි ක්‍රමයක් සකස් කළා. ධීවර කැකුළු ළමා ඉතුරුම් ක්‍රමය ඇති කිරීමට කටයුතු කළා. මේ ඉතුරුම් ක්‍රම පිළිබඳව ධීවරයන් නිරතුරුවම දැනුවත් කරන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. ඒ කටයුත්ත ධීවර දරුවාගෙන් ආරම්භ කරලා, සමස්ත ආදරණීය ධීවර ජනතාව ඉතුරුම් ක්‍රමවලට හුරු කරන්නට අපට සිද්ධ වෙලා තිබෙනවා.

ගරු ඇමතිතුමාගේ උපදෙස් පරිදි දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට ගොස් හඳුනා ගත් ධීවර ගැටලුවලට කඩිනම් විසඳුම් ලබා දීමට අපි කටයුතු කරනවා. ඒ අනුව අපි හම්බන්තොට දිස්ත්‍රික්කයට ගියා; ගැටලු සාකච්ඡා කළා. හෙට කළුතර දිස්ත්‍රික්කයට යනවා. ඒ වාගේම අපි උතුරු පළාතටත් යනවා. ඒ විධියට ධීවරයන් සමීපයටම ගිහිල්ලා කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමනි, ධීවර ජනතාවට ගැටලු රාශියක් තිබෙනවා. සමහර ගැටලු පිළිබඳව වසර ගණනාවක්, දශක ගණනාවක් තිස්සේ සාකච්ඡා කරනවා. හැබැයි, ඒවා සාකච්ඡාවට පමණයි සීමා වෙලා තිබෙන්නේ. ඒක නිසා ධීවර ජනතාවගේ ගැටලු විසඳන්නට ධීවර ජංගම සේවයක් ක්‍රියාත්මක කිරීමේ දීප ව්‍යාප්ත වැඩ පිළිවෙළක් අපි මේ වන විට ආරම්භ කර තිබෙනවා.

අපි මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ගැනත් බලමු. මේ දවස්වල අපි මන්ද පෝෂණය ගැන කථා කරනවා. තව තව දේවල් ගැනත් කථා කරනවා. බඩු මිල වැඩියි ලු; මාළු කන්න බැහැ ලු; මාළු මිල අහස උසට ගිහිල්ලා ලු. හැබැයි, අපට තිබෙන හොඳම සම්පතක් තමයි මිරිදිය ධීවර කර්මාන්තය. ඒ නිසා ලෝක ධීවර දිනය වෙනුවෙන් මිරිදිය ධීවර කර්මාන්තය ශක්තිමත් කරන වැඩ පිළිවෙළකුත් අපි ක්‍රියාත්මක කරනවා. ඒ අනුව ඒ ජනතාවට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දෙන්න, නවීන ක්‍රම ඔස්සේ මත්ස්‍ය අස්වැන්න වැඩි කර ගන්නට අවශ්‍ය සහයෝගය ලබා දීමට අපි කටයුතු කර තිබෙනවා.

ධීවර කර්මාන්තයේ යෙදෙන ජනතාවගේ සෞඛ්‍ය පිළිබඳවත් අපි වැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ. ධීවර දරුවාගේ අධ්‍යාපනය, ධීවර ජනතාවගේ සෞඛ්‍යය පිළිබඳවත් අපි වැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ. ඒක නිසා ලංකාව පුරා ව්‍යාප්ත වෛද්‍ය සායන පවත්වන්නට අපි මේ වන විට කටයුතු කර තිබෙනවා. ධීවර දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් අපි විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. විශිෂ්ට ප්‍රතිඵල ලබන දරුවන් ඇගැයීමට ලක් කිරීම වාගේම, ඔවුන්ට ශිෂ්‍යත්ව ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමද ආරම්භ කර තිබෙනවා.

ඒ වාගේම, විශේෂයෙන් ධීවර ප්‍රඥප්තියක අවශ්‍යතාව තිබෙන වකවානුවක් මේ. මෙවර ලෝක ධීවර දිනයේදී ඒ ගැන කතිකාවක් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සියලු දේවල් කළත් වැඩක් නැහැ අපට ධීවර ජනතාව තුළ හොඳ ආකල්ප හදන්න බැරි නම්. විශේෂයෙන් ධීවර පවුල්වල යහපත් දෙමාපියභාවය ගොඩනැඟීම සඳහා අපි "දිරිය ධීවර අම්මා" කියන වැඩසටහන තුළින් සංගීතමය, සංවාදශීලී, විද්වත් කතිකාවක් පවත්වනවා. මෙවැනි කටයුතු කරන්න ධීවර අමාත්‍යාංශය හැටියට අපි විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරගෙන යනවා. අපි කථා කරනවාට වඩා මහ පොළොවට බැහැලා, මහ පොළොවේ ඉඳන් වැඩ කරන්න ඕනෑ. ධීවර අමාත්‍යාංශය හැටියට අපි එසේ කටයුතු කරනවාය කියන ප්‍රතිඥාව ලබා දෙමින් සහ ධීවර ජනතාවගේ දැවෙන ප්‍රශ්න විසඳීමට පක්ෂ විපක්ෂ අපි සියලුදෙනාම එකතු වෙලා කටයුතු කරමු කියන ආයාචනය කරමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ මම එක කාරණයක් මතක් කරන්න ඕනෑ. අද දෙවනවර කියැවීමේ විවාදය සඳහා ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත් නවය, රීති, නියෝග සහ යෝජනා සම්මතය ගැන කථා කළ සියලු ගරු ඇමතිතුමන්ලා සහ මන්ත්‍රීතුමන්ලා විශේෂයෙන් අවධානය යොමු කළා, දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, දරුවන්ට සිදු වූ වැරදි සම්බන්ධව අධිකරණයේ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සහ ඒවායේ තිබෙන අඩු පාඩුකම් බොහොමයක් ගැන. මේ සෑම පනත් කෙටුම්පතකින්ම ඒ කාරණා ආමන්ත්‍රණය කර තිබෙනවා. විශේෂයෙන් විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත, ළමයින් සහ තරුණ තැනැත්තන් (සංශෝධන) පනත් කෙටුම්පත සහ බන්ධනාගාර ආඥාපනත යටතේ ගෙනෙන රීතිවලින් අපි මේ සම්බන්ධ පියවර අරගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි එකක් කියන්න ඕනෑ. මේ නීති හැදුවාට මේ සියලු ප්‍රශ්නවලට උත්තර නීති පද්ධතිය තුළින් ලැබෙන්නේ නැහැ. ඒ සඳහා අපට සමාජයේ දායකත්වය අවශ්‍ය වෙනවා. පාසල්වලින් මේ පිළිබඳව දක්වන උනන්දුව අපට අවශ්‍ය වෙනවා. ගෙවල්වලදී දෙමාපියෝ දරුවන් ආරක්ෂා කරන්න ගන්නා පියවර මොනවාද, පාසල්වලදී විදුහල්පතිවරු හා ගුරුවර ගුරුවරියන් දරුවන් දැනුවත් කිරීමට ගන්නා පියවර

[ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා ]

මොනවාද කියන කාරණා පිළිබඳවත් අපි කථා කරන්න ඕනෑ. මොකද, නීතිය ක්‍රියන්නේ යම් වරදක් සිදු වුණාට පසුව ක්‍රියාත්මක වෙන දෙයක්. වඩාත් වැදගත් වන්නේ, යම් වරදක් වුණාට පසුව නීතිය ක්‍රියාත්මක කර දඬුවම් දෙන එකට වඩා, වරදක් සිදුවීම වළක්වා ගැනීමයි. ඒ නිසා රටේ සමස්ත පුරවැසියන්ගේ අවධානය නිසි පරිදි මේ කාරණයට නො ලැබුණොත්, අපි මේ කරන කර්තව්‍යයෙන් සමහර වෙලාවට ප්‍රතිඵලයක් නොලැබෙන්න ඉඩ තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජයරත්න හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 8ක් තිබුණා නේද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් අඩු වෙලා.

[අ.භා. 4.24]

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය සීමිත නිසා ඉතාම කෙටියෙන් මේ කාරණා ටික ගරු අධිකරණ ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න මම බලාපොරොත්තු වෙනවා. විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත ඇතුළු පනත් කෙටුම්පත් කීපයක් අද දෙවැනිවර කියැවීමේ විවාදයට ඉදිරිපත් කර තිබෙනවා. ඒ සඳහා කටයුතු කිරීම පිළිබඳව විශේෂයෙන් මම අධිකරණ ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විෂ මත්ද්‍රව්‍ය පිළිබඳව නාවික හමුදාව, විශේෂ කාර්ය බලකාය සහ Police Narcotics Bureau එක මෙහෙයුම් කරනවා; සාර්ථක වැටලීම් කරනවා. නමුත්, මට මතකයි, මීට වර්ෂ කීපයකට ඉස්සෙල්ලා Police Narcotics Bureau එක විෂ මත්ද්‍රය සම්බන්ධයෙන් ක්‍රියා කළ ආකාරය පිළිබඳව යම් යම් මත, ගැටලු ඉදිරිපත් වුණා. ඒ කෙසේ වෙතත්, අවම පහසුකම් යටතේ ඔවුන් ගන්නා උත්සාහය ගැන අපි ඔවුන්ටත් ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම, නඩු ප්‍රමාදවීම් වැළැක්වීම සම්බන්ධයෙන් වන කරුණු කාරණා ඇතුළත් සංශෝධන කීපයක්ද අද මේ සභාව හමුවේ තිබෙනවා. මම මේ කාරණය විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. අපේ රටේ හුඟක් සිවිල් සහ අපරාධ සම්බන්ධ නඩු විසඳීම අද දිනෙන් දින ප්‍රමාද වෙනවා. සමහර අධිකරණවල අවුරුදු 20, 25, 30ට ආසන්න වූ සිවිල් ආරාවුල් සම්බන්ධ නඩු, අපරාධ සම්බන්ධ නඩු තිබෙනවා. ගරු ඇමතිතුමනි, මගේ මතකයේ හැටියට පසුගිය යහ පාලන රජය කාලයේත් අධිකරණ ඇමතිතුමා ඔබතුමායි. ඒ වෙලාවේත් යම් යම් විශේෂිත අධිකරණ ස්ථාපිත කරලා මේ තත්ත්වය අවම කරන්න ගත්ත උත්සාහය ගැන අපි විශාල ලෙස බලාපොරොත්තු තැබුවා. නමුත්, ඒකෙන් සාධනීය උත්තරයක් අපට ලැබුණාද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. කෙසේ හෝ වේවා, යම් විශේෂිත වැඩ පිළිවෙළක් කරලා හෝ කාන්තාවන් සහ දරුවන්ගේ නඩු සම්බන්ධව විශේෂ අධිකරණ පිහිටුවා යම් සාධනීය ක්‍රියා මාර්ගයක් ගනු ඇතැයි මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් මේ නඩු විසඳීමේ ප්‍රමාදයට හේතු වී තිබෙන්නේ අධිකරණමය ක්‍රියාමාර්ග විතරක් නොවෙයි. නීතිපති දෙපාර්තමේන්තුවත්, රජය කරවන උදවියත් මේවාට කරන බලපෑම් නිසා බරපතළ විධියේ ශෝචනීය තත්ත්වයක් තිබෙනවා. මේ සම්බන්ධයෙන් මම උදාහරණයක් පැහැදිලි කරන්නම්. කුරුණෑගල ඓතිහාසික රාජධානියේ තිබුණා රාජ සභා මණ්ඩපයක්. එය පුරා විද්‍යා ආඥාපනත යටතට ගැනෙන, පුරා විද්‍යා දෙපාර්තමේන්තුව විසින් සංරක්ෂණය කළ යුතු ස්ථානයක් වුණත්, පසුගිය දවස්වල මේ රාජ සභා මණ්ඩපය කඩා දැම්මා. අපේ පළාත්වල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හෝ පැරණි රජමහා විහාරයකට යාබදව තිබෙන ඉඩමක හෝ පොල් පැළයක්, කෙසෙල් පැළයක් වවන්න වළක් කැපුවත්, පුරා විද්‍යා ආඥාපනත යටතේ කටයුතු කරලා ඔවුන් රක්ෂිත බන්ධනාගාරගත කරනවා. නමුත්, මේ කියන රාජ සභා මණ්ඩපය කඩා දැමීම සම්බන්ධයෙන් නීතිය ඉදිරියට පැමිණවිය යුතු විත්තිකරුවන් පිළිබඳව එවකට සිටි පුරාවිද්‍යා කොමසාරිස්වරයාත්, නීතිපති දෙපාර්තමේන්තුවත් බොහොම අලස ක්‍රියා මාර්ගයක් තමයි ගත්තේ. ඔවුන් ඒ දක්වපු උදාසීනත්වය තුළ අඩුම තරමින් ඒ එක සැකකරුවකුවත් රක්ෂිත බන්ධනාගාරගත කරගන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. අපේ පළාතේ, ඒ ඓතිහාසික රාජධානියේ, තිබෙන ඒ භූමියේ එවකට විජයබා රජ්ජුරුවන්ගේ කාල සීමාව තුළ තැන්පත් කරපු යම් යම් කෞතුකමය වටිනාකම් තිබෙන දේපළ තිබුණා. නමුත්, ඒ නඩුවට අද වෙච්ච දෙයක් නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මම අධිකරණ ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා, ඒ ඓතිහාසික රාජ සභා මණ්ඩපය කඩා දාලා, එහි තිබුණු මුතු, මැණික් එහෙම නැත්නම් ඒ වටිනා දේපළ සොරා ගත්ත උදවියට එරෙහිව තිබුණු ඒ නඩුවට මොකද වුණේ, ඊට සම්බන්ධ වගකිව යුත්තන්, විත්තිකරුවන් අධිකරණය ඉදිරියට පමුණුවන්න යම් ක්‍රියාමාර්ග ගැනීමට තිබෙන අවහිරතා මොනවාද කියන කාරණය සඳහන් කරන්න කියලා.

ඒ වාගේම, අවසාන වශයෙන් මේ කාරණයත් මම මතක් කරන්න ඕනෑ. අපි COPE එකට ඇවිල්ලා, විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධව තිබෙන යම් යම් ගැටලුසහගත තත්ත්ව ගැන සහ අවුරුදු ගණනාවක් තිබුණු -අවුරුදු 50ක්, 60ක්- දූෂණ සහ වංචා පිළිබඳව අනාවරණ කරගත් තොරතුරු ගැන කථා කළා. ඒ යම් යම් කරුණු -කාරණා COPE එක හමුවේ තිබුණා. නමුත්, ඒ සියල්ල ගැන කථා කරලා ඒ තොරතුරු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවලට නිකුත් කරලා ලිපි ගොනුවක් විධියට තැන්පත් කරනවා මිස, ඒ වංචා, දූෂණවලට සම්බන්ධ කිසිම නිලධාරියකු පිළිබඳව ගත්ත කිසිදු ක්‍රියා මාර්ගයක් නැහැ. මම අධිකරණ ඇමතිතුමා එක්ක මේ ගැන මීට ඉස්සෙල්ලා පෞද්ගලිකවත් කථා කළා. ප්‍රසම්පාදන ක්‍රියාවලිය හෝ වෙනත් දූෂණ, වංචා සම්බන්ධව COPE එකේදී අනාවරණ වන කාරණා පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කරලා හෝ නීතිපතිවරයාට බලය පවරා අපරාධ නීතිය යටතේ, සුදුසු අධිකරණවල ඔවුන්ට එරෙහි ක්‍රියාමාර්ගවලට එළැඹෙන්න කටයුතු කරන්න පුළුවන්කමක් ඇති වුණොත්, මේ දූෂණ, වංචා අවම කරන්න අපට පුළුවන්කම තිබෙනවා.

එහෙම නැත්නම් අපි නිකම් කථා පෙට්ටි විතරයි; මේවා කථාවල මාතෘකා විතරයි. කෝටි ගණනක දේපළ වංචා ගැන තොරතුරු මේ පාර්ලිමේන්තුව හමුවට එනවා. අපි ඒවා ගැන කථා කරනවා. අදාළ නිලධාරීන් ඇවිල්ලා රස්තියාදු වෙනවා. අපි ඒවා රසවත් කථා විධියට අහනවා, බලනවා. නමුත්, වෙච්ච දෙයක් නැහැ. මම අධිකරණ ඇමතිතුමාට බොහොම කාරුණිකව මතක් කරනවා, මේ කමිටුවට නීතිමය තත්ත්වයක් ආරෝපණය කරලා

මේ වංචා, දූෂණවලට පෙලඹෙන නිලධාරින්ට  අපරාධ නීතිය යටතේ වහ වහා ක්‍රියාමාර්ග ගන්න කටයුතු කරන්න, අවශ්‍ය අණපනත් සංශෝධනය කර ඒ නීතිමය තත්ත්වය ඇති කරන්න කියලා.

අද පනත් කෙටුම්පත් නවයක් සහ රීති, නියෝග දෙකක් ගැන මෙම ගරු සභාවට කරුණු ඉදිරිපත් වනවා. සමථ මණ්ඩලවලින් ලැබෙන පැමිණිලිවලින් සියයට 70ක් පමණ විභාග කරනවා. අපේ පළාත්වල ජීවත් වන ග්‍රාමීය ජනතාවට සමථ මණ්ඩලය වඩාත් පහසු ස්ථානයක් බවට අද වන කොට පත් වෙලා තිබෙනවා. ඒ පිළිබඳව කථා කරන අතරතුර මා තවත් කාරණයක් කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ රැඳවියන්ගේ ප්‍රශ්නය මෑතකදී - අවස්ථා දෙකකදී- මේ රටේ මහත් ආන්දෝලනයට ලක් වූ කාරණයක් බවට පත් වුණා. මේ, ඒ රැඳවියන්ට එවැනි සිදුවීමක් වූ තුන්වන අවස්ථාව. රැඳවියන් මෙවැනි අවාසනාවන්ත තත්ත්වයකට ගොදුරු නොවන විධියේ යම්කිසි විධිමත් වැඩ පිළිවෙළක් සකස් කරලා ඒ රැඳවියන් ඒ පවතින ගැටුම්වලින් මුදාගත යුතුයි. ඒ කාරණය කෙරෙහි ගරු අධිකරණ ඇමතිතුමාගේ අවධානය යොමු කරවමින්, මට කථා කරන්න කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු උදය ගම්මන්පිල මැතිතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.31]

**ගරු උදය ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய கம்மன்பில)
(The Hon. Udaya  Gammanpila)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිහාල් නෙල්සන් මහතා වරක් ගීතයකින් කිව්වා, "කාලෙන් කාලෙට එන වසංගතේ නැහැ අඩුපාඩු" කියලා. ගංජා යුගය, හෙරොයින් යුගය අවසන් කරලා දැන් අපි අයිස් යුගයට ඇවිත් තිබෙනවා. ඇත්තෙන්ම අයිස් කියන මත් ද්‍රව්‍ය මීට කලින් නම් hyperactivity disorder හෙවත් "වැඩි විසේ" කියන මානසික රෝගයට ඖෂධයක් විධියට පාවිච්චි කළ දෙයක්. ඒ නිසාම අයිස් පාවිච්චි කරන කෙනෙක් හෙරොයින් පාවිච්චි කරන කෙනෙක් වාගේ ප්‍රචණ්ඩ වන්නේ, දහලන්නේ හෝ කියවන්නේ නැහැ. ඒ අය ඉතා සාමකාමීවයි ඉන්නේ. පාසල් දරුවන් අතර ඒ මත් ද්‍රව්‍ය බරපතළ ලෙස පැතිර තිබෙනවා. ඒ අය ඒ මත් ද්‍රව්‍ය පාවිච්චි කරනවාද කියලා හොයාගන්නත් බැහැ. සාමකාමීව හිටියාට ඒ මත් ද්‍රව්‍ය නිසා ලැබෙන ප්‍රතිඵලය බරපතළයි. දත් දිය වීමෙන් පටන් ගෙන ක්ෂණික මරණය දක්වා වන ප්‍රතිවිපාක එයින් ලැබෙනවා. ඒ නිසා මේ වසංගතය, මේ උවදුර පිළිබඳව තේරුම් ගනිමින් අයිස් නමැති මත් ද්‍රව්‍ය, තහනම් මත් ද්‍රව්‍ය ගොන්නට එකතු කිරීමට කටයුතු කිරීම පිළිබඳව ගරු අධිකරණ අමාත්‍යතුමාට අපේ ප්‍රණාමය මේ අවස්ථාවේදී පුද කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සිහින දැක්කේ ලංකාව වාණිජ කේන්ද්‍රයක් වාගේම නාවුක කේන්ද්‍රයක් බවට පත් කරන්නයි. 2010දී මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ජනාධිපතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබුණේ ආසියාවේ පංචබල කේන්ද්‍රය බවට ලංකාව පත් කරනවා කියලායි. ආසියාවේ පංචබල කේන්ද්‍රය කෙසේ වෙතත්, දැන් ශ්‍රී ලංකාව ආසියාවේ මත් ද්‍රව්‍ය කේන්ද්‍රය බවට නම් පත් වෙමින් තිබෙනවා. අවාසනාවට අපේ ආදරණීය රට විරුවන්ගේ නොදැනුවත්කම නිසා ශ්‍රී ලංකාව ආසියාවේ මත් ද්‍රව්‍ය කේන්ද්‍රය බවට පත් කරගැනීමේ ක්‍රියාවලියට දායකවෙමින් ඉන්නවා. ඒක වෙන්නේ මෙහෙමයි. මත් ද්‍රව්‍ය ගෙන්වන කෙනෙකුට වෙනත් භාණ්ඩයක් ආනයනය කරන ආකාරයට බැංකුවක් හරහා සල්ලි TT කරලා, LCs විවෘත කරලා මත් ද්‍රව්‍ය ගෙන්වන්න බැහැ. මත් ද්‍රව්‍ය තොගයක් හොර රහසේ රට ඇතුළට එව්වත්, ඒ වෙනුවෙන් ගෙවන්න ඩොලර් ලබාගන්න ක්‍රමයක් නැහැ. ඒ ඩොලර් ටික මිල දී ගන්න වෙන්නේ කළු කඩයෙන්. ඒ දවස්වල ලංකාවේ ඩොලර් කළු කඩය හරිම පුංචියි. මොකද, ඩොලරයක් සඳහා බැංකුව සහ කළු කඩය ගෙවන අගය  අතර එදා තිබුණේ රුපියලක, දෙකක වෙනසක්. නමුත්, 2020 වර්ෂයේදී ඩොලරයේ රුපියල් වටිනාකම 203ක් ලෙස අල්ලාගෙන ඉන්න ආණ්ඩුව ගත්ත වැරැදි තීන්දුව නිසා කළු කඩය ව්‍යාප්ත වෙන්න ගත්තා. පිට රටවල ඉන්න ශ්‍රමිකයන් බැංකු හරහා ඩොලර් එවනවා වෙනුවට වැඩි වාසි පිණිස කළු කඩය හරහා ඩොලර් එවන්න පටන්ගත්තා. ඒ නිසා කළු කඩයට යහමින් ඩොලර් ලැබුණා. එතෙක් කල් තිබුණු කළු කඩය පුංචි නිසා මත් ද්‍රව්‍ය ජාවාරමත් තිබුණේ පුංචියට. මොකද, ගෙන්වන මත් ද්‍රව්‍යවලට ගෙවීමට ඩොලර් හොයාගන්න විධියක් එදා තිබුණේ නැති නිසා. දැන් මේ කළු කඩය ව්‍යාප්ත වෙන්න, ව්‍යාප්ත වෙන්න මත් ද්‍රව්‍ය ජාවාරමත් වර්ධනය වෙලා තිබෙනවා. ඒක වෙන්නේ මෙහෙමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි උදාහරණයක් ගනිමු. ඩුබායිවල අපේ ශ්‍රමිකයන් ලංකාවට එවන විදේශ මුදල් ටික ඒ රටේ සිටින කෙනෙකුට භාර දෙනවා. ඔහු සල්ලි ටික භාර ගෙන කරන්නේ මොකක්ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් මිනිත්තු දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු උදය ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய கம்மன்பில)
(The Hon. Udaya  Gammanpila)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එයා අද උදේ සල්ලි දුන්නා නම් පැයක් ගත වනකොට ඔහුගේ අම්මාට දුරකථන ඇමතුමක් එනවා, "පුතා මෙච්චර මුදලක් දීලා තිබෙනවා. අම්මාගේ බෙහෙත් තුණ්ඩුවයි, කඩෙන් ගන්න ඕනෑ බඩු ලැයිස්තුවයි එවන්න" කියලා. ඔන්න හවස් වනකොට අම්මාගේ බෙහෙත් ටිකයි, මාසයට ගෙදරට අවශ්‍ය බඩු ටිකයි අරගෙන කෙනෙක් ගෙදරට එනවා. ඔහු ඉතිරි සල්ලි ටික අම්මාට භාර දීලා, රිසිට් එකක් අත්සන් කරවාගෙන, අම්මාත් එක්ක සෙල්ෆි එකකුත් ගන්නවා. ඊට පස්සේ බෙහෙත් රිසිට් එකයි, කඩෙන් ගත්තු බඩුවල රිසිට් එකයි, අම්මාත් එක්ක ගත්ත සෙල්ෆි එකයි, ඉතිරි සල්ලි ලබා දුන් බවට වන රිසිට් එකයි පුතාට WhatsApp කරනවා. පැය 24ක් යන්න කලින් ඒ මුදල් ටික ඔහුගේ ගෙදරට ලැබිලා!

ඒ ක්‍රමය නිසා, එක පැත්තකින්, ලැබෙන රුපියල් ගණන වැඩියි; වාසියි. පැය කිහිපයක් ඇතුළත මුදල ගෙදරට යනවා; ලේසියි. ඊට අමතර වාසිත් තිබෙනවා. ඒ අම්මාට බැංකුවේ පෝලිමේ ඉන්න ඕනෑ නැහැ; ෆාමසියේ පෝලිමේ ඉන්න ඕනෑ නැහැ; කඩවල් ගණනේ ගිහින් බඩු ගන්න රස්තියාදු වෙන්න ඕනෑත් නැහැ. මේ නිසා අද විශාල වශයෙන් ඩොලර් කළු කඩය ව්‍යාප්ත වෙලා තිබෙනවා. එහි ප්‍රතිඵලය විධියට ශ්‍රී ලංකාව අද ආසියාවේ කුඩු ගෙනෙන මධ්‍යස්ථානයක් බවට පත් වෙලා තිබෙනවා. ඩුබායිවල විතරක් නොවෙයි, ඉතාලියේ, කොරියාවේ, ජපානයේ ඉන්න ලාංකිකයන්ගෙන් සාතිශය බහුතරයක්  අද මුදල් එවන්නේ මේ ක්‍රමයට. එහි අවසාන ප්‍රතිඵලය තමයි, අද ලංකාව

[ගරු උදය ගම්මන්පිල මහතා]

මත් ද්‍රව්‍ය ආනයන අපනයන මධ්‍යස්ථානය බවට, එහෙම නැත්නම් මත්ද්‍රව්‍ය කේන්ද්‍රය බවට පත් වෙලා තිබීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවාසනාවට අපේ සමහර මන්ත්‍රීවරු මේ පාර්ලිමේන්තුවේදීත් ඉන් පිටතදීත් කියනවා, "ලංකාවට ඩොලර් එවන්න එපා" කියලා. ආණ්ඩුවත් එක්ක අපටත් තරහක් තිබෙනවා. හැබැයි, නහය එක්ක තරහට මූණ කපාගෙන හරියන්නේ නැහැ. ඩොලර් කළු කඩයට යැවීම නිසා මොකක්ද වෙන්නේ? ලංකාවට ඩොලර් එවන්න එපා කියලා අපේ සමහර මන්ත්‍රීතුමන්ලා පිට රට ඉන්න ශ්‍රී ලාංකිකයන්ට කිව්වාට, ඒ අයගේ ලංකාවේ ඉන්න නෑදෑයන්ට ජීවත් වෙන්න සල්ලි නැතුව බැහැ. ඒ නිසා බැංකු හරහා එවනවා වෙනුවට කළු කඩය හරහා වැඩිවැඩියෙන් ඩොලර් එවන්න ඒ අය පෙලඹී තිබෙනවා. ඒ නිසාම මත් ද්‍රව්‍ය ජාවාරම වඩවඩාත් ව්‍යාප්ත වෙලා තිබෙනවා.

ඒ නිසා අපේ ආදරණීය රට විරුවන්ට මම මේ කාරණය කියන්න ඕනැ. එක පැත්තකින්, ඔබේ දරුවන් මත් ද්‍රව්‍යවලට යොමු වෙනවා නම්, අනෙක් පැත්තෙන් ඔබේ දෙමව්පියන්ට අවශ්‍ය බෙහෙත් ටික ගෙනෙන්න බැරිව ඔවුන් මිය යෑමේ අවදානමට ලක් වෙනවා නම්, ඔබ එවන ඩොලර්වලට රුපියල් කිහිපයක් වැඩියෙන් ලැබීමෙන් වන වාසිය, ප්‍රයෝජනය මොකක්ද යන්න ගැන කරුණාකර හිතන්න කියා අපි ඒ රට විරුවන්ගෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණයත් කියා මම මගේ කථාව අවසන් කරන්නම්. දේශපාලකයන්ගේ අනුග්‍රහය නැතිව, පොලීසියේ සහයෝගය නැතිව රටක මත් ද්‍රව්‍ය ජාවාරමකට පවතින්න බැහැ. ලෝකයේ ඕනෑම රටක් සම්බන්ධයෙන්, ඒකයි තිත්ත ඇත්ත. පොලීසිය බොහොම අමාරුවෙන් මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකු අත්අඩංගුවට ගත්තත් ඊට පස්සේ බලවතුන්ගෙන් දුරකථන ඇමතුම් එනවා. එවිට පොලීසියත් අසරණ වෙනවා. ශ්‍රී ලංකාව ආසියාවේ මත් ද්‍රව්‍ය කේන්ද්‍රය බවට පත් වීම නතර කරගන්න අපට අවශ්‍ය නම්, එහි පළමු පියවර හැටියට මේ මන්ත්‍රීවරුන් 225දෙනාම අධිෂ්ඨානයක් ඇති කරගන්න ඕනැ කිසිම හේතුවක් මත මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට සහාය දෙන්නේ නැහැ කියලා. මැතිවරණවලට කෙතරම් මුදල් ලැබුණත්, කෙතරම් සෙනඟ ලැබුණත් මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට සහාය දෙන්නේ නැහැ; ඒ අය සමඟ සම්බන්ධතාවක් පවත්වන්නේ නැහැ කියන අධිෂ්ඨානය ඇති කරගත්තොත් ඒක ලංකාව ආසියාවේ මත් ද්‍රව්‍ය කේන්ද්‍රය බවට පත් වීම නතර කර ගැනීමේ පළමු වැදගත් පියවර වන බව සිහිපත් කරමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අනුප පස්කුවල් රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.39]

**ගරු අනුප පස්කුවල් මහතා (සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுப பஸ்குவல் - சமூக வலுவூட்டுகை இராஜாங்க அமைச்சர்)
(The Hon. Anupa Pasqual - State Minister of Social Empowerment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද, අධිකරණ කාර්යයන්ට අදාළ විශේෂ අණ පනත් කිහිපයක් සංශෝධනය කිරීමට නියමිතව තිබෙනවා. ඒ අතර අද පාර්ලිමේන්තුව තුළ ප්‍රධාන වශයෙන් කථා කළ කාරණයක් තමයි, මත් ද්‍රව්‍ය සහ මත් ද්‍රව්‍ය ජාවාරම මැඩලීම කියන කාරණය. ඒ පිළිබඳ සංශෝධන පනත් කෙටුම්පතක්ද අද ඉදිරිපත් කර තිබෙනවා. අපි දකිනවා, මත් ද්‍රව්‍ය නිසා බරපතළ ප්‍රශ්නයක් රටේ ඇති වෙලා තිබෙන බව. මත් ද්‍රව්‍ය භාවිතය ආබාධිත දරුවන් බිහි වීම සඳහාත් එක ප්‍රධාන හේතුවක්. පියා හෝ මව අයිස් හෝ වේවා, හෙරොයින් හෝ වේවා, alcohol හෝ වේවා, විස මත්පැන් හෝ වේවා යම් මත් ද්‍රව්‍යයක් භාවිත කරනවා නම් ඒ හේතුවෙන් ආබාධිත දරුවන්, මන්ද මානසික දරුවන්, ඇස් පෙනෙන්නේ නැති දරුවන් බිහි වීමේ ප්‍රවණතා අද සමාජය තුළ දකින්නට තිබෙනවා.

අද අපේ රටේ ජනගහනයෙන් ආබාධ සහිත ප්‍රජාව සියයට 8ක් පමණ ඉන්නවා. ඒකට එක හේතුවක් තමයි මත් ද්‍රව්‍ය භාවිතය. තවත් හේතුවක් තමයි ජානමය හේතු. අනෙක් හේතුව තමයි විවිධ බෙහෙත් සහ ආහාර නිසා ඇති වන ආබාධිත තත්ත්ව. ඒ වාගේම, මන්දපෝෂණ තත්ත්වයටත් ප්‍රධාන වශයෙන් බලපාන හේතුවක් වනවා මව හෝ පියා මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම. ළමා මන්දපෝෂණය සියයට 12ක් පමණ වීම සඳහා මව හෝ පියා - විශේෂයෙන් පියා- මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමත් ප්‍රධාන වශයෙන් හේතු වනවා. මොකද, ඒ ඇබ්බැහිකම නිසා දුප්පත්කම -දුගීභාවය- ඇති වනවා. ඒ නිසාම නිසි පෝෂණය ලබා දීමට නොහැකි වීමෙන් දරුවාට මන්දපෝෂණය ඇති වනවා; දරුවාගේ ශක්තිය හීන වනවා. ඒ වාගේම, මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම නිසා මානසික දුගීභාවයත් ඇති වනවා. ඒ නිසා ඒ මව්පියන් දරුවා නියමිත පරිදි පෝෂණය කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ලක්ෂ පහක පිරිසක් හෙරොයින් සහ අයිස් වැනි මත් ද්‍රව්‍ය පාවිච්චි කරනවා. ඊට අමතරව ලක්ෂ 50කට අධික පිරිසක් - සියයට 25ක් - කුමන හෝ මත්ද්‍රව්‍ය වර්ගයකට ඇබ්බැහි වෙලා සිටිනවා. එයින් මේ ලක්ෂ පහ තමයි, හෙරොයින්, අයිස් වැනි මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ customer base එක. මේ customer base එක කඩන එක, අඩු කරන එක, දුර්වල කරන එක තමයි අපේ ප්‍රධාන ඉලක්කය විය යුත්තේ. පිට රටින් Airport එක හරහා, වරාය හරහා, මුහුද හරහා ලංකාව තුළට එන මත්ද්‍රව්‍ය නවත්වනවා වාගේම, මේ customer base එක නැවැත්තුවේ නැත්නම් කවදාවත් අපට මත්ද්‍රව්‍ය ජාවාරම නැති කරන්න බැහැ.

ඇප ලබා දීමේ දී මත්ද්‍රව්‍ය ග්‍රෑම් දෙකක් ළඟ තබා ගැනීමට අදාළව තිබුණු සීමාව ග්‍රෑම් පහ දක්වා වැඩි කර තිබෙනවා. ඒකට එක හේතුවක් තමයි, හිරගෙදරට ගියාම මේ අයත් සුපිරි මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් බවට පත් වෙනවාය කියන මතය. අධිකරණ අමාත්‍යාංශය තුළත්, අනෙකුත් ආයතන තුළත් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ පිරිස්, නියෝජිතයන් විවිධ වෙස් මුහුණුවලින් ඉන්නවාය කියන එක අතීතයේ වෙච්ච සිද්ධි මත අපට හිතන්න සිද්ධ වෙනවා. ඒ නිසා ග්‍රෑම් 2ක් ළඟ තබා ගැනීම කියන අවම සීමාව ග්‍රෑම් 10 දක්වා වැඩි කරනවා නම් අපට ඒක පිළිගන්න බැහැ. ඒ නිසා මේ customer base එකෙන් විශාල පිරිසක් පුනරුත්ථාපනය කරන එක අත්‍යවශ්‍යම දෙයක්. එහෙම නැත්නම් දවසින් දවස කළුතර දිස්ත්‍රික්කය ඇතුළු ලංකාව පුරාම වයස අවුරුදු 17, 18, 19, 20 වයස්වල දරුවන් මත්ද්‍රව්‍යවලට ගොදුරු වීම වැඩි වන එක, ඒ ප්‍රමාණය ලක්ෂ 5, 6, 7 වන එක වළක්වන්න බැහැ. අපි පොඩි කාලේ මත් ද්‍රව්‍යවලට ගොදුරුවූවන් ලක්ෂයක්වත් හිටියේ නැහැ. බොහොම සුළු පිරිසයි පාසල්වල හිටියේ. සුපිරි පන්තියේ ළමයි තමයි හෙරොයින් පාවිච්චි කළේ. අද වනකොට මතුගම, කළුතර, කොළඹ ඇතුළු සියලු පළාත්වල අන්ත දුප්පත්, සමෘද්ධිලාභී පවුල්වල ළමයි තමයි මේවා පාවිච්චි කරන්නේ. මත් ද්‍රව්‍ය භාවිත කරන වැඩිහිටියන් සියලුදෙනා

පුනරුත්ථාපනය කරලා, තද නීති රීති පද්ධතියකට යටත් කරන්න ඕනෑ. අර කිව්වා වාගේ කන්දකාඩුව වාගේ ආයතන හමුදාව යටතට හෝ පත් කරලා, එහෙම නැත්නම් එවැනි පාසල් පද්ධතියක් ඇති කරලා ඒ අය පුනරුත්ථාපනය කරන එක අත්‍යවශ්‍යයි. යම් කෙනෙකුට ඇප මත ගෙදරට යන්න දුන්නොත්, අනිවාර්යයෙන්ම ඔහු නැවත නැවතත් ඒවාට ගොදුරු වෙමින් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවාගේ ගොදුරක් බවට පත් වෙනවා.

විශේෂයෙන්ම මත්ද්‍රව්‍ය ප්‍රශ්නයේදී පුනරුත්ථාපන ක්‍රමය කියන එක අනිවාර්යය අවශ්‍යතාවක්. ඒ අවශ්‍යතාව මේ අණපනත්වලින් ඉෂ්ට වුණේ නැත්නම්, අයිස් ඇතුළු අනෙකුත් මත්ද්‍රව්‍ය ගැන මේ පනත් කෙටුම්පතට ඇතුළත් කළාය කියලා වැඩක් වෙන්නේ නැහැ. මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ගේ ප්‍රමාණය වැඩි වෙනවා. මත්ද්‍රව්‍ය භාවිත කරන පිරිස වැඩිවීම නිසාම මේ සමාජය සම්පූර්ණයෙන්ම මත්ද්‍රව්‍ය ජාවාරමට ගොදුරු වෙනවා දැක දැක නිකම් ඉන්න අපට සිද්ධ වෙනවා. අපි ඡන්දයට මුහුණ දෙන අවස්ථාවේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත් සමඟ කථා කරනකොට අපට කිව්වේ, මත්ද්‍රව්‍ය ජාවාරම සහමුලින්ම නැති කරනවා කියලායි. පොලීසියත් මේ කටයුතුවලට සම්බන්ධයි කියන එක අර කිව්වා වාගේම සත්‍යයක්. ඒ වාගේම දේශපාලනයේ යෙදෙන යම් පිරිස් මේවාට සම්බන්ධයි කියන එක අපට බැහැර කරන්න බැහැ. ඒ නිසා මත්ද්‍රව්‍ය ජාලය සම්පූර්ණයෙන්ම කඩා බිඳ දමා, විනාශ කර, නැති කර දැමීම සඳහා අධිකරණ අමාත්‍යාංශයත්, පොලීසියත්, හමුදාවත් ඒකාබද්ධව කටයුතු කළ යුතුමයි. එහෙම නොවුණොත් ඇමෙරිකාවේ, ඔස්ට්‍රේලියාවේ සාම්ප්‍රදායික ජනතාව මේ නිසා විනාශ වුණා වාගේම, මේ රටේත් ප්‍රධාන ජාතීන් සියලුදෙනා දුර්වල, ශක්තියෙන් තොර, ආබාධවලින් පිරුණු ජාතියක් බවට පත් වේවි. ඒ නිසා නීති පද්ධතිය ඉතාම ශක්තිමත් කරලා, පුනරුත්ථාපන කටයුතු ශක්තිමත් කරලා, මේ අයට ඇප ලබාදීම සම්පූර්ණයෙන්ම නතර කරලා, දරුවන් පුනරුත්ථාපනය කරලා සමාජගත කරන්න කියලා අපේ අමාත්‍යාංශය විධියට අපි විශේෂයෙන්ම අවධාරණය කරනවා. එහෙම කළොත් තමයි සමෘද්ධිමත් ජාතියක් ගොඩ නඟන්න අපට පුළුවන් වෙන්නේ.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු උදයන කිරිඳිගොඩ මැතිතුමා. ඔබතුමාට මිනිත්තු පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.45]

**ගරු උදයන කිරිඳිගොඩ මහතා**
(மாண்புமிகு உதயன கிரிந்திகொட)
(The Hon. Udayana Kirindigoda)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මට හිතෙන විධියට අපට කථා කරන්න තිබෙන කාලය මදි. ඒ කෙසේ වුවත්, අධිකරණ ක්ෂේත්‍රයට අද ඉතාම වැදගත් දවසක්. පනත් කෙටුම්පත් කිහිපයක් යාවත්කාලීන කරමින් අලුත් දැක්මත් ඇතිව වැඩ කරන අවස්ථාවක, හැම දේම අලුත් විය යුතු අවස්ථාවක තමයි අපි ඉන්නේ. පරණ සිතුම් පැතුම් සියල්ලම පැත්තක තියලා අලුත් විධියට හිතුවේ නැත්නම් අපට ඉස්සරහට යන්න විධියක් නැහැ.

මම පසුගිය සතියේ මහනුවර අධිකරණය ආශ්‍රිතව කටයුතු කරනකොට, දිසා අධිකරණයේ එදිනට නියමිත සමහර නඩුවලට ඊළඟ නඩු විභාග දිනය විධියට ලැබුණේ ලබන අවුරුද්දේ ජූනි මාසයටත් පසු දිනයක්.

අධිකරණ අමාත්‍යාංශයත්, අධිකරණ අමාත්‍යවරයාත් නඩු ප්‍රමාදය වැළැක්වීම සඳහා අවශ්‍ය කටයුතු කරනවා. ඒ සියල්ල කළත්, ක්‍රියාත්මක වන යාන්ත්‍රණය තුළ, ඒ අවශ්‍යතාව, දැක්ම නැත්නම් ඉදිරියට යන්න හැකියාවක් නැහැ.

ගරු අධිකරණ ඇමතිතුමා කථා කරනකොට කිව්වා, අධිකරණවල පරිපාලනය විනිශ්චයකාරවරුන්ට ලබා දීම නිසා අධිකරණවල නඩු ප්‍රමාදයට හේතුවක් තිබෙනවා කියලා. අපි නීතිඥවරු විධියට ඒක පෞද්ගලිකව අත්දැකලා තිබෙනවා. ඇත්තටම විදේශ රටවල් එක්ක සංසන්දනාත්මකව බලනකොට, අධිකරණ ක්ෂේත්‍රය ගැන තිබෙන අත්දැකීම් එක්ක බලනකොට අපි ඉන්නේ ගොඩක් පසුගාමීව කියලායි මම හිතන්නේ. අපේ ක්‍රම, සම්ප්‍රදායයන් සියල්ල බැහැර කරලා අධිකරණ පරිපාලනය වෙනම කණ්ඩායමකට භාර දුන්නා නම්, විනිශ්චයකාරවරුන්ට පුළුවන් නඩු කටයුතු ඉක්මන් කරලා ජනතාවට අවශ්‍ය නෛතික සහන ලබා දීම සඳහා වන ක්‍රියාමාර්ග බොහොම ඉක්මනින් ක්‍රියාත්මක කරන්නටත්, ඒ තුළින් ජනතාවගේ අසහනය නැති කරන්නටත් කටයුතු කරන්න.

නීතිය සම්බන්ධ වැදගත් කරුණු සමාජය තුළ සාකච්ඡා වන අවස්ථාවක තමයි අපි මේ සිටින්නේ. තිළිණි ප්‍රියමාලිගේ කථාව, ඕස්ට්‍රේලියාවට ගිය ක්‍රිකට් ක්‍රීඩකයාගේ කථාව සම්බන්ධයෙන් මාධ්‍ය හැසිරෙන ආකාරය දිහා බලන්න. විදේශ මාධ්‍ය හැසිරෙන ආකාරයයි, ලංකාවේ මාධ්‍ය හැසිරෙන ආකාරයයි දිහා බැලුවොත්, විශේෂයෙන් පරස්පර විරෝධී තත්ත්වයක් දකින්න පුළුවන්. අද යම් කිසි කෙනෙකුට චෝදනාවක් ලැබෙනකොට, සමාජ මාධ්‍ය හරහා ඒ තැනැත්තා වැරැදිකරුවෙක් කරලා අවසානයි. ඇත්තටම මාධ්‍ය තිබෙන්නට ඕනෑ නීතිය ක්‍රියාත්මක කරන්න නොවෙයි, නීතිය රකින්න, නීතියට ආරක්ෂාව දෙන්න, නීතියට අවශ්‍ය සහාය ලබා දෙන්න කටයුතු කරන්නයි. අපරාධ සිදු වුණු සමහර ස්ථානවලට පොලීසියට කලින් යන්නේ මාධ්‍ය. මාධ්‍යයට සමාජය දැනුවත් කිරීමේ වගකීම තිබෙනවා. ඒ වාගේම අපරාධයක් සිදු වුණු ස්ථානය ආරක්ෂා කිරීමේ වැදගත්කමත් මාධ්‍ය අවබෝධ කර ගත යුතුයි. එහෙම නැතිව අධිකරණ අමාත්‍යවරයාට, අධිකරණ අමාත්‍යාංශයට, මේ රටේ අධිකරණ ක්ෂේත්‍රයට චෝදනා කරමින් ඉඳලා හරියන්නේ නැහැ. නඩු ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා කටයුතු කරන්න අපි හැමෝටම සමාජමය වගකීමක් තිබෙනවා.

අපි හැම දාම උසාවියේ තිබෙන නඩුවලට පෙනී සිට සහන ලබා ගැනීම සඳහා ක්‍රියාත්මක වෙන යාන්ත්‍රණය ඒ විධියට ක්‍රියාත්මක කරනවාද, එහෙම නැත්නම් වෙනත් රටවල් වාගේ විකල්ප ක්‍රම මාර්ගයෙන් නඩු කටයුතු අවම කර ගැනීම සඳහා ක්‍රියා කරනවාද කියලා හිතන්නට ඕනෑ. නඩුවක පාර්ශ්ව අතර සමථයක් ඇති කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නවාද කියන එක ගැන අපි අවධානය යොමු කළ යුතුයි. සමථකරණය, බේරුම්කරණය යන සියල්ල වැඩි වර්ධනය කරමින් මේ රටේ ජනතාවට අවශ්‍ය නෛතික සහනය ඉක්මනින් ලබා දීම සඳහා වන ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීමට අපි අවධානය යොමු කරන්නට ඕනෑ, ගරු අධිකරණ අමාත්‍යතුමනි.

නඩු ප්‍රමාදය ගැන හැම දාම බැණුම් අහන කොටසක් තමයි නීතිඥවරු කියන්නේ. නීතිඥවරුන් හිතා මතා නඩු ප්‍රමාද කරනවාය කියන චෝදනාව ගොඩක් වෙලාවට එනවා. හැබැයි, සමහර අධිකරණවල නඩු වාර්තාවක් බලන්න නීතිඥවරුන්ට සති තුනක් බලාගෙන ඉන්න වෙනවා කියලා මම දන්නවා. මේ ක්‍රම වෙනස් කරන්නට ඕනෑ. මොකද, ජනතාවගේ අවශ්‍යතා මතු වෙන්නේ අපට කියලා නෙවෙයි. ක්ෂණිකව ඇති වන ජනතා

[ගරු උදයන කිරිඳිගොඩ මහතා]

අවශ්‍යතාවලට සහන ලබා දීමට නම් ඒ අධිකරණ කටයුතු, අධිකරණ ක්‍රියාමාර්ග සියල්ල ඉක්මන් කිරීම සඳහා වන යාන්ත්‍රණයක් තිබෙන්නට ඕනෑ. ඒ නිසා නීතිඥවරුන්, අධිකරණ කාර්ය මණ්ඩල, විනිශ්චයකාරවරුන් යන සියලුදෙනා අතර අතීතයේ පැවතියා වැනි හොඳ සම්බන්ධතාවක් ඇති වුණොත්, මේ කටයුතු ඉතාම සාර්ථකව කරගෙන යන්න හැකියාව තිබෙනවා. අපි සම්ප්‍රදාය තුළ හිරවෙමින්, එදා සිට ආපු ක්‍රමය තවදුරටත් ක්‍රියාත්මක කරමින් යන්නේ නැතිව අලුත් විධියට හිතලා කටයුතු කළොත්, නඩු ප්‍රමාදය වළක්වා ජනතාවට සහන ලබා දීම සඳහා වන ක්‍රියාමාර්ගය ජයග්‍රහණය කිරීමේ හැකියාව තිබෙනවා. එහෙම නැතිව මොන අධිකරණ පිහිටෙව්වත් වැඩක් වෙන්නේ නැහැ.

දැන් අලුතින් සුළු හිමිකම් අධිකරණය කියලා අධිකරණයක් පිහිටුවනවා. ජනතාවගේ මුදල් ප්‍රශ්න මේ සුළු හිමිකම් අධිකරණයට ගිහින් ඉක්මනින් විසඳා ගැනීමට ක්‍රියාමාර්ග ගන්න පුළුවන්. හැබැයි, ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනතේ හැටහය වගන්තිය යටතේ මාසයකින්, දෙකකින් විසඳන්න ඕනෑ ප්‍රශ්න අවුරුදු දෙක, තුනක් ඇදගෙන ගිය අධිකරණ මේ රටේ තිබුණා. නීතිමය කටයුතු ඉක්මන් කිරීමේ අවශ්‍යතාව පිළිබඳ නීතිඥ ප්‍රජාව හා අධිකරණ කාර්ය මණ්ඩලය දිගටම දැනුවත් කිරීම හරිම වැදගත් වෙනවා. මේ සියල්ල එකට සමායෝජනය වුණොත් විතරයි, අවසානයේ රටේ ජනතාවට සහනයක් ලැබෙන්නේ.

අලුත් කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරලා හැකි ඉක්මනින් මේ රටේ නීතිය නවීකරණයට ලක් කරලා, මේ කටයුතු ඩිජිටල්කරණය කිරීම පුළුවන් ඉක්මනින් කරලා ජනතාවට සහ නීතියට අදාළව කටයුතු කරන සියලුදෙනාට සහන ලබා දෙන්න කියා ඉල්ලනවා. අවසාන වශයෙන්, ගරු විජයදාස රාජපක්ෂ අධිකරණ ඇමතිතුමාට ස්තුතිවන්ත වෙමින් මා නවතිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කේ. කාදර් මස්තාන් මැතිතුමා. ඔබතුමාට මිනිත්තු අටක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු මධුර විතානගේ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு மதுர விதானகே அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. MADHURA WITHANAGE *left the Chair and* HON. DEPUTY SPEAKER *took the Chair.*

[பி.ப. 4.50]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා (ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கா. காதர் மஸ்தான் - கிராமியப் பொருளாதார இராஜாங்க அமைச்சர்)
(The Hon. K. Kader Masthan - State Minister of Rural Economy)

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று கௌரவ நீதி அமைச்சர் அவர்களால் கொண்டுவரப்பட்டிருக்கின்ற சிறைச்சாலைகள் கட்டளைச் சட்டத்தின்கீழான விதிகள் காலத்துக்குத் தேவையானதும் பொருத்தமானதுமாகும். அந்த அடிப்படையில், உண்மையிலேயே இது பாராட்டத்தக்கது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எமது பகுதியைச் சார்ந்த அரசியல் கைதிகளுடைய விடுதலையானது, மிக விரைவாகவும் கட்டங்கட்டமாகவும் நடந்துவருகிறது. அதற்காக நான் முதலில் மாண்புமிகு சனாதிபதி அவர்களுக்கும் கௌரவ நீதி அமைச்சர் விஜயதாஸ ராஜபக்ஷ அவர்களுக்கும் இந்த இடத்தில் நன்றியைத் தெரிவித்துக்கொள்கிறேன். இன்னும் ஒருசில அரசியல் கைதிகள் விடுதலை செய்யப் படாமல் இருக்கிறார்கள். அவர்களுடைய நிலைமையையும் கருத்திலெடுத்து, அவர்களையும் விரைவாக விடுதலை செய்தால், அவர்களுடைய பெற்றோர் மற்றும் குடும்பத்தினர் மிகவும் சந்தோசமடைவதோடு, அவர்களுடைய வாழ்க்கை நிலைமை எதிர்காலத்தில் மாறக்கூடிய வாய்ப்பும் இருக்கிறது. ஆகையால், அவர்களுடைய விடுதலையை விரைவுபடுத்துமாறு நான் அன்பாகக் கேட்டுக்கொள்கிறேன்.

நான் கடந்த முறை சொன்னதுபோல, எமது நாடு ஒரு தீவாக இருக்கின்றபடியால் அதாவது, எமது நாட்டைச் சுற்றிக் கடல் இருக்கின்றபடியால், போதைவஸ்தானது உலகின் பல இடங்களிலிருந்தும் பல்வேறு வழிகளில் எமது நாட்டுக்குள் வருவதற்கு வாய்ப்பு இருக்கிறது. குறிப்பாக, வட மாகாணத்துக்கு இந்தியாவிலிருந்து போதைவஸ்து வருவதற்கு வாய்ப்புகள் கூடுதலாக இருக்கின்றன. அந்தப் பகுதியில் திடீரென வசதி படைத்தவர்கள் உருவாகிறார்கள். அது எவ்வாறு என்பதை நாங்கள் தேடிப் பார்க்க வேண்டும். ஏன் அரசாங்கத்தால் போதைவஸ்து கடத்தலைக் கட்டுப்படுத்த முடியவில்லை? என்பதுதான் இன்று மக்கள் மத்தியில் இருக்கின்ற பாரிய கேள்வியாகும். இதனைக் கட்டுப்படுத்துவதற்காகப் பாதுகாப்புத் தரப்பினர் பாரிய முயற்சிகளை எடுத்துவருகின்றபோதிலும், கடத்தலில் ஈடுபடுகின்றவர்கள் நவீன முறைகளைக் கையாள்கிறார்கள். கடல்மார்க்கமாக போதைவஸ்தைக் கொண்டுவரும்போது, எமது கடற்படையினரை அவர்கள் கண்டுவிட்டால், அந்த இடத்திலேயே அவர்கள் கொண்டுவரும் பொருட்களைக் கடலில் தள்ளிவிட்டு, GPS mark பண்ணிவிடுவார்கள். பின்னர் அந்தப் பொருட்களை எடுத்துக்கொள்வார்கள். இவ்வாறான செயற்பாடுகளை முறியடிக்கக்கூடிய விதத்தில் நாங்களும் நவீன முறைகளைக் கையாள வேண்டும். இவ்வாறு போதைவஸ்துக் கடத்தலில் ஈடுபடுபவர்களைக் கைதுசெய்யும் வரை போதைவஸ்து கடத்தலைத் தடுப்பதென்பது மிகவும் சிரமமான காரிய மாகத்தான் இருக்கும்.

எமது intelligence officers மிகவும் திறமையானவர்கள் என நான் நினைக்கிறேன். குற்றச்செயல்களுடன் தொடர்புடைய பலரை அவர்கள் கண்டுபிடித்திருக்கிறார்கள். எனினும், அவர்களால் போதைவஸ்து கடத்தலை கட்டுப்படுத்த முடியவில்லையே என்பது கேள்விக்குறியாகும். அவர்களும் ஏனைய பாதுகாப்புத் தரப்பினரும் அந்தப் பிரதேசத்திலுள்ள civil societyயினரும் இணைந்து செயற்பட்டு, விரைவாக போதைவஸ்து கடத்தலைக் கட்டுப்படுத்த வேண்டும். யார் போதைவஸ்து கடத்தில் ஈடுபடுகிறார்கள் என்பது அங்குள்ள மீனவச் சங்கங்களில் உள்ளவர்களுக்கும் மீனவர்களுக்கும் தெரியும்! அங்குள்ள கிராம மக்களுக்கும் தெரியும் என்றே நான் நினைக்கிறேன். இதன் ஆரம்பப் புள்ளியைச் சரியாகக் கண்டு பிடித்தால்தான், எமது இளைஞர், யுவதிகளை போதைவஸ்துப் பாவனையிலிருந்து பாதுகாக்கக்கூடியதாக இருக்கும்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, ஹெரோயின் போதைப்பொருளுக்கு அடிமையான நிலையில் மன்னார், வவுனியா, முல்லைத்தீவு போதனா வைத்தியசாலைகளில் சிகிச்சை பெறுவோரின் எண்ணிக்கை மாதாந்தம் அதிகரித்துக் கொண்டே செல்கிறது. அப்பிரதேசங்களுக்கு ஏதோவொரு

வழியில் போதைவஸ்து வருகிறது. அதை நிறுத்துவதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டும். பாடசாலை மாணவர்கள் தொடக்கம் இளம் வயதினர் ஆரம்பத்தில் சிறியளவிலே ஹெரோயின் போதைப்பொருளை எடுத்துக்கொள்கிறார்கள். அவர்கள் சிறைச்சாலைக்குச் சென்று, வெளியே வரும்போது அதற்கு அடிமையான நிலையில்தான் வருகிறார்கள். அது மாத்திரமல்ல, அவர்கள் பல குற்றச்செயல்களைச் செய்யக் கூடியவர்களாகவும் மாறி விடுகிறார்கள். சிறைச்சாலைகளில் இவ்வாறான நிலைமை ஏற்படுவதற்குக் காரணம் என்ன என்பதைக் கண்டறிந்து, எதிர்காலத்தில் அதனைத் தடுக்கும் விதத்தில் அங்குள்ள அதிகாரிகளுக்கு உரிய பயிற்சிகளை வழங்கவேண்டுமெனக் கேட்டுக்கொள்கிறேன்.

அடுத்து, எமது பகுதியில் காணி சம்பந்தமான பல பிரச்சினைகள் இருக்கின்றன. MC landஐ எடுத்துக் கொண்டால், அக்காணிகளுக்குரிய சொந்தக்காரர்கள் பலர் இன்று வெளிநாடுகளில் இருப்பதால், அவை வெறுமையாகக் கிடக்கின்றன. அவற்றைப் பயன்பாட்டுக்கு உட்படுத்துவது தொடர்பில் பிரதேச செயலாளர்களுடன் பேசினால், அதற்கென சரியான சட்ட ஏற்பாடுகள் இல்லை என்கிறார்கள். ஆகையால், கௌரவ அமைச்சர் அவர்கள் வெகுவிரைவில் அது தொடர்பான சட்டங்களைக் கொண்டுவந்து, MC landஆக இருக்கின்ற காணிகளை மக்களுக்குப் பகிர்ந்தளிக்கக்கூடிய வேலைத்திட்டத்தை முன்னெடுக்க வேண்டுமென்று கேட்டுக்கொள்கிறேன்.

இன்றைய விவாத விடயத்திற்குப் புறம்பான ஒரு விடயத்தையும் நான் இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்பு கிறேன். அதாவது, பல்கலைக்கழகங்களுக்கான மாணவர் அனுமதியின்போது, குறித்த 3 வருட காலப் பகுதிக்குள் இணைப்பாடவிதான செயற்பாடுகளில் தேசிய மட்டத்தில் 1ஆம், 2ஆம் மற்றும் 3ஆம் இடங்களைப் பெற்றுச் சாதனை படைத்த மாணவர்களுக்கென ஒவ்வொரு கற்கைநெறியிலும் உத்தேச அனுமதியின்போது 0.5 சதவீதமான இடங்கள் ஒதுக்கப்படுகின்றன. உதாரணத்துக்கு, All Island Tamil Dayஇல் 1ஆம், 2ஆம் மற்றும் 3ஆம் இடங்களைப் பெற்ற மாணவர்களுக்கும் இது பொருந்தும்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! සභාවේ කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කිරීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கா. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
எனினும், 2021ஆம் ஆண்டுக்கான உயர் தரப் பரீட்சை 2022ஆம் ஆண்டில் நடைபெற்றதால், இணைப்பாடவிதானச் செயற்பாடுகளில் பெற்ற சான்றிதழ்கள் குறித்த 3 வருட காலப் பகுதிக்குள் உள்ளடங்காமையால், நாடுபூராவும் பல மாணவர்கள் பாதிக்கப்பட்டிருக்கிறார்கள். இதனைக் கருத்தி லெடுத்து, எதிர்வருகின்ற காலங்களில் அவ்வாறு சான்றிதழ் களைப் பெற்ற மாணவர்கள் குறித்த வகுதியின்கீழ் பல்கலைக் கழகத்துக்கு அனுமதிக்கப்படுவதற்குரிய நடவடிக்கைகளை எடுக்குமாறு நான் உரிய தரப்பினரை இந்த இடத்தில் கேட்டுக்கொள்கிறேன்.

அடுத்து, மன்னார், முல்லைத்தீவு மாவட்டங்களிலுள்ள மீனவர்கள் மண்ணெண்ணெய் இல்லாமல் பாரிய பாதிப்புக் குள்ளாகி இருக்கிறார்கள். கடந்த காலங்களில் அங்குள்ள கடற்றொழில்சார் திணைக்களத்தினால் கூறப்பட்டிருந்தது, மீனவர்களுக்கு ஒரு கிழமைக்கு குறைந்தது -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கா. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
தயவுசெய்து, ஒரு நிமிடம் தருமாறு கேட்டுக்கொள்கிறேன்.
மீனவர்களுக்கு வழங்கப்படுகின்ற மண்ணெண்ணெயின் அளவு போதுமானதாக இல்லை. ஒரு கிழமைக்கு boat ஒன்றுக்கு 28 லீற்றர் மண்ணெண்ணெய்தான் வழங்கப் படுகிறது. அதன் காரணமாக, ஒரு கிழமையில் 4 முறை கடலுக்குச் சென்று மீன்பிடிக்கின்ற அவர்களால் ஒரு முறை தான் செல்லக்கூடியதாக இருக்கிறது. இவர்களுக்கு வழங்கப் படுகின்ற மண்ணெண்ணெயின் அளவு கடற்றொழில் அமைச் சினாலே தீர்மானிக்கப்படுகிறது. ஆகையால், அதன் அளவை அதிகரித்துக் கொடுப்பதற்குரிய ஏற்பாடுகளை கௌரவ அமைச்சர் அவர்கள் விரைவாகச் செய்துகொடுக்குமாறு கேட்டுக்கொள்கிறேன்.

அடுத்து, கடலட்டைக்குரிய export licence, diving licence என்பவற்றை விரைவாக வழங்க வேண்டுமென்று கேட்டுக் கொள்கிறேன். ஏனென்றால், இது நாட்டுக்கு வருமானத்தை ஈட்டித்தரக்கூடிய துறையாக இருக்கிறது. அவற்றுக்காக விண்ணப்பிக்கின்றவர்கள், "நாங்கள் நாட்டுக்கு டொலரைக் கொண்டுவருவதால், அனுமதியின் அளவை அதிகரித்துத் தாருங்கள்" என்று கேட்கிறார்கள். அதையும் கௌரவ அமைச்சர் அவர்கள் கவனத்திலெடுத்து, உரிய நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டு, உரையை நிறைவு செய்கிறேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු එම්.ඒ. සුමන්තිරන් මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 6ක කාලයක් තිබෙනවා.

[5.00 p.m.]

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Thank you, Hon. Deputy Speaker, for the time given to speak on these very important Amendments that have been presented today.

I wish to flag just two issues. One is with regard to an Amendment in the Poisons, Opium and Dangerous Drugs (Amendment) Bill. There is a concern that now, the bail application has to be made to the Court of Appeal instead of the High Court. That is a very serious issue. This is not a question of making bail stringent. You are moving the - *[Interruption.]* Yes, but whatever it is, it is a question of access to justice. I am saying that because the Court of Appeal sits only in Colombo, whereas now, with the Provincial High Courts, you can go to your provincial capital - in lots of instances, High Courts sit in more than one city or town in that province - and make an application.

[ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා]

This is very important. This is not a question of being lenient towards possession of dangerous drugs, but about anybody, who is accused of this offence, being able to go to court. Access to justice must not be denied. We know of instances where, in framing people, various mishaps take place. So, they must be able to approach court and that must never be made difficult. It is only after the Thirteenth Amendment to the Constitution that the first appeal, even on a district court matter, can be made to a court in the province. Before that, even if the district judge made a small mistake in the course of the proceedings, they had to come to Colombo and make an application. So, with devolution - we talk about Executive powers and the Legislative powers - with regard to the Judiciary, a salutary feature came in with people having access to justice in that way, at least, in the first appeal. So, I appeal to the Hon. Minister of Justice not to remove the jurisdiction to grant bail in this way, concentrating it to one central place in the whole country because that is denial of justice to people and also it is against devolution.

The second matter that I want to flag is with regard to the proposed Rules under the Prisons Ordinance. They are totally out of order. Several rights that the prisoners have enjoyed for more than 100 years are being taken away and another novel concept is sought to be brought in. If there is a concept that is against incarceration of people, then I would support it because I think incarceration dehumanizes people. There can be exceptions to violent criminals et cetera, but ordinarily, as a punishment, to incarcerate people, I think, is very regressive and that whole thing must be changed. But here, there is no change in that; punishment is still said to be incarceration. But, there are categories of prisoners. What are the categories? Categories are, those who can afford to pay. You are creating paying wards. I heard the Hon. Dilan Perera also saying this. We cannot escape wondering whether some in the government ranks are preparing places for them in the prison. They know that they are going to spend a lot of time in prison. So, they are creating luxurious apartments in prisons already so that when they go there, they can live in comfort. It looks like that. So, this goes against the fundamental principle that when you mete out punishment, all citizens, particularly, the citizens who are under the care and control of the State, must be treated equally. Of course, the conditions in the prisons are bad, but the answer is not to alleviate those hardships for the few who can part with some money. That is wrong; that is fundamentally wrong and no country should ever do that. Therefore, I bring it to the notice of the Hon. Minister that those Ordinances which create these differences in class of prisoners must be abolished.

Thank you.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමන්ලා වරින් වර ඇවිල්ලා එකම ප්‍රශ්නය මතු කරනවා. ඒවාට උත්තර දීලා හෙම්බත් වෙලා ඉන්නේ. පස්වන වතාවට නැත්නම් හයවන වතාවටයි මං මේ පැහැදිලි කිරීම කරන්නේ. 1934 ඉඳලා අපේ Prisons Regulations තිබෙනවා. ඒකේ categories දෙකක් තිබෙනවා, civil prisonersලා සහ criminal prisonersලා කියලා. ඒ විධියට සල්ලි දීලා cells ඉල්ලුවොත්, ඒ දෙගොල්ලන්ටම අපි දෙන්න ඕනෑ. අපි මේ පනත් කෙටුම්පතෙන් criminal prisonersලා කියන අයට එහෙම දෙන්න තියෙන අයිතිය අහෝසි කරලා තිබෙන්නේ. හැබැයි, civil prisonersලා කියන අය අපරාධකාරයෝ නොවෙයි. අනෙකුත් පාර්ශ්වයක් විසින් සල්ලි ගෙවලා තමයි ඔවුන් හිරේට එවන්නේ. ඉතින් ඒ උදවිය අපරාධකාරයෝ නොවන නිසා ඒ ගොල්ලන්ගේ අයිතිය අහිමි කරන එක සුදුසු නැහැ. හැබැයි, ප්‍රායෝගිකව ගත්තාම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සිවිල් නඩු විධාන සංග්‍රහයේ මේ ප්‍රතිපාදන තිබුණාට, අද වෙනකොට එකම civil prisoner කෙනෙක්වත් බන්ධනාගාරයක නැහැ. සිවිල් නඩු විධාන සංග්‍රහයේ මේ ප්‍රතිපාදන තිබෙනතුරු අපට මේ රෙගුලාසිත් ඊට අදාළව පවත්වාගෙන යන්න සිද්ධ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු සාරතී දුෂ්මන්ත මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.07]

**ගරු සාරතී දුෂ්මන්ත මහතා**
(மாண்புமிகு சாரதீ துஷ்மந்த)
(The Hon. Sarathi Dushmantha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද පනත් කෙටුම්පත් 9ක්, රීති සහ නියෝග කිහිපයක් පාර්ලිමේන්තුව හමුවට ගෙනැවිත් තිබෙනවා. මා හිතන හැටියට අධිකරණ අමාත්‍යාංශයට හැම දාම තිබුණු ප්‍රශ්නයක් තමයි නඩු කටයුතුවලදී සිදුවන ප්‍රමාදය. ඒ ගැන පසුගිය කාල වකවානුවලදී නොයෙකුත් තීන්දු තීරණ අරගෙන තිබෙනවා. අද සුළු හිමිකම් අධිකරණයක් නීතිගත කරනවා. අපි ප්‍රායෝගිකව දන්නවා, දිසා අධිකරණවල මේ වෙනකොට නඩු කටයුතු ලක්ෂ දෙකකට වැඩි ප්‍රමාණයක් තිබෙන බව. ඉඩම් නඩුවක් බේරුම් කර ගන්න ගියාම -මෙතැන ඉන්න ඕනෑ කෙනෙක් ඒක දන්නවා- සමහර තීන්දු එන්නේ අවුරුදු 60, 70කට පස්සේ කියන එක. විශේෂයෙන්ම, ක්‍රෙඩිට් කාඩ් එකක් පිළිබඳ වංචාවක් තිබෙනවා නම්, ඒකත් දිසා අධිකරණයට යොමු කිරීම ගැටලුවක්. අපට පවතින සීමිත වපසරිය ඇතුළත - විනිශ්චයකාරතුමන්ලා වාගේම අධිකරණ සංකීර්ණවල තත්ත්වයත් එක්ක- ගළපා බලනකොට මේ බොහෝ නඩු කටයුතු ගරු ඇමතිතුමාගේ අලුත් සුළු හිමිකම් අධිකරණ හරහා අවසාන කර ගන්නට අපට පුළුවන්කම ලැබෙනවා. ඒක හොඳ තීන්දුවක්.

අද ඉදිරිපත් කර තිබෙන මේ පනත් සංශෝධන, රීති සහ නියෝග පිළිබඳව අපට වැරැද්දක් කියන්න දෙයක් නැහැ. හැබැයි, මම විශ්වාස කරනවා, අපේ සුමන්තිරන් මන්ත්‍රීතුමා කියපු ආකාරයට අධිකරණ ඇමතිතුමනි, අධිකරණ ක්ෂේත්‍රයට පිවිසීම සඳහා අවශ්‍ය වට පිටාව අපි හැම දෙනාටම තිබෙන්න ඕනෑ බව. විශේෂයෙන්ම Court of Appeal එකෙන් ඇප ලබාදීම සම්බන්ධයෙන් අන්තරායදායක ඖෂධ ග්‍රෑම් 10ක ප්‍රමාණයක් වන විධියට තමයි අද මේ සංශෝධනය ඇවිල්ලා තිබෙන්නේ. ඒ පිළිබඳව කථා කරනකොට, යුක්තිය සාධාරණය ලබා ගැනීම සඳහා වන ඒ ප්‍රවේශය අපි සියලුදෙනාටම තිබිය යුතුයි. මම හිතනවා මේ නිසා සමහර වෙලාවට ප්‍රායෝගික මට්ටමින් ගැටලු ඇතිවීමට ඉඩකඩක් තිබෙනවා කියලා. ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියන කාරණාව විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

අද ඉදිරිපත් කරන පනත් කෙටුම්පත් ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. විශේෂයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා ඔබතුමා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය වාගේම විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන එනකොට ලොකු වැඩ කොටසක් කළා. ඒ පිළිබඳ අපේ විශ්වාසයක්, ගෞරවයක් ඔබතුමා කෙරෙහි පැහැදිලිවම තිබෙනවා, අනෙක් ආණ්ඩු පක්ෂයේ ඉන්න ඇමතිවරුන්ට වඩා. අපට මේ සුළු සුළු වෙනස්කම් වුණත් වැදගත් තමයි. නමුත්, ඊට එහාට ගිය ලොකු චිත්‍රයක් අපි හමුවේ තිබෙනවා. ඒ චිත්‍රය තමයි, අද අපේ රට මේ තත්ත්වයට පත් වෙන්න හේතු කාරණා වෙලා තිබෙන සමහර තීන්දු තීරණ. ඒ වාගේම තමයි කෝප් කමිටුව. ඔබතුමා නිසා තමයි කෝප් කමිටුව පිළිබඳ අපිත් බොහොම සුළුවෙන් හෝ දැනගෙන ඒ කෙරෙහි පොඩි උද්‍යෝගයක් ඇති වුණේ. මේ කමිටුවට කරන පත් කිරීම් සම්බන්ධවත් ජනතාව බලාගෙන ඉන්නවා. අද ලොකු වංචා, දූෂණ ගැන කථා කරනවා. සුදු ලූනු වංචාව ගැන කථා කරනවා. සීනි වංචාව ගැන කථා කරනවා. නමුත්, ජනතාවගේ විශ්වාසය ගොඩ නඟන්නට පුළුවන් ආකාරයට ආණ්ඩුව ක්‍රියා කරලා තිබෙනවා ද කියන කාරණාව මම දන්නේ නැහැ. ඒ පිළිබඳව අපටත් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු අධිකරණ අමාත්‍යතුමනි, ආර්ථික වශයෙන් සිදු වුණු ලොකු අපරාධ ටිකක් තිබෙනවා. මේ අපරාධ සම්බන්ධයෙන් ඔබතුමා හෝ කමක් නැහැ මූලිකත්වය අරගෙන කටයුතු කරන්න ඕනෑ. මොකද, ඔබතුමාගේ ඉතිහාසය දිහා බැලුවාම, ආණ්ඩු පක්ෂයේ ඉන්න අනෙක් ඇමතිවරුන්ට වඩා විශ්වාස කරන්න පුළුවන් ඉතිහාසයක් ඔබතුමාට තිබෙන නිසා, ඔබතුමා හෝ නායකත්වය අරගෙන මේ වැරදි වළක්වන්න කටයුතු කරන්නට පුළුවන්කමක් තිබෙනවා නම්, ජනතාවට නැවත වතාවක් රට ගැන ලොකු විශ්වාසයක් ඇති වෙයි. එහෙම නැතිව අපි කොච්චර මෙවැනි සංශෝධන ගෙනාවත්, ඒවා පිළිබඳ ජනතාව එතරම් තැකීමක් කරන්නේ නැහැ. මොකද, යම් යම් පුද්ගලයන්ගේ අනුවණ තීන්දු නිසා අපේ රටේ බරපතළ අපරාධ සිද්ධ වෙලා තිබෙනවා. මේ නිසා අද වන විට අපේ රටේ මිනිසුන්ට ඒවාට මුහුණ දෙමින් ජීවිතය ගත කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ පිළිබඳ මම ඊට එහා කථා කරන්නේ නැහැ.

ගරු අමාත්‍යතුමනි, බන්ධනාගාර ක්ෂේත්‍රය ගත්තාම, අද වන විට බන්ධනාගාරයේ 25,000ක් පමණ රැඳවුම්කරුවන් ඉන්නවා. 11,000කට තමයි ඉන්න පුළුවන්. ඒ නිසා බන්ධනාගාරයේ රැඳවියන් වාගේම, නිලධාරිනුත් බරපතළ ප්‍රශ්නයකට තමයි මුහුණ දීලා ඉන්නේ. හැම වරදකටම පුද්ගලයන් බන්ධනාගාරගත කරන්න පුළුවන්කමක් නැහැ. සමහර වෙලාවට ඒ අයට ඇප දෙන්න සිද්ධ වෙනවා. ඒ කාලයේ නම් විනිශ්චයකාරතුමන්ලා බන්ධනාගාරයේ සංචාරයක් කරලා බලලා තමයි ඒ කටයුතු ඒ ආකාරයට සිද්ධ කළේ. අද බොහොම කනගාටුදායක තත්ත්වයක් තමයි බන්ධනාගාරවල තිබෙන්නේ. ඒ නිසා ඒ කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන්න. සමහර වෙලාවට බන්ධනාගාරයෙන් දුරකථනයක් හම්බ වුණාම අපි ඒක ලොකු දෙයක් විධියට කථා කරනවා නේ. හැබැයි, දරුවා අසනීප වුණාම සිරකරුවෙකුට ගෙදරට දුරකථන ඇමතුමක් ගන්න විධියක් නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු සාරතී දුෂ්මන්ත මහතා**
(மாண்புமிகு சாரதீ துஷ்மந்த)
(The Hon. Sarathi Dushmantha)
මම අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

රැඳවුම්කරුවන් දෙතුන්දාහක් ඉන්න බන්ධනාගාරවල තත්ත්වය ඒකයි. ඒ නිසා ඒවායේ තත්ත්වය වැඩිදියුණු කිරීම අනිවාර්යයෙන්ම කළ යුතුයි. මොකද, අපි බලනවාට වඩා වෙනස් තත්ත්වයක් තමයි ඒ බන්ධනාගාර ඇතුළේ තිබෙන්නේ.

මට නියමිත කාලය අවසන් නිසා මීට වඩා මම කථා කරන්නේ නැහැ. කියමනක් තිබෙනවා, "Justice delayed is justice denied" කියලා. මම කලින් කිව්ව ආර්ථික කරුණු සම්බන්ධයෙන් සලකා බලා, ඒ අපරාධ කරපු අයටත් දඬුවමක් දෙන්න මූලිකත්වය අරගෙන කටයුතු කරන්න ඕනෑ කියලා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න මම කැමතියි. ඒ සඳහා ඔබතුමාට සම්පූර්ණ හැකියාව හා ශක්තිය තිබෙනවා කියලා මම විශ්වාස කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
විනාඩි 5ක්වත් නැද්ද? කාලය දීර්ඝ කළ නිසා මට විනාඩි 5ක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එතරම් කාලයක් දෙන්න විධියක් නැහැ.

[අ.භා. 5.13]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ පැවැත්ම සඳහා ඉතාම වැදගත් සාධකය වෙන්නේ මේ රටේ නීතියයි. අපි විශ්වාස කරනවා, ගරු අධිකරණ ඇමතිතුමා ඒ පිළිබඳ යම් උත්සාහයක යෙදෙන්න හදනවා කියලා. හැබැයි, එතුමාගේ හෘදය සාක්ෂියට අනුව ද මේ නීති පද්ධතිය නිවැරදි කරන්න යන්නේ කියන කාරණය පිළිබඳ මට ප්‍රශ්නයක් තිබෙනවා. ගරු අධිකරණ ඇමතිතුමනි, ඔබතුමා පිළිබඳ මටත් ලොකු ගෞරවයක් තිබෙනවා. හැබැයි, මේ හදන්නේ රටින් එළවා දමපු, රට නොපිළිගත්ත නායකයෙක් නැවත මේ රටේ නායකයා බවට පත් කිරීම සඳහා වූ වැඩ පිළිවෙළක් ද කියන කාරණය පිළිබඳ මගේ සැකයක් තිබෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, මත් ද්‍රව්‍ය මඩින්න නම් "බඩු" නැති වෙන්න ඕනෑ. "බඩු" නැති වුණොත් නඩු නැහැ. හැබැයි, "බඩු" එන්නේ කොහෙන්ද? මේ දූපත් රාජ්‍යයට "බඩු" එන්නේ විදෙස් රටවලින්. ඒක නවත්වන්න පුළුවන් නිලධාරින්ට -ඒ කණ්ඩායමට- අවශ්‍ය ශක්තිය නොදී මේ මත් ද්‍රව්‍ය නිට්ටාවට නවත්වන්න බැහැයි කියන එක තමයි මගේ මතය.

හැබැයි, මත් ද්‍රව්‍ය පාවිච්චිය නිසා මේ රටේ දැවැන්ත පිරිසක් පීඩනයට ලක් වෙලා ඉන්නවා. ඒ පීඩනයට ලක් වුණු ජනතාවගේ පීඩනය නැති කරනවාය කියන මතය අද පාර්ලිමේන්තුව තුළ සම්මත කර ගැනීම හරහා ඔබතුමා නියෝජනය කරන පාලනයේ දක්ෂතාව අනාගතයට හොඳයි කියන අදහස නිර්මාණය කරන්න යනවා නම්, ඔබතුමා ඒ පිළිබඳව දෙසැරයක් හිතන්න, ගරු

[ගරු චමින්ද විජේසිරි මහතා]

විජයදාස රාජපක්ෂ මැතිතුමනි. ඔබතුමාගේ දැනුම, නීතිය භාවිත කරලා මේ රට විනාශ කරපු නායකයෝ නැවත ගොඩගන්න කඩේ යන්න එපා කියන යෝජනාව මම ඔබතුමාට කරනවා. ඒක තමයි දැන් කරන්න යන්නේ. Police Narcotics Bureau එකේ ප්‍රධාන නිලධාරින් - DIGsලා - අහු වුණා මත් කුඩු, පිටිවලට මාරු කරලා. අද ඒ වෙනුවෙන් පහළ නිලධාරින් හිරේ ඉන්නවා. අද ඒ Police Narcotics Bureau එකේ හිටපු උසස් නිලධාරින්ට උසස්වීම් දීලා තිබෙනවා; Senior DIGsලා කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ රටේ ඇතැම් නිලධාරින් දැවැන්ත මත් ද්‍රව්‍ය ජාවාරම්කාරයන්ට ඍජුව සම්බන්ධ වෙලා ඉන්නවා. ඔවුන් තමයි අද කුඩු ප්‍රවාහනය කරන්නේ. මහ මුහුදේ දී කුඩු ටික අල්ලනවා; ගොඩට ගේනවා; අධිකරණයට ගෙන යනවා; අධිකරණයෙන් ඒවා සීල් තබනවා; ඒවා පිටි බවට පත් වෙනවා; ඒවා අදාළ වෙළෙන්දෝ අතට පත් වෙනවා. නඩු නැති වෙන්න නම් "බඩු" නැති කරන්න. මේවාට වැට බඳින්න, මේවාට සම්බන්ධ වන නිලධාරින් නැති කරන්න. අන්න, එදාට මේ රටේ මත් ද්‍රව්‍ය ජාවාරම් නිසා දුක් විඳින ජනතාව බේරාගන්න පුළුවන් වෙයි. එහෙම නැතිව නීති හදනවා, නීති ක්‍රියාත්මක කරනවා කියලා කොතෙක් පෙන්නුවත් වැඩක් නැහැ ගරු ඇමතිතුමනි. එයින් එක් ඡන්දයකට, මනාපයකට වටිනාකම ලැබුණාට ඇත්තටම ඒ අම්මාට, තාත්තාට ඒ මත් ද්‍රව්‍යවලින් දුක් විඳින සමාජය ගොඩගන්න බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. බොරු නඩු පටලවා සමහර නිලධාරින් දේශපාලන වශයෙන් තනතුරු ගන්න, උසස්වීම් ගන්න කටයුතු කරන බව ඉදිරියේදී අපි ඔප්පු කරලා පෙන්වන්නම්. මටත් තිබෙනවා එවැනි කාරණයක් ඉදිරිපත් කරන්න. නීතිපති දෙපාර්තමේන්තුව විසින් මාස හතරකට පසු යම් නඩුවකට අදාළව උපදෙස් එවලා තිබෙනවා, ඒ නඩුව අවසන් කරන්න. සාමාන්‍යයෙන් නීතිපති දෙපාර්තමේන්තුවට තමයි හැමෝම චෝදනා කරන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නමුත් නීතිපති දෙපාර්තමේන්තුව මාස හතරකින් ඒ නීති වැඩ පිළිවෙළ හදලා එවලා තිබෙනවා, එක්තරා නඩුවකට අදාළව. ඒක දේශපාලනයට මැදිහත් වූ පුද්ගලයෙකුගේ නඩුවක්. ඒ නිසා අපි කියනවා, මෙවැනි දේවල් නවත්වන්න කියලා. නීතිය හරහා කරන අත පෙවීම් නවත්වන්න පුළුවන් නම්, මත් ද්‍රව්‍ය ජාවාරම පමණක් නොවෙයි, මුළු රටම නිවැරදි මාවතකට ගන්න පුළුවන්. ඒ හයිය, ශක්තිය ඇමතිතුමා තුළින් නිර්මාණය වේවි කියන විශ්වාසය තබා ගනිමින්, මට කථා කරන්න විනාඩි දෙකක් ලබා දුන්නාට නියෝජ්‍ය මහ ලේකම්තුමියටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට විනාඩි හතරක් ලබා දුන්නා.

මීළඟට, ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විනාඩි 14ක් තිබෙනවා මට.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒවා ඔක්කොම කපලා, විනාඩි නවයක් තිබුණා. දැන් ඒ විනාඩි නවයෙනුත් අඩුවෙලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
කාලය දීර්ඝ කරගත් නිසා මම ටිකක් වෙලාව ගන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
විනාඩි නවයකින් අවසන් කරන්න.

[අ.භා. 5.17]

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සුළු හිමිකම් අධිකරණ කාර්ය පටිපාටිය පනත් කෙටුම්පත, පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත, අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත, සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත කියන මේ පනත් කෙටුම්පත් හතර ම එකට බැඳී තිබෙන සංශෝධන පනත් කෙටුම්පත් හතරක්. සුළු හිමිකම් අධිකරණය පිහිටුවීම සහ ඒ කාර්යය හරහා ඇති වන නීතියේ වෙනස් කිරීම් සඳහා අදාළ ඒ පනත් හතරම මේ අවස්ථාවේ සංශෝධනය වෙනවා. සමහර අවස්ථාවලදී සිවිල් නඩුවල තිබෙන කාර්යය පටිපාටිය සහ තිබෙන නඩු ප්‍රමාණය වැඩිවීම නිසා විශාල වශයෙන් නඩු කල් ගිහින් තිබෙනවා. ඒ තත්ත්වය මැඩලන්න, විසඳන්න අද අලුත් අධිකරණයක් හඳුන්වා දීම නිසා අධිකරණවල තිබෙන තදබදය, අවහිරතාව අඩු කරන්න පුළුවන් තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රුපියල් ලක්ෂ 10ට අඩු සිවිල් නඩුකර සම්බන්ධයෙන් අද බොහෝ දුරට සිද්ධ වන දෙයක් තිබෙනවා. එහිදී මුදල් වංචා කරන අයට යම් පිටුවහලක් ලැබිලා තිබෙනවා. මොකද, ඒ අය දන්නවා සිවිල් නඩුකරයක් පවරන්න ගියාම බොහෝ කාලයක් සහ මුදලක් වැය වන බව. මේ සියලු වැයවීම් නිසා අගතියට පත් පාර්ශ්වය දෙවතාවක් අගතියට පත් වෙනවා. මොකද, එක් අතකින් ඔවුන්ට මේ පිළිබඳ ගන්න පුළුවන් ක්‍රියා මාර්ගයක් නැහැ. අනික් අතින්, ඒ අයට මේ මුදල අහිමි වෙලා ඒක අමතක කර දමන තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ නිසා අද ගෙනැවිත් තිබෙන සුළු හිමිකම් අධිකරණ කාර්ය පටිපාටිය පනත් කෙටුම්පත මඟින් මේ රටේ ජනතාවට සුවිශේෂී අවස්ථාවක් උදා වෙනවා. යම් ආකාරයකින් පාඩුවක්, හානියක් වෙන කටයුත්තකදී ඒ සම්බන්ධයෙන් ක්ෂණිකව, කාර්යක්ෂමව නඩුකරයක් පවරලා ඒ හානිය පූරණය කර ගැනීමේ හැකියාව අද ජනතාවට ලබා දී තිබෙනවා. මම විශ්වාස කරනවා මෙවැනි වෙනස් කිරීම් පාර්ලිමේන්තුව හරහා සිදුවන එක හොඳයි කියලා. විශේෂයෙන්ම පාර්ලිමේන්තුව හෑල්ලුවට ලක් වෙලා තිබෙන, චෝදනාවට ලක් වෙලා තිබෙන අවස්ථාවක මෙය ඉතා හොඳ ආදර්ශයක් පෙන්නුම් කරනවා. මේවා තමයි පාර්ලිමේන්තුව තුළින් දිගින් දිගටම සිදුවිය යුත්තේ. අද පනත් රාශියක් සංශෝධනය වෙනවා. මට තිබෙන ප්‍රශ්නය තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොන මාධ්‍ය ආයතනය ද මේ පනත් නවය සංශෝධනය වෙනවා කියලා ප්‍රචාරය කළේ? ස්ත්‍රී දූෂණ නඩුවක් හෝ වංචාවක් සම්බන්ධයෙන් විනාඩි පහ, දහය කථා කරනවා. හැබැයි, පාර්ලිමේන්තුව තුළදී රටට වැදගත් වන නීති, අණ පනත් වෙනස්වීම් සම්බන්ධයෙන් කවුද කථා කරන්නේ? ඒ නිසා මම හිතනවා නරක දිගින් දිගටම ඉස්මතු වෙලා හොඳ යට යන තත්ත්වයක් තමයි තිබෙන්නේ කියලා. ඒ නිසා මේ පිළිබඳව ජනමාධ්‍ය හරහාත් යම් ආකාරයක සාධනීය තත්ත්වයක් නිර්මාණය විය යුතුයි කියලා මා විශ්වාස කරනවා.

අද ගෙනැවිත් තිබෙන වැදගත් පනත් කෙටුම්පතක් තමයි ළමයින් සහ තරුණ තැනැත්තන් (සංශෝධන) පනත් කෙටුම්පත. එය ඉතා සුවිශේෂ කාරණයක්. මොකද, "ළමයා" කියන කාරණය සම්බන්ධයෙන් අණ පනත් ගණනාවක විවිධ අවස්ථාවල නොයෙකුත් අර්ථකථන දකිනවා, වයස අවුරුදු 14ක ළමයා, අවුරුදු 16ක ළමයා, අවුරුදු 18ට අඩු ළමයා, අවුරුදු 25ට අඩු වියපත් ළමයා ලෙස. හැබැයි මේ සියල්ලම පසෙකලා අවුරුදු 18ට අඩු තැනැත්තා "ළමයෙක්" කියා හඳුන්වා දෙන තත්ත්වයට අද මේ පනත සංශෝධනය වෙලා තිබෙනවා.

මේවා දීර්ඝ කාලයක් තිස්සේ සංශෝධනය නොවුණු පනත්. ඒ නිසා මේ පනත් සංශෝධනය කිරීම සුවිශේෂී දෙයක් කියා මා විශ්වාස කරනවා. මොකද, දරුවන් කියන්නේ මේ ලෝකයේ අනාගතය භාර ගන්න ඉන්න අය. ඒ අය තමයි අනාගතය තීරණ ගන්නේ; රටේ දිශානතිය තීරණය කරන්නේ. එම නිසා ඒ සම්බන්ධ නිවැරදි නිර්වචනයක් ලබා දීම ඉතාම උචිත දෙයක්.

අද අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පතත් සම්මත කරන්න ඉදිරිපත් කර තිබෙනවා. යම් කෙනෙක් මරණීය දණ්ඩනය ලැබිය යුතු වරදක් කර තිබෙනවා නම්, ඒ පුද්ගලයා අවුරුදු 18ට අඩු කෙනෙකු නම්, ඒ අයට මරණ දණ්ඩනය ලබා නොදීම විය යුත්තක් බව පැහැදිලිවම මේ සංශෝධන තුළ ඇතුළත් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කවුරුත් පිළිගන්නා සත්‍යය තමයි අවුරුදු 18ට අඩු කෙනා දරුවෙක්; ළමයෙක් කියන එක.

අද උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පතත් සම්මත කරන්න ඉදිරිපත් කර තිබෙනවා. එය විය යුතු සංශෝධනයක්. පෙර තිබුණු ක්‍රමයට අනුව දෙමව්පියන්ගේ අවසරය ඇතුව අවුරුදු 18ට අඩු අයට විවාහයට ඇතුළත්වීමේ හැකියාව තිබුණා. නමුත් අපි කවුරුත් දන්නවා, අවුරුදු 18ක් වූ දරුවෙක් විවාහ වුණත්, සමහර වෙලාවට ඒ අය ගන්නා යම් යම් තීන්දු තීරණ වුණත් වරදින බව. අධිකරණයේ තවමත් කටයුතු කරන නීතිඥයකු හැටියට මම ඒ ගැන දන්නවා. බොහොම ඉක්මනට විවාහ වූ අය, ඉවසීමක් නැතුව ඉක්මනට විවාහ වූ අය, විවාහය ඇතුළේත් ඉවසීමක් නැතුව විවාහය අවසන් කරන්න අපි ළඟට එන අවස්ථා තිබෙනවා. ඇතැම් අය ඉතාම ඉක්මනින් ප්‍රේමවන්තයෝ වෙනවා; ඉවසීමක් නැතුව විවාහ වෙනවා. ප්‍රේමවන්තයෝ වෙලා විවාහ වුණාට පසුව විවාහකයෝ හැටියට ඉවසීමක් නැතුව ඉතාම ඉක්මනින් දික්කසාදයට යනවා. අද උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පතත් සංශෝධනය වෙනකොට, ඒ කියන නීතිය වෙනස් වෙනකොට, ඒ අවුරුදු 18 කියන නිර්ණායකය එහෙම පිටින්ම වෙනස් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට තුනෙන් දෙකක බලයක් ලැබුණේ එක රටක එක නීතියක් ඇති කරන්නයි. හැබැයි, අවාසනාවකට, අපේ බලය අපට තේරුණේ නැති නිසා අපට එක රටක් - එක නීතියක් කියන සංකල්පය ගෙනෙන්න බැරි වෙනවා. විශේෂයෙන්ම තේසවලමෙයි නීතිය, මුස්ලිම් නීතිය, උඩරට නීතිය කියන මේ සියලු නීති අයින් කරලා පොදු නීතියකට මේ රට ගෙනෙන්න ඕනෑය කියන සංකල්පය තුළ ඉඳිමින් තමයි මිනිස්සු අපට ඡන්දය දුන්නේ. හැබැයි, අපට ඒක කරගන්න බැරි වුණා. මීට පෙර අවස්ථාවල ගරු පූජ්‍ය අතුරලියේ රතන හාමුදුරුවෝත් මුස්ලිම් නීතිය තුළ වයස අවුරුදු 18ට අඩු දරුවන් විවාහයට පත් කිරීම සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවේ කරුණු මතු කළා. විවාහ වීම සඳහා දරුවෙකුගේ අවම වයස් සීමාව ලෙස අවුරුදු 18 ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහත්මයාත් පාර්ලිමේන්තුවට කරුණු ඉදිරිපත් කළා. හැබැයි, බොහොම අවාසනාවන්ත ලෙස ඒ කරුණු සියල්ලම අද යට ගිහිල්ලා තිබෙන බව මට විශ්වාසයි. මම කනගාටුවෙන් වුණත් කියනවා, අලි සබ්රි මහත්මයා අධිකරණ ඇමති වෙලා සිටියදී එතුමා ඒවා අවශ්‍ය නොවන සංශෝධන හැටියට දක්වා තිබෙන බව. නමුත් මම හිතන විධියට මේවා වෙනස් වෙන්න ඕනෑ. අද ෂරී-ආ නීතිය තිබෙන සවුදි අරාබියේත් අවුරුදු 18ට අඩු දරුවෝ විවාහ කරන්නේ නැහැ. අවුරුදු 18ක් වුණාම තමයි ඒ අයට විවාහ වෙන්න අයිතිවාසිකම ලබා දීලා තිබෙන්නේ. ඒ නිසා මා කාරුණිකව සඳහන් කරනවා, මුස්ලිම් ජන සමාජය තුළ පවතින මෙවැනි අගතිදායක, අන්තගාමී නීතිත් වෙනස් විය යුතුයි කියලා. මේ අය කවුද? මේ අය අහිංසක දැරියෝ. අවුරුදු 13, 14, 15, 16, 17 වයස්වල දැරියෝ මොනවාද දන්නේ? එහෙම අයටත් විවාහ වෙන්න පුළුවන් විධියට මේ රටේ නීතිය තිබෙනවා.

ගරු අධිකරණ ඇමතිතුමනි, මම ඔබතුමාගේ අවධානය තවත් කාරණයකට යොමු කරනවා. දණ්ඩ නීති සංග්‍රහයට අනුව ගත්තාම එවැනි තැනැත්තෙකු සමඟ ලිංගික සම්බන්ධකම් පැවැත්වුවොත් එය අපරාධ වරදක්. හැබැයි, අද අපේ රටේ නීතිය තුළ ඒ නීතිය වෙනස් වෙලා තිබෙනවා. මම අද ජනාධිපතිතුමා එක්කත් සාකච්ඡා කළා. ඒ නිසා මේ තත්ත්වය අනිවාර්යයෙන්ම නැති කරලා විවාහය සම්බන්ධයෙන් පොදු නීතියක් ගෙනෙන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරියන්ගෙන් මම ඉල්ලා සිටිනවා, කරුණාකර මේ තත්ත්වය ගැන කථා කරන්න කියලා. අද මේ අහිංසක මුස්ලිම් කාන්තාවන්ට සිදු වෙලා තිබෙන හානිය ගැන කථා කරන්න. ඒ අයට යන්න තිබෙන්නේ කාති උසාවියට. කාති උසාවියක කාතිවරයකු හැටියට කාන්තාවක් නැහැ. කාතිවරයෙකුට තිබෙන සුදුසුකම මොකක්ද? මහේස්ත්‍රාත්වරුන්ට වාගේ, විනිශ්චයකාරවරුන්ට වාගේ ඔවුන්ට සුදුසුකමක් තිබෙනවාද? ඒ නිසා ගරු අධිකරණ ඇමතිතුමනි, මම හිතන විධියට ඒ ගැන අවධානය යොමු කළ යුතුයි. මොකද, අපි එක පැත්තකින් ළමයින් ගැන කථා කරනවා, ළමයින්ගේ අයිතිවාසිකම් ගැන කථා කරනවා. තව පැත්තකින් අපි සම්පූර්ණයෙන්ම ආගම, බෙදීම ගැන කථා කරනවා. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවා, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය මත වෙනස්කමකට ලක් කරන්න බැහැ කියලා. හැබැයි, ආගම කියන කාරණය නීතියත් එක්ක තිබෙන සබැඳියාවක් නිසා විශේෂයෙන්ම මුස්ලිම් කාන්තාවන් විශාල වශයෙන් පරිහානියට පත් වෙලා තිබෙනවා; අගතිදායක තත්ත්වයකට පත් වෙලා තිබෙනවාය කියන එක පැහැදිලිව කියන්න ඕනෑ.

ඒ එක්කම, අද අපි කථා කරන ඉතාම වැදගත් මාතෘකාව තමයි විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පතට ගෙන ආ සංශෝධනය. ගරු අධිකරණ ඇමතිතුමනි, අභියාචනාධිකරණය තුළ වැඩ වැඩිවීමක් නිර්මාණය වෙයිද, කියලා ගරු සුමන්තිරන් මැතිතුමා ඉදිරිපත් කළ කාරණයට මමත් එතුමා සමඟ එකඟ වෙනවා. හැබැයි, අපට මේ සියලු දේවල් ආවරණය වෙන්න නීති පනවන්න බැහැ. ඔබතුමා බොහොම සද්භාවයෙන් මේ කටයුතු කරන්නේ. මොකද, මේ තිබෙන ව්‍යසනය අවසන් කිරීමට යම් ආකාරයකින් නීති තද කරන්න ඕනෑ. මත් කුඩු ග්‍රෑම් 10ක් ළඟ තබා ගත් කෙනාට මරණ දණ්ඩනය ගෙනෙන කොට, ග්‍රෑම් දෙකේ සිට දහය දක්වා ළඟ තබා ගත් පුද්ගලයාට ඇප දීමේ බලය මහාධිකරණයට තිබෙනවා. හැබැයි, එතැනින් එහාට -ග්‍රෑම් දහයෙන් උඩ- ඇප දීමේ බලය තමයි අභියාචනාධිකරණයට යන්නේ. හැබැයි, මේ රටේ අභියාචනාධිකරණ එකයි තිබෙන්නේ. මේ තත්ත්වය තුළ යම් ආකාරයක ප්‍රශ්නයක් ඇති වෙනවා, නඩු ගොඩ ගැහෙනවා කියන එක අපට තේරුණොත්, එතැනදී තමයි ව්‍යවස්ථාදායකයේ කාර්යය තිබෙන්නේ.

ඒ හැසිරීම් එක්ක මේ දේවල් වෙනස් වෙන්න ඕනෑ. අද අපි මේ පනත් කෙටුම්පත ගේනවා. යම් ආකාරයේ ගැටලුසහගත තත්ත්වයක් ඇතිවෙලා නඩු ගොඩ ගැහුණොත්, යම් ප්‍රශ්නයක්

[ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා]

ඇති වුණොත්, ඒ කියන ආකාරයේ ප්‍රශ්නගත තත්ත්වයක් ඇති වුණොත් අපට පුළුවන් ව්‍යවස්ථාදායකයට තවත් පනත් කෙටුම්පතක් ගෙනැල්ලා ඒක සංශෝධනය කරන්න. ඒ නිසා මම මේ වෙලාවේ කියන්නේ, මේ කරන සියලු හොඳ සම්බන්ධයෙන් කථා කරලා, මේ පනත් කෙටුම්පතට ඔබතුමා ගෙනෙන සංශෝධන සම්බන්ධයෙන් එකී විවේචන එසේම තියා ගනිමින්, මේක සම්මත කර ගනිමු කියලායි. හැබැයි, යම් ගැටලුවක් තිබෙනවා නම් අපි ඉතාම කඩිනමින් ඒක වෙනස් කර ගන්න ඕනෑ කියන කාරණයත් මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

අපේ සහෝදර මන්ත්‍රීවරු මේ විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත ගැන කථා කරද්දී කියා සිටියා, සමහර අවස්ථාවලදී හෙරොයින් පිටි බවට පත් වෙනවා කියලා. ඉතින් ඒ කියන ප්‍රශ්නවලට විසඳුම් තමයි මේ දෙන්නේ. අදාළ සියලුදෙනා ඉදිරියේ මේ භාණ්ඩ විනාශ කරන්න ඕනෑ. මේ පනත් කෙටුම්පතින් ඒ සංශෝධන ගේනවා. ඒ එක්කම නව මත් ද්‍රව්‍ය අනාවරණ වුණොත්, සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමා මාර්ගයෙන් නිර්දේශ කරලා ඒවා මත් ද්‍රව්‍ය බවට නම් කිරීමේ හැකියාව මේ සංශෝධනය තුළ තිබෙනවා. මේ අලුතින් ගෙනාපු පනත් ගණනාව සම්බන්ධයෙන් අපි ඉතාම සාධනීය ලෙස බලන බවත් මතක් කරනවා.

අවසාන වශයෙන් අපි දකින යම් සාධනීය දෙයක් පිළිබඳවත් මම කියන්න ඕනෑ. අද උද්ඝෝෂණ කරන, අරගළ කරන මිනිස්සු ඉදිරියට ඇවිල්ලා, මැද්දට පැනලා සාමාන්‍ය රැකියා කරන මිනිස්සු කියනවා, "කරුණාකරලා උද්ඝෝෂණ, අරගළ කරන්න එපා, අපේ රට තිබෙන තැනින් උඩට ගෙනියන්න අපට එකතු වෙලා වැඩ කරන්න තිබෙනවා" කියලා. මම දැක්කා, ඊයේ ගාලු මුවදොර පිට්ටනියේදී අරගළකරුවන් පිරිසක් ඔවුන්ගේ උද්ඝෝෂණ අයිතිය කියලා නැවත වතාවක් රට ආපස්සට ගෙනියන්න උත්සාහ කරන වෙලාවක, කොළඹ ප්‍රදේශයේ අරක්කැමිවරු, -chefs- ඇවිල්ලා කියනවා, කරුණාකරලා මේ කටයුත්ත කරන්න එපා කියලා. ඒ නිසා මම මේ අදාළ තරුණ තරුණියන්ගෙන් ඉල්ලීමක් කරනවා, ඔබේ ශක්තිය තියා ගන්න මැතිවරණයකට ඉදිරිපත් වෙලා ඒකට තරග කරන්න, නමුත් මේ මොහොතේ, මේ season එකේ සංචාරකයන් අපේ රටට එන අවස්ථාවේදී කරුණාකරලා ඒ දේවල් කඩාකප්පල් කරන්න එපාය කියලා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අමාත්‍යතුමා කථා කරන්න.

[අ.භා. 5.28]

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හිතනවා අද අපේ මේ පාර්ලිමේන්තු ඉතිහාසයේ ඉතා වැදගත් දවසක් කියලා. අද අපි මේ විවාදය තුළ පනත් කෙටුම්පත් 9ක්, ඒ වාගේම රෙගුලාසි 2ක් ඇතුළු කරුණු 14ක් විවාදයට ගත්තා. මේ විවාදය තුළදී පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව මේ පනත්වලට අදාළ කරුණු කාරණා බොහොමයක තිබෙන හොඳ පැත්ත මෙන්ම යම් අඩු පාඩු තිබෙනවා නම් ඒවාත් පෙන්වා දෙන්නට ගරු මන්ත්‍රීවරු, ඇමතිවරු කටයුතු කළා. ඒ සියලුදෙනාටම මගේ ස්තුතිය පුද කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහරු මේ පනත් කෙටුම්පත්වල තිබෙන ප්‍රතිපාදන සම්බන්ධයෙන් අනියත බිය පළ කරන ආකාරයේ ප්‍රකාශ බොහොමයක් කළා. දැන් සමහර අයට භයක් තිබෙනවා කිව්වා, මත් ද්‍රව්‍ය සම්බන්ධ වරදකරුවෙකුට ඇප ගන්න අභියාචනාධිකරණයට යන්න සිද්ධ වුණොත්, අධිකරණයට ප්‍රවේශවීමට අපට තිබෙන අයිතිය අහිමි වෙනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පිරිසිදු - pure - මත් ද්‍රව්‍ය ග්‍රෑම් 10ක් කියන්නේ, සාමාන්‍යයෙන් අපේ වෙළෙඳ පොළෙන් විශාල මත් කුඩු ප්‍රමාණයක් අහු වෙන්නට ඕනෑ. පිරිසිදු ග්‍රෑම් 10ක ප්‍රමාණයක් සොයා ගන්න නම්, ග්‍රෑම් 60ක, 70ක, 80ක මත් කුඩු ප්‍රමාණයක් අහු වෙන්න ඕනෑ. එතකොට තමයි ඒ ග්‍රෑම් 10ක ගණයට වැටෙන්නේ. ඒ ග්‍රෑම් 10ට අඩු නම් මහාධිකරණයට ඒ බලතල දීලා තිබෙනවා ඇප ලබා දෙන්න. නිකම්ම නිකම් අයිතිවාසිකම් ආරක්ෂා කරන්න කියලා අධිකරණයෙන් ඇප දෙන්න බැහැ. ඇප දීමට තරම් සුදුසු, සුවිශේෂී කරුණු තිබෙනවා නම් විතරයි මහාධිකරණයටත් බලය තිබෙන්නේ, ඇප ලබා දෙන්න. අභියාචනාධිකරණ තිබෙන්නේ ලංකාවටම එකයි. හැබැයි, අභියාචනාධිකරණයට යන්න වෙන්නේ ග්‍රෑම් 10කට වඩා වැඩි ප්‍රමාණයක් සම්බන්ධ චෝදනාවකට. මත් කුඩු ග්‍රෑම් 10ක් ලැබෙන්නේ අඩුම ගණනේ ග්‍රෑම් 60ක්, 70ක් වත් අහුවුණ අවස්ථාවක. මත් කුඩු ග්‍රෑම් 60ක්, 70ක් තියාගෙන ඉන්නේ නැහැ, ඒවාට ඇබ්බැහි වෙච්ච මනුස්සයෙක්; තරුණයෙක්. අනිවාර්යයෙන්ම එවැනි මත්කුඩු ප්‍රමාණයක් සන්තකයේ තියාගෙන ඉන්නවා නම්, එක්කෝ ඔහු මහා පරිමාණයේ ව්‍යාපාරිකයෙක්, නැත්නම් මත් ද්‍රව්‍ය විකුණන තැනැත්තෙක්, නැත්නම් බෙදා හරින තැනැත්තෙක්. ඒ වාගේ උදවිය කෙරෙහි අනුකම්පාව වැඩි වශයෙන් දක්වලා කථා කරපු සමහර ගරු මන්ත්‍රීතුමන්ලා ගැනත්, මේ පිළිබඳව කරුණු දක්වපු සමහර නීතිඥ මහත්වරු ගැනත් මට ලොකු කනගාටුවක් තිබෙනවා. සමහර අය කියනවා, "මහා පරිමාණ කුඩුකාරයාගේ අයිතිවාසිකම් වෙනුවෙන් අධිකරණයට යෑමට තිබෙන ප්‍රවේශය අපි ආරක්ෂා කරන්න ඕනෑ. ඒක තමයි මානව අයිතිවාසිකම" කියලා. හැබැයි, එහෙම කියන අයට පොඩ්ඩක්වත් හැඟීමක් නැහැ, මේ ව්‍යාපාරිකයෝ මුදල් ඉපැයීම සඳහා කරන මේ තුච්ඡ, ම්ලේච්ඡ ව්‍යාපාරය තුළින් මේ වෙනකොටත් අපේ රටේ තරුණ පරම්පරාව ලක්ෂ 5ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් මතට ගොදුරු වෙලා තිබෙනවා කියලා.

මෙහි තිබෙන අමාරුකම තේරෙන්න නම්, අර වාගේ උදවිය ගැන කරුණාවෙන් කථා කරපු කෙනෙකුගේ දරුවෙකුත් මතට ඇබ්බැහි වූවෙක් වෙන්නට ඕනෑ. එතකොට තමයි මේකේ වේදනාව තේරෙන්නේ. මේකේ ගැඹුර, මේකේ පරතරය දැන ගන්න ඒ ගොල්ලන්ට අවස්ථාවක් ලැබෙන්නේ, තමන්ගේ පවුලේ සාමාජිකයෙක්, තමන්ගේ දරුවෙක් කුඩුකාරයෙක් වෙච්ච දවසට. එහෙම වුණොත් අපට ඇවිල්ලා කියයි, ඇප දෙන්නම එපා කියලා. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මෙය ආවාට ගියාට කරපු දෙයක් නොවෙයි. විශේෂඥ වෛද්‍යවරු, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, Police Narcotics Bureau එකේ නිලධාරීන්, අධිකරණ අමාත්‍යාංශයේ නිලධාරීන්, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සියලුදෙනා එකට එකතු වෙලා බොහොම හොඳ විද්‍යාත්මක අධ්‍යයනයක් මේ පිළිබඳව කළා. දීර්ඝ කාලයක් තිස්සේ කරපු අධ්‍යයනයක ප්‍රතිඵලයක් විධියට තමයි මේ අණ පනත් ටික අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. ඒ නිසා ඒ ආයතනවල සියලුදෙනාට ස්තුති කරන්නත් මා මෙය අවස්ථාවක් කර ගන්නවා. විශේෂයෙන්ම මගේ පූර්වගාමී අධිකරණ අමාත්‍ය ගරු අලි සබ්රි මැතිතුමා, ඒ වාගේම මගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු නිලධාරීන්, නීතිපතිතුමා ඇතුළු එම නිලධාරීන්, නීති කෙටුම්පත් සම්පාදකතුමිය ඇතුළු එම නිලධාරීන් හා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එකතු වෙලා, ලොකු ව්‍යායාමයක් කරලා තමයි මේ තත්ත්වයට මේ අණ පනත් ටික සකස් කරලා ඉදිරිපත් කළේ. ඒ වාගේම අධිකරණවල විනිසුරුතුමන්ලා, ජ්‍යෙෂ්ඨ නීතිඥවරුන් ඒ කමිටුවලට පත් කරලා, ඒ උදවියත් අධ්‍යයනය කළාට පස්සේ තමයි මේ පනත් කෙටුම්පත් ගෙනාවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "අපි නීති හැදුවාට වැඩක් නැහැ, යන්ත්‍රණය තුළ මේවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ, නිලධාරින් මේවා ක්‍රියාත්මක කරන්නේ නැහැ" කියලා සමහර මන්ත්‍රීතුමන්ලා ප්‍රකාශ කළා. මත් ද්‍රව්‍යවලට සම්බන්ධ රාජ්‍ය නිලධාරින් ඉන්නවා. සමහර වෙලාවට පොලිස් නිලධාරින් ඉන්නවා. ඒ නිසා අවශ්‍ය යන්ත්‍රණය තමයි අපි මේ හදලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පාර්ලිමේන්තුවට විධායක බලයක් නැහැ. පාර්ලිමේන්තුවට තිබෙන්නේ, ප්‍රතිපත්ති සහ නීති සකස් කිරීම. නීති හදන එක තමයි අපේ වගකීම. ඒ කටයුත්ත තමයි අපි මේ ඉටු කර තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි අපි ඊට එහාට ගිහිල්ලා ඒ යන්ත්‍රණවල තිබෙන විශ්වසනීයභාවය රකින්න, ඒ යන්ත්‍රණවල තිබෙන ස්වාධීනත්වය, දේශපාලනඥයන්ට, ජාවාරම්කාරයන්ට ඒ යන්ත්‍රණවලට ඇඟිලි ගහන්න බැරි විධියට ක්‍රියාත්මක වෙන්න අවශ්‍ය පරිසරය නිර්මාණය කළා. ඒක නිසා තමයි මීට සති දෙකකට කලින් අපි විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කළේ. ඒ අනුව ඇති වන ස්වාධීන කොමිෂන් සභාවලට මේ බලතල ඔක්කෝම තිබෙනවා. කවුරු මොනවා කළත්, මොන ඉල්ලීම්, බලපෑම් කළත් ඒවා නොතකා කටයුතු කරන්න පොලීසියට බලය ලැබෙනවා. ඒකට තමයි ජාතික පොලිස් කොමිෂන් සභාව පිහිටුවන්නේ. මින් ඉදිරියට මේ වාගේ දේවල් සම්බන්ධ යම් වැරදි වෙනවා නම් ඒ ඒ කොමිෂන් සභාවල කොමසාරිස්වරු, නිලධාරින් වග කියන්න ඕනෑ. අධිකරණ සේවා කොමිෂන් සභාව තිබෙනවා, මැතිවරණ කොමිෂන් සභාව තිබෙනවා, ජාතික පොලිස් කොමිෂන් සභාව තිබෙනවා. ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී තමයි ලංකාවේ වැඩිපුරම මහජන මුදල් වංචා හා දූෂණ සිදු වෙන්නේ. ඒවා වළක්වන්න ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අපි හඳුන්වා දීලා තිබෙනවා. ඒ වාගේම රාජ්‍ය අංශයේ සිදු වන වංචා, දූෂණ සොයා ගන්න අපට තිබෙන යන්ත්‍රණය තමයි, විගණන සේවා කොමිෂන් සභාව. ඒ, විගණන සේවා කොමිෂන් සභාව ඇති කළාට පස්සේ ස්වාධීනව ක්‍රියාත්මක වෙන්න ඕනෑ.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව තිබෙනවා. ඒක ගැන මේ රටේ ජනතාව සෑහීමකට පත් වෙන්නේ නැති බව අපි දන්නවා. එම නිසා තමයි අපි දූෂණ විරෝධී පනත් කෙටුම්පත සකස් කළේ. අපි මේ වනකොට එය පක්ෂ නායකයන්ට යවා තිබෙනවා. තව මාසයක් හෝ දෙකක් ඇතුළත එම පනත් කෙටුම්පත සම්මත කර ගත්තාට පස්සේ, දූෂණ චෝදනාවලට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන්න නව පන්නයේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවක් ඇති කරනවා. ඒ සියලු කටයුතු ඉදිරියේදී අපි ක්‍රමානුකූලව ඉටු කරන්නට අවශ්‍ය මූලික පරිසරය මේ වනකොට සකස් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකුමනි, මේ වෙනුවෙන් කටයුතු කරපු සියලුදෙනාටම මගේ ස්තුතිය පුද කරන ගමන්ම, ඔබතුමා සහ මහ ලේකම්තුමා ඇතුළු පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය ලබා දුන් සහයෝගයටත් මාගේ ස්තුතිය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Wijeyadasa Rajapakshe]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[THE HON. DEPUTY SPEAKER in the Chair.]*

***1 සිට 35 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகத்திலிருந்து 35ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 1 to 35 ordered to stand part of the Bill.*

***උපලේඛනය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*அட்டவணை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Schedule ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendment..*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

## අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත
### நீதித்துறை (திருத்தம்) சட்டமூலம்
### JUDICATURE (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]***
*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Wijeyadasa Rajapakshe]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[THE HON. DEPUTY SPEAKER in the Chair.]*

***1 සිට 5 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகத்திலிருந்து 5ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 5 ordered to stand part of the Bill.*

## 6 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම)
### வாசகம் 6.- (முதன்மைச் சட்டவாக்கத்தின் 8ஆம் பிரிவைத் திருத்துதல்)
CLAUSE 6.- *(Amendment of section 8 of the principal enactment)*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"4 වන පිටුවේ, 25 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.
'මහෙස්ත්‍රාත්වරයා හෝ අතිරේක ප්‍රාථමික අධිකරණ' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***6 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*6ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 6, as amended, ordered to stand part of the Bill.*

***7 සහ 8 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*7ஆம், 8ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 7 and 8 ordered to stand part of the Bill.*

## 9 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ V වන පරිච්ඡේදය ප්‍රතියෝජනය කිරීම)
### வாசகம் 9.- (முதன்மைச் சட்டவாக்கத்தின் அத்தியாயம் Vஇனை மாற்றீடு செய்தல்)
CLAUSE 9.- *(Replacement of Chapter V of the principal enactment)*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"9 වන පිටුවේ, 27 වන සහ 28 වන පේළි ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.
'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මඟින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***9 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*9ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 9, as amended, ordered to stand part of the Bill.*

***10 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*10ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 10 ordered to stand part of the Bill.*

## 11 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියට VIIවන අලුත් පරිච්ඡේදය ඇතුළත් කිරීම)
### வாசகம் 11.- (முதன்மைச் சட்டவாக்கத்தில் புதிய அத்தியாயம் VII என்பதை உட்புகுத்துதல்)
CLAUSE 11.- *(Insertion of new Chapter VII in the principal enactment)*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"17 වන පිටුවේ, 29 වන සහ 30 වන පේළි ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'දෝෂයක් මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මඟින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***11 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*11ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 11, as amended, ordered to stand part of the Bill.*

## 12 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම)

வாசகம் 12.- (முதன்மைச் சட்டவாக்கத்தின் 37ஆம் பிரிவை மாற்றீடு செய்தல்)

CLAUSE 12.- *(Replacement of section 37 of the principal enactment)*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "18 වන පිටුවේ, 28 සිට 31 දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළු ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීමේ අයිතිවාසිකම

37.(අ) ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයෙන් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයෙන් ඉදිරිපත් කරන යම් අභියාචනයක් පිළිබඳ අභියාචනාධිකරණයේ යම් නඩු තීන්දුවක් හෝ ආඥාවක් සම්බන්ධයෙන්;

හෝ

(ආ) දිසා අධිකරණවලින්, පවුල් අධිකරණවලින්, සුළු හිමිකම් අධිකරණවලින්, මහෙස්ත්‍රාත් අධිකරණවලින් හෝ ප්‍රාථමික අධිකරණවලින් ඉදිරිපත් කරන යම් අභියාචනයක් පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයේ යම් නඩු තීන්දුවක් හෝ ආඥාවක් සම්බන්ධයෙන්,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ වෙනත් යම් නීතියක විධිවිධානවලට අනුකූලව, ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීමේ අයිතිවාසිකමක් තිබිය යුතු ය.' "

(2) "19 වන පිටුවේ, 1 සිට 5 දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළු ව) ඉවත් කරන්න."

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***12 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*12ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 12, as amended, ordered to stand part of the Bill.*

***13 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*13ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 13 ordered to stand part of the Bill.*

## 14 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම)

வாசகம் 14.- (முதன்மைச் சட்டவாக்கத்தின் 49ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 14.- (*Amendment of section 49 of the principal enactment*)

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"19 වන පිටුවේ, 32 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'කොට්ඨාසයෙහි, ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයේ, දිසා අධිකරණයේ,' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***14 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*14ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 14, as amended, ordered to stand part of the Bill.*

## 15 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම)

வாசகம் 15.- (முதன்மைச் சட்டவாக்கத்தின் 52ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 15.- (*Amendment of section 52 of the principal enactment*)

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"20 වන පිටුවේ, 7 සිට 12 දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

(1) එහි (1) වන උපවගන්තියේ 'මහාධිකරණයට සහ එක් එක් දිසා අධිකරණයට, චූලායචන අධිකරණයට සහ මහෙස්ත්‍රාත් අධිකරණයට' යන වචන වෙනුවට, 'ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයට සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයට සහ එක් එක් දිසා අධිකරණයට, පවුල් අධිකරණයට, සුළු හිමිකම් අධිකරණයට, මහෙස්ත්‍රාත් අධිකරණයට සහ ප්‍රාථමික අධිකරණයට' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (2) වන උපවගන්තියේ 'මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා' යන වචන වෙනුවට 'ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මඟින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***15 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*15ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 15, as amended, ordered to stand part of the Bill.*

## 16 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය සංශෝධනය කිරීම)

### வாசகம் 16.- (முதன்மைச் சட்டவாக்கத்தின் 54ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 16.- (*Amendment of section 54 of the principal enactment*)

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"20 වන පිටුවේ, 16 වන සහ 17 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

' "ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයක, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මඟින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයක, දිසා අධිකරණයක, පවුල් අධිකරණයක හෝ සුළු හිමිකම් අධිකරණයක පවරන ලද යම් නඩුවක දී-" යන වචන' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***16 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*16ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 16, as amended, ordered to stand part of the Bill.*

***17 සිට 21 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*17ஆம் வாசகத்திலிருந்து 21ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 17 to 21 ordered to stand part of the Bill.*

## අලුත් වගන්ති

### புதிய வாசகங்கள்

NEW CLAUSES

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් අලුත් වගන්ති ඉදිරිපත් කරනවා:

"4 වන පිටුවේ, 31 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න.

'ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ 'මහාධිකරණය විසින්' යන වචන වෙනුවට 'ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මඟින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය විසින්' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.'

'ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (අ) ඡේදයෙහි 'මහාධිකරණය විසින්' යන වචන වෙනුවට 'ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මඟින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය විසින්' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (ආ) ඡේදයේ 'මහාධිකරණයේ වෙනත් යම්කිසි ආඥාවක්' යන වචන වෙනුවට 'ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයේ හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මඟින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයේ වෙනත් යම්කිසි ආඥාවක්' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.'

'ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියේ (1) වන උපවගන්තියේ 'මහාධිකරණයේ' යන වචනය වෙනුවට 'ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයේ හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මඟින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයේ' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.' "

"5 වන පිටුවේ, 23 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න.

'ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි (1) වන උපවගන්තියේ 'අභියාචනාධිකරණය' යන වචනය වෙනුවට 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මඟින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (2) වන උපවගන්තියේ පිළිවෙළින් 'අභියාචනාධිකරණයේ අවසරය' සහ 'අභියාචනාධිකරණය වෙත' යන වචන වෙනුවට, 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මඟින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයේ අවසරය' සහ 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මඟින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය වෙත' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.' "

"15 වන පිටුවේ, 15 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න.

'ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම

15.ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියේ 'අභියාචනාධිකරණයට' යන වචනය වෙනුවට 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මඟින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයට'යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.' "

"19 වන පිටුවේ, 5 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න.

'ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) එම වගන්තිය එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන්; සහ

(2) එහි නැවත අංක කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන්:-

'(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මඟින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය හැර, මුල් අවස්ථා අධිකරණයකින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මඟින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයට අභියාචනය කරනු ලැබූ සියලු අවස්ථාවල දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මඟින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය විසින් ඒ අභියාචනයේ දී කරනු ලැබ, ප්‍රකාශ කරනු ලැබූ සියලු නඩු තීන්දු, ආඥා සහ තීන්දු ප්‍රකාශ, එකී මුල් අවස්ථා අධිකරණය විසින් කරන ලද හෝ ප්‍රකාශ කරන ලද නඩු තීන්දුවක්, ආඥාවක් හෝ තීන්දු ප්‍රකාශයක් වූවාක් මෙන් ඒ මුල් අවස්ථා අධිකරණය විසින් පිළිපැද, ක්‍රියාවේ යෙදවිය යුතු ය."

***ඉදිරිපත් කරන ලදින්, පළමුවන වර කියවන ලදී.***
*கொண்டுவரப்பட்டு முதன்முறை மதிப்பிடப்பட்டது.*
*Brought up, and read the First time.*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු සභාපතිතුමනි, "අලුත් වගන්ති දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අලුත් වගන්ති පනත් කෙටුම්පතට එකතු කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

***අලුත් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*புதிய வாசகங்கள் சட்டமூலத்தில் சேர்க்கப்படவேண்டுமென்ற வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*புதிய வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Question, that the New Clauses be added to the Bill, put and agreed to.*

*New Clauses ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*

*Bill reported with Amendments.*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරැදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill, as amended, accordingly read the Third time, and passed.*

## පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත
## மாகாணங்களின் மேல் நீதிமன்றம் (சிறப்பு ஏற்பாடுகள்) (திருத்தம்) சட்டமூலம்
## HIGH COURT OF THE PROVINCES (SPECIAL PROVISIONS) (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Wijeyadasa Rajapakshe]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[THE HON. DEPUTY SPEAKER in the Chair.]*

***1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகத்திலிருந்து 3ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 1 to 3 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendment.*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

## සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත
## குடியியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்
## CIVIL PROCEDURE CODE (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Wijeyadasa Rajapakshe]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[*THE HON. DEPUTY SPEAKER *in the Chair.]*

***1 සහ 2 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம், 2ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 and 2 ordered to stand part of the Bill.*

### 3 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ LXVI වන පරිච්ඡේදය ඉවත් කිරීම)
### வாசகம் 3.- (முதன்மைச் சட்டவாக்கத்தின் அத்தியாயம் LXVIனை நீக்குதல்)
CLAUSE 3.- *(Repeal of Chapter LXVI of the principal enactment)*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"1 වන පිටුවේ, 14 සිට 16 දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

| | |
|---|---|
| ප්‍රධාන ප්‍රඥප්තියේ IXඅ වන කොටස ඉවත් කිරීම | '3. ප්‍රධාන ප්‍රඥප්තියේ IXඅ වන කොටස (801 වන වගන්තියේ සිට 833ජ වගන්තිය දක්වා එම වගන්ති දෙක ද ඇතුළු වගන්ති) මෙයින් ඉවත් කරනු ලැබේ.' " |

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*3ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 3, as amended, ordered to stand part of the Bill.*

***4 සහ 5 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*4ஆம், 5ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 4 and 5 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*

*Bill reported with Amendments.*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙසද ඉල්ලා සිටිමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill, as amended, accordingly read the Third time, and passed.*

## උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත
## கண்டிய திருமண, மணநீக்கம் (திருத்தம்) சட்டமூலம்
## KANDYAN MARRIAGE AND DIVORCE (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***

*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*Order for Second Reading read.*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***

***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*

*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ]*

*Resolved:*

*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Wijeyadasa Rajapakshe]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***

***[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*

*[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*

*[THE HON. DEPUTY SPEAKER in the Chair.]*

***1 සිට 11 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகத்திலிருந்து 11ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 1 to 11 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*

*Bill reported without Amendment..*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill accordingly read the Third time, and passed.*

## විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත
## நஞ்சுகள், அபின் மற்றும் அபாயகரமான அவுடதங்கள் (திருத்தம்) சட்டமூலம்
## POISONS, OPIUM AND DANGEROUS DRUGS (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' - [ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Wijeyadasa Rajapakshe]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[THE HON. DEPUTY SPEAKER in the Chair.]*

***1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 1 ordered to stand part of the Bill.*

### 2 වන වගන්තිය.- (218 වන අධිකාරයේ 54අ වන වගන්තිය සංශෝධනය කිරීම)
### வாசகம் 2.- (218ஆம் அத்தியாயத்தின் 54அ என்னும் பிரிவைத் திருத்துதல்)
### CLAUSE 2. - *(Amendment of section $54_A$ of (Chapter 218))*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"2 වන පිටුවේ, 2 වන පේළියේ සිට 8 වන පේළිය දක්වා වන පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

"'ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා'' යන්නෙන්, තත් කාලයේ ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා ලෙස ධුර දරන තැනැත්තා අදහස් වන අතර, අතිරේක, නියෝජ්‍ය, ජ්‍යෙෂ්ඨ සහකාර හෝ සහකාර ආණ්ඩුවේ රස පරීක්ෂකවරයකු සහ ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා හෝ අතිරේක, නියෝජ්‍ය, ජ්‍යෙෂ්ඨ සහකාර හෝ සහකාර ආණ්ඩුවේ රස පරීක්ෂකවරයකු ලෙස කටයුතු කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙක් ද ඇතුළත් වේ.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 2, as amended, ordered to stand part of the Bill.*

### 3 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 77අ වගන්තිය සංශෝධනය කිරීම)
### வாசகம் 3.- (முதன்மைச் சட்டவாக்கத்தின் 77அ என்னும் பிரிவைத் திருத்துதல்)
### CLAUSE 3. - *(Amendment of section $77_A$ of the principal enactment)*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "2 වන පිටුවේ, 31 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'පරීක්ෂණයක් සිදු කර ඇති අවස්ථාවකදී, එසේ ඉදිරිපත් කරන ලද දින සිට මාස දොළහක් නොඉක්මවන කාල සීමාවක් තුළ, ඔහුගේ' "

(2) "3 වන පිටුවේ, 17 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'වාර්තාවේ නිශ්චිතව දක්වා ඇති ආණ්ඩුවේ රස පරීක්ෂකවරයාගේ මතය සම්බන්ධයෙන් යම් තැනැත්තකු' "

(3) "3 වන පිටුවේ, 34 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස අදේශ කරන්න.

'පවරන ලද යම් තැනැත්තකුට ඇසුරුම් සහ මුද්‍රා ඇතුළු එම ඖෂධය, ද්‍රව්‍යය' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*3ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 3, as amended, ordered to stand part of the Bill.*

## 4 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කිරීම)

வாசகம் 4.- (முதன்மைச் சட்டவாக்கத்தின் 83ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 4. - *(Amendment of section 83 of the principal enactment)*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"5 වන පිටුවේ, 1 වන පේළියේ සිට 9 වන පේළිය දක්වා වන පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

| | |
|---|---|
| 'ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම | 4. ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ. |
| 'විශේෂ අවස්ථානුගත කරුණුවලදී මිස 54අ වන හෝ 54ආ වන වගන්තිය යටතේ වන වරදක් සඳහා කිසිදු ඇපයක් ලබා නොදිය යුතු බව | 83. (1) 84 වන සහ 85 වන වගන්තිවල සහ මේ වගන්තියේ (2) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ ආඥාපනතේ 54අ වන සහ 54ආ වන වගන්ති යටතේ වන වරදකට සැකකරුවකු හෝ චූදිතයකු වන යම් තැනැත්තකු, මහාධිකරණය විසින්, විශේෂ අවස්ථානුගත කරුණුවලදී; මිස, ඇප මත නිදහස් කරනු නොලැබිය යුතු ය. |

(2) 84 වන සහ 85 වන වගන්තිවල කුමක් සඳහන් වුව ද 54අ වගන්තියේ (1) වන උප වගන්තිය සහ 54ආ වගන්තිය යටතේ වන වරදක් සඳහා සැකකරුවකු හෝ චූදිතයකු වන්නා වූ තැනැත්තකු-

(අ) ඒ වරද සිදු කිරීමේදී ජාවාරම් කරන ලද, ආනයනය කරන ලද, අපනයනය කරන ලද හෝ සන්තකයේ තබා ගන්නා ලද අන්තරායදායක ඖෂධයේ ශුද්ධ බර 77අ වන වගන්තිය යටතේ ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා විසින් නිකුත් කරන ලද වාර්තාව ප්‍රකාරව ග්‍රෑම් දහයක් හෝ ඊට වැඩි වන්නා වූ විට; සහ

(ආ) සිදු කරන ලද ඒ වරද මරණීය දණ්ඩනයෙන් හෝ ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදක් වන්නා වූ විට, අභියාචනාධිකරණය විසින් විශේෂ අවස්ථානුගත කරුණුවලදී මිස, ඇප මත නිදහස් කරනු නොලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා "අන්තරායදායක ඖෂධය" යන්නෙන්, මොෆීන්, කොකේන්, හෙරොයින් සහ මෙත්ඇම්පිටමින් අදහස් වේ.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***4 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*4ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 4, as amended, ordered to stand part of the Bill.*

## 5 වන වගන්තිය.- (84, 85, 86 සහ 87 අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම)

வாசகம் 5.- (முதன்மைச் சட்டவாக்கத்தின் 84, 85, 86 மற்றும் 87 ஆகிய புதிய பிரிவுகளை உட்புகுத்துதல்)

CLAUSE 5. - *(Insertion of new sections 84, 85, 86 and 87 in the principal enactment)*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "5 වන පිටුවේ, 14 වන පේළියේ සිට සහ 18 වන පේළිය දක්වා වන පේළි (ඒ පේළි දෙක ද අතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'84. 54අ වන වගන්තියේ (1) වන උප වගන්තියේ සහ 54ආ වන වගන්තියේ විධිවිධාන යටතේ අධිකරණයක් විසින් නඩු විභාග කර නොමැති සහ වරදකරු කරනු ලැබ නොමැති සහ දඬුවම් නියම කරනු ලැබ නොමැති සැකකරුවකු හෝ චූදිතයකු, ඔහු අත්අඩංගුවට ගන්නා' ";

(2) "5 වන පිටුවේ, 30 වන සහ 31 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'විසින් නඩු විභාග කරනු ලැබ හෝ දඬුවම් පමුණුවනු ලැබ නොමැති සැකකරුවකු හෝ චූදිතයකු මාස දොළහකට වැඩි' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***5 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*5ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 5, as amended, ordered to stand part of the Bill.*

***6 සිට 8 තෙක් වගන්ති, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*6ஆம் வாசகத்திலிருந்து 8ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 6 to 8 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා සහ මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරැදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙසද ඉල්ලා සිටිමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*

*පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.*

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill, as amended, accordingly read the Third time, and passed.*

## අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත
## குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்
## CODE OF CRIMINAL PROCEDURE (AMENDMENT) BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*

*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*Order for Second Reading read.*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*

*පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.*

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill accordingly read a Second time.*

*මතු පළවන යෝජනාව සභා සම්මත විය.:*

*''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' - [ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]*

*தீர்மானிக்கப்பட்டது.*

*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ]*

*Resolved:*

*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Wijeyadasa Rajapakshe]*

*කාරක සභාවෙහිදී සලකා බලන ලදී.*

*[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]*

*குழுவில் ஆராயப்பட்டது.*

*[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*

*[THE HON. DEPUTY SPEAKER in the Chair.]*

***1* සිට *5* තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

*1ஆம் வாசகத்திலிருந்து 5ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 1 to 5 ordered to stand part of the Bill.*

*ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*

*පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.*

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*

*Bill reported without Amendment..*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*

*පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.*

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill accordingly read the Third time, and passed.*

## ළමයින් සහ තරුණ තැනැත්තන් (සංශෝධන) පනත් කෙටුම්පත
## சிறுவர்கள் மற்றும் இளம் ஆட்கள் (திருத்தம்) சட்டமூலம்
## CHILDREN AND YOUNG PERSONS (AMENDMENT)BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*

*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*Order for Second Reading read.*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*

*පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.*

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill accordingly read a Second time.*

*මතු පළවන යෝජනාව සභා සම්මත විය.:*

*''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' - [ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]*

*தீர்மானிக்கப்பட்டது.*

*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ]*

*Resolved:*

*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Wijeyadasa Rajapakshe]*

*කාරක සභාවෙහිදී සලකා බලන ලදී.*

*[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]*

*குழுவில் ஆராயப்பட்டது.*

*[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*

*[THE HON. DEPUTY SPEAKER in the Chair.]*

## 1 වන වගන්තිය.- (ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය)

வாசகம் 1.- (சுருக்கப்பெயரும் நடைமுறைக்கு வரும் தேதியும்)

CLAUSE 1. - *(Short title and date of operation)*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"1 වන පිටුවේ, 3 වන පේළියේ සිට 6 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙකද ඇතුළුව) ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

1\. (1) මේ පනත 2022 අංක දරන ළමයින් සහ තරුණ තැනැත්තන් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ වගන්තිය හැර, මේ පනතේ විධිවිධාන ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයකදී ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ පනතේ විවිධ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ දින නියම කරනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තියේ විධිවිධාන, මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත්වන දිනයේදී ක්‍රියාත්මක විය යුතු ය.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***1 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 1, as amended, ordered to stand part of the Bill.*

***2 සිට 31 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*2ஆம் வாசகத்திலிருந்து 31ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 2 to 31 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතේ සෝදුපත්වල භාෂා සහ මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරැදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## අන්තරායකර සත්ත්ව (සංශෝධන) පනත් කෙටුම්පත

## அபாயகரமான விலங்குகள் (திருத்தம்) சட்டமூலம்

## DANGEROUS ANIMALS (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Wijeyadasa Rajapakshe]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[THE HON. DEPUTY SPEAKER in the Chair.]*

***1 සිට 4 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகத்திலிருந்து 4ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 4 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendment.*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.*

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

## බන්ධනාගාර ආඥාපනත: රීති
## சிறைச்சாலைகள் கட்டளைச் சட்டம்: விதிகள்
## PRISONS ORDINANCE: RULES

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "(54 අධිකාරය වූ) බන්ධනාගාර ආඥාපනතේ 94 වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජූලි 12 දිනැති අංක 2288/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.10.07 දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ධීවර හා ජලජ සම්පත් පනත: නියෝග
## கடற்றொழில், நீர்வாழ் உயிரினங்கள் சட்டம்: ஒழுங்குவிதிகள்
## FISHERIES AND AQUATIC RESOURCES ACT: REGULATIONS

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා (ධීවර අමාත්‍යතුමා)**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா - கடற்றொழில் அமைச்சர்)
(The Hon. Douglas Devananda - Minister of Fisheries)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நான் பின்வரும் பிரேரணையைச் சமர்ப்பிக்கின்றேன்:

> "1996ஆம் ஆண்டின் 2ஆம் இலக்க, கடற்றொழில், நீர்வாழ் உயிரினங்கள் சட்டத்தின் 61ஆம் பிரிவின்கீழ் கடற்றொழில் அமைச்சரினால் ஆக்கப்பட்டு, 2021 நவம்பர் 24ஆம் திகதிய 2255/22ஆம் இலக்க அதிவிசேட வர்த்தமானப் பத்திரிகையில் பிரசுரிக்கப்பட்டதும் 2022.09.06 ஆம் திகதி சமர்ப்பிக்கப்பட்டது மான ஒழுங்குவிதிகள் அங்கீ கரிக்கப்படுமாக."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நான் பின்வரும் பிரேரணையைச் சமர்ப்பிக்கின்றேன்:

> "1996ஆம் ஆண்டின் 2ஆம் இலக்க, கடற்றொழில், நீர்வாழ் உயிரினங்கள் சட்டத்தின் 64(அ)ஆம் பிரிவுடன் சேர்த்து வாசிக்கப்படவேண்டிய 61(1)(ஆ)ஆம் பிரிவின் கீழ் கடற் றொழில் அமைச்சரினால் ஆக்கப்பட்டு, 2022 பெப்ருவரி 07ஆம் திகதிய 2266/6ஆம் இலக்க அதிவிசேட வர்த்தமானப் பத்திரிகை யில் பிரசுரிக்கப்பட்டதும் 2022.09.06ஆம் திகதி சமர்ப்பிக்கப் பட்டதுமான ஒழுங்கு விதிகள் அங்கீகரிக்கப்படுமாக."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## III

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நான் பின்வரும் பிரேரணையைச் சமர்ப்பிக்கின்றேன்:

> "1996ஆம் ஆண்டின் 2ஆம் இலக்க, கடற்றொழில், நீர்வாழ் உயிரினங்கள் சட்டத்தின் 61ஆம் பிரிவின்கீழ் கடற்றொழில் அமைச்சரினால் ஆக்கப்பட்டு, 2022 ஏப்பிரல் 25ஆம் திகதிய 2277/04ஆம் இலக்க அதிவிசேட வர்த்த மானப் பத்திரிகையில் பிரசுரிக்கப்பட்டதும் 2022.09.06 ஆம் திகதி சமர்ப்பிக்கப்பட்டதுமான ஒழுங்குவிதிகள் அங்கீகரிக் கப்படுமாக."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අත්‍යවශ්‍ය මහජන සේවා පනත: යෝජනා සම්මතය
## அத்தியாவசிய பொதுச் சேவைகள் சட்டம்: தீர்மானம்
## ESSENTIAL PUBLIC SERVICES ACT: RESOLUTION

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2022 නොවැම්බර් 03 දිනැති අංක 2304/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරනු ලැබ, 2022.11.09 දින ඉදිරිපත් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ශාන්ත බණ්ඩාර මහතා (ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சாந்த பண்டார - வெகுசன ஊடக இராஜாங்க அமைச்சர்)
(The Hon. Shantha Bandara - State Minister of Mass Media)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට රීති ප්‍රශ්නයක් මතු කරන්න තිබෙනවා. ඒ සඳහා අවස්ථාව දෙන්න.

මේ අවස්ථාවේ මේ ගරු සභාව තුළ ඉතා වැදගත් පනත් කෙටුම්පත් නවයක් සහ නියෝග කිහිපයක් පිළිබඳ තීන්දු-තීරණ ගනු ලැබුවා. නමුත්, විපක්ෂයේ කිසිදු ගරු මන්ත්‍රීවරයකු මේ වෙලාවේ සභාවේ නැහැ. රටේ අනාගතය වෙනුවෙන් ඉතා වැදගත් වූ තීන්දු-තීරණ ගන්නා මෙවන් අවස්ථාවලදී විපක්ෂය නියෝජනය කරන කිසිදු මන්ත්‍රීවරයෙක් මේ සභාවේ නැතිවීම පිළිබඳව අපි කනගාටු වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතුමන්ලා කථා කරන්නේ එක දෙයක්. ක්‍රියාවෙන් පෙන්වන්නේ තවත් දෙයක්.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය.

## පාසල් දරුවන් මත් උවදුරෙන් ආරක්ෂා කර ගැනීම
## போதைப்பொருள் அச்சுறுத்தலிலிருந்து பாடசாலை மாணவர்களைப் பாதுகாத்தல்
## SAFEGUARDING SCHOOL CHILDREN FROM DRUG MENACE

[අ.භා. 6.10]

**ගරු මංජුලා දිසානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) மஞ்சுலா திசாநாயக்க)
(The Hon.(Mrs.) Manjula Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාසල් ආශ්‍රිතව සිදුවන මත්ද්‍රව්‍ය ජාවාරම් සහ පාසල් සිසුන් ඉලක්ක කර සිදුකරනු ලබන මත්ද්‍රව්‍ය වෙළඳාම් පිළිබඳ සිදුවීම් දිනපතා මාධ්‍ය මඟින් වාර්තා කරයි. මෙලෙස මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ ගොදුරක් බවට පාසල් දරුවන් පත්වීම ඉතා ඛේදජනක තත්ත්වයකි.
>
> මෙම තත්ත්වය මඟහරවා ගැනීමට නම්, වග කිව යුතු රජයේ සියලු අංශ පමණක් නොව දෙමව්පියන් සහ සමාජයේ සියලුදෙනාම තම වග කීම නිසි ලෙස ඉටු කළ යුතුය.
>
> අද වන විට අපේ අනාගත පරම්පරාවට මුහුණ දීමට සිදුව තිබෙන මත්ද්‍රව්‍ය උවදුරෙන් ඔවුන් ගලවා ගැනීමට මෙන්ම මෙම උවදුරෙන් පාසැල් දරුවන් ගලවා ගැනීමට සම්බන්ධිත සියලු පාර්ශ්වයන් සහභාගි කරවාගෙන ඒ සඳහා කඩිනම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු යයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දරුවෙක් කියන්නේ දෙමව්පියන්ට මහා සම්පතක්. මවගේ කුස තුළ දරුවකු පිළිසිඳ ගත්තාම ඒ මව ඒ දරුවා රකින්නේ සිය පණ දෙවැනිකොටයි. මෙලොවට බිහි වන දරුවාගේ රන්කිරි කට ගාන්නේ 'මගේ දරුවා නිරෝගී දරුවෙක් වාගේම රටට වැඩදායී පුරවැසියෙක් වේවා' කියන ප්‍රාර්ථනාවෙන්. මේ ලෝකයේ තිබෙන වටිනාම සම්පත දරුවා. අම්මාට, තාත්තාට දායාද වෙලා මේ ලෝකයට බිහි වන දරුවා කුඩා අවධියේ සිට යොවුන් විය දක්වා සෙනෙහසින් ඇති දැඩි කරලා උගතෙකු, බුද්ධිමතෙකු පමණක් නොව, සමාජය පිළිගන්නා ගුණගරුක පුරවැසියෙකු බවට ද පත් කිරීම තමයි අපේ දෙමව්පියන්ගේ ඒකායන පරමාර්ථය. ඒ ඒකායන පරමාර්ථය ඉටු කරගැනීම වෙනුවෙන් දෙමව්පියන්ගේ ඇකයේ හැදෙන පුංචි දරුවා පෙර පාසලට යවලා, එතැනින් පාසල් අධ්‍යාපනයට යොමු කරවනවා.

අද දවස පුරාවට මේ ව්‍යවස්ථාදායකය තුළ සාකච්ඡාවට ගැනුණේ, මේ රටේ මෙතෙක් කාලයක් ක්‍රියාත්මක වූ නීති රීතිවල තිබුණු අඩු පාඩු සකස් කර ගැනීමට අවශ්‍ය වටපිටාව ගැනයි. මහා ව්‍යසනයක් බවට පත් වෙලා තිබෙන මත් ද්‍රව්‍ය රකුසාගෙන් අද අපේ රට බේරාගන්න අවශ්‍යයි. එවන් මොහොතක ඒ ව්‍යසනයෙන් අපේ රට, අපේ රටේ ජනතාව බේරාගැනීම සඳහා අවශ්‍ය නීති රීති, අණ පනත් සකස් කරන කොට එහි වැඩි බරක් පැටවෙන්නේ අපේ පාසල් පද්ධතියටයි. අපේ රටේ දූ දරුවන්ගේ අනාගතය යහපත් ඉලක්කයක් කරා ගෙන යන්නට අද මේ ව්‍යවස්ථාදායකය තුළ සම්මත කරනු ලැබූ විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත වාගේම ළමයින් සහ තරුණ තැනැත්තන් (සංශෝධන) පනත ද විශේෂයෙන්ම ඵලදායී දායකත්වයක් සපයනු ඇතැයි මා විශ්වාස කරනවා.

ගරු අධ්‍යාපන අමාත්‍යතුමනි, මා විශ්වාස කරන විධියට, අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව හසළ දැනුමක් තිබෙන ඔබතුමා මේ අධ්‍යාපන පද්ධතිය නිවැරදි දිශානතියට, නිවැරදි ඉලක්කයට ගෙන යනවා. ඒ වාගේම, රටේ ජීවනාලිය බඳු අපේ දරු පරපුර අනාගතයේදී යහපත් පුරවැසියන් බවට පත් කිරීමේ භාරදූර වගකීම උර මත දරාගෙන ඒ සඳහා කරන්න ඕනෑ වැඩ කටයුතු සියල්ල ඔබතුමා සම්පාදනය කරමින් ඉන්නවා. අපි ඒක අගය කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි ගමට ගියාම, අපේ ඡන්ද දායකයන් මුණ ගැසුණාම, ඒ අය එක්ක කථා කරන කොට පෙනෙනවා, මේ ජීවන අරගළය වෙනුවෙන් කරන සටන වාගේම, අපේ දරුවන් මත් ද්‍රව්‍ය රකුසාගෙන් බේරාගැනීම සඳහා වන සටනේ යෙදෙන්නත් ඒ අයට සිදුව තිබෙන බව. මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවන් අපේ ගම්වල හයහතර නොතේරෙන දරුවන් ඉලක්ක කරගෙන එම දරුවන් මත් ද්‍රව්‍ය භාවිතයට පොලඹවා ගැනීම සඳහා කරගෙන යන වැඩ පිළිවෙළ පිළිබඳව එම දෙමව්පියන් සහ වැඩිහිටියන් මහත් සේ කනගාටුවට පත්ව සිටිනවා. ඒ අය අපෙන් ඉල්ලා සිටිනවා, මත් උවදුරින් සිදු වන විනාශය ගැන පාර්ලිමේන්තුව තුළ කථා බහ කරලා එම උවදුරෙන් පාසල් යන අපේ දූ දරුවන් ආරක්ෂා කර ගැනීම සඳහා, අපේ පවුල් පද්ධතිය ආරක්ෂා කර දීම සඳහා වන සුදුසු වැඩ පිළිවෙළක් ඉක්මනින් සකස් කරලා ක්‍රියාත්මක කරන්න කියලා. එම ඉල්ලීම අපේ දෙමව්පියන්ගෙන්, අපේ පාසල් පද්ධතිය තුළ සිටින විදුහල්පතිතුමන්ලා, ආචාර්ය මණ්ඩලය ඇතුළු සියලුදෙනාගෙන් නිරන්තරයෙන් සිදු වනවා. ඒ නිසා තමයි අද මේ යෝජනාව මම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ.

ගරු අමාත්‍යතුමනි, අද දවස පුරා මේ ගරු සභාව තුළ මත් ද්‍රව්‍ය උවදුර පිළිබඳව සාකච්ඡා කළා. අපේ දරුවන් ඩැහැ ගන්න, තම මත් ද්‍රව්‍ය වෙළෙඳාමට අපේ දරුවන් නතු කරගන්න, තම වෙළෙඳ

[ගරු මංජුලා දිසානායක මහත්මිය]

ව්‍යාපාර ජාලයට අපේ දරුවන් එකතු කරගන්න, හසු කරගන්න මත් ද්‍රව්‍ය ජාවාරම්කාරයන් පාසල් අසල බලාගෙන ඉන්නවා. ඔවුන් නොයෙක්, නොයෙක් ක්‍රම හරහා අපේ හයහතර නොදන්නා දරුවන් ඔවුන්ගේ අතකොළු බවට පත් කර ගන්නවා. ඒ නිසා අපේ දරුවන් මත් රකුසාගෙන් බේරාගෙන ආරක්ෂා කරගැනීම සඳහා විශේෂයෙන්ම පාසල් පද්ධතිය තුළ උපදේශන සේවාවක් සැපයීම අත්‍යවශ්‍ය වනවා. මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වන දරුවන් ඉන් මුදා ගැනීම සඳහා වාගේම, ඔවුන් මත් ද්‍රව්‍ය ජාවාරම්කාර තැරැව්කරුවන්ගෙන් බේරාගැනීම සඳහා වන උපදේශන වැඩ පිළිවෙළක් පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක කරන්නට කටයුතු කරනවා නම් එය වඩාත් යහපත් වෙයි කියා මම විශ්වාස කරනවා.

මෙය පාසල් සංවර්ධන සමිතිවලට, මත් ද්‍රව්‍ය නිවාරණ සමිතිවලට, පාසල් කාර්ය මණ්ඩලයට -විදුහල්පතිතුමා ඇතුළු ආචාර්ය මණ්ඩලයට- විතරක් කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් නොවෙයි. මේ සඳහා අපේ දෙමව්පියන්ගේ, සමාජයේ වගකිව යුතු සියලු දෙනාගේ දායකත්වය ලබාගත යුතු වෙනවා. ඒ වාගේම අධ්‍යාපන අමාත්‍යාංශය, අධිකරණ අමාත්‍යාංශය, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය සහ මේ සඳහා දායකත්වය ලබාගත හැකි සියලු අමාත්‍යාංශවල නිලධාරින් ඒක රාශි කරගෙන සුදුසු වැඩ පිළිවෙළක් කඩිනමින් සකස් කළ යුතුයි කියන යෝජනාව තමයි මා ගරු අධ්‍යාපන අමාත්‍යතුමා වෙත කරන්නේ. විශේෂයෙන්ම අපේ දූ දරුවන්ගේ අනාගත සිහින බොඳ වී යන්නට ඉඩ දෙන්න අපට බැහැ. ඒ සිහින බොඳ වී යෑම නිසා අපේ රටේ නීරෝගී ශ්‍රම බලකාය ඉතා ශීඝ්‍රයෙන් අඩු වෙමින් යාවි. මොකද, මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වන දරුවන්ගේ කායික ශක්තිය පිරිහෙනවා; මානසික ශක්තිය පිරිහෙනවා. ඒ නිසා නීරෝගී පරපුරක් නොවෙයි අපේ පාසල් පද්ධතියෙන් එළියට එන්නේ. ඒ නිසා රටේ ශ්‍රම බලකාය අනාගතයේ කුමන තැනක තිබේවිද කියන ප්‍රශ්නාර්ථය අද අපට ඉතිරි වෙනවා. ඒ නිසා අපි ඉතා ඉක්මනින් මේ සඳහා නිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සුදුසුයි කියා මා විශ්වාස කරනවා. ඒ විශ්වාසය මත පදනම්ව තමයි මා අද මේ යෝජනාව මේ ගරු සභාවට ඉදිරිපත් කළේ. ගරු අධ්‍යාපන අමාත්‍යතුමනි, ඔබතුමාගෙන් මා විශේෂයෙන් ඉල්ලා සිටින්නේ මේ සඳහා නිසි වැඩ පිළිවෙළක් ඉතා කඩිනමින් ක්‍රියාත්මක කිරීමට සුදුසු ක්‍රියා මාර්ග ගන්නා ලෙසයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක විධියට මා විතරක් නොවෙයි, මහජන නියෝජිතයන් වන අප 225දෙනාම බලාපොරොත්තු වෙනවා, ඒ සඳහා අපට ලබා දිය හැකි දායකත්වයක් තිබෙනවා නම්, ඒ දායකත්වය අනිවාර්යයෙන් ලබා දෙන්නට. ඒ වෙනුවෙන් අනිවාර්යයෙන් කටයුතු කරන බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
යෝජනාව ස්ථිර කිරීම, ගරු රාජිකා වික්‍රමසිංහ මන්ත්‍රීතුමිය.

[අ.භා. 6.20]

**ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ராஜிகா விக்கிரமசிங்ஹ)
(The Hon. (Mrs.) Rajika Wickramasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාව මා ස්ථිර කරනවා.

අපේ දරුවන් මත් ද්‍රව්‍යවලින් මුදාගත යුතුය කියන කාරණය මේ දිනවල, මේ කාල වකවානුවේ ඉතා ඇඩිව කථා බහ වන මාතෘකාවක් බවට පත් වෙලා තිබෙනවා. කාන්තාවක විධියට මා සැබෑ ලෙසම කනගාටු වෙනවා, අපේ අනාගතය භාරගන්න සිටින දූ දරුවන් මෙවැනි තත්ත්වයකට පත්වීම පිළිබඳව. අපේ දූ දරුවන් මෙවැනි තත්ත්වයකට පත් වෙන්න හේතු වුණේ දෙමව්පියන් ද, ගෙදර ද, සමාජය ද, පාසල ද, අධ්‍යාපන ක්‍රමය ද කියන එක අද අපට විශාල ගැටලුවක් වෙලා තිබෙනවා. කෙසේ වෙතත්, විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත අද සම්මත වුණා. ඒ තුළින් මත් ද්‍රව්‍ය වැරැදිවලට නිසි දඬුවම් ලබා දීමට අපට හැකි වේ යැයි මම විශ්වාස කරනවා. මේ කාල වකවානුව තුළ එයයි අප කළ යුතු වන්නේ.

දරුවන් මේවායින් මුදා ගන්න නම්, සමාජයක් විධියට අපි සියලුදෙනා එකට එකතු වෙන්න ඕනෑ. ඒ එක්කම, මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට තදින්ම නීතිය ක්‍රියාත්මක කළ යුතු වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නීති ලිහිල් වීම නිසා තමයි අද රට පුරා අනවශ්‍ය සහ බිහිසුණු දේවල් සිද්ධ වෙන්නේ. පාසල් තුළ වුණත්, අප නියෝජනය කරන පළාත් තුළ වුණත්, දිස්ත්‍රික්ක තුළ වුණත් අද වෙනදා නැති බියක් දෙමව්පියන්ට ඇති වෙලා තිබෙන බව අපි දන්නවා. මොකද, පාසල් ආශ්‍රිතව මත් ද්‍රව්‍ය භාවිතය සිද්ධ වෙනවා. අවුරුදු 13 ඉඳලා අවුරුදු 25 දක්වා වූ තරුණ පිරිස අද මේ මත් ද්‍රව්‍ය උවදුරට ගොදුරු වෙලා තිබෙනවා. ඒ නිසා, නීති සම්පාදනය කරන උත්තරීතර පාර්ලිමේන්තුවට ඒ පිළිබඳ විශාල වගකීමක් තිබෙනවා.

රටක් ගොඩනැගීමේදී, තරුණ පරපුර, දූවා දරුවන් සෞඛ්‍ය සම්පන්න විධියටද රටට දායද කරන්නේ කියන කාරණය ඉතා වැදගත්. ඉදිරි අනාගතය ශක්තිමත් කරන්න යන මේ ගමනේදී නිසි අධ්‍යාපනයක්, නිරෝගී සෞඛ්‍යයක් සහ හොඳ නීති පද්ධතියක් කියන මේ සියල්ල එකතු කර ගනිමින් අපි දරුවන් ආරක්ෂා කරන්න කටයුතු කළ යුතු වෙනවා. නව අධ්‍යාපන අමාත්‍ය අපේ ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා අද අධ්‍යාපන ක්ෂේත්‍රයේ ලොකු වෙනසක් කරන බවට අපට ලොකු විශ්වාසයක් තිබෙනවා. ඒ යන ගමන තුළදී අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරින්ට හරහා දරුවන්ට තව තවත් දැනුම ලබා දීම වාගේම, නරක දෙයින් මිදෙන ආකාරය පිළිබඳවත් දැනුම ලබා දෙමින් හොඳ අධ්‍යාපන ක්‍රමයක් ගොඩනඟන්න එතුමා කටයුතු කරනවා. ඒ නිසා, එතුමා මේ ගැන දැඩි අවධානය යොමු කරනවා ඇතැයි කියා අපි විශ්වාස කරනවා.

ආරක්ෂක අංශ පැත්තෙන්, නීතිය පැත්තෙන් වාගේම, අපි සියලුදෙනා මේ වෙනුවෙන් ක්‍රියාත්මක වෙන්න ඕනෑ අවස්ථාවක් තමයි මේ තිබෙන්නේ. දෙමව්පියන් මේ ලොවට දරුවෙක් බිහි කරන්නේ දහසක් බලාපොරොත්තු ඇතිව. සමාජයට ගුණ ගරුක, රටට ආදරය කරන, දෙමව්පියන්ට ආදරය කරන දරු පිරිසක් අපි බලාපොරොත්තු වෙනවා. නමුත් මත් ද්‍රව්‍ය උවදුර තුළින් කොතරම් නම් විනාශයක් සිදු වෙනවාද, තරුණ පරපුර නොමඟ යවනවාද කියන එක අපි හොඳාකාරවම අද තේරුම් අරගෙන තිබෙනවා. අද දවස පුරාම පාර්ලිමේන්තුවේ අපි සෑම කෙනෙකුම කථා කළේ, දරුවන් මේ බිහිසුණු තත්ත්වයෙන් මුදා ගන්නේ කොහොමද කියන කාරණය යි. මත් ද්‍රව්‍ය භාවිතය නවත්වන්නේ කොහොමද කියන කරුණු කාරණා පිළිබඳවයි. අද මේ නව නීති සකස් කරලා, තව මාසයක් දෙකක් ගත කරන්නේ නැතුව ඉතා කඩිනමින් ඒ නීති ක්‍රියාත්මක කරලා, අපේ අනාගත පරපුර රැක ගන්න අපි සියලුදෙනා එකට එකතු වෙලා කටයුතු කරමු.

අපේ ගරු මන්ත්‍රීතුමිය කාලීන මෙන්ම ඉතාම වැදගත් යෝජනාවක් තමයි අද ඉදිරිපත් කළේ. මින් ඉදිරියට අපේ තරුණ පරපුර අපි රැකගත යුතුයි. දරුවන් උගතුන්, බුද්ධිමතුන් වෙනවා වාගේම, නරක දේ මොකක්ද, හොඳ දේ මොකක්ද කියලා තේරුම් අරගෙන කටයුතු කරන්න වැඩිහිටියන් විධියට, උත්තරීතර පාර්ලිමේන්තුව විධියට හැමදෙනාම කටයුතු කරාවි කියා මා විශ්වාස කරනවා.

ගරු මන්ත්‍රීතුමිය ගෙන ආ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ස්ථිර කරන්න මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මැතිතුමා.

[අ.භා. 6.24]

**ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ලෝකයට බිහිවෙනකොට කිසිම වෙලාවක කිසිම දරුවෙක් අපරාධකාරයකු ලෙස බිහි වන්නේ නැහැ. අපි දන්නවා, යම් යම් අයගේ යම් යම් දායකත්වය තුළ අපරාධකාරයෙක්, මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවෙක් නිර්මාණය වෙන්න පුළුවන් බව. අපි මේ කාරණය ගැන දීර්ඝව හිතන්න ඕනෑ. මොකද, වැඩිහිටියන්ට මත් ද්‍රව්‍ය විකුණන කෙනාටත්, දරුවන්ට මත් ද්‍රව්‍ය විකුණන කෙනාටත්, ජාවාරම් කරන කෙනාටත් එකම නීතිය අනුව තමයි අපි දඬුවම් කරන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සැමට නීතිය එකයි කියලා කිව්වාට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කාන්තාවන් සහ දරුවන් වෙනුවෙන් විශේෂ ප්‍රතිපාදන තිබෙනවා. ඒ අය වෙනුවෙන් සුවිශේෂී නීති හදන්න පුළුවන් හැකියාව නිර්මාණය කරලා තිබෙනවා. විශේෂයෙන් කාන්තාව සහ දරුවන් කියන අය විශේෂ අවධානය යොමු විය යුතු අය කියලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම පෙන්වා දීලා තිබෙනවා. ඒ නිසා පාසල් ආශ්‍රිතව, අධ්‍යාපන ආයතන ආශ්‍රිතව යම් යම් පුද්ගලයන් මත් ද්‍රව්‍ය විකුණනවා නම්, ඒ අයට නීතිය තදින් ක්‍රියාත්මක කළ යුතුයි කියා මා විශ්වාස කරනවා. පාසල් දරුවන්, විශ්වවිද්‍යාල දරුවන් ඉලක්ක කරගෙන මත් ද්‍රව්‍ය විකිණීම කරනවා නම්, ඒ සම්බන්ධ නව අණපනත් ඇති කිරීම හරහා ඒ ජවාරම්කරුවන්ට තදින් නීතිය ක්‍රියාත්මක කළ යුතුයි. ඒක ව්‍යවස්ථාදායකයේ කාර්යයක් කියලා මා හිතනවා. ඒ එක්කම බාලවයස්කාර දරුවන් යම් ආකාරයකට මේ විධියේ තත්ත්වයකට ගොදුරු වෙලා තිබෙනවා නම්, පාසල් අධ්‍යාපනය ලබන දරුවෙක් මේ තත්ත්වයට ගොදුරු වෙලා තිබෙනවා නම්, ඒ පිළිබඳව විශේෂයෙන් සලකා බලන්න ඕනෑ. ගරු අධ්‍යාපන අමාත්‍යතුමාත් මේ සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් කථා කළා.

අද ඉතාම අවාසනාවන්ත සිද්ධි අපි දකිනවා. අද පාසලකදී පුංචි සොරකමක් වුණත්, පාසලට පොලීසිය ගෙන්වන තත්ත්වයක් අපි දකිනවා. අපි විශ්වවිද්‍යාල තුළ සිටි කාලයේ මොන අරගළ තිබුණත්, සාමාන්‍යයෙන් විශ්වවිද්‍යාලවලට පොලීසිය එන්නේ නැහැ.

හැබැයි, අද පාසල්වලටත් පොලීසිය ගෙන්වන තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒක නොදැනුවත්කම තුළ සිදු වෙච්ච දෙයක් කියලා මම හිතනවා. නමුත්, මේ දේවල් නිරාකරණය කර ගන්න ඕනෑ. පොලීසිය ඒ හැම දෙයකටම සම්බන්ධ කරනවාට, වඩා මත් ද්‍රව්‍ය වැනි කාරණාවලට අනුගත වෙච්ච, හුරු වෙච්ච මෙවැනි දරුවන් සම්බන්ධයෙන් අපි සුවිශේෂී කාර්ය පටිපාටියක් ආරම්භ කරන්න ඕනෑ.

දියුණු රටවල වාගේ, අපරාධකරුවන් හෝ සැකකරුවන් වෙනුවෙන් බෙදලා වෙන් කළ බන්ධනාගාර පද්ධතියක් අපේ රටේ නැහැ. එතකොට යම් අවස්ථාවක බන්ධනාගාරගත වෙන්නේ පාසල් දරුවන් වෙන්න පුළුවන්, විශ්වවිද්‍යාල දරුවන් වෙන්න පුළුවන්. අවුරුදු 18-25ත් අතර දරුවන් "වියපත් දරුවන්" කියලා නීතියෙන් හඳුන්වනවා. මේ තිබෙන තත්ත්වය තුළ විශ්වවිද්‍යාල දරුවන් හෝ පාසල් දරුවන් බන්ධනාගාරගත වීමක් සිද්ධ වුණොත්, සමහර වෙලාවට ඒ අය මත් ද්‍රව්‍යවලටත් එහාට ගිහිල්ලා, අයිස්වලටත් එහා මත් ද්‍රව්‍යවලට හුරු වෙච්ච තත්ත්වයක් එක්ක පරිපූර්ණ අපරාධකාරයකු හැටියට තමයි බන්ධනාගාරයෙන් එළියට එන්නේ. ඒ නිසා ඒ දරුවන් සම්බන්ධයෙන් අපි වෙනමම යන්ත්‍රණයක් ඇති කළ යුතුයි කියලා මා විශ්වාස කරනවා. පාසල් අධ්‍යාපනය ලබමින් සිටින දරුවෙක් හෝ විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වා ඉගෙනීම හෝ දැනුමක් ඇති දරුවෙක් මේ ආකාරයට මත් ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවීමකට ලක් වෙන්නේ කිසියම් වූ පාරිසරික සාධකයක් මත. ඒ අය, සාමාන්‍ය ලෙස මත් ද්‍රව්‍යවලට අනුගත වූ පුද්ගලයන් එක්ක එකට දාන්න බැහැ. ඒ නිසා මේ ගැන වෙනම කියැවීමක් තිබෙන්න ඕනෑ. ඒකට අපට වෙනම ක්‍රමයක් - system එකක් - හදන්න පුළුවන් නම් එය වඩාත් උචිතයි කියලා මා විශ්වාස කරනවා. පුනරුත්ථාපන ක්‍රියාවලිය හරහා තමයි පාසල් දරුවන් සහ විශ්වවිද්‍යාල දරුවන් බේරා ගන්න අපට පුළුවන් වෙන්නේ. ඒ සඳහා වඩාත් සක්‍රිය පුනරුත්ථාපන ක්‍රියාවලියක් තිබෙන්න ඕනෑ.

පසුගිය දවස්වල කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානයේත් ප්‍රශ්නයක් ඇති වුණා, අපි දැක්කා. අපි කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානය හොඳයි කියලා තමයි දැන ගෙන හිටියේ. සමහර වෙලාවට මත් ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් හසු වෙලා හිටපු පුද්ගලයන් වෙනුවෙන් අධිකරණවල පෙනී සිටිනකොට, ඔවුන්ගේ දෙමව්පියන්ගෙන් අපි හැම වෙලාවේම ඇහුවේ, කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානයට දාලා දෙන්නද කියලායි. මොකද, කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානය ගැන තමයි අපට විශ්වාසයක් තිබුණේ. නමුත්, දැන් අපට පැහැදිලිව පෙනෙන්න තිබෙන දෙයක් තමයි ඒ පුනරුත්ථාපන මධ්‍යස්ථානයත් පාසල් දරුවන්, විශ්වවිද්‍යාල දරුවන් දාන්න පුළුවන් තැනක් නොවෙයි කියන එක. ඒ නිසා මේ අය සඳහා සුවිශේෂී යන්ත්‍රණයක් අනිවාර්යෙන්ම නිර්මාණය වෙන්න ඕනෑ. ඒ සඳහා පුනරුත්ථාපන ක්‍රියාවලියක් වඩාත් උචිත ලෙස සැකසිය යුතු වෙනවා. ඒ සම්බන්ධයෙන් වන වෛද්‍යවරුන්, මානසික වෛද්‍යවරුන්, අධ්‍යාපනඥයන්, නීතිමය අධිකාරිය යනාදී ඒ සියලු අය එකතු වෙලා විශාල යන්ත්‍රණයක් ඇති කරලා මේ අය යහ මඟට ගන්න අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න ඕනෑ. මේ පිරිස මෙවැනි ඇබ්බැහිවීම්වලින් ලේසියෙන්ම බේරා ගන්න පුළුවන්. මොකද, ඒ අයට යම් අධ්‍යාපනයක් හා යම් දැනුමක් තිබෙන නිසා. ඒ අය පුනරුත්ථාපනය කරලා සමාජයට මුදා හරින්න පුළුවන්. ඒ අය ජීවත් වෙන කාලය වැඩියි. සමහර ඇබ්බැහිවීම්වලට, දීර්ඝ කාලීනව මත් ද්‍රව්‍යවලට හුරු වෙච්ච අයට වඩා, පාසල් දරුවෙක් හෝ උසස් අධ්‍යාපන ආයතනයක දරුවෙක් මෙවැනි දේවල්වලට ඇබ්බැහිවීමෙන් මුදා ගැනීම පහසුයි. ඒ අයට ජීවත් වෙන්න තිබෙන කාල සීමාව වැඩියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ අයට යම් ප්‍රතිඵල ලැබෙන යහපත් යන්ත්‍රණයක් අවශ්‍යයි කියන කාරණය මම මේ අවස්ථාවේ දී කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ සඳහා ගරු අධ්‍යාපන අමාත්‍යතුමාට මම යෝජනාවක් කරන්න කැමතියි. මේ පාර්ලිමේන්තුව තුළ විශේෂ කාරක සභාවක් පත් කරලා මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ කණ්ඩායම් වෙනුවෙන් කරන්න ඕනෑ මොනවාද කියලා අපි බලන්න ඕනෑ. ඒ සඳහා සුවිශේෂී වූ නීති හඳුන්වා දෙන්න ඕනෑ. දරුවන් මත් ද්‍රව්‍ය විකුණනවා නම් ඒ අයට නීතිය ක්‍රියාත්මක කරන්නේ කොහොමද, ඒ අයගේ පුනරුත්ථාපන ක්‍රියාවලිය සිදු වෙන්න ඕනෑ කොහොමද කියන කාරණා පිළිබඳව එහිදී අපට දීර්ඝව සාකච්ඡා කරන්නත් පුළුවන්.

[ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාව ඉතා වැදගත් යෝජනාවක්. මේක මේ රටේ අනාගතය සම්බන්ධ යෝජනාවක්. මේ විපක්ෂය ගැන මම ඇත්තටම පුදුම වෙනවා. උදේ ඉඳලා සවස් වෙනතෙක් පාර්ලිමේන්තුවේ කාලය, රාජ්‍ය වියදම්, මේ රටේ ජනතාවගේ බදු මුදල් ගැන කිඹුල් කඳුළු හෙළන විපක්ෂය, අද මේ වාගේ වැදගත්, මේ රටේ අනාගතයට සම්බන්ධ වැදගත් යෝජනාවකදී පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් පත් කරමු කියලා අපි යෝජනා කළත්, අද ඒ පිළිබඳව අදහස් දක්වන්නවත් විපක්ෂයේ කිසිදු මන්ත්‍රීවරයකු නැහැ. මම මේ අවස්ථාවේ ඒ කාරණය මතක් කරන්නේ වෙන මොකක්වත් නිසා නොවෙයි, ඊළඟ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවකදීවත් කථා කරන්න විපක්ෂයේ මන්ත්‍රීවරුන් මේ ගරු සභාවේ සිටියි කියලා විශ්වාස කරන නිසායි.

විශේෂයෙන්ම මෙම මත්ද්‍රව්‍ය උවදුරින් පාසල් දරුවා, විශ්වවිද්‍යාල දරුවා බේරා ගැනීම සඳහා සුවිශේෂී යන්ත්‍රණයක් ඇති කළ යුතුයි කියලා මා මතු කළ කාරණාවලින් ඔබ්බට ගිය විශාල කාරණා ගණනාවක් තිබෙනවා. ඒ පිළිබඳව ගරු අධ්‍යාපන ඇමතිතුමාටත් දැනුම් දෙන්න ඇති. මේ සියලු කාරණා සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකය එක් යන්ත්‍රණයක් හැටියට කටයුතු කරලා, යෝජනාවලියක් සකස් කරලා පාසල් දරුවන් හා විශ්වවිද්‍යාල දරුවන් සම්බන්ධයෙන් වෙනම යන්ත්‍රණයක් ඇති කරන්න අපට පුළුවන් නම් හොඳයි. ඒක මේ රටේ අනාගතයට ඉතා වැදගත් කියලා මා හිතනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ජේ.සී. අලවතුවල මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු වීරසුමන වීරසිංහ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

[අ.භා. 6.30]

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කළේ ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය විසින්. ඒ යෝජනාව ඉදිරිපත් කිරීම, ස්ථිර කිරීම සහ අදහස් දැක්වීම සම්බන්ධයෙන් අපේ ගරු මන්ත්‍රීතුමියලා දෙපළට සහ ගරු මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා. අවාසනාවකට වාගේ, විපක්ෂයේ එකදු මන්ත්‍රීවරයෙක්වත් මේ වෙලාවේ මේ ගරු සභාවේ නැහැ.

මම සඳහන් කරන්න ඕනෑ, මේ හා සමාන යෝජනාවක් ස්ථාවර නියෝග 27.(2) යටතේ ඊයේ උදෑසන අසන ලද ප්‍රශ්නයෙන් ඉදිරිපත් කර තිබුණු බව. මම ඒකටත් පිළිතුරු ලබා දුන්නා. මේ දිනවල ඉතා බහුල වශයෙන් මාධ්‍ය තුළින් මේ සම්බන්ධ කරුණු ගෙනහැර දක්වනවා. නමුත්, මීට මාස කිහිපයකට පෙර තමයි මම මේ තත්ත්වය දැක්කේ. මොකද, මම පාර්ලිමේන්තුවට එන්න කලිනුත්, දැනට මාස හයකට විතර කලිනුත් කොළඹ මහාධිකරණයේත්, මහේස්ත්‍රාත් අධිකරණවලත් තමයි නඩුවලට පෙනී සිටියේ. එතකොට මම දැක්කා, මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණයට එක දම්වැලක දාලා 25ක, 30ක විශාල පිරිසක් ගේන හැටි. ඒ සමහරුන්ගේ වයස අවුරුදු 20ට අඩුයි. මේ ප්‍රවණතාව ඇති වෙන්න හේතු කිහිපයක් තිබෙනවා. ඉස්සෙල්ලාම අපි මේකට හේතු වූ මූලාශ්‍ර හොයන්න ඕනෑ, ඇයි එහෙම වුණේ කියලා.

විශේෂයෙන්ම පසුගිය වකවානුව තුළ මීට අදාළ නීති සංශෝධනය වුණේ නැහැ. 1984 අංක 13 දරන විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත තමයි තිබුණේ. නව තාක්ෂණය අනුව සහ වෙනත් ආකාරයෙන් නිර්මාණය කරන විෂ මත් ද්‍රව්‍ය පාලනය කරන්න ඒ පනත ප්‍රමාණවත් නැහැ. හැබැයි, දැන් විපක්ෂය කොපමණ කෑ ගැහුවත්, ඔවුන්ට කොපමණ කාලය තිබුණත් අපේ ආණ්ඩුවෙන්, අපේ අධිකරණ ඇමතිතුමා තමයි මේ 1984 අංක 13 දරන විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත සංශෝධනය කළේ. බලන්න, ඒ පනත කොච්චර පැරණි ද කියලා. අද අපි ඒ සංශෝධන පනත් කෙටුම්පත සම්මත කළා. ඊළඟ සති දෙක තුළදී ගරු කථානායකතුමා විසින් මෙහි සහතිකය සටහන් කළ පසු එය නීතියක් බවට පත් වෙනවා. එතකොට ඊළඟ සති දෙක තුළ අපට මේ සංශෝධනත් එක්ක කටයුතු කරන්න පුළුවන්.

මීට කලින් පැවැති විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනතට අදාළව අද සිදු කළ සංශෝධන මොනවාද කියලා මම බැලුවා. අපි මෙහි මූලික පනත ගත්තොත්, ඒකේ බොහොම සුළු වශයෙන් තමයි මත් ද්‍රව්‍ය ගැන සඳහන් කර තිබෙන්නේ. හෙරොයින් - diacetylmorphine, ගංජා - *cannabis sativa,* කොකේන්, අබිං වාගේ දේවල් අද සම්මත වූ පනත අනුව මත් ද්‍රව්‍ය යටතට වැටෙනවා. අබිං සහ ගංජා කියන මත් ද්‍රව්‍ය බලපත්‍ර සහිතව ආයුර්වේද වෛද්‍ය ක්‍රම සඳහා සන්තකයේ තබා ගන්න පුළුවන්. එහෙමයි, ඒ පනතේ තිබෙන්නේ. හැබැයි, මේ සංශෝධනයෙන් ඉන් ඔබ්බට ගිහිල්ලා විෂ මත් ද්‍රව්‍ය වර්ග 128ක් ඒවායේ රසායනික නාමය සමඟ සඳහන් කරලා තිබෙනවා. ඊළඟට, එහි ශුද්ධ බර ප්‍රමාණය අනුව නඩුව විභාග කළ යුත්තේ මහේස්ත්‍රාත් අධිකරණයේද, මහාධිකරණයේද යන වෙනස්වීම්, ඇප ලබා ගැනීමේ ආකාරය, දඩ මුදල්, දඬුවම් ආදී කාරණා සියල්ලම මේ සංශෝධන පනතේ තිබෙනවා.

මේ පාර්ලිමේන්තුව තිබෙන්නේ මොකටද කියන එක උදේට මේ සභාවේ ඉන්න අයගෙන් තමයි අහන්න ඕනෑ. උදේට මෙතැනට ඇවිල්ලා පැය දෙකක් විතර අරගෙන එතුමන්ලා විවිධ කරුණු කියනවා. හැබැයි, ඒ සියලුදෙනාටම මම මේ කාරණය මතක් කර දෙන්න ඕනෑ. අද න්‍යාය පත්‍රයේ තිබුණු විෂය අංක 1 සිට 14 දක්වා වූ පනත් කෙටුම්පත්, රීති, නියෝග සහ යෝජනා සම්මතය ද සම්මත වුණා. නමුත්, විෂය අංක 1 සිට 9 දක්වා වූ සියලු සංශෝධන පනත් කෙටුම්පත් තිබුණේ අපරාධ නීතිය සහ සිවිල් නීතිය සම්බන්ධයෙන්. මේ අතර තමයි විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත තිබුණේ. ඒ වාගේම, විෂය අංක 10 යටතේ තිබුණේ බන්ධනාගාර ආඥාපනත යටතේ ඉදිරිපත් කළ රීති. ඊට අමතරව ධීවර හා ජලජ සම්පත් පනත යටතේ වූ නියෝග 3ක් ද, අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනා සම්මතයක් ද අද දිනට නියමිත විෂයය අතර තිබුණා. මේවායෙන් පැහැදිලි වෙනවා, රජයක් හැටියට ඉතා කෙටි කාලයක් තුළදී රටේ නීතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන්නා වූ නීති සම්පාදනය කිරීම සඳහා අපි අනික් සියලු අභියෝග එක්ක මුල් තැන දීලා තිබෙන බව.

එයින් වැදගත් ම පනත තමයි, අද ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය ඉදිරිපත් කළ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවේ සඳහන් කාරණයට අදාළ වන විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත. විශේෂයෙන් ම අපේ සමාජයේ පාසල් තුළ සහ තරුණ පරපුර අතර මත් ද්‍රව්‍ය

භාවිතය බහුල වීම පාලනය කිරීම සඳහා නීති අවශ්‍යයි. දැන් ඔන්න ඒ නීතිය සම්මත කර දීලා තිබෙනවා. හැබැයි, ඒ නීතිය සම්මත කරනකොට විපක්ෂය මේ සභාවේ නැහැ. මේක තමයි තිබෙන තත්ත්වය. අපි මීට වඩා නිර්ව්‍යාජ වෙන්න ඕනෑ.

ඊළඟට මම සඳහන් කරන්න ඕනෑ, ගරු මන්ත්‍රීතුමිය ඉදිරිපත් කළ මේ යෝජනාවට අදාළව ම ඊයේත් මම යම් සඳහනක් කළ බව. අපි මේ තත්ත්වය කලින් දැකපු නිසා මේ ආසන්නයේ රාජගිරියේ ඔබේසේකරපුර ප්‍රදේශයේ, School Cluster එකක් හදලා නියමු ව්‍යාපෘතියක් පටන් ගත්තා.

ඒකෙන් අපි අරමුණු කීපයකට ගියා. අපි පටන් ගත්තේ පෝෂණයෙන්. පෝෂණය දීලා දරුවන් ගෙදර යැව්වේ නැහැ. සවස දෙකේ ඉඳලා හතර වෙනකම් වැඩිහිටි -10 ශ්‍රේණියෙන් ඉහළ - සිසුන් තියා ගන්නවා. එසේ තියාගෙන ඒ ගොල්ලන්ට උපදේශනය ලබා දෙනවා; counselling කරනවා. ඊළඟට, මාර්ගෝපදේශනය ලබා දෙනවා. ඒ වාගේම ඒ ගොල්ලන් කැමැති යම් වෘත්තියක් සම්බන්ධයෙන් වෘත්තීය පුහුණුවකුත් ලබා දෙනවා, අපේ අමාත්‍යාංශය යටතේ දැන් ඒ සියලු ආයතන තිබෙන නිසා. මම එතැනින් නොනැවතී ගියා, කොළඹ කලාපයට. කොළඹ කලාපයේ පාසල් 144ක දරුවෝ 184,000ක් ඉන්නවා, ගුරුවරු 11,000ක් ඉන්නවා. ඒ පාසල්වලත් ඒ වාගේම වැඩ පිළිවෙළක් පටන් ගෙන තිබෙනවා. ඒ වාගේම පාසල්වලට දිවා ආහාරය ලබා දෙන වැඩ පිළිවෙළත් අපි දැන් සකස් කර තිබෙනවා.

ඊළඟට, එම පාසල්වලින් ගුරුවරු 144දෙනෙක් කැඳවා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මඟින් දින තුනක වැඩමුළුවක් පැවැත්වූවා, මත් ද්‍රව්‍ය භාවිත කළ කෙනෙකු හඳුනා ගන්නේ කොහොමද කියලා. අයිස් මත් ද්‍රව්‍යය භාවිත කළ අය සාමාන්‍ය කෙනෙකුට එකවර හඳුනා ගන්න බැහැ. අපි උසාවිවල වැඩ කරපු අය නිසා එවැනි අය සම්බන්ධයෙන් අපට යම් අදහසක් ඇති කරගන්න පුළුවන්. හැබැයි, එවැනි අය නිශ්චිත වශයෙන් හඳුනා ගැනීමේ ක්‍රම තිබෙනවා. ඒ සඳහා අපි ගුරුවරුන් පුහුණු කළා, දින තුනක්. මාත් සහභාගි වුණා, ඒ වැඩමුළුවට.

මම ඊළඟ සතිය යොදා ගත්තා, කොළඹ කලාපයේ සියලු විදුහල්පතිවරු හෝ ඒ අයට එන්න බැරි නම් නියෝජ්‍ය විදුහල්පතිවරුන් දැනුවත් කිරීමේ වැඩසටහනකට. ඊළඟට, මනෝ විද්‍යාව පිළිබඳ විශේෂඥයන් මඟින් දේශන පවත්වා, මේ ගොල්ලන් කළමනාකරණය කරගන්නේ කොහොමද කියලා දැනුවත් කළා. පාසල් දරුවෙක් යම් වරදක් කළොත්, අපි ඒක පොලීසියට ගිහින් කියන්නේ නැහැ නේ. ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න අපට චක්‍රලේඛ තිබෙනවා. ඒ අනුව එවැනි තත්ත්ව පාලනය කරන්න පුළුවන්. පාසල් දරුවන් යම් යම් ඇබ්බැහිවීම්වලට, වැරදි ක්‍රියාවලට පෙලඹුණු අවස්ථාවලදී ඉතිහාසය පුරාවටම ඒවා කළමනාකරණය කරගත්තේ එහෙමයි. ඒ සඳහා අවශ්‍ය ක්‍රමය කියා දීලා තිබෙනවා.

මම ලබන සතිය වෙනකොට සමීක්ෂණයක් කරනවා, අපි ආරම්භ කරපු වැඩ පිළිවෙළ සම්බන්ධව. අපි මේ වැඩ පිළිවෙළ පටන් ගත්තේ නොවැම්බර් 01වැනි දා. මේ වැඩ පිළිවෙළ පටන් අරගෙන සති දෙකක් ගතවෙනකොට, නිලධාරි කණ්ඩායමක් යොදවා අපි කොළඹ කලාපයේ සමීක්ෂණයක් කරනවා, මේ වැඩ පිළිවෙළේ අඩු ලුහුඬුකම් මොනවාද, තව දියුණු කළ යුත්තේ මොනවාද කියා සොයා බලන්න. ඒ අතරතුර, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය - National Dangerous Drugs Control Board - සහ පොලීසිය, සෞඛ්‍ය අමාත්‍යාංශයේ විශේෂඥ වෛද්‍යවරුන් මෙන්ම මනෝ වෛද්‍යවරුන්ගෙන් සමන්විත කමිටුවක් රැස් කරනවා. අද ඒ කමිටුව රැස්වෙන්න හිටියේ. නමුත්, මම අද පාර්ලිමේන්තුවේ නිසා මම ඒ අයට වෙන දිනයක් දුන්නා. අපි ඒ අයට භාර දීලා තිබෙනවා, ලංකාවටම මෙවැනි වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා. ඒ වාගේම කලාප මඟින් පාසල්වල තොරතුරු ලබා ගෙන, පළාත් නවයේම ප්‍රධාන දිස්ත්‍රික්කවල තිබෙන කලාප සියල්ලේම දෙසැම්බර් 01වැනි දා වෙනකොට කොළඹ හා සමාන වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න මම බලාපොරොත්තු වෙනවා. ජනවාරි 01වැනි දා වෙනකොට අපි අධ්‍යාපන කලාප 100 තුළම මේ වැඩසටහන ක්‍රියාත්මක කරනවා. මම බලාපොරොත්තු වෙනවා, පළාත් නවයේම මන්ත්‍රීවරුන් පළාතෙන් පළාත වෙනම කැඳවන්න; අධ්‍යාපන පරිපාලන ප්‍රතිසංස්කරණ පිළිබඳව මන්ත්‍රීවරුන් නියෝජනය කරන බලප්‍රදේශවල අදහස් ගන්න. ඊට සමගාමීව මම මේ පිළිබඳවත් දැනුවත් කරනවා. එතකොට ඒ ඒ ප්‍රදේශවල අපේ ගරු මන්ත්‍රීතුමන්ලාට පක්ෂ-විපක්ෂ භේදයෙන් තොරව කලාප මට්ටමින්, කොට්ඨාස මට්ටමින් ඒ වගකීම භාර දීලා නීතිය ක්‍රියාත්මක කරන අයට, අපේ පාසල් පද්ධතියට ඒ අයගේ සහයෝගය උපරිමයෙන් ලබා දීමට අවශ්‍ය ප්‍රවේශය මම සකස් කර දෙනවා.

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය ඉදිරිපත් කළ යෝජනාව මහ පොළොවේ ක්‍රියාත්මක වෙන තැනට ගෙන ඒමට මම කටයුතු කරනවා. පාසල්වල දෙවැනි වාරය දෙසැම්බර් 02වන දා අවසන් වෙනවා. තුන්වැනි වාරය දෙසැම්බර් 05වන දා පටන් ගන්නවා. ජනවාරි මාසයේ 02වන දා වෙනකොට, මේ සියලු වැඩ පිළිවෙළ දිවයින පුරා සංවිධානාත්මකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සකස් කර තිබෙනවා කියන කාරණය සඳහන් කරමින්, මේ යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමියට ස්තුතිවන්ත වෙමින් මගේ පිළිතුරු කථාව අවසන් කරනවා.

***එකල්හි වේලාව අ. භා. 5.30 පසු කර තිබුණෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ. භා. 6.40ට, 2022 නොවැම්බර් 11 වන සිකුරාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால், மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 6.40க்கு, பாராளுமன்றம் 2022 நவம்பர் 11, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*And it being past 5.30 p.m,* THE HON. DEPUTY SPEAKER *adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 6.40 p.m until 9.30 a.m. on Friday, 11th November, 2022.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.